

2012, 2013 සහ 2014 වර්ෂවල පවත්වන ලද
පළාත් සහා ඡන්ද විමසීම් පිළිබඳ

මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව

පෙරවදන

1988 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද පළාත් සභා ඡන්ද විමසීම් එම වර්ෂයේ සිට මේ දක්වා ම පවත්වා ඇත්තේ වෙන් වෙන් හෝ අදියර වශයෙනි. මෙම වාර්තාවෙන් සමාලෝචනයට බඳුන්වන පළාත් සභා ඡන්ද විමසීම් ද පූර්වයෙහි සඳහන් කළ අයුරින් 2012, 2013 හා 2014 වර්ෂවල දී අදියර හතරක් යටතේ පවත්වන ලදී. එනම්, 2012.09.08 දින නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව පළාත් සභා වෙනුවෙන් ද, 2013.09.21 දින මධ්‍යම, වයඹ හා උතුරු පළාත් සභා වෙනුවෙන් ද, 2014.03.29 දින බස්නාහිර, දකුණ යන පළාත් සභා වෙනුවෙන් ද, අවසාන වශයෙන් 2014.09.26 දින ඌව පළාත් සභාව වෙනුවෙන් ද ඡන්ද විමසීම් පවත්වන ලදී.

එබැවින් සියලුම පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීමෙන් අනතුරුව ඒවාට අදාළ සියලුම වාර්තා හා තොරතුරු ඒකරාශී කොට අධ්‍යයනය කිරීමෙන් අනතුරුව මෙම වාර්තාව නිකුත් කිරීමට සිදු වූ අතර, එය ඉතාම අසීරු හා වෙහෙසකර කාර්යයක් විය. සාමාන්‍යයෙන් ඡන්ද විමසීම් වාර්තාවක් නිකුත් කිරීම සඳහා එය අවසන්ව වසර දෙකක පමණ කාලයක් ගත වේ. මෙම ඡන්ද විමසීමට අදාළ වාර්තාව නිකුත් කිරීම සඳහා ද එයටත් වඩා කාලයක් ගත වී ඇත. එක් එක් අදියරට අදාළව පැන නැගී ඇති අධිකරණමය ක්‍රියාමාර්ග අවසන්ව නොතිබීමත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත වීම සහ ඊට අදාළ පරිපාලනමය හා ආයතනමය කාර්යයන් සිදු කිරීමට සැලකිය යුතු කාලයක් ගත වීමත් සහ එම කාර්යයන් අවසන්ව වාර්තාව සකස් කිරීම ආරම්භ වූ පසු නව මැතිවරණ ක්‍රමවේදයකට අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීමට සිදුවීමත් නිසා නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය හේතු කොට ගෙන මෙම වාර්තාව නිකුත් කිරීම ප්‍රමාද වූ බව සඳහන් කළ යුතුව ඇත.

ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් සංවිධානය කිරීම හා මෙහෙයවීමේ වගකීම මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැවරුණ ද, එය අත්‍යන්තයෙන්ම සාමූහික ක්‍රියාවලියකි. එමෙන්ම සාමූහික කර්තව්‍යයක් වූ මෙම වාර්තාව සැකසීමේ දී යූ. අමරදාස මහතා, (අතිරේක මැතිවරණ කොමසාරිස් පසුව මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්) ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා, (අතිරේක මැතිවරණ කොමසාරිස් පසුව මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්) සහ අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන් වූ එම්.ඒ.පී.සී. පෙරේරා මහතා, එම්.එම්. මොහමඩ් මහතා, සමන් ශ්‍රී රත්නායක මහතා ඇතුළු මැතිවරණ මහලේකම් කාර්යාලයේ සමස්ත කාර්ය මණ්ඩලය මා වෙත ලබා දුන් සහයෝගය හා කැපවීම බෙහෙවින් අගය කරමි. එමෙන්ම භාෂා පරිවර්තක කටයුතු සඳහා සහය වූ ලංකා මැතිවරණ වෘත්තීකයන්ගේ සංසදයේ සභාපති එස්. මැදවැව මහතාට ද බෙහෙවින් කෘතිඥ වෙමි.

ලංකාවේ පමණක් නොව විදෙස් රටවල ද ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විද්‍යාර්ථීන්, පර්යේෂකයන් ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය හා එහි විකාශය ස්වකීය අධ්‍යයනය හා පර්යේෂණ කටයුතු සඳහා මාතෘකා කොට ගෙන ඇත. ඡන්ද විමසීම් අවසානයේ දී නිකුත් කරනු ලබන මෙබඳු වාර්තා ඔවුන්ගේ ශාස්ත්‍රීය කටයුතුවලට මනා පිටුවහලක් වී ඇති බව අප වෙත ලැබෙන ප්‍රතිචාර තුළින් ස්ථිර වේ. ඡන්ද විමසීමට අදාළ මූලිකාංග වූ ඡන්ද විමසීම් ඉතිහාසය, ආණ්ඩුක්‍රම හා පනත්වල දැක්වෙන විධි විධාන, ඡන්ද විමසීම් ක්‍රියාවලිය, නීති රීති හා ඒවා බලාත්මක කිරීම, උපමාන හා ආචාර ධර්ම නිකුත් කිරීම, ප්‍රතිඵල හා සංඛ්‍යා සටහන් ආදී තොරතුරුවලින් සංගෘහිත මෙම වාර්තාව ඒ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම පාර්ශවයන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇතැයි හඟිමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්
(2011.03.25 සිට 2015.11.13 දක්වා)

2018 ජූලි 11 දින
මැතිවරණ කොමිෂන් සභාව
රාජගිරිය

පටුන

I වැනි කොටස 1

හැඳින්වීම 1

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හා පළාත් සභා පනතේ විධිවිධාන 1

පළාත් සභා සංස්ථාපනය 1

පළාත් සභා පරිපාලන ඒකකය 2

පළාත් සභා වෙනුවෙන් තෝරා පත් කරගත යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 3

පළාත් සභාවක මන්ත්‍රීවරුන් සඳහා සුදුසුකම් 4

ඡන්ද විමසීමේ කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 5

පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් වලංගු ඡන්දහිමි නාමලේඛනය 5

ඡන්ද විමසීම පරිපාලනය කිරීම සහ තේරීම්භාර නිලධාරීන් 5

II වන කොටස 6

ඡන්ද විමසීම්වලට අදාළ මූලික කටයුතු 6

ඡන්ද විමසීම් සඳහා වලංගු වූ ඡන්දහිමි නාමලේඛන 7

උතුරු පළාත වෙනුවෙන් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සැකසීම 7

ඡන්ද මධ්‍යස්ථාන 8

අවතැන් වූ ඡන්දහිමියන්ට පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 125 අ වගන්තිය අනුව වෙනත් ඡන්දපොළවල පහසුකම් සැලසීම 10

පිළිගත් දේශපාලන පක්ෂ 11

III වන කොටස 13

නාමයෝජනා භාර ගැනීම 13

නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව පළාත් සභා 13

මධ්‍යම, උතුරු සහ වයඹ පළාත් සභා 14

බස්නාහිර සහ දකුණ පළාත් සභා 14

ඌව පළාත් සභාව 15

ඡන්ද පත්‍රිකා 17

IV වන කොටස 19

ඡන්ද විමසීම් සඳහා පූර්ව අවශ්‍යතා 19

තැපෑලෙන් ඡන්දය දීම 19

තැපැල් ඡන්දහිමියන්ගේ නාමලේඛන 20

ඡන්ද විමසීම් පිළිබඳ දැන්වීම 21

නිල ඡන්ද දැන්වීම්පත් 21

නිල ඡන්ද දැන්වීම්පත් මුද්‍රණය කිරීම 22

පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 28 (1) වගන්තිය අනුව ඡන්ද පොළවල ප්‍රදර්ශනය කළ යුතු දැන්වීම් 24

නොමැකිය හැකි තීන්ත 24

නිල ලකුණේ මුද්‍රාව ඡන්ද පත්‍රිකාවේ තැබීම 24

ශාරීරික දුබලතාවයෙන් පෙළෙන තැනැත්තන් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම් 25

අශක්තතාවට පත් ඡන්දදායකයකුට ඡන්දය ප්‍රකාශ කිරීමේ දී සහාය වීමට යම් තැනැත්තකු කැටුව ඡන්ද පොළට යාමට ඉඩ ලබා දීම 25

සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු දීම 25

ඡන්දදායකයාගේ අනන්‍යතාව නිශ්චය කර ගැනීම 26
මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීම 27

V වන කොටස 29
පිළිගත් දේශපාලන පක්ෂ නියෝජිතයින්, බලයලත් නියෝජිතයින් හා ස්වාධීන කණ්ඩායම් නායකයින් සමග සාකච්ඡා කිරීම 29
දේශපාලන පක්ෂ, ස්වධීන කණ්ඩායම් සහ ඒවායේ අපේක්ෂකයින් වෙනුවෙන් ආචාර ධර්ම පද්ධතියක් නිකුත් කිරීම 31
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති මැතිවරණ මාර්ගෝපදේශ 32

VI වන කොටස 33
කාර්ය මණ්ඩලය හා ප්‍රවාහන කටයුතු 33
කාර්ය මණ්ඩල යෙදවීම 33
නිලධාරීන් පුහුණු කිරීම 35
ප්‍රවාහන කටයුතු සංවිධානය 37

VII වන කොටස 38
මැතිවරණ නීති කඩ කිරීම් වැළැක්වීම 38
මැතිවරණ කාල සීමාව තුළ දී රජයේ දේපළ අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම 39
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (1) (5) ඡේද අනුව ගුවන්විදුලි හෝ රූපවාහිනී සේවාවන් හා ප්‍රවෘත්ති පත්‍ර අයිතිකරුවන්/ ප්‍රකාශකයින් වෙත උපමාන නිකුත් කිරීම 40
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4 අ) (ආ) ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවයට අදාළ කරුණු පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් උපදෙස් නිකුත් කිරීම 40
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ, (1) ව්‍යවස්ථාව අනුව මැතිවරණ දෙපාර්තමේන්තුව ඡන්ද විමසීම් කාලය තුළ ශ්‍රී ලංකා පොලිසිය සමග ක්‍රියා කිරීම 41
මැතිවරණ රාජකාරී සම්බන්ධ උපදෙස් මාලාවක් පොලිසිය වෙත නිකුත් කිරීම 41
දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් නියෝජිතයින් සමග පැවති සාකච්ඡාවලට පොලිසිය සහභාගී වීම 42
ඡන්ද විමසීම් කාලය තුළ ඡන්ද විමසීමට අදාළ පැමිණිලි භාර ගැනීම හා පොලිසියේ සහාය ඇතිව පැමිණිලි පිළිබඳව සොයා බැලීමට වැඩපිළිවෙල යෙදීම 42
මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවන ලද මැතිවරණ පැමිණිලි භාරගැනීමේ මධ්‍යස්ථාන 43
දිස්ත්‍රික්කවල හා ප්‍රාදේශීය වශයෙන් පිහිටුවන ලද පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථාන 43
පැමිණිලි ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයන් හා සංවිධාන 43
මැතිවරණ කොමසාරිස්වරයා විසින් විශේෂ විමර්ශන නිලධාරීන් යොදවා පැමිණිලි සම්බන්ධව සොයා බැලීම 44
මැතිවරණ කොමසාරිස්වරයාට හා තේරීම්භාර නිලධාරීන්ට ලැබුණු පැමිණිලිවල ස්වභාවය 44
මැතිවරණ නීති උල්ලංඝනය කිරීම: නීති විරෝධී මැතිවරණ දැන්වීම් ප්‍රදර්ශනය 44
මැතිවරණ නීති උල්ලංඝනය කිරීම: නීති විරෝධී රැස්වීම් පැවැත්වීම හා අනවසර පෙළපාලි/ පෙරහැර පැවැත්වීම 45
මැතිවරණ නීති උල්ලංඝනය කිරීම: නීති විරෝධී ඡන්ද විමසීම් කාර්යාල පිහිටුවීම 47
මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් : ඡන්දදායකයින්ට බලපෑම් කිරීම 48
රාජ්‍ය දේපල අනිසි ලෙස භාවිතා කිරීම : රජයේ වාහන මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා අනිසි ලෙස යොදවා ගැනීම 48
රජයේ දේපල අනිසි ලෙස භාවිතා කිරීම : රජයට අයත් ගොඩනැගිලි ආදිය මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් යොදා ගැනීම 49

රජයේ දේපල අනිසි ලෙස භාවිතා කිරීම : පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තැපැල් මුද්දර අනිසි ලෙස භාවිතා කිරීම 49
රජයේ දේපළ අනිසි ලෙස භාවිතා කිරීම : රාජ්‍ය උත්සව පැවැත්වීම මගින් අපේක්ෂකයින්ට වාසි ලබා දීම 50
මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථානයට සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ලැබුණු පැමිණිලි 50
නැගෙනහිර පළාත 50
මඩකලපුව දිස්ත්‍රික්කය 50
අම්පාර දිස්ත්‍රික්කය 51
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය 53
උතුරු මැද පළාත 54
අනුරාධපුර දිස්ත්‍රික්කය 54
පොළොන්නරුව දිස්ත්‍රික්කය 55
සබරගමුව පළාත 55
රත්නපුර දිස්ත්‍රික්කය 55
කෑගල්ල දිස්ත්‍රික්කය 56
මධ්‍යම පළාත 57
මහනුවර දිස්ත්‍රික්කය 57
නුවරඑළිය දිස්ත්‍රික්කය 57
මාතලේ දිස්ත්‍රික්කය 58
උතුරු පළාත 59
වයඹ පළාත 61
පුත්තලම දිස්ත්‍රික්කය 61
කුරුණෑගල දිස්ත්‍රික්කය 61
බස්නාහිර පළාත 63
කොළඹ දිස්ත්‍රික්කය 63
කළුතර දිස්ත්‍රික්කය 64
ගම්පහ දිස්ත්‍රික්කය 65
දකුණු පළාත 66
ගාල්ල දිස්ත්‍රික්කය 66
මාතර දිස්ත්‍රික්කය 66
හම්බන්තොට දිස්ත්‍රික්කය 67
ඌව පළාත 68
මොණරාගල දිස්ත්‍රික්කය 68
බදුල්ල දිස්ත්‍රික්කය 69
ඌව පළාතේ පළාත් සභා ඡන්ද විමසීම් කාලයේ දිවි නැගුම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන්, ක්ෂේත්‍ර සමීක්ෂණයක් සඳහා යොදවා ගැනීම 70
මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉහත ලිපියට 2014.08.28 වන දින පිළිතුරු එවමින්, ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා පහත සඳහන් කරුණු දන්වා ඇත 71
මොණරාගල දිස්ත්‍රික්කයේ නියඟයෙන් පීඩා විඳි ගොවි පවුල්වලට සහනාධාර මුදල් ඡන්ද විමසීම් කාලය තුළ ලබා දීම 72

VIII වන කොටස 75
උතුරු පළාතේ ඡන්ද විමසීම් කටයුතු සංවිධානය 75
ඡන්දහිමියන් ගණන් ගැනීම හා ඡන්දහිමි නාමලේඛන සැකසීම 76

උතුරු හා නැගෙනහිර පළාත්වල 2008 සිට 2013 දක්වා ගෙන් ගෙට ගොස් ඡන්දහිමියන් ගණන් නොගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කළ ඡන්ද කොට්ඨාස හා ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳ විස්තර 77
උතුරු පළාතේ වාර්ෂික ඡන්දහිමි නාමලේඛනය යාවත්කාලීන කිරීමට හා ඡන්ද විමසීම් කටයුතු ක්‍රමවත් කිරීමට ගනු ලැබූ විශේෂ ක්‍රියාමාර්ග 77

IX වන කොටස 79
ඡන්ද විමසීම 79
ඡන්ද විමසීම් දිනට ආසන්න දින වල දිස්ත්‍රික්කවල ඉටුකරන ලද කාර්යයන් 79
ඡන්ද විමසීම් දිනට පෙර දින කටයුතු, ඡන්ද මධ්‍යස්ථාන පිළියෙල කිරීම 81
ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි ඇතුළු ඡන්ද විමසීමට අවශ්‍ය දෑ නිකුත් කිරීම 81
ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ඡන්ද පොළවල් කරා පිටත් කිරීම 82
කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් 82
ආරක්ෂක කටයුතු 83
ඡන්ද විමසීම් දිනය 83
ඡන්ද විමසීම නිරීක්ෂණය කිරීම 83
උතුරු පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් විදේශීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් යෙදවීම 84

X වන කොටස 87
ඡන්ද හා මනාප ගණන් කිරීම 87
ඡන්ද ගණන් කිරීම පිළිබඳ දැන්වීම 87
ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයින් 87
ඡන්ද විමසීමෙන් පසු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගෙන් ඡන්ද පෙට්ටි, භාණ්ඩ හා වාර්තා ආදිය ආපසු භාර ගැනීම 88
ඡන්ද ගණන් කිරීම භාර නිලධාරීන් සහ සහායක කාර්ය මණ්ඩලය 88
ඡන්ද ගණන් කිරීමේ ශාලා පිහිටුවීම 89
ඡන්ද හා මනාප ගණන් කරන ලද ආකාරය 89
I වන පියවර 89
II වන පියවර 90
III වන පියවර 91

XI වන කොටස 93
ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම 93
ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම හා සම්බන්ධ දැන්වීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරනු ලබන ස්ථානය නියෝජනය කිරීම 93
ප්‍රතිඵල සැකසීමේ ස්ථාන පිළියෙල කිරීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය පත් කිරීම 93
ප්‍රතිඵල ලේඛන භාර ගැනීම 93
ප්‍රතිඵල සැකසීම හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ අවස්ථා 94

XII වන කොටස 95
ඡන්ද විමසීම සඳහා වියදම 95

XIII වන කොටස 97
නිරීක්ෂණ හා නිර්දේශය 97
ඡන්ද විමසීම් සඳහා දින නියම කිරීම 97
නාමයෝජනා පත්‍රවලට අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීම 98

පළාත් සභා ඡන්ද විමසීම් සඳහා අපේක්ෂකයින් වශයෙන් ඉදිරිපත්වන පළාත් පාලන ආයතනවල නියෝජිතයින් 99
අපේක්ෂකයින්ගේ ආරක්ෂාව 99
තැපෑලෙන් ඡන්දය දීම 100
මැතිවරණ ප්‍රචාරණ කටයුත්ත 101
රජයේ දේපළ දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් භාවිතා කිරීම 102
මැතිවරණ නීති බලාත්මක කිරීම 103
විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය භාවිතය 105
ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වන පිළිගත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල සහභාගීත්වය 105
මැතිවරණ රාජකාරී, රාජ්‍ය නිලධාරීන් හා නිලධාරීන්ගේ දේශපාලන අයිතිවාසිකම් 108
ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප වීම හා මනාප අවලංගු වීම 109
ඡන්ද විමසීම පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව පරීක්ෂා කිරීම හා ඊට අදාළ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම 110

XIV වන කොටස 112
ඇගයීම 112

XV වන කොටස 115
සමාප්තිය 115

පරිශිෂ්ඨ

01. නැගෙනහිර පළාත් සභාව විසුරුවා හරිමින් එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් 2012.06.27 දින අංක 1764/06 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් 119

02. උතුරු මැද පළාත් සභාව විසුරුවා හරිමින් එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් 2012.06.27 දින අංක 1764/07 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් 119

03. සබරගමුව පළාත් සභාව විසුරුවා හරිමින් එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් 2012.06.27 දින අංක 1764/08 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් 119

04. මධ්‍යම පළාත් සභාව විසුරුවා හරිමින් එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් 2013.07.05 දින අංක 1817/38 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් 120

05. වයඹ පළාත් සභාව විසුරුවා හරිමින් එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් 2013.07.05 දින අංක 1817/39 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් 120

06. බස්නාහිර පළාත් සභාව විසුරුවා හරිමින් එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් 2014.01.12 දින අංක 1844/75 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් 120

07. දකුණු පළාත් සභාව විසුරුවා හරිමින් එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් 2014.01.12 දින අංක 1844/76 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් 121

08. ඌව පළාත් සභාව විසුරුවා හරිමින් එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් 2014.07.11දින අංක 1870/64 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම්. 121

09. මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ නැගෙනහිර, උතුරුමැද සහ සබරගමුව යන පළාත් සභා වෙනුවෙන් 2012.06.28 අංක 1764/15 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නාමයෝජනා කැඳවීමේ දැන්වීම්....112

10. මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ මධ්‍යම, වයඹ සහ උතුරු යන පළාත් සභා වෙනුවෙන් 2013.07.11 අංක 1818/21 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නාමයෝජනා කැඳවීමේ දැන්වීම්.... 126

11. මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ බස්නාහිර සහ දකුණ යන පළාත් සභා වෙනුවෙන් 2014.01.16 අංක 1845/18 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නාමයෝජනා කැඳවීමේ දැන්වීම් 130

12. මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ 2014.07.16 දින අංක 1871/32 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඌව පළාත් සභාව වෙනුවෙන් වූ නාමයෝජනා කැඳවීමේ දැන්වීම. 133

13. නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා ඡන්ද විමසීම - 2012 පිළිගත් දේශපාලන පක්ෂ නාමලේඛනය. 134

14. මධ්‍යම, උතුරු සහ වයඹ පළාත් සභා ඡන්ද විමසීම - 2013 පිළිගත් දේශපාලන පක්ෂ නාමලේඛනය.....135

15. බස්නාහිර සහ දකුණු පළාත් සභා ඡන්ද විමසීම - 2014 පිළිගත් දේශපාලන පක්ෂ නාමලේඛනය.....136

16. ඌව පළාත් සභා ඡන්ද විමසීම - 2014 පිළිගත් දේශපාලන පක්ෂ නාමලේඛනය. 137

17. පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014 පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ 138

18. පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014 නාමයෝජනා ක්‍රියාවලිය.....139
නැගෙනහිර පළාතේ පළාත් සභාව 140
උතුරු මැද පළාතේ පළාත් සභාව.....146
සබරගමුව පළාතේ පළාත් සභාව 148
මධ්‍යම පළාතේ පළාත් සභාව 151
උතුරු පළාතේ පළාත් සභාව.....156
වයඹ පළාතේ පළාත් සභාව 161
බස්නාහිර පළාතේ පළාත් සභාව.....164
දකුණු පළාතේ පළාත් සභාව.....169
ඌව පළාතේ පළාත් සභාව 172

19. තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.08.03 දින ඌව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව පළ කරන ලද මාධ්‍ය නිවේදනය.....174

20. අශක්නුතාවට පත් ඡන්ද හිමියෙකුට ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවසර ලබා දෙන නීතිමය ප්‍රතිපාදනය පිළිබඳ ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.08.28 දින පළ කරන ලද මාධ්‍ය නිවේදනය 175

21. කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් වෙනුවෙන් විශේෂ ප්‍රවාහන පහසුකම් ලබා ගත හැකි ආකාරය පිළිබඳව ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.08.13 දින පළ කරන ලද මාධ්‍ය නිවේදනය.....176

22. ඡන්ද දායකයා විසින් ඡන්ද පොළේ දී තම අනන්‍යතාවය තහුවරු කළ යුතු ආකාරය පිළිබඳව 2014.08.18 දින ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කරන ලද මාධ්‍ය නිවේදනය 178

23. ඡන්ද ප්‍රකාශ කිරීම සහ මනාප ලකුණු කිරීම පිළිබඳව 2014.08.17 දින ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කරන ලද මාධ්‍ය නිවේදනය..... 179

24. සේවා නියුක්තියන්ට ඡන්දය දීම සඳහා නිවාඩු ලබා දිය යුතු ආකාරය පිළිබඳව සේවා යෝජකයන් දැනුවත් කිරීම සඳහා 2014.08.25 දින ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කරන ලද මාධ්‍ය නිවේදනය..... 180

25. තැපැල් ඡන්ද දායකයින් සහ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්, තැපැල් ඡන්දය සලකුණු කිරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2014.08.21 දින ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කරන ලද මාධ්‍ය නිවේදනය 181

26. 2014.07.28 දින ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව ඡන්ද විමසීම් තරග කරනු ලබන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ද, අපේක්ෂකයින් ද වෙනුවෙන් නිකුත් කරන ලද ආචාරධර්ම පද්ධතිය..... 182

27. 2014.08.09 දින ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව ඡන්ද විමසීම් නිරීක්ෂණ ආයතන හා නිරීක්ෂකයින් වෙනුවෙන් නිකුත් කරන ලද ආචාරධර්ම පද්ධතිය..... 186

28. ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව ඡන්ද විමසීම් නිරීක්ෂණ ආයතන වල නිලධාරීන් හා නිරීක්ෂකයින් විසින් ලබා දිය යුතු වූ ප්‍රතිඥාව..... 187

29. 2014.07.16 දින ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාව..... 188

30. 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 61ඇ (2) වගන්තිය යටතේ එක් එක් පළාත් සභාව වෙනුවෙන් තෝරාපත් කරගන්නා ලද මන්ත්‍රීවරුන්ගේ නාමලේඛනය..... 192

31. පළාත් සභා ඡන්ද විමසීමට අදාළව පැවති නඩු විභාග පිළිබඳ විස්තර දැක්වෙන සාරාංශය 193

32. 2013.07.13 වන දින මධ්‍යම, උතුරු හා වයඹ යන පළාත් සභා ඡන්ද විමසීම්වලට අදාළව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙනුවෙන් නිකුත් කරන ලද ආචාර ධර්ම පද්ධතිය..... 197

සංඛ්‍යා සටහන්

01. පළාත් සභා විසුරවන ලද දින, ඡන්ද විමසීම් සඳහා නාමයෝජනා කැඳවන ලද දින හා ඡන්ද විමසිම් පැවති දින (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014)..... 201

02. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරා ගැනීමට නියමිත වූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014)..... 202

03. පරිපාලන දිස්ත්‍රික්ක යටතේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව, ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව හා ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014)..... 203

04. පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව, ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව සහ ඒවා නියෝජනය කළ අපේක්ෂකයන් සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014)..... 204

05. වර්ෂ 2012 දී පැවති නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව යන පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද දේශපාලන පක්ෂ..... 205

06. වර්ෂ 2013 දී පැවති මධ්‍යම, උතුරු සහ වයඹ යන පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද දේශපාලන පක්ෂ..... 206

07. වර්ෂ 2014 දී පැවති බස්නාහිර හා දකුණු පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් තරග කරන ලද දේශපාලන පක්ෂ 207

08. වර්ෂ 2014 දී පැවති ඌව පළාත් සභාවේ ඡන්ද විමසීම වෙනුවෙන් පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද දේශපාලන පක්ෂ 208

09. තරග කරන ලද දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ ඒවායේ ලකුණු ද අපේක්ෂකයින්ගේ නම් සහ ඔවුන්ට වෙන් කරන ලද හඳුනාගැනීමේ අංක ද ඇතුළත් ගෘහයන් වෙත තැපෑලෙන් යවන ලද ගෘහ දැන්වීම් සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014)..... 209

10. තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව හා ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව (ප්‍රතික්ෂේප වීමට හේතු වූ කරුණු අනුව) (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014)..... 210

11. ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවන ලද ගොඩනැගිලි වර්ග අනුව ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014) 211

12. ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව, ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව අනුව වර්ග කිරීම (නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව යන පළාත් සභා ඡන්ද විමසීම් - 2012) 212

12-I ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව, ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව අනුව වර්ග කිරීම (මධ්‍යම, උතුරු, වයඹ, බස්නාහිර, දකුණ සහ ඌව යන පළාත් සභා ඡන්ද විමසීම් - 2013/2014)..... 213

13. මැතිවරණ රාජකාරි වෙනුවෙන් භාවිතා කරන ලද වාහන සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014)..... 214

14. ඡන්ද විමසීම් සඳහා කාර්ය මණ්ඩල යෙදවීම (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014) 215

15. ඡන්ද ගණන් කිරීම සඳහා යොදා ගත් නිලධාරී මණ්ඩලය (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014).... 216

16. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ පිහිටුවන ලද ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014) 217

17. නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව, ගණන් කිරීමට ලද සංඛ්‍යාව හා පක්ෂ හා කණ්ඩායම් අනුව ගණන් කිරීමේ දී ප්‍රතික්ෂේප වූ තැපැල් ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව. 218

18. පිළිගත් දේශපාලන පක්ෂ පරිපාලන දිස්ත්‍රික්ක අනුව ලබාගත් ඡන්ද සංඛ්‍යාව, ප්‍රතිශතය හා හිමිකර ගත් ආසන සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014)..... 219

19. දේශපාලන පක්ෂ තරගකළ පළාත් සභා සංඛ්‍යාව, පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව,ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව හා හිමිකරගත් මන්ත්‍රී ධුර සංඛ්‍යාව (පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014) 225

20. පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව, පක්ෂ ලබා ගත් මුළු ඡන්ද සංඛ්‍යාව හා ප්‍රතිශතය, ලැබුණු මන්ත්‍රීධුර සංඛ්‍යාව, දෙන ලද ඡන්ද සංඛ්‍යාවෙන් 1% ට වඩා අඩු ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව... 226

21. පළාත් සභාවල මන්ත්‍රීධුර දේශපාලන පක්ෂ අතර බෙදී ගිය ආකාරය..... 228

22. පළාත් සභා මන්ත්‍රීධුර හිමි වූ දේශපාලන පක්ෂ, පළාත් අනුව ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාව, ඡන්ද ප්‍රතිශතය හා හිමිකරගත් මන්ත්‍රීධුර සංඛ්‍යාව..... 229

23. එක් එක් පළාත් සභාවේ පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරඟ කරන ලද දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ඡන්ද ප්‍රදේශ අනුව ලබාගත් ඡන්ද සංඛ්‍යාව, දෙන ලද ඡන්ද සංඛ්‍යාව සහ ප්‍රතිශතය සහ ප්‍රතික්ෂේප වූ ඡන්ද සංඛ්‍යාව 230

24. ඡන්ද විමසීමේ දී මන්ත්‍රී ධූර හිමි වූ දේශපාලන පක්ෂ නියෝජනය කරන ලද අපේක්ෂකයින් විසින් ලබාගන්නා ලද මනාප සංඛ්‍යාව 257

25. පළාත් සභා ඡන්ද විමසීමේ දී මැතිවරණ දෙපාර්තමේන්තුව ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදන මත පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව හා මුද්‍රණ දෙපාර්තමේන්තුව වැය කරන ලද මුදල 386

26. ඡන්ද විමසීම් වියදම් වාර්තාව (වියදමේ ස්වභාවය අනුව) 387

I වන කොටස

හැඳින්වීම

1. 1978 ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වාදීම සමඟ මෙරට පළාත් සභා ක්‍රමයෙහි ආරම්භය සනිටුහන් වේ. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුතින් ඇතුළත් කරන ලද XVII ඒ පරිච්ඡේදයේ විධිවිධාන, 1988 ජනවාරි මස 26 වන දින සිට ක්‍රියාත්මක වේ.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ (8) (ආ) වන ඡේදය අනුව, පළාත් සභාවක් වාරාවසානය කිරීමට ආණ්ඩුකාරවරයාට ඇති බලතල අනුව පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු,1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 (1) වන වගන්තිය ප්‍රකාරව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීමක් පැවැත්වීමේ තම අදහස ප්‍රකාශ කළ යුතුවේ. නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් සභා 2012.06.27 දිනද, මධ්‍යම හා වයඹ පළාත් සභා 2013.07.05 දින ද ඒවායේ ආණ්ඩුකාරවරුන් විසින් විසුරුවා හරින ලදී. උතුරු පළාත් සභාව වෙනුවෙන් ඡන්ද විමසීමක් පවත්වන ලෙස ජනාධිපතිවරයා, 2013.07.05 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ (2) ව්‍යවස්ථාව අනුව, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 (1) වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස්වරයාට විධානය කළේය. බස්නාහිර හා දකුණ යන පළාත් සභා 2014.01.13 දින ද, ඌව පළාත් සභාව 2014.07.11 දින ද විසුරුවා හරින ලදී. මෙසේ විසුරුවාහරින ලද පළාත් සභා 8 හි සහ ඡන්ද විමසීම් පවත්වන ලෙස ජනාධිපතිවරයාගේ විධානය ලද උතුරු පළාත් සභාව ද වෙනුවෙන්, එම විසුරුවා හැරීම් සිදු වූ එක් එක් දින හා අදාළ විධානය ලද දින සිට සතියක් ඇතුළත ඡන්ද විමසීම් පැවැත්වීමේ සිය අදහස මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැන්වීම් මගින් පළ කරන ලදී. ඒ අනුව නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් සභා වෙනුවෙන් 2012.06.08 දින ද, මධ්‍යම, උතුරු හා වයඹ පළාත් සභා වෙනුවෙන් 2013.07.11 දින ද, බස්නාහිර හා දකුණු පළාත් සභා වෙනුවෙන් 2014.01.16 දින ද, ඌව පළාත් සභාව වෙනුවෙන් 2014.07.16 දින ද එම දැන්වීම් ප්‍රකාශයට පත් කරන ලදී. එක් එක් පළාත් සභාව විසුරුවා හරිමින් ආණ්ඩුකාරවරුන් විසින් ගැසට් පත්‍රවල පළ කරන ලද දැන්වීම්, මෙම වාර්තාවේ අංක 1 සිට 8 දක්වා වූ පරිශිෂ්ඨවලට ඇතුළත් කර ඇත. මෙම පළාත් සභා වෙනුවෙන් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා නාමයෝජනා භාර ගැනීමෙන් පසු, ඡන්ද විමසීමේ දැන්වීම් පළ කොට, ඡන්ද විමසීම් දින ද නියම කරන ලදී. මේ පිළිබඳ විස්තර අංක 1 දරන සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හා පළාත් සභා පනතේ විධිවිධාන

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයේ බස්නාහිර, වයඹ, ඌව, සබරගමුව, මධ්‍යම, නැගෙනහිර, දකුණු, උතුරුමැද හා උතුරු යනුවෙන් දැක්වෙන පළාත් සංඛ්‍යාව 9කි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 154 අ (2) වන ව්‍යවස්ථාව අනුව, පළාත් සභා වෙනුවෙන් මන්ත්‍රීවරුන් තෝරාපත් කරනු ලැබූ විට, පළාත් සභා සංස්ථාපනය වනු ඇත. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 1 වන වගන්තිය අනුව, එම සංශෝධන ක්‍රියාත්මක වන දිනය වශයෙන්, ජනාධිපතිවරයා විසින් නියම කරන ලද්දේ, 1988 ජනවාරි මස 26 දිනය යි. මෙසේ පිහිටුවන ලද පළාත් සභාවල අනුගමනය කළයුතු කාර්යය පටිපාටිය සහ පළාත් රාජ්‍ය සේවය හා සම්බන්ධ කරුණු වෙනුවෙන් විධිවිධාන සැලැස්වීමට පනවන ලද 1987 අංක 42 දරන පළාත් සභා පනත ක්‍රියාත්මක කරන ලද්දේ 1988.02.01 දින සිටය. පළාත් සභාවල මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ කාර්ය පටිපාටිය හා ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමට පනවන ලද, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත, 1988 පෙබරවාරි මස 02 දින සිට ක්‍රියාත්මක වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය, 1987 අංක 42 දරන පළාත් සභා පනත හා 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යන පනත් ද පළාත් සභා ඡන්ද විමසීමට අදාළ නීතිමය විධිවිධාන ඇතුළත් වන මූලික ලේඛන වේ. ඉන් අනතුරුව පළාත් සභා ඡන්ද විමසීමට අදාළ පනතේ විධිවිධාන, 1988 අංක 35, 1988 අංක 55, 1990 අංක 29, 1993 අංක 7, 2004 අංක 5, 2004 අංක 14 හා 2011 අංක 28 දරන සංශෝධන පනත් මාර්ගයෙන් ද සංශෝධනය වී ඇත. මෙම පළාත් සභා ඡන්ද විමසීමට අදාළ ප්‍රධාන නීතිමය විධිවිධාන කෙරෙහි මෙම අවස්ථාවේ අවධානය යොමු කිරීම සුදුසු වේ.

පළාත් සභා සංස්ථාපනය

4. 1987 නොවැම්බර් මස 14 වන දින සහතික කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, 1988 ජනවාරි මස 26 වන දින සිට ක්‍රියාත්මක වේ. මෙම සංශෝධනය XVII ඒ පරිච්ඡේදය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත්ව ඇති අතර, 154 අ සිට 154 ඩ දක්වා වූ ව්‍යවස්ථාවන් ඊට ඇතුළත්ව ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයේ නිශ්චිතව සඳහන්

වන පළාත් සඳහා, පළාත් සභා පිහිටුවනු ලබන බව 154 අ (1) අනු ව්‍යවස්ථාවේ දැක්වෙන අතර, 154 අ (2) අනු ව්‍යවස්ථාවේ හා පළාත් සභා ඡන්ද විමසීම් නීතියට අනුව, එම සභා වෙනුවෙන් මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගනු ලැබූ විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ ව්‍යවස්ථාවේ සඳහන් 8 වන පරිශිෂ්ඨයෙහි දක්වා ඇති පළාත් සභා 9 හි පළාත් සභා සංස්ථාපනය විය යුතුය.

පළාත් සභා පරිපාලන ඒකකය

5. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව, පළාතකට ඇතුළත් පරිපාලන දිස්ත්‍රික්ක සංයුක්ත වීමෙන්, පළාත් සභා පරිපාලන ඒකකය නිර්මාණය වේ. මෙම පරිපාලන ඒකකය ආණ්ඩුකාරවරයෙකුගෙන්, ප්‍රධාන අමාත්‍යවරයෙකුගෙන් හා අමාත්‍ය මණ්ඩලයකින් සමන්විත විය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ (3) අනු ව්‍යවස්ථාව අනුව, මෙවැනි පරිපාලන ඒකකයක්, එකිනෙකට යාබද පළාත් දෙකක් හෝ තුනක් සම්බන්ධ කර පිහිටුවා ගැනීමට අවකාශය ඇත. එසේ පළාත් කීපයක් සම්බන්ධ කර ගනිමින් පළාත් සභාවක් පිහිටුවීම නිශ්චය කළ යුතු ආකාරය පිළිබඳ නීති සම්පාදනය කිරීමේ වගකීම පාර්ලිමේන්තුව සතුවන අතර, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 37 වන වගන්තියේ, මෙවැනි පළාත් කීපයක් සම්බන්ධ කොට පළාත් සභාවක් ස්ථාපිත කළහැකි ආකාරය දක්වා ඇත. මෙසේ නිශ්චිත පළාත් දෙකකට හෝ තුනකට අදාළ වන ආකාරයට එක් පළාත් සභාවක් ස්ථාපිත කිරීමේ බලය, 37(1) අ වගන්තිය අනුව ජනාධිපතිවරයාට හිමිව තිබේ.

6. තවද, උතුරු හා නැගෙනහිර යන පළාත් දෙකට, පළාත් සභා පනතේ දැක්වෙන පරිදි එක් පළාත් සභාවකට අදාළ නීතිමය විධිවිධාන බල පැවැත්වෙන බවට වූ ජනාධිපතිවරයාගේ ප්‍රකාශය, 1988 ක් වූ සැප්තැම්බර් මස 7 වන දින නිකුත්විය. (1988 සැප්තැම්බර් 8 දිනැති අංක 522/9 දරන ගැසට් පත්‍රයේ මෙම දැන්වීම පළවී ඇත.) මෙවැනි පළාත් කිහිපයක් වෙනුවෙන් එක් පරිපාලන ඒකකයක් ඇති කරනු ලැබූ අවස්ථාවක, එවැනි පළාත් වෙනුවෙන් එක් පළාත් සභාවක් දිගටම පැවතිය යුතු ද, එසේ නොමැතිනම් ඒ ඒ පළාත් වෙනුවෙන් වෙන වෙනම වූ පළාත් සභා තිබිය යුතුදැයි තීරණය කරන්නා වූ ඡන්ද විමසීමක්, පළාත් දෙකේ හෝ අදාළ පළාත්වල පැවැත්විය යුතුයැයි ජනාධිපතිවරයා විසින් නියම කළ යුතුය.

7. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 37 (1) (අ) වගන්තිය අනුව, ජනාධිපතිවරයා විසින් උතුරු හා නැගෙනහිර පළාත් වෙනුවෙන් එක් පරිපාලන ඒකකයකින් යුත් පළාත් සභාවක් පිහිටුවනු ලැබීය. ඉන්පසු, එම පනතේ 37 (2) (අ) වගන්තිය අනුව එවැනි පරිපාලන ඒකකයක් ඒ අයුරින්ම පැවතිය යුතු ද, එසේ නොමැතිව එම පළාත් වෙනුවෙන් වෙන් වූ පළාත් සභා පිහිටුවිය යුතු ද යන්න තීරණය කිරීමට ඡන්ද විමසීම්, 1988 දෙසැම්බර් මස 31 වන දිනට පසු නොවන දිනයක පැවැත්විය යුතු බවට ද නියම වී තිබිණි.

8. මෙවැනි ඡන්ද විමසීම් දින හෝ දිනය, ජනාධිපතිවරයාගේ අභිමතය අනුව කෙරෙන නියමය මගින් කලින් කල කල් තබනු ලැබිය හැකි බව, එම පනතේ 37 (2) (අා) වගන්තියේ දැක්වේ. ඒ අනුව මෙම ජනමත විචාරණය දිගින් දිගටම ජනාධිපතිවරයා විසින් කල් දමනු ලැබූ අතර, 1990 අංක 27 දරන පළාත් සභා (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම නිසා, උතුරු නැගෙනහිර පළාත් සභාව විසුරුවා හැරීමට සිදුවිය. මේ පිළිබඳව 1990 වර්ෂයට අදාළ මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්ෂික වාර්තාවේ 6.1 ඡේදයේ දැක්වෙන්නේ මෙසේය.

"1990 අංක 27 දරන පළාත් සභා (සංශෝධන) පනතේ 5 (3) වන වගන්තිය යටතේ, මන්ත්‍රීවරයෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනතභාවය දැක්වීම ප්‍රතික්ෂේප කර ඇති බවට හෝ පැහැදිලි ලෙසම එසේ ප්‍රතික්ෂේප කොට ඇති බවට ආණ්ඩුකාරවරයා විසින් යම් පළාත් සභාවක සභාපතිවරයකු වෙත දැනුම් දෙනු ලැබූ අවස්ථාවක, එසේ දැනුම් දෙන ලද දින සිට එම මන්ත්‍රීවරයා නුසුදුස්සකු වන අතර, 5 අ වන වගන්තිය යටතේ, මේ පදනම අනුව සම්පූර්ණ මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් අඩකට වැඩි සංඛ්‍යාවක්, එසේ නුසුදුස්සන් වූ අවස්ථාවක එම නුසුදුසුවීම ජනාධිපතිතුමා වෙත දැනුම් දෙනු ලැබීමෙන් පසු, එම පළාත් සභාව නිරායාසයෙන්ම අහෝසි වේ. උතුරු සහ නැගෙනහිර පළාත්වල පළාත් සභාව සම්බන්ධයෙන් එවැනි දැනුම්දීමක් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලැබීමෙන් පසුව පළාත් සභාව විසුරුවා හරිනු ලැබ ඇතැයි සලකන ලදී. 1990 අංක 29 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 10 වන වගන්තිය යටතේ, එවැනි විසුරුවා හැරීමක් හේතුවෙන් නාමයෝජනා කැඳවීම, මැතිවරණ කොමසාරිස්වරයාට පැවරේ. ඒ අනුව, 1990 ජූලි මස 11 දාතමින් යුත් අංක 618/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල පළාත් සභාවට ඡන්ද විමසීම සඳහා නාමයෝජනා කැඳවනු ලැබීය. හදිසි අවස්ථා නියෝග යටතේ ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද අංක 618/18 හා 1990 ජූලි මස 12 දාතමින් යුත් අති විශේෂ ගැසට් පත්‍රය මගින් එම දැන්වීම අවලංගු කරන ලදී."

9. ඉහත පළාත් සභාව ඒකාබද්ධව තිබීම සම්බන්ධව එම පළාත් දෙකේ ඡන්දහිමියන්ට තීරණයක් ගැනීම සඳහා වූ ජනමත විචාරණයක් පැවැත්වීම, දිගින් දිගටම කල් තැබුණු බැවින්, මෙම පළාත් ඒකාබද්ධ කිරීම හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් කඩවූ බව දක්වමින් 2006 වර්ෂයේදී, නැගෙනහිර පළාතේ අම්පාර

පරිපාලන දිස්ත්‍රික්කයේ පුද්ගලයින් තිදෙනෙකු විසින්, ශේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් 3 ක් ඉදිරිපත් කරනු ලැබිණි. (FR 243/6, FR 244/6 සහ FR 245/6)මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කළ ගරු අධිකරණය, අයදුම්කරුවන්ට ඔවුන් අපේක්ෂා කළ සහන ලබා දෙන ලදී. මේ නිසා නැගෙනහිර පළාත වෙනුවෙන් වෙනම පළාත් සභාවක් ස්ථාපිත කිරීමට ඉඩ ලැබුණි. ඒ අනුව ජනාධිපතිවරයා විසින් නැගෙනහිර පළාත වෙනුවෙන් ඡන්ද විමසීමක් පවත්වන ලෙස 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 (1) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (අ) (2) වන ව්‍යවස්ථාව අනුව 2008.03.07 වන දින මැතිවරණ කොමසාරිස්වරයාට මග පෙන්වීම් කරනු ලැබූ බැවින්, නැගෙනහිර පළාත වෙනුවෙන් වූ වෙනම පළාත් සභාවක් ස්ථාපිත කිරීම සඳහා වූ ඡන්ද විමසීම 2008.05.10 වන දින පවත්වන ලදී.

පළාත් සභා වෙනුවෙන් තෝරා පත් කරගත යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව

10. පළාත් සභා ඡන්ද විමසීම් නීතිය අනුව, පළාතේ සෑම පරිපාලන දිස්ත්‍රික්කයක්ම ඡන්ද විමසීමේ කාර්ය සඳහා ඡන්ද විමසීම් බල ප්‍රදේශ වේ. පළාත් සභාවකට, ඊට අයත් පරිපාලන දිස්ත්‍රික්කවලින් තෝරාගනු ලැබිය යුතු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව, පරිපාලන දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් සංඛ්‍යාව හා භූමි ප්‍රමාණය පදනම් කරගෙන තීරණය කළ යුතුය. පරිපාලන දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් 40,000 කට එක් මන්ත්‍රීවරයකු බැගින් විය යුතු අතරම ඊට අමතරව දිස්ත්‍රික්කයේ සෑම වර්ග කිලෝ මීටර් 1000කට ම එක් මන්ත්‍රීවරයෙක් නියෝජනය වන ආකාරයට මන්ත්‍රී සංඛ්‍යාව ගණනය කළ යුතුය. ජන සංඛ්‍යාව පදනම් කොටගෙන නියම කරනු ලබන තෝරාගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව තීරණය කිරීම සඳහා අදාළ කරගත යුත්තේ, අවසාන මහ සංගණනය විසින් ප්‍රකාශිත ජන සංඛ්‍යාව වේ. මේ වගන්තිය යටතේ තෝරාගත යුතු මන්ත්‍රී සංඛ්‍යාව මැතිවරණ කොමසාරිස්වරයා විසින් තීරණය කළ යුතු බව, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3 (4) වගන්තියේ දැක්වේ. මෙම පළාත් සභා ස්ථාපිත කිරීමේ මුල් අවස්ථාවේදී මේ ආකාරයට එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ තෝරා පත් කර ගැනීමට නියමිත මන්ත්‍රීන් සංඛ්‍යාව, 1988.02.05 දින අංක 491/17 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරා ගැනීමට නියමිත වූ මන්ත්‍රීවරු සංඛ්‍යාව අංක 2 දරන සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

11. මේ අනුව පරිපාලන දිස්ත්‍රික්කවල භූමි ප්‍රමාණය ස්ථාවරව පවතින තාක් කල් එය පදනම් කරගෙන තෝරාගනු ලබන මන්ත්‍රී සංඛ්‍යාවේ වෙනසක් ඇති නොවූව ද ජනසංඛ්‍යාව මත නියෝජනය වන මන්ත්‍රී සංඛ්‍යාව ජනසංගණනයක් නිසා වෙනස්වීම්වලට භාජනය විය හැකිය. මෙම කරුණ පළාත් සභාවක් සකස්විය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ඉහළ යාමට හේතු වනු ඇත. එහෙත් 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීමේ (සංශෝධිත) පනත මගින් මෙම තත්ත්වය වෙනස් විය. එමගින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 2 වන වගන්තිය යටතේ, ජනාධිපතිවරයා විසින් එක් එක් පළාත් සභාව යටතේ ඡන්ද විමසීම් පවත්වා තෝරා ගත යුතු මන්ත්‍රී සංඛ්‍යාව වශයෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබූ සංඛ්‍යාව, නොවෙනස්ව සෑම පළාත් සභා ඡන්ද විමසීමක දීම තෝරාපත් කර ගැනීමට නියම විය. එහෙත් ජන සංගණනයකට පසුව පළමු වරට පැවැත්වෙන පළාත් සභා ඡන්ද විමසීමකදී, අදාළ පළාත් සභාවට ඇතුළත් ඡන්ද විමසීම් බල ප්‍රදේශ වන පරිපාලන දිස්ත්‍රික්ක යටතේ, 2004 අංක 5 දරන සංශෝධන පනතින් සංශෝධනය වූ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3 (3) (අ) සහ (ආ) යන වගන්ති අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින තැනැත්තන්ගේ මුලු සංඛ්‍යාව ද, එහි භූමි ප්‍රමාණය ද සැලකිල්ලට ගෙන දිස්ත්‍රික්ක අනුව තෝරා ගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තීරණය කළ යුතුය. එම සංඛ්‍යාව, අදාළ පළාත් සභාව වෙනුවෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ දෙවන වගන්තිය යටතේ සහ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 61 අ වගන්තියේ සඳහන් තෝරා ගැනීමට නියමිත මුලු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට ඇතුළත් වන ප්‍රසාද ආසන 2 හැර ඉතිරි සංඛ්‍යාවට අනුරූප විය යුතුය. වෙනත් අයුරකින් සඳහන් කළහොත්, පරිපාලන දිස්ත්‍රික්කවල භූමි ප්‍රමාණයේ වෙනසක් නොවන තාක් වසර දහයකට වරක් පවත්වනු ලබන ජන සංගණනයෙන්, සංගණනයට පළාතක් තුළ පිහිටි දිස්ත්‍රික්ක යටතේ වෙසෙන ජන සංඛ්‍යා වෙනස්කම්වලට අනුරූපව තෝරාගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව, මෙම සංශෝධන හේතුවෙන් වෙනසකට භාජනය වනු ඇත. එහෙත් මුලු පළාත් සභාව නියෝජනය කළ යුතු වන මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නොවෙනස්ව පවතිනු ඇත.

12. මෙවර උඟව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ වන දැන්වීම, 2014 ජූලි 16 වන දින අංක 1871/32 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එම දැන්වීමෙහි බදුල්ල හා මොණරාගල යන පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් පිළිවෙලින් අපේක්ෂකයින්ගේ නම් 21 ක් හා 17 ක් නාමයෝජනා පත්‍රයකට ඇතුළත් විය යුතු බවට ප්‍රකාශ වී තිබුණි. (පරිශිෂ්ඨ 12) මීට පෙර 2004 හා 2009 යන වර්ෂවල එම පළාත් සභාව වෙනුවෙන් පැවති ඡන්ද විමසීම්වල දී මොණරාගල දිස්ත්‍රික්කය වෙනුවෙන් නම් කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව 11 ක් වූ අතර, බදුල්ල දිස්ත්‍රික්කයේ එම සංඛ්‍යාව 21 ක්

වශයෙන් නොවෙනස්ව පැවතිණි. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් පැවති අවස්ථාව වන විට 2011 වර්ෂයේ ජන සංගණන වාර්තාව ප්‍රකාශයට පත් වී තිබුණු බැවින්, මෙම පළාත් සභාවේ පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් නම් කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ නීතිමය විධිවිධාන අනුව, ජනගහනය හා භූමි ප්‍රමාණය මත නැවත ගණනය කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට සිදු විය.

ඒ අනුව මෙම ඡේදයේ ඉහතින් දක්වන ලද මොණරාගල දිස්ත්‍රික්කය සඳහා දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් තරග කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව පෙර එම පළාත් සභාව සඳහා පවත්වන ලද ඡන්ද විමසීම් අවස්ථාවේ නියම වී තිබූ අපේක්ෂක සංඛ්‍යාවට වඩා වැඩි විය. එම සංඛ්‍යාව 17 ක් විය. මෙම අපේක්ෂක සංඛ්‍යාවේ වෙනස්වීමට විරුද්ධව, බදුල්ල දිස්ත්‍රික්කයේ හරීන් ප්‍රනාන්දු හා එච්.ඩබ්.ටී. මහීමල් මුණසිංහ යන මහත්වරුන් විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 2014.07.21 වන දින පෙත්සමක් (SC/FR/219/2014) ඉදිරිපත් කොට මේ සම්බන්ධව කරුණු දක්වන ලදී. 2004 වර්ෂයේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ දී පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් අපේක්ෂක සංඛ්‍යාව සඳහන් කරමින් පළ කරන ලද ගැසට් නිවේදනයේ සඳහන් එම සංඛ්‍යා පාර්ලිමේන්තුව විසින් පමණක් වෙනස් කළ හැකි බව පෙත්සම්කරුවන් ඉදිරිපත් කරන ලද ප්‍රධාන තර්කයක් විය.

13. පළාත් සභාවකට අදාළ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කළ යුතු බවට නියමයක් නීතියේ සඳහන්ව නැති බැවින් පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ වූ නාමයෝජනා කැඳවීමේ දැන්වීමට එම සංඛ්‍යා ඇතුළත් වීම ප්‍රමාණවත් බවත්, අදාළ අපේක්ෂකයින් හා මන්ත්‍රීවරුන් සංඛ්‍යාව පිළිබඳ තීරණය කිරීම පළාත් සභා ඡන්ද විමසීම් පනතේ විධිවිධාන අනුව මැතිවරණ කොමසාරිස්වරයාට පැවරී ඇති කාර්යයක් බවත්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරන ලදී. අවසන්වරට පැවති ජන සංගණනය හා ඌව පළාත් සභාවට අයත් දිස්ත්‍රික්ක දෙකේ භූමි ප්‍රමාණය ද සැලකිල්ලට ගෙන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ හා 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් සංශෝධන පනතේ නියමයන් අනුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් මෙවර පළාත් සභා ඡන්ද විමසීම සඳහා නියම කරන ලද අපේක්ෂක සංඛ්‍යාව නිවැරදි බව අධිකරණය විසින් පිළිගන්නා ලදී.

14. මෙසේ පළාත් සභාවක පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තෝරාපත්කර ගනු ලබන මන්ත්‍රීවරු සංඛ්‍යාවට අමතරව, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 61 අ වගන්තිය යටතේ, පළාත් සභා බල ප්‍රදේශයේ ඡන්ද විමසීම් අවස්ථාවක, සියලුම පරිපාලන දිස්ත්‍රික්කවලින් වැඩිම මුළු ඡන්ද සංඛ්‍යාව ලබාගන්නා දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ප්‍රතිලාභ ආසන 2ක් හිමිවන බැවින්, ඡන්ද විමසීමක් මඟින් තෝරා පත්කරගෙන සිටින මන්ත්‍රීන් සංඛ්‍යාවට අමතරව වූ ප්‍රතිලාභ ආසන 2 ක් පළාතේ සිටින මන්ත්‍රී සංඛ්‍යාවට එක් වනු ඇත. එම දෙදෙනා අදාළ ප්‍රතිලාභ ආසන හිමි දේශපාලන පක්ෂයෙන් පළාත් සභාවට තරග කොට තේරී පත් නොවූ අපේක්ෂකයන් අතුරින් පක්ෂයේ ලේකම්වරයා විසින් නම් කළ යුතු බව පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 61 අ (2) වගන්තියේ වැඩි දුරටත් දැක්වේ.

පළාත් සභාවක මන්ත්‍රීවරුන් සඳහා සුදුසුකම්

15. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ, 9 වන වගන්තිය අනුව, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 වන වගන්තියේ දැක්වෙන නුසුදුසුකම් කිසිවකට යටත් වූවෙකු, පළාත් සභාවක් සඳහා තෝරාපත්කර ගැනීමට නුසුදුසු වේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක් වෙනුවෙන් තරග කිරීමට නුසුදුසු අයෙකුට මෙන්ම, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් දරමින් සිටින්නෙකුට ද පළාත් සභා ඡන්ද විමසීමක දී තරග කළ නොහැකිය. පළාත් පාලන ආයතන සභික ධුරයක් දරන තැනැත්තෙකුට එම ධුරය දරමින්, පළාත් සභා ඡන්ද විමසීමක් වෙනුවෙන් තරග කිරීමට නීතිමය බාධාවක් නොමැත. එසේම එක් අපේක්ෂකයකුට ඡන්ද විමසීමක දී තරග කළ හැක්කේ එක් පළාත් සභාවක් වෙනුවෙන් පමණි. ඊට අමතරව, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 (අ) වගන්තිය අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 (1) ව්‍යවස්ථාවේ (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) යන ඡේදවල දක්වා ඇති කවර හෝ නුසුදුසුකමකට යටත් වන කිසිවෙකුට, පළාත් සභා ඡන්ද විමසීමක් වෙනුවෙන් තරග කළ නොහැකිය.

ඡන්ද විමසීමේ කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ

16. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 8 (1) වගන්තිය අනුව, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති සෑම දේශපාලන පක්ෂයකටම, එම පිළිගැනීම පවතින තාක්කල් පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් ද තරග කළ හැකිය.

පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් වලංගු ඡන්දහිමි නාමලේඛනය

17. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 5(1) වන වගන්තිය අනුව, පළාත් සභා ඡන්ද විමසීමකට අදාළව නාමයෝජනා දැන්වීම පළ කරනු ලබන අවස්ථාව වන විට වලංගුව පවතින, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාරව සහතික කරන ලද ඡන්දහිමි නාමලේඛනය, අදාළ පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් වලංගුවේ.

ඡන්ද විමසීම පරිපාලනය කිරීම සහ තේරීම්භාර නිලධාරීන්

18. 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 126 වන වගන්තිය අනුව, එම පනත යටතේ ඡන්ද විමසීම් පැවැත්වීම, පරිපාලනය කිරීම හා මෙහෙයවීම ද, අධීක්ෂණය කිරීම ද පැවරෙන්නේ මැතිවරණ කොමසාරිස්වරයා වෙතයි. ඒ අනුව, පනතේ විධිවිධාන සාර්ථකව ක්‍රියාවේ යෙදවීම සඳහා අනිකුත් අදාළ නිලධාරීන්ට හා ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයට ද, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට ද ඡන්ද විමසීම් වෙනුවෙන් උපදෙස් දීම සහ මග පෙන්වීම් මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදු කෙරේ. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 7 (1) වගන්තිය අනුව, මැතිවරණ කොමසාරිවරයා විසින්, එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියා ලෙස කලින් කල යම් තැනැත්තෙකු නමින් හෝ නිලයෙන් පත්කළ යුතුය. තවද, තේරීම්භාර නිලධාරියාගේ කාර්යය ඉටු කිරීමෙහිලා ඔහුට සහය වීම පිණිස අවශ්‍ය වන අයද නමින් හෝ නිලයෙන් පත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට හැකියාව තිබේ. පළාත් සභා ඡන්ද විමසීම් පළමු වරට පැවති අවස්ථාවේ දී, 1988 වර්ෂයේ එවකට දිවයිනේ පිහිටි සියලුම පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ලෙස දිසාපතිවරුන් නිලනාමයෙන් පත්කරන ලද අතර, ඒ ඒ පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වෙන අවස්ථාවල දී එම තේරීම්භාර නිලධාරීන්ට සහය වීම සඳහා අනිකුත් සහකාර තේරීම්භාර නිලධාරීන්, නිලයෙන් සහ නාමයෙන් පත් කිරීම සිදුකෙරේ.

19. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව යටතේ තුන්දෙනෙකුගෙන් සමන්විත මැතිවරණ කොමිෂන් සභාවේ බලතල, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනතේ 27 වන වගන්තිය අනුව මැතිවරණ කොමිෂන් සභාව පත්කරනු ලබන තෙක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතුවේ. ඒ අනුව 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට යටත්ව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ක්‍රියාත්මක කිරීමට ලබා දී ඇති බලතල ද මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය.

II වන කොටස

ඡන්ද විමසීම්වලට අදාළ මූලික කටයුතු

20. පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් පළාත් සභා විසුරුවා හැරීමෙන් අනතුරුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා ප්‍රකාශයට පත් කළ යුතු දැන්වීම් පළ කිරීමත් සමගම, අදාළ දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම් සඳහා මූලික කටයුතු සංවිධානය කිරීමට එම දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන්ට, මැතිවරණ කොමසාරිස්වරයා විසින් උපදෙස් හා මඟපෙන්වීම් දෙන ලදී.

21. පළාත් සභා ඡන්ද විමසීමක් වෙනුවෙන් නාමයෝජනා කැඳවීමේ දැන්වීම පළ කළ අවස්ථාවේ සිට, ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම දක්වා වූ ඡන්ද විමසීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා, විශාල රාජ්‍ය සේවක පිරිසක් විවිධ රාජකාරි වෙනුවෙන් සහභාගී කරවා ගැනීමට සිදුවේ. එසේම ඡන්ද විමසීම් කටයුතු සංවිධානය සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සලසා ගනු ලබන්නේ, ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය අංශයේ වාහන මගිනි. මේ නිසා නාමයෝජනා දැන්වීම පළ වූ විගස ඡන්ද විමසීම සඳහා විවිධ මට්ටම්න් රාජකාරී පැවරීමට සිදුවන කාර්ය මණ්ඩලය වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් තෝරා ගැනීමටත්, මැතිවරණ රාජකාරි සඳහා ලබා ගත හැකි රාජ්‍ය අංශයේ වාහන පිළිබඳව වාර්තා ලබා ගැනීම සඳහාත් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත, තේරීම්භාර නිලධාරීන් විසින් රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙතින් තොරතුරු කැඳවනු ලැබේ.

22. පළාත් සභා ඡන්ද විමසීමක් වෙනුවෙන් නාමයෝජනා දැන්වීම පළවීමත් සමගම, තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ කාලය ඇරඹෙන බැවින්, තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලුම් කරන අයට අයදුම්පත්‍ර ලබා දීමට හා ඒවා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට, ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. මෙම නාමලේඛන ප්‍රදර්ශනය, ඡන්ද විමසීම පැවැති දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල ද සිදු කරන ලදී. ඊට අමතරව ආරක්ෂක අංශයේ, පොලිසියේ හා රාජ්‍ය ආයතනවල ඉල්ලීම් අනුව, සංයුක්ත තැටි වශයෙන් සකස් කරන ලද ඡන්දහිමි නාමලේඛන පිටපත් ද, කාර්ය මණ්ඩලවලට අදාළ ලියාපදිංචි තොරතුරු පරීක්ෂාකර බලා ගැනීමට නිකුත් කරන ලදී.

23. තේරීම්භාර නිලධාරීගේ කාර්යාලයට ආසන්න, ඡන්ද විමසීම් කටයුතු සම්බන්ධව පළපුරුද්ද ඇති, රජයේ කාර්යාලවල සේවය කරනු ලබන, මාණ්ඩලික මට්ටමේ නිලධාරීන්ගේ සේවය, ඡන්ද විමසීම සංවිධානය කිරීම සඳහා අනිවාර්යයෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට මෙන්ම, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ද අවශ්‍යවනු ඇත. මෙවර ඡන්ද විමසීමට අදාළව එබඳු නිලධාරීන්, සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් නිල නාමයෙන් පත් කිරීම සඳහා, අවශ්‍ය විස්තර තේරීම්භාර නිලධාරීන්ගෙන් ලබාගෙන, ඔවුන්ගේ පත් කිරීම් සිදු කරන ලදී. මෙබඳු නිලධාරීන් පිරිසක් සෑම දිස්ත්‍රික්කයකම සේවය සඳහා කැඳවීමට හැකිවීම මැතිවරණ දෙපාර්තමේන්තුවට මෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට ද ඉමහත් සහනයකි. තව ද මෙබඳු ඡන්ද විමසීම් මූලික සංවිධාන කටයුතු සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල භාරව කටයුතු කොට, පසුව දෙපාර්තමේන්තුවෙන් ස්ථානමාරු ලැබ ගිය මාණ්ඩලික නිලධාරීන්ගේ සේවය ද ලබා ගැනීමට හැකියාව ලැබී තිබේ. මෙවර ඡන්ද විමසීම් සංවිධාන කටයුතු සඳහා මේ දෙයාකාරයේම වූ නිලධාරීන්ගේ සහාය ද ලබා ගන්නා ලදී.

24. ඡන්ද විමසීමේ මුල් අවස්ථාවේ සිටම, මැතිවරණ කොමසාරිස්වරයාගේ හා තේරීම්භාර නිලධාරීන්ගේ නිවේදන හා දැන්වීම් ඇතුළත් ගැසට් පත්‍ර, මැතිවරණය සඳහා අවශ්‍යවන ලිපිලේඛන, ආකෘති පත්‍ර වර්ග හා මුද්‍රිත උපදෙස් ආදිය නියමිත වේලාවට මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සංවිධානය කිරීමටත්, විශේෂයෙන් නාමයෝජනා භාර ගැනීමේ කාලයෙන් පසු මුද්‍රණය කළ යුතු ඡන්ද විමසීමට අදාළ දැන්වීම් හා ඡන්ද පත්‍රිකා මුද්‍රණය සඳහා කටයුතු සූදානම් කිරීමටත් අවශ්‍ය හෙයින්, මේ කරුණු පිළිබඳව මූලික සාකච්ඡා සෑම ඡන්ද විමසීමකටම පෙර රජයේ මුද්‍රණාලයාධිපතිවරයා සමග මැතිවරණ කොමසාරිස්වරයා විසින් පවත්වන ලදී. ඡන්ද විමසීම්වලට අදාළ මුද්‍රණ කටයුතු වෙනුවෙන් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධව ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට ද මැතිවරණ කොමසාරිස්වරයා, රජයේ මුද්‍රණාලයාධිපතිවරයාට සෑම පළාත් සභා ඡන්ද විමසීමකටම පෙර නියමිත උපදෙස් දෙන ලදී.

25. නාමයෝජනා දැන්වීම් පළ කිරීමත් සමග දිස්ත්‍රික් ලේකම් කාර්යාල, නාමයෝජනා භාර ගැනීමේ සහ නාමයෝජනා වෙනුවෙන් ඇප මුදල් භාර ගැනීමේ ස්ථාන හැටියට ක්‍රියාත්මක වන බැවින්, එම ස්ථානවල අවශ්‍ය ආරක්ෂක කටයුතු සංවිධානය කළ යුතු විය. ඒ පිළිබඳව ප්‍රාදේශීය මට්ටමේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන්ට සහ පොලිස් අධිකාරීවරුන්ට උපදෙස් දීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා මූලික සාකච්ඡා,

පොලිස්පතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ සහ පරිපාලන) සමග පවත්වා, ඉදිරි ඡන්ද විමසීම් කටයුතු සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍යවන ප්‍රතිපාදන ද පොලිස්පතිවරයා වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

26. තැපෑලෙන් ඡන්දය දීම සඳහා වන ඉල්ලීම වෙනුවෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාලය එළඹීමත් සමග, තැපැල් ඡන්ද කටයුතු ඇතුළු ඡන්ද විමසීමට අදාළව තැපැල් දෙපාර්තමේන්තුවට පැවරෙන රාජකාරී පැහැදිලි කිරීමට සහ ඒ සඳහා උපදෙස් දීමට ද, එම කටයුතු වෙනුවෙන් අවශ්‍යවන මුල්‍යමය ප්‍රතිපාදන පිළිබඳව දැන ගැනීමට ද මැතිවරණ කොමසාරිස්වරයා තැපැල්පතිවරයා සමග සාකච්ඡා කරන ලදී. මෙහිදී අදාළ කාර්යයන් සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කටයුතු සූදානම් කිරීමට, මැතිවරණ කොමසාරිස්වරයා විසින් තැපැල්පතිවරයාට උපදෙස් දෙන ලදී.

27. ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සූදානම් කිරීමට අවශ්‍ය මග පෙන්වීම්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට සහ දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට, ඔවුන් වරින් වර රැස්වීම් සඳහා කැඳවා, ලබා දීමට මැතිවරණ කොමසාරිස්වරයා කටයුතු කළේය.

ඡන්ද විමසීම් සඳහා වලංගු වූ ඡන්දහිමි නාමලේඛන

28. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ, පළාත් සභාවක ඡන්ද විමසීමක් වෙනුවෙන් නාමයෝජනා දැන්වීම පළ කරනු ලැබූ දිනයේ ක්‍රියාත්මකව පැවති ඡන්දහිමි නාමලේඛනය, ඡන්ද විමසීම සඳහා භාවිතා කළ යුතු නාමලේඛනය බව, එම පනතේ 5 (1) වගන්තියේ දැක්වේ. එම ඡන්දහිමි නාමලේඛනය අනුව, ඡන්ද විමසීමේ දී යමෙකු ඡන්දය දීමට හිමිකම ලබන්නේ ද නොලබන්නේ ද යන්න තීරණය වේ. නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් නාමයෝජනා දැන්වීම පළ කරන ලද 2012.06.28 දින වන විට වලංගු වූ ඡන්දහිමි නාමලේඛනය වූයේ 2011 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයයි. එම නාමලේඛනය අනුව නැගෙනහිර පළාතේ ඡන්දහිමියන් 1,033,749 ක් ද, උතුරු මැද පළාතේ ඡන්දහිමියන් 900,873 ක් ද, සබරගමුව පළාතේ ඡන්දහිමියන් 1,401,795 ක් ද ලියාපදිංචි වී සිටියහ. මධ්‍යම, උතුරු හා වයඹ යන පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් 2013.07.11 දින නාමයෝජනා දැන්වීම පළ වන විට වලංගු ඡන්දහිමි නාමලේඛනය වූයේ 2012 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය යි. එම නාමලේඛනය අනුව මධ්‍යම පළාතේ හි 1,889,557 ක් ද උතුරු පළාතේ 719,447 ක් ද, වයඹ පළාතේ 1,754,218 ක් ද ඡන්දහිමියන් ලියාපදිංචි වී සිටියහ. උතුරු පළාත වෙනුවෙන් සකස් කරන ලද පරිපූරක ඡන්දහිමි නාමලේඛනයෙහි අමතර ඡන්දහිමියන් 4,989 ක් ද ලියාපදිංචි වී සිටියහ. බස්නාහිර හා දකුණ යන පළාත් සභා වෙනුවෙන් 2014.01.16 වන දින ද ඌව පළාත වෙනුවෙන් 2014.07.16 වන දින ද නාමයෝජනා දැන්වීම් පළ කරන අවස්ථාව වනවිට එම පළාත්වල ඡන්ද විමසීම් වෙනුවෙන් වලංගු ඡන්දහිමි නාමලේඛනය වූයේ 2013 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයයි. එම නාමලේඛනය අනුව බස්නාහිර පළාතේ ඡන්දහිමියන් 4,024,624 ක් ද, දකුණු පළාතේ ඡන්දහිමියන් 1,873,804 ක් ද, ඌව පළාතේ ඡන්දහිමියන් 942,730 ක් ද ලියාපදිංචි වී සිටියහ. පරිපාලන දිස්ත්‍රික්ක යටතේ ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව, ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව හා ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව අංක 3 දරන සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

උතුරු පළාත වෙනුවෙන් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සැකසීම

29. උතුරු පළාතේ පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් භාවිතා කිරීමට නියම වූයේ 2012 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයයි. උතුරු හා නැගෙනහිර පළාතේ පැවති ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන්, අවතැන් වීම නිසා සිය නම්, 2012 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කරවා ගැනීමට නොහැකි වූ ඡන්ද බලය හිමි පිරිසට, ඒ සඳහා ඉඩ සලසා දීමට 2013 අංක 27 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධි විධාන) පනත පනවන ලදී. මෙම පනත 2013 ජූනි 20 වන දින සහතික කරන ලද්දකි. රජයේ හමුදා, එල්ටීටීඊ සංවිධානය සමග පැවති සන්නද්ධ අරගලය 2009 වසරේ අවසන් කළ ද එතෙක් වසර 30 කට අධික කාලයක් සිවිල් පරිපාලන කටයුතු අඩාලවීම් නිසා දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත්වල බොහෝ ප්‍රදේශවල ඡන්දහිමියන් නීතියේ සඳහන් ආකාරයට ගණන් ගැනීම අසීරු විය. මේ නිසා එම ප්‍රදේශවල වයස අවුරුදු 18 ඉක්ම වූ පිරිසක් ඡන්දහිමි නාමලේඛනවල ලියාපදිංචි වීමට ඉඩක් නොලැබ සිටියහ. යුද වාතාවරණය නිසා 2009 වර්ෂයේ සිට දිවයින තුළ කිසිඳු මැතිවරණ කොට්ඨාසයක ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචියට ඉඩ නොලද, සුදුසුකම් ඇති අයට මෙම පනත යටතේ, 2012 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට නම් ඇතුළත් කරවා ගැනීමට ඉඩ ලැබුණි.

30. 2012.06.01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ, 2009 වර්ෂයෙන් පසු දිවයිනේ කිසිදු ඡන්දහිමි නාමලේඛනයක සිය නම ලියාපදිංචි කරවා ගෙන නොමැති, ඡන්දහිමියකු වීමට අනිකුත් අදාළ සුදුසුකම්

ද ඇති අය, 2013.06.22 සිට 28 දක්වා කාලය තුළ, තමා පදිංචි දිස්ත්‍රික්කයේ ලියාපදිංචි නිලධාරියා වෙත ලියාපදිංචිය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු විය. ඒ සඳහා අවශ්‍ය අයදුම්පත් අදාළ අයට ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තබන ලදී. තමාගේ අවතැන්වීම සහතික කිරීම සඳහා පදිංචිව සිටින ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීගේ සහතිකයක් ද, අවතැන් වන විට වයස අවුරුදු 18 ඉක්මවූවකු නොවී සිටියේ නම්, සිය උප්පැන්න සහතිකය ද අයදුම්පත සමග ඉදිරිපත් කිරීමට අදාළ අයට නියම විය. මේ සම්බන්ධයෙන් ඡන්දහිමියන් දැනුවත් කිරීම සඳහා, 2013.06.21 වන දින අංක 1815/18 දරන ගැසට් පත්‍රයේ මැතිවරණ කොමසාරිස්වරයා දැන්වීමක් පළ කළේ ය. ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ලැබුණු අයදුම්පත් සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීමෙන් පසු, සකස් කරන ලද කෙටුම්පත් නාමලේඛන 2013.06.29 සිට 2013.07.05 දක්වා කාලය තුළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල තුළ ප්‍රදර්ශනය කිරීමටත්, අභියාචනා ලබා ගැනීමටත්, දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීහු කටයුතු කළහ. මෙසේ ලැබුණු අයදුම්පත් හා අභියාචනා සංඛ්‍යාව ද, පරිපූරක ඡන්දහිමි නාමලේඛනය වෙනුවෙන් පිළිගත් නම් සංඛ්‍යාව ද, පිළිනොගැණුනු අයදුම්පත් හා අභියාචනා සංඛ්‍යාව ද පහත දක්වා ඇත.

පරිපාලන දිස්ත්‍රික්කය (1)	ලැබුණු අයදුම්පත් සහ අභියාචනා සංඛ්‍යාව (2)	පිළිගත් නම් ගණන (3)	නොපිළිගත් අයදුම්පත් සහ අභියාචනා සංඛ්‍යාව (4)
යාපනය හා කිලිනොච්චිය	170	121	49
මන්නාරම	7,041	3,317	3,724
වවුනියාව	1,126	277	849
මුලතිව්	1,906	1,274	632
එකතුව	**10,243**	**4,989**	**5,254**

31. ඉහත වගුවේ (2) වන තීරුවේ දැක්වෙන සංඛ්‍යාවට අමතරව තවත් පුද්ගලයන් 1412 දෙනෙකුගේ ඉල්ලීම් පිළිබඳව සලකා බැලීමට, අදාළ දිස්ත්‍රික්කවල ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ට නොහැකි වී ඇත. ඉන් 67 දෙනෙකු එක් වරකට වඩා ඉල්ලීම් ඉදිරිපත් කර තිබූ අතර, තවත් 1345 දෙනෙකු ඒ වන විටත් 2012 වර්ෂයේ ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචිව සිටි අය වූ බැවින්, මෙම ඉල්ලීම් සලකා බැලීමට නොහැකි වී ඇත. මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ පිටපතක් සංයුක්ත තැටියක් වශයෙන් පිළියෙල කොට, රුපියල් 1500.00 ක මිලකට විකිණීමට කටයුතු කර ඇත.

32. ඡන්ද විමසීම්වලට අදාළව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ වූ දැන්වීම්, මැතිවරණ කොමසාරිස්වරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ අවස්ථාවේ, වලංගුව පැවති ඡන්දහිමි නාමලේඛනවල දිස්ත්‍රික්ක යටතේ ලියාපදිංචි වී සිටි ඡන්දහිමියන්ගේ නම් සංඛ්‍යාව සහ ඡන්ද විමසීමට අදාළව විකුණන ලද නාමලේඛන පිටපත් සංඛ්‍යාව පහත දැක්වේ.

පළාත	පරිපාලන දිස්ත්‍රික්කය	ඡන්ද විමසීම සඳහා භාවිතා කළ ඡන්දහිමි නාමලේඛනයේ වර්ෂය	ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව	සංයුක්ත තැටි වශයෙන් සැකසූ ඡන්දහිමි නාමලේඛනයක මිල රු.	පක්ෂ / ස්වාධීන කණ්ඩායම් විසින් මිලදී ගත් සංයුක්ත තැටි සංඛ්‍යාව*	ලැබුණු මුදල රු.
නැගෙනහිර	මඩකලපුව	2011	347,099	3,000.00	18	54,000.00
	අම්පාර		441,287	5,000.00	8	40,000.00
	ත්‍රිකුණාමලය		245,363	3,000.00	25	75,000.00
උතුරු මැද	අනුරාධපුරය	2011	606,508	7,500.00	5	37,500.00
	පොළොන්නරුව		294,365	3,000.00	8	24,000.00
සබරගමුව	රත්නපුර	2011	769,813	7,500.00	5	37,500.00
	කෑගල්ල		631,981	8,000.00	7	56,000.00
මධ්‍යම	මහනුවර	2012	1,015,315	15,000.00	4	22,000.00
	මාතලේ		366,549	5,000.00	6	25,000.00
	නුවරඑළිය		507,693	7,500.00	9	48,500.00
උතුරු	යාපනය	2012	426,813	10,000.00	4	31,000.00
	කිලිනොච්චිය		68,600	2,000.00	5	10,000.00
	මන්නාරම		75,737	2,000.00	5	10,000.00
	වවුනියාව		94,644	2,000.00	11	22,000.00
	මුලතිව්		53,683	2,000.00	11	22,000.00
වයඹ	කුරුණෑගල	2012	1,227,810	15,000.00	36	101,000.00
	පුත්තලම		526,408	22,000.00	14	73,500.00
බස්නාහිර	කොළඹ	2013	1,552,734	15,000.00	23	249,000.00
	ගම්පහ		1,590,076	15,000.00	04	25,500.00
	කළුතර		881,814	10,000.00	09	48,000.00
දකුණු	ගාල්ල	2013	809,822	10,000.00	03	14,000.00
	මාතර		608,524	7,500.00	02	9,500.00
	හම්බන්තොට		455,398	7,500.00	07	3,000.00
ඌව	බදුල්ල	2013	609,966	10,000.00	07	46,000.00
	මොණරාගල		332,764	5,000.00	04	20,000.00

*සැ.යු. : නාමලේඛන ඡන්ද ප්‍රදේශ අනුව ද මිල දී ගත් අවස්ථා ද මීට ඇතුළත්ව ඇත.

33. ඡන්දහිමි නාමලේඛන පොත් වශයෙන් ඉතා සීමිත සංඛ්‍යාවක් සකසන ලද අතර, මෙවර ඡන්ද විමසීමේ දී දේශපාලන පක්ෂවලට අවශ්‍ය නාමලේඛන සංයුක්ත තැටි වශයෙන් සකසා විකිණීමට කටයුතු කරන ලදී.

ඡන්ද මධ්‍යස්ථාන

34. 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 4 (1) වගන්තිය අනුව, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ,

තත්කාලයේ බලපවත්නා එක් එක් ඡන්ද කොට්ඨාසය, මේ පනතේ කාර්යය සඳහා ද වලංගු වේ. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9 (2) වගන්තිය අනුව ඡන්ද කොට්ඨාස පිහිටුවීමේ දී හා ඒවා නැවත බෙදීමේ දී, එක් ඡන්ද කොට්ඨාසයකට ඡන්දදායකයින් 1,500 කට වැඩි නොවන සේ ඡන්ද කොට්ඨාස පිහිටුවිය යුතුවේ. මෙසේ පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව, නැගෙනහිර පළාත වෙනුවෙන් 1,163 ක් ද, උතුරු මැද පළාත වෙනුවෙන් 895 ක් ද, සබරගමුව පළාත වෙනුවෙන් 1,185 ක් ද විය. මධ්‍යම පළාත වෙනුවෙන් 571 ක් ද, උතුරු පළාත 832 ක් හා වයඹ පළාත 1309 ක් ද ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවන ලදී. එම සංඛ්‍යාව බස්නාහිර පළාතේ 2,689 ක් හා දකුණු පළාතේ 1,564 ක් ද විය. ඌව පළාත වෙනුවෙන් පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව 834 ක් විය. මෙම විස්තර සංඛ්‍යා සටහන් 03 හි වැඩිදුරටත් දක්වා ඇත.

35. ඡන්ද කොට්ඨාස බෙදීමේ දී ප්‍රදේශයේ පිහිටීම හා භූ විෂමතාව ද, ඡන්දදායකයින් පදිංචි ප්‍රදේශ හා ප්‍රදේශය තුළ ඇති ප්‍රවේශ මාර්ග පිහිටීම ආදී කරුණු ද සැලකිය යුතුය. ඡන්දදායකයින්ට ඡන්ද පොළ කරා ගමන් කිරීමට ඇති දුර ප්‍රමාණය හැකිතාක් දුරට අඩුවනසේ, සුදුසු ගොඩනැගිලිවල ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය. කෙසේ වුව ද ඡන්ද කොට්ඨාස පිහිටුවීමේ දී හා ඡන්ද මධ්‍යස්ථාන තෝරා ගැනීමේ දී ඡන්ද කොට්ඨාස තුළ පදිංචි සියලුම ඡන්දහිමියන් පදිංචි ප්‍රදේශවලට සෑම අතින්ම පහසු වන ආකාරයේ ඡන්ද මධ්‍යස්ථාන සොයා ගැනීම අසීරු වේ. එසේම ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව 1500 ඉක්ම වූ යම් ඡන්ද කොට්ඨාස සංඛ්‍යාවක් වෙනුවෙන් ද, ඡන්ද මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවීමට ද සිදු විය. මෙම ඡන්ද විමසීම්වල දී පිහිටුවනු ලැබූ මුළු ඡන්ද මධ්‍යස්ථාන, ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව අනුව වර්ග කර අංක 12 සහ 12-I දරන සංඛ්‍යා සටහන්වල දක්වා ඇත. ඡන්ද කොට්ඨාසයක ඡන්දහිමියන් 1500 කට සීමාවන සේ කටයුතු කිරීමට අසීරු අවස්ථාවල දී, විකල්ප ඡන්ද මධ්‍යස්ථාන වෙනුවෙන්, සුදුසු ස්ථාන අදාළ නීතිමය කරුණු සැලකිල්ලට ගෙන තෝරා ගත යුතු වේ. ඡන්ද කොට්ඨාසය තුළ ඡන්ද මධ්‍යස්ථානය වෙනුවෙන් සුදුසු ස්ථිර ගොඩනැගිලි නොමැති විට, තාවකාලික මඩුවක් වුවද ඡන්ද මධ්‍යස්ථානයක් ලෙස යොදා ගත හැකිය. ඡන්ද කොට්ඨාසයක ඡන්දහිමියන් සංඛ්‍යාව සෑහෙන ඉහළ මට්ටමක වේ නම්, එය ඡන්ද විමසීමට බාධාවක් නොවීම සඳහා, ඡන්දහිමියන් වෙනුවෙන් ඡන්ද පොළේ පෝලිම් ගණන වැඩි කිරීමට, ඡන්ද විමසීම් අවස්ථාවල දී කටයුතු කරනු ඇත. ඊට අමතරව, ඡන්ද දායිකාවන් සඳහා වෙන් කරන ලද විශේෂ ඡන්ද පොළවල් පිහිටුවීමට ද සෑම ඡන්ද විමසීමේ පනතකින්ම නීතිමය අවකාශය සලසා ඇත. එම පහසුව, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 22 (1) (ඈ) වගන්තිය මගින් පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් ලබා දී ඇත. තව ද, පවතින විශේෂ අවශ්‍යතා සැළකිල්ලට ගෙන, ඡන්ද කොට්ඨාසයෙන් පිටත වුව ද ඡන්ද පොළක් පිහිටුවීමට තේරීම්භාර නිලධාරීට, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 22 (4) වගන්තිය යටතේ හැකියාව ඇත.

36. 2012 වර්ෂයේ සිට මැතිවරණ දෙපාර්තමේන්තුව දිවයිනේ සියලුම මැතිවරණ කොට්ඨාසවලට අදාළ නාමලේඛන පරිගණක ගත කොට සකසා තිබූ බැවින්, මෙම ඡන්ද විමසීම සඳහා සාමාන්‍ය ආකාරයට පොත් වශයෙන් සකස් කරනු ලබන නාමලේඛන පිටපත් සංඛ්‍යාව විශාල වශයෙන් අඩු කර තිබිණි. මේ නිසා නාමලේඛන අනුපිටපත් කිරීමේ වියදම බෙහෙවින් පහළ ගොස් තිබුණි. ඒ අනුව සකස් කළ සීමිත නාමලේඛන පොත් සංඛ්‍යාව මෙම ඡන්ද විමසීම්වල දී ඡන්ද පොළවල භාවිතාවට ගැනීමට කටයුතු කරන ලදී. ඡන්ද විමසීම සඳහා අවශ්‍ය අවම ඡන්දහිමි නාමලේඛන පිටපත් සංඛ්‍යාව පමණක් ඡන්ද පොළකට සපයා ඉන් උපරිම ප්‍රයෝජන ගැනීමටත්, මෙතෙක් පැවති ගැහැණු/ පිරිමි යනුවෙන් ඡන්දපොළ පෝලිම් වෙන් කිරීම වෙනුවට ඡන්දහිමි නාමලේඛනයේ පිළිවෙළ අංක අනුව පෝලිම් වෙන් කිරීමටද කටයුතු කරන ලදී. මේ නිසා ඡන්ද පොළට යවනු ලබන ඡන්දහිමි නාමලේඛන පෝලිම් අනුව වෙන වෙනම සකස් කර යැවීමට තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දී තිබුණි.

37. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 22 (1) වගන්තිය යටතේ, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිත ඡන්ද විමසීම පිළිබඳ දැන්වීමට, පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා වූ ඡන්ද පොළේ හෝ ඡන්ද පොළවල පිහිටීම දැක්වෙන විස්තර ද ඇතුළත් කළ යුතු වේ. නාමයෝජනා භාර ගැනීමේ කාලයෙන් අනතුරුව, අප්‍රමාදව පළ කළ යුතු මෙම දැන්වීමට අවශ්‍ය වන ඡන්ද පොළවල්වල විස්තර මැනවින් සොයා බලා, කල් තබා ඒවා සූදානම් කර ගැනීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දී තිබිණි. මෙම ඡන්ද මධ්‍යස්ථාන නාමලේඛන ප්‍රසිද්ධියට පත් කිරීමට පෙර, ඒවා පිහිටුවීමට අපේක්ෂා කරනු ලබන ගොඩනැගිලි පරීක්ෂා කර ඡන්ද විමසීම පැවැත්වීම සඳහා සුදුසු දැයි සොයා බැලිය යුතු වන අතර, ඒවා අදාළ නිලධාරීන් ලවා ඡන්ද විමසීම සඳහා සූදානම් කිරීම, තේරීම්භාර නිලධාරීන්ගේ වගකීම වේ.

38. ඡන්ද පොළවල් සූදානම් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ග්‍රාම නිලධාරීන්ගේ සහාය ලබා ගැනේ. ඡන්ද

පොළවල පහසුකම් ඇති කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මැතිවරණ කොමසාරිස්වරයාගේ මග පෙන්වීම අනුව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් අදාළ නිලධාරීන්ට නිකුත් කර තිබුණි.

39. සියලුම පළාත් සභා වෙනුවෙන් පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථාන සඳහා යොදාගත් ගොඩනැගිලි වර්ග කර, ඒ පිළිබඳ විස්තර අංක 11 දරන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත දිනය සෙනසුරාදා දිනයක් වන බැවින් ඊට පෙර සිකුරාදා දිනයේ දී එම ගොඩනැගිලි ඡන්ද විමසීම් කටයුතු සඳහා භාර ගැනීමට හා එම ස්ථාන සූදානම් කිරීමට අදාළ පාසල් ගොඩනැගිලි භාර විදුහල්පතිවරුන්ගේ සහාය කල් තබා ලබා ගත යුතු ආකාරය සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන් දැනුවත් කර තිබුණි.

40. ඡන්ද විමසීම් දිනට පෙර දින රාත්‍රියේ, කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් (නිලධාරිනීන් හැර) සෑම ඡන්ද පොළකම රැඳවිය යුතු වේ. එදින කාර්ය මණ්ඩලයට ඡන්ද පොළවල නවාතැන් ගැනීමට හැකිවන පරිදි, එම ස්ථාන සූදානම් කිරීම හා ඡන්ද විමසීම් දිනට පෙර දින පස්වරුවේ සිට ඡන්ද විමසීම් දින කටයුතු අවසන් වී කාර්ය මණ්ඩලය ඡන්ද පොළෙන් ඉවත්වීම දක්වා කාලය තුළ එම නිලධාරීන්ට අවශ්‍ය ආහාර පාන ලබාදීම සම්බන්ධ අවශ්‍ය උපදෙස්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් නිකුත් කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරන ලද්දේ ග්‍රාම නිලධාරීන් විසිනි. ඒ සම්බන්ධයෙන් ගැටලු මතුවන අවස්ථාවල දී, ඡන්ද මධ්‍යස්ථාන පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය එම නිලධාරීන් විසින් ලබා ගන්නා ලදී.

41. ඡන්දපොළ කාර්ය මණ්ඩලයට ආහාරපාන සැපයීමේ දී සාධාරණ මිලකට, පිරිසිදු ආහාරවේලක් ලබා දීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග සහ ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන් ඒ ඒ දිස්ත්‍රික්කවල පවත්නා තත්ත්වයන් අනුව, පොදු පිළිවෙතක් අනුගමනය කිරීමට තේරීම්භාර නිලධාරීන් මාර්ගයෙන් අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

42. ඡන්ද විමසීමේ කටයුතුවලින් අනතුරුව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ කාර්යාලයට ඉතා දුරබැහැර පිහිටි ඡන්ද මධ්‍යස්ථානයක සිට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට ඡන්ද පත්‍රිකා අඩංගු ඡන්ද පෙට්ටි හා අනෙකුත් දෑ සමඟ ගමන් කිරීමට සිදුවන්නේ නම්, එවැනි ඡන්ද පොළවල්වල කාර්ය මණ්ඩලයට සහ ඒවායේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා විශේෂ ආරක්ෂිත වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමට, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සහාය ඇතිව තේරීම්භාර නිලධාරීන් කටයුතු කර තිබුණි.

43. සෑම ඡන්ද මධ්‍යස්ථානයකම ආරක්ෂාව වෙනුවෙන් පොලිස් නිලධාරීන් දෙදෙනෙකුවත් යෙදවීම සඳහා අවශ්‍ය උපදෙස් පොලිසියට දී තිබූ අතර, සමහර දේශපාලන පක්ෂ විසින් විශේෂ ආරක්ෂාව සලසා දිය යුතු බවට මැතිවරණ කොමසාරිස්වරයාට දන්වා තිබූ ඡන්ද මධ්‍යස්ථාන සම්බන්ධව සුදුසු පියවර ගැනීමට ද පොලිස්පතිවරයා වෙත දන්වන ලදී.

අවතැන් වූ ඡන්දහිමියන්ට පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 125 අ වගන්තිය අනුව වෙනත් ඡන්දපොළවල පහසුකම් සැලසීම

44. උතුරු හා නැගෙනහිර පළාත්වල වසර 30 කට අධික කාලයක් පැවති යුද්ධමය වාතාවරණය හේතුවෙන්, එම කාලය තුළ එම පළාත්වල සිවිල් පරිපාලන කටයුතු හා සාමාන්‍ය ජන ජීවිතය ද අඩාල වී ගියේය. රජයේ හමුදා, 2009 වසරේ එම ප්‍රදේශවල ත්‍රස්තවාදී සටන් ව්‍යාපාරය මර්දනය කළ ද එම පෙදෙස්වල සිවිල් පරිපාලනය තහවුරු කිරීමටත්, අවතැන් වූ පුද්ගලයින් නැවත ඔවුන්ගේ මුල් ගම් ප්‍රදේශවල පදිංචි කරවීමටත් සැලකිය යුතු කාලයක් ගත විය. සිය මුල් පදිංචි ස්ථානවලට නොයෙකුත් හේතු නිසා මේ වන තෙක් පදිංචිය සඳහා නොගිය පිරිස්, තාවකාලිකව වෙනත් තැන්වල දැනට ද ජීවත් වෙති. සිවිල් පරිපාලනය බිඳවැටී තිබූ ප්‍රදේශවල බිම්බෝම්බ ඉවත් කිරීම අවසන්වී නොතිබීම නිසා සහ පැවති අනාරක්ෂිත තත්ත්වය හා තවත් විශේෂ හේතූන් මත මෙවැනි අවතැන් වූ ඡන්දහිමියන්ගේ නම්, ඔවුන්ගේ මුල් පදිංචි ස්ථාන යටතේ ඡන්දහිමි නාමලේඛනවල කලින් ලියාපදිංචි වී තිබූ ආකාරයටම ප්‍රතිශෝධනය කරනු ලබන නාමලේඛනවලට ඇතුළත් කිරීමට, අවශ්‍ය පියවර මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබීය. මෙවැනි වාතාවරණයක් තුල, තම මුල් පදිංචි ප්‍රදේශවලින් බැහැරව තාවකාලිකව පදිංචිව සිටීමට සිදුවූ ඡන්දහිමියන්ට ද, තම ඡන්ද පොළේ දී ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්දහිමියන්ට ද තම අභිමතය පරිදි තමා තාවකාලිකව පදිංචිව සිටින ප්‍රදේශයේ වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා, උතුරු පළාතේ පැවති පළාත් සභා ඡන්ද විමසීමේ දී අවශ්‍ය පහසුකම්, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 125 අ වගන්තිය අනුව සලසන ලදී.

45. උතුරු පළාතේ මෙවැනි ඡන්දහිමියන්ගේ අයදුම්පත්, 2013.07.11 සිට 2013.08.12 දක්වා කාලය තුළ මැතිවරණ කොමසාරිස්වරයා විසින් භාරගන්නා ලද

අතර, ඒ පිළිබඳව අදාළ ප්‍රදේශවල ඡන්දහිමියන් දැනුවත් කිරීමට ද කටයුතු කරන ලදී. අදාළ දිස්ත්‍රික්ක අනුව ලද අයදුම්පත් හා පිළිගත් අයදුම්පත් සංඛ්‍යාව පහත දක්වා ඇත.

දිස්ත්‍රික්කය	2012 නාමලේඛනයේ ලියාපදිංචි දිස්ත්‍රික්කය සඳහා පිළිගත් නම් සංඛ්‍යාව	අවතැන් වූ ඡන්දහිමියන් පදිංචිව සිටින දිස්ත්‍රික්ක අනුව පිළිගත් නම් සංඛ්‍යාව		
		පුත්තලම	අනුරාධපුරය	යාපනය
මන්නාරම	11221	10949	272	-
වවුනියාව	802	-	799	03
මුලතිව්	1250	1250	-	-
එකතුව	**13273**	**12199**	**1071**	**03**

46. අවතැන් වූ ඡන්දහිමියන් වෙනුවෙන් පුත්තලම, අනුරාධපුරය හා යාපනය යන දිස්ත්‍රික්කවල ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවන ලදී. මෙවැනි ඡන්ද මධ්‍යස්ථාන 19 ක් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටුවා තිබූ අතර, ඉන් 17 ක් මන්නාරම දිස්ත්‍රික්කය යටතේ ලියාපදිංචි ඡන්දහිමියන් 10,949 ක් වෙනුවෙන් වෙන් විය. පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටුවා තිබූ ඡන්ද මධ්‍යස්ථාන 02 ක්, මුලතිව් දිස්ත්‍රික්කයේ ඡන්දහිමියන් 1,250 ක් වෙනුවෙන් වෙන්වී තිබුණි. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ අවතැන් ඡන්දහිමියන් වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථාන දෙකක් පිහිටුවා තිබුණි. ඉන් එකක්, වවුනියාව දිස්ත්‍රික්කය යටතේ ලියාපදිංචිව සිටි ඡන්දහිමියන් 799 ක් වෙනුවෙන් ද, අනික් ඡන්ද මධ්‍යස්ථානය, මන්නාරම දිස්ත්‍රික්කයේ ඡන්දහිමියන් 272 ක් වෙනුවෙන් ද පිහිටුවා තිබුණි. යාපනය දිස්ත්‍රික්කයේ පිහිටුවන ලද ඡන්දපොළ වවුනියාව දිස්ත්‍රික්කයේ ඡන්දහිමියන් තිදෙනා වෙනුවෙනි.

47. මීට අමතරව, සිවිල් සංවිධාන හා දේශපාලන පක්ෂ විසින් උතුරු පළාතේ දිස්ත්‍රික්කවල සුභසාධන කඳවුරු කිහිපයක හා තවත් ගම්මානවල සිට දුරබැහැර පිහිටි ඡන්ද මධ්‍යස්ථාන කරා ගමන් කිරීමට ඡන්දදායකයින්ට ඇති අපහසුතා පිළිබඳව දන්වා තිබූ බැවින්, ඒ පිළිබඳව පොදු ගමනාගමන පහසුකම් ක්‍රමවත් කිරීම ආදී වැඩපිළිවෙලක් සකස් කිරීමට යෙදීමට උතුරු පළාතේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට, මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2013.08.24 වන දින උපදෙස් දෙන ලදී.

48. අවතැන් වූ ඡන්දහිමියන්ගේ පහසුකම් සැලසීම සඳහා ඔවුන්ගේ අයදුම්පත් සම්පූර්ණ කරවීම, ඒවා ග්‍රාම නිලධාරීන් ලවා නිර්දේශ කරවීම මෙන්ම අදාළ ඡන්දහිමියන් පදිංචි ප්‍රදේශවල එම පුද්ගලයින්ට අයදුම්පත් බෙදා දීම ආදී කටයුතු වෙනුවෙන් සමහර දේශපාලන පක්ෂ උනන්දු වූ බව පැහැදිලි කරුණකි. මෙසේ ඡන්ද විමසීම තරග කරනු ලබන අංශවල උනන්දුවෙන් මෙම කටයුතු සිදු වන විට, අයදුම්පත් සම්පූර්ණ කොට මැතිවරණ කොමසාරිස්වරයා වෙත එවීමේ දී යම් යම් වැරදි ක්‍රියා සිදු වන බව නිරීක්ෂණය කර ගැනීමට හැකි විය.

49. ඉදිරිපත් කරන ලද අයදුම්පත්වල සඳහන් අදාළ පුද්ගලයින්ගේ අනන්‍යතාව හා ඔවුන්ගේ අවතැන් වීමට අදාළ කරුණු සනාථ කිරීමට ග්‍රාම නිලධාරීන්ට වගකීම පවරා තිබුණි. එසේම, අයදුම්කරු විසින් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති විස්තරවල නිවැරදිතාව සහතික කිරීම ද එම නිලධාරීන්ගේ රාජකාරියක් විය. ඡන්දහිමි නාමලේඛනයේ විස්තර පරීක්ෂා කරමින්, අයදුම්කරුවන් වෙනුවෙන් වෙනත් පුද්ගලයින් විසින් අයදුම්පත් සම්පූර්ණ කිරීමත්, අයදුම්කරුවන්ගේ විස්තර සොයා බැලීමකින් තොරව බොහෝ ග්‍රාම නිලධාරීන් විසින් අයදුම්පත් නිර්දේශ කිරීමත් නිසා, විවිධාකාර විෂමතා, අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේ දී හෙළි විය. අයදුම්පත අයදුම්කරු විසින් අත්සන් නොකළ අවස්ථා හා ඒවායේ ඔවුන්ගේ ලියාපදිංචියට අදාළ විස්තර වැරදි සහගත ලෙස ඇතුළත් වීම් ද දක්නට ලැබුණි. ඉල්ලුම්කරුවන් විසින් අත්සන් නොකරන ලද අයදුම්පත් 150 කට අධික සංඛ්‍යාවක් ලැබී තිබුණි. සමහර අයදුම්කරුවන් වෙනුවෙන් අයදුම්පත් කිහිපයක් ඉදිරිපත් වූ අවස්ථා ද විය. මෙවර පළාත් සභා ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්දදායකයන් වශයෙන් පිළිගෙන තිබූ රජයේ නිලධාරීන් වෙනුවෙන් ද, මෙවැනි අයදුම්පත් ඉදිරිපත් වූ අවස්ථා විය. එවැනි අයදුම්පත් 164 ක් ඉදිරිපත් වී තිබුණි. ඊට අමතරව මිය ගිය පුද්ගලයින්ගේ නම් 34 ක් සඳහා ද අයදුම්පත් ඉදිරිපත් විය. සමහර අයදුම්කරුවන්ට මේ ආකාරයේ පහසුකම් ලැබීම සඳහා හිමිකම් ද නොතිබිණි. මෙම හේතු නිසා අදාළ පහසුකම් ලැබිය යුතු අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම හා අයදුම්පත්වල නිවැරදිතාව පරීක්ෂා කිරීම සඳහා විවිධ පියවර ගැනීමට සිදු විය.

පිළිගත් දේශපාලන පක්ෂ

50. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 8 වන වගන්තිය අනුව, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පිළිගත් සෑම දේශපාලන පක්ෂයක්ම, පළාත් සභා ඡන්ද විමසීම් කටයුතු වෙනුවෙන් ද පිළිගත් දේශපාලන පක්ෂ හැටියට සැලකේ. මෙම ඡන්ද විමසීම්වලට අදාළව පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 (1) වන වගන්තිය යටතේ වූ දැන්වීම්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත්කරන අවස්ථාව වන විට, පිළිගෙන තිබූ දේශපාලන පක්ෂ සංඛ්‍යාව 64කි.

51. පිළිගෙන ඇති දේශපාලන පක්ෂයක හිමිකම පිළිබඳව ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් හිමිකම් පෑම නිසා,

ඡන්ද විමසීම් අවස්ථාවක දී දුෂ්කරතා ඇති වී තිබෙන බවට මැතිවරණ කොමසාරිස්වරයා විශ්වාස කරන්නේ නම්, එම දුෂ්කරතා ඉවත් කිරීම පිණිස එවැනි පක්ෂ පිළිබඳව තීරණයක් ගැනීමට ඔහුට සිදුවේ. අදාළ පාර්ශ්ව ඉදිරිපත් කරනු ලබන කරුණු සලකා, නාමයෝජනා කාලය ඉකුත්ව යාමට ප්‍රථම, එවැනි දේශපාලන පක්ෂයක් වෙනුවෙන් හිමිකම් පාන්නාවූ කිසියම් කණ්ඩායමක් එම පක්ෂය හැටියට පිළිගනු ලබන්නේදැයි මැතිවරණ කොමසාරිස්වරයාට තීන්දු කළ හැකිය. එසේම එම කිසිදු කණ්ඩායමක් අදාළ පක්ෂය වශයෙන් එම ඡන්ද විමසීමට අදාළව පිළිනොගැනීමට ද මැතිවරණ කොමසාරිස්වරයාට තීරණය කළ හැකිය.

52. 2012 සිට 2014 දක්වා පැවති පළාත් සභා ඡන්ද විමසීම්, අවස්ථා හතරකදී පැවති අතර, ඒ ඒ පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවන්හිදී පිළිගෙන තිබූ දේශපාලන පක්ෂවලනම්, පරිශිෂ්ඨ අංක 13, 14, 15, 16 හා 17 වශයෙන් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත. ඒ සෑම පක්ෂ නාමලේඛනයකම පිළිගෙන තිබූ දේශපාලන පක්ෂ සංඛ්‍යාව 64ක් වශයෙන් දක්වා තිබුණ ද ඒවායේ ඇතුළත් දේශපාලන පක්ෂ සුළු සංඛ්‍යාවක නම් වල සංශෝධන සිදු කිරීම් නිසා යම් වෙනස්කම් නිරීක්ෂණය කළ හැකිය.

III වන කොටස

නාමයෝජනා භාර ගැනීම

53. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 (1) වගන්තිය අනුව, පළාත් සභාවක් විසුරුවා හැරීමෙන් පසු සතියක් ඇතුළත, එම සභාවට ඡන්ද විමසීමක් පැවැත්වීමේ තම අදහස පිළිබඳ දැන්වීමක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කරනු ලැබිය යුතුය. එම පළාතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියා විසින් නාමයෝජනා භාර ගනු ලබන ස්ථානය හා වේලාව ද, නාමයෝජනා පත්‍රයෙහි ඇතුළත් කිරීමට නියමිත අපේක්ෂක සංඛ්‍යාව ද, නාමයෝජනා වෙනුවෙන් ඇප මුදල් තැන්පත් කළ හැකි ආකාරය ද එම දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතුය. පනතේ 10 (2) වගන්තිය අනුව නාමයෝජනා කාල සීමාව, ඉහත සඳහන් ආකාරයට දැන්වීම පළ කරනු ලැබූ දිනයෙන් පසුව එළඹෙන 14 වන දිනයෙන් ආරම්භවී, 21 වන දිනයේ මධ්‍යාහ්න 12ට අවසන් විය යුතුය. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 14 (1) වගන්තිය අනුව, නාමයෝජනා දැන්වීම පළ කරනු ලැබූ දිනය සහ නාමයෝජනා භාර දීමේ අවසන් දිනයට පෙර දින දහවල් 12 දක්වා කාලය තුළ ස්වාධීන කණ්ඩායම් විසින්, එක් අපේක්ෂකයකුට රුපියල් දෙදහස බැගින් වූ ඇප මුදලක් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත තැන්පත් කළ යුතු වේ.

54. ඒ ඒ පළාත් සභාව විසුරුවා හරින ලද දිනය, නාමයෝජනා දැන්වීම පළ කළ දිනය, පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් එක් පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව ද, එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරා පත්කර ගැනීමට නියමිත මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ද, දිස්ත්‍රික්ක අනුව පිළිගන්නා ලද නාමයෝජනා පත්‍ර හා පිළිනොගත් නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව ද, තරගයට එළඹී මුළු අපේක්ෂක සංඛ්‍යාව ද පහත වගුවල දක්වා ඇත. එක් එක් පළාත් සභාව වෙනුවෙන් නාමයෝජනා කැඳවන මෙන් ගැසට් පත්‍රවල පළ කරන ලද දැන්වීම් අංක 09, 10, 11 සහ 12 යන පරිශිෂ්ඨවල දක්වා ඇත.

නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව පළාත් සභා

I. පළාත් සභා විසුරුවා හරින ලද දිනය - 2012 06.27
II. නාමයෝජනා දැන්වීම පළ කළ දිනය - 2012.06.28
III. නාමයෝජනා භාර ගැනීමේ කාලය - 2012.07.12 සිට 2012.07.19
IV. ඡන්ද විමසීම් දිනය - 2012.09.08

පළාත	පළාතට අයත් පරිපාලන දිස්ත්‍රික්ක	පක්ෂයක්/ කණ්ඩායමක් විසින් නාමයෝජනා කළයුතු අපේක්ෂකයින් සංඛ්‍යාව	දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරා පත්කරගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව	පිළිගත් දේශපාලන පක්ෂ විසින් භාර දෙන ලද නාමයෝජනා පත්‍ර ගණන	නාමයෝජනා භාර දුන් ස්වාධීන කණ්ඩායම් ගණන	ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව (දේශාපලන පක්ෂ විසින් භාර දෙන ලද)	ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව (ස්වාධීන කණ්ඩායම් විසින් භාර දෙන ලද)	තරග කළ අපේක්ෂක සංඛ්‍යාව
නැගෙනහිර	මඩකලපුව	14	11	13	21	-	-	476
	අම්පාර	17	14	16	19	-	01	578
	ත්‍රිකුණාමලය	13	10	17	16	01	-	416
එකතුව		**44**	**35**	**46**	**56**	**01**	**01**	**1,470**
උතුරු මැද	අනුරාධපුරය	24	21	09	05	-	-	336
	පොළොන්නරුව	13	10	09	07	-	-	208
එකතුව		**37**	**31**	**18**	**12**			**544**
සබරගමුව	රත්නපුර	27	24	14	06	01	-	513
	කෑගල්ල	21	18	13	14	-	01	546
එකතුව		**48**	**42**	**27**	**20**	**01**	**01**	**1,059**
මුලු එකතුව		**129**	**108**	**91**	**88**	**02**	**02**	**3,063**

මධ්‍යම, උතුරු සහ වයඹ පළාත් සභා

I. මධ්‍යම සහ වයඹ පළාත් සභා විසුරුවා හරින ලද දිනය - 2013.07.05
(උතුරු පළාත වෙනුවෙන් ඡන්ද විමසීම පවත්වන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ (2) ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විධානය මතය.)

II. නාමයෝජනා දැන්වීම පළ කළ දිනය - 2013.07.11

III. නාමයෝජනා භාර ගැනීමේ කාලය - 2013.07.25 සිට2013.08.01

IV. ඡන්ද විමසීම් දිනය - 2013.09.21

පළාත	පළාතට අයත් පරිපාලන දිස්ත්‍රික්ක	පක්ෂයක්/ කණ්ඩායමක් විසින් නාමයෝජනා කළයුතු අපේක්ෂකයින් සංඛ්‍යාව	දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරා පත්කරගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව	පිළිගත් දේශපාලන පක්ෂ විසින් භාර දෙන ලද නාමයෝජනා පත්‍ර ගණන	නාමයෝජනා භාර දුන් ස්වාධීන කණ්ඩායම් ගණන	ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව (දේශාපලන පක්ෂ විසින් භාර දෙන ලද)	ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව (ස්වාධීන කණ්ඩායම් විසින් භාර දෙන ලද)	තරග කළ අපේක්ෂක සංඛ්‍යාව
මධ්‍යම	මහනුවර	32	29	17	08	-	-	800
	මාතලේ	14	11	13	07	-	-	280
	නුවරඑළිය	19	16	14	10	-	01	437
එකතුව		**65**	**56**	**44**	**25**		**01**	**1,517**
උතුර	යාපනය	19	16	13	10	02	01	380
	කිලිනොච්චි	07	04	11	03	-	01	91
	මන්නාරම	08	05	12	08	-	-	160
	වවුනියාව	09	06	12	08	-	01	171
	මුලතිව්	08	05	11	02	-	-	104
එකතුව		**51**	**36**	**59**	**31**	**02**	**03**	**906**
වයඹ	කුරුණෑගල	37	34	15	12	02	-	925
	පුත්තලම	19	16	13	11	01	-	437
එකතුව		**56**	**50**	**28**	**23**	**03**		**1,362**
මුලු එකතුව		**172**	**142**	**131**	**79**	**05**	**04**	**4,785**

බස්නාහිර සහ දකුණ පළාත් සභා

I. පළාත් සභා විසුරුවා හරින ලද දිනය - 2014.01.12

II. නාමයෝජනා දැන්වීම පළ කළ දිනය - 2014.01.16

III. නාමයෝජනා භාර ගැනීමේ කාලය - 2014.01.30 සිට 2014.02.06

IV. ඡන්ද විමසීම් දිනය - 2014.03.29

පළාත	පළාතට අයත් පරිපාලන දිස්ත්‍රික්ක	පක්ෂයක්/ කණ්ඩායමක් විසින් නාමයෝජනා කළයුතු අපේක්ෂකයින් සංඛ්‍යාව	දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරා පත්කරගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව	පිළිගත් දේශපාලන පක්ෂ විසින් භාර දෙන ලද නාමයෝජනා පත්‍ර ගණන	නාමයෝජනා භාර දුන් ස්වාධීන කණ්ඩායම් ගණන	ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව (දේශාපලන පක්ෂ විසින් භාර දෙන ලද)	ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව (ස්වාධීන කණ්ඩායම් විසින් භාර දෙන ලද)	තරග කළ අපේක්ෂක සංඛ්‍යාව
බස්නාහිර	කොළඹ	43	40	18	15	-	04	1,247
	ගම්පහ	43	40	13	09	-	-	946
	කළුතර	25	22	14	10	01	01	550
එකතුව		**111**	**102**	**45**	**34**	**01**	**05**	**2,743**
දකුණ	ගාල්ල	25	22	14	04	-	-	450
	මාතර	20	17	14	05	-	-	380
	හම්බන්තොට	17	14	09	04	-	-	221
එකතුව		**62**	**53**	**37**	**13**	-	-	**1,051**
මුලු එකතුව		**173**	**155**	**82**	**47**	**01**	**05**	**3,794**

ඌව පළාත් සභාව

I. (පළාත් සභාව විසුරුවා හරින ලද දිනය - 2014.07.11
II. නාමයෝජනා දැන්වීම පළ කළ දිනය - 2014.07.16
III. නාමයෝජනා භාර ගැනීමේ කාලය - 2014.07.30 සිට 2014.08.06
IV. ඡන්ද විමසීම් දිනය - 2014.09.20

පළාත	පළාතට අයත් පරිපාලන දිස්ත්‍රික්කය	පක්ෂයක්/ කණ්ඩායමක් විසින් නාමයෝජනා කළයුතු අපේක්ෂකයින් සංඛ්‍යාව	දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරා පත්කරගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව	පිළිගත් දේශපාලන පක්ෂ විසින් භාර දෙන ලද නාමයෝජනා පත්‍ර ගණන	නාමයෝජනා භාර දුන් ස්වාධීන කණ්ඩායම් ගණන	ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව (දේශාපලන පක්ෂ විසින් භාර දෙන ලද)	ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව (ස්වාධීන කණ්ඩායම් විසින් භාර දෙන ලද)	තරග කළ අපේක්ෂක සංඛ්‍යාව
ඌව	බදුල්ල	21	18	10	04	-	-	294
	මොණරාගල	17	14	12	07	-	-	323
එකතුව		38	32	22	11	-	-	617

55. නාමයෝජනාභාර ගැනීමේ කටයුතු සංවිධානයට අදාළව, මැතිවරණ කොමසාරිස්වරයාට හා අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට ද කටයුතු රාශියක් ඉටු කිරීමට තිබිණි. නාමයෝජනා භාර දීමට සුදුසුකම් ඇති අයට බාධාවකින් තොරව ඇප මුදල් තැන්පත් කිරීමට හා නාමයෝජනා භාරදීමට පහසුකම් සැලසීම සම්බන්ධව අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දීමත්, එම වැඩපිළිවෙල පිළිබඳව අදාළ පාර්ශ්ව හා පිළිගත් දේශපාලන පක්ෂ දැනුවත් කිරීමත් මැතිවරණ කොමසාරිස්වරයාගේ වගකීමකි. එම කටයුතු දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තෝරා ගැනීමට හා නාමයෝජනා භාර ගැනීමේ ස්ථානවල ආරක්ෂාව සැලසීම පිළිබඳව අදාළ දිස්ත්‍රික්කවල ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමග කටයුතු කිරීමට තේරීම්භාර නිලධාරීන්ට මග පෙන්වන ලදී. නාමයෝජනා භාර ගැනීම හා සම්බන්ධ කටයුතු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් ඉටු කළ හැකි සුදුසු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ සහායට තෝරා පත්කරන ලදී. විශේෂයෙන් නාමයෝජනා භාර ගැනීමේ අවසාන දිනයේ දී, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ඉටු කළ යුතු රාජකාරීවලට බාධා නොවන පරිදි, එම නිලධාරීන්ගේ කාර්යාල පරිශ්‍රවල මෙන්ම, එම කාර්යාල අවට සාමකාමී පරිසරයක් පවත්වාගෙන යාම, ප්‍රාදේශීය මට්ටමේ පොලිස් නිලධාරීන්ගේ වගකීමකි. ඒ කාර්යභාරය සම්බන්ධව අදාළ ප්‍රාදේශීය මට්ටමේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා, පොලිස්පතිවරයා තම කාර්යාලයට කැඳවා උපදෙස් දීමට, මැතිවරණ කොමසාරිස්වරයා කටයුතු කරන ලදී. එසේම, ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ද දිස්ත්‍රික් නියෝජ්‍ය හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ද නාමයෝජනා භාර ගැනීමේ වැඩපිළිවෙල පිළිබඳව පළාත් සභා විසුරුවා හැරීමේ දැන්වීම පළ කළ විගස දැනුවත් කරන ලදී.

56. නාමයෝජනා වෙනුවෙන් ඇප මුදල් තැන්පත් කිරීමට හා නාමයෝජනා භාර දීම සඳහා පැමිණෙන සියලු දෙනා නාමයෝජනා ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමට, තේරීම්භාර නිලධාරීන් ක්‍රියා කරන ලදී. නාමයෝජනා ආකෘතිපත්‍ර භාර ගැනීමට පැමිණි සියලු දෙනා වෙත නාමයෝජනා භාර දීමට අදාළ කරුණු ලිඛිතව ලබාදීමට ද තේරීම්භාර නිලධාරීන් ක්‍රියා කොට තිබුණි. මෙම ක්‍රියාමාර්ගය නිසා නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප වීමට තිබූ ඉඩකඩ, බොහෝ දුරට අහුරාලීමට හැකියාව ලැබුණු බව විශ්වාස කළ හැකිය.

57. නාමයෝජනා භාර ගැනීමේ කාලය තුළ, අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් භාර ගන්නා ලද නාමයෝජනා පත්‍ර පිළිබඳ විස්තර අංක 4 දරන සංඛ්‍යා සටහනේ දක්වා ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ නාමලේඛන 5, 6, 7 සහ 8 යන සංඛ්‍යා සටහන්වල දක්වා ඇත.

58. පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නාමයෝජනා පත්‍රභාර දී ඇති දින වකවානු බැලීමේ දී පැහැදිලි වන කරුණක් වනුයේ, මෙවර නාමයෝජනා භාරගැනීම සඳහා තිබූ සතියක කාලය තුළ අවසාන දින දෙකෙහි විශාල නාමයෝජනා පත්‍ර සංඛ්‍යාවක් භාර දී ඇති බවයි. (නාමයෝජනා ක්‍රියාවලිය පිළිබඳ විස්තර සඳහා අංක 18 (I) සිට 18 (IX) දක්වා පරිශිෂ්ඨ බලන්න.) පිළිගත් දේශපාලන පක්ෂවලින් නාමයෝජනා ඉල්ලා ඉදිරිපත්වන පිරිස අධික වීම නිසා අපේක්ෂකයින් තෝරා ගැනීමේ දී තරගයක් පැවතීම, එවැනි පක්ෂ වඩාත් ඉහළ ජයග්‍රහණයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් තම අපේක්ෂකයන් තෝරා ගැනීමට උනන්දුවීම ආදී කරුණු ප්‍රධාන පෙළේ දේශපාලන පක්ෂවලට

නාමයෝජනා පත්‍ර භාර දීම පමාවීමට බොහෝවිට හේතු වන්නට ඇත. එහෙත් අනිකුත් පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නාමයෝජනා පත්‍ර භාර දීම ප්‍රමාදවීමට බොහෝවිට ඒවායේ අසංවිධානාත්මකභාවය වැනි කරුණු බලපාන්නට ඇතැයි සිතිය හැකිය. පරිපාලන දිස්ත්‍රික්ක යටතේ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් තරග වැදුණු අපේක්ෂක සංඛ්‍යාව අංක 4 දරන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

59. නාමයෝජනා භාර ගැනීමේ කටයුතු අවසන් වූ දින, එම කටයුතු අවසානයේ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් තේරීම්භාර නිලධාරී කාර්යාලවලට හා ඒ අවට ප්‍රදේශවලට පැමිණෙන පිරිස පාලනය කිරීම සඳහා පොලිසිය විසින් ආරක්ෂක වැඩපිළිවෙලවල් යොදා තිබිණි.

60. නාමයෝජනා ඉදිරිපත් කරනු ලැබූ පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල ආධාරකරුවන් සෑහෙන පිරිසක් නාමයෝජනා කාලයේ අවසන් දින, තේරීම්භාර නිලධාරීන්ගේ කාර්යාල අවට රැස්වෙන බැවින්, ඒ අවට සාමකාමී පරිසරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය විධිවිධාන යෙදීමට තේරීම්භාර නිලධාරීන්ට හා පොලිසියට අවශ්‍ය උපදෙස් දී තිබිණි. විශේෂයෙන් මෙම දින නාමයෝජනා භාර දෙනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ සිය පිරිස් බලය ප්‍රදර්ශනය කිරීම සඳහා, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාල දක්වා විශාල ලෙස ජනතාව කැඳවීම හා පාක්ෂිකයින් මෙන්ම වාහන ද භාවිතා කරමින්, පෙළපාලි පැවැත්වීම ද සිදු කිරීම සාමාන්‍ය සිරිතක්ව පවතින බැවින්, එවැනි නීති විරෝධී පෙළපාලි නැවැත්වීමට අවශ්‍ය උපදෙස් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පොලිසියට දී තිබුණි. මේ ආකාරයේ පෙළපාලි නැවැත්වීමට පොලිසිය ගත් උත්සාහයන් ව්‍යර්ථ වූ අවස්ථාවන්හි දී, එම නීති විරෝධී පෙළපාලි පැවැත්වූ අය සම්බන්ධ යම් යම් අවස්ථාවල පොලිසිය නීති මගින් ද ක්‍රියා කර ඇත.

61. නාමයෝජනා භාර ගැනීම අවසන් වීමෙන් පසු පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 17 වන වගන්තිය අනුව, නාමයෝජනා පත්‍ර පරීක්ෂාකොට ඒවා පිළිබඳ තීරණ දැනුම් දීමෙන් අනතුරුව, තරගය සඳහා ඉතිරි වූ නාමයෝජනා පත්‍ර සම්බන්ධයෙන් අදාළ පනතේ 20 (1) වගන්තිය යටතේ දැක්වෙන ක්‍රියාමාර්ග තේරීම්භාර නිලධාරීන් විසින් ගන්නා ලද අතර, සියලුම දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම්, තරග සහිත වූ බැවින්, ඡන්ද විමසීම් අඩාලව කල් තැබිණි. ඉන් පසු තරගය සඳහා එළඹ සිටි පිළිගත් දේශපාලන පක්ෂ වෙනුවෙන් ඒවායේ අනුමත ලකුණු ද, ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් ඒ ඒ කණ්ඩායම් නායකයන් විසින් තෝරා ගන්නා ලද ලකුණු සහ ස්වාධීන කණ්ඩායම් හඳුනා ගැනීමේ අංක ද වෙන් කිරීමෙන් අනතුරුව, අපේක්ෂකයින්ගේ අනුක්‍රමික අංක ද, දිස්ත්‍රික්ක තුළ පිහිටු වන ලබන ඡන්ද පොළවල පිහිටීම ද, ඡන්ද විමසීම් දිනය හා කාලය ද, ඇතුළත් ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම්, ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා තේරීම්භාර නිලධාරීන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබීය. නාමයෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවල දී ඒ පිළිබඳව අදාළ පාර්ශ්ව වෙත තේරීම්භාර නිලධාරීන් විසින් ලිඛිතව දැනුම් දී ඇත.

62. පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් ගම්පහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත 2014.02.06 වන දින භාරදුන් නාමයෝජනා පත්‍රයක් පරීක්ෂා කිරීමේ දී ඇතිවූ ගැටලු සහගත තත්ත්වය හේතුවෙන්, එහි සඳහන් ජාතික හැඳුනුම්පත් අංක සහිත අපේක්ෂකයින් කිහිප දෙනෙකුගේ අනන්‍යතාවට අදාළ කරුණු විමර්ශණය කිරීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියාට සිදුවිය. එම කරුණු විමර්ශණයේ දී හෙළිවූයේ එම නාමයෝජනා පත්‍රයේ ඇතුළත් අපේක්ෂකයින් කිහිපදෙනෙකුගේ නම් ඔවුන්ගේ අනුදැනුමකින් තොරව නාමයෝජන පත්‍රයට ඇතුළත්කර ඇති බවය. ඒ අනුව එම ලේඛනවල අපේක්ෂකයින් නාමයෝජනා වෙනුවෙන් සිය කැමැත්ත ප්‍රකාශ කරමින් යොදා ඇති අත්සන් ද වංචා සහගතව යෙදූ ඒවා බවට ද සැක පහළ විය. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ සඳහන් නීතිමය ප්‍රතිපාදන අනුව එම නාමයෝජනා පත්‍රය ඡන්ද විමසීම සඳහා පිළිගැනුන ද එහි ඇතුළත් සාවද්‍ය යැයි හැඟී ගිය කරුණු නිසා, ගම්පහ දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා/ සහකාර තේරීම්භාර නිලධරයා, එම නාමයෝජනා පත්‍රය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාළ දේශපාලන පක්ෂයට විරුද්ධව පැමිණිල්ලක් ගම්පහ පොලිසිය වෙත ඉදිරිපත් කරන ලදී.

63. කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් භාරදෙන ලද පිළිගත් දේශපාලන පක්ෂයකට අදාළ නාමයෝජනා පත්‍රයක, නම ඇතුළත් අපේක්ෂකයකු, සිය නමෙහි ආරම්භයට "අ" අක්ෂරය සිව් වාරයක් අසාමාන්‍ය පරිදි යොදා තිබීම නිසා ඒ පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරුණු සොයා බලන ලදී. ඒ අනුව පෙනී ගොස් ඇත්තේ, එම අපේක්ෂකයා තම නම එම ආකාරයට කොළඹ, වැල්ලවත්ත උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයෙන් නිකුත් කර තිබූ උප්පැන්න සහතිකයට ද, ජාතික හැඳුනුම්පතට ද ඇතුළත් කරවාගෙන තිබූ බවයි. උප්පැන්න සහතිකයේ 13 වන තීරුව යටතේ, මෙසේ අදාළ නම අලුතින් උප්පැන්න

සහතිකයට ඇතුළත් කරගෙන තිබීම පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා, 2014.02.10 වන දින,රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැනුම් දී ඇත. ගම්පහ දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කරන ලද අපේක්ෂකයෙකු ද කඳාන කොට්ඨාසයේ ලියාපදිංචි කර ඇති තම උප්පැන්න සහතිකයේ නමට ඉදිරියෙන්, අ සහ ආ යන සිංහල අක්ෂර යොදා සංශෝධනය කරවා ගෙන, ඒ අනුව නාමයෝජනා පත්‍රයට ද නම ඇතුළත් කර ඇති බව ද හෙළි විය. මේ ගැන ද මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.02.13 වන දින රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දන්වා ඇත.

64. මෙසේ අපේක්ෂකයින් නාමයෝජනා පත්‍රයෙහි සිය නමෙහි මූලට, ඔවුන්ගේ වාසගමටවත් අදාළ නොවන පරිදි සිංහල භාෂා අක්ෂර මාලාවේ ඇති මුල් අකුරු යොදා ගැනීමට පෙළඹී ඇත්තේ, ඡන්ද විමසීම් නීතිය අනුව අපේක්ෂකයින් හඳුනා ගැනීමට අනුපිළිවෙළ අංක ලබා දීම සඳහා ඔවුන්ගේ නම් ආරම්භවන සිංහල අක්ෂර හෝඩියේ අකුරු අනුපිළිවෙළට අපේක්ෂකයින්ගේ නම් පෙළගැස්වීමට කටයුතු කරනු ලබන නිසා බව පැහැදිලි වන කරුණකි. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා මැතිවරණ කොමසාරිස්වරයාගේ 2014.02.10 වන දිනැති ලිපියට පිළිතුරු එවමින්, 2014.02.12 දින දන්වා ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ අදාළ නමේ සංශෝධන කටයුතු කර ඇති අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ එම රාජකාරී ක්‍රියාකලාපය පිළිබඳව, මූලික විමර්ශනයක් සිදු කර එම අයට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගනු ලබන බවයි. තව ද මෙම තත්ත්වය හේතුවෙන් උප්පැන්න ලේඛනවල නම් වෙනස් කිරීම හා එම ලේඛනවලට අලුතින් නම් ඇතුළත් කිරීම පිළිබඳව 2014.02.18 වන දින සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්ට හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්ට නව උපදෙස් මාලාවක් නිකුත් කර ඇති බව ද මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා ඇත. එම උපදෙස් අනුව, උච්චාරණය කළ නොහැකි හා ශබ්ද නගා නාමයක් වශයෙන් ව්‍යවහාර කළ නොහැකි අකුරු කීපයක්, සංශෝධන හැටියට නම සමග සටහන් කරවා ගැනීමට උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 27 වන වගන්තිය යටතේ ඉල්ලුම්කර ඇති විට, එම ඉල්ලීම මුල් අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කළ යුතු වේ.

65. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් 2014.02.03 වන දින භාර දෙන ලද නාමයෝජනා පත්‍රයක නම් ඇතුළත් එක් අපේක්ෂකයෙකුගේ හා අපේක්ෂිකාවකගේ නම්, ලිපිනයන් හා ජාතික හැඳුනුම්පත් අංක තවත් දේශපාලන පක්ෂයක නාමයෝජනා පත්‍රයකට ඇතුළත්ව ඇති බවත්, තමන් වෙනත් නාමයෝජනා පත්‍රයක නම් ඇතුළත් කර නොමැති බවත් දන්වමින් අදාළ අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි අනුව, හම්බන්තොට දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරයා මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි ඒ පිළිබඳව 2014.02.22 වන දින තංගල්ල විශේෂ අපරාධ විමර්ශන අංශයට පැමිණිලි කර ඇත.

ඡන්ද පත්‍රිකා

66. නාමයෝජනා කාලය අවසන් වීමෙන් පසු තම දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වධීන කණ්ඩායම් ද, අපේක්ෂක සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 30 (1) වගන්තිය හා පනතේ පළමුවන උප ලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුකූලව මුද්‍රණය කළ යුතු ඡන්ද පත්‍රිකාවක ආදර්ශයක්, ඒ ඒ තේරීම්භාර නිලධාරියා විසින් මැතිවරණ කොමසාරිස්වරයාට භාර දෙනු ලබන අතර, එහි නිවැරදිතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකා මුද්‍රණය සඳහා වූ ඇණවුම, මැතිවරණ කොමසාරිස්වරයා විසින් රජයේ මුද්‍රණාලයාධිපති වෙත භාර දෙනු ලැබේ. ඒ හැරුණු කොට නාමයෝජනා භාරගැනීමෙන් පසු තවත් වැදගත් ලේඛන රාශියක් ද දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් මැතිවරණ කොමසාරිස්වරයාට භාර දෙනු ලැබේ.

67. ඡන්ද පත්‍රිකාවේ ඉහළ කොටසේ, දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂවල නම් සිංහල අකාරාදි පිළිවෙළට සඳහන් කරනු ලැබේ. ඉන් අනතුරුව, තරග කරනු ලබන ස්වාධීන කණ්ඩායම්වල නම් එහි සඳහන් කරනු ඇත. යම් දිස්ත්‍රික්කයකට ස්වාධීන කණ්ඩායම් එකකට වඩා තරග කරන්නේ නම් ඒවා හැඳින්වීම සඳහා 1, 2 ආදී වශයෙන් අනුපිළිවෙළට ඒවා වෙනුවෙන් අංක ලබා දෙනු ඇත. දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල නම්වලට ඉදිරියෙන් ඒවායේ ඡන්ද ලකුණු ද, ඡන්දය සලකුණු කිරීම වෙනුවෙන් පක්ෂයකට හෝ කණ්ඩායමකට එක් හිස් කොටුවක් බැගින් ද ඡන්ද පත්‍රිකාවල මුද්‍රණය කෙරේ. පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල නම්වලට අනතුරුව, ඡන්ද පත්‍රිකාවෙහි පහළ කොටසෙහි දිස්ත්‍රික්කය වෙනුවෙන් පක්ෂයක් හෝ කණ්ඩායමක් නියෝජනය කරමින් තරග කරනු ලබන අපේක්ෂකයන් සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් වන පරිදි ඔවුන් හඳුන්වා දීම සඳහා වෙන් කරන ලද අංක, අනුපිළිවෙලට කොටුවල වෙන වෙනම මුද්‍රණය කෙරේ. එවැනි අංකයක් සහිත කොටුවක් කතිර ලකුණකින් කපා හැර අපේක්ෂකයකු වෙනුවෙන් ඡන්දදායකයාට මනාපය පළ කළ හැකිය. සෑම පළාත්

සභා ඡන්ද විමසීමකටම අදාළව ඡන්දය ප්‍රකාශ කිරීම සහ මනාප ලකුණු කිරීම පිළිබඳව පැහැදිලි කිරීමේ පුවත්පත් දැන්වීම් පළ කරන ලදී. ඡන්ද පත්‍රිකාවක ආදර්ශයක් ද ඇතුළත් වූ උඟව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව පුවත්පත්වල පළ වූ එවැනි දැන්වීමක් අංක 23 දරන පරිශිෂ්ඨයෙහි ඇතුළත් වේ.

68. රජයේ මුද්‍රණාලයාධිපති විසින් විශේෂ ආරක්ෂාව යටතේ ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීමෙන් පසු ඒවා ඒ ඒ දිස්ත්‍රික්කයට ආරක්ෂා සහිතව අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීගේ හා මැතිවරණ කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරයලත් නිලධාරීන් මාර්ගයෙන්, තේරීම්භාර නිලධාරීන්ට භාර දීම සඳහා ක්‍රියා කෙරේ. ඡන්ද පත්‍රිකාවක සාමාන්‍ය පළල අඟල් 4 ක් පමණ වුව ද දිස්ත්‍රික්කයක් වෙනුවෙන් තරග කරනු ලබන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව, අනුව ඒවා දිග ප්‍රමාණයෙන් වෙනස් වනු ඇත. මෙවර ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වැඩි සංඛ්‍යාවක් වූ දිස්ත්‍රික්කවල ඡන්ද පත්‍රිකා, අඟල් 20 ක් ඉක්මවූ දිගින් යුක්ත විය.

IV වන කොටස

ඡන්ද විමසීම් සඳහා පූර්ව අවශ්‍යතා

තැපෑලෙන් ඡන්දය දීම

69. 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 24 (3) වගන්තිය අනුව, තැපෑලෙන් ඡන්දය දීම සඳහා කරනු ලබන ඉල්ලීමක්, පනතේ 10 වන වගන්තිය යටතේ නාමයෝජනා භාර ගැනීම පිළිබඳ දැන්වීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කරනු ලැබූ දිනට පසු, දින දහයක් ඇතුළත ලැබෙන පරිදි, තේරීම්භාර නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට අයදුම්කරුවන්ට ඇති අපහසුතා සහ තැපෑලේ ප්‍රමාද ආදිය සැලකිල්ලට ගෙන, එම කාලය මෙම සෑම ඡන්ද විමසීම් අවස්ථාවකදීම වාගේ තවත් සතියක පමණ කාලයකින් දීර්ඝ කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට සිදු විය.

70. තැපෑලෙන් ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන පිරිස කවුරුන්දැයි යන්න, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 24 (2) වගන්තියේ දැක්වේ. ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්ට, පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන්ට, දුම්රිය, තැපැල් හා විදුලි සංදේශ යන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලවලට හා ලංකා ගමනා ගමන මණ්ඩලයේ කාර්යමණ්ඩලයට, මැතිවරණ රාජකාරී පැවරෙන රජයේ නිලධාරීන්ට හා පදිංචි දිස්ත්‍රික්කය හැර වෙනත් පරිපාලන දිස්ත්‍රික්කයක් වෙනුවෙන් ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන අපේක්ෂකයින්ට ද, මෙම පහසුකම ලබාගැනීම සඳහා අයදුම්කළ හැකිය. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත එවිය යුතු අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා අයදුම්කරුවන්ට තම ලියාපදිංචි විස්තර, ඡන්දහිමි නාමලේඛනවලින් පරීක්ෂාකර ලබා ගැනීම අවශ්‍ය වේ. ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවලට අදාළ ඡන්දහිමි නාමලේඛන, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද, ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අදාළ වන පරිදි ග්‍රාම නිලධාරී කාර්යාලවල ද එම ලේඛන ප්‍රදර්ශනය කරන ලදී. ආරක්ෂක අංශවල සාමාජිකයින් හා පොලිස් නිලධාරීන් දිවයින පුරා පිහිටා ඇති සේවා ස්ථානවල සේවය කරනු ලබන බැවින්, ත්‍රිවිධ හමුදාවට හා පොලිසියට අදාළ සේවා ස්ථානවල, තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලුම් කරන්නන්ගේ ලියාපදිංචි තොරතුරු පරීක්ෂා කර බැලීමට, සංයුක්ත තැටි වශයෙන් සකසන ලද ඡන්දහිමිනාමලේඛන පිටපත්, මැතිවරණ මහ ලේකම් කාර්යාලයෙන් එම කාර්ය ස්ථානවලට ලබා ගැනීමට ඉඩ සලසා තිබුණි. ඊට අමතරව මැතිවරණ මහලේකම් කාර්යාලයේ මෙම තොරතුරු ලබාදීම සඳහාම ස්ථාපිත කර තිබූ විශේෂ දුරකථන මාර්ගවලින් ද, රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය මගින් ද අදාළ අයට ඡන්දහිමි නාමලේඛනයේ තම ලියාපදිංචි විස්තර ලබා ගැනීමට පහසුකම් සලසා තිබිණි. තැපෑලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් අයදුම් කරන්නන් හා පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 123 වගන්තිය යටතේ සිය සේවා ස්ථානවලින් නිවාඩු ලබා ගෙන ඡන්දය පාවිච්චි කිරීම සඳහා යනු ලබන අය දැනුවත් කිරීමට ද පුවත්පත් දැන්වීම් පළ කරන ලදී. මෙම දැන්වීම් නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් 2012.07.06 ද, මධ්‍යම, උතුරු හා වයඹ පළාත් සභා වෙනුවෙන් 2013.07.12 ද, බස්නාහිර හා දකුණු පළාත් සභා වෙනුවෙන් 2014.01.21 ද, ඌව පළාත් සභාව වෙනුවෙන් 2014.08.03 දින ද පුවත්පත්වල පළ කොට ඇත. ඌව පළාත් ඡන්ද විමසීමට අදාළව එසේ පළ කරන ලද දැන්වීම පරිශිෂ්ඨ 19 වශයෙන් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

71. වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනයේ පිටපත් සෑම අවස්ථාවකදීම ඒ ඒ ග්‍රාම නිලධාරී වසම්වලට අදාළ වන පරිදි ග්‍රාම නිලධාරීන් වෙත භාර දෙනු ලබන බැවින්, ඒවා මාර්ගයෙන් ද අදාළ ඡන්දහිමියන්ට තම ලියාපදිංචි විස්තර සොයා ගැනීමට හැකියාව තිබේ. ඊට අමතරව ඡන්දහිමියන් ගණන් ගන්නා අවස්ථාවේ ගෘහ මූලිකයන්ට අදාළ ආකෘති පත්‍ර සමග ඒ ඒ ගෘහය යටතේ ප්‍රවර්ථන නාමලේඛනයේ ඇතුළත් ඡන්දදායකයින්ගේ නම් පිළිබඳව භාර දෙනු ලබන විස්තර මගින් ද තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලුම් කරන අයට තම ලියාපදිංචි විස්තර දැන ගැනීමට ඉඩ ලැබේ.

72. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සමහර භටයින්, ආරක්ෂක සේවා කටයුතු නොවන වෙනත් කෘෂිකාර්මික, ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන හා පූජා භූමි ශුද්ධ පවිත්‍ර කිරීමේ සේවා වැනි කටයුතුවල යොදවා ඇති බැවින්, එබඳු පිරිස්වලට තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් ලබා දිය නොහැකි බවත්, එවැනි අය ඡන්ද පොළට ගොස් සිය ඡන්දය පාවිච්චි කළ යුතු බවත්, එම භටයින් වැඩිපිරිසක් සේවය කරන උතුරු හා නැගෙනහිර පළාත්වලට අදාළ ඡන්ද විමසීම් අවස්ථාවල දී, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැනුම් දී ඇත.

73. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ රාජකාරී පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය මුද්‍රිත උපදෙස් එම නිලධාරීන්ට යැවීමටත්, ඊට අමතරව ඔවුන් කැඳවා උපදෙස් දීමටත් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් කටයුතු කර තිබිණි. විශේෂයෙන් උතුරු

පළාතේ පිහිටුවා තිබූ ආරක්ෂක සේවා ස්ථානවල තැපැල් ඡන්දසහතික කිරීමේ නිලධාරීන් හැටියට කටයුතු කරන අය දැනුවත් කිරීමට,වෙනත් දිස්ත්‍රික්කවලින් පළපුරුදු මාණ්ඩලික නිලධාරීන් යොදවා තිබිණි. එම පළාතේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා උපදෙස් පත්ති සිංහල මෙන්ම දෙමළ භාෂාවෙන් ද පැවැත්වීමට කටයුතු කරන ලදී.

74. තැපැල් ඡන්ද අයදුම්පත් සම්බන්ධව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ තීරණ, ඡන්දදායකයින්ට පිටපතක් ද සහිතව ඔවුන්ගේ සහතික කිරීමේ නිලධාරීන් වෙත දැනුම් දෙනු ලැබේ. තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට විවිධ කරුණු හේතු විය හැකිය. තේරීම්භාර නිලධාරියා වෙත අයදුම්පත් නියමිත කාලය තුළ දී නොලැබීම, අයදුම්පතේ ඡන්දදායකයාගේ විස්තර වැරදි හෝ අඩු පාඩු සහිතව සටහන් කිරීම, සහතික කිරීමේ නිලධාරියා විසින් හෝ අයදුම්කරු විසින් අයදුම්පත අත්සන් නොකිරීම ආදි කරුණු තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට බලපාන ප්‍රධාන හේතු වේ. තේරීම්භාර නිලධාරීන් වෙත ලැබුණු අයදුම්පත් හා ඒවා ප්‍රතික්ෂේප වූ ආකාරය සම්බන්ධ විස්තර අංක 10 දරන සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

තැපැල් ඡන්දහිමියන්ගේ නාමලේඛන

75. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ දෙවන උප ලේඛනයේ දැක්වෙන 1988 තැපැල් ඡන්දදායකයින් පිළිබඳ (පළාත් සභා ඡන්ද විමසීම්) නියෝග මාලාවේ 4 (1) නියෝගය අනුව, තැපැල් ඡන්දදායකයින් පිළිබඳ ලැයිස්තුව සැකසීම සඳහා, තැපැල් ඡන්දහිමියාට අදාළ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි විස්තර සහ එම අයගේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීගේ නම, තනතුර හා රාජකාරී ලිපිනය ද අවශ්‍ය වේ. ඡන්දදායකයන්ගේ ලියාපදිංචි විස්තර, පරිගණක දත්ත පද්ධතිය උපයෝගී කර ගනිමින්, තැපැල් ඡන්දහිමියන්ගේ නාමලේඛනය වෙනුවෙන් ලබා ගැනීම පහසු විය. එම තොරතුරුවලට අමතරව, එම නාමලේඛනයට ඇතුළත් කිරීමට සිදුවූයේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ විස්තර පමණි. ඒ අන්දමට සංයුක්ත තැටි (සී.ඩී) වශයෙන් තැපැල් ඡන්දදායකයන්ගේ නාමලේඛනය සකසන ලද අතර, එහි පිටපත් තරග කරනු ලැබූ පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙත ලබා දෙන ලදී.

76. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ දෙවන උපලේඛනයේ දැක්වෙන තැපැල් ඡන්දදායකයින් පිළිබඳ නියෝග මාලාවේ 10 (1) නියෝගය අනුව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල දී තැපැල් ඡන්දදායකයන් වෙත ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම, නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් 2012.08.20 වන දින ද , මධ්‍යම, උතුරු හා වයඹ යන පළාත් සභා වෙනුවෙන් 2013.08.22 දින ද, බස්නාහිර, දකුණු යන පළාත් සභා වෙනුවෙන් 2014.02.28 දින ද, ඌව පළාත් සභාව වෙනුවෙන් 2014.08.25 දින ද දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ කාර්යාලවලදී, තේරීම්භාර නිලධාරීන් විසින් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි සිදු කරන ලදී. එසේ නිකුත් කිරීම් සිදුකරනු ලබන බව හා ඒ වෙනුවෙන් පත්කළ හැකි නියෝජිතයින් සංඛ්‍යාව පිළිබඳව තරග කළ පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙත තේරීම්භාර නිලධාරීන් විසින් දැනුම් දෙන ලදී.

77. තැපැල් ඡන්දදායකයින්ට ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතු දින දෙකක් තීරණය කොට ඒ පිළිබඳව තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් සහ තැපැල් ඡන්දදායකයින් දැනුවත් කිරීම, මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදු කරන ලදී. මෙසේ ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් 2012.08.27 හා 28 යන දිනවල ද, මධ්‍යම, උතුර හා වයඹ යන පළාත් සභා වෙනුවෙන් 2013.09.09 හා 10 යන දිනවල ද, බස්නාහිර හා දකුණු පළාත් සභා වෙනුවෙන් 2014.03.13 හා 14 යන දිනවල ද සිදු කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කරන ලදී. ඌව පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් තැපැල් ඡන්දදායකයින්ට ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා 2014.09.04 සහ 05 යන දින වෙන් කර දෙන ලදී. මේ පිළිබඳව මැතිවරණ කොමසාරිස් විසින් ඌව පළාතට අදාළව පළ කළ දැන්වීම පරිශිෂ්ඨ 25 වශයෙන් වාර්තාවට ඇතුළත් කර ඇත.

78. මෙවර පැවති සෑම පළාත් සභා ඡන්ද විමසීමක දීම සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවල දී තැපැල් ඡන්ද සලකුණු කිරීමට නියමිත දිනවල, එම කටයුතු, මැතිවරණ කොමසාරිස්වරයාගේ හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීගේ උපදෙස් පරිදි සිදුවන්නේ දැයි සොයා බැලීමට සහකාර තේරීම්භාර නිලධාරීන් යොදවා තිබිණි. සාමාන්‍යයෙන් තැපැල් ඡන්දදායකයින් හතලිස් දෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඡන්දය සලකුණු කිරීමට නියමිත සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලට මෙවැනි සහකාර තේරීම්භාර නිලධාරීන් අධීක්ෂණ කාර්යය සඳහා යොදවා තිබිණි.

79. නියමිත දින දෙක තුළ ඡන්ද ප්‍රකාශ කිරීමට නොහැකි වූ තැපැල් ඡන්දදායකයින්ගේ ඡන්ද පත්‍රිකා අඩංගු කවර, සම්බන්ධව විශේෂ වැඩපිළිවෙලක් මෙවර

ඡන්ද විමසීම්වලට අදාළව යොදන ලදී. පෙර පැවති ඡන්ද විමසීම්වල දී, මෙවැනි කවර, තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් විසින් ඡන්ද විමසීම් දිනට පසුව අප්‍රමාදව ආවරණ ලිපියක් ද සහිතව, රක්ෂණ තැපෑලෙන්, ඒවා නිකුත් කරන ලද දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත යැවීම සිදු කෙරුණි. මෙම පළාත් සභා ඡන්ද විමසීම් පැවති අවස්ථාවල දී එවැනි කවර පිළිබඳව ඊට වඩා වෙනස් පියවරක් ගන්නා ලදී. ඡන්ද විමසීම තරග කරනු ලබන දේශපාලන පක්ෂවල ලේකම්වරුන් හා ස්වාධීන කණ්ඩායම් නායකයින්ගේ එකඟත්වය මත මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගන්නා ලද එම තීරණ, තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙතද දන්වා ඇත. ඒ අනුව ගන්නා ලද පියවර පහත දක්වා ඇත.

(අ) සහතික කිරීමේ නිලධාරී කාර්යාලවල දී නියම කරනු ලැබූ දෙදින තුළ තැපැල් ඡන්දදායකයන් විසින් පාවිච්චි නොකිරීම නිසා ඉතිරි වූ තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු කවර, අප්‍රමාදව සහතික කිරීමේ නිලධාරී හෝ වෙනත් වගකිව යුතු නිලධාරියකු මගින් සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලයට භාරගෙන ලදුපතක් නිකුත් කිරීම.

(ආ) ඉන් අනතුරුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ ඉදිරි දිනයක දී දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයන් හි දී එම තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු කවර අයත් තැපැල් ඡන්දදායකයින්ට, සිය අනන්‍යතාව තහවුරු කොට ඡන්දය පාවිච්චි කිරීමේ වැඩපිළිවෙලක් යෙදීම.

මෙසේ පසු අවස්ථාවකදී තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන දිනවලට, තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයින්ට විවිධ සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලට යෑම වෙනුවට, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ගොස් අදාළ කටයුතු පිළිබඳව සොයා බැලීම පහසු විය. අවසන්වරට නියම කළ දිනවල දී ද ඡන්දය පාවිච්චි කිරීමට නොපැමිණි තැපැල් ඡන්දදායකයින්ගේ පැකැට්ටු, ඡන්ද විමසීම අවසන්වීමෙන් පසුව රක්ෂණ තැපෑලෙන් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යැවීමට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන්ට නියම කර තිබිණි.

ඡන්ද විමසීම් පිළිබඳ දැන්වීම

80. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින්, පිළිගන්නා ලද නාමයෝජනා පත්‍ර අනුව දිස්ත්‍රික්කය තුළ ඡන්ද විමසීම සඳහා තරගයක් ඇත්තේ නම් ඒ වෙනුවෙන් පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 22 වගන්තිය යටතේ වූ ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම, ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කටයුතු කළ යුතුය.

81. එම ඡන්ද විමසීම් පිළිබඳ දැන්වීමට ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන තොරතුරු ඇතුළත් විය යුතුය. තරග කරනු ලබන දේශපාලන පක්ෂවල නම් සිංහල අකාරාදී පිළිවෙළට ද, තරග කරනු ලබන ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව එකකට වැඩි වන්නේ නම්, ඒවා වෙනුවෙන් වූ හඳුනා ගැනීමේ අංක, එවැනි කණ්ඩායම්වලහා පක්ෂවල ලකුණු ද ඊට ඇතුළත් කළ යුතුය. දිස්ත්‍රික්කයක් වෙනුවෙන් ස්වාධීන කණ්ඩායම් එකකට වඩා තරග කරන්නේ නම්, ඒවා හැඳින්වීම සඳහා නාමයෝජනා පත්‍රභාර ගැනීමේ අවසාන දිනයේ දී හඳුනා ගැනීමේ අංක, තේරීම්භාර නිලධාරී විසින් ලබා දෙනු ඇත. නාමයෝජනා භාරගැනීමේ කටයුතුවලින් පසු පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් තරග කරනු ලබන සියලුම අපේක්ෂකයන්ගේ නම් හා ඔවුන් හඳුනාගැනීම සඳහා වෙන් කරන ලද අංක ද මෙම දැන්වීමට ඇතුළත් කරනු ලබන වැදගත් තොරතුරකි. පරිපාලන දිස්ත්‍රික්කය තුළ එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා පිහිටුවනු ලබන ඡන්ද පොළවල පිහිටීම සහ ඡන්ද දායිකාවන් සඳහා වෙන් කරන ලද ඡන්ද පොළවල් ඇතොත් ඒවා ද මෙම දැන්වීමට ඇතුළත් කළ යුතුය.

82. ඡන්ද විමසීම පිළිබඳ දැන්වීමට ඡන්ද විමසීමේ දිනය සහ ඡන්ද විමසීම පවත්වන්නා වූ කාලය පිළිබඳ විස්තර ද ඇතුළත් විය යුතුය. 2004 අංක 5 දරන සංශෝධන පනතින් සංශෝධිත පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 22 (1) (ඇ) ඡේදය යටතේ එම දිනය, ඡන්ද විමසීම් පිළිබඳ දැන්වීම පළ කරනු ලැබූ දිනයේ සිට සති 5 කට අඩු නොවූ හෝ සති 8 කට වැඩි නොවූ දිනයක් වූ සෙනසුරාදා දිනයක් විය යුතුය. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 31 වන වගන්තිය අනුව ඡන්ද විමසීමක් පෙරවරු 7.00 ට ආරම්භ කළ යුතු අතර, එදින පස්වරු 4.00 ට අවසන් කළ යුතුවේ. නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් තුනෙහි ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම් 2012.07.25 දින ද, මධ්‍යම, උතුරු හා වයඹ පළාත්වලට අදාළ ඡන්ද විමසීමේ දැන්වීම් 2013.08.06 වන දින ද, අතිවිශේෂ ගැසට් පත්‍රවල පළවිය. බස්නාහිර හා දකුණු පළාත් සභාවලට අදාළ ඡන්ද විමසීමේ දැන්වීම, 2014.02.10 වන දින හා ඌව පළාත් සභාවට අදාළ එම දැන්වීම 2014.08.13 දින ද රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

නිල ඡන්ද දැන්වීම්පත්

83. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 25 (2) වගන්තිය අනුව ඡන්ද විමසීමේ දී ඡන්දය පාවිච්චි

කිරීමට සුදුසුකම් ලබා ඇති ඡන්දහිමියන්ට, ඡන්ද විමසීම් දිනට දින 07 කට කලින් ලැබෙන සේ "නිල ඡන්ද දැන්වීම්පත්" තේරීම්භාර නිලධාරී විසින් තැපැල් මගින් යැවිය යුතුය. එම නිල ඡන්ද දැන්වීම් පතේ, ඡන්දහිමි නාමලේඛනයේ ඡන්දහිමියා ලියාපදිංචි වී ඇති විස්තර, ඡන්දදායකයා සඳහා වෙන් කරනු ලැබ ඇති ඡන්ද පොළ සහ ඡන්දය විමසීමේ දිනය හා වේලාව ද සඳහන් කළ යුතුය. මෙවැනි නිල ඡන්ද දැන්වීම්පතක් නොමැතිව වුව ද ඡන්දහිමි නාමලේඛනයේ තම නම ලියාපදිංචි ඡන්දදායකයකුට, ඡන්දය පාවිච්චි කිරීමට හැකියාව තිබේ. එහෙත් මෙවැන්නක් ඡන්දදායකයා වෙත තිබීම ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයට මෙන්ම ඡන්දදායකයාට ද පහසුවකි.

84. මෙම ඡන්ද විමසීම්වල දී පළාත්වල එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ ලියාපදිංචිව සිටි ඡන්දහිමියන් වෙනුවෙන් නිල ඡන්ද දැන්වීම්පත් මුද්‍රණය කොට තැපැල් මගින් නිකුත් කිරීමට කටයුතු කළ අතර, ඊට අදාළ සංඛ්‍යාත්මක තොරතුරු පහත දැක්වේ.

පළාත	පරිපාලන දිස්ත්‍රික්කය	නිකුත් කළ නිල ඡන්ද දැන්වීම්පත් සංඛ්‍යාව	ඡන්දහිමි නාමලේඛනය අනුව ගණන සංඛ්‍යාව	නිල ඡන්ද දැන්වීම්පත් සඳහා දරන ලද වියදම රු. ශත	නිල ඡන්ද දැන්වීම්පත් යැවීමට අදාළ වෙනත් වියදම් රු. ශත
නැගෙනහිර	මඩකලපුව	347099	159188	69419.80	7200.00
	අම්පාර	441287	197000	87257.40	8750.00
	ත්‍රිකුණාමලය	245363	131186	49072.60	-
උතුරු මැද	අනුරාධපුරය	606508	241798	121301.60	-
	පොළොන්නරුව	294365	114182	58873.00	-
සබරගමුව	රත්නපුරය	769813	301000	153962.80	26502.80
	කෑගල්ල	631981	228733	126396.20	20500.00
මධ්‍යම	මහනුවර	1015315	366375	225962.50	-
	මාතලේ	366549	144445	තොරතුරු ලැබී නැත	තොරතුරු ලැබී නැත
	නුවරඑළිය	507693	177155	113038.60*	-
උතුරු	යාපනය	4267813	164369	92840.00	-
	කිලිනොච්චිය	68600	27127		
	මන්නාරම	75737	25027	වාරතා කර නැත	වාරතා කර නැත
	වවුනියාව	94644	37500	23740.00	-
	මුලතිව්	53683	31461	වාරතා කර නැත	වාරතා කර නැත
වයඹ	කුරුණෑගල	1227810	476527	198350.00	116000.00
	පුත්තලම	526408	203717	105281.60	13250.00
බස්නාහිර	කොළඹ	1552734	502326	වාරතා කර නැත	වාරතා කර නැත
	ගම්පහ	1590076	558872	වාරතා කර නැත	වාරතා කර නැත
	කළුතර	881814	321837	වාරතා කර නැත	වාරතා කර නැත
දකුණු	ගාල්ල	809882	294912	වාරතා කර නැත	වාරතා කර නැත
	මාතර	608524	251000	වාරතා කර නැත	වාරතා කර නැත
	හම්බන්තොට	455398	178249	වාරතා කර නැත	වාරතා කර නැත
ඌව	බදුල්ල	609966	234630	වාරතා කර නැත	වාරතා කර නැත
	මොණරාගල	332768	134498	වාරතා කර නැත	වාරතා කර නැත
එකතුව		**18381830**	**5503114**	-	

*මුළු වියදම

නිල ඡන්ද දැන්වීම්පත් මුද්‍රණය කිරීම

85. 2008 වසරේ පළාත් සභා ඡන්ද විමසීමට ප්‍රථම පැවති ඡන්ද විමසීම්වල දී, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කරවා ගන්නා ලද නිල ඡන්ද පත්‍රිකාවල, ඡන්ද විමසීමේ නම, ඡන්දදායකයා වෙනුවෙන් වූ උපදෙස් ද, ඡන්දදායකයාගේ නම, මැතිවරණ කොට්ඨාසය, ඡන්ද ප්‍රදේශය, ඡන්ද කොට්ඨාසය සහ ඡන්දදායකයාගේ පිළිවෙල අංකය ආදී තොරතුරු ඇතුළත් කිරීමට ඉඩ තබා, අදාළ මාතෘකා පමණක් මුද්‍රණය කළ අතර, දැන්විය යුතු සියලු විස්තර මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නිල ඡන්ද දැන්වීම්පත්වල අතින් ලියා සම්පූර්ණ කොට, ඒ ඒ ගෘහය අනුව නිල ඡන්ද දැන්වීම්පත් එකට අමුණා තැපෑලෙන් යැවීම සඳහා තැපැල් කාර්යාලවලට භාරදීම සිදු කරන ලදී.

86. එහෙත් 2008 වර්ෂයේ පැවති පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ සිට, නිල ඡන්ද දැන්වීම්පත් සකස් කිරීමේ ක්‍රමය වෙනස් වී ඇත. දැනට දිවයිනේ සියලුම ඡන්දහිමි නාමලේඛන පරිගණකගත කර සකස් කරනු ලබන බැවින්, ඒ සඳහා භාවිතා කරන පරිගණක දත්ත පද්ධතිය මඟින් නිල ඡන්ද දැන්වීම්පතට ඇතුළත් විය යුතු ඡන්දදායකයන්ගේ ලියාපදිංචි විස්තර ලබාගෙන, ඡන්ද පොළ පිළිබඳ විස්තර ද අලුතින් ඇතුළත් කර, නිලඡන්ද දැන්වීම්පත් පොද්ගලික අංශයෙන් මුද්‍රණය කිරීමට හැකියාව ලැබී තිබේ. එබැවින්, පෙර මැතිවරණ අවස්ථාවල දී මෙන් නිල ඡන්ද දැන්වීම්පත්, ඡන්දදායකයා වෙත තැපැල් මගින් යැවීම සඳහා ඒවා නිලධාරීන් විසින්

ලියා සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවක් දැන් නොමැත. මේ නිසා ඇති වූ විශේෂ පහසුකම් කීපයක් පහත දක්වා ඇත.

I. නිල ඡන්ද දැන්වීම්පත්වල ඇතුළත් සියලු විස්තර, මුද්‍රිත අකුරින් පැහැදිලිව ඡන්දදායකයාට දැන්වීමට හැකි වීම.

II. පරිගණක දත්ත පද්ධතිය භාවිතා කරමින් අදාළ විස්තර, නිල ඡන්ද දැන්වීම්පත්වලට ඇතුළත් කරනු ලබන හෙයින් එම තොරතුරුවල නිවැරදිතාව ඉහළ මට්ටමක රඳවා ගැනීමට හැකිවීම.

III. නිල ඡන්ද දැන්වීම්පත්, නියමිත ඡන්දහිමියන් සංඛ්‍යාව අනුව මුද්‍රණය කරනු ලබන බැවින් හා ඒවා අතින් ලියා සකස් කිරීමක් සිදු නොකරන බැවින්, මුද්‍රිත නිල ඡන්ද දැන්වීම්පත් අපතේ යාමක් සිදු නොවීම.

IV. ඡන්දහිමියන් භාවිතා කරනු ලබන භාෂාව අනුව, සිංහල හෝ දෙමළ යන එක් භාෂාවකින් නිල ඡන්ද පත්‍රිකා පහසුවෙන් මුද්‍රණය කර සකසා ගත හැකි වීම. (මින් පෙර එසේ භාෂාව අනුව නිල ඡන්ද දැන්වීම්පත් ලිවීම සඳහා, එම භාෂාවලින් ලිවීමට හැකියාව ඇති නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට සිදු විය.)

87. නිල ඡන්ද දැන්වීම්පත, ඡන්ද පොළට රැගෙන යාමෙන් ඇතිවන පහසුව ගැන ද, ඡන්ද විමසීම් දින, ඡන්ද පොළට යන විට ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගන්නා අනන්‍යතා ලේඛනයක් රැගෙන යාම අවශ්‍ය බව ද එම දැන්වීම් පත මගින් ඡන්දදායකයින්ට වැඩිදුරටත් දන්වා තිබිණි.

88. ලියාපදිංචි ඡන්දහිමියකු සිය ඡන්ද පත්‍රිකාව ලබා ගැනීම සඳහා ඡන්ද පොළේ දී ජාතික හැඳුනුම්පත හෝ, වෙනත් ඒ සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් පිළිගනු ලබන අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාව නීතිගත වූයේ 2004 වර්ෂයේදීය. ඊට පෙර ඡන්දදායකයා ඡන්ද පොළට රැගෙන යනු ලබන නිල ඡන්ද දැන්වීම් පතේ විස්තර හා ඡන්දහිමියා තම අනන්‍යතාවට අදාළව ඡන්ද පොළේ දී ඡන්ද පොළ කාර්ය මණ්ඩලය වෙත ප්‍රකාශ කරනු ලබන තොරතුරු මත, කාර්ය මණ්ඩලය සෑහීමට පත්වේ නම් හා, ඡන්ද පොළ නියෝජිතයන්ගේ ද විරෝධතාවක් නොමැතිනම්, කිසිදු ලිඛිත ප්‍රකාශයක් සිදු නොකොට, ඡන්දය දීම සඳහා ඡන්දදායකයකුට අවකාශය ලබා ගත හැකි විය. එම අවධියේ දී මියගිය අයට හා විදේශගතව සිටින්නන්ට අදාළ නිල ඡන්ද දැන්වීම් පත්වලින් යම් අයුතු ප්‍රයෝජනයක් කිසිවෙකු විසින් ගනු ලැබීමට ඉඩ ඇතැයි ඇතැමුන් තුළ විශ්වාසයක් පැවතුන බව පෙනී ගිය බැවින්, එම ඉඩකඩ අහුරාලීමේ පියවරක් වශයෙන් පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

I. ඡන්ද විමසීමට ඉතා ආසන්න කාලයක් දක්වා, ඡන්දහිමි නාමලේඛනයේ නම් ලියාපදිංචිව ඇති පුද්ගලයන්ගෙන්, මියගොස් ඇති හා විදේශගත වී ඇති අයගේ නම්, ග්‍රාම නිලධාරීන් මාර්ගයෙන් ලබා ගැනීම.

II. ඡන්ද පොළේදී භාවිතා කිරීම සඳහා නිකුත් කරනු ලබන ඡන්දහිමි නාමලේඛනයේ පිටපත්වල, එවැනි නම් හඳුනාගැනීම සඳහා අදාළ නම්වලට ඉදිරියෙන් නිශ්චිත ලකුණක් යෙදීම.

III. ග්‍රාම නිලධාරීන් විසින් වාර්තා කර ඇති මියගිය හා විදේශ ගත වූ ඡන්දහිමියන් පිළිබඳ විස්තර, සෑම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකුටම ඒ ඒ ඡන්ද පොළට අදාළවන පරිදි ලිඛිතව දැනුම් දීම.

IV. අහම්බෙන් හෝ අදාළ වාර්තාවක අඩුපාඩුවක් හේතුවෙන්, මියගිය හෝ විදේශගත වූ බවට වාර්තා වූ අයෙකු ඡන්දය දීමට පැමිණ ඒ සඳහා අවස්ථාවක් ඉල්ලා සිටිය හොත්, එවැනි ඡන්දහිමියන්ගේ අනන්‍යතාව හා අනෙකුත් අදාළ කරුණුවල නිවැරදිතාව තහවුරු කරගෙන, ගත යුතු පියවර ගැන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම.

V. ග්‍රාම නිලධාරී වාර්තා අනුව මියගොස් ඇති බවට වාර්තා වූ ඡන්දහිමියන්ට අදාළව, "මිය ගිය අයකු බව වාර්තා වී ඇත" හා විදේශ ගතවී ඇති බවට වාර්තා වී ඇති පුද්ගලයින්ට අදාළව "විදේශගත වූවකු බව වාර්තා වී ඇත" යනුවෙන් ද අදාළ පරිදි නිල ඡන්ද දැන්වීම්පත්වල මුද්‍රාතබා සඳහන් කොට, ඒ ඒ නිවසට අදාළ ඉතිරි අනිකුත් නිල ඡන්ද දැන්වීම්පත් සමග ඒවා ද තැපැල් කිරීමට පියවර ගැනීම.

VI. තැපැල් ඡන්දදායකයින්ට අදාළ නිල ඡන්ද දැන්වීම්පත්වල "තැපැල් ඡන්දදායකයකු වශයෙන් පිළිගෙන ඇත. ඡන්ද පත්‍රිකාවක් නිකුත් කළ නොහැක"යනුවෙන් මුද්‍රාවක් තබා ඒවා ද නිවසට අදාළ අනෙකුත් නිල ඡන්ද දැන්වීම්පත් සමග තැපෑලෙන් යවන ලදී. තැපැල් ඡන්දදායකයින්ට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් මේ ආකාරයට යැවීමට විශේෂ හේතුවක් තිබේ. යම් ඡන්ද කොට්ඨාසයක එක සමාන නම් දෙකක් හෝ කීපයක් ඇති විට, ඉන් එක් පුද්ගලයකු තම නමට සමාන වූ වෙනත් අයකුගේ නමට අදාළව තැපැල් ඡන්ද පහසුකම් සඳහා අයදුම්පතක් ඉදිරිපත්කොට සහතික කිරීමේ නිලධාරියා මගින් ඡන්ද පත්‍රිකාව ලබාගෙන ඇත්නම්, එවැන්නක් සලකුණු කිරීමට ප්‍රථම ආපසු තේරීම්භාර නිලධාරී වෙත ලබාගෙන නියමිත ඡන්දදායකයාට ඡන්ද පොළට ගොස් ඡන්දය පාවිච්චි කිරීමට අවකාශ ලබා දීමට, බොහෝ විට ඉඩ ලබා ගැනීමට මෙම ක්‍රියා මාර්ගය නිසා හැකි වේ.

89. වර්තමානයේ ඡන්ද පොළේදී ඡන්දදායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත් අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වී ඇති බැවින්, ඉහත සඳහන් ආකාරයේ ඡන්ද පොළට සපයනු ලබන විස්තරවලින්, ඡන්ද පොළකට එතරම් ප්‍රයෝජනයක් නොමැති බව කෙනෙකුට පෙනී යා හැක. වාර්ෂික ඡන්දහිමි නාමලේඛනය පරීක්ෂා කිරීමේ දී තවමත් 20% කට ආසන්න ඡන්දහිමියන් සංඛ්‍යාවකගේ ජාතික හැඳුනුම්පත් අංක, ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් වී නොමැති බව පෙනී යන කරුණකි. මෙවැනි තැනැත්තන් මැතිවරණ කොමසාරිස් විසින් පිළිගන්නා ලද අනන්‍යතා ලේඛනයක් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඡන්ද විමසීම් අවස්ථාවක දී නිකුත් කරන තාවකාලික හැඳුනුම්පතක්, ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ. ජාතික හැඳුනුම්පත් හා මෙවැනි වෙනත් හැඳුනුම්පත් භාවිතා කරන්නන් ඉදිරිපත් කරන හැඳුනුම්පත්වල ඡායාරූප මගින් පුද්ගලයින් හඳුනාගැනීමට අපහසු අවස්ථා ඇති බව පෙනී යන හෙයින් හා මියගිය හා විදේශගත පුද්ගලයින් වෙනුවෙන් හොර ඡන්ද දැමීමේ ප්‍රයත්න තවමත් වාර්තා වන හෙයින්ද ඉහත සඳහන් ආකාරයේ විස්තර ඡන්ද පොළවල්වලට සැපයීම තවදුරටත් ක්‍රියාත්මක කළ යුතු බව නිරීක්ෂණය වේ.

පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 28 (1) වගන්තිය අනුව ඡන්ද පොළවල ප්‍රදර්ශනය කළ යුතු දැන්වීම්

90. මෙම වගන්තිය යටතේ අදාළ ඡන්ද විමසීම් පනතේ 3 වන උපලේඛනයේ දැක්වෙන, ඡන්දදායකයාට මග පෙන්වීම සඳහා දැන්වීමක්, ඡන්ද පොළේ පිටත සහ සෑම ආවෘත ස්ථානයකම ප්‍රදර්ශනය කළ යුතුය. ඊට අමතරව දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කරනු ලබන දේශපාලන පක්ෂවල නම් හා ස්වාධීන කණ්ඩායම් ද, ඒවායේ ලකුණු ද තරග කරනු ලබන සියලුම අපේක්ෂකයින්ගේ නම් හා ඔවුන්ට පවරා ඇති හඳුනාගැනීමේ අංක ද ඇතුළත් දැන්වීමක්, ඡන්ද පොළේ පිටත ප්‍රසිද්ධ කළ යුතුය. අපේක්ෂකයින්ට පවරා ඇති මෙවැනි අංක පිළිබඳව, තේරීම්භාර නිලධාරියා විසින් පළ කළ යුතු වෙනත් දැන්වීමක් මෙම ඡන්ද විමසීම් නීතියෙහි සඳහන් නොවූව ද, වත්මන් සමානුපාතික නියෝජන ක්‍රමය අනුව ඡන්ද විමසීම් ක්‍රියාත්මක වීම් ඇරඹීමත් සමග මෙවැනි විස්තර ඇතුළත් දැන්වීමක් ඡන්දදායකයා වෙත නිල ඡන්ද දැන්වීම්පත සමග යැවීමට සෑම ඡන්ද විමසීමක දීම කටයුතු කර ඇත.ඒ ආකාරයට මෙවර පැවති පළාත් සභා ඡන්ද විමසීම්වල දී ද ඡන්දදායකයින් දැනුවත් කිරීම් සඳහා සෑම ගෘහයකටම අදාළ නිල ඡන්ද දැන්වීම්පත් කට්ටලය සමග මෙම දැන්වීමේ පිටපතක් තැපෑලෙන් යැවීමට ක්‍රියා කරන ලදී.

91. ඡන්ද විමසීම් අවස්ථාවේ සෑම ඡන්දදායකයෙකු වෙතම නිල ඡන්ද දැන්වීම් පත් තැපෑලෙන් යවනු ලබන අවස්ථාවේ දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කරනු ලබන දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම්, අපේක්ෂකයින්ට වෙන් කර ඇති හඳුනාගැනීමේ අංක ආදී විස්තර ඇතුළත් ගෘහ දැන්වීමක් ගෘහයට අදාළ නිල ඡන්ද දැන්වීම් පත් ගොන්න සමග අමුණා තැපැල් මගින් භාරදීමට කටයුතු කරනු ලැබේ. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් අපේක්ෂකයින් 11269 ක් තරග කරන ලද අතර, වැඩිම සංඛ්‍යාව වූ 1247 ක් තරග කරන ලද්දේ කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙනි. එම අපේක්ෂකයින් දේශපාලන පක්ෂ 18 ක් හා ස්වාධීන කණ්ඩායම් 11 ක් නියෝජනය කරන ලද අය විය. වැඩිම ගෘහ දැන්වීම් සංඛ්‍යාව වූ 558872 ක් ගම්පහ දිස්ත්‍රික්කයට අදාළ විය. මෙම දැන්වීම් සිංහල, දෙමළ යන භාෂාවලින් එකම කඩදාසියක දෙපැත්තේ මුද්‍රණය කර තිබුණි. තරග කරනු ලැබූ පක්ෂ හා කණ්ඩායම් සංඛ්‍යාව ද අපේක්ෂකයින් සංඛ්‍යාව ද මත, මුද්‍රණය කරන ලද මෙම දැන්වීම්වල විශාලත්වය වෙනස් විය. මෙසේ මුද්‍රණය කොට බෙදා හරින ලද ගෘහ දැන්වීම් සංඛ්‍යාව අංක 9 සංඛ්‍යා සටහනෙහි සඳහන්ය.

නොමැකිය හැකි තීන්ත

92. පළාත් සභා ඡන්ද විමසීමේ පනතේ, 36 (1) වගන්තිය අනුව ඡන්දදායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට ප්‍රථම, උචිත ලකුණකින් එම අය (නොමැකිය හැකි තීන්තෙන්) සලකුණු කළ යුතුය. වෙනත් ඡන්ද විමසීම් අවස්ථාවල දී මෙන්ම, මෙවර ද මේ සඳහා, ඡන්දදායකයාට අපහසුතාවක් ඇති නොවන, සුදුසු නොමැකෙන තීන්ත නිකුත් කිරීමට කටයුතු කර ඇත. ඡන්දදායකයින් මෙසේ සලකුණු කිරීම අනිවාර්යයෙන් සිදු කළ යුතු කාර්යයක් බැවින්, සෑම ඡන්ද පොළකටම, ඒවා මුද්‍රා තැබූ කවරවල බහා ආරක්ෂිතව අවශ්‍ය ප්‍රමාණයෙන් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. කෙසේ වුවද මෙම නොමැකිය හැකි තීන්තවලින් සලකුණු කිරීම තවදුරටත් ක්‍රියාත්මක කළ යුතුද යන්න පිළිබඳව විවිධ අදහස් ඉදිරිපත් වී ඇති බව සටහන් කළ යුතුය.

නිල ලකුණේ මුද්‍රාව ඡන්ද පත්‍රිකාවේ තැබීම

93. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 35 වන වගන්තියේ, ඡන්ද පත්‍රිකා ඡන්දදායකයින් වෙත නිකුත් කළ යුතු ආකාරය දක්වා ඇත. එම වගන්තියේ (ඇ) ඡේදය අනුව, ඡන්දදායකයා වෙත ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර එය නිල ලකුණෙන් මුද්‍රා තැබිය යුතුය. එසේ නැතහොත් නිල ලකුණ එහි තෙරපීමට හෝ සිදුරු කිරීමට වුව ද නීතිය අනුව කළ හැකිවේ.

සාමාන්‍යයෙන් ඡන්ද විමසීමකදී භාවිතා කිරීමට එබඳු ලකුණු තේරීමේදී අවසානයට පැවති ඡන්ද විමසීමේ දී භාවිතා නොකරන ලද සලකුණක් සෑම ඡන්ද පොළක් වෙනුවෙන්ම තෝරා ගැනීම වෙනුවෙන් සැලකිලිමත් වේ.

94. ඡන්ද පත්‍රිකාවල මුද්‍රා තැබීම සඳහා භාවිතා කරනු ලබන මෙම සලකුණු, ඡන්ද විමසීම් දිනට ආසන්න දිනක දී ආරක්ෂා සහිතව මැතිවරණ කොමසාරිස්වරයා විසින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යැවෙනු ඇත. එසේ ඡන්ද පොළේ භාවිතා කිරීමට නියමිත මෙම නිල ලකුණු පිළිබඳ තොරතුරු, ඡන්ද පොළ කාර්ය මණ්ඩලවලට පවා ඡන්ද විමසීම් දින තෙක් දැකගත නොහැකි වන සේ ඒවායේ රහස්‍යභාවය ආරක්ෂාවන පරිදි නිකුත් කරනු ලබන අතර, මුද්‍රා තැබූ කවරයක බහා, ඒවා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට තේරීම්භාර නිලධාරීන් විසින් භාර දෙනු ලැබේ. මෙවැනි එකිනෙකට වෙනස් වූ මුද්‍රා නිශ්චිත සංඛ්‍යාවක් එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයාට භාර දෙනු ලබන අතර, එවැනි මුද්‍රාවලින් එකක් ඡන්ද විමසීම් දින එම කටයුතු ඇරඹීමට පෙරාතුව ඡන්ද පොළේ නියෝජිතයන්, නිරීක්ෂකයන් හා කාර්ය මණ්ඩලය ඉදිරියේ අහඹු ලෙස තෝරාගෙන භාවිතා කළ යුතු වේ. මෙය ඡන්ද පොළේ භාවිතා කරනු ලබන නිල ලකුණ තෝරා ගැනීමේ විනිවිදභාවය ඉහළ නැංවීම් වස් සිදු කරනු ලැබේ.

ශාරීරික දුබලතාවයෙන් පෙළෙන තැනැත්තන් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම්

95. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 84 (1) (අ) වගන්තියේ, ඡන්ද විමසීමේ දින ඡන්දහිමියන් ඡන්ද විමසන ස්ථානයට හෝ එම ස්ථානයේ සිට, ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ගෙවීම් නොකළ යුතු බවත්, එසේ ගෙවීම් සඳහා ගිවිසුම් ඇති නොකරගත යුතු බවත්, කියැවේ. එහෙත් මහජන ප්‍රවාහන සේවයක් සලසන, ගමනාගමන මණ්ඩලය හෝ දුම්රිය සේවය මගින්, ඡන්දදායකයා විසින් වියදම් දරා ඡන්ද පොළකට යාම හෝ ඊම නීති විරෝධී නොවන බව, එම පනතේ 84 (4) (ඇ) වගන්තියේ වැඩි දුරටත් දැක්වේ.

96. යම් ශාරීරික දුර්වලතාවක් නිසා ඡන්ද පොළකට පයින් ගමන් කිරීමට නොහැකි අයෙකුට, ඒ වෙනුවෙන් වාහනයක් පාවිච්චි කිරීමට ලිඛිත බලයක්, තේරීම්භාර නිලධාරීගෙන් ලබා ගැනීම සඳහා පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 84 (4) (ඈ) වගන්තිය අනුව හැකියාව තිබේ. මෙවැනි පහසුකමක් භාවිතා කිරීම සඳහා එවැනි තැනැත්තෙකුට හෝ එම අය වෙනුවෙන් ඡන්ද විමසීමේ අපේක්ෂකයකු නොවන වෙනත් අයෙකුට, ඡන්ද විමසීමේ දිනට දින 7කට පෙර තම දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියාගෙන් ඉල්ලීමක් කළ හැකිය. මැතිවරණ කොමසාරිස්වරයා විසින් මේ සම්බන්ධව ඡන්දහිමියන් දැනුවත් කිරීම සඳහා සෑම පළාත් සභා ඡන්ද විමසීමකටම අදාළව දැන්වීමක් පුවත්පත්වල පළ කරන ලදී. නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන ඡන්ද විමසිම් අවස්ථාවේ දී පුවත්පත්වල පළ කළ දැන්වීම අංක 21 පරිශිෂ්ඨයෙහි දැක්වේ. මෙම පහසුකම් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගෙන් ඉල්ලනු ලබන අයට, පොදු වාහනයකින් හෝ පාගමනින් ඡන්ද පොළට හා එහි සිට ආපසු ගමන් කිරීමට නොහැකි බව තහවුරු කෙරෙන, බටහිර හෝ දේශීය ලියාපදිංචි වෛද්‍යවරයකුගේ වෛද්‍ය වාර්තාවක් අදාළ අයදුම්පත සමග ඉදිරිපත් කිරීමට සිදුවේ.

අශක්නුතාවට පත් ඡන්දදායකයකුට ඡන්දය ප්‍රකාශ කිරීමේ දී සහාය වීමට යම් තැනැත්තකු කැටුව ඡන්ද පොළට යාමට ඉඩ ලබා දීම

97. 2011 අංක 28 දරන (විශේෂ විධි විධාන) පනතින්, යම් අශක්නුතාවකට පත් තැනැත්තකුට, තම ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා විසින් නියම කරන පරිදි ඡන්ද ස්ථානාධිපතිවරයා හා කාර්ය මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී ලකුණු කොට ඡන්ද පෙට්ටියට දැමීම සඳහා යම් තැනැත්තකු ඡන්ද පොළට කැටුව යාමට අවසර දී ඇත. එසේ කැටුව යන තැනැත්තා වයස අවුරුදු 18ට වැඩි, ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු හෝ ඡන්ද පොළ නියෝජිතයකු ලෙස ඉදිරිපත් නොවූ අයෙකු විය යුතු ය. තවද එම තැනැත්තා කිසිදු අශක්නුතාවට පත් නොවූ අයෙකු ද විය යුතු ය. මෙම හිමිකම ලබා ගැනීම සඳහා පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 4 වන උපලේඛනයේ දැක්වෙන ප්‍රකාශයක් හා ග්‍රාම නිලධාරීවරයාගේ ද රජයේ වෛද්‍ය නිලධාරියකුගේ ද සහතික අදාළ අය විසින් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් පැවති අවස්ථාවල මේ පිළිබඳව ඡන්දදායකයින් දැනුවත් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් පුවත්පත් දැන්වීම් පළ කරන ලදී. උඟව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව එසේ පළ කරන ලද දැන්වීම පරිශිෂ්ඨ 20 හි ඇතුළත් කර ඇත.

සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු දීම

98. මෙරට මැතිවරණ අවස්ථාවක දී තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් ලබා දී ඇත්තේ ආරක්ෂක අංශවලට, ඡන්ද විමසීම් රාජකාරීවල යෙදීමට නියමිත හෝ මැතිවරණ කටයුතු වෙනුවෙන් යම් යම් අත්‍යවශ්‍ය

සේවාවන් සපයනු ලබන රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයන් කිහිපයක සේවක මණ්ඩල වෙනුවෙන් පමණි. එහෙත් වෙනත් අත්‍යවශ්‍ය සේවාවන්හි යෙදෙන රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල ද, මෙම පහසුකම් අවශ්‍ය බවට දන්වමින්, මැතිවරණ පැවැත්වෙන අවස්ථාවල දී මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කෙරුණ ද මෙතෙක් එවැනි අංශ සම්බන්ධව තැපැල් ඡන්ද පහසුකම් ලබා දීමට නීති සම්පාදනය වී නැත. එබැවින්, ඡන්ද විමසීම් දිනයේ තම රාජකාරියේ නිරතවීමට සිදු වන යමෙකු වේ නම්, එබඳු අය ඡන්ද විමසීම් නීතිවල සඳහන් ආකාරයට සේවායෝජකයන්ගෙන් නිවාඩු ලබාගෙන ඡන්දය දීම සඳහා ඡන්ද පොළට යායුතු වේ.

99. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 123 වන වගන්තිය අනුව, යම් සේවා නියුක්තිකයකුට පෞද්ගලිකව ඡන්දය දීමට හැකිවනු පිණිස, ඒ තැනැත්තා ප්‍රමාණවත්යැයි සලකනු ලබන අඛණ්ඩ නිවාඩු කාලයක් වැටුප් අහිමි වීමක් නොමැතිව සේවායෝජකයා විසින් දෙනු ලැබිය යුතුය. මෙම කාලය අවම වශයෙන් පැය 4 ක්වත් විය යුතුවේ. මෙම විධිවිධාන කඩකරනු ලබන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින අයෙකුට නඩු පැවරීමකින් පසු වරදකරු වූ විට නීතිය අනුව දඬුවම් කළ හැකිවේ. මෙම කරුණු සම්බන්ධව අදාළ ඡන්දහිමියන් මෙන්ම, සේවායෝජකයින් ද දැනුවත් කිරීම සඳහා සෑම ඡන්ද විමසීමක දීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් වූ දැන්වීම් පුවත්පත් කීපයක පළ කරන ලදී. ඌව පළාත් සභාව වෙනුවෙන් සේවා යෝජකයින් දැනුවත් කිරීම සඳහා පළ කරන ලද දැන්වීම පරිශිෂ්ඨ 24 හි දක්වා ඇත.

100. සබරගමුව පළාතේ ඡන්ද විමසීමට අදාළව රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්කවල ද, මධ්‍යම හා ඌව පළාත් ඡන්ද විමසීම්වල දී එම පළාත්වල පිහිටි තේ හා රබර් වතුවල පදිංචි ඡන්දදායකයින්ට සිය පාලන අධිකාරියෙන්, ඡන්දය පාවිච්චි කිරීම සඳහා යාමට නිවාඩු ලබා ගැනීමේ දී පැන නැඟී ඇති අපහසුතා මැතිවරණ කොමසාරිස්වරයාට වාර්තාවීම නිසා, එම දිස්ත්‍රික්කවල පිහිටි වතු අයත් වූ වැවිලි සමාගම්වල සභාපතිවරුන්ට, සාමාන්‍යාධිකාරිවරුන්ට හා ප්‍රධාන විධායක නිලධාරීන්ට අදාළ පිරිස් වෙනුවෙන් පැය 4 ක් දක්වා ඡන්දය දීම සඳහා යාමට වැටුප් සහිත නිවාඩු දීම අනිවාර්යයෙන්ම කළ යුතු බව දන්වන ලදී. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීම සඳහා අදාළ වතු පරිපාලන කටයුතු අයත් වන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරු වෙතද පොල් සංවර්ධන මණ්ඩලයේ හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරුන් වෙත ද මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැනුම් දී ඇත.

ඡන්දදායකයාගේ අනන්‍යතාව නිශ්චය කර ගැනීම

101. 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත 2004.11.18 වන දින සහතික කරන ලද අතර, මෙමගින්, ශ්‍රී ලංකාවේ පැවැත්වෙන සෑම ඡන්ද විමසීමක දීම ඡන්ද පොළේහි ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා වෙත භාර දීමට පෙරාතුව, ඡන්දදායකයාගේ වලංගු අනන්‍යතා ලේඛනය පරීක්ෂාකර බලා, ඔහුගේ හෝ ඇයගේ නම සහ අනන්‍යතාවය නිශ්චය කර ගත යුතුය. ඡන්දදායකයාගේ වලංගු අනන්‍යතා ලේඛනය ඡන්ද පොළේ දී, බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීම සඳහා ඡන්දදායකයකු විසින් ඉඩ නොදෙන්නේ නම් හෝ, ඡන්දදායකයාගේ අනන්‍යතාවය පිළිබඳව සෑහීමට පත්වීමට නොහැකි බවට පරීක්ෂණයකින් අනාවරණය වුවහොත්, එවැනි ඡන්දදායකයකුට කිසිම ඡන්ද පත්‍රිකාවක් නිකුත් නො කළ යුතු බව, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 36 (1) වගන්තියේ දැක්වේ. එම හේතුව මත ඡන්ද පත්‍රිකා නිකුත් නොකරනු ලැබූ ඡන්දදායකයින්ගේ විස්තර, ඡන්ද විමසීම් පනතේ, පළමුවන උප ලේඛනයේ දැක්වෙන "ඈ" ආකෘතිය මගින් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කළ යුතුය.

102. ඡන්දදායකයා වෙත තිබිය යුතු අනන්‍යතා ලේඛනය, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරනු ලැබූ අනන්‍යතා ලේඛනයක් විය යුතු බව පනතේ 4.1 වගන්තියේ දැක්වේ. 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත, සහතික කරනු ලබන දින සිට එක් අවුරුද්දක කාලයක් අවසාන වූ විට ක්‍රියාත්මක විය යුතු බව, පනතේ 1 වන වගන්තියේ දැක්වේ. මෙම පනතේ විධිවිධාන අනුව, ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ඇති සියලු තැනැත්තන්, හැඳුනුම්පත් ලබාගෙන තිබීම හා මෙම නීතිමය ප්‍රතිපාදන හේතුවෙන් ඡන්දදායකයන්ගේ ඡන්දය පාවිච්චි කිරීම වැළැක්වීයාමක් නොවීම යන කරුණු සහතික වීම සඳහා, පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීමට පෙර, පහත සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ විය යුතුය.

(අ) 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධ සියලු පරිපාලන වැඩ සපුරා ඇති බවට මැතිවරණ කොමිෂන් සභාව/ මැතිවරණ කොමසාරිස්වරයා සෑහීමට පත්විය යුතුය. එම කරුණු සහතික කරමින් එම සහතිකය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(ආ) එම සහතිකය ප්‍රසිද්ධ කිරීමට පෙර, හැඳුනුම්පත් නිකුත් කිරීමට යොදා ඇති පරිපාලන වැඩපිළිවෙල සම්බන්ධව පාර්ලිමේන්තුව නියෝජනය

කරන දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගේ අදහස්වලට, මැතිවරණ කොමසාරිස්වරයා සැලකිල්ලක් දැක්විය යුතුය.

(ඇ) මැතිවරණ කොමසාරිස්වරයාගේ සහතිකය නිකුත් කිරීමට පෙර, ඔහු විසින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාගේ සහතිකය, සියලුම මැතිවරණ කොට්ඨාස සම්බන්ධයෙන් ලබා ගත යුතුය.

103. ඉහතින් දක්වන ලද අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාට,"මැන්ඩාමුස්" ආඥාවක් මගින් දැනුම් දෙන ලෙස, නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (පැෆරල්) නැමති සංවිධානයේ විධායක අධ්‍යක්ෂ විසින් 2008 වර්ෂයේ දී අභියාචනාධිකරණය වෙත සී.ඒ.(රිට්) අංක 356/2008 දරන අයදුම්පතින් ඉල්ලා සිටින ලදී. එමඟින්, ඉදිරියේ දී පැවැත්වීමට නියමිතව තිබූ නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීමට අදාළව, ඉහත සඳහන් කරන ලද නීතිමය විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට දැනුම්දීමට ද පෙත්සම්කරුවන් ඉල්ලා තිබුණි. මෙම පෙත්සම් විභාගයේ දී කරුණු දැක්වූ මැතිවරණ කොමසාරිස්වරයා, මෙයට පෙර මේ හා සමාන ඉල්ලීමක් පැෆරල් සංවිධානය විසින් ඉදිරිපත් කර තිබූ බවත් පෙත්සම විභාගයේ දී 2006 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ජාතික හැඳුනුම්පත නොමැතිවිට ඡන්දහිමියන්ගේ අනන්‍යතාව පරීක්ෂාව සඳහා විකල්ප අනන්‍යතා ලේඛන පිළිගැනීමට ගන්නා ලද තීරණය පරිදිව මේ අවස්ථාවේ දී ද කටයුතු කරන බව දැන්වූ බැවින්, 2008 පෙත්සම, පෙත්සම්කරුවන් විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී. ඒ අනුව පළාත් සභා ඡන්ද විමිසීම් වලටද අදාළ කරගනු ලැබූ එම ක්‍රියාමාර්ගය අනුගමනය කරමින් ඉන්පසු පැවති සෑම මැතිවරණයකදීම එවැනි අනන්‍යතා ලේඛන පිළිගෙන අදාළ කටයුතු කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව ක්‍රියාකර ඇත.

104. ඒ අනුව මෙම පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ දී ජාතික හැඳුනුම්පත වෙනුවට පහත දැක්වෙන අනන්‍යතා ලේඛනයක්, ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර ඡන්දදායකයන්ට අදාළව පරීක්ෂා කොට ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

1. වලංගු ගමන් බලපත්‍රය
2. වලංගු රියදුරු බලපත්‍රය
3. රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
4. වැඩිහිටි හැඳුනුම්පත
5. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන පූජ්‍ය/ පූජක හැඳුනුම්පත

105. ජාතික හැඳුනුම්පත හෝ ඉහත සඳහන් විකල්ප හැඳුනුම්පතක් හෝ ඉදිරිපත් කිරීමට නොහැකි ඡන්දහිමියන්ට, ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවල මැතිවරණ කාර්යාල මගින් තාවකාලික හැඳුනුම්පත් ලබාදීමට ක්‍රියා කරන ලදී.

මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීම

106. ජාතික හැඳුනුම්පත හෝ ඉහත දක්වා ඇති වලංගු හැඳුනුම්පතක් හෝ නොමැති ඡන්දහිමියන් වෙත, ග්‍රාම නිලධාරීන් ද තේ හා රබර් වතුවල සේවය කරන එම වතුවල පදිංචිකරුවන් වෙනුවෙන් වතු අධිකාරීන් ද මගින් තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය උපදෙස්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. තේ හා රබර් වැනි වගාවන් සහිත වතුවල පදිංචිව සිටීමින් සේවය කරනු ලබන වතු සේවකයින්ට හා ඔවුන්ගේ පවුල්වල අයට, මෙවැනි හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය විස්තර ඇතුළත් අයදුම්පත් සහතික කිරීම, ඔවුන් පදිංචිව සිටින වතුවල වතු අධිකාරීන් විසින් සිදු කිරීම අවශ්‍ය විය. මැතිවරණ දෙපාර්තමේන්තුව විසින්, මෙම තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමේ දී, විශේෂයෙන් මෙම ඡන්ද විමසීම්වලට භාවිතා කිරීමට නියමිත වූ ඡන්දහිමි නාමලේඛනවල ජාතික හැඳුනුම්පත් අංක සටහන් වී නොතිබූ ඡන්දහිමියන්ට, ප්‍රමුඛත්වයක් දෙන ලෙස ද අදාළ නිලධාරීන්ට දන්වන ලදී.

107. හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා අවශ්‍ය අයදුම්පත්, ග්‍රාම නිලධාරී කාර්යාලවල හා වතු අධිකාරී කාර්යාලවල තබන ලදී. ඒවා සම්පූර්ණ කොට, අඟල් 1 ¼ x 1 ප්‍රමාණයේ තමාගේ ඡායාරූප දෙකක් අදාළ ග්‍රාම නිලධාරීගේ හෝ වතු අධිකාරීගේ සහතිකය ද සමඟ, එම නිලධාරීන් මගින් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ඉදිරිපත් කළ යුතු විය. මෙසේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් වෙනුවෙන්, ඡායාරූප ද යොදා තාවකාලික හැඳුනුම්පත් සකස් කොට ඒවා ඡන්ද විමසීම් දිනට පෙර, අදාළ ඡන්දදායකයින් වෙත නිකුත් කිරීම සඳහා ග්‍රාම නිලධාරී කාර්යාලවලට හා වතු අධිකාරී කාර්යාලවලට භාර දීම, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ වගකීමක් විය. මෙම හැඳුනුම්පත් නිකුත් කිරීමේදී ඇතිවිය හැකි ප්‍රමාදය වැළැක්වීමට බොහෝවිට වෙනත් දිස්ත්‍රික්කවලින් සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරුන් ඡන්ද විමසීම් පැවති දිස්ත්‍රික්කවල මැතිවරණ කාර්යාලවලට අනුයුක්ත කරන ලදී. ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීම සඳහා ඡන්දදායකයා

විසින් ඡන්ද පොළේ දී ඉදිරිපත් කළ යුතු අනන්‍යතා ලේඛන සහ එවැන්නක් නොමැති අය තාවකාලික හැඳුනුම්පත් මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු ආකාරය පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරන ලදී. ඒ අන්දමට 2012.09.08 වන දින නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් දැන්වීමක් පළ කරන ලදී. එවැනිම දැන්වීමක් මධ්‍යම, උතුරු හා වයඹ පළාත් සභා වෙනුවෙන් 2013.08.08 ද, බස්නාහිර හා දකුණු පළාත් සභා වෙනුවෙන් 2014.02.28 ද, ඌව පළාත් සභාව වෙනුවෙන් 2014.08.18 දින ද පුවත්පත්වල පළ කරන ලදී. ඌව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව පළ කරන ලද එම දැන්වීම අංක 22 පරිශිෂ්ඨයේ දක්වා ඇත.

V වන කොටස

පිළිගත් දේශපාලන පක්ෂ නියෝජිතයින්, බලයලත් නියෝජිතයින් හා ස්වාධීන කණ්ඩායම් නායකයින් සමග සාකච්ඡා කිරීම

108. සමස්ත ඡන්ද විමසීම් ක්‍රියාදාමය සැලකිල්ලට ගැනීමේ දී ඡන්ද විමසීමකදී තරග කිරීම සඳහා ඉදිරිපත් වන පිළිගත් දේශපාලන පක්ෂ, ඡන්ද විමසීම් ක්‍රියාදාමයෙහි ඉතා වැදගත් පාර්ශ්වකරුවෙකු වේ. ඡන්ද විමසීම් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් පැවරෙන පාර්ශ්වයන් ද ඡන්ද විමසීම පරිපාලනය කිරීම සඳහා කටයුතු කරනු ලබන පාර්ශ්වයන් ද ගනු ලබන උත්සාහයන් සාර්ථක වීම සඳහා තම අපේක්ෂකයන් තරගයට ඉදිරිපත් කර ඇති දේශපාලන පක්ෂ විසින් ලබා දෙන සහයෝගය සමස්ත ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වන බව පිළිගත යුතුය. මෙම තත්ත්වය සැලකිල්ලට ගත්විට, ඡන්ද විමසීමක් සම්බන්ධ නාමයෝජනා භාර ගැනීමෙන් අනතුරුව තරග කරන දේශපාලන පක්ෂවල නායකයින් හා ලේකම්වරුන් සමග ප්‍රධාන වශයෙන් මැතිවරණ කොමසාරිස්වරයා සාකච්ඡා කිරීම ද, ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්ක නියෝජනය කරන දේශපාලන පක්ෂවල බලයලත් නියෝජිතයින් සහ ස්වාධීන කණ්ඩායම් නායකයින් සමග දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් පවත්වනු ලබන සාකච්ඡාද ඡන්ද විමසීමේ ඉතා වැදගත් පියවර හැටියට සැලකිය හැකිය. 2012 වර්ෂයේ පවත්වන ලද නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව යන පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ සිට 2014 වර්ෂයේ අවසන් වරට පැවති ඌව පළාත් සභා ඡන්ද විමසීම දක්වා පැවති සියලුම පළාත් සභා ඡන්ද විමසීම්වල ද එක් එක් ඡන්ද විමසීමට අදාළව මෙවැනි රැස්වීම් අඩුම තරමින් 4 ක් හෝ 5 ක් බැගින් පවත්වා ඇත. නාමයෝජනා භාර ගැනීමේ කාලය ඇරඹීමට පෙර සියලුම පිළිගත් දේශපාලන පක්ෂවල නියෝජිතයින් සමග පැවැත්වෙන මෙවැනි සාකච්ඡා නාමයෝජනා භාර ගැනීමෙන් අනතුරුව ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට සීමා වේ. මෙම රැස්වීම්වල දී තරග කරන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් මැතිවරණ නීතිය අනුව දැනුවත් කිරීම ද අදාළ පක්ෂවලින් හා ස්වාධීන කණ්ඩායම්වලින් ඡන්ද විමසීම් ක්‍රියාදාමය සාර්ථක කර ගැනීම සඳහා අපේක්ෂා කරනු ලබන සහාය පිළිබඳව ද නියෝජිතයින් දැනුවත් කිරීම සිදු විය.

109. නාමයෝජනා භාර දීමෙන් පසු ඡන්ද විමසීම් කටයුතුවලට හා ඡන්ද ගණන් කිරීමට අදාළව පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයින් සහභාගී කරවීමේ වැදගත්කම සම්බන්ධව අදාළ පාර්ශ්ව දැනුවත් කළ අතර, ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම හා මැතිවරණ ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව ගනු ලබන පියවර,මෙම රැස්වීම්වල දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් පැහැදිලි කර දී ඇත.

110. මෙම රැස්වීම්වලට සහභාගී වූ පොලිස්පතිවරයාගෙන් හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන්, පක්ෂ නියෝජිතයින්ට, ඡන්ද විමසීමට අදාළව පොලිසියෙන් ලබාගත යුතු උපදෙස් දැනගැනීමට ඉඩ ලැබුණු අතර, ඔවුන්ට පොලිසිය වෙත දැන්වීමට ඇති කරුණු ද ඉදිරිපත් කිරීමට හැකි විය. ප්‍රාදේශීය මට්ටමේ පොලිස් නිලධාරීන්ගේ සේවාවන් අපේක්ෂිත මට්ටමින් සිදු නොවන විට, ඒ පිළිබඳව ඉහළ මට්ටමේ පොලිස් නිලධාරීන්ට දන්වා අවශ්‍ය සහන ලබා ගැනීමට මෙම රැස්වීම් මගින් පක්ෂ නියෝජිතයන්ට ඉඩ ලැබිණි.

111. මේ ආකාරයට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික්කවල පැවති දේශපාලන පක්ෂ නියෝජිතයින්ගේ රැස්වීම්වල දී ඉදිරිපත් වූ සමහර කරුණු දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගේ අවධානයට යොමු කිරීම සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ අවස්ථා ද විය. එසේම මැතිවරණ කොමසාරිස්වරයා විසින් දේශපාලන පක්ෂවල නියෝජිතයින් සමග පවත්වන ලද සාකච්ඡාවල දී ගන්නා ලද සමහර තීරණ අවශ්‍යතාවයන් අනුව තේරීම්භාර නිලධාරී මගින් දිස්ත්‍රික් නියෝජිතයින්ට ද දන්වන ලදී. මෙම සාකච්ඡාවල දී ඉදිරිපත් වූ කරුණු හා ගනු ලබන තීරණ පිළිබඳව වාර්තා ලිඛිතව තබා ගන්නා හෙයින් එම වාර්තා ඉදිරි කාලයේ පූර්ව මැතිවරණ ක්‍රියාදාමයන් පිළිබඳව තොරතුරු දැනගැනීමට ඉතා ප්‍රයෝජනවත් වේ. මෙම රැස්වීම්වල දී මැතිවරණ කොමසාරිස්වරයා අදාළ ප්‍රශ්න පිළිබඳව දක්වා ඇති ප්‍රතිචාරයන් ද, මැතිවරණ දෙපාර්තමේන්තුව මෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා දරන ලද උත්සාහය ගැන ද අවබෝධයක් ලබා ගැනීමට මෙන්ම, අදාළ පක්ෂ මුහුණ දුන් ගැටලු ද දැනගැනීමට මෙම වාර්තා මගින් හැකි වනු ඇත. මෙම සාකච්ඡා සඳහා පොලිස්පතිවරයා හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු පොලිසිය නියෝජනය කරමින් පැමිණි අතර, දිස්ත්‍රික් මට්ටමේ රැස්වීම් සඳහා ද ප්‍රාදේශීය මට්ටමේ ප්‍රධාන පොලිස් නිලධාරීන් සහභාගී වී ඇත.

112. මෙම රැස්වීම් සඳහා පක්ෂ ලේකම්වරුන්ට සහභාගී වීමට නොහැකි වූ අවස්ථාවල දී ඔවුන් වෙනුවෙන් පක්ෂයේ වගකිව යුතු නියෝජිතයින් සහභාගී කරවීමට

ඔවුන් කටයුතු කර ඇත. මෙබඳු රැස්වීම් සඳහා පක්ෂයක එකම නියෝජිතයෙකුට නොකඩවා සහභාගීවීමේ අසීරුතා ඇති නිසා, සෑම රැස්වීමක දී ම ගනු ලබන තීරණ සහ සාකච්ඡා කළ කරුණු පක්ෂ විසින් දැනගැනීම සඳහා, රැස්වීම් සඳහා පක්ෂයක් නියෝජනය කරමින් එක් නියෝජිතයෙකුට වඩා සහභාගී වන අවස්ථා ද දැකිය හැකි විය.

113. නාමයෝජනා පත්‍ර භාර දීමේ ක්‍රමය සහ ඒවා භාර ගනු ලබන ආකාරයත්, ඒ සඳහා යොදා ඇති වැඩපිළිවෙළත්, ඡන්දපොළ නියෝජිතයින්, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම හා සලකුණු කිරීමේ අවස්ථාවලට පත්කරනු ලබන නියෝජිතයින්, ඡන්දපොළ කටයුතු හා ඡන්ද විමසීම් ක්‍රියාවලිය මෙන්ම ඡන්ද ගණන් කිරීමේ වැඩපිළිවෙළ ද, එවැනි අවස්ථා සඳහා නියෝජිතයින් පත් කිරීම ද ආදී කටයුතු සිදු විය යුතු ආකාරය පිළිබඳවත් මෙම රැස්වීම්වල දී විශේෂයෙන් දේශපාලන පක්ෂ නියෝජිතයින් හා ස්වාධීන කණ්ඩායම් නායකයින් දැනුවත් කිරීමට ක්‍රියා කර ඇත.

114. මැතිවරණ කොමසාරිස්වරයාගේ මූලිකත්වයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැවති මෙම රැස්වීම්වලට සෑම විටම මැතිවරණ කටයුතු හා සම්බන්ධ නියෝජ්‍ය පොලිස්පතිවරයා සහභාගී වූ අතර, සමහර අවස්ථාවල දී පොලිස්පතිවරයා ද සහභාගී වී ඇත. ඊට අමතරව සියලුම රැස්වීම්වලට විවිධ විෂය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන් වැනි නිලධාරීන් ද සහභාගි වී ඇති අතර, මෙම නිලධාරීන්ගේ සහභාගීත්වය දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජිතයින්ට සිය ඡන්ද ව්‍යාපාරය වෙනුවෙන් ප්‍රයෝජනවත් විය. මැතිවරණ ප්‍රචාරණ රැස්වීම් සඳහා අවසර ලබා ගැනීම, රැස්වීම්වල දී ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සඳහා අවසර ලබා ගැනීම, මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් පිහිටුවනු ලබන ඡන්ද කාර්යාල පිළිබඳ නිවේදනය කිරීම සහ වෙනත් මැතිවරණ ප්‍රචාරණයට අදාළ ක්‍රියාමාර්ග යන් පිළිබඳව දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයින් ඡන්ද විමසීම් නීතිය යටතේ ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධයෙන් මෙම රැස්වීම්වල දී දැනුවත් කිරීමට පොලීසිය විසින් ද පියවර ගන්නා ලදී.

115. ප්‍රාදේශීය මට්ටමින් සිය ඡන්ද ප්‍රචාරණ ව්‍යාපාරය වෙනුවෙන් තම ප්‍රදේශයේ පිහිටි පොලිස් ස්ථානවලින් යම් බාධාවක් ඇති වුනි නම් හෝ අසාධාරණ අන්දමින් පොලිස් රාජකාරියක් සිදුවී නම්, එවැනි අවස්ථා පිළිබඳව ඍජුවම පොලිස්පතිවරයාට කරුණු ඉදිරිපත් කොට යම් සහනයක් ලබා ගැනීමටත් පක්ෂ නියෝජිතයින්ට මෙම රැස්වීම්වල දී අවකාශ සැලසිනි.

116. ඡන්ද විමසීම් ක්‍රියාදාමයේ දී තරග කරන දේශපාලන පක්ෂවල යම් එකඟතාවයන් මත සමහර ඡන්ද විමසීම් සංවිධාන කටයුතු ඉටු කිරීම සඳහා පියවර ගැනීමට මැතිවරණ කොමසාරිස්වරයාට හැකි විය.පළාත් සභා වෙනුවෙන් තරග කරනු ලබන අපේක්ෂකයින් පළාත් පාලන ආයතනවල සභික ධුර දරමින් සිය ඡන්ද විමසීම් ව්‍යාපාරවල කටයුතු කිරීම ගැටලු සහගත කරුණක් විය. පළාත් සභා ඡන්ද විමසීම් නීතිය අනුව, එවැනි අය සිය පළාත් පාලන ආයතනයේ දරන ධුරයෙන් ඉල්ලා අස්වීමේ අවශ්‍යතාවක් හෝ ඔවුන් දරන එම කටයුතුවලින් නිවාඩු ලබාගෙන සිටීම හෝ අවශ්‍ය නොවේ. එහෙත් විශේෂයෙන් රාජ්‍ය දේපළ භාවිතා කරමින් ඔවුන් සිය ඡන්ද ව්‍යාපාරයේ යෙදීම ගැටලු සහගත වූ බැවින්, පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් තරග කළ පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ට එම පළාත් පාලන ආයතන මාර්ගයෙන් නිවාඩු ලබාගෙන පළාත් සභා වෙනුවෙන් තරග කිරීමට උපදෙස් දෙන ලෙස අදාළ දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටින ලදී. තවද විදේශීය නිරීක්ෂකයින් ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතු සඳහා යෙදවීම සම්බන්ධව දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කළ කරුණු සලකා බලා, උතුරු පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ ඒ වෙනුවෙන් විදේශීය නිරීක්ෂකයින් මෙරටට ගෙන්වීමට මැතිවරණ කොමසාරිස්වරයා එකඟත්වය පළ කරන ලද්දේ, මෙවැනි පක්ෂ නියෝජිතයින් සමග පවත්වන ලද සාකච්ඡාවක දී ගන්නා ලද එකඟතාවක් මතයි. මේ අනුව මෙම පක්ෂ නියෝජිතයින්ගේ රැස්වීම් ඡන්ද විමසීම් අවස්ථාවක දී යම් එකඟතාවයන් ඇතිකර ගැනීමට ද ඉවහල් වන බව පෙන්වා දිය හැකිය.

117. පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් දිස්ත්‍රික්ක මට්ටමින් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් තරග කරනු ලබන සමහර අපේක්ෂකයින්ගේ ක්‍රියාකාරකම් නිසා ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමේ දී ගැටලු සහගත තත්ත්වයන් ඇති වේ. සමහර අපේක්ෂකයින් මැතිවරණ නීති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන පොලිස් නිලධාරීන් සමග ගැටුම් පවා ඇති කර ගන්නා අවස්ථා ද ඇත. ඡන්ද විමසීම් කාලයක දී මෙසේ ඇතිවන ගැටුම් මුලු ඡන්ද විමසීම් කාලය තුළම පැවතුනහොත්, එය ඡන්ද විමසීම් නීති අඩාල වී යාමටත්, ප්‍රාදේශීය මට්ටමින් නීතිය හා සාමය බිඳ වැටීමටත් හේතු වේ. මේ නිසා මෙම රැස්වීම්වලට සහභාගී වූ නියෝජ්‍ය පොලිස්පතිවරයා සහ අනෙකුත් පොලිස් නිලධාරීන් විසින් ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයින් පොලිස් නිලධාරීන් සමඟ ඇති කරගන්නා මෙවැනි ගැටළු සම්බන්ධයෙන් මෙම රැස්වීම්වල දී මැතිවරණ කොමසාරිස්වරයාගේ සහ දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගේ හා නියෝජිතයින්ගේ අවධානයට යොමු කිරීමට කටයුතු කර ඇත. මැතිවරණ

දෙපාර්තමේන්තුවට සහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට මැතිවරණ නීති කඩ කිරීම ගැන දිස්ත්‍රික්කවලින් ලැබෙන පැමිණිලි හා වාර්තා අනුව, ඒ ඒ පක්ෂයේ අපේක්ෂකයින් ඒවාට සම්බන්ධවී ඇති ආකාරය ද සැලකිල්ලට ගෙන, පක්ෂ ලේකම්වරුන්ට එම තත්ත්වයන් දැනුම් දීමට මැතිවරණ කොමසාරිස්වරයාට ද මෙම රැස්වීම්වල දී ඉඩ ලැබුණි. මේ නිසා පොලිසියට සහ මැතිවරණ කොමසාරිස්වරයාට යම් යම් අපේක්ෂකයින්ගේ ගැටලු සහගත කටයුතු සම්බන්ධව සෘජුවම පක්ෂ ලේකම්වරුන්ට දැනුම් දී මැතිවරණ ක්‍රියාදාමයට ඇතිවන බාධාවන් ඉවත් කර ගැනීමට බොහෝ විට ඉඩ ලැබුණු බව ප්‍රකාශ කළ හැකිය.

118. ඇතැම් දේශපාලන පක්ෂවලට මැතිවරණ ප්‍රචාරණ රැස්වීම් පැවැත්වීම සඳහා භූමිභාග වෙන් කර ගැනීමට ඉල්ලීම් කළ අවස්ථාවල දී, සමහර පළාත් පාලන ආයතනවලින් අසාධාරණ තීරණ ලබා දී ඇති බවට කරුණු ද මෙම රැස්වීමේ දී ඉදිරිපත් විය. සමහර අවස්ථාවල දී රැස්වීම් පැවැත්වීම සඳහා භූමිභාග වෙන්කර ගැනීමට කල් ඇතිව කරන ලද ඉල්ලීම් පවා, කිසිදු සාධාරණ හේතු නොමැතිව පිළිනොගත් පළාත් පාලන ආයතන සම්බන්ධව, සොයා බලා අසාධාරණයට ලක් වූ පක්ෂවලට සහනයක් ලබා දීමට කටයුතු කරන ලදී.

119. රජයේ දේපළ අනිසි ලෙස ඡන්ද ව්‍යාපාරය වෙනුවෙන් භාවිතා කිරීම සම්බන්ධව සමහර දේශපාලන පක්ෂවලට සහ අපේක්ෂකයින්ට විරුද්ධව මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි ලැබුණි. එවැනි පැමිණිලිවල සත්‍යතාවයක් ඇති බවට කරුණු හෙළි වූ අවස්ථාවවලදී පවා, විශේෂයෙන් රජයේ වාහන ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම් වැනි අවස්ථාවල දී සත්‍ය තොරතුරු ලබා දීමට හෝ පැමිණිලිවල සත්‍යතාව පිළිගැනීමට හෝ දේශපාලන පක්ෂ කැමැත්තක් නොදැක් වූ බව පෙනී ගිය කරුණකි. මෙවැනි අවස්ථාවල දී දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ හෝ පොලීසියේ ද සහාය ඇතිව සොයා ගන්නා ලද බරපතල සිද්ධීන්ට අදාළ පැමිණිලි සම්බන්ධව නිවැරදි තොරතුරු, දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට දැනුම් දීමට මෙබඳු රැස්වීම් අවස්ථාවල දී මැතිවරණ කොමසාරිස්වරයාට අවකාශය ලැබී ඇත.

120. දේශපාලන පක්ෂ සමග සිදුකොට ඇති මෙවැනි සාකච්ඡා, ශ්‍රී ලංකා පොලීසියට මෙන්ම මැතිවරණ කොමසාරිස්වරයා ඇතුළු මැතිවරණ පරිපාලන පාර්ශ්වයන්ට ද මැතිවරණ සංවිධානයට අදාළ කටයුතු සාර්ථක කර ගැනීමට පිටිවහලක් වී ඇති බව කිව හැකිය.

දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ ඒවායේ අපේක්ෂකයින් වෙනුවෙන් ආචාර ධර්ම පද්ධතියක් නිකුත් කිරීම

121. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ඇතුළත් දේශපාලන පක්ෂ පිළිගැනීම හා පිළිගත් දේශපාලන පක්ෂ සම්බන්ධව විධිවිධාන රාශියක් 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින් සංශෝධනය විය. ඒ සංශෝධනයන්ට අනුව, පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8 වන වගන්තිය යටතේ, ඡන්ද විමසීම් අවස්ථාවක දී ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වන දේශපාලන පක්ෂවලට හා අපේක්ෂකයන්ට අදාළව ආචාර ධර්ම පද්ධතියක් නිකුත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට බලය ඇත. මෙම බලතල අනුව ඡන්ද විමසීමක දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළමුවරට මෙවැනි ආචාර ධර්ම පද්ධතියක් නිකුත් කරන ලද්දේ 2012 වර්ෂයේ පැවති නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව පළාත් වෙනුවෙන් ඡන්ද විමසීම් පැවති අවස්ථාවේ දීය. ඉන්පසු පැවති සෑම පළාත් සභා ඡන්ද විමසීමක දීම එවැනි ආචාරධර්ම පද්ධති නිකුත් කරන ලදී.

122. මෙවැනි ආචාර ධර්ම පද්ධතියක් මගින් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයින් විසින් මැතිවරණ ව්‍යාපාරයේ දී සිදු කරනු ලබන මැතිවරණ නීති කඩ කිරීම් සම්පූර්ණ වශයෙන් නතර කිරීමේ හැකියාවක් නොතිබුණ ද, අදාළ මැතිවරණ නීති ආරක්ෂා කිරීමට එම අයට ඇති වගකීම පිළිබඳව ඔවුන්ට හා ඡන්දදායකයින් ඇතුළු සෙසු පාර්ශ්වයන්ට ද ඉන් අවබෝධයක් ඇතිවේ.

123. එම ආචාර ධර්ම පද්ධතියට, මෙරට පවත්නා මැතිවරණ නීති ඇතුළු සියලුම නීති රැකෙන අන්දමට හා මැතිවරණ කාලය තුළ නීතිය හා සාමය ආරක්ෂා වන අන්දමින් කටයුතු කිරීම, විනයානුකූලව මැතිවරණ ව්‍යාපාරයේ යෙදීම, අනෙකුත් විරුද්ධ පාක්ෂිකයන්ගේ අයිතිවාසිකම් රැකෙන පරිදි කටයුතු කිරීම, නීත්‍යානුකූලව මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල යෙදීම, ඡන්ද විමසීම් දින හා ඡන්ද ගණන් කිරීමේ කටයුතුවල දී නීත්‍යානුකූලව එම කටයුතුවලට සහාය වීම වැනි විෂයයන්ට අදාළ කරුණු රාශියක් ඇතුළත් විය. මෙවැනි ආචාර ධර්ම පද්ධති 2013 සහ 2014 වසරවල පැවති පළාත් සභා ඡන්ද විමසීම්වල දීද මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇත. අවසන්වරට පැවති උඟව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව එසේ නිකුත් කරන ලද ආචාර ධර්ම පද්ධතිය පරිශිෂ්ඨ 26 වශයෙන් දක්වා ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති මැතිවරණ මාර්ගෝපදේශ

124. බස්නාහිර හා දකුණු පළාත් සභා ඡන්ද විමසීම් පැවති අවස්ථාවේ දී, පිළිගත් දේශපාලන පක්ෂ නියෝජිතයින් සමග මැතිවරණ කොමසාරිස්වරයා 2014.03.04 වන දින පවත්වන ලද සාකච්ඡාවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂමේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් කිහිපදෙනෙක් ද, එම කොමිෂමේ නිලධාරීන් කිහිපදෙනෙක් ද සහභාගී වී දේශපාලන පක්ෂ වෙනුවෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති ආචාර ධර්ම පද්ධතිය ද, ඊට අමතරව මැතිවරණ රාජකාරී හා සම්බන්ධවන නිලධාරීන් වෙනුවෙන් එම කොමිෂම විසින් සකස් කරන ලද මාර්ගෝපදේශයක් ද ඇතුළත් ග්‍රන්ථයක් රැස්වීම සඳහා සහභාගී වූ නියෝජිතයින්ට බෙදා දෙන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මැතිවරණ රාජකාරියේ යෙදෙන රජයේ නිලධාරීන්ට අදාළව නිකුත් කර තිබූ මාර්ගෝපදේශය අංක 28 දරන පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

125. මැතිවරණ මාර්ගෝපදේශ වශයෙන් ඉහත සඳහන් ලේඛනයට ඇතුළත් වූ කරුණු සැකෙවින් පහතින් දක්වා ඇත.

I. මැතිවරණ පිළිබඳ පැමිණිලි භාර ගැනීම හා විමර්ෂණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සිදු කළ යුතු බව හා සැමට නීතියේ සම රැකවරණය ලැබීමට අයිතියක් ඇති බවත් පිළිගත යුතුය.
II. පැමිණිලි සම්බන්ධ විමර්ශන පක්ෂග්‍රාහී නොවන අයුරින් පැවැත්විය යුතුය.
III. මැතිවරණ ප්‍රචාරණය සම්බන්ධ නීති සර්ව සාධාරණව ක්‍රියාත්මක කළ යුතු අතර, කිසිවෙකුට දේශපාලන මතය හේතුවෙන් අසමානව සැලකීම හෝ වෙනස් කොට සැලකීම නොකළ යුතුය.
IV. මැතිවරණ රැස්වීම් සඳහා අවසර දීම නීතියට අනුව සිදු කළ යුතු අතර, පෙරහැර සඳහා නීතියට අනුව කටයුතු කළ යුතුය.
V. මැතිවරණ ප්‍රචාරණ කටයුතු නීතිය උල්ලංඝනය වන අයුරින් සිදු කිරීම වැලැක්විය යුතුය.
VI. ඡන්දය භාවිතා කිරීමේ අයිතිය උල්ලංඝනය කරන පුද්ගලයන් සම්බන්ධයෙන් දැඩිව ක්‍රියා කළ යුතුය.
VII. ඡන්ද පොළවල් සඳහා ප්‍රමාණවත් ආරක්ෂාව සලසා නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට සියලු උත්සාහයන් දැරිය යුතුය.
VIII. මැතිවරණ නීති උල්ලංඝනය කරමින් රජයේ දේපළ අයුතු ලෙස පරිහරණය කරන අයට එරෙහිව දැඩිව නීතිය ක්‍රියාත්මක කළ යුතුය.
IX. පශ්චාත් මැතිවරණ හිංසනයන් වැළැක්වීමට සියලු පියවර ගත යුතුය.
X. කිසිදු නිලධාරියෙකු වෙනත් පාර්ශ්වයන් වධහිංසාවලට හෝ දඩුවමකට යටත් කිරීමට සහභාගී නොවිය යුතුය.

VI වන කොටස

කාර්ය මණ්ඩලය හා ප්‍රවාහන කටයුතු

කාර්ය මණ්ඩල යෙදවීම

126. මෙම පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් අවශ්‍ය වන කාර්ය මණ්ඩල තෝරා ගැනීම සඳහා, රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරී මහත්ම මහත්මීන්ගේ සහ ගුරුසේවයේ ගුරුභවතුන්ගේ ද, අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ද විස්තර අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත අප්‍රමාදව යැවීමට කටයුතු කරන ලෙස අදාළ පළාත් සභා විසුරුවාලීමත් සමගම මැතිවරණ කොමසාරිස්වරයා විසින්, එම පළාත්වල ප්‍රධාන ලේකම්වරුන්ට, පළාත් සභා අමාත්‍ය ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට දන්වන ලදී.

127. මැතිවරණයක් පැවැත්වෙන දින හා එදිනට පූර්ව දිනයේ, සාමාන්‍ය මහජනතාව එම මැතිවරණ කටයුතු වෙනුවෙන් උනන්දු වේ. එබැවින් රජයේ කාර්යාලවලින් එම දින දෙකේහි දී සේවාවන් ඉටුකර ගැනීම සඳහා එම කාර්යාල කරා මහජනතාවගේ පැමිණීම අඩුවනු ඇත. එවැනි සුළු පිරිසක් සඳහා අත්‍යවශ්‍යම සේවාවන් ඉටු කිරීමට පමණක් ප්‍රමාණවත් අවම කාර්ය මණ්ඩලයක් පමණක් එම දින දෙකේහි දී අදාළ ආයතනවල රාජකාරී සඳහා යෙදවීම ප්‍රමාණවත්ය. මෙම කරුණ සැලකිල්ලට ගෙන සිය රාජකාරී කටයුතු සඳහා අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩල පමණක් තම කාර්යාලවල රඳවා ගැනීමටත්, ඉතිරි සියලු දෙනාගේ විස්තර, දත්ත පත්‍ර මාර්ගයෙන් තේරීම්භාර නිලධාරීන් වෙත දැන්වීමටත් අවශ්‍ය වන බව මැතිවරණ කොමසාරිවරයා විසින් රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට දන්වන ලදී.

128. රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් නිලධාරීන්ගේ අදාළ තොරතුරු මැතිවරණ දෙපාර්තමේන්තුවට හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට ඉදිරිපත් කිරීමෙන් පසුව, විවිධ හේතුමත මැතිවරණ රාජකාරිවලින් නිදහස් කිරීම සඳහා සමහර නිලධාරීහු මැතිවරණ කොමසාරිස්වරයා වෙත, ඉල්ලීම් ඉදිරිපත් කරති. එබැවින්, නිලධාරීන්ගේ විස්තර ඇතුළත් කළ යුතු දත්ත පත්‍රිකාවල, සියලු නිලධාරීන්ගේ විස්තර ඇතුළත් කිරීමෙන් අනතුරුව, අත්‍යවශ්‍ය රාජකාරියක යෙදවීමට සිදුවන නිසා හෝ, නිලධාරීන්ගේ අසනීපයක් වැනි පෞද්ගලික හේතුවක් මත හෝ යම් නිලධාරියෙකුගේ සේවය ඡන්ද විමසීම වෙනුවෙන් ලබාදීමට නොහැකි වන්නේ නම්, ඒ වෙනුවෙන් වූ ඉල්ලීම, සිය නිර්දේශය සමග අදාළ ආයතන ප්‍රධානියා විසින් දත්ත පත්‍රිකා සමග ඉදිරිපත් කළයුතු විය. ඊට අමතරව වෙනම ලිපියක් මගින්, එම නිදහස් කිරීමට අදාළව ආයතන ප්‍රධානීන් විසින් සිය නිර්දේශ ද ඉදිරිපත් කිරීම අවශ්‍ය විය.

129. පෙර පැවති කිසියම් ඡන්ද විමසීමක දී අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වී ඇති හෝ මෙවර ඡන්ද විමසීමට අදාළව ක්‍රියාකාරී ලෙස දේශපාලන කටයුතුවල නිරතවන නිලධාරීන්, නිලධාරිනියන්, ආබාධිත හෝ සෞඛ්‍ය හේතුවක් නිසා දුරබැහැර රාජකාරී සඳහා යාමට අපහසු නිලධාරී මහත්ම මහත්මීන්, ඉදිරි තුන් මාසයක කාලය තුළ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන් මෙන්ම තාවකාලික, ආදේශ හෝ විශ්‍රාම ගැනීමෙන් පසු සේවයේ යොදවනු ලබන අයගේ විස්තර ද මෙම දත්ත පත්‍රිකාවලට ඇතුළත් නොකරන ලෙසද උපදෙස් දී තිබුණි.

130. මෙයට ප්‍රථම පැවති ඡන්ද විමසීම් අවස්ථාවල දී සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ විස්තර සමහර ආයතන ප්‍රධානීන් විසින් සිය ආයතනයට අදාළ දත්ත පත්‍රවලට ඇතුළත් කිරීමෙන් වැලකී සිටීමේ නරක පුරුද්දකට යොමුවීමේ හේතුවෙන් සමහර නිලධාරීන් මැතිවරණ රාජකාරී සඳහා යොදවා ගැනීමේ අවකාශය ඇහිරී ගිය අවස්ථා තිබිණි. මෙම තත්ත්වය වළක්වාලීම සඳහා, සියලු නිලධාරීන්ගේ හා නිලධාරිනීන්ගේ තොරතුරු ඇතුළත් කර, ඡන්ද විමසීම් කාර්ය වෙනුවෙන් වූ දත්ත පත්‍රිකා මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි, සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස, ජනාධිපති ලේකම්වරයා මගින් ද රජයේ ආයතන ප්‍රධානීන් වෙත දැනුම් දෙන ලදී.

131. ඡන්ද විමසීම් රාජකාරී වෙනුවෙන් නිලධාරී සංගණනය ඇරඹීමෙන් පසුව, ඡන්ද විමසීම පවත්වා අවසන් වන තෙක් වූ කාලය තුළ, රාජ්‍ය නිලධාරීන්ගේ හා රජයේ විදුහල්වල විදුහල්පතිවරුන් ඇතුළු ගුරුවරුන්ගේ ස්ථාන මාරුවීම් සිදුවුවහොත් ඉන්, මැතිවරණ කටයුතු සංවිධානයට හා තැපැල් ඡන්ද ක්‍රියාවලියට ද යම් යම් බාධා ඇති වේ. මේ නිසා ඡන්ද විමසීම් පැවැත්වෙන පරිපාලන දිස්ත්‍රික්කවල රජයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්, ඡන්ද විමසීම් කාලය තුළ තාවකාලිකව අත්හිටුවීමට අවශ්‍ය උපදෙස් අදාළ නිලධාරීන් සහ පළාත්වල ආණ්ඩුකාර ලේකම්වරුන් වෙත නිකුත් කරන ලෙස ද ඒ ඒ පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජනාධිපති ලේකම්වරයා වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එම උපදෙස් අදාළ අංශ වෙත ජනාධිපති ලේකම්වරයා විසින් යවා තිබුණි.

132. ඡන්ද විමසීම ඇතුළු අනෙකුත් අදාළ රාජකාරී සඳහා නිලධාරීන් යොදවා ගැනීම පිළබඳ උපදෙස් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීම පැවැත්වෙන දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් වෙත යවන ලදී. ඡන්ද මධ්‍යස්ථාන යටතේ ලියාපදිංචි ඡන්දහිමියන්ගේ සංඛ්‍යාව පදනම් කරගෙන, එක් එක් කාණ්ඩවලට අයත් නිලධාරීන් එම මධ්‍යස්ථානවලට යෙදවීමටත්, ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවන ගොඩනැගිලිවල ඇති ඉඩ කඩ ප්‍රමාණය ද සලකා, දළ වශයෙන් ලියාපදිංචි ඡන්දහිමියන් 8,00 සිට 10,00 දක්වා වූ සංඛ්‍යාවකට අදාළ ඡන්ද මධ්‍යස්ථාන ප්‍රමාණයක් වෙනුවෙන් වූ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවීමටත් එවැනි මධ්‍යස්ථාන සඳහා නියමිත නිලධාරීන් සංඛ්‍යාවක් පත් කිරීමටත් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

133. ඡන්ද පොළවලට හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට කාර්ය මණ්ඩලය පත් කිරීම පහත සඳහන් සංඛ්‍යා පදනම් කොටගෙන සිදු කරන ලදී.

ඡන්ද පොළවලට හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට කාර්ය මණ්ඩල යෙදවූ ආකාරය

ඡන්ද පොළවල ලියාපදිංචි ඡන්දහිමියන්ගේ සංඛ්‍යාව අනුව ඡන්ද පොළ කාර්ය මණ්ඩලය යොදවන ලද ආකාරය				
නිලධාරී වර්ගය	ලියාපදිංචි ඡන්ද හිමියන් 800 ට අඩු	ලියාපදිංචි ඡන්ද හිමියන් 801 - 1200	ලියාපදිංචි ඡන්ද හිමියන් 1201-1500	ලියාපදිංචි ඡන්ද හිමියන් 1500ට වැඩි
ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු	1	1	1	1
කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු	1	1	2	2
අතිරේක ඡන්ද ස්ථානාධිපතිවරු	1	1	2	2
ලිපිකරු	4	4	8	8
අතිරේක ලිපිකරු	-	1	2	3
කාර්යාල කාර්ය සහායකයින්	1	1	1	1
මුළු සංඛ්‍යාව	8	9	16	17

ඡන්ද ගණන් කිරීමේ ශාලාවක කාර්ය මණ්ඩලය සඳහා නිලධාරීන් යෙදූ සංඛ්‍යාව		
නිලධාරී වර්ගය	සාමාන්‍ය ගණන් කිරීමේ ශාලාවක් සඳහා	තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලාවන් සඳහා
ඡන්ද ගණන් කිරීම භාර නිලධාරී	01	01
සහාය වීම සඳහා සහකාර තේරීම්භාර නිලධාරී	08	02

නිලධාරී වර්ගය	සාමාන්‍ය ගණන් කිරීමේ ශාලාවක් සඳහා	තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලාවන් සඳහා
ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු	10	04
කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු හා ලිපිකරුවන්	20	06
කාර්යාල කාර්ය සහායකයින්	02	02
මුළු සංඛ්‍යාව	41	15

134. ඡන්ද පොළ කාර්ය මණ්ඩල හා ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩල පත්කිරීමේ දී පහත සඳහන් මගපෙන්වීම් අනුව ක්‍රියා කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් තේරීම්භාර නිලධාරීන්ට විශේෂයෙන් උපදෙස් දෙන ලදී.

I. ඡන්ද පොළක හෝ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් භාරව කටයුතු කරනු ලබන නිලධාරියා එම කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨතමයා විය යුතුය.

II. මෙම ඡන්ද විමසීමට පෙර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු ලෙස කටයුතු කර නොමැති නිලධාරියකු, එම රාජකාරිය සඳහා මෙවර ඡන්ද විමසීම වෙනුවෙන් තෝරා ගන්නේ නම්, අඩු තරමින් එම අය වාර 4 ක් වත් ඡන්ද විමසීම්වල දී කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු වශයෙන් කටයුතු කර තිබිය යුතුය.

III. එකම රාජකාරී ස්ථානයක සේවය කරන නිලධාරීන් කීප දෙනෙකු එකම ඡන්ද පොළක රාජකාරී සඳහා පත් නොකළ යුතුය.

IV. ක්‍රියාකාරී වශයෙන් දේශපාලන කටයුතුවල නිරත වන අයෙකුගේ ඥාති නිලධාරීන්/ නිලධාරිනියන් වෙතොත් එබඳු අයට (නිලධාරීන්ගේ මෙවැනි විස්තර, නිලධාරී සංගණන ආකෘතිය මගින් ලබා ගැනීමට උපදෙස් දී තිබුණි.) මැතිවරණ රාජකාරී නොපැවරිය යුතුය.

V. පූර්ව මැතිවරණ අවස්ථාවල දී යම් නිලධාරියෙකු හෝ නිලධාරිනියක විසින් මැතිවරණ රාජකාරී පැහැර හැරීමක් සිදුකොට ඇති බව හෝ එබඳු අයකුගෙන් රාජකාරී අකාර්යක්ෂමතාවක් පිළිබඳව වාර්තා වී ඇත්නම්, එවැන්නන් මෙවර ඡන්ද විමසීම් රාජකාරියේ යොදවා නොගත යුතුය.

VI. ඡන්ද විමසීමට අදාළව සිදු කළ නිලධාරී සංගණනයේ දී තොරතුරු කැඳවන ලද සෑම ආයතනයකින්ම, යම් නිලධාරීන් සංඛ්‍යාවක් මැතිවරණ රාජකාරියේ යෙදවීමට පියවර ගත යුතුය.

VII. ඡන්ද පොළ රාජකාරී වෙනුවෙන් නිලධාරීනින්, ඡන්ද විමසීම් දිනට පෙර දින ඡන්ද පොළේ සේවයට වාර්තා කළ යුතුය. ඡන්ද විමසීම් දිනට පෙර දින

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද විමසීමට අදාළව පවත්වන පෙරහුරුවට සහභාගී වීමෙන් පසු ඔවුන් සිය පෞද්ගලික නවාතැන් කරා යා යුතු වේ. ඔවුන් සිය පදිංචි ස්ථානයේ හෝ තාවකාලික නවාතැන් ගත් ස්ථානයේ සිට ඡන්ද විමසීම් දින එම කටයුතු ඇරඹීමට පෙර ඡන්ද පොළට සේවය සඳහා වාර්තා කළ යුතු බැවින්, එවැනි පහසුකම් ඇති ඡන්ද මධ්‍යස්ථානවලට රාජකාරී සඳහා නිලධාරීනීන් අනුයුක්ත කළ යුතුය. එහෙත් අදාළ දත්ත පත්‍රිකා පරීක්ෂාකර එවැනි අයගේ නිවස පිහිටි ඡන්ද කොට්ඨාසයේ ඡන්ද මධ්‍යස්ථානයට නිලධාරිනියන් පත් නොකිරීමට ක්‍රියා කළ යුතුය. රාජ්‍ය සේවයේ නිලධාරීනින්ගේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පවතින බැවින්, ඔවුන්ගේ සේවය ලබා නොගෙන ඡන්ද විමසීමක් පැවැත්විය නොහැකි තත්ත්වයක් ඇති බැවින් නිලධාරීනින් ඡන්ද පොළවල සේවයට යොදවා ගැනීමේ දී මෙවැනි සහන සැලසීමට සිදු වේ.

VIII. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා, ඡන්ද විමසීමට පෙර දින රාත්‍රියේ ඡන්ද පොළේ රැඳී සිටිය යුතු බැවින්, ඔහු සමග අඩු තරමින් නිලධාරියෙකු හෝ දෙදෙනෙකුවත් එහි රැඳී සිටිය යුතුය. එම කරුණ ද සැලකිල්ලට ගෙන ඡන්ද පොළවල් වෙනුවෙන් ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් පත් කිරීම සිදු කළ යුතුය.

135. මැතිවරණ සංවිධාන කටයුතු හා මූලික රාජකාරී කටයුතු වෙනුවෙන් ඒ සඳහා පළපුරුදු නිලධාරීන් දිස්ත්‍රික්කය තුළ පිහිටි රාජ්‍ය ආයතනවලින්, අදාළ ආයතන ප්‍රධානීන්ගේ අවසරය ඇතුව යොදා ගැනීම සඳහා උපදෙස් දී තිබිණි.

136. ඡන්ද විමසීමේ කටයුතු සහ ඡන්ද ගණන් කිරීමේ කටයුතු සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් තම දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාලවල කාර්ය මණ්ඩලය මෙන්ම රජයේ පාසල්වල ගුරුවරුන් ද, ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සහ පළපුරුද්ද සලකා යොදවා තිබුණි. සෑම දිස්ත්‍රික්කයකටම පිටස්තර දිස්ත්‍රික්කවලින් මෙන්ම කොළඹ සංචිතයෙන් ද නිලධාරීන් යොදවා ගැනීමට සිදු විය. විශේෂයෙන් ඡන්ද පොළවල් භාරව ක්‍රියා කිරීමට ඒ සඳහා පළපුරුදු ජ්‍යෙෂ්ඨ පිරිමි නිලධාරීන් ද ඡන්ද ගණන් කිරීම භාරව කටයුතු කිරීමට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් ද බොහෝ විට පිටස්තර දිස්ත්‍රික්කවලින් ලබා ගැනීමට සිදු විය. සෑම දිස්ත්‍රික්කයකටම ඡන්ද ගණන් කිරීම භාරව ක්‍රියා කිරීම සඳහා වැඩි නිලධාරීන් පිරිසක් යැවීමට සිදුවන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. කාර්ය මණ්ඩලය යෙදවීම පිළිබඳ තොරතුරු සංඛ්‍යා සටහන් 14 හි දැක්වේ.

නිලධාරීන් පුහුණු කිරීම

137. ඡන්ද විමසීමක් වෙනුවෙන් නාමයෝජනා දැන්වීම පළකිරීමේ අවස්ථාවේ සිට, ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම දක්වා මැතිවරණ දෙපාර්තමේන්තුවටත්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ටත් පැවරෙන රාජකාරී, පුහුණු කාර්ය මණ්ඩලයකට පැවරීම අත්‍යවශ්‍ය කරුණකි. ඡන්ද විමසීමේ ක්‍රියාවලිය වෙනුවෙන්, රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ විවිධ ශ්‍රේණිවලට අයත් විශාල රාජ්‍ය සේවකයින් පිරිසක් යොදා ගැනේ. ඒ අතර, මැතිවරණ සංවිධානය හා අදාළ රාජකාරී කටයුතු පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ඇති අය සිටිය ද, මැතිවරණ නීති මෙන්ම ඊට අදාළ ක්‍රියාදාමය ද වරින් වර සංශෝධනය වන බැවින්, සෑම නිලධාරියෙකුම මැතිවරණ රාජකාරී වෙනුවෙන් සෑම මැතිවරණ අවස්ථාවකදී ම පුහුණු කිරීම අත්‍යවශ්‍ය වේ.මෙවර ඡන්ද විමසීමේ දී නිලධාරීන් පුහුණු කිරීම විශේෂයෙන් සිදුවූයේ, තැපැල් ඡන්ද කටයුතු, ඡන්ද විමසීම් කටයුතු හා ඡන්ද ගණන් කිරීම යන කාර්යයන්ට අදාළවය.

138. තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලා සිටි අයගේ අයදුම්පත් පරීක්ෂා කිරීම, සුදුසු අයදුම්පත් පිළිගැනීම හා පිළිගැනීමට නුසුදුසු ඒවා තේරීම සහ ඒ පිළිබඳව වාර්තා තබා ගැනීම, තැපැල් ඡන්ද අයදුම්පත් සම්බන්ධ තීරණ තැපැල් ඡන්දදායකයින්ට හා සහතික කිරීමේ නිලධාරීන්ට දැනුම් දීමත් පළපුරුදු කාර්ය මණ්ඩලයක් විසින් සිදු කිරීම අවශ්‍ය වේ. මෙම කටයුතු වෙනුවෙන් පළපුරුදු මාණ්ඩලික නිලධාරීන්, තේරීම්භාර නිලධාරීන්ගේ කාර්යාලයට ආසන්න කාර්යාලවලින් තෝරා ගැනීමට උපදෙස් දෙන ලද අතර, විශේෂයෙන් මෙම කාර්යය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීගේ ආසන්න අධීක්ෂණය යටතේ සිදුවිය යුතු කර්තව්‍යයක් බැවින් ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීමට ද දිස්ත්‍රික් නියෝජ්‍ය හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට උපදෙස් දෙන ලදී. තැපැල් ඡන්ද අයදුම්පත්වල තොරතුරු ඇතුළත් කිරීම නිවැරදි ආකාරයට සිදු නොකිරීම නිසා, ප්‍රතික්ෂේප වන අයදුම්පත් සංඛ්‍යාව, මැතිවරණ අවස්ථාවල දී තවමත් ඉහළ මට්ටමක පවතින බැවින්, මෙම අයදුම්පත් පරීක්ෂා කරන නිලධාරීන්ට ඒ වෙනුවෙන් විශේෂ පුහුණුවක් තිබිය යුතු වේ.

139. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම, ඡන්ද විමසීම තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරනු ලබන නියෝජිතයන් ඉදිරියේදී සිදු කළ යුතු, ඡන්ද විමසීම් පනතේ දැක්වෙන ඉතා වැදගත් කර්තව්‍යයකි. මෙම කාර්යය පැවරෙන කාර්ය

මණ්ඩලය වෙනුවෙන්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් විශේෂ උපදෙස් මාලාවක් නිකුත් කරන ලද අතර, ඒ සඳහා පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යොදවා ගැනීමට ද තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ දිනය තුළ තැපැල් ඡන්දදායකයින්ගේ කවර සියල්ල නිකුත් කර අවසන් කිරීමට හැකිවන පරිදි, තැපැල් ඡන්ද පත්‍රිකා සංඛ්‍යාවක් නිකුත් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට උපදෙස් දෙන ලදී.

140. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ට, තැපැල් ඡන්ද ක්‍රියාවලියේ දී ඉතා වගකිවයුතු රාජකාරියක් පැවරේ. එම නිලධාරීන්ගේ රාජකාරිය නිවැරදිව, නියමිත වේලාවට ඉටු නොකිරීම, තැපැල් ඡන්දදායකයන්ගේ අයදුම්පත මෙන්ම එම අයගේ ඡන්ද පත්‍රිකා පවා ප්‍රතික්ෂේප වීමට හේතුවන බැවින්, තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් කටයුතු කරන සියලුම රජයේ නිලධාරීන් පුහුණු කිරීමට, දිස්ත්‍රික් නියෝජ්‍ය හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් පෞද්ගලිකව කටයුතු කළ යුතු බවට උපදෙස් දෙන ලදී. ඒ සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී, මැතිවරණ දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් වශයෙන් සේවය කොට, දැනට වෙනත් රාජ්‍ය ආයතනවල සේවය කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යෙදවීමට පියවර ගන්නා ලදී. මෙවැනි උපදෙස් පන්ති සඳහා සහභාගීවන නිලධාරීන්ට, වඩාත් පහසු භාෂාව අනුව පුහුණු පන්ති පැවැත්වීමටත්, එම නිලධාරීන් විසින් සහතික කළ යුතු අනන්‍යතා පත්‍ර හා නඩත්තු කළ යුතු ජර්නලය ඇතුළු ලේඛන සම්බන්ධයෙනුත්, විශේෂයෙන් තැපැල් ඡන්දදායකයින්ට අදාළ පහසුකම් සැලසිය යුතු ආකාරය පිළිබඳවත් එම නිලධාරීන්ට උපදෙස් දීමට ක්‍රියාකරන ලදී.

141. ඡන්ද පොළේ ප්‍රධාන නිලධාරීන් හැටියට කටයුතු කරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් හා කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඇතුළු ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා, ඡන්ද විමසීම් පැවති දිස්ත්‍රික්වල දී මෙන්ම, කොළඹ දී ද උපදෙස් පන්ති පවත්වන ලදී. මෙම උපදෙස් පන්ති පැවැත්වීම සඳහා බොහෝවිට, මැතිවරණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරු හා සහකාර මැතිවරණ කොමසාරිස්වරු අතුරින් නිලධාරීන් තෝරා ගැනුණි. එම නිලධාරීන් ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර මැතිවරණ කොමසාරිස්වරු ලෙස සේවය කොට ඇති, දැනට වෙනත් දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන්ගේ ද සහාය ද ඒ සඳහා ලබා ගන්නා ලදී. මෙම නිලධාරීන් පුහුණු කිරීමේ දී අදාළ සෑම කරුණක් කෙරෙහිම ඔවුන්ගේ අවධානය යොමුකරමින්, සෑම දිස්ත්‍රික්කයකදී ම ඒකාකාරී හා සම්පූර්ණ වූ පුහුණුවක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිරුන්ට ලබාදීමේ අපේක්ෂාවෙන්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් පුහුණු කිරීමේ නිලධාරීන් සඳහා, අත්පොතක් ද, සූදානම් කොට එම නිලධාරීන් වෙත ලබා දෙන ලදී.

142. ඡන්ද විමසීම් දිනට පෙර දින සහ, ඡන්ද විමසීම් දිනයේ දී ඉතා වැදගත් ක්ෂේත්‍ර රාජකාරියක් වන ඡන්ද මධ්‍යස්ථානවල අධීක්ෂණ කටයුතු පැවරෙන කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් පුහුණු කිරීම, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ මූලිකත්වයෙන් අදාළ දිස්ත්‍රික්කවල දී, සිදුකරන ලදී. විශේෂයෙන් මෙම නිලධාරීන්ගේ පුහුණු සැසිවාරවල දී, ඡන්ද පොළක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සිදුකිරීමට නියමිත සියලුම රාජකාරී පිළිබඳව, ඔවුන් දැනුවත් කිරීමටත්, ඡන්ද පොළවල්වල අනපේක්ෂිත පරිදි යම් කලබලකාරී සිදුවීමක් ඇතිවුවහොත් හෝ ඡන්ද විමසීම, අඩාල වුවහොත් හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය ගැන ද ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

143. මෙම කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් විසින් නඩත්තු කළ යුතු ප්‍රධාන ලේඛනයක් වන්නේ, එම නිලධාරීන්ගේ කාර්ය පටිපාටි සංග්‍රහයයි. සමහර අධිකරණ ක්‍රියාමාර්ගවල දී පවා ඉදිරිපත් කිරීමට සිදුවිය හැකි මෙම ලේඛනය, අදාළ නිලධාරීන් ඉතාමත් නිවැරදිව සහ සම්පූර්ණ ලෙස නඩත්තු කිරීම වැදගත් වේ. ඡන්ද පොළක ඡන්ද විමසීමක් ශූන්‍ය කිරීම සඳහා හේතුවන සිද්ධීන් පිළිබඳව, මෙම කාර්ය පටිපාටි සංග්‍රහවල ඇතුළත් කරුණු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට මෙන්ම මැතිවරණ කොමසාරිස්වරයාට ද වැදගත්වන හෙයින්, මෙම ලේඛන නඩත්තු කිරීමේදී විශේෂ අවධානයකින් කටයුතු කිරීමට උපදෙස් දෙන ලෙස තේරීම්භාර නිලධාරීන්ට දන්වා තිබිණි.

144. ඡන්ද සහ මනාප ගණන් කිරීම භාරව කටයුතු කිරීම සඳහා, මැතිවරණ කොමසාරිස්වරයා විසින් රජයේ ආයතනවලින් ඉදිරිපත් කරන ලද රාජ්‍ය නිලධාරීන්ගේ දත්ත පත්‍රිකා මත, නිලධාරීන් තෝරා ගන්නා ලදී. දිස්ත්‍රික්කවල පිහිටි රජයේ කාර්යාලවලින් රැස්කරන ලද එම තොරතුරු අනුව, ඡන්ද ගණන් කිරීම භාරව ක්‍රියාකිරීමට දිස්ත්‍රික්කවලින් තෝරා ගැනීම සඳහා තේරීම්භාර නිලධාරී විසින් යෝජනා කරනු ලැබූ නිලධාරීන්ගේ සුදුසුකම් බලා, එම අය අතුරින් ද මෙම කාර්යය වෙනුවෙන් අවශ්‍ය නිලධාරීන් තෝරා ගැනීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදුකරන ලදී. ඡන්ද ගණන් කිරීම භාරව ක්‍රියාකිරීම සඳහා හඳුනාගත් සියලුම

සහකාර තේරීම්භාර නිලධාරීන් කොළඹ, රාජගිරියේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී සහ ඊට ආසන්න රජයේ කාර්යාලවල දී පුහුණු කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා ද අතිරේක හා නියෝජ්‍ය කොමසාරිස්වරු ද කටයුතු කළහ.

ප්‍රවාහන කටයුතු සංවිධානය

145. රජයේ ආයතන සතු ඡන්ද විමසීම් කටයුතු සඳහා අවශ්‍යවන වාහන පිළිබඳ සංගණනයක් ඡන්ද විමසීම පැවැති පළාත්වල පිහිටි දිස්ත්‍රික්කවල රජයේ කාර්යාලවලට අදාළව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සිදුකරන ලද අතර, ඊට අමතරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ද කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි රාජ්‍ය ආයතනවලින් එම තොරතුරු ලබා ගන්නා ලදී. තව ද ඡන්ද විමසීම් පැවති දිස්ත්‍රික්කවලට ආසන්න දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන්ට ද, ඉහත දක්වන ලද ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවලට වාහන අවශ්‍ය විය හැකි බැවින් රජයේ වාහන පිළිබඳ තොරතුරු ඔවුන්ගේ දිස්ත්‍රික්කවලින් ද රැස් කිරීමට ද උපදෙස් දෙන ලදී.

146. ඡන්ද විමසීමට අදාළ ප්‍රවාහන කටයුතු සංවිධානයේ දී ප්‍රධාන තැනක් දියයුතු වන්නේ ඡන්ද විමසීම් දිනට පෙර දින ඡන්ද පොළවල් කරා ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු ඇතුළු ඡන්ද පොළ කාර්ය මණ්ඩලය කෙරෙහිය. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ භාරයේ පවතින ඡන්ද පත්‍රිකා ඇතුළු ඡන්ද පොළේ බඩුබාහිරාදිය ඔහු සමගම රැගෙනයාමට ඉඩ සැලසිය යුතුය. ඊට අමතරව ඔහු සමග ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් ද යායුතු වේ. ඡන්ද පොළවල් කරා ගමන් කිරීමට ඇති මාර්ග පහසුකම් පිළිබඳව සැලකිලිමත්ව හැකිතාක් දුරට සෑම ඡන්ද පොළකටම වෙනම වාහනයක් ලබාදීම කෙරෙහි සැලකිලිමත්ව මෙම කටයුතු සැලසුම් කෙරේ.

147. පූර්ව මැතිවරණ කිහිපයක දී සිදු කළ ආකාරයට, මෙම ඡන්ද විමසීමේ දී ද, ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා හැර ඉතිරි අයට කල්තියා ඔවුන් සේවය කළ යුතු ඡන්ද පොළ දැනුම් දෙනු ලබන බැවින්, ඒ අනුව ඡන්ද විමසීම් දිනට පෙර දින පස්වරුවේ කල්වේලා ඇතිව සිය පෞද්ගලික ගමනාගමන වැඩපිළිවල් යොදාගෙන, ඡන්ද පොළවල් කරා වාර්තා කිරීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් එම ඡන්ද පොළ කාර්ය මණ්ඩලයට උපදෙස් දී තිබිණි. එකම මාර්ගයේ පිහිටි ඡන්ද පොළවල් කිහිපයක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සහ ඒවාට ගමන් කිරීමට සිටින ඉතිරි ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ද රැගෙන එම ඡන්ද මධ්‍යස්ථාන කරා බස් රථ ගමන් කරවීම බොහෝවිට සිදු කරන දෙයකි. බස් රථ ගමන් කළ නොහැකි හා ගමනා ගමන පහසුකම් අතින් දුෂ්කර ප්‍රදේශවල පිහිටි මධ්‍යස්ථාන සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ජීප් රථ වැනි කුඩා වාහනවලින් ප්‍රවාහනය කිරීමට කටයුතු කරන ලදී.

148. රාජ්‍ය ආයතනවලින් මැතිවරණ කටයුතු සඳහා ලබා දිය හැකි වාහන පිළිබඳ තොරතුරු රැස්කරන ලද අවස්ථාවේ දී ඒවායේ රියදුරන්ට සහ සහායකයින්ට තැපැල් ඡන්ද පහසුකම් ලබා දිය යුතු බව ද දන්වන ලදී.

149. නිල ඡන්ද දැන්වීම්පත් බෙදා හැරීමට හා එම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍රයට යාමට තැපැල් දෙපාර්තමේන්තුවට අමතර වාහන අවශ්‍ය වුවහොත් ඒවා වෙනුවෙන් ද ආරක්ෂක වැඩපිළිවෙල වෙනුවෙන් පොලීසියට අවශ්‍ය අමතර වාහන ද ඉල්ලා සිටිය හොත් එම කටයුතු සඳහා ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් ලබා දිය යුතු බව තේරීම්භාර නිලධාරීන්ට දන්වා යවන ලදී.

150. මෙසේ රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ලබාගත හැකි වාහන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ මෙන්ම පෞද්ගලික බස් සමාගම්වල බස් රථ යොදවා ගැනීමට උපදෙස් දෙන ලදී. එම වාහන සංඛ්‍යාව ද ප්‍රමාණවත් නොවන විට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු හැටියට පත්වීම් ලබන නිලධාරීන්ගේ හා කලාප භාරව කටයුතු කරන සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ පෞද්ගලික වාහන කුලී පදනම යටතේ ලබා ගැනීමට උපදෙස් දෙන ලදී. ලංකා ගමනාගමන මණ්ඩලයෙන් හා පෞද්ගලික බස් රථ සමාගම්වලින් මෙම රාජකාරී සඳහා අවශ්‍ය බස් රථ ඡන්ද විමසීම් පැවති සියලුම දිස්ත්‍රික්කවලට ඒකාකාරී මිල ගණන් යටතේ ලබා ගැනීමට එම ආයතන සමග මැතිවරණ කොමසාරිස්වරයා කටයුතු කළ අතර, ඒ අනුව අදාළ උපදෙස් දිස්ත්‍රික්කවලට යවන ලදී.

151. ඡන්ද විමසීම් දින සහ ඊට පෙර දින, ඡන්ද පොළවල කාර්ය මණ්ඩලයේ සහ එම ඡන්ද පොළවල ආරක්ෂාව සැලසීමේ වැඩපිළිවෙල වෙනුවෙන් පොලිස් නිලධාරීන්ට ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී ඒ සඳහා පෞද්ගලික අංශයේ වාහන විශේෂ ගාස්තු ප්‍රමාණ යටතේ ලබා ගැනීමට පොලිස්පතිවරයාට අවසර දෙන ලදී.

152. මෙම ඡන්ද විමසීම් කටයුතු වෙනුවෙන් භාවිතා කරන ලද වාහන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු සංඛ්‍යා සටහන් 13 හි ඇතුළත් කර ඇත.

VII වන කොටස

මැතිවරණ නීති කඩ කිරීම් වැළැක්වීම

153. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඉදිරිපත් වූ දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහතික කරන ලද්දේ 2001 ඔක්තෝම්බර් මස 03 වන දිනදීය. එම සංශෝධන පනතේ 9 සහ 27 වන වගන්ති, මැතිවරණ කොමසාරිස්වරයා, මැතිවරණ දෙපාර්තමේන්තුව, තේර්මිහාර නිලධාරීන්, මැතිවරණ කොමසාරිස්වරයාගේ බලතල හා කෘත්‍යභාර සම්බන්ධ වේ. මෙම සංශෝධන පනත මගින් මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු හා එයට සාමාජිකයින් පත්කිරීම, රාජ්‍ය මාධ්‍ය ආයතන වෙනුවෙන් පමණක් මාධ්‍ය උපමාන පැනවීම, මාධ්‍ය උපමාන කඩවන අවස්ථාවල දී නිසි බලධරයකු මගින් සුදුසු ක්‍රියා මාර්ග ගැනීම, රාජ්‍ය සේවයට අදාළව මැතිවරණ අවස්ථාවල දී මැතිවරණ කොමසාරිස්වරයාට මැදිහත් වීමට තිබූ අවස්ථා සහ මැතිවරණ කොමිසම පත්කරන තෙක් මැතිවරණ කොමසාරිස් තනතුරට අදාළ අන්තර් විධිවිධාන යන කරුණුවලට අදාළව පනවා තිබූ නීතිමය ප්‍රතිපාදන, 2010 සැප්තැම්බර් 09 වන දින සහතික කරන ලද දහ අට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත මගින් සංශෝධනයට ලක්විය. මේ වන විට දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නීතිගත වී වසර 12 කටත් වැඩි කාලයක් ගතවී ඇත. එමගින් මැතිවරණ කොමසාරිස්වරයාට තිබූ සමහර බලතල 18 වන ආණ්ඩුක්‍රම සංශෝධනය මගින් සීමා කර ඇත. එසේ වුව ද තවමත් විවිධ දේශපාලන පක්ෂ හා සිවිල් සංවිධාන ආදිය, මැතිවරණ අවස්ථාවල දී එම 17 වන සංශෝධනයේ විධිවිධාන ක්‍රියාත්මක කරන ලෙස රජයේ වගකිව යුතු අංශවලට ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන් පෙනී යන්නේ, එමගින් මැතිවරණ ක්‍රියාදාමය තව දුරටත් අර්ථවත් වන බවට සමාජයේ පිළිගැනීමක් ඇති බවයි.

154. වත්මන් නීතිය අනුව, මැතිවරණ කොමසාරිස්වරයාට, දහහත් වන හා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන යටතේ පිහිටුවීමට නියමිත මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවන තෙක්, එකී බලතල එම සංශෝධනයන්හි දැක්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

155. ජනමත විචාරණ සහ ඡන්ද විමසීම් පැවැත්වීම සම්බන්ධ මැතිවරණ කොමසාරිස්වරයාගේ බලතල හා මැතිවරණ කළමනාකරණය කිරීමට අදාළව, ඉහත සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධන දෙක යටතේ දක්වා ඇති ප්‍රධාන කරුණු පහත දක්වා ඇත.

(අ) නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම, කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතුය.

(ආ) යම් ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීම කොමිෂන් සභාවේ කාර්ය විය යුතුය.

(ඇ) එම නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීමෙහිලා කොමිෂන් සභාවට සහයෝගය දැක්වීම, නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම බලධරයන්ගේ කාර්ය විය යුතුය.

(ඈ) ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් හා පොලිස් නිලධාරීන් සංඛ්‍යාව, මැතිවරණ කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයාට දැන් වූ පසු, එසේ නිශ්චිතව දන්වනු ලබන නිලධාරීන් පොලිස්පතිවරයා සැපයිය යුතු වන අතර, එම නිලධාරීන් ඡන්ද විමසීම, නිදහස්ව සහ සාධාරණව පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් සහගත ආකාරයට කොමිෂන් සභාව විසින් යොදවා ගනු ලැබීම කොමිෂන් සභාවේ වගකීම වේ.

(ඉ) කොමිෂන් සභාව වෙත සපයන ලද සෑම පොලිස් නිලධාරියෙකුම, ඡන්ද විමසීම් කාලය තුළ දී කොමිෂන් සභාවට වගකිව යුතු වන අතර, කොමිෂන් සභාවේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතුය.

(ඊ) ඡන්ද විමසීම් කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් නිශ්චල හෝ චංචල දේපළක්, දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හෝ ඒවායේ අපේක්ෂකයින් තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා භාවිතා කිරීම, විධානයක් මගින් තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට/ මැතිවරණ කොමසාරිස්වරයාට ඇත.

(උ) රූපවාහිනී සේවාවන්, ගුවන්විදුලි සේවාවන් හා ප්‍රවෘත්ති පත්‍ර වෙනුවෙන් උපමාන පැනවිය හැකිය.

(ඌ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය පථයට අයත් නොවන්නා වූ රාජ්‍ය සේවා නිලධාරීන්ගේ පත්වීම්, මාරු කිරීම් සහ උසස් කිරීම්, ආදිය ඡන්ද විමසීමකට සෘජුව බලපාන්නා වූ ආකාරයකට ඡන්ද විමසීම් කාලය තුළ සිදුවන්නේ නම් එවැනි අවස්ථාවල අදාළ ආයතන වෙනුවෙන් මග පෙන්වීම් සිදු කළ හැකිය.

(එ) ඡන්ද විමසීම් අවස්ථාවල දී තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට සහ ඒවායේ අපේක්ෂකයින් සඳහා ආචාරධර්ම පද්ධති පැනවිය හැකිය.

156. මෙම සංශෝධන ක්‍රියාත්මක වීමෙන් පසු මැතිවරණ පැවැත් වූ සෑම අවස්ථාවක දී ම, එම නීතිමය සංශෝධනවල මූලික අරමුණු සාක්ෂාත් කරලීමට විවිධ පියවර මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගන්නා ලද අතර, මෙම පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල දී ඒ අනුව ගන්නා ලද ප්‍රධාන පියවර පැහැදිලි කිරීම යෝග්‍ය වේ.

මැතිවරණ කාල සීමාව තුළ දී රජයේ දේපළ අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම.

157. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දහහත් වන සංශෝධනය ගෙන ඒමෙන් පසු මැතිවරණ පැවැත්වෙන සෑම අවස්ථාවක දී ම, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීම් කාල සීමාව තුළ ඊට අදාළව රාජ්‍ය දේපල අනිසි ලෙස භාවිතා කිරීම තහනම් බව රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ට දන්වා යවනු ලැබේ. ඌව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව එසේ කරනු ලැබූ දැනුවත් කිරීමේ ලිපිය පරිශිෂ්ඨ 29 වශයෙන් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

158. මෙවර පැවති පළාත් සභා ඡන්ද විමසීම් කාලවල දී, මැතිවරණ කොමසාරිස්වරයා විසින් මෙම කරුණට අදාළව රාජ්‍ය ආයතනවලට විවිධ අවස්ථාවල මග පෙන්වීම් හා උපදෙස් ලබා දී ඇත. විසුරුවා හැර තිබූ පළාත් සභා වෙනුවෙන් අපේක්ෂකයින් වශයෙන් තරග කරනු ලබන, පළාත් පාලන ආයතනවල සභාපතිවරු, උප සභාපතිවරු හා සභිකයන්, සිය නිලයේ රැඳී සිටිමින් දැනට දරන මහජන නියෝජිත තනතුරුවලට මුවාවී, ඔවුන් සේවය කරනු ලබන පළාත් පාලන ආයතනවල, රජයේ වාහන හා දේපල ද, ඔවුන්ගේ තනතුරට හිමි වරප්‍රසාද ද, පළාත් සභා ඡන්ද විමසීමේ දී සිය ජයග්‍රහණය වෙනුවෙන් යොදා ගනු ලබන බවට මැතිවරණ දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබී තිබිණි. මැතිවරණ කොමසාරිස්වරයා සහ ඡන්ද විමසීම තරග කරනු ලබන දේශපාලන පක්ෂවල ලේකම්වරුන්, නියෝජිතයින් සමග පැවති රැස්වීම්වල දී,මෙම කරුණ පිළිබඳව සාකච්ඡා කරන ලදී. එම නියෝජිතයන් සියලු අයගේ එකඟත්වය ඇතිව, එබඳු අපේක්ෂකයින්ට තමා කටයුතු කරනු ලබන පළාත් පාලන ආයතනවල කටයුතුවලින් ඉවත් වීම සඳහා, නිවාඩු ලබා ගන්නා ලෙස, අදාළ පක්ෂ ලේකම්වරුන් උපදෙස් දිය යුතු බව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ පක්ෂ ලේකම්වරුන්ට ලිඛිතව දන්වන ලදී.

159. මැතිවරණ කොමසාරිස්වරයා විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරු වෙත ලිපියක් යවමින්, අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්,රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරු මෙම පළාත් සභා ඡන්ද විමසීම්වලට අපේක්ෂකයින් වශයෙන් ඉදිරිපත්ව ඇත්ද යන්න, ඉදිරිපත්ව ඇති අය ඔවුන්ගේ රාජකාරීවලින් ඉවත්ව සිටීදැයි යන්න හා ඔවුන් පළාත් සභා ඡන්ද විමසීම් කාලයේ, අදාළ ආයතනවලින් නිවාඩු ලබාගෙන සිටින්නේ ද යන්න විමසන ලදී. එම විමසීමට ලද පිළිතුරුවලින්, ඡන්ද විමසීම තරග කරනු ලබන අපේක්ෂකයින්, නීත්‍යානුකූලව නිවාඩු ලබාගෙන එම කටයුතුවල නිරත වන බවට, මැතිවරණ කොමසාරිස්වරයාට සෑහීමට පත්වීමට හැකි විය. තව ද, පළාත් සභාවල හිටපු මැති ඇමතිවරුන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් දේශපාලන ප්‍රචාරණ කටයුතු සඳහා පළාත් සභාවල වාහන යොදවාගනු ලබන බවට ලැබුණු පැමිණිලි අනුව, එබඳු අය වෙනුවෙන් කලින් වෙන්කොට තිබූ රජයේ වාහන, මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදවා ගැනීම වැළැක්වීමට අදාළව රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් වගකීම භාරගත යුතු බව, ඡන්ද විමසීම් පැවැත්වෙන අවස්ථාවල දී ඒ ඒ පළාත්වල පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්ට මැතිවරණ කොමසාරිස්වරයා දන්වා යවා ඇත. විශේෂයෙන් රාජ්‍ය ආයතනවල වාහන, මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දේශපාලන පක්ෂ විසින් යොදා ගැනීම ගැන ලැබෙන පැමිණිලි සම්බන්ධව සොයා බැලීමට, තවත් නිලධාරී කණ්ඩායමක සහාය අවශ්‍ය විය. ඒ සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ රාජකාරී පහසුවීම සඳහා, රාජ්‍ය ආයතනවල වාහන භාවිතය හා රාජකාරී සඳහා වාහන වෙන්කිරීම පිළිබඳ වගකීම දරනු ලබන නිලධාරීන් පිළිබඳ විස්තර ද අදාළ අමාත්‍යාංශවලින් හා ආයතනවලින් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

160. දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමට හේතුවන කටයුතු, ඡන්ද විමසීම් පැවැත්වෙන පළාත් සභා බලප්‍රදේශවල රාජ්‍ය උත්සව පැවැත්වීම මාර්ගයෙන් සිදු වන බවට මැතිවරණ කොමසාරිස්වරයාට, මෙම පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වෙන අවස්ථාවල පැමිණිලි ලැබිණි. මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ සම්බන්ධ උපදෙස්, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට, අදාළ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්ට, ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවල දිසාපතිවරුන්ට, පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට, රාජ්‍ය බැංකු හා සංස්ථා මණ්ඩල ප්‍රධානීන්ට හා අදාළ පළාත්වල පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට යවන ලදී. "රාජ්‍ය උත්සව/ රාජ්‍ය ව්‍යාපෘති හා සුභසාධන කාර්යයන්හිදී දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීම හා වෙනත් පක්ෂවලට/ අපේක්ෂකයින්ට අහිතකර ක්‍රියා සිදු කිරීම"

මැයෙන් නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ දී 2012.07.13 දින අදාළ ආයතන ප්‍රධානීන්ට යවා ඇති ලිපියේ දෙවන ඡේදයේ උපුටනයක් පහත දැක්වේ.

"ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශයන්හි පවත්වනු ලබන රජයේ උත්සව, දේශපාලන පක්ෂ නායකයන් හා අපේක්ෂකයන් විසින් ස්වකීය අයිතියට ගනිමින් අදාළ ව්‍යාපෘති සඳහා ලැබී ඇති රාජ්‍ය ප්‍රතිපාදන තමන්ගේ ධනය මෙන් යොදවා තමන්ගේ පක්ෂයේ/ අපේක්ෂකයන්ගේ ප්‍රවර්ධනය සඳහා එකී අවස්ථා භාවිතා කරන බවටත් ඇඳුම් පැළඳුම්, වියළි ආහාර මලු, බයිසිකල්, රෝද පුටු, නිවාස ඉදිකිරීම් ද්‍රව්‍ය, ගෘහ උපකරණ, ක්‍රීඩා උපකරණ, පාසල් පොත්, පාසල් බෑග් ඇතුළු විවිධ ද්‍රව්‍ය, නිවාස/ඉඩම් ඔප්පු ආදිය බෙදා දීමේ උත්සව හා සම්මන්ත්‍රණ, ශ්‍රමදාන ආදිය සංවිධානය කරමින් ඒ හරහා දේශපාලනමය වාසි ලබා ගැනීමට ක්‍රියා කරන බවටත් පැමිණිලි ලැබෙමින් පවතී. මෙවැනි ක්‍රියා ඕනෑම ඡන්ද විමසීම් පනතක් යටතේ දූෂණ/ වැරදි යටතට ගැගෙන බවත්, සදාචාර විරෝධී වන බවත් කාරුණිකව පෙන්වා දෙනු කැමැත්තෙමි. මැතිවරණ කාල සීමාව තුළ දී මුල්ගල් තැබීම්, ජනතා අයිතියට පැවරීම් හෝ විවෘත කිරීම් ආදිය ඇතුළු රාජ්‍ය උත්සවවලදී ද රජයේ මැදිහත් වීමෙන් ඉටු කරනු ලබන ව්‍යාපෘති හෝ සුභසාධන කාර්යන්හි දී ද කිසිඳු පක්ෂයකට හෝ අපේක්ෂකයකුට වාසි සැලසෙන ආකාරයෙන්, නැතහොත් වෙනත් පක්ෂ/ අපේක්ෂකයන්ට අවාසි සිදුවන ආකාරයෙන්, කථා පැවැත්වීම හෝ ජනතා සුභ සාධන කාර්යන් ඉටු කිරීම නො කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි."

161. දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයන්ගේ කටයුතු ප්‍රවර්ධනය සඳහා සමහර නිලධාරීන් විසින් සිය නිල බලය යොදාගෙන ගුරුවරුන් රැස්වීම් සඳහා කැඳවන බවට මැතිවරණ දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබී තිබුණි. පළාත් සභා ස්ථාපිත කිරීමෙන් පසුව, පළාත්වල සේවය කරනු ලබන විදුහල්පතිවරු (ජාතික පාසල්වල කාර්ය මණ්ඩලය හැර) සහ ගුරුවරු පළාත් රාජ්‍ය සේවයට අයත් වෙති. මෙම ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවල, විදුහල්පතිවරු හා ගුරුවරු, එම දිස්ත්‍රික්ක අයත් වන පළාත්වල පළාත් සභා විසුරුවාලීමෙන් පසුව, ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන්ගේ ද සහාය ඇතිව, ඡන්ද විමසීම් තරග කරනු ලබන දේශපාලන පක්ෂ විසින් විවිධාකාරයේ රැස්වීම් සඳහා කැඳවා ඇති බවට පැමිණිලි ලැබිණි. පක්ෂවල ජයග්‍රහණය හා අපේක්ෂකයන්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය උදෙසා එබඳු රැස්වීම් සංවිධානය කිරීමෙන් වළකින ලෙස, අදාළ අවස්ථාවල දී පළාත්වල ප්‍රධාන ලේකම්වරුන්ට, පළාත් අධ්‍යාපන ලේකම්වරුන්ට, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට/ කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට හා විදුහල්පතිවරුන්ට මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලිඛිතව උපදෙස් දෙන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (5) ඡේද අනුව ගුවන්විදුලි හෝ රූපවාහිනී සේවාවන් හා ප්‍රවෘත්ති පත්‍ර අයිතිකරුවන්/ ප්‍රකාශකයින් වෙත උපමාන නිකුත් කිරීම

162. රාජ්‍ය මාධ්‍ය ආයතන වෙනුවෙන් උපමාන නිකුත් කිරීමට හා එම උපමාන පිළිනොගෙන කටයුතු කරනු ලබන අවස්ථා වෙනුවෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමට, නිසි බලධරයකු පත් කිරීම සඳහා 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව මැතිවරණ කොමිෂන් සභාවට/ මැතිවරණ කොමසාරිස්වරයාට බලය තිබිණි. එහෙත් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අදාළ උපමාන, සියලුම මාධ්‍ය ආයතන වෙනුවෙන් නිකුත් කිරීමට හැකි වුවද එම සංශෝධනය මගින් උපමාන පිළිනොගෙන කටයුතු කරන අවස්ථාවක දී, අදාළ අංශ සම්බන්ධව නිසි බලධාරියකු මගින් ක්‍රියා කිරීමට තිබූ අවකාශය ඉවත් කොට ඇත. නව නීතිය අනුව, මෙසේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන පිළිපැදීම හා ඒවා පිළිපැදීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීමට සියලු මාධ්‍ය ආයතනවල කාර්යය වන්නේ ය.

163. මේ ආකාරයට මෙවර ඌව පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් සියලු මාධ්‍ය ආයතන වෙත නිකුත් කරන ලද උපමාන, අංක 32 දරන පරිශිෂ්ඨයේ දැක්වේ. අනිකුත් පළාත් සභා ඡන්ද විමසීම්වලට අදාළව ද මීට සමාන වූ උපමාන, මාධ්‍ය ආයතන වෙනුවෙන් නිකුත් කෙරිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4 අ) (ආ) ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවයට අදාළ කරුණු පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් උපදෙස් නිකුත් කිරීම

164. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සෘජු පරිපාලනයට යටත් නොවන, වෙනත් රාජ්‍ය අංශ සේවකයන් බඳවා ගැනීම්, ඔවුන්ගේ උසස් කිරීම් සහ මාරුකිරීම් සිදු කිරීමෙන් මෙම ඡන්ද විමසීම් කාල සීමාවන් තුළ වැළකී සිටින ලෙස එම ආයතන ප්‍රධානීන් වෙත දන්වා ඇත.

165. තවද, ඡන්ද විමසීම පැවැත්වෙන බලප්‍රදේශවල ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ ස්ථාන මාරුවීම්,

ඡන්ද විමසීම අවසන් වී දෙසතියක කාලයක් අවසන් වන තෙක්, කල්දමන ලෙස ද උපදෙස් දෙන ලදී. විනය ක්‍රියාමාර්ග හෝ නිලධාරීන්ගේ ඉල්ලීම් මත හෝ සානුකම්පිත හේතූන් මත දීමට අපේක්ෂා කරන ස්ථානමාරුවීම්, දේශපාලන හේතුමත නොවේ නම්, තමාගේ අනුමැතිය ඇතිව කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා, මෙවර පැවති සියලුම පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල දී අදාළ බලධාරීන් වෙත දැනුම් දී ඇත.

166. මෙම උපදෙස් හේතුවෙන්, රාජ්‍ය සේවයේ අදාළ පත්වීම්, උසස්වීම් හා ස්ථාන මාරුවීම්වල අවශ්‍යතාව හා ඒවා විධිමත් පරිපාටියට අනුව සිදු වන බවට දන්වමින් ඒවා සිදු කිරීම සඳහා රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් හා අනුමැතිය ලබාගැනීමට විශාල වශයෙන් ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි.

167. එවැනි ඉල්ලීම් සලකා බලා, අවශ්‍ය උපදෙස් හෝ අනුමැතිය මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ අංශවලට දී තිබුණි. එසේ උපදෙස් දීමට පෙර අදාළ පත්වීම්, උසස්වීම් හෝ මාරුවීම් නියමිත පරිපාටි අනුව සිදුවී ඇත් ද යන්න හා සේවා අවශ්‍යතාවය අනුව ඒවා කල් දැමීමක් සිදු කළ හැකිද යන කරුණු විමසා දැනගන්නා ලදී. බොහෝ අවස්ථාවල දී අදාළ පත්වීම, උසස් කිරීම හෝ මාරු කිරීම රජයේ පිළිගත් ක්‍රමවේදයකට හා ඡන්ද විමසීම් කාලය තුළ දේශපාලන වාසි ලබා දීමේ අරමුණක් නොමැතිව සිදු කරන බවට හෙළි වුණි නම්, එවැනි අවස්ථාවල එම කටයුතුවලට මැතිවරණ කොමසාරිස්වරයාගේ අනුමැතිය ලැබුණි.

168. මෙවැනි උපදෙස් මාලාවක් රාජ්‍ය ආයතනවලට මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇති බව දැනගත් විවිධ පුද්ගලයන් හා පාර්ශ්වයන් විසින්, යම් යම් අවස්ථාවල දී රාජ්‍ය අංශයේ ආයතනවල මෙන්ම, රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවල විවිධ පත්කිරීම්, මාරුකිරීම් හා උසස්වීම් දීම් ආදිය පිළිබඳ පැමිණිලි මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිණි. එබඳු පැමිණිලි ලද විට, ඒ සම්බන්ධ පාර්ශ්වයන්ගෙන් කරුණු විමසා, සුදුසු උපදෙස් එම ආයතනවලට නිකුත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ, (1) ව්‍යවස්ථාව අනුව මැතිවරණ දෙපාර්තමේන්තුව ඡන්ද විමසීම් කාලය තුළ ශ්‍රී ලංකා පොලිසිය සමග ක්‍රියා කිරීම

169. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාව අනුව, නිදහස් හා සාධාරණ මැතිවරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිසමේ/ දෙපාර්තමේන්තුවේ පරමාර්ථය විය යුතුය.

170. ඡන්ද විමසීමක් පැවැත්වෙන අවස්ථාවක දී, ඒ සඳහා අවශ්‍ය පහසුකම් හා පොලිස් නිලධාරීන් ලබාදීම, මැතිවරණ කොමිසම/ කොමසාරිස්වරයා දැනුම් දෙන පරිදි පොලිස්පතිවරයා විසින් ඉටු කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ (1) ව්‍යවස්ථාවෙහි දැක්වේ. ඡන්ද විමසීමේ කාලය තුළ, එම පොලිස් නිලධාරීන් මැතිවරණ කොමිසමට වගකිව යුතු වන අතර, කොමිෂන් සභාවේ විධානය හා පාලනය යටතේ ඔවුන් ක්‍රියා කළ යුතු බව, එම ව්‍යවස්ථාවේ වැඩි දුරටත් දැක්වේ. ඡන්ද විමසීම්, නිදහස්ව සහ සාධාරණව පැවැත්වීම සඳහා, අදාළ පොලිස් නිලධාරීන් සැලසුම්ගත ආකාරයකින් කොමිෂන් සභාව විසින් යොදවාගත යුතුය.

මැතිවරණ රාජකාරි සම්බන්ධ උපදෙස් මාලාවක් පොලිසිය වෙත නිකුත් කිරීම

171. මහජන නියෝජිතයින් තෝරා පත්කර ගැනීමේ දී ඡන්දදායකයාට නිදහස්ව හා සාධාරණ ලෙස කටයුතු කිරීමට අවකාශය සැලසීම, ඡන්ද විමසීමට අදාළ වගකීම පැවරුණු සියලුම පාර්ශ්වයන්ගේ යුතුකම වේ. ඡන්ද විමසීම් කාලය තුළ රටේ නීතිය, සාමය රැකීම හා ඡන්ද විමසීම් නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස් පොලිස් නිලධාරීන් වෙත නිකුත් කිරීම, පොලිස්පතිවරයා විසින් සිදු කළ යුතු ය. එම තත්ත්වය ද පැහැදිලි කර විශේෂිත කාරණා කිහිපයක්, සියලුම පොලිස් නිලධාරීන් වෙත දැනුම් දීම සඳහා, මෙම ඡන්ද විමසීම් අවස්ථාවල දී උපදෙස් මාලාවක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලදී. එහි ඇතුළත් මග පෙන්වීම් පහත කරුණු යටතේ සිදුකර තිබිණි.

I. ඡන්ද විමසීම් නීතියට අදාළ උපදෙස් නිවැරදිව හා අපක්ෂපාතී ලෙස ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව.
II. මැතිවරණ කටයුතුවලට අදාළ පැමිණිලි පිළිබඳව අප්‍රමාදව ක්‍රියා කිරීම.
III. ඡන්ද විමසීම තරග කරනු ලබන දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයින් විසින් ඡන්ද විමසීම් ප්‍රචාරණ කාර්යාල පවත්වාගෙන යාම.
IV. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 73 වන වගන්තියට අදාළ කරුණු.
V. මැතිවරණ වැරදි හා මැතිවරණ දූෂණ ක්‍රියා.
VI. ඡන්ද විමසීම් දින ඡන්ද විමසීම් කටයුතුවලට ඇති වන බාධාවන් ඉවත් කිරීම.
VII. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් ක්‍රියාකරන පොලිස් නිලධාරීන්ට වැදගත්වන කරුණු.

දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් නියෝජිතයින් සමග පැවති සාකච්ඡාවලට පොලීසිය සහභාගී වීම

172. ඡන්ද විමසීම සඳහා තරග කළ දේශපාලන පක්ෂවල ලේකම්වරුන් හා ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයන් සමග සාකච්ඡා, මැතිවරණ කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී පවත්වනු ලැබිණි. දිස්ත්‍රික්ක මට්ටමින් මෙවැනි රැස්වීම් පැවතියේ, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් එම නිලධාරීන්ගේ කාර්යාලවල දීය. එම රැස්වීම්වලට ඡන්ද විමසීම් තරග කරන ලද දේශපාලන පක්ෂවල බලයලත් නියෝජිතයන්ට හා ස්වාධීන කණ්ඩායම් නායකයින්ට සහභාගි වීමට ඉඩ සලසා තිබිණි. මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැවති රැස්වීම් සඳහා පොලිස්පතිවරයා හෝ ඔහු නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ/ පරිපාලන) සහභාගී විය. දිස්ත්‍රික් මට්ටමින් පැවති මීට සමාන වූ රැස්වීම්වලට දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරු, පොලිස් අධිකාරීවරු, සහකාර පොලිස් අධිකාරීවරුන් මෙන්ම සමහර අවස්ථාවල දී ඊට පහළ මට්ටම්වල පොලිස් නිලධාරීන් ද සහභාගී වී ඇත.

173. මෙම රැස්වීම් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව නියෝජනය වීම අංශ කිහිපයකින් වැදගත් විය. එම අවස්ථාවල දී පහත දැක්වෙන කරුණු බොහෝ විට සාකච්ඡාවට භාජනය විය.

I. ඡන්ද විමසීම් නීතියට අදාළව දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් නියෝජිතයින්ට දැනගැනීමට අවශ්‍ය කරුණු.
II. මැතිවරණ ප්‍රචාරණ රැස්වීම් පැවැත්වීම සඳහා ආරක්ෂාව ලබාදීම හා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සඳහා අවසර ලබා දීම.
III. තරග කරන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් මැතිවරණ ප්‍රචාරණ කාර්යාල පිහිටුවීම.
IV. මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල දී, පක්ෂවලට, කණ්ඩායම්වලට හා අපේක්ෂකයින්ට සිදුවන අවහිරතා.
V. විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලවල් යෙදීම අවශ්‍ය වන ඡන්ද පොළවල් හා අපේක්ෂකයින්ගේ ආරක්ෂාව.
VI. ඡන්ද විමසීම් කටයුතුවලින් පසු ඡන්ද පෙට්ටි ඡන්ද ගණන් කිරීමේ ස්ථාන කරා රැගෙන ඒමේ දී ආරක්ෂාව සැලසීම.
VII. පොලිස් ස්ථානවල දී පැමිණිලි භාර ගැනීම හා ඒවා සම්බන්ධ පරීක්ෂණ සිදුකිරීම.
VIII. ඡන්ද පොළවල්වල් හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙනුවෙන් ආරක්ෂාව සැලසීම.
IX. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් රජයේ දේපල භාවිතය නතර කිරීම.
X. නීති විරෝධී ප්‍රචාරණ දැන්වීම් පළ කිරීම වැළැක්වීම හා පළ කොට ඇති එවැනි දැන්වීම් ඉවත් කිරීම.
XI. පක්ෂ හා කණ්ඩායම්වල ආධාරකරුවන් යොදාගෙන රථ පෙළපාලි පැවැත්වීම.

174. මෙම රැස්වීම්වල දී අදාළ පක්ෂ හා කණ්ඩායම්වලින් ඉදිරිපත්වන තොරතුරු මගින්, පොලිස් කොට්ඨාස මට්ටමින් මැතිවරණ නීතිය ආරක්ෂා කිරීමට පියවර ගන්නා ආකාරය පිළිබඳව අවබෝධයක්, ප්‍රධාන පෙළේ පොලිස් නිලධාරීන්ට දැනගැනීමට ඉඩ ලැබේ. මැතිවරණ දෙපාර්තමේන්තුවට ද, මැතිවරණ කටයුතු සංවිධානය හා සම්බන්ධ යම් යම් ගැටලු මෙවැනි රැස්වීම් මාර්ගයෙන් විසඳා ගත හැකිය. එසේම ඡන්ද විමසීම් කාලය තුළ පොලිස් දෙපාර්තමේන්තුව මගින් කරවා ගත යුතු වන සේවාවන්වල අඩුපාඩු, දිස්ත්‍රික්කවල ප්‍රධාන පොලිස් නිලධාරීන් වෙත පොලිස්පතිවරයා හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ/ පරිපාලන) මාර්ගයෙන් යොමු කරවා ගැනීමට රැස්වීම්වලට සහභාගී වූ නියෝජිතයින්ට ද අවස්ථාව ලැබිණි.

ඡන්ද විමසීම් කාලය තුළ ඡන්ද විමසීමට අදාළ පැමිණිලි භාර ගැනීම හා පොලීසියේ සහාය ඇතිව පැමිණිලි පිළිබඳව සොයා බැලීමට වැඩපිළිවෙල යෙදීම.

175. ඡන්ද විමසීම්වලට අදාළ නාමයෝජනා භාර ගැනීමේ කාල පරිච්ඡේද ඉකුත්වීමෙන් පසු ඡන්ද විමසීම සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි ලිඛිතව භාර ගෙන, ඒවා පිළිබඳව කරුණු සොයා බලා සුදුසු පියවර ගැනීමට, පැමිණිලි භාර ගැනීමේ ස්ථාන මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයන්හි පිහිටුවන ලදී. මේ පිළිබඳව ඡන්ද විමසීම තරග පාර්ශ්වයන් ද මැතිවරණ නිරීක්ෂණ ආයතන ද මහජනතාව ද දැනුවත් කිරීමට කටයුතු යොදනු ලැබීය. මෙම වැඩපිළිවෙළ පිළිබඳව පුවත්පත් දැන්වීම් මගින් ජනතාව දැනුවත් කරන ලදී. මැතිවරණ මහලේකම් කාර්යාලයේ ඒ වෙනුවෙන් වෙන් වූ දුරකථන පහසුකම් ද ඇති කර, මෙම පැමිණිලි භාර ගැනීමේ ස්ථානවල සේවය සඳහා මාණ්ඩලික නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ මූලිකත්වයෙන් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ද යොදවා තිබිණි. පැමිණිලි පිළිබඳව දිස්ත්‍රික්කවල පිහිටි පොලිස් ස්ථානවලින් පරීක්ෂණ සිදුකොට වාර්තා මැතිවරණ කොමසාරිස්වරයාට ලබා දීම මෙම පොලිස් නිලධාරී කණ්ඩායමේ රාජකාරිය විය.

176. මෙම පැමිණිලි භාර ගැනීමේ වැඩපිළිවෙළ ඡන්ද විමසීම සාර්ථක කර ගැනීමට පහත ආකාරයට හේතු වූ බව ප්‍රකාශ කළ හැකිය.

I. ඡන්ද විමසීම් කාලය තුළ හෝ ඡන්ද විමසීම් දිනයේ කුමන හේතුවක් මත හෝ යමෙකුට කෙලින්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට හෝ මැතිවරණ කොමසාරිස්වරයාට ඡන්ද විමසීමට අදාළව අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු පැමිණිල්ලක් වශයෙන් සලකන ඕනෑම කරුණක්, මෙම වැඩපිළිවෙළ යටතේ මෙම පැමිණිලි භාර ගැනීමේ ස්ථානවලට ඉදිරිපත් කිරීමෙන් එම නිලධාරීන්ගේ අවධානයට අප්‍රමාදව යොමු කළ හැකි වීම.

II. මැතිවරණ නීති කඩවීමක් හෝ පක්ෂවලට, කණ්ඩායම්වලට හෝ අපේක්ෂකයින්ට යම් අසාධාරණයක් සිදුවූ අවස්ථාවක් පැමිණිලි මගින් වාර්තා වී නම්, අදාළ පැමිණිලි භාර ගැනීමේ ස්ථානයේ සේවය කළ පොලිසියේ හා මැතිවරණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ නිලධාරීන් ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු කළ බැවින්, පැමිණිලි පිළිබඳව ක්ෂණිකව අවශ්‍ය පියවර ගැනීමට ඉඩලැබීම.

III. පැමිණිලිවල බරපතලකම සලකා, අවස්ථානුකූලව ගත යුතු පියවර ගැන උපදෙස් ලබා ගැනීමට, මැතිවරණ කොමසාරිස්වරයාට මෙන්ම පොලිස්පතිවරයාට අදාළ පැමිණිලි යොමු කිරීමට මෙම පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථානවලට උපදෙස් දී තිබූ බැවින් පැමිණිලි සම්බන්ධව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට හෝ ප්‍රාදේශීය පොලිස් නිලධාරීන්ට නියෝග නිකුත් කිරීමට අදාළ පරිදි පොලිස්පතිවරයාට හෝ මැතිවරණ කොමසාරිස්වරයාට ඉඩ ලැබීම.

IV. පැමිණිලි ඉදිරිපත් කළ පිරිස්වලට සෑහෙන දුරට අප්‍රමාදව සහන සැලසීමටත්, මැතිවරණ ක්‍රියාවලියේ යම් යම් අඩුපාඩු මගහරවා ගැනීමටත් අවස්ථාව සැලසීම.

V. ඡන්ද විමසීම් දිනයේ, ඡන්ද විමසීමට අදාළව ලැබෙන පැමිණිලි පිළිබඳව තේරීම්භාර නිලධාරීන්ට හා අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයාට දැනුම් දී එම සිදුවීම් පිළිබඳ වාර්තා ලබා ගෙන ඡන්ද පොළවල ඡන්ද විමසීම් ශූන්‍ය කිරීමට අදාළ තීරණ ගැනීමේ පහසුවක් මැතිවරණ කොමසාරිස්වරයාට ඇති වීම.

මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවන ලද මැතිවරණ පැමිණිලි භාරගැනීමේ මධ්‍යස්ථාන

177. පහත සඳහන් ආකාරයට මෙම මධ්‍යස්ථාන, මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි පිහිටුවීමට කටයුතු කරන ලදී.

I. දුරකථන පණිවුඩ, ෆැක්ස් පණිවුඩ ලෙස හෝ ලිඛිතව ලැබෙන පැමිණිලි භාරගෙන ලේඛනගත කිරීම හා පැමිණිලි සම්බන්ධව සොයා බැලීමට අදාළ නිලධාරීන්ට ඒවා යොමු කොට වාර්තා ලබා ගැනීම.

II. අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්, පොලිස්පතිවරයා හෝ රාජ්‍ය ආයතන ප්‍රධානියා මගින් පැමිණිල්ල පිළිබඳව වාර්තා ලබාගෙන, සත්‍යතාවක් ඇති පැමිණිලි පිළිබඳ වගකිවයුත්තන්ට ඒ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ගය මැතිවරණ කොමසාරිස්වරයා විසින් අප්‍රමාදව දැනුම් දීම.

III. දිස්ත්‍රික්කවල පිහිටි මැතිවරණ පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථානවලට හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට හෝ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර තේරීම්භාර නිලධාරීන්ට ලැබුණු පැමිණිලි සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ගය පිළිබඳව, මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් විමසනු ලබන අවස්ථාවල දී, ඒ සම්බන්ධව මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් යැවීම.

දිස්ත්‍රික්කවල හා ප්‍රාදේශීය වශයෙන් පිහිටුවන ලද පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථාන

178. මෙම ඡන්ද විමසීම් වෙනුවෙන් පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථාන දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල හා ප්‍රාදේශීය මට්ටමින් සුදුසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද පිහිටුවා, අවශ්‍ය මග පෙන්වීම් සිදුකොට නිලධාරී මණ්ඩලයක් ඒවා වෙනුවෙන් පත් කිරීමට අවශ්‍ය උපදෙස් තේරීම්භාර නිලධාරීන්ට නිකුත් කර තිබුණි. මෙම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පැමිණිලි භාර ගැනීමේ ස්ථානවල මාණ්ඩලික මට්ටමේ රජයේ නිලධාරියෙකු සමග නිලධාරී මණ්ඩලයක් ද පොලිස් නිලධාරීන් ද සේවයේ යොදවා තිබූණි.

පැමිණිලි ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයන් හා සංවිධාන

179. පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථානවලට, පැමිණිලි ඉදිරිපත් කිරීම පහත සඳහන් පුද්ගලයන් හා සංවිධාන විසින් සිදු කර ඇත.

(1) තරග කළ දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින්.
(2) මැතිවරණ නිරීක්ෂණ සංවිධාන.
(3) වෙනත් සමාජ සංවිධාන.
(4) ඡන්දදායකයින් හා වෙනත් පුද්ගලයින්.

180. මෙම ඡන්ද විමසීමේ දී පහත සඳහන් මැතිවරණ නිරීක්ෂණ ආයතන පැමිණිලි ඉදිරිපත් කිරීමේ දී කැපී පෙනුණි.

I. නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය. (PAFFREL)
අංක 12/3, රොබට් ටෙරස්, රොබට් ගුණවර්ධන මාවත, කොළඹ 06

II. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය. (CaFFE)
අංක 100/19ඒ, වැලිකඩවත්ත පාර, රාජගිරිය.

III. මැතිවරණ නිරීක්ෂණ ජාලය. (NEM)
327/2 ඩී, විජයබා පෙදෙස, ගජබා මාවත, මාකොළ උතුර.

IV. ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය. (NPOC)
195, බේස්ලයින් පාර, කොළඹ 09

V. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය. (CMEV)
24/2, 28 වන පටුමග, මල්පාර යාබද, කොළඹ 07

181. මීට අමතරව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට ලැබෙන පැමිණිලි ද උපදෙස් බලාපොරොත්තුවෙන් ඔවුන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද අවස්ථා ද තිබිණි. තව ද ලංකා ගුරු සංගමය හා ලංකා ජාතික වතු කම්කරු සංගමය වැනි වෘත්තීය සමිති ද, වෙනත් සිවිල් සංවිධාන ද ඡන්ද විමසීම හා සම්බන්ධ පැමිණිලි එවා තිබුණි. සමහර පුද්ගලයින් නිර්ණාමිකව ද පැමිණිලි මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර තිබිණි.

මැතිවරණ කොමසාරිස්වරයා විසින් විශේෂ විමර්ශන නිලධාරීන් යොදවා පැමිණිලි සම්බන්ධව සොයා බැලීම

182. මෙම ඡන්ද විමසීම් අවස්ථාවල දී මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබුණු පැමිණිලි සම්බන්ධව ඔහුගේ සෘජු අධීක්ෂණය යටතේ පහත දැක්වෙන අවස්ථාවල දී විශේෂ විමර්ශන නිලධාරීන් යොදවා සමහර පැමිණිලි පිළිබඳව කරුණු සොයා බලන ලදී.

(අ) සමහර ප්‍රදේශවල අනවසර අන්දමින් මැතිවරණ ප්‍රචාරණය සඳහා දැන්වීම්, විශාල ප්‍රමාණයේ අපේක්ෂක ඡායාරූප ආදිය ප්‍රදර්ශනය කිරීම පිළිබඳව ලද පැමිණිලි අනුව, ඒවා ඉවත් කිරීමට පොලීසියට අවශ්‍ය උපදෙස් ලබා දුන් නමුත් දිගින් දිගටම එවැනි පැමිණිලි ලැබෙන විට, එවැනි පැමිණිලිවල සත්‍යතාව හා පොලිසිය අදාළ උපදෙස් අනුව ක්‍රියා කර ඇත්ද යන්න සොයා බැලීමට අවශ්‍ය වූ විට.

(ආ) පැමිණිලි සම්බන්ධව මැතිවරණ කොමසාරිස්වරයා රජයේ නිලධාරීන්ගෙන් වාර්තා කැඳවූ විට, ඔවුන්ගෙන් ලැබෙන සමහර වාර්තාවල නිවැරදිභාවය සෙවීමට අවශ්‍ය වූ විට.

(ඇ) බරපතල ලෙස මැතිවරණ නීති උල්ලංඝනයක් වී ඇති බව පැමිණිල්ලක් මගින් දක්වා ඇති අවස්ථාවක.

මැතිවරණ කොමසාරිස්වරයාට හා තේරීම්භාර නිලධාරීන්ට ලැබුණු පැමිණිලිවල ස්වභාවය

183. මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථානයට හා දිස්ත්‍රික්කවල පිහිටුවා තිබූ එවැනි මධ්‍යස්ථානවලට, ඡන්ද විමසීමේ දිනට පෙර මැතිවරණයට අදාළව ලැබුණු පැමිණිලිවල ස්වභාවය අනුව පහත ආකාරයට ඒවා වෙන්කර දැක්විය හැකිය.

මැතිවරණ නීති උල්ලංඝනය කිරීම: නීති විරෝධී මැතිවරණ දැන්වීම් ප්‍රදර්ශනය

184. පළාත් සභා ඡන්ද විමසීම් නීතිය අනුව ප්‍රචාරණ දැන්වීම්, නාමයෝජනා කාලය ඉකුත් වූ පසු සහ ඡන්ද විමසීමේ දිනයට පැය 48කට කලින් වූ කාලය දක්වා ප්‍රදර්ශනය කළ හැකිය. එසේ ප්‍රදර්ශනය කළ හැකි වන්නේ, නීත්‍යානුකූලව පැවැත්වෙන මැතිවරණ ප්‍රචාරණ රැස්වීම් භූමියක් තුළ දී, එම රැස්වීම් පැවැත්වෙන කාලයේ දී ය. ඊට අමතරව මැතිවරණ නීතියට අදාළවන පරිදි පිහිටුවාගෙන ඇති නිවේදනය කරන ලද ඡන්ද කාර්යාලවල දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයින්ට අනුකූලවන පරිදි දැන්වීම් ප්‍රදර්ශනයට මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඉඩ ලබා දී ඇත. ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන අපේක්ෂකයකු ගෙන යාම සඳහා පාවිච්චි කරනු ලබන වාහනයක් තුළ හෝ වාහනයක ද දැන්වීමක්, ඡායා රූපයක් හෝ ලකුණක් ප්‍රදර්ශනය කළ හැකිය.

185. එහෙත් ඉහත දක්වන ලද නීත්‍යානුකූල ආකාරයට නොවන පරිදි ඡන්ද විමසීම් කාලය තුළ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම, වත්මන් මැතිවරණ ක්‍රියාවලියෙහි එළිපිටම සිදුවන, ප්‍රචලිත මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් හැටියට පෙන්වා දිය හැකිය. මෙවර පළාත් සභා ඡන්ද විමසීම්වල දී පහත ආකාරයට නීති විරෝධී වූ දැන්වීම් ප්‍රදර්ශනය වූ බවට කරුණු හෙළි වී ඇත.

- අවසරලත් රැස්වීම් භූමිවලින් පිටත රැස්වීම් නොපැවැත්වෙන අවස්ථාවල දී, මහජනයා ගැවසෙන ප්‍රධාන මාර්ග දෙපස දැන්වීම් පළ කිරීම.

- අපේක්ෂකයා ගමන් නොකරන වෙනත් මැතිවරණ ප්‍රචාරණයේ යෙදෙන වාහනවල අපේක්ෂක ඡායාරූප හා දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.
- සාමාන්‍ය මෝටර් රථ ප්‍රවාහන නීති උල්ලංඝනය කරමින් වාහනවල වීදුරුද ආවරණය වන පරිදි දැන්වීම් අළවා ප්‍රචාරය කිරීම.
- රජයේ හා පෞද්ගලික මගී ප්‍රවාහන බස් රථවල දැන්වීම් ප්‍රචාරණය.
- රජයට අයත් භූමිභාගවල හා ගොඩනැගිලිවල දැන්වීම් ප්‍රචාරණය.
- වාහන පදවන රියදුරන්ගේ දර්ශන පථයට ද බාධාවන ආකාරයට ප්‍රධාන මහා මාර්ගය මතුපිට තීන්ත ආලේප කරමින් දැන්වීම් ලියා ප්‍රදර්ශනය කිරීම.
- මහා මාර්ග හරහා කොඩිවැල් ඇදීම.

186. මෙවැනි නීත්‍යානුකූල නොවන ආකාරයේ දැන්වීම් අදාළ ස්ථානවලින් ඉවත් කිරීම, පොලිසිය මාර්ග යෙන් සිදු කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් පොලිසිය වෙත ශ්‍රමිකයන් ලබා ගැනීමට මූල්‍ය ප්‍රතිපාදන ද සපයනු ලැබීය. ඊට අමතරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීමට අදාළව දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජිතයින් සමග පවත්වන ලද රැස්වීම්වල දී ද, නීති විරෝධී දැන්වීම් පළ කිරීම වැළැක්වීමේ අවශ්‍යතාව ද ඒවා ඉවත් කිරීමට දැරීමට සිදුවී ඇති වියදම හා මහන්සිය පිළිබඳව ද නියෝජිතයින්ට කරුණු පැහැදිලි කර දී ඇත.

187. නීති විරෝධී මැතිවරණ දැන්වීම් ඉවත් කිරීමේ කටයුතු සමහර ඡන්ද විමසීම් ප්‍රදේශවල උදාසීන අන්දමින් සිදු කිරීම පිළිබඳව ලද පැමිණිලි මත, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ වෙනුවෙන් දිස්ත්‍රික්කවල පොලිස් නිලධාරීන්ගේද සහාය ඇතිව කටයුතු කිරීමට, සහකාර තේරීම්භාර නිලධාරීන් කීප දෙනෙකුගෙන් යුත් නිලධාරී කණ්ඩායම් ද වරින් වර යොදවන ලදී. සමහර අවස්ථාවල දී බස් රථ හෝ වෙනත් වාහනවලින් මෙවැනි දැන්වීම් ඉවත් කිරීමට කටයුතු කළ පොලිස් නිලධාරීන්ට හා රජයේ නිලධාරීන්ට විවිධාකාර ගැටළුවලට ද මුහුණපෑමට සිදු වූ බව මැතිවරණ කොමසාරිස්වරයාට වාර්තා වී තිබුණි.

188. දේශපාලන පක්ෂ මෙන්ම මැතිවරණ නිරීක්ෂණ ආයතන හා සිවිල් සංවිධාන ද මෙවැනි නීතිවිරෝධී දැන්වීම් ප්‍රචාරණය වන අවස්ථා පිළිබඳව මැතිවරණ කොමාසරිස්වරයාට දැන් වූ අවස්ථාවල දී ඒවා ඉවත් කිරීමට අදාළ ප්‍රදේශවල ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ට නියෝග කිරීමටත්, ඒවා ඉවත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පොලිස් ස්ථානවලින් වාර්තා ලබා ගැනීමටත්, මැතිවරණ මහලේකම් කාර්යාලයේ පිහිටි පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථානය කටයුතු කළ අතර, මෙම කටයුතු වල ප්‍රගතිය නිරන්තරයෙන් මැතිවරණ කොමසාරිස්වරයාගේ අවධානයට යොමු කිරීමට ද මෙම මධ්‍යස්ථානයට උපදෙස් දී තිබිණි.

මැතිවරණ නීති උල්ලංඝනය කිරීම: නීති විරෝධී රැස්වීම් පැවැත්වීම හා අනවසර පෙළපාලි/ පෙරහැර පැවැත්වීම

189. ඡන්ද විමසීම් තරග කරන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට තම පක්ෂය හෝ කණ්ඩායම ද, අපේක්ෂකයින් ද ජයග්‍රහණය කරා මෙහෙය වීමට ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය වන අතර, එය පළාත් සභා ඡන්ද විමසීම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුගතව සිදු විය යුතුය. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 70 වන වගන්තිය අනුව, ඡන්ද විමසීම් දිනයට පැය 48 කට කලින්ආරම්භ වී, තේරීම්භාර නිලධාරියා විසින්, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් සතියකට පසුව අවසන් වන කාලසීමාව ඇතුළත, අදාළ පරිපාලන දිස්ත්‍රික්කයක් තුළ කිසිම ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්විය නොහැකිය.

190. නාමයෝජනා කාලය ඉකුත්වීමෙන් පසු මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් රැස්වීම් සඳහා පොදු ස්ථාන, හෝ පෞද්ගලික ස්ථාන ඒවායේ අයිතිකරුවන්ගේ එකඟත්වය මත ලබාගෙන, රැස්වීම් සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතාව වෙනුවෙන් අදාළ පොලිස් ස්ථානයෙන් අවසරද ගෙන නීත්‍යානුකූල රැස්වීම් පැවැත්වීම් සඳහා කටයුතු කළ යුතුය. මෙවැනි රැස්වීම් සඳහා ආරක්ෂාව සැලසීමේ වගකීම ප්‍රාදේශීය මට්ටමේ පොලිස් ස්ථානවලට පැවරේ.

191. ඉහත සඳහන් ආකාරයකට නොමැතිව, දේශපාලන අයිතිවාසිකම් නොමැති රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් හා සාම නිලධාරීන් ගණයට අයත්වන ග්‍රාම නිලධාරීන් වැනි අය දේශපාලන අරමුණු ඇතිව, රැස්වීම් සඳහා කැඳවීම ද, වෙනත් රාජ්‍ය සේවකයින් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරී කාලය තුළ එවැනි රැස්වීම් සඳහා කැඳවීමට ගත් උත්සාහයන් ගැන ද වාර්තා වූ අතර, එවැනි සිද්ධීන් නීති විරෝධී බව කිව යුතුය. ඊට අමතරව විසුරුවා ඇති පළාත් සභාවල හිටපු අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් නැවත අපේක්ෂකයන් වශයෙන් ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව, ඔවුන් අඳුනන පළාත් සභාවල සේවය කරනු ලබන ඉහළ මට්ටමේ නිලධාරීන් මාර්ගයෙන්, රජයේ නිලධාරීන්ගේ හා මහජනතාවගේ අනුග්‍රහය තමා වෙත ලබා ගැනීම සඳහා, රැස්වීම් පැවැත්වීමට කටයුතු

කළ අවස්ථා පිළිබඳව ද වාර්තා විය. එවැනි රැස්වීම්, කිසිප ආකාරයකින්ම නීතිවිරෝධී හා රජයේ නීති රීති උල්ලංඝනය කළ ඒවා වශයෙන් හැඳින්විය හැකිය.

192. මධ්‍යම රජයේ බලය පවත්නා දේශපාලන පක්ෂවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා අමාත්‍යවරුන්ට පළාත් සභාවලට තම පක්ෂයෙන් ඉදිරිපත් වී ඇති අපේක්ෂකයින් ජයග්‍රහණය කරවීම සඳහා, දේශපාලන ප්‍රචාරණ ව්‍යාපාරයේ වගකීම පක්ෂය විසින් පවරා ඇති අවස්ථාවල, සිය නිල බලය යොදා අදාළ පළාත්වල නිලධාරීන්, රජයේ රාජකාරියකට මෙන් කැඳවා, රැස්වීම් පවත්වා තම පක්ෂයේ අපේක්ෂකයන්ට සහාය දක්වන ලෙස ඉල්ලා සිටින අවස්ථා ද විය. මෙවැනි දේශපාලන බලවතුන්ගේ දැන්වීම් මත ප්‍රාදේශීය මට්ටමේ යම් යම් නිලධාරීන්, රාජකාරී කාලය තුළ රැස්වීම් සඳහා කැඳවා, ඔවුන්ගේ සහාය තම පක්ෂයේ අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය වෙනුනේ ලබා ගැනීමටත්, සමහර අවස්ථාවල දී නිලධාරීන්ගේ රාජකාරී කටයුතු මාර්ග යෙන් ඡන්දදායකයන්ට බලපෑම් කිරීමටත් උත්සාහ ගත් අවස්ථා පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාට වාර්තා වී ඇත.

193. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 69 වන වගන්තිය අනුව වෙනත් ඡන්ද විමසීම්වල දී මෙන්ම ඡන්ද විමසීම් කාලසීමාව තුළ එනම් නාමයෝජනා කාලසීමාවේ, පළමුවන දින සිට ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර සතියක් ගතවන තුරු මැයි දිනයේ දී පවතිනු ලබන පෙරහැරක් හෝ ආගමික/ සමාජීය කරුණු සඳහා පවත්වන පෙරහැරක් හැර වෙනත් පෙරහැරක් පැවැත්වීමට, මෙහෙයවීම, සහභාගීවීම දඬුවම් ලැබිය හැකි වරදක් වේ.

194. එසේ වුව ද මෙම ඡන්ද විමසීමේ දී නාමයෝජනා භාර ගැනීමේ අවසන් දිනයේ දී සමහර දිස්ත්‍රික්කවල රථ පෙළපාලි හා මහජන පෙළපාලි පැවත්වූ බව වාර්තාවී තිබේ.

195. නාමයෝජනා භාර දීමට පැමිණීමේදී රථ පෙළපාලි සේ පැමිණීම සෑම දිස්ත්‍රික්කයකින්ම වාර්තා වුව ද නාමයෝජනා භාර දීමෙන් අනතුරුව මාතලේ, මහනුවර, කුරුණෑගල, කිලිනොච්චිය, කොළඹ, ගම්පහ හා ගාල්ල දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරී කාර්යාල ඉදිරිපිට හෝ ප්‍රධාන නගරය තුළ හෝ මහජන නැතහොත් රථ පෙළපාලි පැවැත්වීම පිළිබඳව වාර්තාවීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. එම දිස්ත්‍රික්කවල වෙනත් ප්‍රදේශවල ද මේ අනීතික ක්‍රියාකාරකම් වාර්තාවූ අතර කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු කොළඹ, රත්මලාන, කඩුවෙල, හෝමාගම හා කැස්බෑව යන ප්‍රදේශවල ද ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව, මිනුවන්ගොඩ, දිවුලපිටිය, අත්තගල්ල යන ප්‍රදේශවල ද ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල, බද්දේගම හා හිනිදුම ප්‍රදේශවල ද මහජන හා රථ පෙළපාලි පැවැත්වූ බව වාර්තා වී තිබේ. තවද නාමයෝජනා භාරදුන් දිනයේ හෝ එයට පසුදින අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෛයිපත්තු, මරුදමුනෙයි යන ප්‍රදේශවල ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කදුරුවෙල ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ප්‍රදේශයේ ද රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ලේ හා කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ද නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන් හා කොටගල ප්‍රදේශවල ද පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රදේශයේ ද කළුතර දිස්ත්‍රික්කයේ පයාගල, බේරුවල, අලුත්ගම හා මතුගම ප්‍රදේශවල ද මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය, දෙනියාය ප්‍රදේශවල ද හම්බන්තොට දිස්ත්‍රික්කයේ මිරිජ්ජවිල, තංගල්ල යන ප්‍රදේශවල ද නාමයෝජනා දින මහජන හා රථ පෙළපාලි පැවැත්වූ බවට පැමිණිලි ලැබී තිබිණ.

196. නාමයෝජනා භාර ගැනීමේ අවසන් දින කොළඹ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී කාර්යාලය ඉදිරිපිට ප්‍රබල ලෙස සංවිධානය කරන ලද පෙරහැරක් පැවැත්වීම සම්බන්ධයෙන් විමසීමේ දී එකී පෙළපාලිය මෙහෙය වූ දේශපාලනඥයින් එය වරදක් නොවන බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම විමතියට කරුණකි. එමෙන්ම කොළඹ තේරීම්භාර නිලධාරී කාර්යාලය ඉදිරිපිට මේ අනීතික ක්‍රියා සිදු කළ තැනැත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ලෙස පොලිස්පතිවරයාට හා කොළඹ නගරය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ට කිහිප වතාවක් දැනුම් දී තිබිය දී ඒ දේශපාලඥයින් සම්බන්ධයෙන් කඩිනම්, ඵලදායී ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි වීම කණගාටුවට කරුණකි. එසේවුවත් ගම්පහ දිස්ත්‍රික්කයේ අනවසර පෙළපාලියක් පැවැත්වීමට කටයුතු කළ දේශපාලනඥයකුට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රයත්න දැරීම පිළිබඳව අදාළ පොලිස් නිලධාරීන්ට මැතිවරණ දෙපාර්තමේන්තුවේ ප්‍රශංසාව හිමිවේ. කෙසේ වුව ද එදිනෙන් පසු මෙවැනි අනීතික ක්‍රියා පැවැත්වීම වැලැක්වීමට පොලිස්පතිවරයා හා මැතිවරණ විෂය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ක්ෂේත්‍රයේ රාජකාරී කරන නිලධාරීන්ට හා ඔවුන්ගේ අධීක්ෂණ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් නිකුත් කරනු ලදුව තත්ත්වය පාලනය කර ගැනීමට හැකි විය. එසේ වුවත් නාමයෝජනා භාර ගැනීමේ අවසන් දින බදුල්ල- මහියංගන මාර්ගයේ දැවැන්ත රථ පෙළපාලියක් පවත්වා තිබූ අතර එයට එරෙහිව ක්‍රියා කිරීමට තැත් කළ මැතිවරණ නිලධාරීන්ට බරපතල අපහසුතාවලට මුහුණ දීමට සිදුවිය. මේ පිළිබඳව වැඩිදුර කරුණු 351 ඡේදයේ දක්වා ඇත.

197. උතුරු මැද පළාතේ පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වූ 2012 වර්ෂයේ දී ඡන්ද විමසීම් කාලසීමාව තුළ අ.පොස උසස් පෙළ විභාගය පැවැත්වෙන අතරතුර අනුරාධපුර නගරයේ විභාග ශාලා පිහිටුවා තිබූ පාඨශාලා පිහිටි ප්‍රදේශය හරහා මහජන පෙළපාලි මගින් රැස්වීම් භූමියට ස්වකීය ආධාරකරුවන් රැගෙන යාමට එකී දිස්ත්‍රික් කණ්ඩායම් නායකයා ඇතුළු අපේක්ෂයන් කිහිපදෙනෙකු ක්‍රියා කර තිබුණි. මහනුවර දිස්ත්‍රික්කයේ නාමයෝජනා භාර දුන් දිනයේ දී ආණ්ඩුවේ ඉහළම නිලයක් හෙබවූ දේශපාලනඥයකුගේ ආරක්ෂක නිලධාරීන්ගේ සහභාගීත්වය නැතහොත් ආරක්ෂාව ඇතිව රථ පෙළපාලියක් මහනුවර නගරයේ පැවැත්වූ බව වාර්තා වී ඇත.

198. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අරලගංවිල ප්‍රදේශයේ සිට පොළොන්නරුව - මඩකලපුව මහා මාර්ග යට ට්‍රැක්ටර්, යතුරු පැදි හා පාපැදිවලින් ද පාගමනින් ද දැවැන්ත පෙළපාලියකින් පැමිණීමේ සුදානමක් ඇති බවට ලද පැමිණිලි සම්බන්ධයෙන් සොයා බැලීමෙන් අනතුරුව එකී පෙළපාලිය වැලැක්වීමට පොලිස් නිලධාරීන්ට හා මැතිවරණ බලධාරීන්ට ඉමහත් වෙහෙසක් දැරීමට සිදු විය. මේ සඳහා පොළොන්නරුව සහකාර කොමසාරිස්වරයාට ද ක්ෂේත්‍රයට යෑමට සිදු වූ අතර මේ තත්ත්වය අදාළ පක්ෂයේ ඉහළ නායකත්වයට ද වාර්තා කරන ලදී. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ දී නුවරඑළිය නාගරික වෙළඳපොලේ ඡන්දය ආයචනා කිරීමේ කාර්යයේ යෙදමින් සිටි පිළිගත් දේශපාලන පක්ෂයක ආධාරකරුවන් හා අපේක්ෂකයන් අමාත්‍යවරයෙකුගේ මෙහෙයවීමෙන් නගරයේ පෙළපාලියක් පවත්වනු ලැබ තිබේ. එමෙන්ම මොණරාගල දිස්ත්‍රික්කයේ හා බදුල්ල දිස්ත්‍රික්කයේ ඩිපෙන්ඩර් ජීප්රථ සහ එවැනි කැපීපෙනෙන වාහනවලින් සමන්විත රථ පෙළපාලි එකී දිස්ත්‍රික්කවල නගර, ගම්, නියම්ගම්වල සැරිසැරීම සුලභ දර්ශනයක් වී තිබුණි.

199. කුරුණෑගල දිස්ත්‍රික්කයේ තවත් පිළිගත් දේශපාලන පක්ෂයක නායකයා සහභාගි වූ අවසන් මහා රැළියේ දී රාජ්‍ය බලය ප්‍රදර්ශනය කෙරෙන අයුරින් මහජන පෙළපාලිවලින් ජනතාව රැස්වීම් භූමියට කැඳවනු ලැබ තිබේ.

200. මේ පිළිබඳව පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් දැනුවත් කරමින් ඡන්ද විමසීම් කාලසීමාව තුළ පෙරහැර/ පෙළපාලි පැවැත්වීම සිමාකිරීමේ නීතියට අනුව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව පෙන්වාදී තිබේ. විශේෂයෙන්ම පක්ෂ නායකින් සහභාගීවන අවසන් මහා රැස්වීම්වලට ජනතාව පෙළපාලිවලින් කැඳවාගෙන ඒමේ සංස්කෘතිය වෙනස් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව අවධාරණය කරන ලදී.

201. එසේවුවත් ප්‍රාදේශීය හා පළාත් බද දේශපාලන බලධාරීන් ස්වකීය ශක්තිය පෙන්විම් වස් පවත්වනු ලබන මෙවැනි පෙළපාලි පැවැත්වීම සම්පූර්ණයෙන්ම පාලනය කිරීමට නොහැකි වී තිබේ.

202. මෙම තත්ත්වය පාලනය කිරීමට අපහසු වීමට හේතුවක් වන්නේ මෙම නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට නීතිපතිවරයාගේ අනුමැතිය අවශ්‍යවීමයි. නීතිපතිවරයා උපදෙස් ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් ගතවන බැවින් ඒ පිළිබඳව ඇති උනන්දුව හීනවේ.

203. තවද නීතිය ක්‍රියාත්මක කිරීමෙන් හෝ පොලිසියේ අධිපාලනයකින් හෝ පමණක් මේ අනීතික ක්‍රියාව වැලැක්වීම අපහසුය. ඒ සඳහා දේශපාලන පක්ෂ නායකයින්ගේ, ප්‍රමුඛ නිලධාරීන් හා ක්‍රියාකාරීන්ගේ හා පක්ෂ ආධාරකරුවන්ගේ සහාය අත්‍යාවශ්‍යය. එමෙන්ම මෙවැනි ක්‍රියා නීති විරෝධී බව ජනතාව දැනුම්වත් කිරීමේ පුළුල් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අත්‍යාවශ්‍යය.

මැතිවරණ නීති උල්ලංඝනය කිරීම්: නීති විරෝධී ඡන්ද විමසීම් කාර්යාල පිහිටුවීම

204. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 73 වගන්තියේ, පරිපාලන දිස්ත්‍රික්කයක පැවැත්වෙන යම් ඡන්ද විමසීමක දී බලයලත් නියෝජිතයෙකුට, ස්වාධීන කණ්ඩායම් නායකයෙකුට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට, ඡන්ද විමසීමේ දිනයට පසු දින දක්වා පවත්වාගෙන යා හැකි ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වූ කාර්යාල ද පිහිටුවිය හැකි ආකාරය පිළිබඳව දැක්වේ. මෙම කාර්යාල පිහිටුවීමට බලය ඇති අය විසින්, කාර්යාලයක් පිහිටුවීමෙන් පසු ඒ පිළිබඳව අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරිවරයාට හා කාර්යාලය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති වෙත නිවේදනය කළ යුතු වේ.

205. මෙම කාර්යාල පිහිටුවා පවත්වාගෙන යායුතු ආකාරය දැක්වෙන වෙනත් විශේෂ නීතිමය විධි විධානයක් අදාළ ඡන්ද විමසීම් පනතේ දක්වා නොමැති වුව ද, ඒ පිළිබඳව අදාළ පාර්ශ්වයන්ට මෙන්ම සමහර අවස්ථාවල දී පොලිස් නිලධාරීන්ට ද ගැටලු ඇති වන බවට, මැතිවරණ දෙපාර්තමේන්තුවට හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට පෙනීයාමෙන් පසු ඒ පිළිබඳව පක්ෂවලට හා කණ්ඩායම්වලට ලිඛිතව මග පෙන්වා ඇත. පිහිටුවන ලද පක්ෂ කාර්යාල පිළිබඳව අදාළ නිවේදන කිරීමට පෝරම ද මැතිවරණ කොමසාරිස්වරයා හඳුන්වා දෙන ලදී. ඊට අමතරව ඡන්ද විමසීමට අදාළව පොලිස් නිලධාරීන් වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාවට ද ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ඇතුළත් කර ඇත.

206. එසේ වුව ද සමහර අවස්ථාවල දී අදාළ පොලිස් ස්ථානයට හෝ තේරීම්භාර නිලධාරීට නිවේදනය නොකොට ඡන්ද විමසීමේ කාර්යාල පවත්වාගෙන යාම, රජයේ ගොඩනැගිලිවල හෝ රජයේ ඉඩම්වල බලයේ සිටින දේශපාලන පක්ෂවල අපේක්ෂකයන් වෙනුවෙන් ප්‍රචාරණ කාර්යාල පවත්වාගෙන යාම හා වෙනත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයින් වෙනුවෙන් කාර්යාල පවත්වාගෙන යාම ආදී අවස්ථා පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා හා තේරීම්භාර නිලධාරීන් වෙත වාර්තා වී ඇත. එබඳු පැමිණිලි හෝ වාර්තා සම්බන්ධයෙන් ඒකාකාරී ලෙස ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව ද සැලකිල්ලට ගනිමින් එබඳු නීත්‍යානුකූල නොවන කටයුතු සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගන්නා ලදී.

මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් : ඡන්දදායකයින්ට බලපෑම් කිරීම

207. පළාත් සභා ඡන්ද විමසීමක දී යමෙකුට ඡන්දය දීමට හෝ දීමෙන් වැළකී සිටීමට ඒ තැනැත්තා පෙළඹවීම හෝ, බල කිරීම, අයුතු බලපෑමේ වරද වශයෙන් ඡන්ද විමසීම් නීතියේ දැක්වේ. එසේම එවැනි පෙළඹවීමක් සඳහා යමෙකු විසින් සෘජුවම හෝ අන් අයුරකින් වටිනා දෙයක්, ණයක්, තනතුරක්, සේවා නියුක්තියක් ලබා දීම ද අල්ලස් වරදක් වේ.

208. මෙවර පළාත් සභා ඡන්ද විමසීම්වලට අදාළව, මැතිවරණ කොමසාරිස්වරයාට ලැබුණු පැමිණිලි පරීක්ෂා කිරීමේදී, ඡන්ද විමසීමට ඉදිරිපත් වූ සමහර දේශපාලන පක්ෂවල පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන් ඡන්දදායකයාට බලපෑම් කිරීමට උත්සාහ ගත් අවස්ථා ගැන තොරතුරු ලැබී තිබිණි. පළාත් සභා විසුරුවා හැර තිබුණ ද පළාත් සභාවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහාය ඇතිව, පළාත් සභා විසින් යම් යම් සහනාධාර ක්‍රම යටතේ සුදුසුකම් අනුව ජන කොටස්වලට බෙදා දීම සඳහා ගෙන්වා තිබූ බඩු බාහිරාදිය, පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂයන්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ඡන්ද විමසීම් කාලය තුළ ඡන්දදායකයින් වෙත බෙදා දීමට ගත් උත්සාහයන් පිළිබඳව පැමිණිලි ලැබිණි.

209. මධ්‍යම රජයේ හා පළාත් සභාවල විවිධ වැඩසටහන් යටතේ සමාජයේ දුගී බව අඩු කිරීම, ස්වයං රැකියා වෙනුවෙන් දිරි දිම් කිරීම හා සමාජ සුභ සාධනය වෙනුවෙන් සහනාධාර සැපයීම යනාදී වශයෙන් යම් යම් සමාජ සුභසාධනය අරමුණු කරගත් සහනාධාර වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කෙරේ. එබඳු ව්‍යාපෘති වෙනුවෙන් වාර්ෂිකව සුදුසු සේවාලාභීන් හඳුනාගෙන අදාළ ප්‍රදානයන් සිදු කළ යුතු ය. එහෙත් පළාත් සභා විසුරුවාලීමෙන් පසු මෙවැනි ව්‍යාපෘති වෙනුවෙන් ගබඩා කොට ඇති භාණ්ඩ, ඡන්දදායකයින්ට බලපෑම් කිරීම සඳහාත්, අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහාත් ඡන්ද විමසීම් කාලය තුළ යොදා ගැනීම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමකි.

රාජ්‍ය දේපල අනිසි ලෙස භාවිතා කිරීම : රජයේ වාහන මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා අනිසි ලෙස යොදවා ගැනීම

210. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනයෙන් හඳුන්වා දෙන ලද නව ව්‍යවස්ථාවන් අනුව, ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී රජයේ දේපළ ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව ඇති කිසිදු දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ එවැනි පක්ෂයක, කණ්ඩායමක අපේක්ෂකයෙකුට වාසියක් හෝ අගතියක් වන ආකාරයට භාවිතා කිරීම තහනම් කිරීමේ බලයක් මැතිවරණ කොමසාරිස්වරයාට ඇත.

211. රාජ්‍ය දේපල අයිතිකරුවන් වශයෙන්, ඒවා පාලනය කිරීමේ වගකීම හා බලතල ඒවායේ භාරකරුවන් වන, අමාත්‍යාංශ ලේකම්වරු, රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් හා රාජ්‍ය ආයතන ප්‍රධානීන් සතු වන අතර, ඒ ඒ අමාත්‍යාංශ හා අදාළ රාජ්‍ය ආයතන සතු දේපල, සිය රාජකාරී කටයුතු වෙනුවෙන් පරිපාලනයේ වගකීම ඔවුන්ට පැවරේ. අමාත්‍යාංශ ලේකම්වරුන්ට ඉහළින් අමාත්‍යාංශ භාරව සිටිනුයේ විෂය භාර ඇමතිවරුන්ය. මධ්‍යම රජය යටතේ මෙන්ම පළාත් සභා යටතේ ද අමාත්‍යවරු කටයුතු කරති. රජයේ වාහන, ගොඩනැගිලි ආදිය පාර්ලිමේන්තු බලය උසුලන මහජන නියෝජිතයින් විසින් තම දේශපාලන පක්ෂයෙන් පළාත් සභා වෙනුවෙන් තරග කරන අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය තහවුරු කර ගැනීම සඳහා විවිධාකාරයෙන් භාවිතා කරනු ලැබීම වත්මන් මැතිවරණ ක්‍රියාදාමය තුළ නීතිය උල්ලංඝනය කෙරෙන ප්‍රධාන මාර්ගයක් බව පෙනේ. පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මැති ඇමතිවරුන්ට පළාත් සභා ඡන්ද විමසීමේ දී තරග වැදී සිටින තම පක්ෂයේ අපේක්ෂකයන්ගේ ජයග්‍රහණය ළඟා කර දීමට පක්ෂ නායකත්වය විසින් පවරන වගකීම ඉටු කිරීම, පක්ෂය තුළ තමාගේ පැවැත්ම ද ස්ථාවර කර ගැනීමට ලැබෙන අවකාශයක් කොට සලකමින් තම නිල බලය මෙන්ම වරප්‍රසාද ද ප්‍රයෝජනයට ගනිමින් අනිසි ලෙස රජයේ දේපල මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් මහජන නියෝජිතයින් විසින් යොදා ගනු ලබන බව ඡන්ද විමසීම් කාලය තුළ මැතිවරණ කොමසාරිස්වරයාට මෙන්ම තේරීම්භාර නිලධාරීන්ට ලැබෙන පැමිණිලි හා මාධ්‍ය තුළ පළ වූ ප්‍රවෘත්ති මගින් ද පැහැදැලි වේ.

මෙම තත්ත්වය තවත් උග්‍ර වී ඇත්තේ පළාත් සභා වෙනුවෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මැති ඇමතිවරුන්ගේ කිට්ටුම ඥාතීන් තරග කරනු ලබන විටය. සමහර රාජ්‍ය සංස්ථාවලට සම්බන්ධතා තිබූ නිලධාරියෙකු මෙවැනි ඡන්ද විමසීමක දී තරග කරන්නේ නම්, තමා සේවය කළ සංස්ථාවේ වාහන හා වෙනත් වරප්‍රසාද ලබා ගනිමින් තම ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කරනු දක්නට ලැබේ. වංචනික ලියාපදිංචි අංක යොදාගත් හෝ එසේ නොමැතිනම් කිසිදු ලියාපදිංචි අංකයක් නොමැතිව මෙවැනි වාහන මගින් බොහෝ අවස්ථාවල දී මැතිවරණ ප්‍රචාරණ කටයුතු කරන හෙයින් සත්‍ය වශයෙන්ම පොලිස් නිලධාරීන්ගේ සහයෝගයක් නොමැතිව මෙවැනි වාහන සාමාන්‍ය සිවිල් නිලධාරීන්ට සොයා ගැනීම අසීරුය. ඉතාමත් සංවිධානාත්මක ලෙස සිදුවන මෙම නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධව ඡන්ද විමසීම් කාලය තුළ නොයෙකුත් පැමිණිලි මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබී ඇත. පොලිසියේ සමහර නිලධාරීන් මෙවැනි ක්‍රියා මැඩීමට ඉදිරිපත් නොවීම කෙරෙහි විශාල අප්‍රසාදයක් ඡන්ද විමසීම් කාලය තුළ නොයෙකුත් දේශපාලන පක්ෂවලින් හා සිවිල් සංවිධානවලින් ද පළ විය.

රජයේ දේපල අනිසි ලෙස භාවිතා කිරීම : රජයට අයත් ගොඩනැගිලි ආදිය මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් යොදා ගැනීම

212. ඡන්ද විමසීම් වෙනුවෙන් පළාත් සභා විසුරුවා හැරීමත් සමග ඒවායේ මහ ඇමතිවරුන් හා අනෙකුත් ඇමතිවරුන් සිය නිල නිවාස අත්හැර ඒවා අදාළ සභාව වෙත භාර දීම නීත්‍යානුකූලව සිදුවිය යුතුය. එහෙත් මෙවර පළාත් සභා ඡන්ද විමසීම ආරම්භයේ දීම මෙම මහජන නියෝජිතයින්ට, ඔවුන් විසින් භාවිතා කරන ලද නිල නිවාස සහ නිල වාහන ඔවුන්ගේ සහ ඔවුන්ගේ පක්ෂවල ඡන්ද ව්‍යාපාරය වෙනුවෙන් භාවිතා කිරීම වළක්වාලීම සඳහා ඒවා අදාළ සභා ලේකම්වරු වෙත භාර දීම සඳහා ක්‍රියා කළ යුතු බව අපේක්ෂකයින් වෙත දැනුම් දීමට මැතිවරණ කොමසාරිස්වරයාට සිදුවිය. එසේ දැනුම් දීමෙන් අනතුරුව පමණක් එම රාජ්‍ය දේපල භාරකරුවන් වූ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු මැතිවරණ කොමසාරිස්වරයාගේ දැනුම් දීම ද ඉදිරිපත් කොට, මෙම කරුණු පිළිබඳව හිටපු මහ ඇමතිවරුන්ට සහ අමාත්‍යවරුන්ට සිහිපත් කිරීමට ලිපි යැවීමෙන් පැහැදිලි වන්නේ, මෙවැනි කරුණු සම්බන්ධව මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිහිපත් කරන තෙක් එම නිලධාරීන් නිහඬතාවක් දක්වා ඇති බවයි.

213. පළාත් සභා හා මධ්‍යම රජය යටතේ ද පවත්නා නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ පාලනය වන නිවාඩු නිකේතන හා සංචාරක බංගලා, ඡන්ද විමසීම් කාලය තුළ දේශපාලන පක්ෂවල කටයුතු වෙනුවෙන් අමාත්‍යවරුන් වෙත වෙන්කරවා ගැනීම පිළිබඳ අවස්ථා කිහිපයක දීම පැමිණිලි ලැබිණි. අමාත්‍යාංශයක් යටතේ වන එවැනි සංචාරක බංගලාවක් අමාත්‍යවරයාට වෙන් කර දීමට ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කිරීම සාමාන්‍ය තත්ත්වයක් වුව ද, ඒ ඒ ප්‍රදේශවල මැතිවරණ ව්‍යාපාර මෙහෙයවීම සඳහා දේශපාලන පක්ෂය විසින් පත්කර ඇති පක්ෂයේ ප්‍රධාන පෙළේ දේශපාලනඥයින්ට එම මැතිවරණ ව්‍යාපාරය මෙහෙයවීම සඳහා ඒවා දීර්ඝ කාලයකට වෙන් කර දීම සුදුසු නොවේ. එවැනි බංගලා අමාත්‍යවරයෙකුට නිල වශයෙන් වෙන් කිරීමේ දී මුදල් අය කිරීමක් ද සාමාන්‍යයෙන් සිදු නොවේ. ඒ අනුව දේශපාලන කටයුතුවල නිරත වීම සඳහා අමාත්‍යවරයකු මට්ටමේ දේශපාලනඥයෙකුට ඒවා නොමිලයේ වෙන් කර දීම, ඡන්ද විමසීම තරග කරන අනිකුත් පාර්ශ්වයන්ට නොමැති විශේෂ වරප්‍රසාදයක් ලෙස සැලකිය හැකි බැවින් එය සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට බාධාවකි.

214. මෙම පළාත් සභා ඡන්ද විමසීම්වල දී පළාත් පාලන ආයතනවලට හෝ රජයේ වෙනත් ආයතනයකට අයත් භාවිතා නොවන ගොඩනැගිලි යම් යම් දේශපාලනඥයන්ගේ ප්‍රයෝජනය සඳහා ගාස්තුවකින් තොරව ලබා දීමට සමහර අවස්ථාවල ක්‍රියාකර ඇති බව හෙළි විය. මෙවැනි කරුණු හෙළි වූයේ, විරුද්ධ දේශපාලන පක්ෂවල අපේක්ෂකයින් හෝ එම පක්ෂවලට අදාළ වෙනත් බලධාරීන්ගෙන් හෝ සිවිල් සංවිධාන වෙතින් ලද පැමිණිලි අනුවය. මෙසේ ගොඩනැගිලි භාවිතා කළ අවස්ථාවල අදාළ බලධාරීන්ගෙන් ඒවා මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලින් බැහැර කර ගැනීමට මැතිවරණ කොමසාරිස්වරයාට මැදිහත්වී කටයුතු කිරීමට සිදුවූ අවස්ථා ද ඇත.

රජයේ දේපල අනිසි ලෙස භාවිතා කිරීම : පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තැපැල් මුද්දර අනිසි ලෙස භාවිතා කිරීම

215. පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන සෑම මහජන නියෝජිතයෙකුටම මාසිකව නිශ්චිත වටිනාකමක් සහිත තැපැල් මුද්දර, තැපැල් දෙපාර්තමේන්තුව හරහා ලිපි ගණුදෙනු කිරීමට ලබා දී ඇත. මෙවර පළාත්වල දිස්ත්‍රික්ක සඳහා තරග කරන අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරණ ලේඛන, ඡන්දදායකයින් වෙත යැවීම සඳහා මෙම පහසුකම් භාවිතා කරන ලද අවස්ථා කිහිපයක් පිළිබඳව හෙළිදරව් වී ඇත. මෙම ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්දහිමියන් වශයෙන් පිළිගෙන තිබූ රජයේ නිලධාරීන් වෙත නොයෙකුත් පළාත් සභා සඳහා තරග කරන අපේක්ෂකයින්ගේ මැතිවරණ ලියකියවිලි මේ ආකාරයට යොමු වූ අවස්ථා පිළිබඳව,

එම නිලධාරීන් ද මැතිවරණ නිරීක්ෂණ ආයතන විසින් ද මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇත. මෙම අවස්ථාව, මහජන නියෝජිතයින්ට දී ඇති වරප්‍රසාද, අදාළ අරමුණට වෙනස් වූ පටු දේශපාලන අරමුණු වෙනුවෙන් වැරදි අන්දමින් භාවිතාවීමක් හැටියටත්, අනිකුත් අපේක්ෂකයින්ට නොමැති සහනයක් තවත් අපේක්ෂකයෙකුට ලබා දීම මගින් ඡන්ද විමසීමේ සාධාරණත්වයට බලපෑම් වූ අවස්ථාවක් හැටියටත් හැඳින්විය හැකිය.

රජයේ දේපළ අනිසි ලෙස භාවිතා කිරීම : රාජ්‍ය උත්සව පැවැත්වීම මගින් අපේක්ෂකයින්ට වාසි ලබා දීම

216. පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් නාමයෝජනා භාර ගැනීමෙන් පසු එළඹෙන මාස දෙකකට ආසන්න වූ ඡන්ද විමසීම් කාලය තුළ, ඡන්ද විමසීම පැවැත්වෙන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මධ්‍යම රජයේ අමාත්‍යාංශ යටතේ විවිධ මට්ටමින් ජාතික උත්සව සහ සංවර්ධන වැඩපිළිවෙලවල් යටතේ පවත්වනු ලබන උත්සවවලදී, රටේ පාලනය හිමි දේශපාලන පක්ෂය යටතේ පළාත් සභා සඳහා තරග වදින අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ ගත් බව පෙනී ගිය කරුණකි.

217. මධ්‍යම රජයේ සමහර අමාත්‍යාංශ යටතේ, දිවයිනේ ඕනෑම දිස්ත්‍රික්කයක් යටතේ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කොට ක්‍රියාත්මක කළ හැකි විශේෂ ජන කණ්ඩායම් අරමුණු කොට ගත් සහනාධාර බෙදාදීමේ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව අනුව, ඒ සඳහා සහනාධාරලාභීන් තෝරා ගැනේ. ඔවුන්ට ප්‍රදානයන් සිදු කිරීම ද මධ්‍යම රජයේ අමාත්‍යාංශ හෝ ආයතන මගින් සිදු කළත්, දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන එවැනි වැඩපිළිවෙලවල් පාලක දේශපාලන පක්ෂයේ පළාත් සභා අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය අරමුණු කරගෙන සංවිධානය කරනු ලබන බවට විවිධ පැමිණිලි ලැබී තිබිණි. මෙවැනි අවස්ථා සම්බන්ධව දේශපාලන පක්ෂ, අපේක්ෂකයින් හා සිවිල් සංවිධාන විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිලි කළ අවස්ථාවල දී, අදාළ පැමිණිලිවල සත්‍යතාවය සොයා බලා, සමහර අවස්ථාවල දී එවැනි උත්සව පළාත් සභා ඡන්ද විමසීමට ඉදිරිපත්වන අපේක්ෂකයින්ගේ සහභාගීත්වයකින් තොරව මැතිවරණ ප්‍රචාරණ කටයුත්තක් නොවන ආකාරයට පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්වරයා උපදෙස් දී ඇත.

218. මෙවැනි පැමිණිලි සම්බන්ධව හෝ එවැනි අරමුණු වෙනුවෙන් සූදානම් කර ඇති රැස්වීම් පිළිබඳව ද දැනගත හැක්කේ පළාත් සභා අමාත්‍යාංශවල ලේකම්වරුන්ගෙන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙනි. එවැනි තොරතුරු විමසුවද බොහෝ අවස්ථාවල එම නිලධාරීන්ගෙන් පවා නිවැරදි තොරතුරක් නොලැබීමත්, එවැනි රැස්වීම් පිළිබඳව පොලිස් වාර්තා ලැබෙන අවස්ථාව වන විට අදාළ රැස්වීම් පවත්වා අවසන්ව තිබීමත් වැනි හේතු නිසා, බොහෝ විට මෙවැනි පැමිණිලි සම්බන්ධයෙන් එතරම් සාර්ථක පිළියමක් මැතිවරණ දෙපාර්තමේන්තුවට යෙදීමට නොහැකි විය. එහෙත් සමහර අවස්ථාවල දී මෙබඳු භාණ්ඩ බෙදා හැරීමේ අවස්ථා මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි ඡන්ද විමසීම්වලින් පසුව සිදු කිරීමට සමහර ආයතන ප්‍රධානීන් එකඟ වූ අවස්ථා ද ඇත. මෙවැනි සිද්ධීන් සම්බන්ධව මෙන් ම අඩු ආදායම්ලාභීන්ගේ සුභසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක වන සමහර වැඩසටහන්, ඡන්ද විමසීම් කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම, අදාළ ඉලක්ක කරා යාමට බාධාවක් බව ද සමහර අමාත්‍යාංශවල නිලධාරීන් විසින් පෙන්වා දී ඇත.

මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථානයට සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ලැබුණු පැමිණිලි

219. ඡන්ද විමසීම් පැවති දිස්ත්‍රික්කවලින් මැතිවරණ මහලේකම් කාර්යාලයට ලැබුණු පැමිණිලි පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි අදාළ අංශවලින් තොරතුරු ලබාගෙන පැමිණිලි සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලදී. මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හෝ පොලිස් නිලධාරීන් යොදවා පැමිණිලිවල සත්‍යතාවය ද තහවුරු වීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලද රාජ්‍ය දේපළ අනිසි පරිහරණයට හා මැතිවරණ නීති උල්ලංඝනයට හා මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියාවලට අදාළ සිද්ධීන් සමහරක් ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්ක යටතේ පහත දක්වා ඇත.

220. මෙම පැමිණිලි අතුරින් වැඩි සංඛ්‍යාවක් පිළිබඳව සොයාබලා ක්ෂණික විසඳුම් ලබා දීමට අවශ්‍ය අවස්ථාවල දී මැතිවරණ නිලධාරීන්, පොලිසියේ සහාය ඇතිව (අදාළ අවස්ථාවල දී ඒ ඒ දේශපාලන පක්ෂවල නියෝජිතයන් දැනුම්වත් කර) ආරවුල් නිරාකරණය කර ඇති අතර සමහර බරපතල සිද්ධිවල දී පොලිසිය හරහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබේ.

නැගෙනහිර පළාත
මඩකලපුව දිස්ත්‍රික්කය

221. මෙම දිස්ත්‍රික්කය වෙනුවෙන් දේශපාලන පක්ෂයක් නියෝජනය කරමින් තරඟ කළ අපේක්ෂකයෙක්, 2012.07.17 දින සිය නිවසේ සිටිය දී, නිවසේ ගේට්ටුවට දම්වැල් හා ඉබි යතුරු දමා

ඔහුට නිවසින් බැහැරට යාමට නොහැකි වන සේ, යම් කණ්ඩායමක් විසින් සිදු කොට තිබූ තර්ජනාත්මක ක්‍රියාව නිසා, ඔහුට පොලිස් ආරක්ෂාව ලබා දෙන ලෙස එම පක්ෂය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කොට තිබිණි. මෙම අයගේ ආරක්ෂාව සම්බන්ධව මැතිවරණ කොමසාරිස්වරයා විසින් සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයාට කරන ලද දැන්වීම අනුව, එම අපේක්ෂකයාගේ නිවස අසල පොලිස් මාර්ග බාධක යොදා ආරක්ෂක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරවන ලදී.

222. මඩකලපුව දිස්ත්‍රික්කයේ හිටපු පළාත් සභා අමාත්‍යවරයකු හා පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයෙකු, එරාවුර් තැපැල් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ පළමු මහළේ නීති විරෝධී මැතිවරණ කාර්යාලයක් පවත්වාගෙන යන බව, නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය, 2012.07.28 වන දින දැන්වීම නිසා, එම කාර්යාල ගොඩනැගිල්ල 2012.07.31 දිනට පෙර එහි තැපැල් ස්ථානාධිපතිවරයාට හෝ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයාට භාර දිය යුතු බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම අපේක්ෂකයාට දන්වා තිබිණි. එම හිටපු අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධීකරණ නිලධාරියකු විසින් අපේක්ෂකයා භාවිතා කළ ගොඩනැගිල්ලේ යතුරු 2012.07.31 වන දින එරාවුර් පොලිස් ස්ථානාධිපතිවරයාට භාර දීමෙන් පසු, ඔහු විසින් ඒවා 2012.08.03 දින මඩකලපුව ප්‍රාදේශීය තැපැල් අධිකාරිවරයාට භාර දී ඇත.

223. මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයෙකු විසින්, 2012.08.02 දින මඩකලපුව දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාට දන්වා ඇත්තේ, පිළිගත් දේශපාලන පක්ෂයක පාර්ලිමේන්තු නියෝජිතයෙකු මඩකලපුව දිස්ත්‍රික්කයට තරග කරන අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවස්ථාවන්, අදාළ දේශපාලනඥයා විසින් පානීය ජල ව්‍යාපෘති හා වෙනත් විවෘත කිරීම් සිදු කිරීමේ දී ලබා දෙන බවය. එම කරුණු සනාථ කිරීමට පැමිණිලිකරු විසින් එවැනි උත්සවවලට අදාළ විස්තර හා ඡායාරූප ද එවා තිබුණි. මේ සම්බන්ධයෙන් අදාළ නියෝජ්‍ය අමාත්‍යවරයාට නිසි උපදෙස් දෙන ලෙස, මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ පක්ෂයේ ලේකම්වරයාට ද, ඒ පිළිබඳව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සභාපතිවරයා වෙත ද 2012.08.10 දින දන්වා ඇත.

224. මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවුර් ප්‍රධාන මාර්ගයේ පිහිටි එරාවූර් නගර සභාවට අයත්, දෙමහල් ගොඩනැගිල්ලේ (දාරුස්සලාම්) පිළිගත් දේශපාලන පක්ෂයකින් මෙවර පළාත් සභා ඡන්ද විමසීමට තරග කරන අපේක්ෂකයකු, කිසිදු බදු කුලියක් එම ගොඩනැගිල්ල වෙනුවෙන් නොගෙවා දේශපාලන කටයුතුවලට එය යොදාගෙන ඇති බවට ලද පැමිණිල්ල අනුව, එම ගොඩනැගිල්ල එලෙස යොදාගෙන ඇත්නම් එය වහා වළක්වන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් එරාවුර් නගර සභාවේ ලේකම්වරයා වෙත 2012.08.02 දින දැනුම් දී ඇත.

225. මඩකලපුව දිස්ත්‍රික්කයට තරඟ කළ පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු විසින් ස්වකීය මනාප අංකය මුද්‍රණය කළ පොලිසැක් මලුවල ඉහළ වටිනාකමකින් යුතු සහල්, හා වෙනත් ආහාර ද්‍රව්‍ය පර්සල්වල බහා ඡන්ද හිමියන්ට බෙදාහරින බවට පැමිණිලි කිහිපයක් ලද අතර මැතිවරණ නිලධාරීන් විසින් ඒ පිළිබඳව සොයා බලා පොලිස් නිලධාරීන්ගේ සහාය ඇතිව තවදුරටත් එවැනි බෙදාහැරීමේ සිදු කිරීමේ අවස්ථා වළක්වන ලදී.

අම්පාර දිස්ත්‍රික්කය

226. 2013 වර්ෂයේ පැවැත්වීමට නියමිත "දැයට කිරුළ" වැඩ සටහන යටතේ, නැගෙනහිර පළාතට අයත්, දිස්ත්‍රික්කවල හා පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ විවිධ ව්‍යාපෘති ආරම්භ කරමින්, ඡන්දදායකයින්ට දේශපාලන සංවිධාන හරහා රජයේ අරමුදල් ප්‍රයෝජනයට ගනිමින් ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරන බවට පිළිගත් දේශපාලන පක්ෂයක් නියෝජනය කළ, නැගෙනහිර පළාත් කණ්ඩායම් නායකයකු විසින් 2012.07.20 දින කර ඇති පැමිණිල්ල මත, ඒ පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැයට කිරුළ ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරී, විදුලි සංදේශ හා තොරතුරු අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් කරුණු විමසීමක් කර ඇත. විශේෂයෙන් පොල්පැළ බෙදාදීම, නිවාසවලට උළු බෙදීම, ඉඩම් නියමානුකූල කිරීම, නිවාස ණය හා නිවාස වෙනුවෙන් ආධාර මුදල් දීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම වැනි කටයුතු, දේශපාලන පක්ෂවල මෙන්ම අපේක්ෂයන්ගේ ද ප්‍රවර්ධනය සඳහා සිදුකරන බවට පැමිණිල්ලේ සඳහන් විය. ඒ ගැන සැලකිලිමත් වීමට 2012.07.28 දින එම ලේකම්වරයාට දන්වා ඇත. එම වැඩසටහන්වලට අදාළව ව්‍යාපෘති ආරම්භ කරමින් පවත්වන උත්සව, රැස්වීම් හෝ ජංගම රැස්වීම් වෙනුවෙන් මෙවර ඡන්ද විමසීමේ දී තරග වැදී සිටින අපේක්ෂකයින් කැඳවා, ඔවුන්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමට හේතු වන කටයුතු කිරීම වළක්වන ලෙස, අදාළ ලේකම්වරයාට මැතිවරණ කොමසාරිස්වරයා විසින් දන්වා ඇත.

227. නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්වල ආරක්ෂක කටයුතු වෙනුවෙන් යොදවා ඇති සිවිල් ආරක්ෂක බලකායේ සමහර කටයුතු, එම පළාතේ පළාත් සභාව වෙනුවෙන් තරග කරනු ලබන දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය වෙනුවෙන් මෙන්ම තවත් පක්ෂවලට හා අපේක්ෂකයින්ට අසාධාරණවන පරිදි සිදුවන බව දන්වමින් සැලකිය යුතු පැමිණිලි සංඛ්‍යාවක් මැතිවරණ නිරීක්ෂණ ආයතනවලින් මෙන්ම දේශපාලන පක්ෂවලින් ද මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබී තිබිණි. පසුගිය මැතිවරණ අවස්ථාවල දී, සිවිල් ආරක්ෂක බලකායේ කඳවුරුවල දී නියාමකයන්ට සිය තැපැල් ඡන්දය පාවිච්චි කිරීමේ දී, එම බලකායේ ඉහළ නිලධාරීන්ගෙන් බලපෑම් සිදුවූ බව දැන ගන්නට ලැබුණු බැවින්, මෙවර එම ස්ථානවල තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු එම කඳවුරුවලින් බැහැර වෙනත් සුදුසු ස්ථානවල දී (ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි) සිදුකරන ලෙස, දේශපාලන පක්ෂයක් විසින් මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉල්ලා තිබිණි. විශේෂයෙන්ම ඊට හේතුවක් වශයෙන් දක්වා තිබුණේ, පසුගිය පළාත් සභා ඡන්ද විමසීම සඳහා ද අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වූ සිවිල් ආරක්ෂක සේවාවේ හිටපු අණ දෙන නිලධාරියා, මෙවර ද නැගෙනහිර පළාත් සභාව වෙනුවෙන් තරගයට ඉදිරිපත්ව සිටීමයි. මෙවැනි පැමිණිලි ඉදිරිපත් කිරීමේ හේතුවෙන් තම ආරක්ෂාවට යොදවා සිටි සිවිල් ආරක්ෂක සේවයේ නියාමකයාද පවා එම බලකාය විසින් ඉවත් කරගත් බවද පැමිණිලිකරු මැතිවරණ කොමසාරිස්වරයාට වැඩිදුරටත් දන්වා තිබුණි. මේ සම්බන්ධව සුදුසු පියවර ගන්නා ලෙස පැමිණිලි පාර්ශ්වය වෙත දැන් වූ කොමසාරිස්වරයා, තැපැල් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමට නියමිත දිනවල සහතික කිරීමේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීමට පත්කරනු ලබන සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ විශේෂ අවධානය, මේ සම්බන්ධව යොමු කිරීමට අදාළ පළාතේ තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

228. 2012.08.05 දින පස්වරුවේ, උහන මාළිගාතැන්න විහාරස්ථානයට, සිවිල් ආරක්ෂක බලකායේ භටයින්ට සිවිල් ඇඳුමින් සැරසී පැමිණෙන ලෙස එම බලකායේ එක් කලාපයක අණ දෙන නිලධාරී විසින් දන්වා ඇති බවත්, එම අවස්ථාවට ප්‍රධාන පක්ෂයක අපේක්ෂකයින් පැමිණ සිය අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා කටයුතු කරනු ලැබිය හැකි බවත්, පැමිණිල්ලක් මගින් දන්වා තිබිණි. මේ සම්බන්ධව ක්ෂණිකව ක්‍රියා කොට එම රැස්වීම අවලංගු කරවීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී.

229. පිළිගත් දේශපාලන පක්ෂයක් නියෝජනය කළ පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයෙකු අක්කරෙයිපත්තුවේ පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සංචාරක නිවාසය, මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගනිමින් තිබෙන බව, 2012.08.23 දින නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය (CaFFE) මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි කිරීමෙන් පසු එම නිවාසය වෙන් කළ ආකාරය පිළිබඳව එම මණ්ඩලයෙන් ද, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයෙන් ද කරුණු ලිඛිතව විමසා ඇත. ඊට අමතරව, අම්පාර දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ කොමසාරස්වරයා ද අදාළ මහජන නියෝජිතයා මුණ ගැසී මේ පිළිබඳව විස්තර ලබා ගැනීමට කටයුතු කර ඇත. මෙම සංචාරක නිවාස දීර්ඝ කලක් තිස්සේ එකී දේපාලඥයා විසින් පරිහරණය කරමින් තිබූ එකක් බව පෙනී ගිය අතර අදාළ ගොඩනැගිල්ල මැතිවරණ පැමිණිලි විමර්ශන කාර්යාංශය පිහිටුවීම සඳහා ලබා ගැනීමේ අවශ්‍යතාව අදාළ මණ්ඩලයට ද මහජන නියෝජිතයාට ද දන්වා තිබිණි. ගොඩනැගිල්ල 2012.09.01 දින සිට අම්පාර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අදාළ රාජකාරී වෙනුවෙන් ඉල්ලා සිටිය ද ඡන්ද විමසීම් දිනට පෙර දින සිට ඡන්ද විමසීම් දිනට පසු දින දක්වා කාලයට පමණක් සංචාරක නිවාසයේ මහජන නියෝජිතයාගේ බඩු බාහිරාදිය තබා තිබූ කාමරය හැර එහි අනිකුත් කාමර ලබා දිය හැකි බව දන්වා තිබුණි. ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා මැදිහත් වීමෙන් අනතුරුව අදාළ දේශපාලනඥයා විසින් එකී සංචාරක නිවාසය දේශපාලන කටයුතු සඳහා භාවිතා කිරීම වලක්වන ලදී. පසුව මෙම ගොඩනැගිල්ලේ මැතිවරණ පැමිණිලි විමර්ශන කාර්යාංශයක් පිහිටුවනු ලැබූ අතර එහි පැවැත්වූ සාකච්ඡාවට මැතිවරණ කොමසාරිස්වරයා ද සහභාගී විය.

230. අම්පාර නගර සභාවට, "දැයට කිරුළ" වැඩසටහන යටතේ අවශ්‍ය රාජකාරී කටයුතු කිරීමට, දිස්ත්‍රික් ලේකම්වරයා තාවකාලිකව භාර දී තිබූ EP PA 3828 දරන කැබ් රථය, අම්පාර නගර සභා සභාපතිවරයා සිය පළාත් සභා ඡන්ද විමසීම් ප්‍රචාරණ කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදාගෙන ඇති බවට පැමිණිල්ලක් ලැබිණි. එම රථය ආපසු ලබා දීමට දිස්ත්‍රික් ලේකම්වරයාට කරන ලද දැන්වීම අනුව, 2012.08.30 වන දින එම වාහනය ආපසු ලබාගත් බව මැතිවරණ කොමසාරිස්වරයාට දන්වා ඇත.

231. අම්පාර දිස්ත්‍රික්කයට තරග කළ පිළිගත් දේශපාලන පක්ෂ දෙකක ප්‍රමුඛතම ක්‍රියාකාරීන් හා ආධාරකරුවන් දෙපාර්ශ්වයකට බෙදී රාමසාන් උපවාස කාලය තුළ දී මහා මාර්ගයේදී බරපතල ගැටුමක් ඇතිවීමේ තත්ත්වයක් පැන නැඟී ගල්වලින් ප්‍රහාර එල්ල කරගනිමින් සිටින බවට පැමිණිල්ලක් ලැබී තිබිණි. මේ

සිද්ධියේදී ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු එක් පාර්ශවයකට පක්ෂපාතිත්වය දැක්වූ බවට චෝදනා එල්ල විය. මෙම අවස්ථාවේ දී ගැටුමක් ඇති වීම වළක්වා ගැනීම පිණිස අම්පාර සහකාර මැතිවරණ කොමසාරිස්වරයා හා ඔහුගේ සහාය සඳහා අනුයුක්ත කර තිබූ වෙනත් දිස්ත්‍රික්කවල නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු අදාළ ප්‍රදේශයට ගොස් දෙපාර්ශවයටම කරුණු පැහැදිලි කර දෙන ලද අතර එමගින් ජීවිත විශාල ප්‍රමාණයකට හානි වීමට ඉඩ තිබූ ගැටුමක් ඇති වීම වළක්වාගත හැකි විය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

232. නැගෙනහිර පළාත් සභාව විසුරුවන ලද්දේ 2012.06.27 දිනය. එම පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වූ මෙවර පිළිගත් දේශපාලන පක්ෂයකින් අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වූ අයෙකුගේ පදිංචිය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාට අයත් නිල නිවසක්, එම අය වෙත භාර දී තිබී ඇත. ඔහු එම නිල නිවස ආපසු භාර නොදී එහි රැඳී සිටීමින් මෙවර පළාත් සභා ඡන්ද විමසීම සඳහා ද මැතිවරණ ව්‍යාපාරයෙහි යෙදෙන බවට පැමිණිලි ලැබුණි. එම පැමිණිල්ල මත අදාළ පළාත් සභාවේ නිල කාලය අවසන්වී ඇති බැවින්, නිල නිවස ආපසු භාර ගැනීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාට දැන්වීය. ඒ අනුව එම හිටපු පළාත් සභා මන්ත්‍රීවරයාට නිල නිවස ආපසු භාර දීම සඳහා දිසාපති විසින් දැනුම් දී තිබුණ ද ඔහු ඒ සඳහා 2012.07.18 දින දක්වාම ප්‍රමාද වී ඇත.

233. 2012.08.09 වන දින, ගෝමරන්කඩවල පොලිස් ස්ථානයේ දී සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්ට පදක්කම් පැළඳවීමේ උත්සවයක්, මෙවර පළාත් සභා ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්වී ඇති අපේක්ෂකයන්ගේ ද සහභාගීත්වයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව පැෆරල් සංවිධානය විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිලි කර තිබුණි. මෙම උත්සවය සඳහා අපේක්ෂකයින් සහභාගී කර නොගැනීමට හෝ අදාළ උත්සවය ඡන්ද විමසීමෙන් පසුව සිදු කිරීමට හෝ කටයුතු කරන ලෙස සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා ත්‍රිකුණාමල අණදෙන නිලධාරී වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2012.08.09 වන දින දන්වන ලදී. අදාළ උත්සවය අපේක්ෂකයින්ගේ සහභාගීත්වයකින් තොරව පැවැත්වීමට කටයුතු කරනු ලබන බව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ජනරාල් හා ත්‍රිකුණාමලය අණදෙන නිලධාරී විසින් 2012.08.13 වන දින මැතිවරණ කොමසාරිස්වරයාට දන්වා ඇත.

234. පාර්ලිමේන්තුව නියෝජනය කරන පිළිගත් දේශපාලන පක්ෂයක මහජන නියෝජිතයකු විසින් 2012.08.16 වන දින පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත්තේ, බදුල්ල ජාතික නිවාස සංවර්ධන අධිකාරී කාර්යාලයේ ගබඩාවෙහි ඇති නිවාස සෙවිලි තහඩු තොගයක්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් තරග කරනු ලබන අපේක්ෂකයින්ගේ මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් භාවිතා කිරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගබඩාවකට මාරුකර යැවීම සඳහා දරනු ලබන උත්සාහය නතර කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට දැනුම් දීමටය. මෙය මැතිවරණ නීති උල්ලංඝනය කිරීමකට දරන තැතක් බව ද ඔහු දන්වා තිබිණි. මේ සම්බන්ධව 2012.08.17 වන දින ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලිපියක් යවා, එම කටයුතු වළකා ඇත. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ විවිධ ස්ථානවල නිවාස සෙවිලි කිරීමේ තහඩු බෙදා දීම හා නිවාස ණය අයදුම්පත් බෙදා දී සම්පූර්ණ කරවා ගැනීම ආදී මැතිවරණ සමයකදී නොකළ යුතු මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සිදුවන බව නිරීක්ෂණ ආයතන විසින් ද මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා තිබිණි. මෙම කටයුතු ඡන්ද විමසීම් දිනයෙන් පසුව සිදුකරන ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරියට හා එම අධිකාරිය අයත්වන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ද දන්වා මෙවැනි කටයුතු ඉදිරියේ දී සිදුවුවහොත් ඒවා නතර කිරීමට අවශ්‍ය පියවර ගැනීමට ත්‍රිකුණාමලය පොලිස් අධිකාරීවරයාට ද දැනුම්දී ඇත.

235. 2012.08.22 වන දින ත්‍රිකුණාමලය කච්චේරියේ දී, උපාධිධාරී අභ්‍යාසලාභීන් හා සමෘද්ධි නිලධාරීන් ද, ග්‍රාම නිලධාරීන් ද අමාත්‍යවරුන් දෙදෙනෙකු විසින් කැඳවා, පැවැත්වීමට සංවිධානය කර තිබූ රැස්වීමක් සම්බන්ධයෙන් නිරීක්ෂණ ආයතනයක් සිදු කළ දැනුම් දීම් අනුව, එම රැස්වීම් කල් දැමීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත දැනුම් දී ඇත.

236. කන්තලේ අග්‍රබෝධි දහම් පාසලේ දී, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දහම් පාසල්වලට රුපියල් එක්ලක්ෂ පනස්දහස බැගින් ලබා දීමේ උත්සවයක්, මැතිවරණ ප්‍රචාරණ කටයුත්තක් හැටියට සිදු කිරීමට කටයුතු සංවිධානය කර ඇති බවට 2012.09.01 වන දින මැතිවරණ කොමසාරිස්වරයාට ලද පැමිණිල්ල අනුව එම රැස්වීම් පැවැත්වීම නතර කිරීමට කටයුතු කරන ලදී.

237. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු වශයෙන් තරග කරනු ලබන අයකු, ඉදිකිරීම් අමාත්‍යාංශයට අයත් බැකෝ යන්ත්‍රයක් යොදාගෙන මැතිවරණ ප්‍රචාරණ

කාර්යයක් වශයෙන් ත්‍රිකුණාමලයේ අග්බෝපුර - කොළණි පාර සංවර්ධනය කිරීම පිළිබඳව පැමිණිලි කීපයක්ම මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්වීම් කොට අදාළ ක්‍රියාව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී මගින් එම අවස්ථාවේ නතර කිරීමට කටයුතු කරන ලදී.

උතුරු මැද පළාත
අනුරාධපුර දිස්ත්‍රික්කය

238. මෙම දිස්ත්‍රික්කය තුළ අනවසර දැන්වීම් ප්‍රචාරය කිරීම පිළිබඳව දිගින් දිගටම පැමිණිලි ලැබුණු අතර, ඒ පිළිබඳව උපදෙස් අප්‍රමාදව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට සහ උතුරු මැද පළාත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත යවා ඒවා ඉවත් කිරීමට කටයුතු කරන ලදී. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් රාජ්‍ය සංස්ථා ආදියට අයත් වාහන, මැතිවරණ නීති උල්ලංඝනය කරමින් මෙවර මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගනු ලබන බවට දන්වා අපේක්ෂකයන්ට විරුද්ධව සෑහෙන පැමිණිලි සංඛ්‍යාවක් ලැබී තිබුණි. මේවා සම්බන්ධව සොයා බැලීම සඳහා පැමිණිලි ලද අවස්ථාවේ ම පොලිස්පතිවරයාට, නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ) වෙත මෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට ද යොමු කොට එබඳු වාහන මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලින් ඉවත් කරලීමට විශේෂ උත්සායක් දරන ලදී. මෙවැනි කාර්යයකට ප්‍රාදේශීය මට්ටමේ උසස් පොලිස් නිලධාරීන්ගේ සහාය අත්‍යවශ්‍ය වේ. එහෙත් බොහෝ අවස්ථාවල දී මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල යෙදුණු වාහන සම්බන්ධව පොලිසියට දන්වා සිටිය ද, පොලිසියෙන් ලද සාමාන්‍ය පිළිතුරු වූයේ එසේ මැතිවරණ නීති උල්ලංඝනය කරමින් මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල යෙදුණු වාහන තමන්ට සොයා ගැනීමට නොහැකි බවයි. මේ නිසා රජයේ නිලධාරීන් මෙබඳු වාහන සොයා ගැනීමට උත්සාහ ගත් බොහෝ අවස්ථාවල එම කාර්යය සාර්ථක කර ගැනීමට නොහැකි විය.

239. හිටපු පළාත් සභා මැති ඇමතිවරුන්ගේ සමහර වාහන, 2012.06.07 වන දින උතුරු මැද පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව ද අදාළ අමාත්‍යාංශවලට ආපසු භාර නොදීම පිළිබඳව විවිධ පැමිණිලි ලැබිණි. එම පළාත් සභා අමාත්‍යාංශවල ලේකම්වරුන්ට සහ හිටපු පළාත් සභා මැති ඇමතිවරුන් මෙවර පළාත් සභා ඡන්ද විමසීමේ අපේක්ෂකයන්ට ද මේ සම්බන්ධව ඍජුවම ලිපි යැවීමට මැතිවරණ කොමසාරිස්වරයාට සිදුවිය. සමහර අවස්ථාවල දී දිගින් දිගටම ආපසු භාර නොදුන් මෙවැනි වාහන අත්අඩංගුවට ගැනීම සඳහා පොලිසියට උපදෙස් දීමට මැතිවරණ කොමසාරිස්වරයාට සහ අදාළ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්ට දැන්වීමට සිදුවූ අවස්ථා ද විය.

240. පළාත් සභාවේ සමහර අමාත්‍යාංශවලට විවිධ ව්‍යාපෘති යටතේ දිස්ත්‍රික්කයේ පදිංචි පවුල්වලට හෝ ගොවීන් අතර බෙදා දීම සඳහා රජයෙන් බාර දී තිබූ පොහොර, නිවාස සෙවිලි තහඩු, ක්‍රීඩා භාණ්ඩ, පාපැදි, උදලු ඇතුළු කෘෂිකාර්මික උපකරණ, වතුර මෝටර් සහ හදිසි විදුලි ලාම්පු වැනි දෑ අදාළ ගබඩාවලින් ලබාගෙන, විසුරුවා හරින ලද පළාත් සභාවේ හිටපු මැති ඇමතිවරුන් සමහර ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ද සහාය ඇතිව මැතිවරණ ප්‍රචාරණ කටයුත්තක් හැටියට මැතිවරණ නීති කඩකරමින් ඒවා ගෘහයන් වෙත භාර දෙන ලද අවස්ථා සම්බන්ධව සෑහෙන පැමිණිලි සංඛ්‍යාවක් ලැබී තිබිණි. 2012.08.20 වන දින ප්‍රධාන පිළිගත් දේශපාලන පක්ෂයක් වෙනුවෙන් මැතිවරණයට තරග කරන ලද අපේක්ෂකයකු විසින් ලාම්පු බෙදා හැරීමට කටයුතු යොදා ඇති බව දන්වමින් එවූ පැමිණිල්ලක් ගැන සොයා බැලීමේ දී, එම පැමිණිල්ල සත්‍ය බවට කරුණු හෙළි විය. එම ලාම්පු විශාල සංඛ්‍යාවක් බෙදා දීමෙන් අනතුරුව මැතිවරණ කොමසාරිස්වරයාගේ නිලධාරීන් විසින් සොයා ගන්නා ලද ඉතිරි ලාම්පු අදාළ බලධාරීන්ට භාර දීමට ක්‍රියා කර ඇත.

241. එක් අවස්ථාවක දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ රෝහල්වලින් බෙහෙත් හා ඖෂධ වර්ග රෝගීන්ට නිකුත් කිරීමේ දී ඒවා බහා නිකුත් කරනු ලබන කුඩා කවරවල, මෙවර පළාත් සභා ඡන්ද විමසීම් සඳහා තරග කරනු ලබන අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමට ආධාරවන ආකාරයේ සටහන් යොදා තිබුණු බව හෙළි විය. මෙම පැමිණිල්ල 2012.08.25 වන දින පැෆරල් සංවිධානය විසින් ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් ලවා සොයා බැලීමේ දී, අනුරාධපුර සේනපුර රෝහලෙන් සොයා ගන්නා ලද එවැනි කවර තොගයක් නිලධාරීන් විසින් විනාශ කිරීමට කටයුතු කර ඇත.

242. 2012.08.24 වන දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ රජයේ ගබඩා කිහිපයක විවිධ ආයතනවලින් හා ගොවිජන සේවා පාර්ලිමේන්තුව සුදුසු සේවාලාභීන් වෙත යම් යම් අවස්ථාවල දී බෙදා දීම සඳහා ගබඩා කොට තිබූ විවිධ කෘෂි උපකරණ සහ භාණ්ඩ, මෙවර ඡන්ද විමසීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂයකින් ඉදිරිපත්ව ඇති අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා පුද්ගලයින් වෙත බෙදා දීමේ සූදානමක් ඇති බවට පැමිණිලි ලැබී තිබිණි. අදාළ ගබඩා 2012.08.25 වන දින

මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලවා මුද්‍රා තබා ඡන්ද විමසීමෙන් අනතුරුව ඒවා විවෘත කරලීමට අදාළ රාජ්‍ය අංශවලට පහසුකම් සලසන ලදී.

243. 2012.08.31 වන දින, අනුරාධපුර රෝහලේ වෛද්‍යවරයෙකුට දේශපාලන පක්ෂයකට අයත් ආධාරකරුවන් පිරිසක් අනුරාධපුර ප්‍රදේශයේදී පහර දීම නිසා රෝහල්ගත කිරීමට සිදු වූ බව කැමේ සංවිධානය විසින් දන්වන ලදී. ඒ සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණ කටයුතු පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා පොලිසියෙන් කළ විමසීමක දී දැනගැනීමට හැකිවුයේ සිද්ධියට අදාළ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර ඇති බවයි.

පොළොන්නරුව දිස්ත්‍රික්කය

244. 2012.08.16 වන දින පොළොන්නරුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කැබ් රථයක්, මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කරන බවට මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලද පැමිණිල්ලක් අනුව, ඒ පිළිබඳව ද දන්වා එම වාහනය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයාට එම නීති විරෝධී කටයුත්ත වළක්වාලන ලෙසට උපදෙස් දී ඇත. ඒ අනුව උතුරු මැද පළාත් සභාව විසින් එම වාහනය පළාත් සභාව විසුරුවාහැරීමට පෙර භාර ගෙන තිබූ හිටපු අමාත්‍යවරයාට, එය ආපසු පළාත් සභාවට භාර දෙන ලෙස දැන්වුව ද එවැනි වාහනයක් තමා භාරයේ නොමැති බවට පිළිතුරක් මගින්, අදාළ ලේකම්වරයාට ඔහු විසින් දැනුම් දී ඇත. එහෙත් මේ සම්බන්ධව පොලිසියට කළ දැනුම් දීම අනුව, අදාළ වාහනය 2012.08.17 වන දින පොළොන්නරුවේ පළාත් මාර්ග අධිකාරියට අයත් වාහන රථගාලක නතර කොට තිබෙන බව පොලිසිය වාර්තා කරන ලදී.

245. 2012.08.21 වන දින පොළොන්නරුව අරලගන්විල, මැදගම ප්‍රදේශයේ පළාත් සභා ඡන්ද විමසීමට මෙවර ඉදිරිපත් වී ඇති අපේක්ෂකයෙකු, ඡන්දහිමියන් වෙත ආහාර පාර්සල් බෙදා දීමට සූදානම් වී සිටින බවට ලද පැමිණිල්ල පිළිබඳව සොයා බලා සුදුසු පියවර ගැනීමට උපදෙස් දී ඇත. එම භාණ්ඩ බෙදීම අත්හිටුවන ලද බව, පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරයා වාර්තා කර ඇත.

246. 2012.09.06 වන දින පොළොන්නරුව රෝහල් භූමිය තුළ මෙවර පළාත් සභා ඡන්ද විමසීමට ඉදිරිපත්ව ඇති දේශපාලන පක්ෂයකට සහාය දැක්වීම සඳහා යම් වෘත්තීය සමිතියක් විසින් රැස්වීමක් පවත්වනු ලබන බවට ලද පැමිණිල්ල අනුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් දෙන ලද උපදෙස් මත එම රැස්වීම නතර කිරීමට රෝහල් අධ්‍යක්ෂවරයා පියවර ගන්නා ලදී.

247. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එගොඩපත්තුව ප්‍රදේශයේ සමෘද්ධි නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් කාර්යාල වේලාව තුළ එක් දේශපාලන පක්ෂයක ප්‍රචාරක කටයුතුවල නිරතවන බවට ලද පැමිණිලි සම්බන්ධයෙන් අදාළ ප්‍රාදේශීය ප්‍රධානීන් දැනුම්වත් කර එවැනි ක්‍රියා වැළැක්වීමට පියවර ගන්නා ලදී.

248. පාසැල් දරුවන්ට හා පෙර පාසැල් දරුවන්ට දේශපාලන පක්ෂයක ලකුණ හා අපේක්ෂකරුව/ අංකය සහිත පාසැල් බෑග්, අභ්‍යාස පොත් මහා පරිමාණයෙන් බෙදා ගැනීමට අධ්‍යාපන බලධාරීන්ගේ ද සහාය ලබාගන්නා බවට ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමෙන් අනතුරුව එම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදෙන ලදී.

සබරගමුව පළාත
රත්නපුර දිස්ත්‍රික්කය

249. විවිධ පුද්ගලයින්ගෙන් සහ පැෆරල් සංවිධානය වැනි මැතිවරණ නිරීක්ෂණ සංවිධානවලින්, මෙම දිස්ත්‍රික්කයේ විවිධ ස්ථානවල ප්‍රදර්ශනය වන නීති විරෝධී මැතිවරණ දැන්වීම් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි ලැබී තිබූ අතර, ඒවා ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ පොලිස් නිලධාරීන්ට සහ තේරීම්භාර නිලධාරීට මැතිවරණ කොමසාරිස්වරයා උපදෙස් නිකුත් කර ඇත.

250. සබරගමුව පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු එම පළාත් සභාවට අයත් වාහන එහි අමාත්‍යාංශ විසින් පළාත් සභාවට භාර දී ඇත්දැයි මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරන ලද විමසුමට අනුව, එවැනි වාහන 12 ක් භාර දී නොමැති බවට රත්නපුර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයාගෙන් දැන ගෙන ඇත. නීති විරෝධීව රඳවා ගෙන ඇති මෙම වාහන අත්අඩංගුවට ගන්නා ලෙස රත්නපුර නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා දැන්වීමෙන් අනතුරුව එම වාහන 2012.08.18 වන දින වන විට භාර දී ඇති බව වාර්තා වී ඇත.

251. සබරගමුව පළාත් සභා ඡන්ද විමසීමේ දී පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත්වූ අයෙකු, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන නිවාස ණය යෝජනා ක්‍රමය, සිය දේශපාලන වාසි සඳහා යොදාගෙන ඇති බව 2012.08.07 වන දින පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි කිරීමෙන් පසු එවැනි කටයුතු වළක්වන ලෙස ඉදිකිරීම්, ඉංජිනේරු

සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට මැතිවරණ කොමසාරිස්වරයා 2012.08.13 වන දින දන්වා ඇත.

252. පැල්මඩුල්ල රක්වාන මාර්ගයේ පිහිටා ඇති රජයේ දෙපාර්තමේන්තුවකට අයත් නිල නිවස, පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයෙකු මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගෙන ඇති බවට 2012.08.08 වන දින ලද පැමිණිල්ලක් සොයා බැලීමේ දී, කිසිවකු එහි පදිංචිව නොමැති බවට වාර්තා වූ අතර, එම ගොඩනැගිල්ල මුද්‍රා තැබීමට මැතිවරණ කොමසාරිස්වරයා 2012.08.14 වන දින දැනුම් දී ඇත.

253. රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩගම ප්‍රදේශයේ කාර්යාලයකට පිළිගත් දේශපාලන පක්ෂයක පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයකු විසින් උපාධිධාරී අභ්‍යාසලාභීන් කැඳවා රැස්වීමක් පැවැත්වීමට කටයුතු කර ඇති බවට නිරීක්ෂණ සංවිධානයක් විසින් 2012.08.23 වන දින කර ඇති පැමිණිල්ල අනුව, එය වැළැක්වීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත රත්නපුර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා දන්වා ඇත. එදින එම රැස්වීම පවත්වා නැත.

254. පළාත් සභා ඡන්ද විමසීමට පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත්ව ඇති අයෙකු ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින් එකොලොස් දෙනෙකු ඔහුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට යොදවාගෙන ඇති බවත්, එම අධිකාරියේ ෆැක්ස් යන්ත්‍රයක් ද ඒ වෙනුවෙන් ඔහු විසින් භාවිතා කරනු ලබන බවත් දන්වා දේශපාලන පක්ෂයක් විසින් මැතිවරණ කොමසාරිස්වරයාට 2012.08.23 වන දින ඉදිරිපත් කරන ලද පැමිණිල්ල අනුව, එම කටයුතු වැළැක්වීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වෙත 2012.08.24 වන දින දන්වා ඇත.

255. පිළිගත් දේශපාලන පක්ෂයකින් සබරගමුව පළාත් සභාවට තරග කරනු ලබන අපේක්ෂකයෙකුගේ සහභාගීත්වයෙන් 2012.09.06 වන දින කුරුවිට-ලෙල්ලෝගම පාරේ කොන්ක්‍රීට් පාර විවෘත කිරීමට යොදා තිබූ කටයුතු, එදින ලද පැමිණිල්ලක් අනුව නවතා දමන ලදී.

කෑගල්ල දිස්ත්‍රික්කය

256. සබරගමුව පළාත් සභාව සඳහා ඉදිරිපත් වූ පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයෙකු, 2012.07.10, 2012.07.12 සහ 2012.07.15 යන දිනයන්හි දී විදුහල් කිහිපයක ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් ද, අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන් කිහිප දෙනෙක් ද අදාළ විදුහල්වල රැස්වීම් සඳහා කැඳවා, සිය මැතිවරණ ව්‍යාපාරයට සහාය ඉල්ලා ඇති බව, ලංකා ගුරු සේවා සංගමය 2012.07.16 වැනි දින පැමිණිලි කිරීමෙන් පසු, එම රැස්වීම් පැවැත්වීමට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධව නිසි පියවර ගන්නා ලෙස ද, ඉදිරියේ දී මෙවැනි රැස්වීම් පැවැත්වීම වළකාලන ලෙස ද සබරගමු පළාත් අධ්‍යාපන ලේකම්වරයා වෙත දැනුම් දී ඇත.

257. මධ්‍යම රජයේ අමාත්‍යාංශ දෙකක හා දෙපාර්තමේන්තුවක වාහන සබරගමුව පළාත් සභාව සඳහා තරග කරන අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා යොදා ගන්නා බවට ලද සත්‍ය බව පෙනීගිය පැමිණිලි අනුව, එවැනි ක්‍රියා වැළැක්වීමට කටයුතු කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ට දන්වා ඇත.

258. රාජ්‍ය සංස්ථාවකට අයත් වාහන 2 ක් සබරගමුව පළාත් සභාව වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කරන අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධන කිරීම සඳහා යොදා ගන්නා බවට දේශපාලන පක්ෂයක් විසින් කරන ලද පැමිණිල්ලක් අනුව, එම කටයුතු වළක්වන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා 2012.08.28 වන දින අදාළ සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයාට උපදෙස් දී ඇත.

259. පිළිගත් දේශපාලන පක්ෂයකින් සබරගමුව පළාත් සභාව සඳහා තරග කරනු ලබන අපේක්ෂකයෙකු, ව්‍යාජ අංක යොදා භාවිතා කළ වාහනයක් මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2012.08.31 දින පරීක්ෂාවට ලක්කොට බලපත්‍ර රහිතව තිබූ එම වාහනයේ භාවිතා කළ ශබ්දවාහිනී යන්ත්‍රය ද, පොලිස් අත්අඩංගුවට පත් කිරීමට කටයුතු කර ඇත.

260. ඡන්ද විමසීම් කාලය තුළ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ වෙනුවෙන් උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන බව දන්වමින් පිළිගත් දේශපාලන පක්ෂයක් නියෝජනය කරන පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයකු විසින් 2012.09.01 වන දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත කරන ලද පැමිණිල්ල අනුව, එම බඳවා ගැනීම් ඡන්ද විමසීම් කාලය තුළ සිදු නොකිරීමට 2012.09.02 වන දින එම අමාත්‍යාංශයේ ලේකම්වරයාට මැතිවරණ කොමසාරිස්වරයා විසින් දන්වා ඇත. ඒ අනුව එම බඳවා ගැනීම් එදින සිදු නොකරන බව එම ලේකම්වරයා මැතිවරණ කොමසාරිස්වරයාට දැනුම් දී ඇත.

261. කෑගල්ල දිස්ත්‍රික්කයට පිළිගත් දේශපාලන පක්ෂයකින් තරඟ කළ පළාත් සභාව නියෝජනය කර තිබූ අපේක්ෂකයකු විසින් සුබෝපභෝගී බස් රථ දෙකක් ස්වකීය ප්‍රචාරණ කටයුතු සඳහා යොදවා ගැනීම පිණිස ප්‍රචාරණ ස්ටිකර් මගින් සම්පූර්ණයෙන් සරසා භාවිතා කරන බවට ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් ක්‍රියා කළ මැතිවරණ නිලධාරීන් විසින් පොලිසියේ සහාය ඇතිව එම කාර්යය වළක්වන ලදී.

මධ්‍යම පළාත

මහනුවර දිස්ත්‍රික්කය

262. මහනුවර පෞද්ගලික සමාගමක් විසින් මහනුවර පේරාදෙණිය පාරේ, මෙවර පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් තරඟ කරනු ලබන අපේක්ෂකයින්ගේ ඡායාරූප හා ඔවුන්ගේ ලකුණු ඇතුළත් දැන්වීම් ප්‍රදර්ශනය කරන බවට ලැබුණු පැමිණිලි අනුව ඒ සම්බන්ධව පරීක්ෂා කර, ඒවා ඉවත් කිරීමට කටයුතු කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2013.08.04 දින පොලිසියට උපදෙස් දී ඇත. පොලිස් පරීක්ෂණයෙන් පසු එම ප්‍රචාරණ කටයුතු අදාළ ආයතනය නවතා ඇත.

263. මහනුවර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන වෙත, සමහර දේශපාලන පක්ෂ විසින් මැතිවරණ රැස්වීම් පැවැත්වීමට එම ආයතනවලට අයත් භූමිභාග වෙන් කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලබන බවට, මැතිවරණ කොමසාරිස්වරයා වෙත වරින්වර පැමිණිලි ලැබී ඇත. එවැනි පැමිණිලි මහනුවර මහනගර සභාව, නාවලපිටිය නගර සභාව සහ උඩුනුවර ප්‍රාදේශීය සභාව යන ආයතනවලට අදාළව ලැබී තිබූ අතර, මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ පළාත් පාලන ආයතනවලින් ඒවා පිළිබඳව කරුණු විමසා ඇති අතර, එම අවස්ථාවල දී සුදුසු උපදෙස් එම ආයතනවලට නිකුත් කිරීම ද සිදුකර ඇත. විශේෂයෙන් දේශපාලන පක්ෂවල ඉල්ලීම් සම්බන්ධව කටයුතු කිරීමේ දී සෑම පක්ෂයකටම සහ කණ්ඩායමකටම සාධාරණය ඉටුවන පරිදි මෙම කටයුතු කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා උපදෙස් දී ඇත.

264. හිටපු පළාත් ප්‍රධාන අමාත්‍යවරයකු එම පළාත් සභාව විසුරුවාලීමෙන් අනතුරුව ද සිය නිල නිවසේ රැඳෙමින් සිටින බවට ලද තොරතුරු මත අදාළ නිල නිවස එම පළාත් සභාව වෙත භාර දෙන ලෙස 2013.08.17 දින මැතිවරණ කොමසාරිස් දැනුම් දී ඇත. ඒ අනුව 2013.08.22 වැනි දින එම භාර දීම සිදුකර ඇති බව පළාත් සභාව විසින් මැතිවරණ කොමසාරිස්වරයාට දන්වා ඇත.

265. මහනුවර දිස්ත්‍රික්කයේ තරඟ කළ දේශපාලන පක්ෂ අපේක්ෂකයකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ද සහයෝගය ඇතිව පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී ලේක්හවුස් ආයතනයට අයත් වාහනයක සවිකරන ලද ශබ්ද විකාශන යන්ත්‍ර හරහා ජංගම ප්‍රචාරක කටයුතු සිදු කරන බවට ලද පැමිණිල්ලක් පිළිබඳව සොයා බැලීමට මැතිවරණ නිලධාරීන් හා පොලිස් නිලධාරීන් ක්‍රියා කර ඇති අතර අදාළ වාහන අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ නමුත් එම සිද්ධිය සත්‍ය බවට සනාථ වී තිබේ. මැතිවරණ හා පොලිස් නිලධාරීන්ගේ අධීක්ෂණය හේතුවෙන් එම නීතිවිරෝධී හා අසම්මත ක්‍රියාව වළක්වා ගැනීමට හැකිවිය.

266. එමෙන්ම එක් අපේක්ෂකයකු ප්‍රමුඛ දේශපාලනඥයකුගේ සහාය ඇතිව ස්වකීය මනාප අංකය සහිත පුවරු කඳු මුදුන්වල සවිකර එම අංක රාත්‍රී කාලයේ විදුලි බුබුලු මගින් ආලෝකමත් කර ප්‍රදර්ශනය කරන බවට පැමිණිලි ලැබී තිබිණි. එවැනි අංක ප්‍රදර්ශනය කිරීමත් නීති විරෝධී නොවන බැවින් එවැනි පුවරු ඉවත් කළ නොහැකි බවට ප්‍රාදේශීය පොලිස් බලධාරීන්ගේ මතය වූ නමුත් මැතිවරණ කොමසාරිස්වරයා හා පොලිස් නීති කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා නීතිය පැහැදිලි කරදීමෙන් අනතුරුව මෙම පුවරු ප්‍රදර්ශනය කිරීම වළක්වන ලදී.

නුවරඑළිය දිස්ත්‍රික්කය

267. අඹගමුව ප්‍රදේශීය ලේකම් කාර්යාලයට අයත් නාවලපිටිය පාරේ පිහිටි සම්මන්ත්‍රණ ශාලාවේ (පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෙමහල් ගොඩනැගිල්ල) පිළිගත් දේශපාලන පක්ෂයක පක්ෂ සංවිධායකවරයකු විසින් මධ්‍යම පළාත් සභාව සඳහා මහනුවර දිස්ත්‍රික්කයෙන් තරඟ කරන අපේක්ෂකයෙක් වෙනුවෙන් පක්ෂ කාර්යාලයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බවට පැමිණිල්ලක්, මැතිවරණ කොමසාරිස්වරයාට ලැබිණි. එහි අයිතිය පිළිබඳ තොරතුරු නිරාකරණය කර ගැනීමෙන් පසු, මෙම ඡන්ද විමසීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් පැමිණිලි ලබා ගැනීමට සම්බන්ධීකරණ කාර්යාලයක් එහි පිහිටුවීම සඳහා එය ආපසු භාර ගන්නා ලෙස අඹගමුව ප්‍රාදේශීය ලේකම්වරයාට 2013.08.13 වන දින මැතිවරණ කොමසාරිස්වරයා උපදෙස් දී ඇත.

268. 2013.08.15 වන දින ගිණිගත්හේන-අඹගමුව සමුපකාර ගොඩනැගිල්ල ද මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා දේශපාලන පක්ෂයක් විසින් භාවිතා කරන බවට මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි ලැබුණි. එසේම රාගල සමුපකාර ගොඩනැගිල්ලේ ද කොටසක්

ඒ ආකාරයට භාවිතා කරනු ලබන බවට මැතිවරණ කොමසාරිස්වරයාට 2013.08.30 වන දින පැමිණිලි ලැබී ඇත.

269. 2013.08.16 වන දින නුවරඑළිය ත්‍රිරෝද රථ සංගමයට අදාළව නුවරඑළිය පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් රජයේ කාර්යාලයක දී පැවැත්වීමට කටයුතු කරන ලද රැස්වීමක් පවත්වා ගෙන යන අතරතුර, මධ්‍යම පළාත් සභාව වෙනුවෙන් ප්‍රධාන පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කරන අපේක්ෂකයෙකු එම රැස්වීමේ මූලාසනය බලහත්කාරයෙන් ලබාගෙන, එම රැස්වීමට බාධා පමුණුවා, එය දේශපාලන රැස්වීමක් වශයෙන් පැවැත්වීමට කටයුතු කළ නිසා රජයේ නිලධාරීන් එම ස්ථානයෙන් බැහැරට ගිය බව මැතිවරණ කොමසාරිස්වරයාට දන්වා ඇත. මෙම සිද්ධිය, අදාළ පක්ෂයේ අපේක්ෂකයා වෙත සුදුසු උපදෙස් දීම සඳහා එම පක්ෂයේ ලේකම්වරයාට 2013.08.29 වන දින මැතිවරණ කොමසාරිස්වරයා දන්වා ඇත.

270. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඡන්ද හිමියන්ට නොමිලේ මත්පැන් ලබාදීම හරහා ඡන්දය දීමට පෙළඹවීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම කරන බවට ලද පැමිණිල්ල සුවිශේෂී පැමිණිල්ලකි. මේ පිළිබඳව සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, වතු අධිකාරීන් එක්ව ක්‍රියා කිරීමෙන් මෙම තත්ත්වය යම්තාක් දුරට පාලනය කිරීමට මැතිවරණ නිලධාරීන්ට හැකි විය. නිවාසවලට ගොස් බෙදාහැරීම වෙනුවට මත්පැන් අලෙවිසල්වලට යැවෙන කුඩා ලිඛිත සටහන් හෝ ජංගම දුරකථන හරහා යැවෙන කෙටි පණිවුඩ මගින් මේ මත්පැන් බෙදාහැරීමට කරනු ලැබූ උත්සාහයද ව්‍යර්ථ කිරීමට මැතිවරණ නිලධාරීන් සමත් විය.

මාතලේ දිස්ත්‍රික්කය

271. මෙම දිස්ත්‍රික්කයේ ද අනවසර මැතිවරණ ප්‍රචාරණ දැන්වීම් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාට සහ දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරයාට ලද පැමිණිලි අනුව පොලිසිය ලවා එවැනි දැන්වීම් ඉවත් කරලීමට අවශ්‍ය පියවර ගෙන ඇත. රජයේ වාහන මෙන්ම සමහර අවස්ථාවල දී තාවකාලික ගරාජ් අංක යොදා මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදුණු වාහන සම්බන්ධව ද ලැබුණු පැමිණිලි පිළිබඳව, ඒ ඒ අවස්ථාවල දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ අංශවලට පැමිණිලි ද යොමු කොට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

272. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරියෙකු පිළිගත් දේශපාලන පක්ෂයකින් ඡන්ද විමසීම තරග කරන ඔහුගේ සොහොයුරා වෙනුවෙන්, මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට සහභාගී වන බවට මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන් ලද පැමිණිල්ල අනුව, අදාළ අංශයේ ඉහළ නිලධාරීන්ට උපදෙස් දී එම නිලධාරියා ඔහු සේවය කළ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉවත් කොට වෙනත් ස්ථානයකට මාරු කර යැවීමට කටයුතු කරන ලදී.

273. පිළිගත් දේශපාලන පක්ෂයක, පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මෙම දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෙකු ඔහු වෙත ලබා දෙන පාර්ලිමේන්තුවේ තැපැල් මුද්දර ලබා දී මෙවර පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් මාතලේ දිස්ත්‍රික්කයට තරග කරනු ලබන අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතුවලට සහාය දක්වන බවටත්, මැතිවරණ නීති උල්ලංඝනය කරන ලද බවටත් පාර්ලිමේන්තුවේ තවත් මහජන නියෝජිතයෙකු විසින් 2013.08.23 වන දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි.

274. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වන රත්තොට ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයෙකු, 2012.12.31 වන දින දක්වා වූ එම සභාවේ මුල්‍ය ප්‍රකාශන විගණනය සඳහා පැමිණි, මධ්‍යම පළාතට අනුයුක්ත විගණන නිලධාරීන්ට ඒ සඳහා ඉඩ නොදී බාධා කොට, කාර්ය මණ්ඩලය කැඳවා ඡන්ද ප්‍රචාරණ රැස්වීමක් පැවැත්වීමට කටයුතු කිරීම පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාට ලද පැමිණිල්ල, අදාළ පක්ෂයේ අපේක්ෂකයාට උපදෙස් දීම සඳහා මග පෙන්වීමක් ද සහිතව එම දේශපාලන පක්ෂයේ ලේකම්වරයා වෙත යොමු කරන ලදී.

275. මාතලේ දිස්ත්‍රික්කයේ සෑම ග්‍රාමසේවා වසමකින්ම තෝරාගත් පවුල් 200 ක් සඳහා දිවිනැගුම වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට උපදෙස් දෙමින් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යවා ඇති උපදෙස් සහ අදාළ ආකෘති පත්‍රයක පිටපතක් පක්ෂයක අපේක්ෂකයෙකු විසින් මාතලේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිල්ලක් ද සමඟ 2013.09.07 දින ඉදිරිපත් කර ඇත. එම වැඩසටහන ඡන්ද විමසීමෙන් අනතුරුව සිදු කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 2013.09.11 වන දින දන්වා ඇත.

276. සුළු අපනයන කෘෂිකාර්මික භෝග වගාකරනු ලබන ගොවීන්ට සහන පොළී බැංකු ණය ලබා දීමේ වැඩමුළුවක් 2013.09.18 වන දින උදේ 9.00 මාතලේ

මහජන බැංකු ප්‍රාදේශීය කාර්යාලයේ දී පැවැත්වෙන බවට වාර්තා වීමෙන් පසු මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම රැස්වීම්, ඡන්ද විමසීම් අවසන් වීමෙන් අනතුරුව පවත්වන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.

277. මාතලේ දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධන කාර්ය සඳහා යොදවා තිබූ ධීවර අමාත්‍යාංශයට අයත් වාහනයක් එකී අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ නිලධාරියෙකු විසින් මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල යොදවන බවට ලද පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී එම වාහනය නිල නොවන කාර්යයන්හි යොදවන බව අසත්‍ය නොවන බව පෙනීගිය බැවින් ඒ බව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ බලධාරීන්ට දන්වා එම කාර්යය වළක්වා ධීවර අමාත්‍යාංශයේ සතු දේපළ අවභාවිත කිරීම වැළැක්වීමට පියවර ගෙන තිබේ.

උතුරු පළාත

278. උතුරු පළාතේ පළාත් සභාව සඳහා යාපනය දිස්ත්‍රික්කය වෙනුවෙන් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් තරග කළ අපේක්ෂකයින් කීපදෙනෙකුගේම පදිංචි ස්ථානවලට ආරක්ෂක අංශයේ නිලධාරීන් යැයි පවසා පැමිණි අය, තමන්ගේ පෞද්ගලික විස්තර විමසා සටහන් කරගෙන ගිය බවත්, එබැවින් එම අපේක්ෂකයින් හා ඔවුන්ගේ නිවැසියන් බියකින් පසුවන බවත් දේශපාලන පක්ෂ කීපයක්ම මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිලි කරන ලදී. විශේෂයෙන් උතුරු පළාතේ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සමග පැවති සාකච්ඡාවලදී ද මෙම කරුණ ඉස්මතු කොට තිබුණි. එබැවින් ආරක්ෂක අංශවලින් හා රාජ්‍ය බුද්ධි අංශයෙන් ද ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව සිටින අපේක්ෂකයින් සම්බන්ධ විස්තර සොයා බැලීමක් සිදු කරන්නේ දැයි මැතිවරණ කොමසාරිස්වරයා විසින් සොයා බැලුව ද, එම අංශ එවැනි සෝදිසි කිරීමක් සිදු නොකළ බව දන්වා තිබිණ.

279. උතුරු පළාතේ මැතිවරණ කොට්ඨාසයක් නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යාපනය දිස්ත්‍රික්කය සඳහා දේශපාලන පක්ෂයකින් තරග කරනු ලබන අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට අදාළ ලේඛන, ඡන්දදායකයින් වෙත තැපෑලෙන් යැවීම සඳහා, තමන්ට පාර්ලිමේන්තුව විසින් ලබා දී ඇති තැපැල් පහසුකම් භාවිතා කිරීමට ඉඩ දී ඇති බවට, දේශපාලන පක්ෂයක් නියෝජනය කළ යාපනයේ කොකුවිල් ප්‍රදේශයේ අපේක්ෂකයෙකුගෙන් මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිල්ලක් ලැබී තිබුණි. තවත් ලද මෙවැනි පැමිණිලි කීපයක් සමග, මෙම පැමිණිල්ල ද සුදුසු පියවර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ ගරු කථානයකතුමා වෙත දැනුම් දීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙත යොමු කරන ලදී.

280. යාපනය මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් 2013.08.10 දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වන ලද්දේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ග්‍රාමනිලධාරීන් 30 කට වැඩි සංඛ්‍යාවක් ද තවත් රජයේ නිලධාරීන් පිරිසක් ද කිලිනොච්චියේ උදය නගර්හි පිහිටි ආපන ශාලාවට 2013.08.07 වන දින කැඳවා, එම පිරිසට දිවා භෝජන සංග්‍රහයක් පවත්වා ඔවුන්ගේ සහාය මෙම ඡන්ද විමසීමේ දී යම් දේශපාලන පක්ෂයක් විසින් ඉල්ලා ඇති බවය. උතුරු පළාත් මැතිවරණ කොට්ඨාස නියෝජනය කරන එම පක්ෂයේ මහජන නියෝජිතයන්ට සාමාන්‍ය රාජකාරී කාලය තුළ රජයේ නිලධාරීන් කැඳවා, දේශපාලන කටයුතු වෙනුවෙන් ඔවුන්ගේ සහාය ඉල්ලීම මෙන්ම, විශේෂයෙන් සාම නිලධාරී කණ්ඩායමක් වන ග්‍රාම නිලධාරීන් ද එවැනි අවස්ථාවලට කැඳවීම පක්ෂයක් විසින් සිදු නොකළ යුත්තක් හැටියට දැන්වූ මැතිවරණ කොමසාරිස්වරයා, එවැනි ක්‍රියාවලින් වැළකීමට අදාළ පාක්ෂිකයින්ට උපදෙස් දෙන ලෙස අදාළ පක්ෂයේ ලේකම්වරයාට 2013.08.10 දින දන්වා ඇත.

281. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සභාපතිවරයෙකු විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත, එම පළාත් පාලන බල ප්‍රදේශයේ ස්ථාන කීපයකම, එම දිස්ත්‍රික්කය සඳහා තරග වදින පිළිගත් දේශපාලන පක්ෂයක් නියෝජනය කරනු ලබන අපේක්ෂකයන්ගේ ජයග්‍රහණය පතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් විසින් රැස්වීම් භූමි සඳහා අවසර ලබා නොගෙන ඡන්ද විමසීමට අදාළ රැස්වීම් පවත්වා ඇති බව දන්වන ලදී. ඒ පිළිබඳව අදාළ පක්ෂ ලේකම්වරයාට 2013.08.31 දින මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැනුම් දී ඇත.

282. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය නමැති මැතිවරණ නිරීක්ෂණ සංවිධානය, 2013.09.05 දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා ඇත්තේ, උතුරු පළාතේ සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයින්, කිලිනොච්චිය හා මුලතිව් යන දිස්ත්‍රික්කවල දේශපාලන පක්ෂයක් නියෝජනය කරමින් උතුරු පළාත් සභාව සඳහා තරග වදින අපේක්ෂකයින්ගේ ජග්‍රහණය වෙනුවෙන් ප්‍රචාරණ කටයුතුවල යෙදෙන බවයි. ඒ පිළිබඳව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනාරාල් වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැනුම් දීමෙන් පසු, අදාළ නිලධාරීන්ට ඒ සම්බන්ධව

අවශ්‍ය උපදෙස් දී ඇති බව එම නිලධාරියා 2013.09.10 දින මැතිවරණ කොමසාරිස්ට දැනුම් දී ඇත.

283. යාපනයේ අරියාලෙයි නැගෙනහිර ප්‍රදේශයේ පෞද්ගලික ඉඩම්වලින් වැලි හාරා, යාපනයේ නාගරික ප්‍රදේශවල ජනතාවට, දේශපාලනඥයින්ගේ අනුග්‍රහය මත පුද්ගලයින් විසින් වැලි ප්‍රවාහනය කොට බෙදනු ලබන බව මැතිවරණ කොමසාරිස්වරයා වෙත, යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් පැමිණිලි කිරීමෙන් පසු ඒ පිළිබඳව පොලීසියෙන් විමසීම් කර ඇත. එවැනි වැලි ප්‍රවාහනය කරන ලද වාහන අත්අඩංගුවට ගත් බව මැතිවරණ කොමසාරිස්වරයාට පොලීසිය මඟින් දැනගත හැකි විය.

284. යාපනය දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ඉදිරිපත් කර තිබූ අපේක්ෂකයන් කිහිපදෙනෙකුට ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහාය ලැබෙන බවට ලද පැමිණිල්ල බරපතල පැමිණිල්ලක් සේ සැලකිය යුතුවේ. මේ අපේක්ෂකයින් විසින් ස්වකීය දේශපාලන ප්‍රචාරණ රැස්වීම්වල දී අනීතික ලෙස බඩුබාහිරාදිය, ගෘහ උපකරණ, කෘෂි උපකරණ බෙදා දීම්වලට සමහර යුධ හමුදා නිලධාරීන්ගේ සහාය ලද බව සහ සමහර යුධ හමුදා කඳවුරු ඉදිරිපිට මෙන්ම සමහර හමුදා මුරපොළවල්වලින් ආරක්ෂිත මහා මාර්ගවල අදාළ පක්ෂයේ සලකුණ හා එකී අපේක්ෂක අංක ඇඳ තිබූ බව නිරීක්ෂණය වී තිබේ. දේශපාලන රැස්වීම්වල දී බඩුබාහිරාදිය හා උපකරණ බෙදාදීම් වැළැක්වීමට මැතිවරණ නිලධාරීන් ක්‍රියා කළ නමුත් යුධ හමුදා කඳවුරු ඉදිරිපිට මහා මාර්ගයේ ඡන්ද සලකුණු හා අපේක්ෂක අංක පින්තාරු කිරීම වළක්වා ගත හැකි වුයේ ඉහළ දේශපාලන හා ආරක්ෂක බලධාරීන්/ නිලධාරීන් දැනුම්වත් කිරීම මගිනි.

285. කලකට පෙර පැවති ප්‍රචණ්ඩක්‍රියා හේතුවෙන් වවුනියාව, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්කවලින් අවතැන්වී පුත්තලම හා අනුරාධපුර දිස්ත්‍රික්කවල වාසය කරන එහෙත් වන්නි ප්‍රදේශයේ ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි වී සිටින ඡන්ද හිමියන්ගේ ඡන්ද වෙනත් පුද්ගලයින් විසින් ව්‍යාජ ලෙස භාවිතා කිරීමේ ප්‍රයත්නයක් ඇති බවට ලද පැමිණිල්ල පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්වීමට සිදු විය. මෙහිදී මේ සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වූ දේශපාලනඥයින්, මැතිවරණ බලධාරීන් හා කොමසාරිස්වරයා අතර අවස්ථා කීපයකදී උණුසුම් වාද විවාද ඇතිවී ඇති අතර ව්‍යාජ ලෙස ඡන්දය පාවිච්චි කිරීම වැළැක්වීම සඳහා ඡන්ද පොළේදී ප්‍රකාශ පත්‍ර අත්සන් කරවීමට පියවර ගැනීම මගින් එවැනි ප්‍රයත්න යම්තාක් දුරකට වැළැක්වීමට හැකි විය.

286. ඡන්ද පොළේදී ඡන්ද දායකයින් ඡන්ද දී ඇත්තේ කවරෙකුටද යන්න ගණන් කරන අවස්ථාවේදී සොයාගත හැකි බැවින් ඡන්ද හිමියන් විසින් වෙනත් අයුරින් ඡන්දය භාවිතා නොකර ස්වකීය පක්ෂයට ඡන්දය දී මනාපය තමන්ට ලකුණු කළයුතු බවට සමහර දේශපාලඥයින්/ අපේක්ෂකයින් විසින් පතුරවන ලද ප්‍රචාරය හේතුවෙන් තැපැල් ඡන්ද දායකයින් හා සාමාන්‍ය ඡන්ද දායකයින් තුළ බියක් ඇති වී ඇති බවට ලද පැමිණිලි පිළිබඳව සොයා බලනු ලදුව එවැනි ප්‍රචාර සිදු කර ඇති බව සනාථ විය. එබැවින් ඒ තත්ත්වය මගහැරවීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ විශේෂ වැඩපිළිවෙලක් උතුරු පළාතේ ක්‍රියාත්මක කරන ලද අතර ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සියලුම දේශපාලන පක්ෂවල සහාය ලැබීම නිසා එම දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙල හරහා ජනතාවගේ බිය නැති කිරීමේ කාර්යය සාර්ථක කරගත හැකිවිය.

එමෙන්ම මේ අයුරින් වන්නි මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචිව සිටින එහෙත් අනුරාධපුරය හා පුත්තලම දිස්ත්‍රික්කයේ ද පදිංචියක් ඇති පුද්ගලයන් අදාළ ඡන්ද මධ්‍යස්ථානවලට දේශපාලකයන් විසින් සංවිධානාත්මකව ප්‍රවාහනය කිරීමේ වැඩපිළිවෙලක් වැලැක්වීමට ද මැතිවරණ නිලධාරීන්ට වෙහෙසකර ආයාසයක් දැරීමට සිදු විය. කෙසේ වුවද පවතින නීතීවල සිදුරු වලින් රිංගීමට සමහර දේශපාලකයින් දැරූ ප්‍රයත්නය වැලැක්වීම බෙහෙවින් අසීරු වූ බව සඳහන් කල යුතුව තිබේ.

287. ඡන්ද ගණන් කිරීමෙන් අනතුරුව ඒ ඒ ඡන්ද ගණන් කිරීමේ ශාලාවේ ප්‍රතිඵලය අනුව ඒ ඒ ප්‍රදේශයේ, ඡන්ද දායකයින් ඡන්දය ලබාදී ඇත්තේ කවර ආකාරයකින්ද යන්න සොයාගත හැකි බැවින් ඡන්දය භාවිතා කළ යුත්තේ යම්කිසි නිශ්චිත පක්ෂයකට පමණක් බවට ඡන්ද හිමියන් වෙත නොහඳුනන පිරිස් තර්ජනය කරන බවට වන්නි ප්‍රදේශයේත්, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේත්, යාපනයෙහි දූපත් ප්‍රදේශවලත් පුරවැසියන් වෙතින් හා තරඟ කළ දේශපාලන පක්ෂවලින් ලැබී තිබුණු පැමිණිලි අසත්‍ය ලෙස සලකා බැහැර කළ නොහැකි බව සනාථ විය. එහෙයින් මෙතෙක් ඒ ඒ ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට අංක අනුපිළිවෙලින් ඡන්ද කොට්ඨාස, ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙන් කිරීම වෙනුවට සමස්ත ඡන්ද ප්‍රදේශයේම අංක අහඹු ලෙස තෝරාගත් ඡන්ද කොට්ඨාස/ ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට වෙන් කිරීමට කොමසාරිස්වරයා උපදෙස් දෙන ලදී. ඒ අනුව ඡන්ද ප්‍රතිඵලය නිකුත් කිරීමෙන් අනතුරුව සමස්ත ඡන්ද ප්‍රදේශයේම හැර ඒ ඒ කුඩා පරිපාලන ඒකකවල ඡන්දය පාවිච්චි කර ඇති ආකාරය කිසිවෙකුට සොයා ගැනීමට නොහැකි විය.

වයඹ පළාත
පුත්තලම දිස්ත්‍රික්කය

288. මැතිවරණ කොමසාරිස්වරයා, 2013.07.30 දින අමාත්‍යාංශ නිලධාරීන් හා රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට යවා ඇති උපදෙස් අනුව, ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශය විසින් දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව කුරුණෑගල, පුත්තලම සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල සිදු කරන ජනතා සත්කාරක වැඩසටහන් කිසිදු දේශපාලන පක්ෂයකට, කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට සහායක් දැක්වෙන ආකාරයට නොපැවැත්විය යුතු බව අදාළ නිලධාරීන්ට එම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් දන්වා ඇත.

289. පැෆරල් සංවිධානය විසින් 2013.08.19 වැනි දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා ඇත්තේ, පුත්තලම සිනමාහලක්, පක්ෂ කාර්යාලයක් වශයෙන් භාවිතා කරන බවත්, එම ගොඩනැගිල්ල පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බැවින්, එහි පක්ෂ කාර්යාල පිහිටුවීම සිදු නොකළ යුත්තක් බවයි. එම ගොඩනැගිල්ල යම් පාර්ශ්වයකට බදු දී ඇති බවට ආරංචි වුව ද පුත්තලම සහකාර මැතිවරණ කොමසාරිස්ට 2013.08.21 වන දින දැනගත හැකි වූයේ, එය යම් පුද්ගලයෙකුට දීර්ඝ කාලීන බදු දීමක් වෙනුවෙන්, පුත්තලම ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කෙරෙමින් පවතින බවයි. එම තත්ත්වය යටතේ අදාළ පක්ෂ කාර්යාලය එම ස්ථානයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇත.

290. පුත්තලම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් ගුඩ්ෂෙඩ් වීදියේ ගොඩනැගිල්ලක, පළාත් සභා අපේක්ෂකයකු පක්ෂ කාර්යාලයක් පවත්වා ගෙන යන බවට ලද පැමිණිල්ල අනුව එය ඉවත් කිරීමට ක්‍රියා කරන ලෙස දැන්වීමෙන් පසු, අදාළ ගොඩනැගිල්ලේ යතුරු එම පාර්ශ්වය විසින් 2013.09.05 දින ප්‍රාදේශීය ඉංජිනේරු වෙත ලබා ගැනීමට ක්‍රියා කර ඇත.

291. වෙන්නප්පුවේ බැංකු ශාඛාවක වාහනයක් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදවන බවට 2013.08.13 වන දින, ලද පැමිණිල්ල අනුව එම බැංකුවේ ප්‍රධාන විධායක ගෙන් කළ විමසීමකින් පසු ඔහු එම වාහනය ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කළ බව 2013.08.23 වන දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා ඇත.

292. පුත්තලම දිස්ත්‍රික්කයේ නීතිවිරෝධී ප්‍රචාරණ කාර්යාල පැවැත්වීම පිළිබඳව කරුණු සොයා බැලීම සඳහා යොදවා තිබූ මැතිවරණ හා පොලිස් නිලධාරීන් විසින් වෙන්නප්පුව ප්‍රදේශයේ අපේක්ෂකයෙකුගේ නීතිවිරෝධී ප්‍රචාරණ කාර්යාලයක් ඉවත් කරවීමෙන් අනතුරුව එම අපේක්ෂකයා විසින් මැතිවරණ නිලධාරීන් හා පොලිස් නිලධාරීන් බීමත්ව පැමිණ තමාට අනර්ථයක් කළ බවට චෝදනා කරන ලදී. එම චෝදනාව පැහැදිලිවම අසත්‍ය චෝදනාවක් බැවින් වහාම ක්‍රියාත්මක වූ කොමසාරිස්වරයා එකී නිලධාරීන් වෛද්‍ය පරීක්ෂණයකට යොමු කර ඔවුන් මත්පැන් පානය කර නොමැති බව සනාථ කරවාගෙන අදාළ ව්‍යාජ චෝදනාව ඉදිරිපත් කළ අපේක්ෂකයාගේ පක්ෂ ලේකම්වරයා හා ජාතික සංවිධායකවරයා වෙත මේ අපේක්ෂකයාගේ නොමනා ක්‍රියාව පිළිබඳ පැමිණිලි කරන ලදී. සිද්ධිය පිළිබඳව බලවත් කණගාටුව ප්‍රකාශ කළ ඔවුන්, අදාළ අපේක්ෂකයාට නිසි උපදෙස් දෙන බවත්, එම ප්‍රදේශයේ නීති විරෝධී කාර්යාල ඉවත් කරවීමට ඔවුන් පියවර ගන්නා බවත් දන්වන ලදී. ඉන් අනතුරුව එම ප්‍රදේශයේ එවැනි ගැටලුවක් මතු නොවීය.

කුරුණෑගල දිස්ත්‍රික්කය

293. නාමයෝජනා භාර ගැනීමෙන් අනතුරුව කිසිදු පක්ෂයකට හෝ කණ්ඩායමකට පෙළපාලි හෝ රැස්වීම් පැවැත්වීමට ඉඩ නොදිය යුතු බවට මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2013.08.01 වන දින දී තිබූ උපදෙස්වලට පටහැනිව, කුරුණෑගල බස් නැවතුම්පොළෙහි පිළිගත් දේශපාලන පක්ෂයක දේශපාලනඥයින් පිරිසක් පවත්වන ලද රැස්වීම, ඒ සඳහා භාවිතා කරන ලද ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා වූ විදුලි සැපයුම අක්‍රිය කිරීමෙන් පසු අවසන් කිරීමට පොලිස් නිලධාරීන්ට සිදු වූ බව වාර්තා විය.

294. තවත් කරුණු කිහිපයක් ද ඇතුළුව කැඳේ සංවිධානය විසින් 2013.08.05 වන දින වයඹ පළාත් සභාවේ මාධ්‍ය ඒකකයේ නිලධාරීන් දෙදෙනකු හිටපු පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරයා නාමයෝජනා භාර දීමට පළාත් සභාවට පැමිණෙන අවස්ථාවේ රාජකාරී කටයුත්තක් ලෙස එම කටයුතු ඡායරූපගත කිරීමට සූදානමින් සිටි ආකාරය පැමිණිලි කිරීමෙන් අනතුරුව, මැතිවරණ කොමසාරිස්වරයාගේ දැන්වීම පරිදි මොවුන් දෙදෙනාගේ එම උපකරණ 2013.08.13 වන දින පළාත් සභාවේ ගබඩාවට භාරගෙන කාර්යාලයේ සේවයට ඔවුන් අනුයුක්ත කළ බව 2013.08.16 වන දින එම පළාත් සභාව විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා ඇත.

295. ප්‍රධාන පිළිගත් දේශපාලන පක්ෂයකින් කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා තරග කරන අපේක්ෂකයෙකු බිංගිරිය සරණංකර ජාතික පාසල

ආසන්නයේ පක්ෂ කාර්යාලයක් පවත්වාගෙන යාම, එම විදුහලේ පැවැත්වෙන අධ්‍යයන උසස් පෙළ විභාග කටයුතුවලට බාධාවක් බවට එම විදුහලේ සිසු සිසුවියන්ගේ දෙමාපියන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත කරන ලද පැමිණිල්ල අනුව, එම කාර්යාලය 2013.08.09 වන දින එම ස්ථානයෙන් ඉවත් කිරීමට පොලිසිය මගින් ක්‍රියා කර ඇත.

296. කුලියාපිටිය ප්‍රදේශයේ පාසල්වල ළමුන්ගේ දෙමාපියන්, ගුරුදෙගුරු රැස්වීම් වෙනුවෙන් කැඳවා, එම රැස්වීම් අතරතුර පළාත් සභා ඡන්ද විමසීමට ඉදිරිපත් වන අපේක්ෂකයින්ට පැමිණීමට ඉඩදී, ඔවුන් ලවා දෙමාපියන්ට ඡන්දය දීමට බලපෑම් කරන ආකාරයේ කථා පැවැත්වීමට ඉඩ දෙන බවට ලද පැමිණිලි නිසා, එම වැඩපිළිවෙල නතර කරන ලෙසට 2013.08.08 වන දින මැතිවරණ කොමසාරිස්වරයා විසින් වයඹ පළාත් අධ්‍යාපන ලේකම්වරයාට දන්වා ඇත.

297. පළාත් සභාවේ හිටපු මහ ඇමතිවරයාගේ නිලනිවස, අදාළ පළාත් සභාව විසුරුවාලීමෙන් පසුව පළාත් සභාව වෙත භාර දී නොතිබිණි. එය රජයේ දේපළක් හැටියට පළාත් සභාව වෙත භාර දිය යුතු බවට මැතිවරණ කොමසාරිස් විසින් කරන ලද දැන්වීම අනුව, ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා එම නිල නිවස පළාත් සභාවට 2013.08.23 හෝ ඊට පෙර භාර දිය යුතු බව අදාළ අයට 2013.08.22 වන දින දැනුම් දී ඇත.

298. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මහජන සේවය වෙනුවෙන් නිදහස් තැපෑල භාවිතා කිරීමට දී ඇති අවසරය, මෙම පළාත් සභා ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන තම පක්ෂය නියෝජනය කරන අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා දේශපාලන පක්ෂ නියෝජනය කරන මහජන නියෝජිතයින් කටයුතු කරන බවට, සාක්ෂි සහිතව ඉදිරිපත් වූ පැමිණිලි මත, ඒ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරන ලෙසට 2013.09.13 වන දින මැතිවරණ කොමසාරිස්වරයා විසින් පාර්ලිමේන්තු මහලේකම්වරයාට දන්වා ඇත.

299. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණ දැන්වීම් පළවීම සහ ඡන්ද විමසීම් නීතිය අනුව තේරීම්භාර නිලධාරීන්ට හා අදාළ පොලිස් ස්ථානවලට නිවේදනය නොකරන ලද ඡන්ද විමසීම් කාර්යාල, පක්ෂ හා කණ්ඩායම් විසින් ද, අපේක්ෂකයන් විසින් ද පවත්වාගෙන යාම පිළිබඳව ලද පැමිණිලි නිසා, එම කටයුතු පිළිබඳ සොයා බලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මැතිවරණ කොමසාරිස්වරයාගේත්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීගේත් උපදෙස් අනුව පොලිස් නිලධාරීන් ද සමග අදාළ උපදෙස් දෙන ලද රජයේ නිලධාරීන් කණ්ඩායම් 2013.09.05 වන දින යොදන ලදී. මහව දළදාගම ප්‍රදේශයේ, මේ අන්දමින් විදුලි කණුවල යොදා තිබූ නීති විරෝධී දැන්වීම් නිලධාරීන් විසින් ඉවත් කරන අවස්ථාවේ, ඒ ආසන්නයේ තිබූ ඡන්ද විමසීම් කාර්යාලයක් ද නිලධාරීන් විසින් පරීක්ෂාවට භාජනය කර ඇත. මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි එම කාර්යාලයෙහි අදාළ පක්ෂය විසින් තේරීම්භාර නිලධාරී වෙත සිය කාර්යාලය සම්බන්ධයෙන් කර ඇති නිවේදනයෙහි පිටපතක් ප්‍රදර්ශනය කර නොතිබූ බැවින්, ඒ පිළිබඳව විමසීමේ දී එවැන්නක් ඉදිරිපත් කිරීමට එහි සිටි අයට නොහැකි වී ඇත. මේ නිසා එම කාර්යාලය නීති විරෝධී කාර්යාලයක් ලෙස සලකා අදාළ සැරසිලි ඉවත් කිරීමට පොලිස් නිලධාරීන් හා සේවකයන් සැරසුණු අවස්ථාවේ, එම ස්ථානයට තවත් පිරිසක් ද සමග පැමිණි පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයා නිලධාරීන්ට තර්ජනය කරමින්, එම අය පැමිණි වාහනවල යතුරු ද රැගෙන ඔවුන් රඳවා ගන්නා ලදී. මේ නිසා නිලධාරීන් සඳහා ආරක්ෂාව සපයන ලෙස මහව පොලිස් ස්ථානාධිපතිවරයාට ද නිලධාරීන් දැනුම් දී ඇත. එම නිලධාරීන්ගේ දැඩි උත්සාහය මත පොලිස් නිලධාරීන් හා රජයේ නිලධාරීන් ද, ඔවුන්ගේ වාහන ද මුදා ගත් අතර, ඒ පිළිබඳව ප.ව. 6.20 ට පමණ මහව පොලිසියට ද අදාළ නිලධාරීන් විසින් පැමිණිලි කර සිටින ලදී. එදිනම අදාළ අපේක්ෂකයා ද ඡන්ද විමසීම් කාර්යාලයට හානි කිරීම් පිළිබඳව එදින ප.ව. 11.35 ට එම පොලිසියට පැමිණිලි කර තිබූ අතර, එම පැමිණිලි දෙකෙන් පොලිසිය විසින් පළමුව විභාග කොට ඇත්තේ ප්‍රමාද වී ලැබුණු පැමිණිල්ල බවද වාර්තා විය. ඒ අනුව පොලිසිය විසින් අදාළ රජයේ නිලධාරීන් විත්තිකරුවන් කරමින් නඩු පැවරීමට ද ක්‍රියා කර ඇත. මෙහි දී පොලිසිය සිදු කළ විමර්ශන කටයුතු පිළිබඳ සෑහීමකට පත් විය නොහැකිය.

300. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිළිගත් දේශපාලන පක්ෂයකින් තරඟ කළ අපේක්ෂකයන් අතර මනාප සඳහා පැවති මහා තරඟය හේතුවෙන් නීත්‍යානුකූල නොවන හා අසම්මත ක්‍රමවේද භාවිතා කිරීම පිළිබඳව නිරතුරුවම පැමිණිලි ලැබිණි. පක්ෂ/ අපේක්ෂක සලකුණු හා අංක සඳහන් ටී-ෂර්ට් බෙදා දී පාපැදි තරඟ හෝ පාපැදි සංචාර සංවිධානය කිරීම, බෞද්ධ භික්ෂූන් වහන්සේ, කිතුනු පූජකවරුන් හා ඉස්ලාමික මවුලවිවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන ආගමික වැඩසටහන් මුවාවෙන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, දැවැන්ත වාහනවල සවිකළ ජංගම වේදිකා භාවිතා කර අනවසර රැස්වීම්/ සංගීත සංදර්ශන පැවැත්වීම්, ඡන්ද හිමියන් සමූහ වශයෙන් කැඳවා ආහාරපාන හා මත්පැන් දිවා/රාත්‍රී සැපයීමට ක්‍රියා කිරීම මේ අතුරින් ප්‍රධාන විය.

එමෙන්ම ස්වාධීන කණ්ඩායම්වල හා සැබෑ ලෙස තරග නොකරන දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්ගේ ඡන්ද කාර්යාල හරහා එම ස්වාධීන කණ්ඩායම්වලට/ දේශපාලන පක්ෂවලට මූල්‍ය අනුග්‍රහය දැක්වූ වෙනත් පක්ෂවල අපේක්ෂකයන්ගේ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම, කුරුණෑගල දිස්ත්‍රික්කයේදී සෙසු පළාත්වලට වඩා වැඩි වශයෙන් සිදුවන බව නිරීක්ෂණය විය. කුරුණෑගල තේරීම්භාර නිලධාරී, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් හා සෙසු සහායක නිලධාරීන්, පොලිස් නිලධාරීන් හා එක්ව මෙම තත්ත්වය පාලනය කිරීමට උපරිම උත්සාහ දරන ලද අතර එමගින් බොහෝ දුරට මෙම අනීතික ක්‍රියා පාලනය කිරීමට හැකි විය.

බස්නාහිර පළාත
කොළඹ දිස්ත්‍රික්කය

301. මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලද පැමිණිල්ලක් සම්බන්ධව විමසීමේ දී 2014.02.07 දින මොරටුව පොලීසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා ඇත්තේ, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කරනු ලබන අපේක්ෂකයෙකුගේ පෞද්ගලික ලේකම්වරයකු යැයි කියාගත් අයෙකු විසින් බස්නාහිර පළාත් මාර්ගස්ථ සංවර්ධන අධිකාරියෙන් ලබාගත්, ත්‍රිරෝද රථ සඳහා වූ මීටර 54ක්, ත්‍රීවීලර් පදවන්නන් රැස් කර ඔවුන් වෙත ලබා දී ඇති බවය.

302. මෙම ඡන්ද විමසීම් අවස්ථාවේ දී ඡන්ද විමසීම තරග කරනු ලබන අපේක්ෂකයන්ට සිය ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් භාවිතා කරනු ලබන එක් වාහනයක සිය දැන්වීම්, කොඩි ආදිය ප්‍රදර්ශනය කිරීමට ඡන්ද විමසීම් නීතිය අනුව ඉඩ තිබුන ද, ඊට අනුගත නොවී පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු සිය ප්‍රචාරක වාහන 4 ක තම ඡායාරූප, ලකුණු හා හඳුනා ගැනීමේ අංකය ආදිය ප්‍රදර්ශනය කිරීම ගැන 2014.02.25 වන දින මැතිවරණ නිරීක්ෂණ ආයතනයක් වූ කැමේ සංවිධානයෙන් ලද පැමිණිල්ල අනුව පොලිසියට දෙන ලද උපදෙස් මත, අමතර වාහන 3 හි අදාළ ප්‍රදර්ශණ දැන්වීම් ඉවත් කළ බව නුගේගොඩ පොලිස් අධිකාරීවරයා 2014.03.07 දින මැතිවරණ කොමසාරිස්වරයාට දන්වා ඇත.

303. කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය ඉදිරිපිට දී කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් දේශපාලන පක්ෂයක් නියෝජනය කරන අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට 2014.03.07 දින අදාළ දැන්වීම් හා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් නීති විරෝධීව ගමන් ගත් වාහනයක් මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ මැදිහත්වීම මත පොලිස් භාරයට පත්කොට පොලිස් පරීක්ෂණ සඳහා යොමු කරන ලදී.

304. කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් දේශපාලන පක්ෂයක් නියෝජනය කරමින් තරග වදින අපේක්ෂකයකු, රත්මලාන, ගාලුපාරේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක අනවසරයෙන් නීත්‍යානුකූල නොවන ආකාරයට පවත්වා ගෙන යන ලද මැතිවරණ ප්‍රචාරණ කාර්යාලයක් පිළිබඳ පැමිණිල්ලක් ලැබීමෙන් පසු 2014.03.20 දින පොලිසිය මාර්ගයෙන් එම කාර්යාලය ඉවත් කරන ලදී.

305. කොළඹ කෙසෙල්වත්ත හා මාලිගාවත්ත යන ප්‍රදේශවල, කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කළ ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් පිහිටුවා තිබූ නිවේදිත ඡන්ද විමසීම් කාර්යාල 7 ක් මෙම ඡන්ද විමසීම වෙනුවෙන් තරග කරන ලද පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු වෙනුවෙන් පිහිටුවනු ලැබූ ප්‍රචාරණ කාර්යාල වශයෙන් කටයුතු කිරීම නිසා ඒ පිළිබඳව ලද පැමිණිලි අනුව එම කාර්යාල පොලිසිය මගින් ඉවත් කරවීමට ක්‍රියා කර ඇත.

306. නිවාස ණය පුද්ගලයන්ට ලබාදීම සඳහා සුදුස්සන් තෝරා ගෙන එවැනි පුද්ගලයින්ට ණය නිකුත් කිරීමේ කටයුතු, ඡන්ද විමසීම් කාලය තුළ පළාත් සභා වෙනුවෙන් තරග කරන අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන 2014.03.20 දින, හෝමාගම ප්‍රදේශයේ විදුහලක දී සිදු කිරීමට එම රාජ්‍ය අංශයේ අධිකාරියක් කටයුතු පිළියෙල කර ඇති බවට දේශපාලන පක්ෂයක් නියෝජනය කළ අපේක්ෂකයෙකුගෙන් ලද පැමිණිල්ලක් විය. ඒ අනුව එම කාර්යය ඡන්ද විමසීම් කාලය තුළ සිදු කළ යුතු වේනම්, පළාත් සභා ඡන්ද විමසීම තරග කරන දේශපාලන පක්ෂ හා ඒවායේ අපේක්ෂකයින්ගේ මැතිවරණ ව්‍යාපාරයට රුකුලක් නොවන ආකාරයට එම අපේක්ෂකයන්ගේ සහභාගීත්වයෙන් තොරව සිදු කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ අධිකාරිය අයත් වන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වන ලදී.

307. පෞද්ගලික මගී බස්රථ මෙන්ම ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ ද අපේක්ෂකයින්ගේ ප්‍රචාරණ දැන්වීම් පළ කිරීම සඳහා යොදාගැනීම ප්‍රචලිතව දැකිය හැකි වූ මැතිවරණ නීති කඩකිරීම කි. මෙවැනි නීත්‍යානුකූල නොවූ දැන්වීම්, දේශපාලන පක්ෂයක් නියෝජනය කළ අපේක්ෂකයන් දෙදෙනෙනකුට අදාළව තලංගම ඩිපෝවට අයත් මගී බස් රථවල අලවා තිබීම පිළිබඳව දේශපාලන පක්ෂයක ලේකම්වරයකුගේ ලද පැමිණිල්ලක් අනුව, ඒ පිළිබඳව 2014.03.21 දින අදාළ ඩිපෝ අධිකාරීවරයා ද දැනුවත් කර ක්‍රියා කරන ලදී.

308. ජගත් කාන්තා දිනය සැමරීමේ මුවාවෙන් ප්‍රධාන පිළිගත් දේශපාලන පක්ෂයක් නියෝජනය කළ පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයෙකුගේ ප්‍රධානත්වයෙන් දේශපාලන රැස්වීමක්, 2014.03.08 දින කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වනු ලබන බවට ලද පැමිණිල්ලක් පරීක්ෂා කිරීමට තවත් නිලධාරීන් හා පොලිස් නිලධාරීන් ද සමග එම කාර්යාලයේ පිහිටුවා තිබූ පැමිණිලි භාරගැනීමේ ස්ථානය භාර නිලධාරී එම ස්ථානයට ගොස්, එම උත්සවයේ කටයුතු නිරීක්ෂණය කර ඇත. එම අවස්ථාවේ එම කරුණු සෙවීම පිළිබඳ උරණ වූ අදාළ මහජන නියෝජිතයා, ඉතා පහත් අන්දමින් නිලධාරීන්ට බැණ වැදී ඇත. මේ සම්බන්ධව එම නියෝජිතයා නියෝජනය කරනු ලැබූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා වෙත මේ සිද්ධිය පිළිබඳව දැන්වූ මැතිවරණ කොමසාරිස්වරයා කැස්බෑව ප්‍රදේශයේ ඡන්ද විමසීමක් පැවැත්වීමට නොහැකි බවට වාර්තාවක් ප්‍රකාශයට පත් කරන බව දැනුම් දෙන ලදී. ඉන් අනතුරුව මේ පිළිබඳව එකී පක්ෂයේ නිසි බලධාරීන් විසින් කණගාටුව ප්‍රකාශ කරන ලද අතර තවදුරටත් මෙවැනි සිද්ධි ඇති වීමට ඉඩ නොතබන බවද දන්වන ලදී.

309. හෝමාගම ප්‍රදේශයේ දී අනවසර ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම් හා නීති විරෝධී ප්‍රචාරක කාර්යාල පවත්වාගෙන යෑම් පිළිබඳව සොයාබැලීම පිණිස පොලිස් නිලධාරීන් සමග ක්ෂේත්‍ර රාජකාරිවල නිතරවූ නිලධාරීන්ට හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වූ පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු හා ඔවුන්ගේ ආධාරකරුවන් විසින් කරනු ලැබූ බියවැද්දීම් හා තර්ජන සම්බන්ධයෙන් විමසීමේ දී කොළඹ දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරයාට ද එම අපේක්ෂකයන් හා ආධාරකරුවන් තර්ජනය කරනු ලදුව එම අපේක්ෂකයන් අයත් පක්ෂයේ ලේකම්වරයාට ඒ බව දන්වා එකී අපේක්ෂකයා සම්බන්ධයෙන් වහාම ක්‍රියාකිරීමේ අවශ්‍යතාව මැතිවරණ කොමසාරිස් විසින් සංනිවේදනය කරන ලදී. ඉන් අනතුරුව එකී අපේක්ෂකයින් වරද පිළිගෙන කණගාටුව ප්‍රකාශ කරන ලදී.

කළුතර දිස්ත්‍රික්කය

310. දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කීප දෙනෙකු ද සේවකයින් සිය දෙනෙකු ද පමණ කළුතර දිස්ත්‍රික්කයෙන් තරග වදින අපේක්ෂකයෙකුගේ මැතිවරණ ව්‍යාපාරයට සම්බන්ධවී කටයුතු කිරීම, මැතිවණ නීති උල්ලංඝනය කිරීමක් මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට බාධාවක් ද වන බැවින්, එම කටයුතු නතර කිරීමට පියවර ගන්නා ලෙස 2014.03.19 දින පැෆරල් සංවිධානය, මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉල්ලා ඇත. ඒ පිළිබඳ තවත් පැමිණිල්ලක් 2014.03.20 දින ද ලැබී තිබුණි. මේ සම්බන්ධව මැතිවරණ කොමසාරිස්වරයාගේ විමසීමකට දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා පිළිතුරු එවා ඇත. පැමිණිල්ලේ සඳහන් එක් නිලධාරියෙකු අසනීප හේතුවෙන් සේවයට වාර්තා නොකළ කාලය වෙනුවෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් නොකිරීම නිසා ඔහු වෙත 2014.03.01 දින සේවය හැර යාමේ ලිපියක් නිකුත් කර ඇති බවත්, අදාළ රාජකාරී සඳහා යොදවා ඇති ආදේශක හා අනියම් කම්කරුවන් සංඛ්‍යාවට වැටුප් හා අතිකාල දීමනා ගෙවීමට අවශ්‍ය නිර්දේශ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියට ඉදිරිපත් කොට ඇති බවත් ය.

311. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලක පිහිටි පරිශ්‍රයේ ඇති මහජන පුස්තකාලයට යාබද ගොඩනැගිල්ලක, කළුතර දිස්ත්‍රික්කය සඳහා දේශපාලන පක්ෂයකින් ඡන්ද විමසීම සඳහා තරග වදින අපේක්ෂකයකු විසින් නීතිවිරෝධී මැතිවරණ ප්‍රචාරණ කාර්යාලයක් පවත්වාගෙන යන බවට කළුතර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයාට ලද පැමිණිල්ලක් අනුව කරුණු සෙවීමේ දී හෙළි වූයේ එම ගොඩනැගිල්ල බදු ගැනීමට පුද්ගලයෙකු ඉදිරිපත්ව ඇතත් එම බදු දීමේ කටයුත්ත ප්‍රාදේශීය සභාව විසින් අවසන් කර නොමැති බවය. එම වාර්තා ලද මැතිවරණ කොමසාරිස්වරයා, අදාළ ගොඩනැගිල්ලේ නීත්‍යානුකූල නොවන මැතිවරණ ප්‍රචාරණ කටයුතු කිරීමට ඉඩ නොතබා, එම ගොඩනැගිල්ලේ භාරකරු වූ මතුගම ප්‍රාදේශීය සභාවේ භාරයට එය ලබා ගත යුතු බව අදාළ සභාවට දන්වා ඇත.

312. දේශපාලන පක්ෂයක් විසින් අගලවත්ත ඡන්ද ප්‍රදේශයේ කුමිදුව හන්දියේ පවත්වාගෙන යන ඡන්ද ප්‍රචාරණ කාර්යාලයක් පිළිබඳව 2014.02.08 දින ලද පැමිණිල්ල අනුව සෙවීමේදී එහි සත්‍යතාවය හෙළිවීමෙන් පසු එය පොලිසිය ලවා ඉවත් කිරීමට කටයුතු කර ඇත.

313. මැතිවරණ නිරීක්ෂණ ජාලය නැමැති මැතිවරණ නිරීක්ෂණ සංවිධානයත්, ඉන් අනතුරුව තවත් දේශපාලන පක්ෂ කීපයක්ම 2014.02.14 දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා තිබුණේ, 2014.02.13 දින අමාත්‍යාංශ ලේකම්වරයකු, බස්නාහිර පළාත් සභාව සඳහා ඡන්ද විමසීමට පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කරන අපේක්ෂකයෙකුගේ ජයග්‍රහණය වෙනුවෙන් පැවැත්වූ මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් අමතා තිබූ බවය. මේ සම්බන්ධව දේශපාලන පක්ෂ නියෝජිතයින් සමග මැතිවරණ කොමසාරිස්වරයා පැවැති සාකච්ඡාවලදී ද අවධානය යොමු වී ඇත. රජයේ නීතිය අනුව, දේශපාලන

අයිතිවාසිකම් නොමැති මෙවැනි නිලධාරීන්, තමන් දරන දේශපාලන මතය පරිදි ඡන්ද විමසීමක් තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට පක්ෂපාතීත්වයක් දක්වා කටයුතු කිරීම නිසා ඇතිවිය හැකි ඵල විපාක මැතිවරණ කොමසාරිස්වරයා එම අපේක්ෂකයා අයත් වන දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට ද, එම පක්ෂයේ ජාතික සංවිධායකවරයාට ද දැනුම් දී ඇත. ඉන් අනතුරුව එම අනීතික ක්‍රියා සිදුනොවීය.

314. එක් අපේක්ෂකයකුගේ මනාප අංකය ප්‍රදර්ශනය කිරීම සඳහා දේශපාලනඥයෙකුගේ උපන්දිනය සඳහන් සුභපැතුම් ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කරන බවට ලද පැමිණිලි කිහිපයක් සැලකිල්ලට ගෙන එවැනි සුභපැතුම් ප්‍රචාරක පුවරු ඉවත් කිරීමට පියවර ගන්නා ලද අතර ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශවය හා අධිකාරීන් අසතුටට පත්වී ඇති බව නිරීක්ෂණය වූ නමුත් කරුණු පැහැදිලි කරදීමෙන් පසු එකී පුවරු ප්‍රදර්ශනය වැළැක්වීමට බාධා ඇති නොවීය.

315. අපේක්ෂකයකුගේ අනුග්‍රහය ලබාගෙන ඔහුට ප්‍රචාරය ලබාදීම සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් හා මනාප අංක සහිත ඇඳුම්, තොප්පි ලබා දෙමින් ක්‍රිකට්, වොලිබෝල්, පාපන්දු තරඟ සංවිධානය කරන බවට දිගින් දිගටම පැමිණිලි ලැබුණු අතර අපේක්ෂකයින් ප්‍රවර්ධනය සඳහා පාසැල් දරුවන් අතර ක්‍රිකට් තරඟ සංවිධානය කිරීම වැලක්වීමට මැතිවරණ නිලධාරීන් ක්‍රියා කරන ලදී. අදාළ විදුහල්පතිවරයකුට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීම ආරම්භක පියවර ගැනීමත් සමග මෙම ක්‍රීඩා තරඟ සංවිධානය හරහා ප්‍රචාරණ කටයුතු කිරීමේ ප්‍රයත්නය ව්‍යර්ථ කළ හැකි විය.

ගම්පහ දිස්ත්‍රික්කය

316. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂයක පාර්ලිමේන්තු මහජන නියෝජිතයෙකු, මෙවර පළාත් සභා ඡන්ද විමසීමට තම දේශපාලන පක්ෂයෙන් එම දිස්ත්‍රික්කයට තරගවදින සිය සොහොයුරාගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, පාසල් සංවර්ධන සමිතිවල දෙමාපියන්, විදුහල්පතිවරුන් මගින් රැස්වීම් සඳහා කැඳවා, රජයෙන් පාසල්වලට ප්‍රතිපාදන ලබාදෙන බව දන්වමින් ඡන්දදායකයින්ට බලපෑම් කරන බවට එම දිස්ත්‍රික්කයේ අධ්‍යාපන බලධාරීන්, ගම්පහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට 2014.03.10 දින පැමිණිලි කර ඇත.

317. විශාල බස් රථවල මුළු බස් රථයේම බාහිර ප්‍රදේශ ආවරණය වන පරිදි අපේක්ෂකයන්ගේ ප්‍රචාරණ දැන්වීම් පළ කිරීමේ ඇති වාසි සහගත තත්ත්වය නිසා සමහර අපේක්ෂකයින් තම නිල රථය වශයෙන් බස් රථ යොදා ගන්නා බවට පැමිණිලි ලැබිණි. මෙවැනි බස්රථ මහජනයා ගැවසෙන ප්‍රධාන නගරවල ප්‍රසිද්ධ ස්ථානවල ගාල් කිරීම ද අපේක්ෂකයින්ගේ තවත් උපායකි. ගම්පහ දිස්ත්‍රික්කයේ පිළිගත් දේශපාලන පක්ෂයක් නියෝජනය කරනු ලැබූ මෙවැනි බස් රථයක් භාවිතා කරන අපේක්ෂකයකු පිළිබඳව ලද පැමිණිල්ල සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා ඡන්ද විමසීම තරග කරන පක්ෂවල නියෝජිතයින්ගේ රැස්වීමකදී ද සාකච්ඡා කරන ලදී. එම නියෝජිතයන්ට ද කරුණු වටහා දී එවැනි බස් රථ භාවිතය සඳහා අවසර නොදීමට තීරණය කරන ලදී. ගම්පහ දිස්ත්‍රික්කයේ අදාළ අපේක්ෂකයාට ද එම තීරණය මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.03.04 දින දන්වා ඇත.

318. ගම්පහ දිස්ත්‍රික්කය වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කළ අපේක්ෂකයකු විසින්, තමා විසින් පටිගත කළ මැතිවරණ ප්‍රචාරක දැන්වීමක්, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දුරකථන ජාලයට සම්බන්ධ දුරකථන ඔස්සේ ශ්‍රාවකයින් වෙත ලැබීමට සලස්වා ඇති බවට මැතිවරණ කොමසාරිස්වරයාට ලැබුණු පැමිණිල්ලකට අනුව, එම නිවේදනය කිරීම අත්හිටුවන ලෙස, විදුලි සංදේශ නියාමන කොමිසන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත මැතිවරණ කොමසාරිස්වරයා 2014.03.24 දින දන්වා ඇත.

319. මීගමුව ප්‍රදේශයේ පක්ෂ අපේක්ෂක ප්‍රචාරණ කටයුතු සඳහා මීගමුව මහ නගර සභාවේ රාජ්‍ය දේපළ හා නිලධාරීන් යොදාගන්නා බවට ලද පැමිණිල්ල සම්බන්ධයෙන් මැතිවරණ නිලධාරීන්ට විශේෂ අවධානයක් යොමු කිරීමට සිදු වූ අතර මීගමුව ප්‍රදේශයේ විශේෂ පැමිණිලි විමර්ශන කාර්යාංශයක් පිහිටුවීමෙන් මෙම තත්ත්වය පාලනය කරන ලදී.

320. මිනුවන්ගොඩ හා ගම්පහ ප්‍රදේශවල සමෘද්ධි නිලධාරීන්ගේ හා කෘෂිකර්ම ක්ෂේත්‍ර නිලධාරීන් රාජකාරී වෙලාව තුළ දේශපාලන ප්‍රවර්ධන කටයුතු සඳහා සහභාගී වන බවට ලද පැමිණිලි සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීම හරහා එකී අනීතික ක්‍රියා අවම කිරීමට හැකි විය.

321. රාජ්‍ය ආයතනවලින් නිවාස ණය ලබාදීමේ ආකෘති බෙදා හැරීමේ ව්‍යාපෘති මගින් පක්ෂ/අපේක්ෂකත්ව ප්‍රවර්ධනය පිණිස වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බවට ලද පැමිණිලි හේතු කොට ගෙන එවැනි නිවාස ණය නිකුත් කිරීමේ ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීමට උපදෙස් දෙනු ලැබිණි. මෙය එක් දිස්ත්‍රික්කයට පමණක් සීමා වූ පැමිණිල්ලක් නොවන බව සඳහන් කළ යුතුව තිබේ.

දකුණු පළාත
ගාල්ල දිස්ත්‍රික්කය

322. දකුණු පළාත් සභාවේ ප්‍රධාන තනතුරක් දරන නිලධරයකු විසින් එම පළාත් සභාව සඳහා තරග කරනු ලබන එක් පිළිගත් දේශපාලන පක්ෂයක් නිසැකවම ජය ලබන බවට 2014.02.11 දින ලංකාදීප පුවත්පතේ සඳහන් කරමින් පළ කෙරුණු පුවත්පත් සාකච්ඡාව පිළිබඳව, යම් යම් පාර්ශ්ව විසින්, මැතිවරණ කොමසාරිස්වරයා වෙත කරුණු ඉදිරිපත් කරන ලද අතර, ඡන්ද විමසීම් අවස්ථාවක එවැනි ප්‍රකාශ මගින් ඡන්ද විමසීම් ක්‍රියාවලියට ඇති වන ගැටලු සම්බන්ධව 2014.02.26 දින එම නිලධරයාට දැන්වූ මැතිවරණ කොමසාරිස්වරයා ඒ පිළිබඳව තරයේ අවවාද කරන ලදී.

323. මව්බිම පුවත්පතේ 2014.01.30 දින පළ වූ වාර්තාවක සඳහන් වූයේ, මෙවර පළාත් සභා ඡන්ද විමසීම සඳහා දකුණු පළාත් සභාවට තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකුගේ පූර්ව සේවා කාලය තුළ සිදු කර ඇති සේවාව අගය කිරීමට හා එම අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා 2014.01.11 දින පැවති හමුවක දී රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් අදාළ අයගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමට හේතු වන ප්‍රකාශයක් සිදු කර ඇති බවය. මේ සම්බන්ධව අදාළ නිලධාරියාගෙන් කරුණු විමසා බලා, සුදුසු පියවර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැන්වීමට ද මැතිවරණ කොමසාරිස්වරයා කටයුතු කරන ලදී.

324. සිනමා ශාලාවල චිත්‍රපටි ප්‍රදර්ශන ඉදිරිපත් කරනු ලබන අතරවාරයේ, මෙම ඡන්ද විමසීම තරග කරන අපේක්ෂකයන් සිය අපේක්ෂකත්වය ප්‍රවර්ධනය වන ආකාරයේ දැන්වීම් ප්‍රචාරය කරනු ලබන බවට මැතිවරණ දෙපාර්තමේන්තුවට කරුණු හෙළි විය. එබඳු දැන්වීම්, මුදල් ගෙවා හෝ එසේ නොමැතිව හෝ සිනමා ශාලාවල ප්‍රචාරණය නොකළ යුතු බවට සියලුම චිත්‍රපට සමාගම්වලට, සිනමා ශාලා අයිතිකරුවන්ට දන්වන ලෙස ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයාට මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.01.31 දින දැනුම් දී ඇත.

325. එසේම මෙවර පළාත් සභා ඡන්ද විමසීම සඳහා තරග කරන අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා මැතිවරණ දැන්වීම්, ඩිජිටල් පුවරු මගින් ප්‍රචාරය කිරීම ද සිදු වන බව දන්වා මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි ලැබී තිබිණි. එවැනි ඩිජිටල් දැන්වීම් පුවරු මගින් අපේක්ෂක ප්‍රවර්ධනයට අදාළ දැන්වීම් පළ නොකරන ලෙස පොලිසිය මාර්ගයෙන් එම ආයතනවලට දැනුම් දීමට ක්‍රියා කරන ලදී.

326. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පාර්ලිමේන්තුවෙන් ලබා දෙන නිදහස් තැපැල් පහසුකම් පිළිගත් දේශපාලන පක්ෂවලින්, පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් ඉදිරිපත්වන අපේක්ෂකයින් සඳහා භාවිතා කරනු ලබන බවට මැතිවරණ කොමසාරිස්වරයාට හෙළිවීමෙන් පසු, තැපැල්පතිවරයාට ඒ පිළිබඳව ගත හැකි පියවර කීපයක් 2014.02.21 දින යෝජනා කරන ලදී. නිල මුද්‍රාව රහිත එවැනි ලිපි තැපෑලට භාර නොගැනීම, ඡන්ද විමසීම් කාලවල දී නීත්‍යානුකූලව ඉදිරිපත් කරනු ලබන ලිපි තොග වශයෙන් භාර ගැනීම ප්‍රධාන තැපැල් කාර්යාලවලින් පමණක් සිදු කිරීම හා එසේ භාර දෙනු ලබන ලිපි පිළිබඳව අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හෝ එසේ නොමැති විට ඔහුගේ බලධරයෙකුගෙන් තැපෑල සඳහා භාර ගැනීමට කටයුතු කිරීම යන යෝජනා මැතිවරණ කොමසාරිස්වරයාගේ යෝජනාවලට ඇතුළත් විය.

327. වැවිලි ක්ෂේත්‍රයේ රජයේ අධිකාරියක් විසින් ඉඩම්වල පාංශු හා ජල රක්ෂණ කටයුතු සඳහා කුඩා තේවතු හිමියන්ට නිකුත් කරනු ලබන රු.5000/= ක දීමනා ප්‍රදානය, මෙවර දකුණු පළාත් සභාව වෙනුවෙන් තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කරන අපේක්ෂකයන්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය වන ආකාරයෙන් සිදු කරනු ලබන බවට මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිලි ලැබුණි. අපේක්ෂක ප්‍රවර්ධන වැඩපිළිවෙලකින් තොරව මෙම දීමනා ප්‍රදානයට කටයුතු කරන ලෙස, මැතිවරණ කොමසාරිස්වරයා දෙන ලද උපදෙස් පරිදි ගාල්ල, කළුතර හා මාතර යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කළමනාකරුවන්ට අදාළ අධිකාරියේ සභාපතිවරයා අවශ්‍ය උපදෙස් දී තිබිණි.

මාතර දිස්ත්‍රික්කය

328. මාතර දිස්ත්‍රික්කය වෙනුවෙන් මෙම පළාත් සභා ඡන්ද විමසීමේ දී තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු, තමා සභාපති ධුරය දරන පළාත් පාලන ආයතනයේ ට්‍රක් රථයක් තම නිවේදිත ඡන්ද විමසීම් කාර්යාලයේ රඳවා ගෙන සිටිය දී පොලිස් නිලධාරීන් විසින් එම වාහනය නීති විරෝධී අන්දමින් මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට යෙදවීම හේතුවෙන් අත්අඩංගුවට ගන්නා ලදී.

329. මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රාදේශීය සභාවකින් 2014.02.20 දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා තිබුණේ, එම සභාව සතු කැබ් රථ දෙකක් එම සභාවේ සභාපතිවරයා විසින් මෙවර පළාත් සභා ඡන්ද විමසීම සඳහා දේශපාලන පක්ෂයකින් ඉදිරිපත්ව ඇති අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් යොදා ගන්නා බැවින්, එම වාහන, ඡන්ද විමසීම් කාලය තුළ මැතිවරණ දෙපාර්තමේන්තුවේ

කටයුතු වෙනුවෙන් යොදා ගන්නා ලෙසය. ඒ අනුව එම වාහන, මැතිවරණ දෙපාර්තමේන්තුවේ රාජකාරී සඳහා යොදා ගැනීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.02.25 දින අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

330. මැතිවරණ නිරීක්ෂණ ආයතනයක් වන මැතිවරණ නිරීක්ෂණ ජාලය 2014.02.25 වන දින, මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ මාතර දිස්ත්‍රික්කය වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කරන අපේක්ෂකයකු විසින් අමාත්‍යාංශයකට අයත් ජීප් රථයක්, සිය ඡන්ද ව්‍යාපාරය වෙනුවෙන් භාවිතා කරනු ලබන බවයි. අදාළ අපේක්ෂකයාගේ මාතර, නූපේ අකුරැස්ස පාරේ පිහිටුවා ඇති එම අයගේ නිවේදිත ඡන්ද විමසීම් කාර්යාලයේ, අපේක්ෂකයාට අදාළ ප්‍රචාරක දැන්වීම් ද අලවා තිබූ එම ජීප් රථය මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2014.03.01 දින පෙ.ව. 11.40 ට රියදුරු ද සමඟ සොයා ගන්නා ලදී. එම ජීප් රථය කොළඹ පිහිටි කෘෂිකර්ම කටයුතු පිළිබඳ රජයේ පර්යේෂණ ආයතනයකට අයත් වූවක් වූ අතර, පොලිසිය විසින් එම ජීප් රථය 2014.03.03 දින අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන බව වාර්තා කර ඇත.

331. ප්‍රධාන පිළිගත් දේශපාලන පක්ෂයක් නියෝජනය කළ අපේක්ෂකයකු විසින් මාතර වෙරළ පාරේ, ඔහුගේ නිවේදිත මැතිවරණ කාර්යාලයක් අසල නීති විරෝධී අන්දමට ප්‍රදර්ශනය කරමින් තිබූ අදාළ අපේක්ෂකයාගේ විශාල ප්‍රමාණයේ ඡායරූප, 2014.03.28 දින මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඉවත් කිරීමට කටයුතු කළ අවස්ථාවේ එම රාජකාරියට විරෝධතාවය පළකොට අපේක්ෂකයාගේ ආධාරකරුවන් පිරිසක්, මාතර සහකාර මැතිවරණ කොමසාරිස්වරයාට සහ සෙසු නිලධාරීන්ට තර්ජනය කර රාජකාරියට බාධා කර ඇත. මේ තත්ත්වය යටතේ ඡන්ද විමසීමට අදාළ රාජකාරිවලින් ඉවත්වීමට මැතිවරණ නිලධාරීන්ට සිදුවන බව කොමසාරිස්වරයා විසින් පක්ෂ ලේකම්වරුන්ට දන්වා තරග කරන පක්ෂවල අපේක්ෂකයින්ගේ සාකච්ඡාවක්ද පවත්වන ලද අතර ඡන්ද විමසීම කල්තැබීමට ක්‍රියා නොකරන ලෙස ඉල්ලමින් විපක්ෂයේ අපේක්ෂකයන් ද කරුණු දක්වන ලදී. කෙසේවුවද මේ පිළිබඳව නොපමාව ක්‍රියා කරන බව මැතිවරණ විෂය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා සහතික වීමෙන් පසු සහ දීර්ඝ ලෙස කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව මැතිවරණ රාජකාරිවලින් ඉවත්වීමට නිලධාරීන් ගෙන තිබූ තීරණය, වෙනස් කර ගත හැකිවිය. මැතිවරණ නිලධාරීන්ට බාධා කළ හා තර්ජනය කළ පුද්ගලයින් දෙදෙනකු නීතීඥවරු මගින් පොලීසියට භාර වීමෙන් පසු 2014.03.30 වන දින අධිකරණයට ඉදිරිපත් කළ බව මැතිවරණ කොමසාරිස් වෙත වාර්තා කර ඇත.

332. මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය නගරයේ හා දෙනියාය පල්ලේගම මාර්ගයේ එක් පක්ෂයක ප්‍රචාරක පුවරු, ධජ පතාක, කොඩිවැල් අසීමිතව ප්‍රදර්ශනය කෙරෙන බවට ලද පැමිණිලි පිළිබඳව සොයා බලා එකී අනවසර ප්‍රචාරණ ඉවත් කිරීමට ගිය පොලිස් හා මැතිවරණ නිලධාරීන්ට ප්‍රදේශයේ දේශපාලන අධිකරුවකු තර්ජනය කර නීතිය බලාත්මක කිරීම වළක්වා තිබේ. ඉන්පසුව අමතර පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකු කැඳවා ඇති නමුත් දේශපාලන බලය ප්‍රදර්ශනය කරමින් එකී අනවසර ප්‍රචාරක පුවරු ධජපතාක ඉවත් කිරීමට ඉඩ දී නැත. පසුදින මැතිවරණ නිලධාරීන්ගේ උපදෙස් පරිදි සැලකිය යුතු තරම් ඉහළ පොලිස් බලයක් යොදා එකී ප්‍රදේශය සම්පූර්ණයෙන්ම පිරිසිදු කර දේශපාලන බලයට වඩා නීතියේ ආධිපත්‍ය බලවත් බව අවධාරණය කරන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික්කය

333. හම්බන්තොට දිස්ත්‍රික්කය වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයින් කිහිපදෙනෙකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, රාජ්‍ය අංශයේ ව්‍යවස්ථාපිත අධිකාරියක හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ යම් යම් වැඩසටහන් මගින් එහි සම්පත් යොදා ගැනීම ගැන ලද පැමිණිලි අනුව, එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඡන්ද විමසීම අවසන්වන තෙක් අත්හිටුවන ලෙස එම අධිකාරිය අයත් වන ඉදිකිරීම්, ඉංජිනේරු සේවා හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත, මැතිවරණ කොමසාරිස්වරයා දන්වා ඇත. එසේ වුවද එකී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන අරමුණු නොමැති බව එම ලේකම්වරයා දන්වා තිබේ. පසුව නැවතත් මේ පිළිබඳව පැමිණිලි ලැබීම නිසා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස නියෝග කිරීමට සිදු විය.

334. හම්බන්තොට දිස්ත්‍රික්කයට පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කරන අපේක්ෂකයකු විසින්, සිය අපේක්ෂක අංකය ප්‍රචලිත කිරීමේ අරමුණෙන් මුදල් තෑගි පිරිනමන දැනුම මිනුම් තරගයක් සඳහා ප්‍රශ්නාවලියක්, එම දිස්ත්‍රික්කයේ ඡන්දදායකයන් අතරේ බෙදා හැරීමට කටයුතු කර තිබුණි. එම ප්‍රශ්නාවලියේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු, අදාළ අපේක්ෂකයාගේ හඳුනා ගැනීමේ අංකය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සකසා තිබුණි. මෙය ප්‍රචලිත කිරීම නතර කරන ලෙස අදාළ අපේක්ෂකයාට මැතිවරණ කොමසාරිස්වරයා 2014.03.21 දින දන්වා ඇත.

335. දකුණු පළාත් සභාවට හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් තරග කරන එම සභාවේ මීට පූර්ව මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ අපේක්ෂකයකු එම සභාවට අයත් වාහන 3 ක් සිය මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගෙන ඇති බවටත්, ඒවා එම පළාත් සභාව විසුරුවා හැරි අවස්ථාවේ ආපසු භාර දී නොමැති බවද දන්වමින් ලද පැමිණිල්ල පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා දකුණු පළාත් සභා ලේකම්වරයාගෙන් හා අදාළ අපේක්ෂකයාගෙන් ද විමසීම් කර ඇත. ඉන් එක් වාහනයක් මිද්දෙණිය පොලිසිය විසින් එය අනවසර ප්‍රචාරණ කටයුතු කිරීමේ දී අත්අඩංගුවට ගත් බවත්, ඉතිරි වාහන භාර දෙන ලෙස දන්වා ඇති බවත් හම්බන්තොට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී 2014.03.20 දින වාර්තා කර ඇත.

336. හම්බන්තොට දිස්ත්‍රික්කය වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කරන අපේක්ෂකයකු විසින්, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන් තම අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කර ගැනීම සඳහා 2014.02.21 දින, රැස්වීමක් සඳහා කැඳවා ඇති බව පැෆරල් සංවිධානය 2014.02.15 දින දන්වා තිබිණි. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්වරයාට ඒ පිළිබඳ අවශ්‍ය උපදෙස් 2014.02.20 මැතිවරණ කොමසාරිස්වරයා දුන් අතර, එම රැස්වීමට ග්‍රාම නිලධාරීන් සහභාගී වීම වළක්වන ලද බව අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා මැතිවරණ කොමසාරිස්වරයාට 2014.03.20 දින දන්වා ඇත.

337. රජයේ අධිකාරියක් විසින් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ආදායම් ප්‍රවර්ධන වැඩසටහන්, පිළිගත් දේශපාලන පක්ෂයකින් එම දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කරන අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන බවට ලද පැමිණිල්ලක් මත, මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.02.15 දින එම අධිකාරිය අයත් අමාත්‍යාංශයේ ලේකම්වරයාට එම පැමිණිල්ල යොමු කර, ඒ පිළිබඳ විස්තර සමග උපදෙස් දී ඇත. ඒ අනුව එම ව්‍යාපෘතියේ කටයුතු හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඡන්ද විමසීම් කටයුතු අවසන් වන තෙක් ක්‍රියාත්මක නොකිරීමට අදාළ අමාත්‍යාංශය තීරණය කරන ලදී.

උඟව පළාත
මොණරාගල දිස්ත්‍රික්කය

338. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (පැෆරල් සංවිධානය) විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත 2014.07.29 දින දන්වා තිබුණේ, ඡන්ද විමසීම තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකුගේ හඳුනාගැනීමේ අංකය යොදා ඡන්දදායකයන් වෙත භාණ්ඩ සමූහයක් බෙදා දීමට බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සූදානම් කර ඇති බැවින්, එම කටයුතු නතර කරන ලෙස ය. එම භාණ්ඩ අතර වූ ප්ලාස්ටික් ජල ටැංකිවල අපේක්ෂකයකුගේ අංකය සඳහන් වන ආකාරය පැහැදිලි කිරීමට අදාළ පැමිණිල්ල සමඟ ඡායාරූප ද එවා තිබුණි. මෙවැනි භාණ්ඩ බෙදීම් නොකරන ලෙසට මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ පක්ෂය වෙත දැනුම් දී ඇත.

339. නියඟයෙන් ගොවිතැන් පාළු වූ ගොවීන්ට ආධාර බෙදා දීම සඳහා අමාත්‍යවරයකුගේ ප්‍රධානත්වයෙන් ගොවීන්, වැල්ලවාය මහින්ද රාජපක්ෂ විද්‍යාලයට 2014.08.18 සහ 19 යන දිනවල කැඳවා ඇති බව, නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය මැතිවරණ කොමසාරිස්වරයා වෙත, 2014.08.18 වන දින දන්වා තිබුණි. ඒ පිළිබඳව සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ සභාපතිවරයාගෙන්, ලිඛිතව කරුණු විමසීමෙන් දැනගැනීමට ලැබී ඇත්තේ, එම කටයුතු අදාළ අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සිදු වුවද, එම අවස්ථාවට පළාත් සභා ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සහභාගී නොවූ බවයි.

340. පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක්, වැල්ලවාය ගංගාරාම විහාරයට යාබදව, රජයේ දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බවට ලද පැමිණිල්ල අනුව, ඒ පිළිබඳව වාර්තාවක් බදුල්ල සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලබා ගැනීමට කටයුතු කරන ලදී. තවද, එම අනවසර ප්‍රචාරක කාර්යාලය 2014.08.20 වන දින ඉවත් කිරීමට කටයුතු කර ඇත.

341. අමාත්‍යවරයකු, සිය දේශපාලන කටයුතුවලට සහාය දැක්වූ ජනතාවට උපහාර දැක්වීම සඳහා රැස්වීමක් කැඳවා ඇති බවත්, ඒ වෙනුවෙන් වැල්ලවාය ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් පිරිසක් පුද්ගලයින් පදිංචි නිවාසවලට යැවීමට කටයුතු කර ඇති බවත් දන්වමින් මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිල්ලක් ලැබිණි. එම පැමිණිල්ල රාජ්‍ය නිලධාරීන් පිරිසක් විසින් එවා තිබුණි. මෙම ක්‍රියාවට ඡන්ද විමසීම් කාලය තුළ අදාළ නිලධාරීන් යෙදවීම සුදුසු නොවන බැවින් එම කටයුත්ත වළක්වන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා 2014.08.19 වන දින අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දැනුම් දී ඇත.

342. නිදහස් ඡන්ද විමසීමක් පැවැත්වීමට බාධා වන අනීතික ක්‍රියා මැඩපැවැත්වීම සඳහා ගත යුතු පියවර ගැන, මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.09.12 වන දින පොලිස්පතිවරයා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

(මැතිවරණ), ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (උඟව/සබරගමුව), මොණරාගල දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීට හා සහකාර මැතිවරණ කොමසාරිස්වරයාට උපදෙස් ලබා දී ඇත. තණමල්විල, බුත්තල, හුලංදාව, බඩල්කුඹුර, මැදගම හා සියඹලාණ්ඩුව යන නගරවල දවසේ පැය 24 පුරාම මාර්ග බාධක යොදා වාහන පරීක්ෂා කිරීමේ වැඩපිළිවෙලක් මොණරාගල දිස්ත්‍රික්කයෙන් බැහැර පොලිස් නිලධාරීන් යොදවා ක්‍රියා කිරීමට දැනුම් දී ඇත. නීත්‍යනුකූලව පිහිටුවා ඇති දේශපාලන පක්ෂ කාර්යාල විනාශ කිරීම හා ඒවාට හානි කිරීම පිළිබඳව දේශපාලන පක්ෂ කිහිපයක් විසින්ම පැමිණිලි කර ඇති බැවින්, ඒවාට සම්බන්ධ පුද්ගලයින් වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට ද උපදෙස් දී ඇත.

බදුල්ල දිස්ත්‍රික්කය

343. මහියංගණය හා ගිරාඳුරුකෝට්ටේ යන නගරවල බදුල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයකින් තරග කරන අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ඩිජිටල් දැන්වීම් පුවරු යොදා ප්‍රචාරණ කටයුතු සිදු කරන බව මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා එක්සත් ජාතික පක්ෂ ලේකම්වරයා විසින් 2014.08.14, 16 සහ 20 යන දිනවල පැමිණිලි ඉදිරිපත් කොට දන්වා තිබුණි. මේවා ඉවත් කිරීම සඳහා පොලීසිය වෙත උපදෙස් දීමෙන් පසුව ද දැන ගැනීමට ලැබුණේ, ඒවා ඉවත් නොකොට තවදුරටත් ප්‍රදර්ශනය වෙමින් පවතින බවයි. මේ සම්බන්ධයෙන් උඟව පළාතේ සහ පොලිස් මූලස්ථානයේ ප්‍රධාන පොලිස් නිලධාරීන් වෙත කිහිප වරක් දැනුම් දීමෙන් පසු එම ප්‍රදර්ශන කටයුතු නතර කිරීමට ඉඩ ලැබුණි.

344. බදුල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන්ගේ සංගමයේ සාමාජිකයින් කැඳවා 2014.09.14 සහ 15 යන දිනවල තේ වතුවල පස් සංරක්ෂණය සඳහා ආධාර මුදල් ලබා දීමේ වැඩපිළිවෙලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සූදානම් කර ඇතැයි, එක්සත් ජාතික පක්ෂය විසින් 2014.09.11 වන දින ද, මැතිවරණ නිරීක්ෂණ ජාලය විසින් 2014.09.12 වන දින ද, මැතිවරණ කොමසාරිස්වරයා වෙත දැනුම් දී තිබුණි. මැතිවරණ කොමසාරිස්වරයා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට සහ අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාට 2014.09.13 වන දින,එම කටයුතු ඡන්ද විමසීම් අවසන්වන තෙක් කල් දැමීමට හෝ ඡන්ද විමසිම් දිනට පෙර එම කටයුතු සිදු කරන්නේ නම්, ඡන්ද විමසීම්වලට ඉදිරිපත්ව සිටින පක්ෂවලට හෝ අපේක්ෂකයින්ට වාසි ගෙන දෙන ලෙස එම කටයුතු සිදුනොකරන ලෙස දන්වා ඇත.

345. උඟව පළාත් සභා ඡන්ද විමසීමට පෙර දින එනම්, 2014.09.19 වන දින, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ බලමණ්ඩල විශේෂ රැස්වීම් එම පළාතේ පැවැත්වීමට කටයුතු කරන බව 2014.09.18 වන දින පැෆ්රල් සංවිධානය විසින් ද, එදිනට පසු දින එක්සත් ජාතික පක්ෂය විසින්ද මැතිවරණ කොමසාරිස්වරයා වෙත දැන්වීමෙන් පසු, අදාළ පාර්ශ්ව වෙත උපදෙස් දී එම රැස්වීම් පැවැත්වීම මැතිවරණ කොමසාරිස් විසින් වළක්වන ලදී.

346. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු සහ තවත් මුස්ලිම් බැතිමතෙකු විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ, බෝග හකුඹුර ආදී ප්‍රදේශවල පිහිටි මුස්ලිම් පල්ලිවලට රුපියල් ලක්ෂය බැගින් වූ චෙක්පත් ප්‍රදානය කිරීමට කටයුතු යොදා ඇති බවට, පැෆ්රල් සංවිධානය විසින් 2014.09.19 වන දින දැන්වීමෙන් පසු, බදුල්ල සහකාර මැතිවරණ කොමසාරිස්වරයා මඟින් එම කාර්යය වළක්වන ලදී.

347. සිය ඡන්ද ව්‍යාපාරය වෙනුවෙන් ඡන්දදායකයින් වෙත, උඟව පළාතේ රාජ්‍ය ආයතන මාර්ගයෙන් දේශපාලන පක්ෂයක් විසින් රජයේ භාණ්ඩ බෙදා හැරීමට සූදානම් කර ඇති බවට මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි ලැබිණි. එවැනි කටයුතු සංවිධානය කිරීමෙන් හා එවැනි අවස්ථාවලට සහභාගී වීමෙන් වළකින ලෙස එම අමාත්‍යාංශවල නිලධාරීන්ට උපදෙස් දීමට පියවර ගන්නා ලෙස මැතිවරණ කොමසාරිස්වරයා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, ආර්ථික සංවර්ධන හා පළාත් පාලන, පළාත් සභා යන අමාත්‍යාංශවල ලේකම්වරුන්ට 2014.07.31 වන දින දැන්වීය.

348. රාජ්‍ය අංශයේ අධිකාරියක සේවකයින් අධිකාරියේ සභාපතිවරයාගේ නියෝග මත උඟව පළාතේ මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල යෙදෙන බවට ජාතික සේවක සංගමය හා එක්සත් ජාතික පක්ෂය විසින් කරන ලද පැමිණිලිවලට අනුව, 2014.09.04 සහ 11 යන දිනවල ඒ පිළිබඳව අදාළ සභාපතිවරයාගෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් විමසන ලදී. එවැනි සේවකයින් යෙදවීමක් කර නොමැති බව සභාපතිවරයා විසින් වාර්තා කර ඇත.

349. බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම තරග කරන පක්ෂයක ආධාරකරුවන් සහ අපේක්ෂකයින්, තම පක්ෂයට විරුද්ධ වූ පක්ෂවල ආධාරකරුවන්ට පහරදීම, එම පක්ෂවල මැතිවරණ ප්‍රචාරක කාර්යාල විනාශ කිරීම් ආදී සාහසික ක්‍රියා සිදුකරන බවට ඡන්ද විමසීමට පෙර වූ අවසාන සති දෙක තුළ සැහෙන පැමිණිලි සංඛ්‍යාවක් මැතිවරණ කොමසාරිස්වරයාට ලැබුණි. එසේම, අංක තහඩු නොමැති ඩිෆෙන්ඩර් ජීප් රථ ප්‍රමාණයක්, එක් වර

ගමන් කරමින් ප්‍රදේශවාසීන් බිය ගන්වන ආකාරයට කටයුතු කරන පිරිස් ගැනද වාර්තා විය.මෙවැනි අවස්ථා සම්බන්ධව ලද පැමිණිලි, සෑම අවස්ථාවකදීම පොලිස්පතිවරයාටත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ) හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (උඟව/සබරගමුව) වෙත යොමු කොට, සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට උපදෙස් දෙන ලදී. මෙවැනි සාහසික ක්‍රියා මැඩලීමට පිටස්තර දිස්ත්‍රික්කවල පොලිස් නිලධාරීන් අවශ්‍ය වන්නේ නම්, එවැනි නිලධාරීන් හා විශේෂ කාර්ය බලකායද කැඳවන ලෙස දන්වන ලදී.

350. බණ්ඩාරවෙල පොලිස් ස්ථානයේ දී පිළිගත් දේශපාලන පක්ෂ දෙකක ආධාරකරුවන් පිරිස් අතර 2014.09.20 වන දින ආරවුලක් ඇති වී ඇත. මෙදින බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු, තමාට බණ්ඩාරවෙල නගරාධිපති ඇතුළු කිහිප දෙනෙකු පහර දුන් බවට පැමිණිල්ලක් කර, ප්‍රතිකාර ලබා ගැනීමට රෝහල්ගතව ඇත. එදිනම බණ්ඩාරවෙල මහනගර සභාවේ නගරාධිපතිවරයා සහ තවත් පිරිසක් පොලිසියට පැමිණ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට හා ඔහුගේ ආධාරකරුවන්ට බැණ තර්ජනය කර පහර දුන් බවට පැමිණිලි කළ අවස්ථාවේ දී මෙම ගැටුම ඇති වී ඇත. මේ පිළිබඳව වාර්තා වූ වහාම අදාළ පරීක්ෂණ පවත්වන ලෙස පොලීසියට උපදෙස් දී ඇත.

351. මෙවර උඟව පළාත් සභා ඡන්ද විමසීම් කාලයේ දී හා නාමයෝජනා භාර ගැනීමේ කාලය අවසන්වන දිනයේ දී පක්ෂවල ආධාරකරුවන් හා රථවාහන යොදා ගෙන පෙළපාලි යාමට අපේක්ෂකයින්ට හා දේශපාලන පක්ෂ නියෝජිතයින්ට ඉඩ නොදෙන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් පොලීසිය වෙත දැඩිව උපදෙස් දී තිබුණි. විශේෂයෙන්ම එම කාලය තුළ අ.පොස උසස් පෙළ විභාගය පැවැත්වීමට නියමිතව තිබූ බැවින් මේ නියමය තදින්ම ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කරන ලදී. එසේවුවත් 2014.08.06 වන දින මහියංගණ - බදුල්ල මාර්ගයේ උඟව පළාතේ හිටපු ඇමතිවරයකු සහ ඔහුගේ සහෝදරයකු පෝස්ටර් හා ඡායාරූපවලින් සරසන ලද වාහන 150 කට ආසන්න සංඛ්‍යාවක් සහිත පෙළපාලියක් සමඟ බදුල්ල දෙසට පැමිණ ඇත. මෙම රථ පෙළපාලිය නතර කිරීමට ප්‍රමාණවත් පොලිස් නිලධාරීන් පිරිසක් යොදවා තිබී නැත. මෙම රථ පෙළපාලිය ගමන් කිරීම වැරදි බව දන්වා, එම රථවාහන පෙළපාලිය වීඩියෝගත කිරීමට කටයුතු කළ, කුරුණෑගල දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ඇතුළු නිලධාරීන් පිරිසට මෙම අනීතික රථ පෙළපාලියට සහභාගීවූ පිරිස් සමඟ එය මෙහෙයවූ ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරීන් තර්ජනය කර සාපරාධි ලෙස බිය වැද්දීම් සිදුකර තිබේ. නිලධාරීන්ට පහරදීමක්ද සිදු වී ඇත. එක් නිලධාරියකුගේ ටැබ් පරිගණකයක් පැහැරගෙන තිබුණි. එකී අපේක්ෂකයන් හා දේශපාලඥයින් අයත් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට මේ බව දන්වා ඔවුන්ගේ ආධාරකරුවන් පාලනය කළ යුතු බවට කොමසාරිස්වරයා විසින් අවධාරණය කරන ලදී. ස්වකීය ආධාර කරුවන්ගේ මේ අනීතික ක්‍රියාව තදින්ම හෙලාදකින බව එම ලේකම්වරයා ප්‍රකාශ කර ඇති අතර ඒ පිළිබඳව පක්ෂයේ කණගාටුව ප්‍රකාශ කර තිබේ. මේ සිද්ධියේ දී පොලිස් බලධාරීන්ගේ නොසැලකිල්ල පිළිබඳව පොලිස්පතිවරයා ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුම්වත් කරන ලද අතර මේ සිද්ධිය හා සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන බව පොලිස්පතිවරයා පෞද්ගලිකවම පොරොන්දු විය. මේ සම්බන්ධයෙන් මහියංගණය අධිකරණයේ නඩු පැවරීමක් සිදු කර ඇත.

උඟව පළාතේ පළාත් සභා ඡන්ද විමසීම් කාලයේ දිවි නැගුම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන්, ක්ෂේත්‍ර සමීක්ෂණයක් සඳහා යොදවා ගැනීම.

352. වසර 2014 අගෝස්තු මස මැද භාගයේ සිට උඟව පළාත් සභා ඡන්ද විමසීම් දිනය වූ 2014.09.20 දිනට ආසන්න වන තෙක් වූ කාලය තුළ, මෙවර පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල ක්‍රම ක්‍රමයෙන් වැඩි දියුණු වෙමින් ආ, රජයේ සේවකයන් හා රාජ්‍ය දේපල දේශපාලන අරමුණු කරා දේශපාලන පක්ෂ විසින් යොමු කරවීම තවත් උත්සන්න තත්ත්වයකින් ප්‍රදර්ශනය වන්නට විය.

353. දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් නිලධාරීන්, උඟව පළාත් සභා ඡන්ද විමසීම් දිනයට ආසන්න දිනවල එම පළාතේ ගෘහයන් වෙත යවා, අඩු ආදායම්ලාභීන් පිළිබඳ සමීක්ෂණයක් කිරීමට එම දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් නිලධාරීන් කටයුතු සංවිධානය කරමින් සිටින බවත්, මේ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ට දිස්ත්‍රික් නිලධාරීන් විසින් වාචිකව උපදෙස් දෙන බවත්, මෙම ක්‍රියාවලියෙන් ඡන්දදායකයින්ට බලපෑමක් සිදු වන බවත් දන්වමින් පැමිණිලි රාශියක් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබුණි. එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ යන දේශපාලන පක්ෂ ද, නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය, නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය හා නිරීක්ෂණ ජාලය යන සංවිධාන ද සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගමය හා රැකියාලාභී උපාධිධාරීන්ගේ සංගමය යන සංගම් ද මෙම පැමිණිලි ඉදිරිපත් කර තිබූ සංවිධාන වේ.

354. සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගමය විසින්, 2014.08.27 දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත මේ සම්බන්ධ දීර්ඝ පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන්ගේ අනු දැනුම ඇතිව, දිවි නැගුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් හා රජය නියෝජනය කරන දේශපාලන පක්ෂවලට පක්ෂපාතී වෘත්තීය සමිතියක් වන සමස්ත ලංකා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරීන්ගේ සංගමයේ නියෝජිතයින් විසින්, සංවිධානය කරන, "අඩු ආදායම්ලාභීන් පිළිබඳ සමීක්ෂණය" සඳහා දිස්ත්‍රික්ක අටක නිලධාරීන් යොදවා සමීක්ෂණයක් මුවාවෙන් කරනු ලබන දේශපාලන ප්‍රචාරන වැඩපිළිවෙලක් බව දන්වා තිබිණි. ඒ සම්බන්ධව අදාළ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා, කොළඹ, ගම්පහ, ගාල්ල, මාතර, පුත්තලම, නුවරඑළිය හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවල පැවැත්වීමට නියමිත රැස්වීම් අටක් පිළිබඳ විස්තර, එම පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් වී තිබුණි. මෙම රැස්වීම් නිරීක්ෂණය කිරීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් ද යොදවන ලදී. එම නිරීක්ෂණය කිරීම්වලින් පහත කරුණු හෙළි විය.

I. අදාළ රැස්වීම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් හා එම අමාත්‍යාංශයේ දිස්ත්‍රික් නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සංවිධානය වූ බව

II. එම රැස්වීම්වලට දිස්ත්‍රික් සමෘද්ධි කළමනාකරුවන්, සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සහභාගී වූ බව.

III. විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් ද රැස්වීම්වලට සහභාගී වූවන් දැනුවත් කර ඇති බව.

IV. රජයේ සංවර්ධන වැඩපිළිවෙල පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට මෙම ක්‍රියාමාර්ගය ගන්නා බවත්, එය උඟව පළාතේ ප්‍රදේශවලින් ඇරඹෙන බවත් රැස්වීම් සංවිධායකයන් ප්‍රකාශ කර ඇති බව.

V. සහනදායී බැංකු පොළී ක්‍රම, බැංකු ණය ක්‍රම, ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා රජයෙන් සැපයෙන යතුරු පැදි ආදිය පිළිබඳව දන්වා, ඒ කටයුතු වෙනුවෙන් අයදුම්පත් රැස්වීම් අවස්ථාවල දී නිලධාරීන් ලවා සම්පූර්ණ කරවා ගැනීම.

VI. මෙම කටයුතු සඳහා සහභාගී වන නිලධාරීන් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවලට අදාළ රාජකාරී සඳහා සැප්තැම්බර් 06, 07 හා 08 යන දිනවල යා යුතු බවත්, ඒ සඳහා ප්‍රවාහන පහසුකම්, නවාතැන් පහසුකම්, ආහාර ලබා දීම සිදු කරන බවද සහභාගී වන අය වෙත දැනුම් දී ඇති බව.

355. මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් රැස්වීම් නිරීක්ෂණය කොට ඉදිරිපත් කරන ලද වාර්තා ලැබීමටත් පෙර, අදාළ පැමිණිලිවල සඳහන් වූ කරුණු බරපතල ඒවා වූ බැවින්, පැමිණිලිවල පිටපත් සමඟ ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 2014.08.20 වන දින ලිපියක් යවා, පහත කරුණු මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැනුම් දී ඇත.

අ. අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර රාජකාරියක් නොවන්නේ නම්, අදාළ නිලධාරීන් උඟව පළාතේ ඡන්ද විමසීම් පැවැත්වෙන කාලය තුළ නිවැසියන් හමුවීමට යැවීම නුසුදුසු බව දන්වා,

ආ. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා සහාය ලබා දෙන ලෙස ඉල්ලීමක් ද කර ඇත.

මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉහත ලිපියට 2014.08.28 වන දින පිළිතුරු එවමින්, ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා පහත සඳහන් කරුණු දන්වා ඇත.

අ. ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශය විසින්, මේ වන විට දිවයිනේ සියලුම ගෘහයන් ආවරණය වන පරිදි සංගණන ගණනාවක්ම පවත්වා අවශ්‍ය දත්ත හා තොරතුරු රැස් කරගෙන තිබෙන බැවින්, මේ අවස්ථාවේ දී දිවයිනේ කිසිදු ප්‍රදේශයක සංගණනයක් පැවැත්වීමට සැලසුම් කර නොමැති බව.

ආ. උඟව පළාතට සමෘද්ධි සංගණන කාර්යයක් සඳහා පිට පළාත්වලින් නිලධාරීන් යැවීමට, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පියවර ගෙන නොමැති බව.

ඇ. සමෘද්ධි නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්, දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන් හැටියට වෘත්තීය සමිති සංවිධාන යටතේ, රාජකාරී කටයුත්තකට සම්බන්ධ නොවී, රාජකාරී වේලාවෙන් බැහැරව දේශපාලන කටයුතුවල නිරත වීම, අමාත්‍යාංශයේ රාජකාරිමය පාලනයෙන් බාහිර කටයුත්තක් බව.

ඈ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් කිසිසේත්ම ඉහත නිලධාරීන්, දේශපාලන කටයුතු සඳහා යොදා නොගන්නා බව.

ඉ. උඟව පළාතේ සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා සහාය දෙනු ලබන බව.

356. මෙම සිද්ධි ක්‍රියාදාමය පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ, අදාළ නිලධාරී කණ්ඩායම් දේශපාලන අයිතිවාසිකම් හිමි පිරිසක් වුවද, උඟව පළාතේ ක්ෂේත්‍ර කටයුත්තකට හෝ නිරීක්ෂණ කටයුත්තකට යම් රාජ්‍ය නිලධාරීන් පිරිසකගේ අනුදැනුම හා මගපෙන්වීම අනුව සහභාගී වී ඇති බවයි.

357. උඟව පළාත් සභා ඡන්ද විමසීම සඳහා තරග කරන අපේක්ෂකයකු හා එක්සත් ජාතික පක්ෂයේ

මහලේකම්වරයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද, පෙත්සම් දෙකක් වෙනුවෙන්, දිවිනැගුම සංවර්ධන නිලධාරීන් ද කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් ද උඟව පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් ප්‍රචාරණ කටයුතු සඳහා යොදවා ගැනීම සම්බන්ධ වූ පැමිණිල්ල 2014.09.04 වන දින විභාග කරන ලදී. එම පෙත්සම් දෙකෙහි වගඋත්තරකරුවන් වූයේ, මැතිවරණ කොමසාරිස්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිපදෙනෙක්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා යි. අදාළ පරීක්ෂණයෙන් පසු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහත දැක්වෙන තීරණයන්ට එළඹී තිබිණි.

අ. දැනට මැතිවරණ කොමසාරිස්වරයා විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කර ඇති ලිපිය ප්‍රසිද්ධියට පත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතු ය.

ආ. මාණ්ඩලික නිලධාරීන් විසින් දේශපාලන කටයුතුවල (ඡන්දය දීම හැරුණු විට) නියම ලෙස හෝ අනියමයෙන් නිරතවීම වරදක් බවට ඔවුන් වෙත දන්වා සිටින ලෙසට අමාත්‍යාංශවල ලේකම්වරුන්ට මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැනුම් දීම කළ යුතු ය.

ඇ. මාණ්ඩලික නොවන නිලධාරීන් ඡන්ද ප්‍රචාරණ කටයුතුවල යෙදෙන්නේ නම්, ඒ සඳහා මොනයම් ආකාරයටවත් රජයේ සම්පත්, දේපල හෝ වෙනත් දීමනා කිසිවක් ඒ හරහා ලබා ගැනීමට ඉඩ නොතැබිය යුතු ය. මේ සම්බන්ධයෙන් අදාළ මාණ්ඩලික නිලධාරීන් විසින් අධීක්ෂණය කළ යුතු අතර, එවැනි අවස්ථාවක් වේ නම් පරීක්ෂා කර, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් විගණකාධිපතිවරයාට දැන්විය යුතු ය.

ඈ. පවතින නීති හා මැතිවරණ නීති උල්ලංඝනය නොවන ආකාරයට වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට වෘත්තීය සමිතිවලට ඇති අයිතිය ඉහත සඳහන් තීරණ මඟින් කිසිදු බාධාවක් වන බවක් අදහස් නොකෙරේ.

මොණරාගල දිස්ත්‍රික්කයේ නියඟයෙන් පීඩා විඳි ගොවි පවුල්වලට සහනාධාර මුදල් ඡන්ද විමසීම් කාලය තුළ ලබා දීම

358. මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී 2014.09.09 දින පෙ.ව. 10.00 ට, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම වෙනුවෙන් දේශපාලන පක්ෂ, රාජ්‍ය නිලධාරීන්, මැතිවරණ නිරීක්ෂණ ආයතන නියෝජිතයින් හා මාධ්‍ය ආයතන නියෝජිතයින් ද කැඳවා එම පාර්ශ්වවල වගකීම පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී. මෙම රැස්වීමට මැතිවරණ කොමසාරිස්වරයා ද බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික් ලේකම්වරුන් ද මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස් ආචාර්ය ප්‍රතිභා මහානාම හේවා මහතා හා නීති ලේකම් නිමල් පුංචිහේවා මහතාද සහභාගී වී ඇත. මෙම රැස්වීමේ දී දේශපාලන පක්ෂ, නිරීක්ෂණ සංවිධාන හා ජන මාධ්‍ය නියෝජිතයින් විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ සෑම පවුල් ඒකකයකම ඡන්ද විමසීම් දිනට පෙර රු. 2500/= ක මූල්‍ය අධාරයක් ලබා දීමට රජය විසින් කටයුතු සංවිධානය කරන බවට පැමිණිලි කරන ලදී.

359. මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස් ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා සහ මැතිවරණ කොමසාරිස්වරයා ද එදිනම ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් දුරකථන පණිවිඩයක් මඟින් කරුණු විමසා ඇත. ඊට අමතරව, 2014.09.09 වන දින මෙසේ ලැබුණු පැමිණිලි සම්බන්ධවත්, 2014.09.06 , 07 සහ 08 යන දිනවල ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් විශාල පිරිසක් මොණරාගල දිස්ත්‍රික්කයේ ගෙන්ගෙට ගොස් වෘත්තීය සමිති මට්ටමින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කර ඇති බැවින්, එම රාජ්‍ය නිලධාරීන් පිරිසම යොදවා මෙවැනි මූල්‍ය ප්‍රදානයන් සිදු කිරීමට කටයුතු කිරීම පිළිබඳව විරෝධතා පැන නැඟී ඇති බවත්, ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මැතිවරණ කොමසාරිස්වරයා දන්වා ඇත. එබැවින් නියඟයෙන් පීඩා විඳි සෙසු දිස්ත්‍රික්කවල පුද්ගලයන් වෙනුවෙන් දැනට මෙම කටයුතු සිදු කරන ලෙසත්, උඟව පළාත තුළ එම ප්‍රදානයන් කිරීම ඡන්ද විමසීමෙන් පසුව සිදු කරන ලෙසත් වැඩිදුරටත් දැනුම් දී ඇත. එම ලිපියට පිළිතුරු වශයෙන් 2014.09.10 වන දින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත අදාළ මුදල් ප්‍රදානයන් සිදු කිරීම අත්හිටුවීමට කටයුතු කළ බව දන්වන ලදී.

360. උඟව පළාත් සභා ඡන්ද විමසීම් කාලය තුළ මාස කිහිපයක් පුරා මොණරාගල දිස්ත්‍රික්කයේ පැවති, නියඟය හේතුවෙන් ගොවිතැන් පාළු වී යාම නිසා, එම හානි වෙනුවෙන් ගොවීන්ට සහනාධාර මුදල් බෙදීමේ සූදානම සම්බන්ධව සමහර දේශපාලන පක්ෂවල හා සිවිල් සංවිධානවල විවිධ අදහස් පළ වීම නිසා එම

කටයුතු පමා වීමෙන් තමන්ට සිදු වූ අසාධාරණය පිළිබඳව වැල්ලවාය ප්‍රදේශයේ පුද්ගලයින් සිව් දෙනෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පෙත්සමක් 2014.09.09 වන දින ඉදිරිපත් කර තිබුණි. එමඟින් නියඟය නිසා මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවීන්ට සිදු වී ඇති හානි වෙනුවෙන් සහන සැලසීමට ආර්ථික කටයුතු අමාත්‍යාංශය ක්‍රියා නොකිරීම නිසා, තමන්ට ඇති වී ඇති අපහසුතාවන් පිළිබඳව පෙත්සම්කරුවන් අධිකරණය වෙත කරුණු දක්වන ලදී.

361. ඒ සම්බන්ධව 2014.09.12 වන දින ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරන ලද්දේ, අදාළ සහන මුදල් ලබා දීමේ (පුද්ගලයෙක් වෙනුවෙන් රු. 2500.00 ක් බැගින්) වැඩපිළිවෙල දිස්ත්‍රික් ලේකම්වරයා හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කිසිදු දේශපාලනඥයකු හෝ කිසිදු දේශපාලන පක්ෂයක නියෝජිතයෙක් සහභාගී කරවා ගැනීමකින් තොරව, සිදු කළ යුතු බවයි.

362. අධිකරණය විසින් අවසර දෙන ලද ආකාරයට, මොණරාගල දිස්ත්‍රික්කයේ නියං සහනාධාර මුදල් බෙදා දීම දිසා ලේකම්වරයා හා ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් සංවිධානය කළද, එම ප්‍රදානයන් සිදු වූ අවස්ථාවල දී මෙවර මොණරාගල දිස්ත්‍රික්කයෙන් පළාත් සභා ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව ඇති පිළිගත් දේශපාලන පක්ෂයක ජයග්‍රහණය හා ඒවායේ අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සිදුවන ආකාරයේ කටයුතු එම මුදල් බෙදීමේ අවස්ථාවල දී සිදු වූ බවට පැමිණිලි මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබිණි. 2014.09.15 මැතිවරණ නිරීක්ෂණ ජාලය යන මැතිවරණ නිරීක්ෂණ සංවිධානය විසින්, මොණරාගල, සෙවණගල, කිරිඉබ්බන්ආර වම්ඉවුරේ සිරි පියරතනාරාමයේ දී නියං සහනාධාර බෙදීමට සමගාමීව මෙවර ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව ඇති අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමක් ද සිදු වී ඇති බව දන්වා ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් 2014.09.16 වන දින නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ව්‍යාපාරය විසින් ද පැමිණිලි කර තිබුණි. 2014.09.16 වන දින මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 31 හන්දිය ප්‍රජාශාලාව, සියඹලාණ්ඩුව වියන්ගොල්ල ආරණ්‍ය සේනාසනය අසල හා දොඹගහවෙල ප්‍රජාශාලාව අසල නියං සහනාධාර ලබා දීමේ කටයුතු සිදු කළ අවස්ථාවල දී පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයන් විසින් සිය මැතිවරණ ප්‍රචාරණ පත්‍රිකා පුද්ගලයින් වෙත බෙදමින් සිය මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කර ඇති බව මැතිවරණ නිරීක්ෂණ ජාලය විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා ඇත. කෙසේ වුවද මෙම ආධාර බෙදා හැරීම නිරීක්ෂණ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් යවා තිබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසකට හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් යොදවනු ලැබූ විශේෂිත නිලධාරී පිරිසකට මෙවැනි දේශපාලන මැදිහත්වීම් නිරීක්ෂණය වූ බවක් වාර්තා කර නැත.

363. මෙම නියං සහනාධාර වශයෙන් ලබා දුන් රුපියල් 2500/= බැගින් වූ ආධාර මුදල මොණරාගල දිස්ත්‍රික්කයට පමණක් ලබා දීමත් අවම වශයෙන් එයට යාබද එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටවත් මෙම ආධාර ලබා නොදීමත් විශේෂ අවධානයට ලක්විය යුතු කරුණකි. එමෙන්ම වෙනත් දිස්ත්‍රික්කවලට නියං සහනාධාර ලෙස ලබා දුන් අර්තාපල් අල කිලෝග්‍රෑම් 5කින් යුතු පාර්සල් මොණරාගල වැසියන්ට පසුව ලබාදී ඇති අතර මොණරාගල දිස්ත්‍රික්කයට මෙම විශේෂ සැලකිල්ලක් දැක්වීමට හේතුව ඡන්ද විමසීමේ දී මොණරාගල වැසියන් පක්ෂපාතී කර ගැනීම බව පෙන්වා දෙමින් ඉදිරිපත් කෙරෙන කරුණු දැක්වීම් බැහැර කිරීමට අපහසුය.

364. පසුගිය 2012 - 2014 වර්ෂවල පැවති පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල දී ඡන්ද විමසීම් සම්බන්ධව මැතිවරණ කොමසාරිස්වරයාට ලැබුණු පැමිණිලි අනුව පෙනී ගිය ප්‍රධාන කරුණක් නම්, ඡන්ද විමසීම හා සම්බන්ධ පාර්ශ්ව මෙන්ම මැතිවරණ නීති බලාත්මක කිරීමේ පූර්ණ වගකීම පැවරී ඇති සමහර පොලිස් නිලධාරීන් ද මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සුළු කොට තැකීමේ ප්‍රවණතාවක් පවතින බවය. විශේෂයෙන් රාජ්‍ය බලය හිමි දේශපාලන පක්ෂ ප්‍රමුඛ අනිකුත් දේශපාලන පක්ෂ ද, මැතිවරණ නීති උල්ලංඝනය කරනු ලබන තම පාක්ෂිකයින් හෝ අපේක්ෂකයින් දේශපාලන සදාචාරාත්මක හැසිරීමකට යොමු කරවීම සඳහා උනන්දුවක් නොදැක්වීම ද පැමිණිලිවල සඳහන් සිදුවීම් ඇතිවීමට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැකිය. මෙම තත්ත්වය යටතේ පහත කරුණු අපේක්ෂාවෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් තමා වෙත ලද පැමිණිලි සම්බන්ධව ක්‍රියා කරන ලද බව කිව යුතුය.

I. මැතිවරණ නීති බලාත්මක කිරීමේ වගකීම පැවරෙන ආයතනවල හා නිලධාරීන්ගේ රාජකාරී හා වගකීම් කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කිරීම
II. මැතිවරණ නීති උල්ලංඝනය වීම් පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධව අප්‍රමාදව සොයා බැලීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම තුළින් ඡන්දදායකයාට, අපේක්ෂකයින්ට, දේශපාලන පක්ෂවලට හා සිවිල් සංවිධානවලට මැතිවරණ ක්‍රියාදාමය පිළිබඳව උනන්දුවක් හා විශ්වාසයක් ඇති කිරීම තුළින් සාධාරණ ඡන්ද විමසීමකට අවශ්‍ය පසුබිම ඇති කිරීම.

III. මැතිවරණ නීති බලාත්මක කිරීම මගින්, ඡන්ද විමසීම් සඳහා තරගයට එළඹ සිටින සියලුම දේශපාලන පක්ෂවලට, ස්වාධීන කණ්ඩායම්වලට හා අපේක්ෂකයින්ට නීතියේ පිහිට, සාධාරණව සලසා දීම මගින්, ඡන්ද විමසීමේ දී අදාළ පාර්ශ්ව වෙත සම සාධාරණ තරග අවස්ථා ලබා දීම.

365. "ඡන්ද විමසීම් කාලය" යන්නට, නාමයෝජනා අවස්ථාවේ සිට ඡන්ද විමසීම් අවසන්වන තෙක් වූ කාලය අයත්වන අතර, එම කාලය තුළ කිසිවකු විසින් සිදු නොකළ යුතු මැතිවරණ දූෂණ ක්‍රියා හා නීති විරෝධී ක්‍රියා සම්බන්ධ නීතිමය විධිවිධාන පළාත් සභා ඡන්ද විමසීම් පනතෙහි ඇතුළත් වී ඇත. ඊට අමතරව රජයේ දේපල මැතිවරණ අවස්ථාවක දී දේශපාලන පක්ෂවල, ස්වාධීන කණ්ඩායම්වල සහ අපේක්ෂකයන්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනයට හා ජයග්‍රහණය වෙනුවෙන් හෝ වෙනත් පාර්ශ්වයකට අගතියක් වන අයුරින් කිසිවෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිපාදන අනුව භාවිතා කළ නොහැකිය. මේ සම්බන්ධව මෙම ඡන්ද විමසීමේ දී රජයේ දේපල භාරකාරත්වය උසුලන සියලුම පාර්ශ්ව දැනුවත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් පියවර ගෙන තිබියදී ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වමින් විවිධ පාර්ශ්ව විසින් සිදු කර ඇති නීති විරෝධී ක්‍රියා, තහවුරු වූ අන්දමින් ඉහත දක්වා ඇත. මෙවැනි ක්‍රියා සිදු නොකිරීම අදාළ පාර්ශ්වවල වගකීම වන අතර, ඒවා වළක්වාලීම නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ගේ වගකීම වේ.

පසුව කරන ලද ඇතුළත් කිරීමකි

270A. 2013 වර්ෂයේදී මධ්‍යම පළාතේ පළාත් සභා ඡන්ද විමසීමේ ප්‍රචාරක කටයුතු සඳහා අමාත්‍යවරයකු ප්‍රමුඛ ආධාරකරුවන් විශාල පිරිසක්, නුවරඑළිය පොදු වෙළඳ පොළෙහි ධජ පතාක රැගෙන යමින් ජන ඝෝෂා නගමින් අත් පත්‍රිකා බෙදීම් හරහා අයුතු ජනරාශිය හා ඡන්ද විමසීම් කාල සීමාව තුළ පෙරහැර පැවැත්වීම යන වැරදි කරමින් පෙළපාලියක් පවත්වමින් සිටියදී, කලූතර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා හා නුවරඑළිය සහකාර මැතිවරණ කොමසාරිස්වරයා එම ක්‍රියාව වරදක් බව පෙන්වා දී ඒ පෙළපාලිය නැවැත්වීමට උපදෙස් දීමේදී එම නිලධාරීන්ට පහර දීමට තැත් කර තිබේ. මෙම සිද්ධිය මැතිවරණ මහලේකම් කාර්යාලයට මේ සිද්ධිය වාර්තාවීමෙන් අනතුරුව පොලිසියට නිසි උපදෙස් ලබා දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් තත්ත්වය පාලනය කර ගැනීමට හැකි වූ අතර එදින රාත්‍රියේ කොමසාරිස්වරයා ඇතුළු පිරිසක් නුවරඑළිය මැතිවරණ කාර්යාලයට ගොස් මෙවැනි සිද්ධි වැළැක්වීමේ වගකීම පොලිසිය වෙත පැවරෙන බවත් තත්ත්වය පාලනය කළ නොහැකි නම් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම අත්හිටුවීමට පියවර ගැනීමට සිදුවන බවත් එසේ සිදුවුවහොත් එහි වගකීම අදාළ දේශපාලනඥයා හා ආරක්ෂක පොලිස් නිලධාරීන් ගත යුතු බව පොලිසියට හා දේශපාලන ක්‍රියාකාරීන්ට දන්වන ලදී. ඉන් අනතුරුව නුවරඑළිය දිස්ත්‍රික්කයේ මෙවැනි සිදුවීම් යම්තාක් දුරකට පාලනය කළ හැකි විය.

284A. 2013 උතුරු පළාතේ පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට අදාළ ඡන්ද විමසීම් කාල සීමාව තුළ උතුරු පළාතේ දැවැන්ත ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් තිබියදී විපක්ෂ අපේක්ෂකයන්ට අවි රැගත් නොහඳුනන කණ්ඩායම් විසින් බිය ගැන්වීම් හා තර්ජනය කිරීම් පිළිබඳව පැමිණිලි කිහිපයක් වාර්තා වී තිබිණි. යාපනය දිස්ත්‍රික්කයට තරග කළ අපේක්ෂිකාවකගේ නිවසට රාත්‍රියේ කඩා වැදුණු හඳුනානොගත් සන්නද්ධ පිරිසක් ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරී ඇය හා පවුලේ සාමාජිකයන් බිය ගැන්වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. එම සිද්ධිය වාර්තා වූ සැණෙන් උතුරු පළාත් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා එකී නිවසට ගොස් සිද්ධිය පිළිබඳව නිරීක්ෂණය කර මැතිවරණ කොමසාරිස්වරයාට කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව නැවතත් එවැනි තත්ත්වයක් ඇති වුවහොත් ඡන්ද පැවැත්වීම කල් තැබීමට සිදුවනු ඇති බවට නිවේදනයක් නිකුත් කිරීමට උතුරු පළාතේ නියෝජ්‍ය කොමසාරිස්වරයාට උපදෙස් දෙන ලදී. ඒ අනුව එකී නිවේදන නිකුත් කිරීම බෙහෙවින් සඵලදායී වූ අතර ඒ නිසා ඒ ආකාරයේ බිය ගැනීම් හා තර්ජනය කිරීම් ඉන් පසු සිදු නොවීය. මේ පිළිබඳව පොලිසිය විසින් පරීක්ෂණ ආරම්භ කරන ලද නමුත් අදාළ මැර පිරිස සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වූ බවක් දැනගැනීමට නැත.

342A. 2014 ඌව පළාතේ පළාත් සභා ඡන්ද විමසීම් කාලසීමාව තුළ මොණරාගල දිස්ත්‍රික්කයේ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් හා විපක්ෂ අපේක්ෂකයන්ගේ ඡන්ද කාර්යාල විනාශ කිරීම් බෙහෙවින් වාර්තා වූ අතර මෙම තත්ත්වය වැළැක්වීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා, පොලිස්පතිවරයා හා මැතිවරණ විෂයභාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා කිහිපවරක්ම මොණරාගල දිස්ත්‍රික්කයේ නිරීක්ෂණ චාරිකාවල නිරත වී තත්ත්වය පාලනය සඳහා නිසි පියවර ගැනීමට ක්‍රියා කරන ලදී. එම උපදෙස් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කරනු ලැබූ මොණරාගල සහකාර මැතිවරණ කොමසාරිස්වරයාට අවස්ථා කිහිපයකදීම ප්‍රාදේශීය දේශපාලනඥයින්ගේ මැර තර්ජනවලට මුහුණපෑමට සිදු වූ අතර එක් ප්‍රාදේශීය දේශපාලනඥයකු හා ඔහුගේ සහචරයන් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවසට ගොස්, අදාළ නීති උල්ලංඝණය කිරීම් වැළැක්වීමට උත්සාහ නොකරන ලෙස පවුලේ සාමාජිකයන්ට මරණීය තර්ජන එල්ල කර තිබේ. එහෙයින් එම නිලධරයාට හා නිවසට ආරක්ෂාව සැපයීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සිදු විය.

VIII වන කොටස

උතුරු පළාතේ ඡන්ද විමසීම් කටයුතු සංවිධානය

366. උතුරු පළාතේ 2013.09.21 දින පැවති පළාත් සභා ඡන්ද විමසීම එම පළාතේ පැවැත්වූ ප්‍රථම පළාත් සභා ඡන්ද විමසීම වේ. 1988 දී උතුරු - නැගෙනහිර ඒකාබද්ධ පළාත් සභාව සඳහා උතුරු පළාතේ සියලුම දිස්ත්‍රික්කවල නියෝජිතයන් නිතරඟයෙන් තේරී පත් වීම නිසා 1988 දී උතුරු පළාතේ පළාත් සභා ඡන්ද විමසීමක් නොපැවැත්වූ අතර ඉන් අනතුරුව විවිධ හේතු මත එකී ඡන්ද විමසීම් පැවැත්වීමට හැකියාවක් නොවීය. උතුරු පළාතට යාපනය, කිලිනොච්චිය, වවුනියාව, මන්නාරම සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වේ. මැතිවරණ කොට්ඨාසය වශයෙන් සලකන්නේ නම්, අංක 10 යාපනය මැතිවරණ කොට්ඨාසයට යාපනය හා කිලිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක ද, අංක 11 වන්නි මැතිවරණ කොට්ඨාසයට වවුනියාව, මන්නාරම හා මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක ද අයත් වේ. පාර්ලිමේන්තු මැතිවරණ අවස්ථාවක දී යාපනය දිසාපතිවරයා සහ වවුනියාව දිසාපතිවරයා පිළිවෙලින් අංක 10 හා අංක 11 යන මැතිවරණ කොට්ඨාසවල තේරීම්භාර නිලධාරීහු වෙති. එහෙත් මෙම පළාත් සභා ඡන්ද විමසීමේ දී උතුරු පළාත් සභා බල ප්‍රදේශයට අයත් මෙම පරිපාලන දිස්ත්‍රික්ක 5 හි, දිසාපතිවරු/ දිස්ත්‍රික් ලේකම්වරු නාමයෝජනා කැඳවීමේ දැන්වීම් අනුව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වශයෙන් කටයුතු කරන ලදී.

367. උතුරු පළාතේ 2013 අගොස්තු මස 21 වන දින පවත්වන ලද පළාත් සභා ඡන්ද විමසීම, සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් වෙනුවෙන්ම, ඡන්ද විමසීම සඳහා තරගයට එළඹී දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව අනුව, පසුගිය වසර 30 ක පමණ කාලයක් තුළ උතුරු පළාතේ පැවති ඡන්ද විමසීම් අතුරින් කැපී පෙනේ. විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වූ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (Liberation Tigers of Tamil Eelam - L.T.T.E) විසින් මෙහෙය වන ලද ත්‍රස්තවාදී ව්‍යාපාරය, රජයේ හමුදා විසින් 2009 වසරේ පරාජය කිරීමෙන් අනතුරුව, පළාත් මට්ටමින් සිය මහජන නියෝජිතයින් තෝරාගැනීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයට උතුරු පළාතේ ජනතාව හා දේශපාලන පක්ෂ නැවත ප්‍රවේශ වීමට දක්වන ලද අපේක්ෂාවන්ට හානි නොවන ආකාරයට හා ඔවුන්ගේ විශ්වාසය දිනාගත හැකි ආකාරයට, සිවිල් පරිපාලනය දීර්ඝකාලයක සිට අඩාල වූ පළාතක මෙම ඡන්ද විමසීම සංවිධානය කිරීම, මැතිවරණ දෙපාර්තුමේන්තුවට මෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ටද අභියෝගයක් වූ බැවින්, එම සංවිධාන කටයුතු හා සම්බන්ධ ප්‍රධාන කරුණු හෝ පැහැදිලි කිරීම මේ අවස්ථාවේ සුදුසු වේ.

368. එක්දහස් නවසිය අසූ (1980) ගණන්වල සිටම දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල පැවති ආකාරයටම, එකම දිනයක උතුරු පළාතේ සියලු පළාත් පාලන ආයතන වෙනුවෙන් ඡන්ද විමසීම් පැවැත්වීමට ගන්නා ලද උත්සාහයන්ද ව්‍යාර්ථ විය. ඊට හේතුව, එම පළාතේ පැවති ත්‍රස්තවාදී කටයුතු නිසා, ජන ජීවිතය හා සිවිල් පරිපාලනයද අඩාලවී තිබීමය. මේ නිසා, උතුරු පළාතේ පළාත් පාලන ආයතන වෙනුවෙන් ඡන්ද විමසීම, අනෙකුත් පළාත්වල එම ඡන්ද විමසීම් පැවති දිනවලදී ම පැවැත්වීමට උත්සාහ ගත්තද, ඉහත දක්වන ලද හේතූන් නිසා ඒවා කල් දැමීමට සිදු විය. මහජන ආරක්ෂක අඥා පනතේ නීතිමය ප්‍රතිපාදන යටතේ, පළාත් පාලන ආයතනවල ධුර කාලය දීර්ඝ කිරීම හා 2002 අංක 01 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සංශෝධන පනතින් සංශෝධිත, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 38 (3) වැනි වගන්තිය යටතේ, නියමිත ඡන්ද විමසීම් දිනය අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් වරින් වර කල් තැබීම හා පළාත් පාලන නීතිය යටතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් නිල කාලය අවසන් වූ පළාත් පාලන ආයතනවල කාර්යයන් ඉටු කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරීම ආදී විවිධ ක්‍රමයන්ට උතුරු පළාතේ පළාත් පාලන ආයතන වෙනුවෙන් මහජන නියෝජිතයන් තොරා ගැනීම සඳහා පැවැත් විය යුතු වූ ඡන්ද විමසීම් කල් තැබිණි.

369. එක්දහස් නවසිය අනූව (1990) අංක 27 දරන පළාත් සභා (සංශෝධන) පනතේ විධිවිධාන අනුව, නිරායාසයෙන්ම අහෝසි වූ උතුරු හා නැගෙනහිර පළාත් සභාව වෙනුවෙන්, ඡන්ද විමසීම් සඳහා වූ නාම යෝජනා 1990 ජූලි මස 11 දින කැඳවූවද, 1990 ජූලි මස 12 දින ජනාධිපතිවරයා විසින් පළ කළ විශේෂ නිවේදනය නිසා එම නාමයෝජනා කැඳවීමේ දැන්වීම අවලංගු විය. ඉන් අනතුරුව, එසේ අක්‍රීයව පැවති පළාත් සභාව ආරම්භයේ දී පිහිටුවන ලද අවස්ථාවේ, උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමේ තීරණය ගැනීම සම්බන්ධයෙන් පැවැත්වීමට නියමිත වූ ජනමත විචාරණ නොපැවැත්වීමේ හේතුවෙන්, මානව හිමිකම් කඩවීමක් සිදුවී ඇති බවත් එම පළාත්, ඒකාබද්ධ කිරීම ද නීත්‍යානුකූල නොවන බවත්, දක්වමින් ඉදිරිපත් වූ පෙත්සම් විභාග කළ ශ්‍රේෂ්ඨාධිකරණය, අදාළ පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවට තීරණය කරන ලදී. ඉන් පසු 2008.05.10 දින නැගෙනහිර පළාත් සභාව ස්ථාපිත කිරීමට ඡන්ද විමසීමක් පැවැත්වූවද, උතුරු පළාත වෙනුවෙන් පළාත්

සභා ඡන්ද විමසීමක් එම අවස්ථාවේ නොපැවැත්විණි. ඒ ආකාරයට, උතුරු පළාත් සභාව වෙනුවෙන් ඡන්ද විමසීමක් මඟින් තම නියෝජිතයන් තෝරා ගැනීමේ අවකාශය ද උතුරු පළාතේ ඡන්දදායකයින්ට සැහෙන කාලයක් සඳහා අහිමි වී ගියේය.

370. එක්දහස් නවසිය අසූ (1980) ගණන්වලින් පසු මෙරට පැවති පාර්ලිමේන්තු හා ජනාධිපතිවරණ මැතිවරණ වෙනුවෙන්ද, තම නියෝජිතයින් ඉදිරිපත් කොට, ඡන්ද විමසීම් ක්‍රියාවලියට පුළුල් වශයෙන් සහභාගීවීමේ අවකාශය නිදහසේ බුක්ති විඳීම සඳහා එම පළාතේ ජනතාවට, උතුරු පළාතේ ක්‍රියාත්මක වූ ඊලාම් විමුක්ති කොටි සංවිධානයෙන් අවසර නොලැබිණ. එම ජාතික මට්ටමේ ඡන්ද විමසීම් අවස්ථාවල දී විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙලවල් යටතේ, ත්‍රස්තවාදී ක්‍රියා මැඩ පවත්වා තිබූ ප්‍රදේශවල ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවා, ආරක්ෂක අංශවල සහායද ඇතිව, ඡන්ද විමසීම් කටයුතු සිදු කිරීමට උතුරු පළාතේ පරිපාලන දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් කටයුතු කළ ද, එම ඡන්ද විමසීම්වලට ඡන්දදායකයන්ගේ සහභාගී වීම ඉතා අඩු මට්ටමක පැවතිණි. දේශපාලන පක්ෂවලට ද ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ බලපෑම් හා උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති අනාරක්ෂිත වාතාවරණය මත, නිහඬව සිටීමට සිදු වීම නිසා, දේශපාලන පක්ෂ එවැනි ඡන්ද විමසීම් අවස්ථාවල දී ක්‍රියාකාරී මට්ටමකින් කටයුතු කරනු දක්නට නොලැබිණි. සමහර ජාතික මට්ටමේ මැතිවරණ පැවති අවස්ථාවල දී, ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ බලය පැවති ප්‍රදේශවල පදිංචි වී සිටි ඡන්දදායකයන් සඳහා, රජයේ හමුදා පාලනයට යටත් ප්‍රදේශවල ඡන්දය පාවිච්චි කිරීමේ පහසුකම් ඇති කළ ද, ඒ සඳහා පැමිණීමට ද ඡන්දදායකයන්ට විවිධ හේතූන් නිසා අපහසුකම් පැවතිණි. ශ්‍රී ලංකා රජය හා එල්.ටී.ටී.ඊ සංවිධානය අතර, සමහර විදේශ රාජ්‍යයන්ගේ ද මැදිහත්වීම් මත ඇති කරගන්නා ලද සටන් විරාම ගිවිසුම් ක්‍රියාත්මකව පැවති කාලය තුළ, ජාතික මැතිවරණ පැවති අවස්ථාවල දී, රජයේ හමුදා බල ප්‍රදේශ හා කොටි සංවිධානයේ බලය පැවති භූමි ප්‍රදේශවලට අතරමැදිව පිහිටුවා තිබූ සටන් රහිත කලාපවල, ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවා ඡන්ද විමසීම් පැවැත්වීමට කටයුතු කරන ලදී.

ඡන්දහිමියන් ගණන් ගැනීම හා ඡන්දහිමි නාමලේඛන සැකසීම

371. උතුරු හා නැගෙනහිර පළාත්වල පසුගිය වසර 30 කට අධික කාලයක් පැවති කුරිරු යුද්ධය හා ත්‍රස්තවාදී ක්‍රියා නිසා, එම පළාත්වල සමහර ප්‍රදේශවල මුළුමනින් ම පාහේ, සමහර කාල පරිච්ඡේදවල සිවිල් පරිපාලන කටයුතු අඩාල වී තිබුණි. එබඳු කාලවල උතුරු පළාතේ පරිපාලන දිස්ත්‍රික්කවල, දිසාපතිවරුන් හා ජාත්‍යන්තර රතු කුරුස සංගමය වැනි සංවිධාන මාර්ගයෙන්, ද්‍රවිඩ ඊළාම් කොටි සංවිධානයේ බලයට යටත් ප්‍රදේශවල වැසියන්ට, රජය මඟින් නොකඩවා ආහාර සහනාධාර ඇතුළු අත්‍යවශ්‍ය දෑ ලබාදීම වැනි කාර්යයන්ට සීමා වූ සිවිල් පරිපාලන කටයුතු පමණක් සිදුවිය. මෙම තත්ත්වය නිසා සිය පදිංචි ප්‍රදේශ අතහැර ගිය ජනතාව විවිධ ප්‍රදේශවල තාවකාලිකව පදිංචි වී සිටියහ. මෙම වාතාවරණය යටතේ, වාර්ෂිකව ගෙයින් ගෙට ගොස් ඡන්දහිමියන් ගණන් ගැනීමේ කටයුතු සිදු කිරීම අසීරු වූ සෑම ප්‍රදේශයකම, පූර්ව වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව තිබූ නම්, ඊළඟ වර්ෂය වෙනුවෙන් ද නාමලේඛනගත කර සකස් කොට සහතික කර භාවිතා කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී. සමහර වර්ෂවල, ප්‍රධාන නාමලේඛනය යාවත්කාලීන කරන ලද්දේ වර්ෂයේ නොවැම්බර්/ දෙසැම්බර් යන මාසවල, දින 28 ක කාලයක් තුළ ඉතා සුළු වශයෙන් ඡන්දහිමියන්ගෙන් ඉදිරිපත් වූ හිමිකම් මාර්ගයෙන් පමණි. මේ තත්ත්වය යටතේ නාමලේඛනගතව තිබූ උතුරු හා නැගෙනහිර පළාත්වල මියගොස් සිටි අයගේ හෝ විදේශගත වූවන්ගේ නම්, ඡන්දහිමි නාමලේඛනවලින් ඉවත් කිරීමක් වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව සිදු නොවුණි.

372. ත්‍රිවිධ හමුදාව හා ශ්‍රී ලංකා පොලිසිය විසින් ත්‍රස්තවාදී ක්‍රියා මර්දනය කර, උතුරු පළාතේ සිවිල් පරිපාලන කටයුතු ක්‍රමිකව සතුටුදායක මට්ටමට ගෙන එන අයුරු ද සැලකිල්ලට ගෙන, දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන්, මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි වාර්ෂිකව ඡන්දහිමි නාමලේඛනය කොටස් වශයෙන් හෝ සාමාන්‍ය ආකාරයට යාවත්කාලීන කිරීම අරඹන ලදී. එහෙත් මේ වන තෙක් අවතැන් වූ ජනතාව, නැවත පදිංචි වී නොමැති උතුරු පළාතේ සමහර ප්‍රදේශවලට අදාළ ඡන්දහිමි නාමලේඛන සාමාන්‍ය පරිදි යාවත්කාලීන නොවේ. 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ උතුරු පළාතේ ඡන්දහිමි නාමලේඛන සලකා බලන විට, මෙම තත්ත්වය පැහැදිලි කර ගත හැකිය. උතුරු පළාතේ යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ සියලුම ඡන්ද ප්‍රදේශවල පිහිටි ඡන්ද කොට්ඨාසවල (526) ඡන්දහිමියන්, ගෙයින් ගෙට ගණන් ගැනීමක් 2008 වර්ෂයේ දී සිදුවී නැත. එතැන් සිට වසරින් වසර එම තත්ත්වය දියුණු වී ගෙයින් ගෙට ගොස් ඡන්දහිමියන් ගණන් නොගන්නා ලද එවැනි ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව 2013 වර්ෂයේ දී 29 දක්වා අඩු වී ඇත. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ 2008 වසරේ ඡන්ද කොට්ඨාස 04 ක ඡන්දහිමියන් ද, 2009 වර්ෂයේ ඡන්ද

කොට්ඨාස 02 ක ඡන්දහිමියන් ද ගෙයින් ගෙට ගොස් ගණන් ගෙන නොමැත. ඉන් අනතුරුව, එම දිස්ත්‍රික්කයේ සියලුම ඡන්ද කොට්ඨාසවල ඡන්දහිමියන්, ගෙයින් ගෙට ගණන් ගැනීම සිදු කෙරේ. 2008 වර්ෂයේ උතුරු පළාතේ, ගණන් ගැනීමකින් තොරව ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කළ ඡන්දහිමියන් සංඛ්‍යාව වූ 825,764 ක සංඛ්‍යාව, 2013 වර්ෂය වන විට 39815 දක්වා අඩු වී ඇත. 2013 වර්ෂයේ එම සංඛ්‍යාවෙන් 38,865 ක්ම අදාළ වූයේ, යාපනය දිස්ත්‍රික්කයේ අධිආරක්ෂිත කලාපවලටය. එම විස්තර සැකෙවින් පහත දක්වා ඇත.

උතුරු හා නැගෙනහිර පළාත්වල 2008 සිට 2013 දක්වා ගෙන් ගෙට ගොස් ඡන්දහිමියන් ගණන් නොගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කළ ඡන්ද කොට්ඨාස හා ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳ විස්තර

පරිපාලන දිස්ත්‍රික්කය	වර්ෂය	මුළු ඡන්ද කොට්ඨාස ගණන	ගණන් ගැනීම නොකළ ඡන්ද කොට්ඨාස ගණන	ගණන් ගැනීමකින් තොරව ලියාපදිංචි කළ නම් සංඛ්‍යාව	එක් එක් වර්ෂයේ ගණන් ගැනීමෙන් තොරව ලියාපදිංචි කළ නම් සංඛ්‍යාව
යාපනය	2008	526	526	630548	827405
කිලිනොච්චිය		95	95	90811	
මන්නාරම		68	16	21044	
වවුනියාව		91	15	15907	
මුලතිව්		51	50	67457	
ත්‍රිකුණාමලය*		278	04	1638	
යාපනය	2009	526	45	54977	261766
කිලිනොච්චිය		95	95	90334	
මන්නාරම		68	24	32433	
වවුනියාව		91	15	15758	
මුලතිව්		50	49	67095	
ත්‍රිකුණාමලය*		278	02	1169	
යාපනය	2010	526	36	50448	85711
කිලිනොච්චිය		95	07	2986	
මන්නාරම		68	04	2073	
වවුනියාව		91	02	3591	
මුලතිව්		50	17	26613	
යාපනය	2011	526	43	45518	59543
කිලිනොච්චිය		95	03	1665	
මන්නාරම		68	01	558	
මුලතිව්		50	10	11802	
යාපනය	2012	526	36	45766	50355
කිලිනොච්චිය		95	3	1682	
මන්නාරම		91	1	594	
මුලතිව්		50	3	2313	
යාපනය	2013	526	29	38865	39815
කිලිනොච්චිය		95	1	477	
මන්නාරම		70	1	473	

*නැගෙනහිර පළාතට අයත් පරිපාලන දිස්ත්‍රික්ක.

උතුරු පළාතේ වාර්ෂික ඡන්දහිමි නාමලේඛනය යාවත්කාලීන කිරීමට හා ඡන්ද විමසීම් කටයුතු ක්‍රමවත් කිරීමට ගනු ලැබූ විශේෂ ක්‍රියාමාර්ග

373. දෙදහස් නවය (2009) වර්ෂයේ සිට කිසිදු මැතිවරණ කොට්ඨාසයක ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි වීමට නොහැකි වූ, උතුරු පළාතේ ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ඇති පුද්ගලයින්ගේ නම් ලියාපදිංචි කිරීමට 2013 අංක 27 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධි විධාන) පනත අනුව, කටයුතු කර එවැනි ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාම ලේඛනයක් ද සකස් කරන ලදී.

374. රජයේ ත්‍රිවිධ හමුදාව ඇතුළු ශ්‍රී ලංකා පොලිසිය, උතුරු පළාතේ ක්‍රියාත්මක වූ ත්‍රස්තවාදී ක්‍රියාවන් මර්දනය කිරීම සඳහා කළ දරුණු සටනින් පසු, 2009 වර්ෂයේ මැද සිට, උතුරු පළාතේ අවතැන් වූ ජනතාව, ඔවුන් විසින් සොයා ගත් තාවකාලික නවාතැන්වල ද, රජය මගින් වවුනියා දිස්ත්‍රක්කයේ පිහිටුවන ලද සුභසාධන මධ්‍යස්ථානවලද පදිංචි වී සිටියහ. උතුරු පළාතේ ද්‍රවිඩ ඊලාම් කොටි සංවිධානය (එල්. ටී. ටී. ඊ සංවිධානය) රජයේ හමුදාවන් සමග සටනේ දී, භූමියේ හි වළලා තිබූ බිම්බෝම්බ ඉවත් කරමින්, උතුරු ප්‍රදේශයේ බිම් ප්‍රදේශ, කොටසින් කොටස ක්‍රමිකව ආරක්ෂාව සහිත ප්‍රදේශ බවට පත් කරමින්, අවතැන් වූ පවුල් ඔවුන්ගේ මුල්පදිංචි ප්‍රදේශවල නැවත පදිංචි කරවීමේ කටයුතු, රජයේ උපදෙස් මත ආරක්ෂක අංශ හා උතුරු පළාතේ දිසාපතිවරුන් විසින් අරඹන ලදී. එම වැඩපිළිවෙලට ආරක්ෂක අංශ, සිවිල් පරිපාලන අංශ මෙන්ම සිවිල් සංවිධානද, ජාත්‍යන්තර සංවිධානද සම්බන්ධ වී සිටියහ.

375. වවුනියාවේ සුභ සාධක කඳවුරුවල සිටි පිරිස්, නැවත පදිංචි කිරීමට අවශ්‍ය මූලික දෑ ද සමඟ කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල පිහිටුවන ලද තාවකාලික කඳවුරු කරා පිටත් කර යවා, ටික කාලයක් ඒවායේ රඳවා, ඉන් අනතුරුව ඒ ඒ පවුල් වෙත වෙන් කරන ලද ආරක්ෂිත භූමි භාගවල ඔවුන් පදිංචි කර වීම සිදු කරන ලදී. මෙසේ පදිංචි වන පවුල් 1980 ගණන්වල සිට වරින් වර සිය මුල් ගම් ප්‍රදේශ හැරගිය ජනතාව වූ බැවින්, මේ පවුල්වල සිටි වයස අවුරුදු 18 ඉක්ම වූ සමහරු, කිසිදිනක ඡන්දහිමි නාම ලේඛනවල ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචිව සිටි අය නොවූහ. අවතැන් වූ පවුල්, වරින් වර ඔවුන්ගේ මුලින් පදිංචිව සිටි ප්‍රදේශවල නැවත පදිංචි කිරීමේ වැඩපිළිවෙල පිළිබඳව සොයා බලා අදාළ පරිපාලන අංශ ද සමග සම්බන්ධ වෙමින් ඡන්දහිමියන් ගණන් ගැනීමේ ක්ෂේත්‍ර කටයුතු, ග්‍රාම නිලධාරීන් මඟින් කරවා ගැනීමට අවශ්‍ය විය. එබැවින් යාපනය දිස්ත්‍රික්කයේ

මැතිවරණ කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියාගේ අධීක්ෂණය යටතේ, කිලිනොච්චියේ දිසාපති කාර්යාල භූමියේ තාවකාලික දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයක් ද, වවුනියාව මැතිවරණ කාර්යාලයේ අධීක්ෂණය යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ වෙනම මැතිවරණ කාර්යාලයක් ද පිහිටුවා එම කාර්යාලවලට තාවකාලික කාර්ය මණ්ඩල ද අනුයුක්ත කොට 2009 වර්ෂයෙන් පසු එම දිස්ත්‍රික්ක දෙකෙහි ඡන්දහිමියන් ගණන් ගැනීමේ කටයුතු තව දුරටත් සිදු කරන ලදී. මීට ප්‍රථම එම දිස්ත්‍රික්කවලට සීමා වූ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල නොතිබිණි.

376. උතුරු පළාතේ දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරීන් ඇතුළු රජයේ නිලධාරීන් ද යුධ වාතාවරණය හේතුවෙන් අවතැන් වී සිටියහ. දිසාපති කාර්යාල, ඇතුළු රජයේ කාර්යාල තාවකාලික මට්ටමින් තැනින් තැන ඇරඹීම නිසා ඡන්දහිමියන් ගණන් ගැනීම සංවිධානය කිරීම ද, අසීරු කරුණක් විය. ඊට ප්‍රධාන හේතුව වූයේ, සිවිල් සංවිධානවල, ආරක්ෂක අංශවල හා රජයේ ආයතනවල ප්‍රධානීන්, මෙම අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීමේ කාර්යය කෙරෙහි මුලිකත්වය දී ක්‍රියාකළ බැවින්, එම කටයුතු යම් තරමකට හෝ අවසන් වන තෙක් අදාළ ප්‍රදේශවල ඡන්දහිමියන් ගණන් ගැනීම ඇරඹීම අසීරු වූ බැවිනි. අවතැන් වූ ජනතාවගේ සුභසාධන කටයුතු වෙනුවෙන් කිලිනොච්චි හා මුලතිව් යන දිස්ත්‍රික්ක වෙනුවෙන් තාවකාලික දිසාපති කාර්යාල ආරම්භ වී තිබුණ ද සුභ සාධක කඳවුරු පිහිටා තිබුණේ වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව නගරය ආසන්නයේය. එබැවින් ඉහත සඳහන් කරන ලද මෙම දිස්ත්‍රික්ක දෙකට අදාළ තාවකාලික මැතිවරණ කාර්යාල, එම දිස්ත්‍රික්ක තුළ පිහිටුවීම සඳහා එම දිස්ත්‍රික්කවල ප්‍රධාන පරිපාලන ඒකක වූ දිසාපති කාර්යාල, එම දිස්ත්‍රික්ක තුළම ස්ථාපිත කරන තෙක් ප්‍රමාද කිරීමට සිදුවිය. ග්‍රාම නිලධාරීන් සියලුදෙනාම පාහේ ඡන්දහිමියන් ගණන් ගැනීමේ සාමාන්‍ය රාජකාරිය පිළිබඳ හොඳ දැනුමක් ඇති අය නොවූහ. විශේෂයෙන් නැවත පදිංචි කරවන පවුල්වලට අදාළ ගැටළු හඳුනාගෙන, ඔවුන් එක් ස්ථානයක් යටතේ පමණක් ලියාපදිංචි කිරීම සඳහා ග්‍රාම නිලධාරීන් ලවා නිර්දේශ කරවා ගැනීම තවත් සංකීර්ණ රාජකාරියක් විය. මේ නිසා යාපනය හා වවුනියාව යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට, 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කිලිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික්ක දෙකේ ඡන්දහිමියන් ගණන් ගැනීම වෙනුවෙන් දැඩි අවධානයක් යොමු කොට විශාල රාජකාරී කොටසක් ඉටු කිරීමට සිදුවිය. 2013 වර්ෂයේ දී, මෙම දිස්ත්‍රික්ක දෙක වෙනුවෙන් ස්ථිර ගොඩනැගිලිවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයක් බැගින් පිහිටුවා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරීන් දෙදෙනෙකු යටතේ ස්ථිර කාර්ය මණ්ඩල ද පත් කිරීමට පියවර ගන්නා ලදී. මෙම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල පිහිටුවීම සඳහා ස්ථිර කාර්යමණ්ඩල අනුමත කරවා ගැනීමට ද සිදුවිය.

377. උතුරු පළාතේ ඡන්ද විමසීම් සඳහා සූදානම් වීමේ දී, උතුරු පළාතේ වැසියන්ගේ ඡන්දය පාවිච්චි කිරීමේ ක්‍රමය පිළිබඳව දැනුම ඇති කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට තරග කරන දේශපාලන පක්ෂ විසින්, මැතිවරණ කොමසාරිස්වරයා වෙත යෝජනා ඉදිරිපත් කරන ලදී. තවද, මධ්‍යම පළාතේ තේ වතුවල සේවය කරන එම වතු වල පදිංචි ජනතාව වෙනුවෙන් ද මෙවැනි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ද දේශපාලන පක්ෂවලින් අදහස් පළ විය. සාමාන්‍යයෙන් ඡන්දදායකයින් දැනුවත් කිරීම සඳහා මෙවැනි කරුණු වෙනුවෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් මීට පෙර පුවත්පත් දැන්වීම් පළ කර තිබුණ ද, මේ ආකාරයේ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කර නොතිබිණි. විශේෂයෙන් ඡන්දහිමියන්ට වැරදි අවබෝධයක් ඇති නොවන අයුරින් හා ඔවුන්ට කිසිදු බලපෑමක් ද නොවන අයුරින් මෙවැනි උපදෙස් දීම් සිදු කළ යුතු බැවින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද මග පෙන්වීමක් පදනම් කරගෙන ඒ සඳහා රැස්වීම් උතුරු පළාතේ ගම් වල පවත් වන ලද්දේ මෙම දෙපාර්තුමේන්තුවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙක් හා දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් කිහිපදෙනෙකු විසිනි.

378. ඉහත ක්‍රියාමාර්ගයන් හේතුවෙන් උතුරු පළාතේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට මෙන්ම, එදිනෙදා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් අදාළ ජනතාවට ඉටු කරවා ගතයුතු සේවාවන් පහසුවෙන් ලබා ගැනීමට ඉඩ සැළසුනු අතරම, මැතිවරණ කොමසාරිස්වරයාට ද සිය දෙපාර්තුමේන්තු කටයුතුවලදී සෘජුවම එම දිස්ත්‍රක්ක සමග සම්බන්ධ වී කටයුතු කිරීමට අවකාශ සැළසිණි. උතුරු පළාතට අදාළව මැතිවරණ දෙපාර්තුමේන්තුවේ කටයුතු වඩාත් ඉක්මනින් සහ ක්‍රමවත්ව ඉටු කිරීමට මෙම ක්‍රියාමාර්ග ඉදිරියට ද හේතු වනවාට සැක නැත.

IX වන කොටස

ඡන්ද විමසීම

379. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, පිහිටුවන ලද බස්නාහිර, මධ්‍යම, දකුණු, උතුරු, නැගෙනහිර, උතුරුමැද, වයඹ, සබරගමුව සහ ඌව යන පළාත් සභා වෙනුවෙන් මෙවර ඡන්ද විමසීම් පවත්වන ලද්දේ අදියර හතරක් යටතේය. 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ එක් වරටකට පළාත් සභා තුනක, දෙකක හෝ එකක ආදී වශයෙන් පැවති එම ඡන්ද විමසීම්වලින් 2014 වර්ෂයේ අවසන් වරට පැවති ඡන්ද විමසීම වූයේ ඌව පළාතේ පළාත් සභාව වෙනුවෙන් පැවති ඡන්ද විමසීම යි.

380. ඡන්ද විමසීමකින් පසුව පත්වන පළාත් සභාවක ධුර කාලය, එම පළාත් සභාවේ පළමු රැස්වීම සඳහා නියම කරන ලද දින සිට අවුරුදු පහක කාලයක් පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(අ) (8) ආ ව්‍යවස්ථාව අනුව ආණ්ඩුකාරවරයාට නියමිත ධුර කාලයට කලින් තම පළාත් සභාවේ වාරාවසානය කළ හැකි අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ (2) අනුව ආණ්ඩුකාරවරයා විසින් ඔහුගේ අභිමතය අනුව ඉටුකළ හැකි කාරණාවක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නියම කර ඇති අවස්ථාවක දී, ඒ තීරණය අවසානාත්මකවේ. ඉහත සඳහන් පළාත් සභා අතුරින් උතුරු පළාතේ ඡන්ද විමසීම පවත්වන ලද්දේ, එම පළාත් සභාව විසුරුවා හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නොව, උතුරු හා නැගෙනහිර යන පළාත් ඒකාබද්ධ කොට පිහිටුවා තිබූ පළාත් සභාවේ, ඒකාබද්ධ කිරීම හා සම්බන්ධ වූ අධිකරණ ක්‍රියාමාර්ගයක් හේතුවෙන්, එම පළාත් වෙනුවෙන් වෙන් වූ පළාත් සභා පිහිටුවීමේ අවශ්‍යතාවක් මතු වූ බැවිනි. එම නඩු තීන්දුවෙන් පසු උතුරු පළාතේ පළාත් සභාව පිහිටුවීම සඳහා, එම සභා බල ප්‍රදේශයේ ඡන්ද විමසීමක් පැවැත්වීමට ජනාධිපතිවරයා විසින් 2013.07.05 දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත නියෝගයක් නිකුත් කරන ලදී.

381. පළමුවෙන් ම නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් සභා වෙනුවෙන් 2012.09.08 දින ද, මධ්‍යම, වයඹ හා උතුරු යන පළාත් සභා වෙනුවෙන් 2013.09.21 දින ද බස්නාහිර හා දකුණු යන පළාත් සභා වල ඡන්ද විමසීම 2014.03.29 දින ද පවත්වනු ලැබූ අතර, ඊට පසු අවසන් වශයෙන් 2014.09.20 දින ඌව පළාත් සභාව වෙනුවෙන් ද, ඡන්ද විමසීම් පවත්වන ලදී. අදාළ ඡන්ද විමසීම් දින වල පෙ.ව 7 .00 සිට ප.ව 4.00 දක්වා සියලු පරිපාලන දිස්ත්‍රික්ක පිහිටි ඡන්ද මධ්‍යස්ථාන වල ඡන්ද විමසීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරීන් විසින් සිදු කරන ලදී.

382. මධ්‍යම, වයඹ හා උතුරු යන පළාත් සභා වෙනුවෙන් ඡන්ද විමසීම් පැවැත්වෙන අවස්ථාවේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2013.09.13 දින විශේෂ කරුණු 04 ක් සඳහන් කරමින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් එවා තිබුණි. ඡන්ද විමසීමේ දී ජනතාවගේ මූලික අයිතියක් වන ඡන්දය දීමේ අයිතිය, අනිකුත් අයිතිවාසිකම් හා මානව හිමිකම් සම්බන්ධව මෙම ඡන්ද විමසීම් අවස්ථාවේ නීරික්ෂණය කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා තම කොමිෂන් සභාව කටයුතු කරන බවත්, ඒ සඳහා කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ කටයුතු අදාළ දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරුන්ට දන්වන ලෙසත් එමගින් දන්වා තිබිණි. තවද, 2013.09.21 දින යාපනය දිස්ත්‍රික්කයේ කන්කසන්තුරේ අවට පිහිටි දූපත්වල ඡන්ද විමසීම් කටයුතු නීරික්ෂණය සඳහා යාමට ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතියද ඉල්ලා තිබුණි. එම ඉල්ලීම් පිළිබඳ සුදුසු පියවර මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගනු ලැබිණි.

ඡන්ද විමසීම් දිනට ආසන්න දිනවල දිස්ත්‍රික්කවල ඉටුකරන ලද කාර්යයන්

383. ඡන්ද විමසීම් පැවැත්වූ සෑම අවස්ථාවකදීම රජයේ ආයතන විශාල සංඛ්‍යාවක් පිහිටි කොළඹ, කෝට්ටේ හා කඩුවෙල යන මහ නගර සභා ප්‍රදේශවල, එම රාජ්‍ය ආයතනවලින් ඡන්ද විමසීම් සඳහා සුදුසු නිලධාරීන් හා රජයේ වාහන තෝරා ගැනීමට අවශ්‍ය වන තොරතුරු කැඳවන ලද්දේ මැතිවරණ මහ ලේකම් කාර්යාලය විසිනි. එම තොරතුරු මත සැකසුනු ඡන්ද විමසීම හා ඡන්ද ගණන් කිරීමේ කාර්යය වෙනුවෙන් තෝරා ගැනුණු නිලධාරීන්ද ලබාගත හැකි වාහන ද පිළිබඳ විස්තර රැස්කිරීමෙන් පසු, අදාළ දිස්ත්‍රික්කවල අවශ්‍යතාවයන් සලකා, නිලධාරීන් හා වාහන මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම දිස්ත්‍රික්ක වෙත වෙන් කරන ලදී. මෙම වාහන හා නිලධාරීන්ට අදාළ උපදෙස් ආයතන ප්‍රධානීන් වෙත යවා, එම නිලධාරීන් හා වාහන, ඡන්ද විමසීම් දිනට දින 2 කට හෝ 3 කට පෙර ඒ ඒ දිස්ත්‍රික්ක වලට යැවීම මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් කරනු ලැබිණි. විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ඡන්ද විමසීම් පැවති අවස්ථාවේ දී, එම පළාත්වල දිස්ත්‍රික්කවල රාජකාරී කිරීම සඳහා දෙමළ භාෂා මාධ්‍යයෙන් කටයුතු කළ හැකි නිලධාරී පිරිසක් තෝරා කොළඹින් යැවීමට කටයුතු කරනු ලැබිණි.

384. සෑම ඡන්ද විමසීම් අවස්ථාවක දී ම, ඡන්ද ගණන් කිරීම භාරව සිටින නිලධාරීන්, මෙන්ම වෙනත් සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් පත් කිරීම සඳහා නිලධාරීන් තෝරා, ඔවුන්ට අවශ්‍ය උපදෙස් දී අදාළ දිස්ත්‍රික්කවල රාජකාරි සඳහා පිටපත් කර යැවීම සිදුකරන ලද්දේ, ඡන්ද විමසීමට ආසන්න දින කීපය තුළ මැතිවරණ මහ ලේකම් කාර්යාලය විසිනි.

385. සෑම දිස්ත්‍රික්කයකටම, ඡන්ද විමසීම් දිනට දින කීපයකට පෙර, ඡන්ද විමසීම හා ඡන්ද ගණන් කිරීම සඳහා වන උපදෙස්, ආකෘති පත්‍ර, මුද්‍රිතලිපි කවර වර්ග, ලිපි ද්‍රව්‍ය සහ වෙනත් බඩු බාහිරාදිය අඩුපාඩුවකින් තොරව ලැබී තිබිය යුතුය. මෙවැනි දේවල අඩුපාඩු තිබේදැයි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් සොයා බලා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත, ඒවා සැපයීමද මෙම දින කීපය තුළ සිදු කළ කාර්යයකි.

386. ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලය ඡන්ද පොළවලට පිටත් වනුයේ ඡන්ද විමසීම් දිනට පෙර දිනයේ දීය. ඊට පෙර එම කාර්ය මණ්ඩලයට හා ක්ෂේත්‍ර කටයුතු භාර මාණ්ඩලික නිලධාරීන්ට ද අවශ්‍ය උපදෙස් දී එම කටයුතු අවසන් කළ යුතුය. ඒ අනුව ඡන්ද පොළවලට අදාළ කටයුතු, ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල සැකසීම යන කාර්යයන් වෙනුවෙන්, අවසාන වශයෙන් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ඇතුළුව කාර්ය මණ්ඩලයට ලබාදිය යුතු උපදෙස් දීම මෙම දිනවල දී මැතිවරණ කොමසාරිස්වරයා ඇතුළු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරී මණ්ඩලය විසින් සිදු කරන ලදී.

387. මෙවර පළාත්වල ඡන්ද විමසීම් කඩින් කඩ පැවැත්වීම නිසා, ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්වලට අවශ්‍ය අමතර නිලධාරීන් හා වාහන, ඡන්ද විමසීම් නොපැවැත් වූ වෙනත් යාබද දිස්ත්‍රික්කවල දිසාපතිවරු/ දිසාලේකම්වරු මාර්ගයෙන් ලබා ගැනීමට ද අවශ්‍ය වැඩපිළිවෙල යොදා තිබිණි. මෙසේ යාබද දිස්ත්‍රික්කවලින් නිලධාරීන් හා වාහන අදාළ දිස්ත්‍රික්කවලට ගෙන්වා ගැනීම ඡන්ද විමසීම් පවත්වනු ලබන දිස්ත්‍රික්කවලට පහසුවකි.

388. උතුරු පළාතේ ඡන්ද විමසීම් කටයුතු නීරීක්ෂණය කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ ආරාධනය පරිදි පැමිණි, දකුණු ආසියානු මැතිවරණ පරිපාලන ආයතන සංසදය නියෝජනය කළ විදේශීය නිරීක්ෂකයන්ගේ ආරක්ෂාව, නවාතැන් පහසුකම්, ඔවුන්ගේ ප්‍රවාහන පහසුකම් සහ ඔවුන්ට අවශ්‍ය අනිකුත් සහායක සේවා කටයුතු කල් ඇතිව සම්පාදනය කිරීමට උතුරු පළාතේ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන්ට උපදෙස් දී, ඒ කරුණු පිළිබඳව අදාළ නීරීක්ෂණ කණ්ඩායම ද ආරක්ෂක අංශද දැනුවත් කොට තිබිණි. එහෙත් එම පිරිස කොළඹ සිට උතුරු පළාතේ යාපනය, කිලිනොච්චිය, වවුනියාව, මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්කවල අදාළ ඡන්ද විමසීම් දිනට දින කීපයකට පෙර පිටත් කර යැවිය යුතු වූ බැවින්, ඒ කටයුතු ඡන්ද විමසීමට ආසන්න දින කීපයේදීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් අධීක්ෂණය කරන ලදී. ආරක්ෂක කටයුතු පිළිබඳව එම නීරීක්ෂකයන්ට හා අදාළ ආරක්ෂක අංශ නිලධාරීන්ට අවසන් වශයෙන් උපදෙස් දීමට පොලිස්පතිවරයා කටයුතු කළේය.

389. ඡන්ද විමසීම් කාලය තුළ ඡන්ද විමසීම් තරග කරන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්, නියෝජ්‍ය හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ඉදිරිපත් කර තිබූ, ඡන්ද විමසීම් කටයුතුවල ආරක්ෂාව හා සම්බන්ධ කරුණු අවශ්‍ය පියවර ගැනීම සඳහා උපදෙස් ද සහිතව පොලිස්පතිවරයාට දැනුම්දීමට මැතිවරණ කොමසාරිස්වරයා කටයුතු කළේය. යම් ඡන්ද පොළක ඡන්ද විමසීම් කටයුතු අඩාලවීමක් සිදුවූවහොත්, එවැනි අවස්ථාවක තමා වෙත එම තොරතුරු ඉදිරිපත් කොට උපදෙස් ලබා ගත යුතු ආකාරය සම්බන්ධවද ඡන්ද විමසීම් දිනට දින කිහිපයකට පෙර මැතිවරණ කොමසාරිස්වරයා සෑම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියෙකුම දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී.

390. තේරීම්භාර නිලධාරීන්ට හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන්ට ඡන්ද විමසීම් දිනට, දින දෙකකට පමණ පෙර, කොළඹින් හා වෙනත් දිස්ත්‍රික්කවලින් තම දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම් රාජකාරි වෙනුවෙන් පැමිණෙන කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් ලබා දීම, අවසන් උපදෙස් ලබා දීම හා පත්වීම් ලිපි නිකුත් කිරීම ආදී කටයුතු සිදු කිරීමට කාලය ගත කිරීමට සිදු විය.

391. මෙම පළාත් සභා ඡන්ද විමසීම්වල දී පළාත් සභා 9ට ඇතුළත් වූ පරිපාලන දිස්ත්‍රික්ක 25 හි ලියාපදිංචි ඡන්දභිමියන් 14,540,766 ක් වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථාන 12,006 ක දී ඡන්දය දීම සඳහා පහසුකම් සැලසීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීහු කටයුතු කළහ. ඊට අමතරව උතුරු පළාත් සභා ඡන්ද විමසීමට අදාළව වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීම වෙනුවෙන් පහසුකම් ඉල්ලා සිටි ඡන්දභිමියන් 13,273 ට, පුත්තලම, අනුරාධපුර සහ යාපනය යන දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් සිය දිස්ත්‍රික්ක තුළ ඡන්ද මධ්‍යස්ථාන 22 ක් පිළියෙල කොට ඔවුන් වෙනුවෙන් පහසුකම් සලසන ලදී. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ (අවතැන් වූ

ඡන්දහිමියන් වෙනුවෙන් පිළියල කළ ඡන්ද මධ්‍යස්ථාන හැර) තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්දහිමියන්ගේ පහසුව සඳහා පිහිට වූ ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

පළාත	පරිපාලන දිස්ත්‍රික්කය	ඡන්ද විමසීමේ දී භාවිතා කරන ලද ඡන්දලේඛන සකස් කළ වර්ෂය	ලියාපදිංචි ඡන්දදායකයන් සංඛ්‍යාව	ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව	පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව
බස්නාහිර	කොළඹ	2013	1,552,733	1,049	1,062
	ගම්පහ		1,590,076	968	1,014
	කළුතර		881,814	540	613
මධ්‍යම	මහනුවර	2012	1,015,315	825	825
	මාතලේ		366,549	322	323
	නුවරඑලිය		507,693	423	423
දකුණ	ගාල්ල	2013	809,822	703	703
	මාතර		608,524	444	450
	හම්බන්තොට		455,398	410	411
උතුර	යාපනය	2012	426,813	526	526
	කිලිනොච්චිය		68,600	95	95
	වවුනියාව		94,644	89	89
	මන්නාරම		75,737	70	70
	මුලතිව්		53,683	50	52
නැගෙනහිර	මඩකලපුව	2011	347,099	362	414
	ත්‍රිකුණාමලය		245,363	285	285
	අම්පාර		441,287	464	464
වයඹ	කුරුණෑගල	2012	1,227,810	920	920
	පුත්තලම		526,408	387	389
උතුරු මැද	අනුරාධපුරය	2011	606,508	608	608
	පොලොන්නරුව		294,365	286	287
ඌව	බදුල්ල	2013	609,966	516	516
	මොණරාගල		332,764	318	318
සබරගමුව	රත්නපුර	2011	769,814	623	623
	කෑගල්ල		631,981	565	526
එකතුව			**14,540,766**	11,848	**12,006**

392. තවද, පුත්තලම,යාපනය හා අනුරාධපුර යන දිස්ත්‍රක්කවල, වෙනත් ඡන්ද පොළක දී ඡන්දය පාවිච්චි කිරීමට උතුරු පළාතේ ඡන්දහිමියන් සඳහා පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථානවල කටයුතු කිරීමට, උතුරු පළාතේ දිස්ත්‍රික්ක සඳහා තරග කළ දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල ඡන්ද පොළ නියෝජිතයින්ට ඉඩ සළසන ලදී.

ඡන්ද විමසීම් දිනට පෙර දින කටයුතු, ඡන්ද මධ්‍යස්ථාන පිළියෙල කිරීම

393. පළාත් සභා බලප්‍රදේශ තුළ පරිපාලන දිස්ත්‍රික්කවල පිහිටුවනු ලබන ඡන්ද මධ්‍යස්ථාන වෙනුවෙන් සුදුසු ගොඩනැගිලි තෝරාගෙන, ඒ පිළිබඳ තීරණ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් කල් තියා ගෙන තිබුණ ද, ඒවායේ අවශ්‍ය සූදානම් කිරීම ඡන්ද විමසීම් දිනට දින දෙකකට පමණ පෙර සිදු කෙරෙනුයේ ග්‍රාම නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මාර්ගයෙනි.

394. ඡන්ද මධ්‍යස්ථාන ගොඩනැගිලිවලින් වැඩි ප්‍රමාණයක් පාසල් ගොඩනැගිලි විය. ඒවායේ පිහිටුවන ඡන්ද මධ්‍යස්ථානවල ඡන්දහිමියන්ගේ පෝලිම් සංඛ්‍යාව තීරණය කිරීම හා ඒ සඳහා සුදුසු ගොඩනැගිලි කල් තියා හඳුනා ගැනීම ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරියාගේ වාර්තාව ද ලබාගෙන දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදුකරන ලදී. පාසල් ගොඩනැගිලිවලට මෙන්ම වෙනත් ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවනු ලබන ගොඩනැගිලිවලට අවශ්‍ය ලීබඩු ආදිය විදුහල්පතිවරුන් මාර්ගයෙන් ලබා ගැනීමට කටයුතු කරන ලද්දේ ග්‍රාම නිලධාරීන් විසිනි. ඊට අමතරව ඡන්ද මධ්‍යස්ථාන ගොඩනැගිලිවල, ඡන්ද විමසීම් දිනට පෙර දින රාත්‍රියේ නවාතැන් ගනු ලබන ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයට නවාතැන් ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් ද, ඔවුන්ට ඡන්ද විමසීම් අවසන් වන තෙක් එහි රැඳී සිටින කාලය තුළ, සාධාරණ මිලකට ආහාර ලබා දීමේ වැඩපිළිවෙල ද ග්‍රාම නිලධාරීන් විසින් තේරීම්භාර නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මග පෙන්වීම අනුව යොදනු ලැබිණි.

395. මෙසේ ග්‍රාම නිලධාරීන් විසින් සූදානම් කරනු ලබන ඡන්ද පොළවල්වල, ඡන්ද විමසීම් දිනට පෙර දින පස්වරුවේ ඡන්ද පොළවල රාජකාරී සඳහා පැමිණෙන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ මග පෙන්වීම මත අවශ්‍ය වෙනස්කම් කිරීම් සිදු කිරීමට එම නිලධාරීන්ට උපදෙස් දී තිබිණි.

396. සමහර ග්‍රාම නිලධාරීන්ට මෙවැනි ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක්ම සූදානම් කිරීමේ වගකීම පැවරී තිබූ අතර, ඔවුන් ඉටු කරනු ලබන මෙම විශේෂ කාර්යය සඳහා ඔවුන්ට ගෙවීම් ද කරන ලදී. ඡන්ද පොළවල් සූදානම් කිරීම වෙනුවෙන් හා ඒවායේ අදාළ පහසුකම් සැලසීමට ග්‍රාම නිලධාරීන් විසින් ඉටු කරනු ලබන සේවය විශේෂයෙන් අගය කළ යුත්තකි.

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි ඇතුළු ඡන්ද විමසීමට අවශ්‍ය දෑ නිකුත් කිරීම

397. ඡන්ද විමසීම් දිනට පෙර දින පෙරවරු 7.00 පමණ වන විට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් මත සේවයට වාර්තා කරනු ලබන ජ්‍යෙෂ්ඨ

ඡන්ද ස්ථානාධිපතිවරුන්ට ඡන්ද පොළවලට අදාළ පත්වීම් ලිපි භාරදීම සිදු විය. ඔවුන්ගේ ආරක්ෂාව සඳහා ලබාදෙන පොලිස් නිලධාරීන් ද, සහායට දෙනු ලබන සුළු සේවක මහතා ද සමග, ඡන්ද පොළ වෙනුවෙන් නිකුත් කෙරෙන ඡන්ද පෙට්ටි, ඡන්ද පත්‍රිකා ඇතුළු ආරක්ෂිත භාණ්ඩ ද, අනිකුත් භාණ්ඩ හා ලේඛන ද අදාළ නිකුත් කිරීමේ ස්ථානයට ගොස් පරීක්ෂාකර භාරගැනීමට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට නියම කොට තිබිණි.

398. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට භාණ්ඩ නිකුත් කිරීමේ මෙවැනි ස්ථාන පිළිවෙල වන්නේ, ඡන්ද මධ්‍යස්ථානවලට අදාළ ඡන්ද පත්‍රිකා ගණන් කිරීම සඳහා සූදානම් කරන ඡන්ද ගණන් කිරීමේ ශාලාවේ හෝ ඒ ශාලාව ආසන්නයේ ය. මෙවැනි එක් නිකුත් කිරීම් ස්ථානයක දී සාමාන්‍යයෙන් ඡන්ද මධ්‍යස්ථාන 10 ක පමණ අදාළ භාණ්ඩ නිකුත් කිරීම සිදු කෙරෙන අතර, එම ස්ථානවල රාජකාරී කටයුතු සඳහා ඉතා පළපුරුදු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් යොදවන ලදී.

ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ඡන්ද පොළවල් කරා පිටත් කිරීම.

399. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා ඇතුළු බඩු බාහිරාදිය ද සමග ආරක්ෂාව සඳහා යොදා ඇති පොලිස් නිලධාරීන් කැටුව නියමිත ඡන්ද පොළවල් කරා ප්‍රවාහනය කරවීම ද, සෙසු ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ඡන්ද පොළවල් කරා යැවීම ද මෙදින දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සැලසුම් සහගතව සිදුකරන ලදී.

400. ඡන්ද විමසීම් කාර්ය මණ්ඩල ප්‍රවාහන වැඩපිළිවෙල කල්තබා සැලසුම්කොට, ක්‍රියාත්මක කිරීම තේරීම්භාර නිලධාරීන්ගේ අපේක්ෂාව වී තිබුන ද, බලාපොරොත්තු වූ වාහන සංඛ්‍යාව සේවයට වාර්තා නොකිරීම් නිසා සමහර දිස්ත්‍රික්කවල නිලධාරීන් ප්‍රවාහනය කිරීම අපහසුතාවන් මැද ඉටු කිරීමට සිදු වූ බව වාර්තා විය.

401. වර්තමානයේ පැවැත්වෙන ඡන්ද විමසීම්වල දී, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් නියමිත ස්ථානයකට කැඳවා අදාළ බඩුබාහිරාදිය ද සමග ඔවුන්, නියමිත ඡන්ද පොළවල් කරා ප්‍රවාහනය කරවීම, මධ්‍යගත ප්‍රවාහන වැඩපිළිවෙලක් යටතේ සිදු කෙරේ. එහෙත් සෙසු ඡන්ද පොළ කාර්ය මණ්ඩලයෙන් වැඩි පිරිසක්, ඡන්ද විමසීම පැවැත්වෙන දිස්ත්‍රික්කය තුළම පදිංචිකරුවන් වන බැවින් කල්තියා ඔවුන්ට දැනුම් දී ඡන්ද විමසීමට පෙර දින අනුයුක්ත කරනු ලබන ඡන්ද පොළවල් ඔවුන්ට දැනුම් දී, ඔවුන් විසින් ම යොදාගත් ක්‍රමයකට හෝ පොදු මගී ප්‍රවාහන සේවා ප්‍රයෝජනයට ගෙන, නියමිත ඡන්ද පොළවල් කරා යාමට තේරීම්භාර නිලධාරීන් උපදෙස්දී තිබුණි. එවැනි මගී ගමනාගමන පහසුකම් ප්‍රමාණවත් ලෙස නොමැති ප්‍රදේශවලින් සේවයට වාර්තා කරනු ලබන අයට හා දිස්ත්‍රික්කයෙන් බැහැර සිට ඡන්ද පොළ රාජකාරි සඳහා වාර්තා කරනු ලබන අමතර කාර්ය මණ්ඩලය වෙනුවෙන් පමණක් තේරීම්භාර නිලධාරීන් ඡන්ද පොළවල් කරා යැවීමට ප්‍රවාහන පහසුකම් සලසන ලදී.

402. මෙසේ ඡන්ද විමසීම් දිනට පෙර දින ඡන්ද පොළවල් කරා ගිය කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට (පිරිමින්) පමණක්, එදින රාත්‍රියේ ඡන්ද පොළේ රැඳී සිටීමට උපදෙස් දී තිබුණි. නිලධාරිනීන් ඡන්ද පොළට සේවයට වාර්තා කිරීමෙන් පසු ඔවුන් විසින් සූදානම් කරගත් නවාතැනකට හෝ ආපසු සිය නිවෙස් කරා ගොස්, පසුවදා ඡන්ද විමසීම ඇරඹීමට පෙර ඡන්ද පොළවල් කරා පැමිණිය යුතු විය. ඡන්ද විමසීම් දිනට පෙර දින පස්වරුවේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පොළේ දී පවත්වනු ලබන ඡන්ද විමසීම පිළිබඳ පෙරහුරුවට සහභාගීවී තමාට පැවරෙන රාජකාරි පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට කාර්ය මණ්ඩලවලට උපදෙස් දී තිබිණි.

403. යාපනය දිස්ත්‍රික්කයේ දූපත්වල පිහිටි ඡන්ද මධ්‍යස්ථාන 9 ක බඩු බාහිරාදිය සහ නිලධාරීන් ද පොලිස් නිලධාරීන් ද, නාවික හමුදා බෝට්ටු හා ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානා මගින් ප්‍රවාහනය කිරීමට වැඩ පිළිවෙල යොදවා තිබිණි. මේ සම්බන්ධයෙන් වූ යාපනය දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියාගේ ඉල්ලීම, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කර, මැතිවරණ කොමසාරිස්වරයා අවශ්‍ය එම ප්‍රවාහන කටයුතු සම්පාදනය කරන ලදී.

කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්

404. ඡන්ද විමසීම් දිනට පෙර දින, ඡන්ද පොළවල්වල සූදානම, ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලය ඡන්ද පොළවල් කරා වාර්තා කිරීම, ඡන්ද විමසීම් කටයුතු සඳහා අවශ්‍යවන සියලුම දෑ ඡන්ද පොළවල්වල සම්පාදනය වී තිබීම සහ ඡන්ද පොළවල්වල සාමකාමී පරිසරයක් පවතීද යන කරුණු සම්බන්ධව කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් මාර්ගයෙන් තේරීම්භාර නිලධාරීන් වාර්තා ලබා ගන්නා ලදී. මෙදින මෙම කරුණුවලට අදාළව කරනු ලබන පරීක්ෂා කිරීම් කළ යුතු ආකාරය හා වාර්තා ඉදිරිපත් කළ යුතු ආකාරය ගැන ද එම නිලධාරීන් දැනුවත් කර තිබුණි. සාමාන්‍යයෙන් ඒ ඒ

ප්‍රදේශවල පවත්නා භූගෝලීය පරිසරය, මාර්ග පහසුකම් මෙන්ම ඡන්ද මධ්‍යස්ථානවල පිහිටීම ආදී කරුණු ද සලකා මෙවැනි එක් නිලධාරියෙකුට ඡන්ද මධ්‍යස්ථාන 5-6 ක පමණ සංඛ්‍යාවක් අධීක්ෂණය කිරීම සඳහා රාජකාරී පැවරේ. ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීම් දින ද සිදු කළ යුතු වන මෙම නිලධාරීන්ගේ රාජකාරි අවසන් කිරීමෙන් පසු, අදාළ දින දෙක තුළ ඉටුකළ රාජකාරි සම්බන්ධව වාර්තාවක් ද තේරීම්භාර නිලධාරීට භාරදීමට ඔවුන්ට නියම කර තිබිණි.

405. ඡන්ද විමසීම් නීතිය, ඡන්ද විමසීමේ ක්‍රියාදාමය, ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතු හා දිස්ත්‍රික්කය තුළ ඡන්ද විමසීම් කටයුතු සංවිධානය කර ඇති ආකාරය යන කරුණු පිළිබඳව හොඳ දැනීමක් හා අවබෝධයක් ඇති දිස්ත්‍රික්කයේ පිහිටීම ගැන ද දැනුමක් ඇති නිලධාරීන් කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් පත් කිරීමට සුදුසු නිලධාරීන් ලෙස තෝරා ගැනීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. තේරීම්භාර නිලධාරී වෙනුවෙන් ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීම් දින ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයට හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට උපදෙස් ලබා දීමට ක්ෂේත්‍රයේ සිටින ප්‍රධාන නිලධාරියා මෙම නිලධාරියා ය.

ආරක්ෂක කටයුතු

406. කලාප සහකාර තේරීම්භාර නිලධාරීන් හා පොලිස් නිලධාරීන් විසින් ලබා දෙන ලද වාර්තා අනුව, පසු දින නියමිත වේලාවට සියලුම ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද විමසීමට අවශ්‍ය කටයුතු සම්පාදනය වී ඇති බවට හා ඡන්ද පොළවල ආරක්ෂාව තහවුරු වී ඇති බව මැතිවරණ කොමසාරිස්වරයාට ඡන්ද විමසීම් දිනට පෙරාතුව වූ දින රාත්‍රියේ අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් වාර්තා කර තිබුණි.

ඡන්ද විමසීම් දිනය

407. ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවල සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්, තම දිස්ත්‍රික්කයේ සියලුම ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද විමසීම පෙරවරු 7.00 ට ආරම්භ කළ බව කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ වාර්තා අනුව දැනගැනීමෙන් පසු ඒ බව මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වන ලදී. තම කාර්ය මණ්ඩල පහත සඳහන් කර්තව්‍යයන්හි නිරත කරවමින් මෙදින ඉදිරියට ඉටු කිරීමට ඇති වැඩ කටයුතු සංවිධානය කිරීමට තේරීම්භාර නිලධාරීන්ගේ අවධානය යොමු වී තිබිණි.

I. ඡන්ද ගණන් කිරීමේ ශාලා හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ බඩුබාහිරාදිය භාර ගැනීමේ ස්ථාන සංවිධානය කිරීම.
II. එතෙක් අවසර පත් ගැනීමට ප්‍රමාද වූ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට නම් කර ඇති දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයින්ගේ අවසරපත් ලබා දීමට වැඩපිළිවෙල යෙදීම.
III. ඡන්ද ගණන් කිරීම භාරව කටයුතු කරනු ලබන නිලධාරීන්ට අවසාන උපදෙස් ලබාදීම.
IV. ඡන්ද ගණන් කිරීම සඳහා නම් කළ නියෝජිතයන්ගෙන්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ ඡන්ද පෙට්ටි හා භාණ්ඩ භාර ගැනීම නිරීක්ෂණය සඳහා කල්තියා පැමිණෙන නියෝජිතයින්ට අවශ්‍ය ඉඩකඩ ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම.
V. ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටි පරිශ්‍ර තුළ ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයට රාත්‍රී කෑම මිල දී ගැනීමට යොදා ඇති වැඩපිළිවෙල හා ඡන්ද ගණන් කිරීමේ ශාලා පිළියෙල කිරීම සොයා බැලීම.
VI. ප්‍රතිඵල සැකසීමේ හා ප්‍රකාශ කිරීමේ ස්ථාන පිළියෙල කිරීම.
VII. සම්බන්ධීකරණ කාර්යාල කටයුතු සොයාබැලීම.
VIII. ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍රවලට තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් පැමිණෙන ගණන් කිරීමේ නියෝජිතයින් හැර අනෙකුත් බලයලත් නියෝජිතයින්, කණ්ඩායම් නායකයන් හෝ වෙනත් අයට සපයා ඇති පහසුකම්.
IX. ප්‍රතිඵල සැකසීමේ ස්ථානය පිහිටි ප්‍රදේශයට ප්‍රතිඵල ලබා ගැනීමට පැමිණෙන මාධ්‍ය ආයතන නියෝජනය කරන නියෝජිතයන් වෙනුවෙන් සපයා ඇති පහසුකම්පිළිබඳව සොයා බැලීම.
X. ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල සැකසීමේ ස්ථානවල ආරක්ෂිත වැඩපිළිවෙල පිළිබඳව අවසාන වශයෙන් සොයා බැලීම.

ඡන්ද විමසීම නිරීක්ෂණය කිරීම

408. ශ්‍රී ලංකාවේ මැතිවරණ නීතියේ මැතිවරණ නිරීක්ෂණය කිරීමට කිසියම් සංවිධානයකට බලය ලබා දීම සඳහා නීතිමය විධිවිධාන ඇතුළත්ව නැත. එහෙත් 1980 වර්ෂය අවසාන භාගයේ, මෙරට පැවති ජාතික මට්ටමේ ඡන්ද විමසීම් නිරීක්ෂණය කිරීම සඳහා, ඡන්ද විමසීම් තරග කරනු ලැබූ දේශපාලන පක්ෂවල එකඟතාව මත ඒ සඳහා අවකාශ ලබා දී ඇත. ඒ ආකාරයට ඉන් අනතුරුව පැවති ඡන්ද විමසීම්වල දී ද නිරීක්ෂණ සංවිධානවලට නිරීක්ෂණ කටයුතු සඳහා අවසර ලබා දෙන ලද අතර, මුල් අවස්ථාවේ

දී ජාත්‍යන්තර සංවිධානවලට නිරීක්ෂණ කණ්ඩායම් ඉදිරිපත් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. එසේ මැතිවරණ කොමසාරිස්වරයාගේ ආරාධනය පරිදි නිරීක්ෂණ කටයුතුවල යෙදුනු සංවිධානවල නිරීක්ෂකයින්ට ඡන්ද පොළවල මෙන්ම ඡන්ද ගණන් කිරීමේ ස්ථානවලද නිරීක්ෂණ කටයුතු කිරීමට ඉඩ දෙන ලදී.

409. ඉහත දක්වන ලද ආකාරයට විදේශීය නිරීක්ෂණ ආයතන මැතිවරණ නිරීක්ෂණය සඳහා පැමිණීමත් සමග මෙරට සංවිධාන කිහිපයක් ද මැතිවරණ පැවැත්වෙන අවස්ථාවල දී ඡන්ද විමසීම් නිරීක්ෂණය කිරීම සඳහා ඉල්ලීම් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඒ සඳහා අවසර ලබා ගන්නා ලදී. මෙවැනි දේශීය හෝ විදේශීය නිරීක්ෂණ ආයතනවලට ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කිරීමට අවසර දීම ඡන්ද විමසීම, තරග කරනු ලබන දේශපාලන පක්ෂවල එකඟත්වය මත සිදු විය. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීම ආරම්භ වූ 2012 වර්ෂයේ සිට එම ඡන්ද විමසීම් අවසන් වූ 2014 වර්ෂය දක්වා පැවති පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල දී, ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කිරීමට පහත දැක්වෙන සංවිධාන, මැතිවරණ කොමසාරිස්වරයාගෙන් අවසර ඉල්ලා සිටින ලදී.

1. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය
   රොබට් ටෙරස්, රොබට් ගුණවර්ධන මාවත, කොළඹ 06
2. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ සංවිධානය
   24/2, 28 වන පටුමග, මල් පාර යාබද, කොළඹ 07.
3. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය.
   100/19 ඒ, වැලිකඩවත්ත පාර, රාජගිරිය.
4. ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය
   195, බේස්ලයින් පාර, කොළඹ 09.
5. මැතිවරණ නිරීක්ෂණ ජාලය
   327/2 බී, විජයබා පෙදෙස, ගජබා මාවත, මාකොළ උතුර.
6. නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ව්‍යාපාරය
   24/13, විජයබා මාවත, නාවල පාර, නුගේගොඩ
7. ලක්බිමේ මව්වරු සහ දියණියෝ සංවිධානය
   52/61, පීරිස් මාවත, ජාඇල.
8. ලංකා මැතිවරණ විවරණ
   17/3, පිරිවෙන පාර, බොරලැස්ගමුව.

410. ඉහත නිරීක්ෂණ ආයතන මෙවර පැවති සියලුම පළාත් සභා ඡන්ද විමසීම් නිරීක්ෂණය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොකෙරිණි. අදාළ ඉල්ලීම් ඉදිරිපත් වූ අවස්ථාවල දී, එම සංවිධානවලට අවසර ලබාදීමට ප්‍රථම එම සංවිධාන පිළිබඳ වැඩි දුර විස්තර කැඳවන ලදී. එසේ විස්තර කැඳවීමේ දී සංවිධානයේ නිලධාරී මණ්ඩලයේ විස්තර, සංවිධානය විසින් සිදු කර ඇති පූර්ව මැතිවරණ නිරීක්ෂණ පිළිබඳ විස්තර, මෙවර මැතිවරණ නිරීක්ෂණ වැඩ පිළිවෙල හා ඒ වෙනුවෙන් මුදල් ලබා ගන්නා ආකාරය ද විමසා බලන ලදී.

411. කිසිදු නිරීක්ෂණ සංවිධානයකට, ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහා ඡන්ද ගණන් කිරීමේ ශාලාවලට ඇතුළු වීමට අවසර නොලැබිණි. ඡන්ද විමසීමට අදාළව එම සංවිධානවලට විවිධ අයුරින් අවසර ලබාදීමට මැතිවරණ කොමසාරිස්වරයා කටයුතු කරන ලදී. නිරීක්ෂණ ආයතන සියල්ලේ ප්‍රධානීන්ට ඕනෑම ඡන්ද පොළකට ඇතුළු වී නිරීක්ෂණය කිරීමට ඉඩ දී තිබුණි. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (පැෆරල්) හා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (සී.එම්.ඊ.වී.) යන සංවිධානවලට සිය නිරීක්ෂකයින් ඡන්ද පොළවල රඳවා, නිරීක්ෂණ කටයුතු කිරීමට ඉඩ දෙන ලද අතර අනිකුත් සංවිධානවලට නිරීක්ෂකයින් ඡන්ද පොළවලින් බැහැරව යෙදවීමට ඉඩ දී තිබුණි. මෙසේ අවසර ලබා දෙන ලද නිරීක්ෂණ ආයතන ප්‍රධානීන්, නිලධාරීන් හා නිරීක්ෂකයින්ද වෙනුවෙන් මැතිවරණ කොමසාරිස්වරයා පළාත් සභා ඡන්ද විමසීම් පැවති අවස්ථාවල දී ආචාර ධර්ම පද්ධතියක් නිකුත් කරන ලද අතර, උඟව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව එසේ නිකුත් කළ ආචාර ධර්ම පද්ධතිය පරිශිෂ්ඨ 27 වශයෙන් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත. එම පිරිස් විසින් ලබා දිය යුතු ප්‍රතිඥාව පරිශිෂ්ඨ 28 හි දැක්වේ.

උතුරු පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් විදේශීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් යෙදවීම.

412. පූර්ව මැතිවරණ පැවති අවස්ථාවල දී ක්‍රියාකර ඇති ආකාරයට උතුරු, වයඹ හා මධ්‍යම යන පළාත් සභා වෙනුවෙන් ඡන්ද විමසීම් පැවති අවස්ථාවේ එම ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වූ දේශපාලන පක්ෂවල ලේකම්වරුන් හා මැතිවරණ කොමසාරිස්වරයා සමග පැවති සාකච්ඡාවක දී, ඉදිරිපත් වූ යෝජනාවක් පිළිගනිමින් උතුරු පළාතේ ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා විදේශීය නිරීක්ෂකයන් කණ්ඩායමක් කැඳවීමට මැතිවරණ කොමසාරිස්වරයා තීරණය කරන ලදී.

413. මේ අනුව පොදු රාජ්‍ය මණ්ඩලයේ මහ ලේකම්වරයා වෙතද, දකුණු ආසියාතික මැතිවරණ පරිපාලන ආයතන සංසදයේ (Forum Of Election Management Bodies Of South Asia) සභාපතිත්වය දරන

ඉන්දියානු මැතිවරණ කොමිසමේ ප්‍රධාන මැතිවරණ කොමසාරිස්වරයා වෙතද, මැතිවරණ කොමසාරිස්වරයා උතුරු, මධ්‍යම හා වයඹ යන පළාත් සභා ඡන්ද විමසීම් හා සූදානම් වූ අවස්ථාවේ, නිරීක්ෂකයින් කණ්ඩායමක් යෙදවීමට ඇති සිය අදහස 2013 ජූලි මාසයේ දී දන්වනු ලැබීමෙන් පසු, ඒ සඳහා අදාළ පාර්ශව එකඟතාවය පළ කරන ලදී. අනතුරුව මැතිවරණ කොමසාරිස්වරයා මෙන්ම, ඉන්දියානු මැතිවරණ කොමිසම ද දකුණු ආසියාවේ අදාළ රටවල මැතිවරණ පරිපාලන ආයතන වෙත නිරීක්ෂණ කණ්ඩායම් වෙනුවෙන් සුදුසු නිලධාරීන් නම් කරන ලෙස දන්වන ලදී. ඒ අනුව ඉන්දියානු මැතිවරණ කොමිෂමේ හිටපු ප්‍රධාන මැතිවරණ කොමසාරිස්වරයෙකු වූ එන්. ගෝපාලස්වාමි මහතාගේ ප්‍රධානත්වයෙන් ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය හා පකිස්ථානය යන රටවල මැතිවරණ කොමිෂන් සභා යටතේ සේවය කරන නිලධාරීන් 17 ක් හා පකිස්ථාන මැතිවරණ කොමිසමේ සේවය කර ඇති අධිකරණ විනිසුරුවරයෙකු වූ සාමාජිකයෙකු ද පත් කෙරුණි. මෙම අය 2013.09.12 සිට 2013.09.16 දක්වා දිනවල දිවයිනට පැමිණි අතර, ඔවුන් නිරීක්ෂණ කටයුතු සඳහා අදාළ දිස්ත්‍රික්ක වෙත පිටත් කර යැවීමට පෙර, මෙරට පළාත් සභා ඡන්ද විමසීම් නීතිය හා ඡන්ද විමසීම් ක්‍රියාදාමය පිළිබඳව ඔවුන් වෙනුවෙන් හඳුන්වාදීමේ කෙටි පුහුණු වැඩසටහනක් ද ක්‍රියාත්මක කර, අදාළ දැනුම ලබාගැනීම සඳහා අවශ්‍ය ලේඛනද ඔවුන් වෙත ලබා දෙන ලදී.

414. මැතිවරණ කොමසාරිස්වරයා ද, පොලිස්පතිවරයා ද පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද ඡන්ද විමසීම් පැවති දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ද, ඡන්ද විමසීම තරග කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජිතයින් ද, දේශීය නිරීක්ෂණ කණ්ඩායම් ද මුණ ගැසීම සඳහා විදේශීය නිරීක්ෂණ කණ්ඩායමට අවස්ථාව සලසන ලදී. ඡන්ද විමසීමට අදාළ ආරක්ෂක වැඩපිළිවෙල පිළිබඳව නිරීක්ෂකයින් දැනුවත් කරන ලද්දේ පොලිස්පතිවරයා විසිනි.

415. උතුරු පළාතේ පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් පමණක් මෙම නිරීක්ෂකයින් යෙදවීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලදී. මෙම අවස්ථාවේ වසර 30කට අධික කාලයක් එම පළාතේ පැවති ත්‍රස්තවාදී ක්‍රියා හා ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ පිළිවෙල ද, සිවිල් පරිපාලනය කඩා වැටීම් ද යනා දී සිදුවීම්වලින් පසු යුධ වාතාවරණය හේතුවෙන් අවතැන් වූ සිවිල් ජනතාව බොහෝ දුරට නැවත පදිංචි කොට තිබීමත්, එම පළාත්වල ක්‍රියාත්මක වූ පිළිගත් දේශපාලන පක්ෂ බොහොමයක් ඡන්ද විමසීමට ඉදිරිපත්ව තිබීමත් යන කරුණු, එම තීරණය ගැනීමට බොහෝ සෙයින් හේතු විය. විශේෂයෙන් දීර්ඝ කාලයක් ත්‍රස්තවාදී ග්‍රහණයට ලක්ව සිටි ජනතාව සිය විමධ්‍යගත පරිපාලන රටාවට අනුගතව, තම මහජන නියෝජිතයින් තෝරා පත් කර ගැනීමට ඡන්දදායකයන් හා තරග කරනු ලබන පාර්ශව විසින් ප්‍රදර්ශනය කෙරුණු, දැඩි උනන්දුව ද නිසා, දිවයිනේ සිවිල් සංවිධාන, මෙන්ම ජනතාව ද මෙම ඡන්ද විමසීම දෙස උනන්දුවෙන් බලා සිටියහ. උතුරු පළාත වෙනුවෙන් තරගයට පිවිසී සිටි දේශපාලන පක්ෂවලින් ද, එම පළාතට විදේශීය නිරීක්ෂකයන් යොදවන ලෙස විශේෂ ඉල්ලීමක් මැතිවරණ කොමසාරිස්වරයා වෙත යොමු වී තිබුණි.

416. මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුටම වෙන් වෙන් වශයෙන් ආරක්ෂාව සැලසීම ට ද, ඔවුන්ගේ නවාතැන් ස්ථානවල ආරක්ෂාව සැලසීමට වැඩපිළිවෙලක් ද යොදා තිබිණි. සෑම නිරීක්ෂකයෙකු වෙනුවෙන්ම කොළඹින් හා අදාළ දිස්ත්‍රික්කයෙන් සම්බන්ධීකාරවරයෙකු බැගින් පත් කර තිබූ අතර, ඒ ඒ දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් තම දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් වැඩපිළිවෙල පිළිබඳව අවශ්‍ය තොරතුරු ලබා දීමෙන් ඔවුන් දැනුවත් කිරීමට ද කටයුතු කෙරුණි.

417. මැතිවරණ කොමසාරිස්වරයා විසින් සියලුම නිරීක්ෂකයින් වෙත නිරීක්ෂණ කටයුතුවලට අදාළ නියමයන් නිකුත් කර තිබුණි. නිරීක්ෂණ කණ්ඩායමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා පළපුරුදු කුඩා නිලධාරී කණ්ඩායමකින් යුත් ලේකම් කාර්යාලයක් ද කොළඹ ගලදරී හෝටලයේ පිහිටුවා තිබුණු අතර, නිරීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයින්ට කොළඹ දී නවාතැන් සපයන ලද්දේ එම හෝටලයේ දීය. නිරීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයන්ට, අදාළ රටවල සිට මෙරටට පැමිණීමටත්, ආපසු යෑමටත් අවශ්‍ය ගුවන් ගමන් වියදම් ද, ඔවුන්ට මෙරට නවතැන් ලබාදීමට හා ප්‍රවාහන පහසුකම් ලබාදීමටද වියදම් මැතිවරණ දෙපාර්තුමේන්තුව විසින් දරන ලදී.

418. පොදුරාජ්‍ය මණ්ඩලයීය නිරීක්ෂණ කණ්ඩායම් නියෝජිතයින් 04 දෙනෙක්ගෙන් සමන්විත වූ අතර, එම නිරීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයන් 2013.09.13 දින මෙරටට පැමිණීමට පෙර එහි සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබ සිටි කෙන්යානු ජනරජයේ හිටපු ජනාධිපති ස්ටෙෆන් කලොන්සු මුස්යොකා මැතිතුමා, මෙරටට පැමිණි අතර, ඔවුන් එම කාලය තුළ මැතිවරණ කොමසාරිස්වරයා ද, දේශපාලන පක්ෂ සාමාජිකයන් උතුරු පළාතේ තේරීම්භාර නිලධාරීන් ද හමුවිය. මෙම නිරීක්ෂණ කණ්ඩායම වෙනුවෙන් කිසිදු වියදම්

දැරීමක් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නොකරන ලද අතර, සාමාජිකයන් සියලු දෙනා ද මැතිවරණ කොමසාරිස්වරයා හමුවී ඡන්ද විමසීමට අදාළ විස්තර හා සංවිධාන කටයුතු පිළිබඳ දැනුමක් ලබාගන්නා ලදී.

X වන කොටස

ඡන්ද හා මනාප ගණන් කිරීම

419. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ IV වන කොටසට අයත් 47 සිට 61 දක්වා වූ වගන්ති හා එම පනතේ දෙවන උප ලේඛනය වන තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග මාලාවේ 18 සිට 28 දක්වා වූ නියෝග ද, ඡන්ද හා මනාප ගණන් කිරීම හා සම්බන්ධ ප්‍රධාන නීතිමය විධිවිධාන වශයෙන් හැඳින්විය හැකිය.

420. මෙම පනතේ 53 වන වගන්තිය යටතේ දැක්වෙන, ඡන්ද මධ්‍යස්ථානවලින් භාර ගත යුතු ඡන්ද පත්‍රිකා අඩංගු පෙට්ටි, මුද්‍රා තැබූ පැකට්ටු, වාර්තා, ප්‍රකාශන ආදිය භාරගෙන, ඡන්ද ගණන් කිරීම සිදුකිරීමෙන් පසු 51 (7) වගන්තිය අනුව ගණන් කිරීමේ නිලධාරීන් විසින් සකසන ලද වාර්තා මත, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා, තම දිස්ත්‍රික්කය වෙනුවෙන් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාව ගණනය කළ යුතුය. දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරා පත්කර ගැනීමට නියමිත මන්ත්‍රීවරු සංඛ්‍යාව, අදාළ පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාවේ අනුපාතයට බෙදා ඒ ඒ පක්ෂයට හා ස්වාධීන කණ්ඩායමට හිමිවන මන්ත්‍රී ධුර සංඛ්‍යාව තිරණය කළ යුතුය. ඉන් අනතුරුව එම පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කළ අපේක්ෂකයින් ලබා ඇති මනාප ගණන් කොට, ගණන් කිරීම භාර නිලධාරීන් විසින් එක් එක් ගණන් කිරීමේ ශාලාව අනුව අපේක්ෂකයින් ලබා ඇති මනාප සංඛ්‍යාව ද තේරීම්භාර නිලධාරියාට වාර්තා කළ යුතුය. මෙසේ තැපැල් ඡන්ද ගණන් කිරීමේ ස්ථාන ද ඇතුළු සියලු ගණන් කිරීමේ ශාලා භාර නිලධාරීන් විසින් වාර්තා කරනු ලබන, ඒ ඒ අපේක්ෂකයා ලබා ඇති මනාප සංඛ්‍යා එකතු කොට, එම සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට සැකසේ. පක්ෂ/කණ්ඩායම්වලින් තෝරා පත්කර ගැනීමට නියමිත වූ මන්ත්‍රීන් සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන ඒ ඒ පක්ෂයේ හා කණ්ඩායමේ, වැඩිම මනාප සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයාගෙන් පටන්ගෙන, තෝරා පත්කරගත යුතු මන්ත්‍රීවරුන්ගේ නම්, ඔවුන් ලබාගත් මනාප සංඛ්‍යාවේ අනුපිළිවෙළට ප්‍රකාශයට පත් කිරීම තේරීම්භාර නිලධාරියාගේ වගකීම වේ. උතුරු පළාතේ ඡන්ද විමසීම් අවස්ථාවේ දී, ඡන්ද විමසීම් පනතේ 125 අ වගන්තිය යටතේ වෙනත් ඡන්ද පොළවල දී ඡන්දය දීමට අවසර දී තිබූ ඡන්දායකයින්ගේ ඡන්ද ද ගණන් කොට එම ප්‍රතිඵල අදාළ දිස්ත්‍රික්කවලට යැවිය යුතුවිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් අදාළ සියලුම තේරීම්භාර නිලධාරීන්ට ලබා දී තිබුණි.

ඡන්ද ගණන් කිරීම පිළිබඳ දැන්වීම.

421. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 48 වන වගන්තිය අනුව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ඡන්ද විමසීම තරග කරනු ලබන දේශපාලන පක්ෂවල ලේකම්වරුන්, බලයලත් නියෝජිතයින් හා ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත "ගණන් කිරීම් පිළිබඳ දැන්වීම" යැවිය යුතුය. එය යැවිය යුතු කාල වකවානුවක් නීතියේ සඳහන්ව නැතත්, ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයින් පත් කිරීමට කල්වේලා ඇතිව එම දැන්වීම අදාළ පාර්ශ්ව වෙත යැවීම වැදගත් වේ. මෙම දැන්වීම මගින් ඡන්ද ගණන් කිරීමේ ශාලාවල පිහිටීම, ගණන් කිරීම ආරම්භ කරන දිනය සහ වේලාව ද එක් එක් ගණන් කිරීමේ ශාලාවට ඡන්ද ගණන් කිරීම සඳහා අනුයුක්ත කර ඇති ඡන්ද මධ්‍යස්ථාන ලේඛනය ද දන්වනු ලැබේ. ගණන් කිරීමේ ශාලාවකට පත් කළ හැකි නියෝජිතයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ පත්වීම් ලිපි නිකුත් කෙරෙන ආකාරය ද, අදාළ නියෝජිතයින්ට ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට ඇතුළු වීම සඳහා තේරීම්භාර නිලධාරීන්ගේ අවසරය ලබා ගත යුතු ආකාරය ද මෙම දැන්වීම මගින්, පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට දන්වා යවනු ලැබේ.

ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයින්

422. ඡන්ද ගණන් කිරීමේ ශාලාවකට නියෝජිතයින් පස් දෙනෙකු බැගින් ද, තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලාවකට නියෝජිතයින් දෙදෙනෙකු බැගින් ද පත් කිරීමට තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට නීතියෙන් ඉඩ ලැබේ. මොවුන්ගේ පත්වීම් ලිපි නිකුත් කිරීමට බලය ඇත්තේ දේශපාලන පක්ෂ ලේකම්වරයාට, බලයලත් නියෝජිතයාට හා ස්වාධීන කණ්ඩායම් නායකයාටය.

423. මෙම ඡන්ද විමසීමේ දී පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට පත් කිරීමට හිමිකම තිබූ නියෝජිතයින් සංඛ්‍යාව සහ ගණන් කිරීමේ ශාලාවක සේවය සඳහා පත්කරන ලද නිලධාරීන් සංඛ්‍යාව සසඳා බැලීමේ දී නිලධාරී සංඛ්‍යාව මෙන් හතර පස් ගුණයක නියෝජිතයින් සංඛ්‍යාවක් ගණන් කිරීමේ ශාලාවකට පත් කිරීමට එම අයට අවකාශය තිබූ බව පැහැදිලි කරුණකි. අවතැන් වූ උතුරු පළාතේ ඡන්දහිමියන් වෙනුවෙන් ඡන්ද පොළවල් පිහිටුවා ඡන්ද විමසීම් කටයුතු ඉටු කළ පුත්තලම, අනුරාධපුර හා යාපනය යන දිස්ත්‍රික්කවල එම ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට උතුරු පළාතේ අදාළ දිස්ත්‍රික්කවලින් නියෝජිතයින්ට සහභාගිවීමට අවස්ථාව ලබා දෙන ලදී.

424. මෙවැනි නිලධාරීන් සංඛ්‍යාවක් ගණන් කිරීමේ ශාලාවක අසුන් ගැනීමේ දී ඡන්ද ගණන් කිරීම සඳහා සූදානම් කරන මේසයේ එක් පසකට, නිලධාරීන් 18/20 දෙනෙකුට පමණ ඉඩ සැලසිය යුතුය. මෙවැනි නිලධාරීන් පිරිසක් විසින් කරනු ලබන ඡන්ද ගණන් කිරීමේ කාර්යය, විශාල නියෝජිතයන් පිරිසක් සහභාගි වී නිරීක්ෂණය කිරීමට ශාලාවක ඉඩ සැලසීම ඉතා අසීරු කරුණකි.

ඡන්ද විමසීමෙන් පසු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගෙන් ඡන්ද පෙට්ටි, භාණ්ඩ හා වාර්තා ආදිය ආපසු භාර ගැනීම

425. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 45 වන වගන්තියේ දැක්වෙන පරිදි ඡන්ද විමසීම් අවසන් කරනු ලැබූ විට ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් තම මුද්‍රාව ද, ස්වකීය මුද්‍රාව තැබීමට කැමති නියෝජිතයින්ගේ මුද්‍රා ද තබා ගණන් කිරීමේ නිලධාරියාට භාර දිය යුතු ඡන්ද පෙට්ටි සහ අනිකුත් බඩු බාහිරාදිය භාර ගැනීමට විශේෂයෙන් පුහුණු කරන ලද කාර්ය මණ්ඩලයක් යොදවනු ලැබේ. මෙම භාණ්ඩ භාර ගැනීමේ ස්ථාන, අදාළ ඡන්ද පත්‍රිකා ගණන් කිරීමට සූදානම් කර ඇති ඡන්ද ගණන් කිරීමේ ශාලා තුළ හෝ ඒ ආසන්නයේ පිහිටුවා තිබුණි. එම භාණ්ඩ භාර ගැනීමේ කටයුතු ඡන්ද විමසීම් දින පස්වරු 4.00 සිට සිදුවන බැවින්, එම කටයුතු නිරීක්ෂණය කිරීමට අවශ්‍ය එක් ගණන් කිරීමේ නියෝජිතයෙකුට, පක්ෂයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් එම වේලාවට එවැනි ස්ථානයකට පැමිණීමට අවකාශ සලසන ලදී. ඡන්ද පෙට්ටි සාමාන්‍ය පරිදි මුද්‍රා තැබීමට අමතරව ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ඡන්ද පොළ නියෝජිතයන් සහ ඡන්ද පොළ නිරීක්ෂකයන් විසින් සිය අත්සන තබන ලද ආකෘති පත්‍රයක් ඡන්ද පෙට්ටි මත අලවා තැබීමටත්, එම ලේඛනයෙහි පිටපතක් ඡන්ද පොළ නියෝජිතයින්ට හා ගණන් කිරීම භාර නිලධාරියාට භාර දීමටත් නියමකර තිබුණි. ඡන්ද ගණන් කිරීමේ කටයුතු වෙනුවෙන් පැමිණෙන නියෝජිතයින්ට එම ඡන්ද පෙට්ටිවල තබා ඇති මුද්‍රා පරීක්ෂා කර ඒ පිළිබඳව සෑහීමට පත් වීමට ඉඩ ලබා දී තිබුණි.

426. මුද්‍රා තැබූ ඡන්ද පෙට්ටි, ඒවායේ යතුරු, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් සකස් කරන ලද ඡන්ද පත්‍රිකා විස්තර, ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ දී ඡන්ද පොළේ භාවිතා කරන ලද මුද්‍රාවල ආදර්ශ මෙන්ම, ඡන්ද පොළේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරී, නිරීක්ෂණ ආයතනවල නියෝජිත යන අය සකස් කරන ලද වාර්තා පිටපත් සහ ඡන්ද විමසීමට යම් බාධාවක් ඇතිවුනි නම් ඒ පිළිබඳව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සකස් කරන ලද වාර්තා ද ගණන් කිරීමේ කටයුතු භාර නිලධාරියාට, භාණ්ඩ භාරගනු ලබන ස්ථානයේ ප්‍රධාන නිලධාරියා විසින් භාර දීමට නියම වී තිබුණි.

ඡන්ද ගණන් කිරීම භාර නිලධාරීන් සහ සහායක කාර්ය මණ්ඩලය

427. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 47 (1) වගන්තිය අනුව එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීම භාර නිලධාරියෙකු ද එම අයට සහාය වීම සඳහා අනිකුත් කාර්ය මණ්ඩලය ද, මැතිවරණ කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව තේරීම්භාර නිලධාරියා විසින් පත් කළ යුතුය. පහත දැක්වෙන පදනම මත ඡන්ද ගණන් කිරීමේ ශාලාවලට නිලධාරීන් පත් කිරීමට උපදෙස් දී තිබුණි.

නිලධාරීන් වර්ගය	සාමාන්‍ය ඡන්ද ගණන් කිරීමේ ශාලාවක් සඳහා	තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලාවක් සඳහා
ඡන්ද ගණන් කිරීම භාර නිලධාරීන්	01	01
සහකාර ගණන්කිරීම භාර නිලධාරීන්	08	02
ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු	10	04
කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු /ලිපිකරුවන්	20	06
කාර්යාල කාර්ය සහායකයින්	02	02
එකතුව	**41**	**15**

428. ඡන්ද ගණන් කිරීම භාරව ක්‍රියා කිරීම සඳහා පත් කළ නිලධාරීන් මැතිවරණ කොමසාරිස්වරයාගේ මූලිකත්වයෙන් කොළඹ දී ද, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ කාර්යාලවලදී ද පුහුණු කරන ලදී. ඡන්ද විමසීම අවසන් වීමෙන් පසු, විශේෂයෙන් ඡන්ද විමසීම් දින රාත්‍රී කාලය ද ඉක්මවා නොකඩවා පැය 20 ක, 24 ක පමණ කාලයක් ඉතා වෙහෙසකර රාජකාරියක නිරත වන මෙම නිලධාරීන් මැතිවරණ ක්‍රියාවලියේ දී ඉතා වැදගත්ම වැඩ කොටසක් ඉටු කරන පිරිසක් හැටියට හැඳින්විය හැකිය. දිවයිනේ පරිපාලන දිස්ත්‍රික්ක 25 හි තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලා ද ඇතුලු මුලු ගණන් කිරීමේ ශාලා සංඛ්‍යාව 1,604 ක් වූ අතර, ඒවායේ රාජකාරී කටයුතු සඳහා පත් කරන ලද සහකාර තේරීම්භාර නිලධාරීන් පිළිබඳ විස්තර අංක 15 දරන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

429. ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයට රාජකාරි ඇරඹීමට පෙර ඡන්ද විමසීම් දින රාත්‍රියේ ආහාරවේල ලබා ගැනීම සඳහා ගණන් කිරීමේ ශාලා පිහිටි පරිශ්‍ර තුළ අවශ්‍ය පහසුකම් සලසා තිබූ අතර, ගණන් කිරීමේ කටයුතු ඇරඹීමෙන් පසු ඔවුන්ට අවශ්‍ය ආහාරපාන ඔවුන් සේවය කළ ශාලා තුළටම සැපයීමට ක්‍රියා කරන ලදී. මුලතිවු හා කිලිනොච්චිය වැනි පහසුකම් අඩු දිස්ත්‍රික්කවල ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයට තේරීම්භාර නිලධාරීන් ආහාර සකස් කර දීමේ වැඩපිළිවෙලක් යොදන ලදී.

ඡන්ද ගණන් කිරීමේ ශාලා පිහිටුවීම

430. පරිපාලන දිස්ත්‍රික්කයේ එක් ඡන්ද ප්‍රදේශයකට අයත් ඡන්ද පොළවල් සංඛ්‍යාවකට අදාළ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාවක් පමණක් ගණන් කිරීම සඳහා, එක් ගණන් කිරීමේ ශාලාවකට භාර කරන ලදී. සාමාන්‍යයෙන් මෙම සංඛ්‍යාව, ලියාපදිංචි ඡන්දහිමියන් 8000 ක් - 12000 ක් පමණ වන ආකාරයට බෙදීම සිදු කරන ලදී. පූර්ව ඡන්ද විමසීම් අවස්ථාවල දී ලද අත්දැකීම් ද අනුව සංඛ්‍යා සටහන 16 හි දක්වා ඇති පරිදි, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවා තිබුණි. ඒ අනුව සාමාන්‍ය ඡන්ද ගණන් කිරීමේ ශාලා 1,397 ක්ද, තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලා 207 ක්ද පිහිටුවා තිබුණි.

431. ඡන්ද ගණන් කිරීමේ ශාලා පිහිටුවීමේ දී ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි සියල්ල හැකි තරම් දුරට, එකම පරිශ්‍රයක් තුළින් සොයා ගැනීමට උත්සාහ ගත්ත ද සමහර අවස්ථාවල දී දිස්ත්‍රික්කවල ඇති පහසුකම් අනුව පරිශ්‍ර කිහිපයක පිහිටි ගොඩනැගිලි මේ වෙනුවෙන් යොදා ගැනීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට සිදු විය. විශේෂයෙන් මේ ශාලා පිහිටුවීමේ දී ඒවාට සැපයිය යුතු ආරක්ෂාව නොඅඩුව ලබා දීමට ඇති හැකියාව මෙන්ම, ඒවායේ සේවය කිරීමට පැමිණෙන කාර්ය මණ්ඩලයට සහ නියෝජිතයින්ට එම භූමිවල ඇති පහසුකම් ද සැලකිල්ලට ගත යුතුය. මේ අනුව සමහර අවස්ථාවල දී පමණක් සියලුම ගණන් කිරීමේ මධ්‍යස්ථාන එකම පරිශ්‍රයක් තුළ පිහිටුවීමට ඉඩ ලැබී ඇත.

ඡන්ද හා මනාප ගණන් කරන ලද ආකාරය

432. පළාත් සභා ඡන්ද විමසීම ද සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පවත්වනු ලබන බැවින් තරග කරන ලද පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව හා අපේක්ෂකයින් ලබා ගන්නා ලද මනාප ගණනය කිරීම, පියවර 3ක් යටතේ සිදු කරන ලදී.

I වන පියවර

433. ඡන්ද ගණන් කිරීම සඳහා පත්කර ඇති සියලුම නිලධාරීන්ගේ පත්වීම් ලිපි සහ ඔවුන්ගේ අනන්‍යතාවය පරීක්ෂා කොට, ගණන් කිරීමේ ශාලාවේ රාජකාරි සඳහා සේවය වාර්තා කිරීමට නිලධාරීන්ට ඉඩ දෙනු ලබන අතර, දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් පත්වීම් ලිපි සමග පැමිණෙන නියෝජිතයන්ගේ එම ලිපි හා අනන්‍යතාව ද පරීක්ෂා කර ඔවුන්ට ද ඔවුන්ගේ පැමිණීම සටහන් කිරීමට ඉඩ දෙනු ලැබේ. ඉන් අනතුරුව එම සියලුම දෙනා පළාත් සභා ඡන්ද විමසීම් පනතේ නීතිමය ප්‍රතිපාදන අනුව ඡන්ද ගණන් කිරීමට අදාළව රහස්‍යතාවය පිළිබඳ ප්‍රතිඥා ලබා දිය යුතු වේ.

434. ඡන්ද ස්ථානාධිපතිවරුන්ගෙන් ඡන්ද පෙට්ටි හා අනෙකුත් අදාළ දෑ ගණන් කිරීමේ ශාලාව වෙත භාර ගැනීමෙන් පසුව, ඒවා ඡන්ද කොට්ඨාස අංක අනුපිළිවෙළට ගණන් කිරීමේ ශාලාව තුළ තැන්පත් කොට ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් පැකට්ටුවල මුද්‍රා පරීක්ෂා කිරීමට පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් පැමිණ සිටින නියෝජිතයින්ට අවසර දෙනු ලැබේ. ගණන් කිරීමේ නියෝජිතයන්ට, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් භාර දී ඇති ඡන්ද පත්‍රිකා විස්තරයෙහි තොරතුරු සටහන් කර ගැනීමට ඉඩ දී, ඡන්ද ගණන් කිරීමේ පියවර පිළිබඳව කෙටියෙන් නියෝජිතයින්ට පැහැදිලි කර දීමෙන් පසු, මෙම පියවරේ දී ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය විසින් ඉටු කළ යුතු රාජකාරී ද පැහැදිලි කෙරේ. පසුව රාජකාරී කටයුතු සඳහා නිලධාරීන් ස්ථානගත කරනු ඇත.

435. ගණන් කිරීමේ නිලධාරීන්, තම ශාලාවට අදාළ සියලුම ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද පෙට්ටි සහ අදාළ ලේඛන ලැබී ඇති බවට සනාථ කොට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීගෙන් ඡන්ද ගණන් කිරීම ඇරඹීම සඳහා අවසර ලබා ගැනීම සිදු කළ යුතුය. එම අවසරය ද ඉහත සඳහන් කටයුතු ද අවසන් වීමෙන් පසුව මෙම පියවර වෙනුවෙන් ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය අසුන්ගෙන සිටින මේසය සමාන කොටස් 5 කට වෙන්කොට, එක් එක් ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද පෙට්ටිවල ඇති ඡන්ද පත්‍රිකා ගණනය කිරීම ආරම්භ කළ යුතුය. මේ සඳහා එක් එක් මධ්‍යස්ථානයේ ඡන්ද පෙට්ටිය මේසයෙහි නියමිත කොටසෙහි තබා අදාළ මධ්‍යස්ථානයේ නම හා ඡන්ද කොට්ඨාස අංකය ද, ඡන්ද පෙට්ටියේ මුද්‍රිත අංකය ද නිලධාරියෙකු විසින් හඬ නගා ප්‍රකාශ කිරීමෙන් පසු, නැවත අවශ්‍ය නියෝජිතයින්ට ඡන්ද පෙට්ටියේ මුද්‍රා පරීක්ෂා කිරීමට ඉඩ දිය යුතුය. ඉන් අනතුරුව ගණන් කිරීමේ නිලධාරියාගේ අවසරය මත ඡන්ද පෙට්ටියෙහි

මුද්‍රා ඉවත් කොට එය විවෘත කර ඡන්ද පත්‍රිකා, ගණන් කිරීමේ මේසය මත තබා, නිලධාරීන් කණ්ඩායමට එහි ඇති ඡන්ද පත්‍රිකා ගණන් කිරීමට උපදෙස් දෙනු ලැබේ. ඒ අවස්ථාවේ දී එහි ඇතුළත් ද්විත්ව ඡන්ද පත්‍රිකා තිබේනම් ඒවා ගණන් කිරීම භාර නිලධාරියාට භාර දිය යුතු අතර, අනෙකුත් ඡන්ද පත්‍රිකා ඒවායේ පිටුපස සඳහන් මුද්‍රිත අංකය අනාවරණය නොවන පරිදි ගණන් කළ යුතු වේ. එසේ ගණන් කොට ඒ ඒ ඡන්ද පෙට්ටියේ තිබූ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව, ගණන් කිරීම භාර නිලධාරියාට වාර්තා කළ යුතු අතර, ඔහු විසින් එම සංඛ්‍යාව,ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ඡන්ද පත්‍රිකා විස්තරය අනුව, ඡන්දදායකයින්ට නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාවට සමාන වන්නේ දැයි පරීක්ෂා කර බලනු ඇත. එම තොරතුරු ගැලපේ නම් එම සංඛ්‍යා අදාළ වාර්තාවල සටහන් කොට ඡන්ද පත්‍රිකා ධාරකයට බහාලීමට අවසර දෙනු ඇත. එසේ නොමැති විට ගණන් කිරීමේ නිලධාරියා විසින් ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව නැවත ගණන් කිරීමට උපදෙස් දෙනු ලබන අතර, අවසානයේ දී ලැබෙන පිළිතුරු අනුව ඡන්ද පෙට්ටියේ තිබූ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. මේ අන්දමට සෑම ඡන්ද මධ්‍යස්ථානයකටම අදාළ ඡන්ද පෙට්ටිවල තිබූ ඡන්ද පත්‍රිකා ගණනය කිරීමෙන් අනතුරුව ඒවා ධාරකයෙහි තැන්පත් කිරීමෙන් පසු එම පියවරෙහි කටයුතු අවසන් වේ. ඉන් පසු ඊළඟ පියවර ඇරඹීමට පෙර කාර්ය මණ්ඩලයට සුලු වේලාවක විවේකයක් ලබා දෙනු ලැබේ.

II වන පියවර

436. ඡන්ද ගණන් කිරීමේ දෙවන පියවර ඇරඹීමට පෙර එම අවස්ථාවේදී සිදු කරනු ලබන ගණන් කිරීමේ කටයුතු පිළිබඳව කෙටි හැඳින්වීමක් නියෝජිතයින් වෙනුවෙන් සිදුකර, ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතුය. මෙම අවස්ථාවේ දී ප්‍රධාන වශයෙන් සිදු කෙරෙනුයේ තරග කරන ලද එක් එක් පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම වෙනුවෙන් ලකුණු කර ඇති ඡන්ද පත්‍රිකා වෙන්කොට ගණන් කිරීමයි. මේ සඳහා ගණන් කිරීමේ නිලධාරීන් අසුන්ගෙන සිටින මේසය, අදාළ කාර්යය වෙනුවෙන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරනු ලැබේ. මේ අවස්ථාව වන විට ඡන්ද ගණන් කිරීම භාර නිලධාරීගේ ඉදිරිපස මේසයෙහි දෙපස නිලධාරීන් අසුන්ගෙන සිටින අතර, එහි එක් කෙළවරක තබා ඇති ධාරකයෙහි ඡන්ද පත්‍රිකා තැන්පත් කර ඇත. එම කෙළවරේ සිට මේසය දෙපස අසුන්ගෙන සිටින නිලධාරීන්, පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අනුව ඡන්ද පත්‍රිකා තේරීම, ඡන්ද පත්‍රිකා පරීක්ෂා කිරීම, පක්ෂ හා කණ්ඩායම් වලට අදාළ ඡන්ද පත්‍රිකා වෙන් වෙන්ව ගණන් කොට පනහේ මිටි වශයෙන් සකස් කිරීම, ඒවා පරීක්ෂාව, නැවත පරීක්ෂාව හා අහඹු පරීක්ෂාව යන කාර්යන් සඳහා කොටස් වශයෙන් බෙදී කටයුතු කරනු ඇත. මුල් අවස්ථාවේ දී තේරීම් කණ්ඩායම් එකකට වැඩිය යොදවනු ලබන අතර, ඔවුන් තමා ඉදිරිපස ඇති එක් එක් පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම වෙනුවෙන් වූ අදාළ ලකුණින් හඳුන්වා ඇති බඳුන්වල, ඒවා සඳහා ඡන්දය ප්‍රකාශ කර ඇති අදාළ ඡන්ද පත්‍රිකා තැන්පත් කරනු ඇත. මෙම අවස්ථාවේ දී, පක්ෂයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් ගණන් කිරීමට නොහැකි වන ඡන්ද පත්‍රිකා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගණන් කිරීමේ නිලධාරීන් විසින් ගණන් කිරීම භාර ප්‍රධාන නිලධාරියාට භාර දෙනු ඇත. එම ඡන්ද පත්‍රිකා යම් පක්ෂයක් හෝ කණ්ඩායමක් සඳහා සලකුණු කරන ලද ඒවා හැටියට එම නිලධාරියා තීරණය කරන්නේ නම්, ඒ අනුව අදාළ ඡන්ද පත්‍රිකා එම පක්ෂය හෝ කණ්ඩායම වෙනුවෙන් ගණන් කොට ඒවා නියමිත බඳුනෙහි තැන්පත් කරනු ඇත. එම නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරනු ලබන ඡන්ද පත්‍රිකා, පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයින්ට ද නිරීක්ෂණය කළ හැකි ආකාරයට ඒවා ප්‍රතික්ෂේප කර, අදාළ මුද්‍රා ඒවායේ තබනු ඇත. මෙවැනි ප්‍රතික්ෂේපිත ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ මේසය වෙත නැවත භාර දීමක් නොකෙරෙන අතර, ඒවා ගණන් කිරීම භාර නිලධාරියා භාරයෙහි තබා ගනු ඇත.

437. ඡන්ද ගණන් කිරීමේ මේසයෙහි මුල් නිලධාරී කණ්ඩායම හෝ කණ්ඩායම් විසින් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අනුව වෙන් කරන ලද ඡන්ද පත්‍රිකා ඊළඟ නිලධාරී කණ්ඩායම විසින් නැවත පරීක්ෂා කර, ඒ ඒ කණ්ඩායම් සහ පක්ෂ වෙනුවෙන් වූ ඡන්ද පත්‍රිකා පනහේ මිටි වශයෙන් සකස් කරනු ඇත. ගණන් කිරීමේ මේසයෙහි ඊළඟ කණ්ඩායම හෝ කණ්ඩායම් දෙක මෙවැනි ඡන්ද පත්‍රිකා පනහේ මිටි නැවත පරීක්ෂා කළ යුතුය. එම පරීක්ෂණයේ දී ඒ සෑම මිටියකටම ඇතුළත්ව ඇත්තේ එකම පක්ෂයක් හෝ එකම කණ්ඩායමක් හෝ වෙනුවෙන් සළකුණු කරන ලද වලංගු ඡන්ද පත්‍රිකා පනහක් දැයි සොයා බලා පරීක්ෂා කරන නිලධාරීන් ඒ පිළිබඳව සෑහීමකට පත්විය යුතුය. මෙවැනි මිටි නැවත පරීක්ෂාකොට එකම පක්ෂයකට හෝ එකම කණ්ඩායමකට අයත් ඡන්ද පත්‍රිකා පනහේ මිටි දහයක් බැගින් එකතු කොට, ඡන්ද පත්‍රිකා පන්සියයක් බැගින් වූ මිටිවලට ඒවා අවසාන පියවරේ දී ගොනු කෙරේ. මෙම පියවරේ දී අදාළ ගණන් කිරීමේ නිලධාරියාගේ උපදෙස් පරිදි සහකාර තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද පත්‍රිකා සම්බන්ධව අවසන් පරීක්ෂාව කරනු ඇත. මෙසේ ගණන් කිරීම අවසන් වූ පසු ගණන් කිරීමේ නිලධාරියාගේ මේසය මත එක් එක් පක්ෂයට හා කණ්ඩායමට වෙන් කර ඇති ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ද, ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන එම නිලධාරියා

විසින්, එක් එක් පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම ලබා ගෙන ඇති ඡන්ද සංඛ්‍යාව පිළිබඳ වාර්තාව සකස් කරනු ඇත. මෙම වාර්තාව සකස් කිරීමට පෙර එහි සිටින ගණන් කිරීමේ නියෝජිතයින්ට උපරිම වශයෙන් අවස්ථා දෙකක් දක්වා නැවත ඡන්ද ගණන් කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය. එසේ ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ඒ අනුව නැවත ඡන්ද ගණන් කිරීම සිදු කළ යුතුය. ඡන්ද ගණන් කිරීම භාර නිලධාරියාට අදාළ ප්‍රතිඵලය පිළිබඳව සෑහීමට පත් වීම සඳහා ඕනෑම වාර ගණනක් නැවත ඡන්ද ගණන් කිරීම සිදු කළ හැකිය.

438. මෙම ඡන්ද ගණන් කිරීමෙන් පසු තමා විසින් පිළියෙළ කරන ලද එක් එක් පක්ෂය හා ස්වාධීන කණ්ඩායම වෙනුවෙන් ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව පිළිබඳ වාර්තාව එම ස්ථානයේ සිටින සහකාර තේරීම්භාර නිලධාරීන් ලවා පරීක්ෂා කරවා, ඔවුන්ගේ අත්සන් හා තම අත්සන ද යෙදීමෙන් පසු නියෝජිතයින්ට එය අත්සන් කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය. මේ අවස්ථාවේ දී ගණන් කිරීමේ නියෝජිතයින්ට අදාළ ප්‍රතිඵලය සටහන් කර ගැනීමට ගණන් කිරීමේ නිලධාරියා විසින් අවකාශය සැලසිය යුතුය. අවසානයේ දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් දී ඇති උපදෙස් මත, එහි පිටපත් නියෝජිතයින්ට භාර දී, මුල් පිටපත ප්‍රතිඵල සකස් කිරීමේ ස්ථානයට මුද්‍රා තැබූ කවරයක බහා යැවීමට ක්‍රියා කළ යුතුය. ඉන් අනතුරුව ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයට සුළු විවේකයක් ලබා දීමෙන් පසු ඊළඟ පියවර වූ ඒ ඒ පක්ෂයේ සහ කණ්ඩායමේ අපේක්ෂකයින් විසින් ලබා ගන්නා ලද මනාප ගණන් කිරීම ආරම්භ කළ යුතු වේ. මෙම පියවර ඇරඹීමට පෙර, ඒ ඒ පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් ගණන් කළ ඡන්ද පත්‍රිකා, මිටි වශයෙන් වෙන් වෙන්ව ආරක්ෂා සහිතව තබා ගත යුතුය.

III වන පියවර

439. මෙම පියවරේ දී ඒ ඒ ගණන් කිරීමේ ශාලාවේ ඡන්ද ගණන් කිරීමේ ප්‍රතිඵලය අනුව, වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් ආරම්භ කොට, ඒ ඒ පක්ෂයේ හා කණ්ඩායමේ අපේක්ෂකයින් ලබාගෙන ඇති මනාප සංඛ්‍යාව ගණන් කිරීම ආරම්භ කළ යුතුය. මෙම කටයුතු ඇරඹීමට පෙර, අදාළ පක්ෂයේ හෝ කණ්ඩායමේ ඡන්ද පත්‍රිකා මිටි තුළ ඇති, මනාප ගණන් කිරීම සඳහා වලංගු නොවන ඡන්ද පත්‍රිකා, ගණන් කිරීමේ නිලධාරියාගේ උපදෙස් අනුව මෙම මනාප ගණන් කිරීමේ ක්‍රියාවලියෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. එම අවස්ථාවේ දී, මනාප ගණන් කිරීම සඳහා වලංගු ඡන්ද පත්‍රිකා කාණ්ඩ තුනකටත්, එම කාර්යය සඳහා වලංගු නොවන ඡන්ද පත්‍රිකා කාණ්ඩ තුනකටත් වශයෙන්, ඡන්ද පත්‍රිකා කාණ්ඩ හයකට වර්ග කළ යුතුය. මින් වර්ග තුනක් මනාප ගණන් කිරීමේ කාර්යයේදී වලංගු නොවන ඒවාය. මනාප සලකුණු කර නොමැති ඡන්ද පත්‍රිකා අපේක්ෂකයන් තිදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් වෙනුවෙන් මනාප ලකුණු කර ඇති ඡන්ද පත්‍රිකා සහ කිසිදු අපේක්ෂකයකු වෙනුවෙන් මනාප සලකුණු කර ඇත්දැයි යන්න නිශ්චිතව තීරණය කළ නොහැකි අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා, එම වර්ග තුනට අයත් වේ. මෙම කොටස් තුනට අයත් ඡන්ද පත්‍රිකා මේ හේතු නිසා ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බැවින්, ඒවා සම්බන්ධ අවසන් තීරණය ගත යුත්තේ ගණන් කිරීම භාර නිලධාරියා විසිනි. එබඳු ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලබන බවට, එම නිලධාරියා විසින් ඒවායේ සටහන් කළ යුතු අතර, එම තීරණ ගන්නා අවස්ථාවේ දී අදාළ පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ නියෝජිතයින් එම ස්ථානයේ සිටීනම්, ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමද ඔහු විසින් කළ යුතු වේ. මේ ආකාරයට ඡන්ද පත්‍රිකා වර්ග කිරීමෙන් අනතුරුව මනාප ගණන් කිරීම සඳහා වලංගු වූ ඡන්ද පත්‍රිකා, පනහේ මිටි වශයෙන් නැවත ගොනු කළ යුතු වේ. මෙම මිටිවලට ඇතුළත් විය යුත්තේ එකම වලංගු මනාප සංඛ්‍යාවකට අදාළ ඡන්ද පත්‍රිකා පමණි. එනම් වලංගු මනාප එකක් සහිත ඡන්ද පත්‍රිකා, වලංගු මනාප දෙකක් සහිත ඡන්ද පත්‍රිකා සහ වලංගු මනාප තුනක් සහිත ඡන්ද පත්‍රිකා යනුවෙන් වෙන් වෙන් වශයෙනි. අදාළ පක්ෂය වෙනුවෙන් මුල් පියවරේ දී ගණන් කළ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව මෙසේ වර්ග කරන ලද ඡන්ද පත්‍රිකා කණ්ඩායම් හයට වෙන් වූ ආකාරය දෙවන සාරාංශ පත්‍රයේ අදාළ ස්ථානයේ සඳහන් කළ යුතුවේ. එවිට, එම කාණ්ඩ 6 ට අයත් මුළු ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව, තමා විසින් දෙවන පියවරේ දී ඒ ඒ පක්ෂයට, කණ්ඩායමට ගණන් කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවට සමාන වන්නේ දැයි ගණන් කිරීම භාර නිලධාරියාට සෑහීමට පත්විය හැකි ය.

440. මනාප ගණන් කිරීම සඳහා වලංගු වූ සෑම ඡන්ද පත්‍රිකා මිටියකම, සපයා ඇති කඩදාසි දවටනයක් යොදා ඒ මත මිටි අංකය සඳහන් කළ යුතුය. මෙම අංක කිරීමේ දී පළමුව මනාප එකක් සහිත ඡන්ද පත්‍රිකා මිටි, අංක කොට අවසානයට ඉතිරිවන, ඡන්ද පත්‍රිකා පනහට අඩු මිටිය ද පටියක් යොදා වෙන් කොට එයද අංක කළ යුතුය. ඊළඟ පිළිවෙල අංකයේ සිට, මනාප දෙකක් සහිත ඡන්ද පත්‍රිකා පහේ මිටි පිළිවෙළට අංක කිරීම ද, අවසානයේ දී මනාප තුනක් සහිත ඡන්ද පත්‍රිකා මිටි අංක කිරීම ද ඉහත දක්වන ලද ආකාරයටම සිදු කළ යුතුය.

මෙසේ අංක කරන ලද මිටි පිළිවෙළටම, අංක කරන ලද සැසඳුම්පත්, සෑම මිටියකටම එක බැගින් සම්බන්ධකොට එම එක් එක් මිටියෙහි ඇති ඡන්ද පත්‍රිකාවල සඳහන් මනාප අදාළ අපේක්ෂකයින්ට ලකුණු කොට ඇති ආකාරය පරීක්ෂා කරමින් එම තොරතුරු, ගණන් කිරීමේ නිලධාරියාගේ උපදෙස් පරිදි සැසඳුම් පත්‍රවලට නිලධාරීන් විසින් ඇතුළත් කළ යුතුය. එසේ ඇතුළු කොට, එක් එක් සැසඳුම් පත්‍රිකාවෙහි අපේක්ෂකයින් ලබාගෙන ඇති මනාප සංඛ්‍යාවල එකතුව, අදාළ තීරුවල ගණන් කිරීමේ නිලධාරීන් විසින් සඳහන් කළ යුතුවේ. සැසඳුම් පත්‍රිකාවක් සම්පූර්ණ කරන නිලධාරියා, එය සකස් කළ බවට සහතික වී අවසානයේ දී සිය අත්සන තැබිය යුතුය. අදාළ සැසඳුම් පත්‍රිකාව සහ ඊට අදාළ ඡන්ද පත්‍රිකා මිටිය, එහි ඡන්ද පත්‍රිකා අනුපිළිවෙළ වෙනස් නොකොට ඡන්ද පත්‍රිකා මිටිය ද, අදාළ සැසඳුම් පත්‍රිකාව ද නැවත පරීක්ෂා කිරීමේ නිලධාරියාට භාර දිය යුතුය. එම නිලධාරියා විසින් නැවතත් එක් එක් ඡන්ද පත්‍රිකාවෙහි ඇතුළත් අපේක්ෂකයින්ට මනාප සළකුණු කර ඇති ආකාරය බලා, සැසඳුම් පත්‍රිකාවෙහි එම තොරතුරු නිවැරදිව සටහන් වී ඇත්දැයි සනාථ කර ගත යුතුය. එහිදී යම් ගැටළුවක් මතුවුව හොත් ඒ පිළිබඳව ගණන් කිරීම භාර නිලධාරියාට වාර්තා කොට අදාළ මිටිය වෙනුවෙන් නිවැරදි සැසඳුම් පත්‍රිකාවක් නැවත සකස් කිරීමට උපදෙස් ලබාගෙන ඒ අනුව අදාළ නිලධාරීන් කටයුතු කළ යුතුය.

441. මේ ආකාරයට මනාප ගණන් කිරීම සඳහා වලංගු වූ සෑම ඡන්ද පත්‍රිකා මිටියක් වෙනුවෙන් ම සැසඳුම් පත්‍රයක් සකසා අවසන් වීමෙන් පසු, ගණන් කිරීමේ නිලධාරියා විසින් තම ගණන් කිරීමේ ශාලාවේ ගණන් කරන ලද ඡන්ද පත්‍රිකාවල, ඒ ඒ අපේක්ෂකයා සඳහා සඳහා ලකුණු කරන ලද මුළු මනාප සංඛ්‍යාව ගණනය කර ඒවා තමා වෙත භාර දී ඇති සාරාංශ පත්‍රවලට ඇතුළත් කළ යුතුය. මේ සඳහා එම නිලධාරියා, පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහය ලබා ගත යුතුවේ. අපේක්ෂකයින් ලබාගත් මනාප සංඛ්‍යාව, පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අනුව වෙන වෙනම වාර්තා කළ යුතු අතර, ඒ සඳහා අවශ්‍ය ආකෘති ඔවුන් වෙත ලබා දෙනු ඇත. මෙම වාර්තාව සකස් කිරීමට පෙර ගණන් කිරීමේ නියෝජිතයින්ට අදාළ සාරාංශ පත්‍රිකා පරීක්ෂා කිරීමට අවස්ථාවක්, ගණන් කිරීමේ නිලධාරියා විසින් ලබා දෙනු ඇත. සාරාංශ පත්‍රිකා සකස් කරන ලද නිලධාරීන් සහ ඒවා පරීක්ෂා කළ නිලධාරීන් ද, නියෝජිතයින් ද සිය අත්සන් යෙදීමෙන් අනතුරුව, ඒ ඒ පක්ෂයේ සහ කණ්ඩායමේ අපේක්ෂකයින් ලබාගත් මනාප සංඛ්‍යාවට අදාළ ප්‍රතිඵල වාර්තා සකසා අත්සන් කර වෙන් වෙන් වූ කවරවල බහා තේරීම්භාර නිලධාරියා දී ඇති උපදෙස් අනුව ප්‍රතිඵල සකස් කිරීමේ මධ්‍යස්ථානයට යැවිය යුතුවේ.

442. මනාප ගණන් කිරීම සම්බන්ධව විශේෂ උපදෙසක් මෙම ඡන්ද විමසීම් හා සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගණන් කිරීමේ නිලධාරීන්ට දී තිබුණි. ගණන් කිරීමේ නිලධාරීන් විසින් මනාප ගණන් කිරීම සිදුකරනු ලබන කාලය තුළ, එම දිස්ත්‍රික්කයේ එක් එක් පක්ෂය සහ කණ්ඩායම වෙනුවෙන් ලබා ගෙන ඇති ඡන්ද සංඛ්‍යාව මත, ඒවාට හිමිවන මන්ත්‍රී ධුර සංඛ්‍යාව තේරීම්භාර නිලධාරියා විසින් තීරණය කරනු ලැබ එය ගණන් කිරීමේ නිලධාරීන් වෙත දැන්වූ පසු එකදු මන්ත්‍රී ධුරයකට හෝ සුදුසුකම් නොලබන පක්ෂ හා කණ්ඩායම් නියෝජනය කරමින් ගණන් කිරීමේ ශාලාවේ රැඳී සිටින නියෝජිතයින්, එම ශාලාවලින් ඉවත් කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා උපදෙස් දී තිබූ බැවින් ඒ අනුව කටයුතු කිරීමට ගණන් කිරීමේ කටයුතු භාර නිලධාරීන්ට සිදුවිය. ගණන් කිරීමේ ශාලාවල විශාල නියෝජිතයින් සංඛ්‍යාවක් රැඳී සිටීම නිසා ගණන් කිරීමේ කටයුතුවලට ඇති අපහසුතාවය යම් තරමකට හෝ අඩු කිරීමට මෙමගින් අපේක්ෂා කරන ලදී.

XI වන කොටස

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම

443. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 55 වන වගන්තියේ සිට 61 වන වගන්තිය දක්වා වූ නීතිමය ප්‍රතිපාදන, ඡන්ද විමසීමකින් පසු, ප්‍රතිඵල සකස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ ප්‍රතිලාභ ආසන වෙනුවෙන් මන්ත්‍රීවරුන් පත් කිරීම යන කටයුතුවලට අදාළ වන අතර, එම කටයුතු සම්බන්ධව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට හා මැතිවරණ කොමසාරිස්වරයාට පැවරෙන කාර්යභාරය ද එම වගන්තිවලින් පැහැදිලි කර ඇත.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම හා සම්බන්ධ දැන්වීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරනු ලබන ස්ථානය නියෝජනය කිරීම

444. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 55 වන වගන්තිය අනුව, ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට පෙර, ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරනු ලබන වේලාව හා ස්ථානය පිළිබඳව ඡන්ද විමසීම් සඳහා තරග කරන ලද දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට හෝ බලය ලත් නියෝජිතයින්ට ද, ස්වාධීන කණ්ඩායම් නායකයින්ට ද ලියවිල්ලකින් තේරීම්භාර නිලධාරීන් විසින් දැන්විය යුතුය. ප්‍රතිඵල සකසා ප්‍රකාශයට පත් කරනු ලබන ස්ථානයට, ඡන්ද විමසීම තරග කරන ලද දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට නියෝජිතයන් 2 කු බැගින් පත් කිරීමට ඉඩ ලැබේ.

445. අදාළ පත්වීම් ලිපි මගින්, සිය නියෝජිතයින්ගේ නම්, ලිපිනයන් හා ජාතික හැඳුනුම්පත් විස්තර ද තේරීම්භාර නිලධාරී වෙත දැනුම් දීමට පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් බැඳී සිටී.

ප්‍රතිඵල සැකසීමේ ස්ථාන පිළියෙල කිරීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය පත් කිරීම

446. ප්‍රතිඵල සැකසීමේ ස්ථානය සංවිධානය කිරීම තේරීම්භාර නිලධාරී විසින් පහත කරුණු කෙරෙහි සැලකිලිමත්ව ඉතා කල්පනාකාරීව කළ යුතු කාර්යය කි.

(අ) ලියාපදිංචි ඡන්ද හිමියන් 8000-10,000 ක් දක්වා වූ සංඛ්‍යාවක් වෙනුවෙන් එක් ගණන් කිරීමේ ශාලාවක් බැගින් ද, ඊට අමතරව තැපැල් ඡන්ද 1500 ක් වෙනුවෙන් එක් ගණන් කිරීමේ ශාලාවක් ද වශයෙන් පිහිටුවන බැවින්, සැම විටකදී ම එකම පරිශ්‍රයක සියලු ගණන් කිරීමේ ශාලා පිහිටුවීම අසීරු වේ. එබැවින් වැඩිම ගණන් කිරීමේ ශාලා සංඛ්‍යාවක් පිහිටි ස්ථානයකට ආසන්න වූ ආරක්ෂා සහිත ස්ථානයක්, මේ සඳහා තෝරා ගත යුතුය. ඊට හේතුව ප්‍රතිඵල සැකසීමේ ස්ථානයකට එක් එක් ගණන් කිරීමේ ශාලාවේ සිට රැගෙන ආයුතු ප්‍රධාන ප්‍රතිඵල ලේඛන වර්ග දෙකක් බැගින් තිබීමත්, ප්‍රතිඵල සැකසීමේ ස්ථානයේ එදින රාත්‍රියේ සිටින තේරීම්භාර නිලධාරියාට වඩාත් පහසු පරිදි ගණන් කිරීමේ ශාලා සමග සම්බන්ධතාව පවත්වා ගැනීමත් අවශ්‍ය බැවිණි.

(ආ) පක්ෂ හා කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ගණන් කිරීමේ ශාලාවලින් ලැබෙන ප්‍රතිඵල, දිස්ත්‍රික්කය හා ඡන්ද ප්‍රදේශ අනුව ද, අපේක්ෂකයින්ගේ මනාප ප්‍රතිඵල පරිපාලන දිස්ත්‍රික්කය අනුව ද, තැපැල් ඡන්ද ප්‍රතිඵලය දිස්ත්‍රික් මට්ටමින් ද සැකසිය යුතුය. ගණන් කිරීමේ ශාලා හා ඡන්ද ප්‍රදේශය අනුව ලැබෙන මෙම ප්‍රතිඵල වාර්තා, අදාළ සාරාංශ පත්‍රිකාවලට ඒ ඒ පක්ෂ හා කණ්ඩායම් වෙනුවෙන් වෙන් වෙන්ව සැකසිය හැකි ආකාරයට ප්‍රතිඵල සැකසීමේ ස්ථානයේ කාර්ය මණ්ඩලය සංවිධානය කළ යුතුය.

(ඇ) කාර්ය මණ්ඩලයේ නිලධාරීන්, ජ්‍යෙෂ්ඨත්වය හා පළපුරුද්ද අනුව, ප්‍රතිඵල ලේඛන සැකසීමට, පරීක්ෂාවට හා එම කටයුතු අධීක්ෂණයට ද යෙදවිය යුතුවේ.

(ඈ) කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට නිශ්චිත කාර්යන් පැවරී තිබීම ද, ඒ සෑම අයෙකුටම අදාළ රාජකාරී වෙනුවෙන් ලිඛිත උපදෙස් ලබා දීමට ද තේරීම්භාර නිලධාරී ක්‍රියා කළ යුතුය. විශේෂයෙන් ප්‍රතිඵල සැකසීමේ ස්ථානයට භාරගනු ලබන ලේඛනවල ආරක්ෂාව ගැන අවබෝධයක් ඇතිව මෙම සියලු කටයුතු සංවිධානය කළ යුතුවේ.

(ඉ) මෙම ස්ථානවල සිට තේරීම්භාර නිලධාරීන්ට නිරන්තරව මැතිවරණ කොමසාරිස්වරයා සමග සම්බන්ධතා පැවැත්වීම අවශ්‍යවන බැවින්, ඒ සඳහා දුරකථන හා ෆැක්ස් පණිවුඩ ලබා ගැනීමට හා මූලික ප්‍රතිඵල ලේඛන මැතිවරණ කොමසාරිස්වරයා වෙත ෆැක්ස් පණිවිඩ මාර්ග යෙන් එවීමටත් ඡන්ද විමසීම් දින රාත්‍රියේ පහසුකම් තිබිය යුතුය.

ප්‍රතිඵල ලේඛන භාර ගැනීම

447. ප්‍රතිඵල ලේඛන ප්‍රතිඵල නිකුත් කිරීමේ ස්ථානයට භාරදීම සඳහා ගණන් කිරීම භාර නිලධාරියාට පෞද්ගලිකව පැමිණීම අසීරුවන බැවින්, ඒ සඳහා විශේෂ නිලධාරීන් පත් කිරීමට ද, ලේඛන රැගෙන ගමන් කිරීමේ දී ආරක්ෂාව සහිතව යාමට ද අවශ්‍ය වැඩපිළිවෙල යොදනු ලැබේ.

448. ප්‍රතිඵල ලේඛන ගණන් කිරීමේ ශාලාවක සිට ප්‍රතිඵල සකස් කිරීමේ ස්ථානයට රැගෙන යාමේදී ඒවා මුද්‍රා තබා තිබිය යුතු අතර, එම මුද්‍රා තබන ලද පැකට්ටු භාර ගන්නා නිලධරයා ප්‍රතිඵල සැකසීමේ ස්ථානයේ සිටින පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරන නියෝජිතයන්ට ඔවුන්ගේ ඉල්ලීම් මත පරීක්ෂාවට ඉඩ දිය යුතු බව පනතේ 58 වන වගන්තියේ දැක් වේ.

ප්‍රතිඵල සැකසීම හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ අවස්ථා

(අ) එක් එක් පක්ෂය හා කණ්ඩායම ඡන්ද ප්‍රදේශ වෙනුවෙන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව හා දිස්ත්‍රික්කයෙන් ලබාගත් තැපැල් ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම හා ප්‍රකාශ කිරීම.

(ආ) එක් එක් පක්ෂය හා කණ්ඩායම දිස්ත්‍රික්කයෙන් ලබා ගෙන ඇති ඡන්ද සංඛ්‍යාව අනුව හිමිකර ගන්නා මන්ත්‍රී ධුර සංඛ්‍යාව ප්‍රකාශ කිරීම.

(ඇ) අපේක්ෂකයන් ලබා ගෙන ඇති මනාප සංඛ්‍යාව අනුව, පළාත් සභාව සඳහා දිස්ත්‍රික්කයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් පිළිබඳ ප්‍රකාශය.

449. ඡන්ද ප්‍රදේශවලට අදාළ ප්‍රතිඵල ප්‍රකාශය, ඡන්ද විමසීම් පනතේ නීතිමය විධිවිධාන යටතේ සිදු කරන්නක් නොවූව ද පැරණි මැතිවරණ කොට්ඨාස වූ එම ඡන්ද ප්‍රදේශ යටතේ ප්‍රතිඵල දැන ගැනීමට සෑම පාර්ශ්වයකටම ඇති උනන්දුව නිසා, මෙවැනි පදනමක් යටතේ ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම මෙවැනි ඡන්ද විමසීමක දී සිදු කෙරේ. ඉහත ආකාරයට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගෙන් මැතිවරණ කොමසාරිස්වරයා ලබාගත් ප්‍රතිඵලවල නිවැරදිතාව තහවුරු කර ගැනීමෙන් පසු, ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලද අතර, රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාරණ මාධ්‍ය මගින් ද, ඒවා විසුරුවා හැරීමට අවශ්‍ය වැඩපිළිවෙල යොදන ලදී. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ ප්‍රතිඵල වාර්තා ලබා ගැනීමෙන් පසු ප්‍රතිලාභ ආසන වෙනුවෙන් අදාළ පක්ෂවලින් නාමයෝජනා ලබා ගෙන තේරීපත් වූ සියලු මන්ත්‍රීවරුන්ගේ නම් ගැසට් පත්‍රයේ පළ කිරීමට ද පියවර ගන්නා ලදී.

XII වන කොටස

ඡන්ද විමසීම සඳහා වියදම

450. මෙවර පළාත් සභා නවය වෙනුවෙන් ඡන්ද විමසීම්, අදියර හතරක් යටතේ 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ දින හතරක දී පැවැත්විණි.

451. පළමුවෙන්ම නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව යන පළාත් සභා වෙනුවෙන් 2012.09.08 වන දින ඡන්ද විමසීම් පැවැත් වූ අතර, එය එම පළාත් තුනෙහි පිහිටි මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව, කෑගල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක වලට අදාළ විය. මෙම දිස්ත්‍රික්ක යටතේ ලියාපදිංචි වී සිටි ඡන්දහිමියන් 3,236,417 ක් වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථාන 3,247 කදී ඡන්දය දීම සඳහා මධ්‍යස්ථාන පිළියෙල කොට ඡන්ද විමසීම් පවත්වන ලදී. ඉන් අනතුරුව ඡන්ද ගණන් කිරීමේ කටයුතු ගණන් කිරීමේ මධ්‍යස්ථාන 329 ක දී සිදු කරන ලදී. මේ වෙනුවෙන් රු. 672,432,229.61 වැය කිරීමට සිදු වූ අතර, ඒ අනුව ලියාපදිංචි එක් ඡන්දදායකයෙකු වෙනුවෙන් වැය වූ මුදල රු. 201.54 ක් විය.

452. මධ්‍යම, වයඹ හා උතුරු පළාත් සභා වෙනුවෙන් ඡන්ද විමසීම් පැවතියේ 2013.09.21 දීය. ඒ සඳහා මහනුවර, මාතලේ, නුවරඑළිය, යාපනය, කිලිනොච්චිය, වවුනියාව, මන්නාරම, මුලතිව්, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්ක යටතේ ලියාපදිංචිව සිටි ඡන්දහිමියන් සංඛ්‍යාව වූ 4,363,252 දෙනෙකු වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථාන 3,712 දී ඡන්දය පාවිච්චි කිරීමට පහසුකම් සලසා ඡන්ද විමසීම් පවත්වන ලදී. අවතැන් වූ ඡන්දහිමියන් වෙනුවෙන් පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථාන 24 ක් ද, ඊට ඇතුළත් විය. එම දිස්ත්‍රික්කවල ඡන්ද ගණන් කිරීමේ කටයුතු මධ්‍යස්ථාන 499 ක දී සිදු විය. මෙම දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම හා ඡන්ද ගණන් කර අවසන් කොට ප්‍රතිඵල නිකුත් කිරීම දක්වා කටයුතු වෙනුවෙන් රු. 874,232,151.12 ක් වැය වී ඇත. ඒ අනුව එම පළාත් සභා සඳහා ඡන්දය විමසීමේ දී, එක් ලියාපදිංචි ඡන්දහිමියෙකු වෙනුවෙන් වැය වී ඇති සාමාන්‍ය මුදල රු.200.36 කි.

453. බස්නාහිර හා දකුණ යන පළාත් වලට අයත් කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම 2014.03.29 වන දින පවත්වන ලද අතර, ඒ වෙනුවෙන් ඡන්දහිමියන් 5,898,428 ක් ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබා සිටිය හ. ඔවුන් වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථාන 4,253 ක් පිහිටුවා ඡන්ද විමසීම පැවැත්වීමෙන් පසු, ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන 608 ක දී ඡන්ද ගණන් කිරීම සිදු කරන ලදී. මෙම ඡන්ද විමසීම වෙනුවෙන් වැය වූ මුදල රු.986,843,376.40 ක් වූ අතර, ඒ අනුව එක් ලියාපදිංචි ඡන්දහිමියකු වෙනුවෙන් වැය වී ඇති මුදල රු.167.31කි.

454. අවසන් වරට 2014.09.20 දින පැවති උඟව පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් මොණරාගල, බදුල්ල යන දිස්ත්‍රික්කවල ඡන්දහිමියන් 942,730 ලියාපදිංචිව සිටි අතර, ඡන්ද පොළවල් 854 ක් පිහිටුවා ඔවුන්ට ඡන්දය පාවිච්චි කිරීමට පහසුකම් සලසන ලදී. මෙම ඡන්ද විමසීම සඳහා වැය වූ මුදල රු. 293,877,380.97 වූ අතර, ඒ අනුව එක් ඡන්දහිමියෙක් වෙනුවෙන් වැය කරන ලද මුදල රු. 311.71 කි.

455. 2012 සිට 2014 දක්වා කාලය තුළ සියළුම පළාත් සභා සඳහා පවත්වන ලද ඡන්ද විමසීම් වෙනුවෙන් වැය වූ මුදල රු.3,127,386,338.20 වන අතර, ලියාපදිංචි වූ ඡන්දහිමියෙක් වෙනුවෙන් වැය වූ සාමාන්‍ය මුදල රු.215.07 කි.

456. ඡන්ද විමසීම් අවස්ථාවක දී මැතිවරණ දෙපාර්තමේන්තුව, වැදගත් මෙන්ම ප්‍රධාන රාජකාරී ඉටු කිරීමේ වගකීම පවරනු ලබන දෙපාර්තමේන්තු අතර පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව හා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ප්‍රධාන තැනක් ගනී. නාමයෝජනා කටයුතු ඇරඹීමත් සමග ඡන්ද විමසීම් කටයුතු අවසන් වී තවත් කාලයක් යන තෙක් රටේ නීතිය හා සාමය පවත්වාගෙන යාමට ද ඡන්ද විමසීම් කාලයේ දී අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට ආරක්ෂාව සැපයීම, ඡන්ද පොළවල ඡන්ද විමසීමට හා ඡන්ද ගණන් කිරීමේ කටයුතුවල දී ආරක්ෂාව සැපයීම සහ ඡන්ද විමසීම් කාලවල දී මැතිවරණ නීති උල්ලංඝණය කිරීම පිළිබඳව නීතිමය පියවර ගැනීම යනාදී කාර්යයන් පොලිසියට පැවරෙන ප්‍රධාන රාජකාරී වේ. මෙම රාජකාරී ඉටු කිරීම සඳහා ඉහත සඳහන් කරන ලද ඡන්ද විමසීම් අවස්ථාවල දී පොලිස්පතිවරයාට වෙන් කරන ලද මුදල රු. 429,670,247.94 විය. පොලිස් දෙපාර්තමේන්තුව දරන ලැබූ වියදම්වලින් වැඩිම වියදම, කාර්යය මණ්ඩල වැටුප්, අතිකාල, ගමන් වියදම් හා දීමනා යටතේ දරා ඇත. වාහන කුලියට ගැනීමට හා වාහනවලට ඉන්ධන සපයා ගැනීමට, එම දෙපාර්තමේන්තුව ඊළඟ වැඩිම වියදමක් දරා ඇත. ඡන්ද විමසීම් කාලය තුළ නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණ දැන්වීම් ඉවත් කිරීම සඳහා අනියම් සේවකයින් යොදාගෙන විශේෂ කාර්යය භාරයක් ඉටුකිරීමට ද පොලිස් දෙපාර්තමේන්තුවට සිදු වේ. මෙවර පැවති සියලුම පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල දී පොලිස් දෙපාර්තමේන්තුව නීති විරෝධී

ලෙස ප්‍රදර්ශනය වූ දැන්වීම් ඉවත් කිරීම සඳහා රු. 29,144,195.33 වියදම් කර ඇත.

457. ඡන්ද විමසීම් කාලය තුළ ඡන්ද විමසීම් සංවිධානය කිරීම සම්බන්ධයෙන්, විශාල ලිපි ලේඛන තොගයක් රාජ්‍ය අංශයේ කාර්යාල ද දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ද, මැතිවරණ කොමසාරිස්වරයා ද අතර, හුවමාරු වන බැවින් එම ලිපි ප්‍රමුඛ සේවාව යටතේ බෙදා හැරීමට තැපැල් දෙපාර්තමේන්තුව ක්‍රියා කර ඇත. ඊට අමතරව නියමිත කාලයක් තුළ ගෘහ මූලිකයින් වෙත නිල ඡන්ද දැන්වීම්පත් හා අපේක්ෂක නාමලේඛන ඇතුළත් ගෘහ දැන්වීම් බෙදා හැරීම හා තැපැල් ඡන්ද ක්‍රියාවලියට අදාළ රක්ෂණ තැපෑලෙන් යැවිය යුතු ලිපිලේඛන බෙදා හැරීම ද සිදු කරනුයේ තැපැල් දෙපාර්තමේන්තුව මඟිනි. මෙම ඡන්ද විමසීම්වල දී තැපැල් දෙපාර්තමේන්තුවට ගෘහ මූලිකයින් වෙත බෙදා දීම සඳහා භාර දෙන මුළු නිල ඡන්ද දැන්වීම් පත්‍ර සංඛ්‍යාව 14,540,871 කි. එසේම තැපැල් ඡන්දදායකයින්ට අදාළ ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂණ පත්‍රිකා 355,675ක් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සහතික කිරීමේ නිලධාරීන් වෙත යැවීමට තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. විශේෂයෙන් ඡන්ද විමසීමට පෙර සහ ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද පොළවල් අධීක්ෂණය කරන සහකාර තේරීම්භාර නිලධාරීන්ට දුරකථන හා ෆැක්ස් පණිවිඩ යැවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ඡන්ද විමසීම් කාලයේ දී තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන තවත් විශේෂ කාර්යයකි. මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් තැපැල් දෙපාර්තමේන්තුවට දෙන ලද මුදලින් වැඩිම ප්‍රමාණයක් වැය වී ඇත්තේ කාර්ය මණ්ඩල වැටුප් අතිකාල දීමනා හා ගමන් වියදම් වෙනුවෙනි. මෙම ඡන්ද විමසීම්වල දී තැපැල් දෙපාර්තමේන්තුවට වැය වූ මුළු මුදල රු. 277,306,790.64 වූ අතර, එය මුළු වියදමින් 8.8%කි.

458. මැතිවරණ දෙපාර්තමේන්තුව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කරවා ගැනීම හා වෙනත් උපදෙස් පත්‍රිකා, ආකෘති, ලිපි ලේඛන, තැපැල් ඡන්ද කටයුතු සඳහා අවශ්‍ය වන ලිපිකවර ද, දැන්වීම් ආදිය ද මුද්‍රණය කරවා ගැනීම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ලවා සිදු කරවා ගැනේ. එම දෙපාර්තමේන්තුවට මැතිවරණ කටයුතු වෙනුවෙන් වැය කිරීමට සිදු වූ මුදල රු. 162,712,892.58 වූ අතර, එය ඡන්ද විමසීමේ මුළු වියදමින් 5.20% ප්‍රතිශතයකි. මෙම ඡන්ද විමසීම් අවස්ථාවල දී නිල ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම පෞද්ගලික අංශය ලවා ඉටු කරවා ගන්නා ලදී.

459. මෙවර පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව හා මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් වැය කරන ලද මුදල් ප්‍රමාණය අංක 25 සටහනේ දක්වා ඇත. එම දෙපාර්තමේන්තු විසින් වැය කරන ලද මුදල, සමස්ත මැතිවරණ වියදමින් 28% පමණ වන බව එම සටහනින් පැහැදිලි වේ.

460. පළාත් සභා ඡන්ද විමසීමේ දී, දරන ලද සියලු වියදම්, වියදමේ ස්වභාවය අනුව වර්ග කොට එම පිළිවෙලට අංක 26 දරන සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මධ්‍යම උතුරු හා වයඹ යන පළාත් සභා වෙනුවෙන් වියදම් විස්තර 11 ක් යටතේ වියදම් දක්වා ඇති අතර, අනිකුත් ඡන්ද විමසීම්වලට අදාළව එම විස්තර අයිතම 10 ක් යටතේ දක්වා ඇත.

461. මෙම පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථා 4 හි දරන ලද මුළු වියදම් අංක 26 දරන සංඛ්‍යා සටහනේ දක්වා ඇති අතර, ඒ ඒ අවස්ථාවල දී ඡන්ද විමසීමට අදාළ ලියාපදිංචි ඡන්දහිමියන්ගේ සංඛ්‍යාව හා ඡන්ද විමසීම් සඳහා දරන ලද වියදම් සලකා, එක් ලියාපදිංචි ඡන්දහිමියෙකු වෙනුවෙන් ඡන්ද විමසීමේ දී දරන ලද වියදම වෙන වෙනම දක්වා ඇත. ඒ අනුව එම ඡන්ද විමසීම්වල දී එක් ලියාපදංචි ඡන්දදායකයෙකු වෙනුවෙන් රු. 167.31 සිට රු.311.71 දක්වා මුදලක් වැය වී ඇත.

XIII වන කොටස

නිරීක්ෂණ හා නිර්දේශය

ඡන්ද විමසීම් සඳහා දින නියම කිරීම

462. මෙවර පළාත් සභා ඡන්ද විමසීම්, 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ අදියර 4 කදී පැවැත්විණි. මුලින් ම 2012.09.08 වන දින, නැගෙනහිර, උතුරු මැද හා සබරගමු යන පළාත් සභා සඳහා ඡන්ද විමසීම් පැවති අතර, මධ්‍යම, උතුරු හා වයඹ යන පළාත් සභා වෙනුවෙන් 2013.09.04 දින ඡන්ද විමසීම් පවත්වන ලදී. 2014.03.29 වන දින බස්නාහිර, දකුණු පළාත් සභා වෙනුවෙන් හා අවසානයට 2014.09.20 දින ඌව පළාත් සභාව වෙනුවෙන් ද ඡන්ද විමසීම් පැවැත්විණි.

463. පළාත් සභාවක ධුර කාලය වසර 5කි. පළාත් සභාවේ පළමු සභා රැස්වීම් දිනයෙන් ඇරඹෙන එම කාලය අවසන් වීමට පෙර, පළාත් සභාවක් ආණ්ඩුකාරවරයාගේ අභිමතය පරිදි විසුරුවා හැරීමට හැකියාව ඇති අතර, එසේ අභිමතය පරිදි ආණ්ඩුකාරවරයෙකුට ඉටුකළ හැකි බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයක් සම්බන්ධයෙන්, අධිකරණයකදී ඔහුට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව ද නීතියේ සඳහන් වේ. තවද, ආණ්ඩුකාරවරයාගේ අභිමතය පරිදි ඉටු කරන ක්‍රියා, ජනාධිපතිවරයාගේ එකඟතාවය මත සිදුවිය යුතු බව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වැඩි දුරටත් දැක්වේ. මෙවර උතුරු පළාත් සභාව වෙනුවෙන් වූ ඡන්ද විමසීම හැර, ඉතිරි පළාත් සභා සඳහාවූ ඡන්ද විමසීම් පවත්වනු ලැබුවේ, එම පළාත්වල ධුර කාලය අවසන් වීමට පෙර ඒවා විසුරුවා හැරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. එවැනි විසුරුවා හැරීමක් පළාත් සභාවකට අදාළව සිදු වූ විට, එදින සිට සතියක් ඇතුළත පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ, මැතිවරණ කොමසාරිස් විසින් නාමයෝජනා දැන්වීම පළ කළ යුතුය. එම දැන්වීමෙන් පසු එළඹෙන තුන් වන සතිය තුළ, දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් විසින් නාමයෝජනා භාර ගත යුතුවේ. එම කාලය අවසන් වීමෙන් පසු හැකි ඉක්මණින්, තරග පවතින පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් ඡන්ද විමසීම් දිනය නියම කරමින්, පනතේ 22 වන වගන්තිය අනුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද විමසීම් දැන්වීම පළ කළ යුතු ය. එම දැන්වීම පළ කරනු ලබන දිනයේ සිට සති 5 ත් 8ත් අතර කාලය තුළ, සෙනසුරාදා දිනයක ඡන්ද විමසීම පැවැත්විය යුතුය.

464. මෙවර, 2012.09.08 වන දින ඡන්ද විමසීම් පැවති නැගෙනහිර පළාතේ, ඊට ප්‍රථමයෙන් ඡන්ද විමසීම් පවත්වා තිබුණේ 2008.05.10 දින දීය. 2012.09.08 දින ඡන්ද විමසීම් පැවති උතුරු මැද හා සබරගමු පළාත් සඳහා ඊට ප්‍රථම පළාත් සභා ඡන්ද විමසීම් 2008.08.23 දින පවත්වා තිබිණි. එම ඡන්ද විමසීම්වලින් පසු 2008.06.04 දින නැගෙනහිර පළාත් සභාවේ ද, 2008.09.18 දින උතුරු මැද පළාතේ ද, 2008.09.01 දින සබරගමු පළාතේ ද, ප්‍රථම සභා රැස්වීම් පවත්වා ඇත. ඒ අනුව මෙම පළාත් සභා 3, ඒවායේ ආණ්ඩුකාරවරුන් විසින් 2012.06.27 දින විසුරුවා හැර ඇත්තේ, ඒවායේ ධුර කාලය තවත් ඉදිරියට වසරකටත් වඩා වැඩි කාලයක් ඉතිරිව තිබිය දීය. ඒ නිසා මෙම පළාත් සභා වෙනුවෙන් ඡන්ද විමසීම් පැවැත් වීම සඳහා අදාළ දැන්වීම් පළ කරනු ලැබූ අවස්ථාවේ වලංගුව පැවති 2011 වර්ෂයට අදාළ ඡන්දහිමි නාමලේඛනය, ඒ සඳහා භාවිතා කිරීමට සිදුවිය. මෙම පළාත් සභා 3, කලින් විසුරුවා හැරීමක් නොකොට සාමාන්‍ය පරිදි ඒවායේ ධුර කාලය අවසන් වීමට ඉඩ හැර ඡන්ද විමසීම් පැවැත්වූයේ නම්, ඒ වෙනුවෙන් 2012 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය භාවිතා කිරීමට ඉඩ ලැබේ. 2011 වර්ෂයට වඩා, ඡන්දහිමියන් 57,000 ක් පමණ, 2012 වර්ෂයේ මෙම පළාත් සභා තුනේ ඡන්දහිමි නාමලේඛනවල ලියාපදිංචි වී ඇති අතර, එයින් සැලකිය යුතු පිරිසක් වයස අවුරුදු 18 ඉක්ම වූ පළමුවරට ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි වූ අයවේ. මෙම පිරිසට සිය පළාත් සභා වෙනුවෙන් නියෝජිතයින් තෝරා ගැනීමට ඡන්දය භාවිතා කිරීමට නැවත අවස්ථාවක් ලැබෙන්නේ ඊළඟ පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවක දී ය.

465. වර්තමානයේ ඡන්දහිමි නාමලේඛන සැකසීමට, ගත වන කාලය පෙරට වඩා අඩු වී ඇත. වර්ෂයේ ජූනි මස පළවෙනි දිනයේ දී ආරම්භ වන ඡන්දහිමියන් ගණන් ගැනීමෙන් පසු, ඡන්දහිමි නාමලේඛනය සැකසීමට ඊළඟ වසරේ මැයි මස අග දක්වාම කාලයක් 2012 වර්ෂයට පෙර ගත වූ බැවින්, එවැනි නාමලේඛන ඡන්ද විමසීම් සඳහා වසර එකහමාරක කාලයක් වලංගුව පැවතිනි. දැනට ඡන්දහිමියන් ගණන් ගන්නා වර්ෂය අවසන් වන විට නාමලේඛනය සකසා අවසන් වන බැවින්, ඊළඟ වර්ෂය ආරම්භවීමත් සමඟ මාස 12ක කාලයක් පමණක් නාමලේඛනය වලංගුව පවතී. මේ නිසා දැනට ඡන්දහිමි නාමලේඛනයක වලංගු වන කාලය වසරකට පමණක් සීමාවේ. එබැවින් ඡන්ද විමසීම් සඳහා වඩාත් යාවත්කාලීන වූ ඡන්දහිමි නාමලේඛනයක් භාවිතා කිරීමට දැන් ඉඩ ලැබී ඇත. වඩාත් යාවත්කාලීන වූ ඡන්දහිමි නාමලේඛනයක් ඡන්ද විමසීමක දී භාවිතා කිරීම, ඡන්ද විමසීමක ගුණාත්මක භාවය ඉහළ යාමට ඉවහල් වන කරුණකි. ඡන්ද විමසීම් සඳහා කාල වකවානු තීරණය කරනු ලබන පාර්ශ්වයවන්ට, මෙම කරුණු ද සැලකිල්ලට ගැනීම යෝග්‍ය වේ.

466. මෙසේ කල්තබා ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා පළාත් සභා විසුරුවා හැරීමෙන් සිදු වන තවත් ප්‍රතිඵලයක් නම්, ඉදිරි වසරක පමණ කාලයක් පළාත් සභා විසින් ඉටු කිරීමට අපේක්ෂා කරන ලද හා සැලසුම් කරන ලද වැඩ කටයුතු අනපේක්ෂිත පරිදි නතර කරලීමට පළාත් සභාවලට සිදුවීමය. මෙවර මුලින් ඡන්ද විමසීම් පැවති පළාත් තුනේ පළාත් සභාවලට අහිමි වූ ධුර කාලය වසරක් පමණ වේ. පළාත් සභාවක් සඳහා විශාල මූල්‍ය හා වෙනත් සම්පත් වෙන් කිරීම, අනුමත කාර්යයන් අනුව වර්ෂයක් පාසා අයවැය ලේඛන මාර්ගයෙන් සිදු වන බැවින්, මෙවැනි හදිසි විසුරුවා හැරීම්වලින්, එම රාජ්‍ය සම්පත් නිසි පරිදි කළමනාකරණයට බාධා පැමිණේ.

467. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් පැවැත් වූ කාලය, 2012 සිට 2014 දක්වා වූ අතර, ඒවා අවස්ථා 4 ක දී පැවත්විණි. ඒ සෑම අවස්ථාවක දීම ඒවා වෙනුවෙන් මාස 2ක් බැගින් පමණ කාලයක් වෙන් කිරීමට ඊට සම්බන්ධ සෑම අංශයකටම සිදු විය. මෙම කාලය තුළ රජයේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන ලද සමහර වැඩසටහන්, දේශපාලනික අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීමට රාජ්‍ය බලය දරන ලද දේශපාලන පක්ෂය විසින් මැතිවරණ ප්‍රචාරණ ක්‍රියා හැටියට ක්‍රියාත්මක කළ බවට මැතිවරණ දෙපාර්තුමේන්තුවට පැමිණිලි ලැබී තිබිණි. එවැනි වැඩපිළිවෙලවල් ඡන්ද විමසීම් කාලයෙන් පසුව ඉටු කිරීමට ඇති හැකියාව සම්බන්ධව සමහර අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතනවලින් කරුණු විමසීමේ දී මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා ඇත්තේ, එබඳු වැඩපිළිවෙළවල් ගම් මට්ටමේ දිළිඳු ජනතාව හෝ විශේෂ ජන කණ්ඩායම් කේන්ද්‍ර කර ගෙන වාර්ෂිකව සිදුකරන වැඩසටහන් බවත්, එවැනි කටයුතු ඡන්ද විමසීම් කාලයක් හේතුවෙන් මාස 2 ක් පමණ ප්‍රමාද කිරීම, අදාළ රාජ්‍ය ආයතනවල වාර්ෂික සංවර්ධන ඉලක්ක සපුරාගැනීමට බාධාවක් වන බවත්ය. මෙවැනි කඩින් කඩ පැවැත්වෙන ඡන්ද විමසීම් නිසා රාජ්‍ය බලය මෙහෙයවන දේශපාලන පක්ෂයේ, පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්ට ද, වෙනත් මහජන ආයතනවල නියෝජිතයින්ට ද, තම දේශපාලන පක්ෂය වෙනුවෙන් පළාත් සභා සඳහා තරග කරනු ලබන අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය සඳහා දීර්ඝ කාලයක් මැතිවරණ ප්‍රචාරණ කටයුතු කිරීමට සිදුවේ.

468. දිවයින පුරා ඡන්ද විමසීම් එකම දිනයක දී පැවැත්වීමට නම්, පළාත් සභා විසුරුවාහැරීම හා අලුතින් තේරී පත් වූ පළාත් සභාවල ප්‍රථම සභා රැස්වීම් පැවැත්වීම, යම් තරමකට හෝ ආසන්න දින වකවානුවල සිදු විය යුතුය. එකම දිනක දී සියලු පළාත් සභා වෙනුවෙන් ඡන්ද විමසීම් නොපැවැත්වීම මඟින්, මැතිවරණ වෙනුවෙන් සුදානම් වන දේශපාලන පක්ෂ වලට අපේක්ෂා සහගතව නිසි ලෙස ඡන්ද විමසීම්වලට සුදානම් වීමට ඇති අවස්ථාව අහුරාලීමෙන්, රාජ්‍ය බලය දරන දේශපාලන පක්ෂවලට පමණක් විශේෂ වාසි අත් වේ.

469. එකම ඡන්ද විමසීමක් දිවයින පුරා වසර දෙකක කාලයක් තිස්සේ පැවැත් වීම නිසා, රජයේ දේපළ දේශපාලන පක්ෂවල මැතිවරණ ව්‍යාපාර වෙනුවෙන් භාවිතා කිරීමේ ඉඩකඩ වැඩි වේ. ඡන්ද විමසීම් අවස්ථාවල දී රජයේ දේපළ, පක්ෂවල හෝ අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය උදෙසා භාවිතා කිරීම, මැතිවරණ කොමසාරිවරයා විසින් තහනම් කර ඇති බව රාජ්‍ය ආයතන වලට දැනුම් දීම සිදු කෙරේ. එහෙත් මෙසේ කඩින් කඩ ඡන්ද විමසීම් පැවැත්වීම නිසා, රජයේ පාලන බලය හිමි දේශපාලන පක්ෂයට සිය මැතිවරණ ව්‍යාපාරය, රජයේ වරප්‍රසාද යටතේ බොහෝ දුරට ඉටු කිරීමට අවස්ථාව උදාවන නිසා, මෙම තත්ත්වය මැතිවරණ සාධාරණ ලෙස පැවැත්වීමට ඉමහත් බාධාවක් ඇති කරයි. එමෙන්ම, ඉහත කරුණු නිසා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ ඡන්ද විමසීම් තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට යම් අසාධාරණයක්ද සිදුවේ.

නාමයෝජනා පත්‍රවලට අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීම

470. 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ පළමු උපලේඛනයේ "අ" ආකෘතිය අනුව පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් මුද්‍රණය කළ යුතු නාමයෝජනා පත්‍රව වල මුල් තීරුවෙහි, අපේක්ෂකයාගේ නම ඇතුළත් කිරීමට ඉඩ සලසා ඇත. අදාළ නම් මූලකුරු සමග හෝ සම්පූර්ණ නම් වශයෙන් තිබිය හැකිය. එම නම්, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ, 22(1)(අ) වගන්තිය අනුව සිංහල අකාරාදී පිළිවෙළට සකස් කර, එම පිළිවෙළට එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් අනුක්‍රමික අංක පැවරීම, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට නාමයෝජනා භාර ගැනීමෙන් පසු පැවරෙන රාජකාරියකි.

471. අපේක්ෂකයින් හඳුනා ගැනීම සඳහා දෙනු ලබන අංකවලින්, මුලට ඇති පිළිවෙළ අංකයක් ලබා ගැනීමේ අරමුණ ඇති අපේක්ෂකයින් විසින්, නාමයෝජනා පත්‍රවල තම නම මුලට, නමට අදාළ නොවන ආකාරයෙන් සිංහල අකාරාදියේ මුලින් යෙදෙන අ අක්ෂරය එක් වරක් හෝ කිහිපවරක් යොදා, නාමයෝජනා පත්‍ර සකසා තිබූ ආකාරය මෙම වාර්තාවේ මීට ඉහත සඳහන් කර ඇත. එම අවස්ථාවල දී සමහර අපේක්ෂකයින් මේ වෙනුවෙන් සිය උප්පැන්න සහතික මෙන්ම ජාතික හැඳුනුම්පත පවා ඒ ආකාරයට වෙනස්කර සකස් කරවාගෙන තිබූ බව හෙළි විය.

දිවයින පුරා ඡන්ද විමසීමක් පැවැත්වෙන විට, තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව මත, නාමයෝජනා පත්‍රවල අපේක්ෂකයින්ගේ නම් වෙනුවෙන් අනුක්‍රමික අංක ලබා දීම සඳහා සැහෙන කාලයක් ගතවේ. නාමයෝජනා පත්‍රවලට මූලකුරු සමග නම් ඇතුළත් කර ඇති විට, සමාන නම් ද ඇති වන අතර, ඒවා සිංහල අකාරාදී පිළිවෙළට පෙළගැස්වීමේ දී එක ළඟට පිහිටුවා පිළිවෙළ අංක ලබා දීමට සිදු වන අවස්ථා ද තිබේ.

472. මෙරටට අනුපාත ඡන්ද ක්‍රමය හඳුන්වා දුන් මුල් අවධියේ පැවති මැතිවරණ නීතිය අනුව අපේක්ෂකයින් හඳුනා ගැනීම සඳහා අංක පැවරීම සිදු වූයේ අදාළ පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා පත්‍රයට සිය අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කර තිබූ අනුපිළිවෙලටමය. නමුත් එම ක්‍රමය පසුව නීති මගින් වෙනස් විය. එහෙත් වර්තමානයේ මේ සම්බන්ධයෙන් ඇති වී ඇති ගැටලු පිළිබඳව කල්පනා කිරීමේදී, අපේක්ෂකයින්ගේ නම් සිය වාසගම සහිතව සම්පූර්ණ නම් වශයෙන් උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතෙහි සඳහන් ආකාරයට නාමයෝජනා පත්‍රයට ඇතුළත් කිරීමටත්, පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා පත්‍රයට නම් ඇතුළත් කර ඇති පිළිවෙළටම, අපේක්ෂකයින් වෙත අංක පැවරීමටත් අවකාශය සලසමින්, නීති සංශෝධනය වීම සුදුසුය.

පළාත් සභා ඡන්ද විමසීම් සඳහා අපේක්ෂකයින් වශයෙන් ඉදිරිපත්වන පළාත් පාලන ආයතනවල නියෝජිතයින්

473. පළාත් සභා ඡන්ද විමසීම් නීතිය අනුව, පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයෙකුට එම තනතුර දරමින් සිටියදීම පළාත් සභා ඡන්ද විමසීමකදී අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමට ඉඩ සැලසී ඇත.

474. මෙවර පළාත් සභා ඡන්ද විමසීමේ දී ඉහත ආකාරයේ අපේක්ෂකයින් සැහෙන සංඛ්‍යාවක් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් තරග වැදුනු අතර, ඔවුන් සිය පළාත් පාලන ආයතනය පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන්ම තරග කරන ලදී. මින් සමහර දෙනෙකු ප්‍රාදේශීය සභාවල සභාපතිවරු වූහ. මෙවර ඡන්ද විමසීම් අවස්ථාවේ දේශපාලන පක්ෂ සමග මැතිවරණ කොමසාරිස්වරයා පවත්වන ලද සාකච්ඡාවල දී, පක්ෂවලින් ලද එකඟත්වය අනුව ඉහත ආකාරයට ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයින්ට, සිය පළාත් පාලන ආයතනවලින් නිවාඩු ලබාගෙන ඡන්ද විමසීම් ඉදිරි කටයුතුවලට සහභාගි වන ලෙසට දැනුම් දුන්න ද එය එතරම් ඵලදායී වූ බවක් නොපෙනුණි. මෙවැනි අපේක්ෂකයින් සිය පළාත් පාලන ආයතනවල වාහන හා වෙනත් සම්පත් ආදිය භාවිතා කරමින් තම අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කර ගැනීමට රජයේ දේපළ භාවිතා කිරීම සිදු කර ඇති බව හෙළි වී ඇත. මෙවැනි රාජ්‍ය දේපළ අවභාවිතය කිරීම වඩාත් ප්‍රදර්ශනය වූ අවස්ථාවක් ලෙස මාතර දිස්ත්‍රික්කයේ ඇතිවූ සිද්ධියක් පිළිබඳව අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. මාතර දිස්ත්‍රික්කයේ එක් පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙකු, පළාත් සභා ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු ලෙස තරග කරමින් එකී පළාත් පාලන ආයතනයේ දේපළ හා කාර්ය මණ්ඩලය ස්වකීය අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා භාවිතා කිරීම වැළැක්වීම සඳහා මැතිවරණ බලධාරීන් කටයුතු කරන ලද අතර මැතිවරණ නිලධාරීන්ගේ එම ක්‍රියාවට එරෙහිව පළාත් පාලන ආයතනයේ සේවකයන් ලවා උද්ඝෝෂණයක් පැවැත්වීමට එකී අපේක්ෂකයා ක්‍රියා කරන ලදී. පසුව අදාළ පක්ෂයේ බලධාරීන් දැනුම්වත් කර පොලිසියේ ද සහාය ඇතිව මෙම පළාත් පාලන ආයතනයේ රාජ්‍ය දේපළ අනිසි භාවිතය වැළැක්වීමට හැකිවිය. පළාත් පාලන ආයතන සභාපතිවරුන් අපේක්ෂකයන් ලෙස තරග කරමින් ස්වකීය ආයතනයේ සම්පත් හා නිලධාරීන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරත කරවීම බොහෝ දිස්ත්‍රික්කවල දී දැකිය හැකි වූ අතර මාතර දිස්ත්‍රික්කයට අමතරව රත්නපුර, කෑගල්ල හා කළුතර දිස්ත්‍රික්කවල පළාත් පාලන සභාපතිවරු තිදෙනෙකු අන් අයට සාපේක්ෂව සම්පත් අවභාවිතා කිරීම වැඩි බව නිරීක්ෂණය විය. එවැනි අවස්ථාවල දී මැතිවරණ නිලධාරීන් පොලිස් නිලධාරීන් හා එක්ව මෙම අකටයුතු මහත් අපහසුතා මැද වළක්වා ඇත.

475. මෙම තත්ත්වය, රජයේ දේපළ මැතිවරණ කටයුතු වෙනුවෙන් යොදා ගැනීමට අපේක්ෂකයින්ට ඇති ඉඩකඩ තවත් වැඩි වීමට හේතු වී ඇති බැවින්, පළාත් පාලන ආයතනවල ධුර දරමින් පළාත් සභා වෙනුවෙන් තරග කිරීමට ඇති අවකාශය නීති මගින් අහෝසි කරලීම සුදුසුය. තවද, මෙම පළාත් පාලන සභිකයින් එම ආයතනවලින් ඉල්ලා අස්වී පළාත් සභා සඳහා තරග කරන්නේ නම්, එවැනි පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීම සඳහා, අදාළ සභිකයින් නියෝජනය කළ පක්ෂයෙහි නාමයෝජනා පත්‍රයේ නම් ඇතුළත් අය ඒ වෙනුවෙන් පත් කිරීම සඳහා නිතීමය ප්‍රතිපාදන ද ඇත. එසේ ඉතිරි වූ නම් නාමයෝජනා පත්‍රයක නොමැති වූ අවස්ථාවක පුරප්පාඩු පිරවීමට ක්‍රියා කළ යුතු ආකාරය ද නීතියේ සඳහන් වේ.

අපේක්ෂකයින්ගේ ආරක්ෂාව

476. ඡන්ද විමසීමක් වෙනුවෙන් ඉදිරිපත් වන සියලුම අපේක්ෂකයින්ට ඒකාකාරී ආරක්ෂක වැඩපිළිවෙළක් යෙදීමේ ක්‍රමයක් දැනට නොපවතින අතර, ඔවුන්ට

සැපයිය යුතු ආරක්ෂාව සම්බන්ධව තීරණය කරනු ලබන්නේ පොලිස්පතිවරයාය. සමහර අවස්ථාවල දී යම් අපේක්ෂකයෙක් විශේෂ හේතූන් මත පොලිස් ආරක්ෂාව ඉල්ලා සිටිය ද, එබඳු අයගේ ආරක්ෂාවට එල්ල වී ඇති තර්ජන පිළිබඳව සොයා බලා අදාළ අයට සැපයිය යුතු ආරක්ෂාවේ ප්‍රමාණය ගැන පොලිසිය විසින් තීරණය කරනු ඇත. බොහෝ විට පළාත් සභා ඡන්ද විමසීමක දී අදාළ පළාත් සභාව විසුරුවා හැරීමට පෙර අපේක්ෂකයින් විසින් දරා ඇති මැතිඇමති තනතුරු ආදිය සැලකිල්ලට ගෙන පොලිසිය විසින් නිල ආරක්ෂකයින් ඔවුන් වෙත ලබා දෙන බව පෙනේ.

477. ඉහත ආකාරයට ආරක්ෂාව සැපයීමේ දී සමහර අපේක්ෂකයින් වෙත සිටින නිල ආරක්ෂකයින් අනිවාර්යයෙන්ම මැතිවරණ කාලය පුරාම අදාළ අපේක්ෂකයින් සමග රැඳී සිටින අතර, ඔවුන්ගේ ප්‍රචාරණ කටයුතුවලට ද එවැනි අය සම්බන්ධ වූ බවට හෙළිවූ අවස්ථා ද ඇත. මෙසේ නිල ආරක්ෂකයින් නොමැති අපේක්ෂකයින් බොහෝ අවස්ථාවල දී තම ආරක්ෂාව සඳහා ආධාරකරුවන් හෝ පෞද්ගලික ආරක්ෂකයින් ඒ සඳහා යොදවා ගන්නා බව පෙනීයන කරුණකි. මැතිවරණ ප්‍රචාරණ කටයුතු උග්‍ර වන අවස්ථාවල දී අපේක්ෂකයින් අතර ඇතිවන ගැටුම්වලට මෙම ආරක්ෂක කණ්ඩායම් ද සම්බන්ධ වූ අවස්ථා පිළිබඳව මැතිවරණ අවස්ථාවල දී මාධ්‍ය මගින් කරුණු හෙළි වී තිබේ. මෙවැනි විශාල ආරක්ෂකයින් පිරිසක් සමග මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට වර්තමානයේ අපේක්ෂකයින් පෙළඹී සිටින නිසා, සමහර සමාජයේ නම ගිය අපරාධකරුවන් පවා ආරක්ෂකයින් වශයෙන් සේවයේ යොදාගන්නා බවට තොරතුරු මැතිවරණ අවස්ථාවල දී යම් යම් ප්‍රවෘත්ති මගින් දැකිය හැකිය. මෙම තත්ත්වය සාමාකාමී ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා එක් අතකින් බාධාවකි. මෙවැනි පිරිස් තම අපේක්ෂකයාගේ ආරක්ෂාව සඳහා පමණක් නොව අනවසර මැතිවරණ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම ආදී කටයුතුවලට පවා මැදිහත්වන බැවින්, මොවුන්ගේ කටයුතු නිසා ප්‍රචණ්ඩකාරී සිද්ධීන් පවා ඇතිවේ.

478. ආරක්ෂාව ඉල්ලා සිටින අපේක්ෂකයින්ට පොලිසිය මගින් ආරක්ෂාව සැපයීමේ සාධාරණ වැඩපිළිවෙලක් ඡන්ද විමසීම් කාලය තුළ පවත්වාගෙන යා හැකි නම් එය තරමක් දුරට හෝ ප්‍රචාරණ කටයුතුවල දී ප්‍රචණ්ඩ ක්‍රියා අඩුවීමට හේතුවිය හැකිය.

තැපෑලෙන් ඡන්දය දීම

479. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන සෑම ඡන්ද විමසීමක දී ම අදාළ ඡන්ද විමසීම් නීතිය අනුව යම් පිරිසක් තැපෑලෙන් ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබනු ඇත. මෙම ගණයට ප්‍රධාන වශයෙන් අයත් වන්නේ මැතිවරණ කටයුතු සඳහා තෝරා ගැනීමට අපේක්ෂිත කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා පොලිසිය ඇතුළු ආරක්ෂක අංශවල නිලධාරීන්ය. ඊට අමතරව පොදු ප්‍රවාහන සේවා, තැපැල් හා රාජ්‍ය අංශයේ විදුලි සංදේශ සේවාවන්හි නිරත වන අයටද එම පහසුව ලැබේ.

480. ඡන්ද විමසීම වෙනුවෙන් නාමයෝජනා දැන්වීම් පළ කිරීමෙන් අනතුරුව ඡන්ද ගණන් කිරීමේ කටයුතු අවසන්වන තෙක්ම තැපැල් ඡන්දදායකයින්ගේ පහසුකම් වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට තේරීම්භාර නිලධාරීන්ට සිදුවේ. තැපැල් ඡන්ද ක්‍රියාවලියේ දී තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ට ද විශාල වගකීමක් පැවරේ. එසේම නාමයෝජනා කාලය ආරම්භ වූ විගසම තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ඡන්දහිමියන්ට, ඡන්දහිමි නාමලේඛනයේ සිය ලියාපදිංචි විස්තර සොයා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සැලසිය යුතුය.

481. තැපෑලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් ඉල්ලා සිටින අයකුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේපවීමට හේතුවන කරුණු කීපයක් ඇත. එහි ඇතුළත් වන ඡන්දදායකයාගේ ලියාපදිංචි විස්තරවල අඩුපාඩු, අයදුම්පත් සහතික කිරීමේ අඩුපාඩු මෙන්ම, අයදුම්පතෙහි අයදුම්කරුගේ අත්සන නොමැති වීම ආදී කරුණු ඉන් ප්‍රධාන වේ. එසේම තැපැල් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමෙන් අනතුරුව තම සහතික කිරීමේ නිලධාරියා මගින් තේරීම්භාර නිලධාරී වෙත ඒවා ඉදිරිපත් කිරීමේදී ඇතිවන අඩුපාඩු ද තැපැල් ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේපවීමට හේතු වනු ඇත. මේ නිසා සාමාන්‍ය ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේපවීමට ඇති ඉඩකඩට වඩා වැඩි ඉඩක්, තැපැල් ඡන්දදායකයින්ගේ ඉල්ලීමක් හා එම අයගේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප වීමට ඇති බව කිව හැකිය. අංක 10 දරන සංඛ්‍යා සටහනෙහි මෙවර පළාත් සභා ඡන්ද විමසීමේ දී ලැබුණු තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව, ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව සහ ඒවා ප්‍රතික්ෂේප වීමට හේතු වූ කරුණු යටතේ ද දක්වා ඇත. ඒ අනුව ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව, ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන් 20.63% ක් වී ඇත. ප්‍රතික්ෂේප වූ මුළු අයදුම්පත් සංඛ්‍යාව 87,409 ක් වූ අතර, ඉන් වැඩි සංඛ්‍යාවක් ඒවායේ තොරතුරු වැරදි සහගත වීම නිසා සහ අයදුම්පත් නියමිත කාල සීමාව තුළ තේරීම්භාර නිලධාරීන් වෙත නොලැබීම නිසා ප්‍රතික්ෂේප වී ඇත. මෙම හේතූන් දෙක යටතේ මුළු ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාවෙන් 81.28% ක් ම ප්‍රතික්ෂේප වී ඇත.

482. ඡන්ද විමසීමක දී තැපෑලෙන් ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලබන ඡන්දහිමියන් රාජ්‍ය අංශයේ රැකියාවල නියුතු වූවන් බැවින්, සාමාන්‍යයෙන්

අනෙකුත් ඡන්දහිමියන්ට වඩා ඔවුන්ගේ දැනුම ඉහළ මට්ටමක තිබෙන බව පිළිගත යුතුය. එහෙත් තැපැල් ඡන්දය ඉල්ලුම් කිරීමේදී ඔවුන් විසින් ඉදිරිපත් කළ අයදුම්පත්වල අඩුපාඩු හා නියමිත ආකාරයට ඡන්දය පාවිච්චි කර අදාළ ඡන්ද පත්‍රිකාව, සහතික කරන ලද අනන්‍යතා පත්‍රය සමග නියමිත කාලය තුළ අදාළ තේරීම්භාර නිලධාරීන්ට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා ප්‍රතික්ෂේප වීමේ ප්‍රතිශතය තවදුරටත් ඉහළ මට්ටමක පවතී. මෙම තත්ත්වය මගහරවා ගැනීමට තැපැල් ඡන්ද හිමිකම් ලබන පිරිස මෙන්ම තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් දැනුවත් කොට අදාළ ක්‍රියාදාමය නැවත සාමාලෝචනය කර එහි ඇති අඩුපාඩු අවම කිරීමට පියවර ගැනීම අවශ්‍යතාවකි.

483. තැපැල් ඡන්ද භාවිතා කිරීමේදී සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්ය ස්ථාන නියෝජනය කිරීම සඳහා, ඡන්ද විමසීම තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට නියෝජිතයින් දෙදෙනෙකු බැගින් පත් කිරීමට 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතින් ඉඩ සලසන ලදී. මෙම නීතිමය ප්‍රතිපාදනය එතරම් ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කිරීම අසීරු කරුණක් වී තිබේ. ඊට හේතුව තැපැල් ඡන්දදායකයාගේ සේවා ස්ථානය, එම අය ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචිව සිටින දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටා ඇති විට, අදාළ දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කරනු ලබන පක්ෂවලට හෝ ස්වාධීන කණ්ඩායම්වලට අදාළ දිස්ත්‍රික්කයෙන් පිටත, දුරබැහැර පිහිටි සේවා ස්ථානවලට තම නියෝජිතයින් පත්කර යැවීමේ අසීරුතාවයයි. කෙසේ වුව ද එවැනි සේවා ස්ථාන පිහිටි දිස්ත්‍රික්ක සඳහා තරග කරනු ලබන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් කුමන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් නියෝජිතයින් පැමිණීමට ඉඩ ඇති නිසා, අදාළ තැපැල් ඡන්ද සලකුණු කිරීමේ ස්ථානවල කටයුතු යම් නියෝජිත කණ්ඩායමකගේ නිරීක්ෂණය යටතේ සිදුවන බවට සැහීමට පත් විය හැකිය. එහෙත්, සාමාන්‍යයෙන් උතුරු නැගෙනහිර පළාත්වල ආරක්ෂක අංශවල හා පොලිස් ස්ථානවල බොහෝ විට වෙනත් පළාත්වල ලියාපදිංචි ඡන්දදායකයන් සේවය කරන බැවින්, එම කාර්ය ස්ථාන පිහිටි ප්‍රදේශවල ඡන්ද විමසීම් තරග කරන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයින් එම කාර්ය ස්ථාන වලට පැමිණීම අදාළ දිනවල දී සිදු නොවීමට බොහෝවිට ඉඩ තිබේ. තව ද ආරක්ෂක අංශවල පවත්නා විශේෂ රැකියා තත්ත්වයන් මත, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රකාශිත දින දෙකේ දී එම ප්‍රදේශවල ආරක්ෂක අංශවල තැපැල් ඡන්දදායකයන්ට, සිය තැපැල් ඡන්ද සලකුණු කිරීම අවසන් කිරීමට නොහැකි තත්ත්වයක් ද පවතී. මේ නිසා බොහෝ විට නියෝජිතයන් ද නොමැතිව විටින් විට තැපැල් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම, එබඳු සේවා ස්ථානවල දී සිදුවීමට ඉඩ ඇත.

484. තැපැල් ඡන්ද ක්‍රියාවලියේ පවත්නා මෙම තත්ත්වයට පිළියමක් ලෙස, මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන දින දෙක තුළ පමණක් ඡන්ද පත්‍රිකා සලකුණු කොට, ඉතිරි වන තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු පැකට්ටු, ඉක්මනින් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට භාර දීමට පසුගිය පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල දී අවශ්‍ය උපදෙස්, සහතික කිරීමේ නිලධාරීන්ට දී තිබිණි. එසේ භාර ගන්නා ලද තැපැල් ඡන්ද පත්‍රිකා, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී ඡන්ද විමසීමට පෙර දිනයක, අදාළ සේවා ස්ථානවල තැපැල් ඡන්දදායකයින් ලවා සලකුණු කරවීමට අවස්ථාව ලබා දෙන ලද අතර, ඒවා අප්‍රමාදව රක්ෂණ තැපෑලෙන් අදාළ තේරීම්භාර නිලධාරීන්ට යොමු කිරීමේ වගකීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට පවරා තිබිණි.

485. ඉහත ආකාරයට අදාළ දින දෙකෙහි දී සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද පත්‍රිකා, එම තැපැල් ඡන්දදායකයින්ට සලකුණු කිරීම සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී අවස්ථාව සැලසීමට, විශේෂයෙන්, දිවයිනේ එක් දිනක පැවැත්වෙන ඡන්ද විමසීමක දී ක්‍රියාත්මක කිරීම අසීරුවනු ඇත.

මැතිවරණ ප්‍රචාරණ කටයුතු

486. පළාත් සභා ඡන්ද විමසීම් නීතිය අනුව අපේක්ෂකයන්ගේ ජයග්‍රහණය සඳහා ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම, පෙරහැරවල් පැවැත්වීම, ඡන්ද විමසීමට අදාළ ප්‍රචාර පත්‍රිකා මුද්‍රණය හා බෙදා හැරීම, දැන්වීම් ප්‍රදර්ශනය හා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ඡන්ද කාර්යාල පවත්වාගෙන යාම ආදී කරුණු සම්බන්ධව යම් යම් සීමාවන් යටතේ ඡන්ද විමසීම තරග කරනු ලබන දේශපාලන පක්ෂ වලට හා ස්වාධීන කණ්ඩායම්වලට අවකාශය ලබා දී ඇත. එසේම වර්තමානයේ නවීන මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ක්‍රම භාවිතා කරමින් ඡන්ද විමසීම් අවස්ථාවල දී සිදු කෙරෙන සමහර ආකාරයේ ප්‍රචාරණ ක්‍රියාවන්, වර්තමාන මැතිවරණ නීති ප්‍රතිපාදන මගින් ආවරණය වී නොමැති බව ද පෙනී යන කරුණකි.

487. මැතිවරණ ප්‍රචාරණ කටයුතු හා මැතිවරණ වැරදි, මැතිවරණ දූෂණ ක්‍රියා යනාදිය සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් විසින් ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධව සෑම ඡන්ද විමසීම් අවස්ථාවක දී ම පොලිස්පතිවරයා විසින් පොලිස් නිලධාරීන්ට ලිඛිත උපදෙස් නිකුත් කරනු ලැබේ. මැතිවරණ කොමසාරිස්වරයා, තේරීම්භාර නිලධාරීන් හෝ තරග කරනු ලබන පාර්ශ්වයක් විසින්

මැතිවරණ ප්‍රචාරණයට අදාළ පැමිණිල්ලක් පොලිසිය වෙත යොමු කළ හොත් ඒ පිළිබඳව සොයා බලා අප්‍රමාදව සුදුසු පියවර ගැනීම පොලිසියෙන් අපේක්ෂා කෙරේ.

488. ඡන්ද විමසීම් කාලය තුළ දී පොලිසියට පැවරී ඇති සාමාන්‍ය රාජකාරී කටයුතු මෙන්ම නීතිය හා සාමය ආරක්ෂා කිරීමත්, මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල යෙදෙන පිරිස්වලට ආරක්ෂාව සැලසීමටත් සිදුවේ. එසේම මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් මාස 2 ක පමණ කාලයක් තුළ විවිධ රැස්වීම් සහ ප්‍රචාරණ වැඩපිළිවෙලට සම්බන්ධවන මහජන නියෝජිතයින්ට හා අපේක්ෂකයින්ට ද, ආරක්ෂාව සැලසීම ද පොලිසිය විසින් සිදු කළ යුතුය. පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මැති ඇමතිවරුන්ට මෙන්ම පළාත් සභා ඡන්ද විමසීමට ඉදිරිපත්ව ඇති අපේක්ෂකයින්ට ද පොලිසිය විසින් විශේෂ ආරක්ෂිත වැඩ පිළිවෙල යටතේ ආරක්ෂාව සපයනු ඇත. මෙවැනි වාතාවරණයක් තුළ මැතිවරණ සමයක දී ඊට අදාළ නීති කඩකරන අවස්ථාවල් සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් දී ක්ෂණිකව ක්‍රියා කිරීම කෙරෙහි යම් යම් බාධා එල්ල වෙන බව පෙනේ.

රජයේ දේපළ දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් භාවිතා කිරීම

489. මැතිවරණ කාල පරිච්ඡේදය තුළ දී, රජයට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්, පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයෙකුගේ තෝරා ගැනීම ප්‍රවර්ධනයට හෝ වළක්වාලීමට හේතුවන අයුරින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාවට/ මැතිවරණ කොමසාරිස්වරයාට ඇත.

490. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් පැවති අවස්ථාවල දී, මේ ආකාරයට රාජ්‍ය දේපල භාවිතා කිරීම සම්බන්ධව ලැබුණු පැමිණිලි හා ඒ සම්බන්ධව මැතිවරණ කොමසාරිස්වරයා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් වෙනත් පරිච්ඡේදයක දක්වා ඇත. එම පැමිණිලිවලින් සත්‍ය බවට මැතිවරණ දෙපාර්තමේන්තුවට හෙළි වූ ප්‍රධාන පැමිණිලි ද මෙම වාර්තාවේ අදාළ දිස්ත්‍රික්ක අනුව දක්වා ඇත. රජයේ වාහන හා ගොඩනැගිලි අනිසි ලෙස මැතිවරණ කටයුතු වෙනුවෙන් භාවිතා කිරීම, රජයේ සේවකයින් සමහර පක්ෂ විසින්, ඔවුන්ගේ රාජකාරී කාලය තුළදී ම මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට යොදවා ගැනීම, රාජ්‍ය උත්සව අපේක්ෂකයින්ගේ ජයග්‍රහණ වෙනුවෙන් සංවිධානය කිරීම, නිලධාරීන් ලවා ඡන්දදායකයන්ට නොයෙකුත් බලපෑම් කිරීම ආදී කටයුතු පිළිබඳ පැමිණිලි, මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් වූ අතර, ඒවා පිළිබඳව අදාළ පාර්ශ්වයන්ට දන්වමින් සුදුසු මගපෙන්වීම් කර, එවැනි කටයුතු වළකාලීමට ද ක්‍රියා කර ඇත.

491. ඉහත ආකාරයේ, රාජ්‍ය දේපළ දේශපාලන පක්ෂ විසින් සිය මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් යොදවා ගැනීම ඉතා සූක්ෂ්ම ලෙස දේශපාලන බලය මත සිදු කිරීම, සමහර රාජ්‍ය නිලධාරීන්ගේ අනුග්‍රහය මත එවැනි දෑ සිදු වීම හා නීතිය ක්‍රියාත්මක කරන සමහර පොලිස් නිලධාරීන්ගේ අනුදැනුම හා ආරක්ෂාව තුළ එවැනි දෑ සිදු කිරීමත් නිසා, මෙවැනි ක්‍රියා වළක්වාලීමට හා නතර කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගන්නා ලද උත්සාහයන් මුළුමනින්ම සාර්ථක වූ බව කිව නොහැකිය. මෙවැනි පැමිණිලි ලද අවස්ථාවල, ඒවා ගැන තොරතුරු ලබා දෙන ලෙස හෝ, එවැනි ක්‍රියා වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පොලිසිය හා අදාළ වෙනත් නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කළ ද, මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස්, සතුටුදායක මට්ටමින් ඇතැම් අවස්ථාවල ක්‍රියාත්මක වූ බවක් හෙළි නොවිණි. මෙවැනි අවස්ථාවල දී පොලිස් නිලධාරීන් සමග කටයුතු කළ වෙනත් දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙන්ම මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට ද යම් යම් අපහසුතාවලට මුහුණ පෑමට ද සිදුවිය. එවැනි අවස්ථාවල දී සමහර පොලිස් නිලධාරීන්ගේ සහාය අප දෙපාර්තමේන්තු නිලධාරීන්ට නොලැබුණා පමණක් නොව, සමහර දේශපාලන පක්ෂවල අපේක්ෂකයින් මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට එරෙහිව මෙවැනි සිද්ධීන්ට අදාළව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ද පෙළඹිණි.

492. මෙවැනි අවස්ථා කිහිපයක දී මැතිවරණ නිලධාරීන්ට එරෙහි පැමිණිලි අධිකරණයට ඉදිරිපත් කිරීමට පොලිසිය ක්‍රියා කර ඇති අතර එකී අවස්ථාවල දී මැතිවරණ නිලධාරීන්ට රජයේ නීතිඥ සහාය නොලැබීම නිසා පෞද්ගලික විසඳුමින් නීතිඥ සහාය ලබා ගැනීමට සිදුවීම කණගාටුවට කරුණකි. මේ අවස්ථාවල දී සුහසාධක සංගම් හා සහෝදර නිලධාරීන්ගේ සහාය නොලදහොත් එවැනි නිලධාරීන්ට මානසික පීඩාවට අමතරව ආර්ථික පීඩාවකට ද ලක්වීමට සිදු වේ. මෙවැනි අවස්ථාවලදී මැතිවරණ නිලධාරීන්ට නිසි ආරක්ෂාව හා නීතිඥ සහාය ලබා දීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැකසීමට අත්‍යාවශ්‍ය කරුණකි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ද පියවර ගනිමින් තිබේ.

493. මෙවැනි සිද්ධීන් සම්බන්ධව ඡන්ද විමසීම් කාලය තුළ පැමිණිලි භාර ගැනීම සඳහා විශේෂ ස්ථාන ද

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ආශ්‍රිතව මෙන් ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි ස්ථාන වල ද, පිහිටුවා තිබුණු අතර, එම ස්ථානවලට ද ඉහත ආකාරයේ පැමිණිලි ලැබී ඇත.

494. දැනට ඡන්ද විමසීම් අවස්ථාවල දී රාජ්‍ය දේපළ භාරකරුවන් වන, අමාත්‍යාංශ ලේකම්වරුන්ට, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්ට, රාජ්‍ය සංස්ථා ප්‍රධානීන්ට හා පොලිස් හා ආරක්ෂක අංශ ප්‍රධානීන්ට හා අනිකුත් රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට ද සිය භාරයේ ඇති රාජ්‍ය දේපළ ඉහත සඳහන් ආකාරයේ අනිසි හා නීති විරෝධී අන්දමින් භාවිතා කිරීම තහනම් කරමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැන්වීම් කරනු ලැබේ. මෙවැනි රජයේ දේපළ අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධව මැතිවරණ අවස්ථාවල දී මැතිවරණ කොමසාරිස්වරයාට හා තේරීම්භාර නිලධාරීන්ට ලැබෙන පැමිණිලි සම්බන්ධව, අවශ්‍ය උපදෙස් ද, සමග ඒවා පොලිස්පතිවරයාට හෝ දේපළ භාරකාරත්වය උසුලන අයට ගත යුතු ක්‍රියා මාර්ගය ද සමග දන්වා යවනු ලැබේ.

495. ඉහත ආකාරයයේ දැනුම් දීම් මගින් මැතිවරණ දෙපාර්තමේන්තුවට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම අසීරු වී ඇති බව පැහැදිලිව පෙනේ. ඊට ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇති බව කිව හැකිය.

අ. දේපළ භාරව සිටින බොහෝ රාජ්‍ය නිලධාරීන්, මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් නොතකා රජයේ පාලන බලය හිමි දේශපාලන පක්ෂය නියෝජනය කරන මහජන නියෝජිතයින්ට නීතියෙන් රිංගා ගොස් රාජ්‍ය දේපල භාවිතා කිරීමට ඉඩ ලැබෙන අයුරින් නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම.

ආ. ප්‍රාදේශීය මට්ටමේ පොලිස් නිලධාරීන් බොහෝ විට, පාලක දේශපාලන පක්ෂවල අපේක්ෂකයින්ගේ මැතිවරණ නීති කඩකිරීම් පිළිබඳව නීතියට අනුව ක්‍රියා නොකිරීම.

ඇ. බොහෝ රජයේ නිලධාරීන් හා පොලිස් නිලධාරීන් මෙසේ රාජ්‍ය දේපළ අනිසි ලෙස යොදා ගන්නා අවස්ථා මැඩලීමට බියක් දැක්වීම හා ඒ වෙනුවෙන් රාජකාරී ඉටු කිරීමෙන් මගහැර සිටීම.

496. රජයේ දේපල මෙසේ ඡන්ද විමසීම් අවස්ථාවල දී දේශපාලන පක්ෂවලට හා ඒවායේ අපේක්ෂකයින්ට භාවිතා කිරීමට හැකි ආකාරයේ ඉඩකඩක් වර්තමානයේ ඇති වී තිබෙන බව නිරීක්ෂණය වේ. මෙරට ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා ඡන්ද විමසීම හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ද පවත්වා නියෝජිතයින් තෝරා ගැනේ. මින් එක් ඡන්ද විමසීමක් පැවැත්වෙන විට අනෙකුත් මහජන නියෝජන ආයතනවල, යම්කිසි දේශපාලන පක්ෂයක් බලය තහවුරු කරගෙන සිටී. ඔවුන්, ඡන්ද විමසීමකට තම පක්ෂය නියෝජනය කරමින් ඉදිරිපත්ව ඇති අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය වෙනුවෙන්, තමා තනතුර දරන, මහජන නියෝජිත ආයතනයේ දේපල හා තමා වෙත ඇති වරප්‍රසාද භාවිතා කරමින්, මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට සහාය දක්වයි. මේ නිසා රාජ්‍ය පාලන බලය හිමි දේශපාලන පක්ෂයට හා එහි අපේක්ෂකයින්ට වෙනත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයින්ට නොමැති අනිසි බලයක් හා ආරක්ෂාවක් ඡන්ද විමසීම් අවස්ථාවල දී ලැබේ. මේ නිසා ඡන්ද විමසීමට ඉදිරිපත්වන සියලු පක්ෂවලට හා අපේක්ෂකයින්ට ඡන්ද විමසීම්වල දී සම තරග අවස්ථාවක් උදා නොවන බව ද පෙනී යන කරුණකි. මෙම කරුණ වර්තමානයේ දේශපාලන පක්ෂවල හා වෙනත් විවිධ පාර්ශ්වවල කණස්සල්ලට හේතුවී ඇති කරුණකි.එමෙන්ම ජනතාවගේ වියදමින් සිය දේශපාලන කටයුතු කරන දේශපාලන පක්ෂ, මේ පිළිබඳව සැලකීමක් නොකරන බව පෙනේ. මේ නිසා කඩින් කඩ ඡන්ද විමසීම් පැවැත්වීම, ඡන්දදායකයාට පාලන කටයුතුවලට සහභාගී වීම සඳහා ලැබෙන අවස්ථාවකට වඩා, බලයේ සිටින දේශපාලන පක්ෂවල බලය විවිධ දේශපාලන තලවල දී තවදුරටත් වර්ධනය කිරීමට භාවිතා වන දේශපාලන උපක්‍රමයක් ලෙස පෙනී යයි.

මැතිවරණ නීති බලාත්මක කිරීම

497. පළාත් සභා ඡන්ද විමසීමට අදාළ නීතිමය ප්‍රතිපාදන, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද 1987 අංක 42 දරන පළාත් සභා පනතේ ද, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ ද ඇතුළත් වේ. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 126 වන වගන්තිය අනුව, එම පනත යටතේ ඡන්ද විමසීම පැවැත්වීම පරිපාලනය කිරීම ද, පනතින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම ද මැතිවරණ කොමසාරිස්වරයා විසින් කළ යුතුය.

498. දහහත් වන හා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අනුව මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවන තෙක්, එම සභාවට අදාළ බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම මැතිවරණ කොමසාරිස්වරයාට පැවරේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාව අනුව, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් හා ජනමත විචාරණ පැවැත්වීම කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ ව්‍යවස්ථාවේ, මැතිවරණ කොමිෂන් සභාවේ බලතල කාර්ය සහ කර්තව්‍යය පැහැදිලි ලෙස දක්වා ඇත. යම් ඡන්ද විමසීමක් හෝ

ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීම කොමිෂන් සභාවේ කාර්යභාරය විය යුතු අතර, එසේ නීති බලාත්මක කිරීම වෙනුවෙන් කොමිෂන් සභාවට සහයෝගය දැක්වීම එම නීති බලාත්මක කිරීම භාරව සිටින රජයේ බලධාරීන්ගේ කාර්යක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවේ දැක්වේ.

499. මැතිවරණ කොමිෂන් සභාවට ඡන්ද විමසීම් අවස්ථාවක දී පොලිසිය යොදා ගැනීමට ඇති බලතල ද, කොමිසම විසින් දැනුම් දෙන පරිදි ඉල්ලා සිටින ආකාරයට පොලිස්පතිවරයා විසින් සපයනු ලබන පොලිස් නිලධාරීන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්සහගත ලෙස යොදා ගත යුතු බව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ ව්‍යවස්ථාවේ සඳහන් වේ. එසේ යොදවා ගනු ලබන සෑම පොලිස් නිලධාරියෙකුම පැවරුණු රාජකාරී ඉටු කිරීමේ දී, මැතිවරණ කොමිෂන් සභාවට වගකීමට බැඳී සිටින අතර, ඔවුන් එහි විධානයට හා පාලනයට ද යටත් වේ.

500. ඉහත සඳහන් නීතිමය ප්‍රතිපාදන අනුව, මෙරට නීතිගත වී ඇති පළාත් සභා ඡන්ද විමසීම් නීතිය බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇති මැතිවරණ කොමසාරිස්වරයා, පොලිස්පතිවරයා සහ රජයේ බලධාරීන් නිදහස් හා සාධාරණ ලෙස ඡන්ද විමසීම පැවැත්වීම වෙනුවෙන් කැපවී කටයුතු කළ යුතු වේ.

501. ඡන්ද විමසීම් කාලයක් සාමාන්‍යයෙන් සති 6 කට හෝ 8 කට පමණ කාලයකට සීමා වේ. ඡන්ද විමසීම් නීතිය බලාත්මක කිරීමට වගකීම් පැවරී ඇති අංශ විසින් එම කාලය තුළ අදාළ නීතිය ක්‍රියාත්මක කර, ඡන්දදායකයාට මෙන්ම අනෙකුත් අදාළ පාර්ශ්වවලට ද සාධාරණය ඉටු නොකරන්නේ නම්, නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම වෙනුවෙන් ඔවුන්ට පැවරී ඇති වගකීම ඉටු නොවනු ඇත. මැතිවරණ කොමසාරිස්වරයා ද, රජයේ බලධාරීන් ද, පොලිසිය ද මෙම නීති බලාත්මක කිරීම සිදු කළ යුත්තේ රටෙහි පවත්නා සාමාන්‍ය පරිපාලන යාන්ත්‍රණයන් ඔස්සේ පමණි. මැතිවරණ සමයක දී එසේ පවත්නා සාමාන්‍ය පරිපාලන රටාවට අනුගතවී මැතිවරණ නීති ක්‍රියාත්මක කිරීමට යාමෙන් සිදුවන ප්‍රමාදය හේතුවෙන්, යම් යම් පාර්ශ්වයන්ට අසාධාරණයන්ට මුහුණ දීමට සිදුවීම නොවැලැක්විය හැකිය. ඡන්ද විමසීම් අවස්ථාවල දී නීති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ දී බලධාරීන් වගකීම් පැහැර හැරීම නිසා සමහර දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින්ට සිදුවන අපහසුතා සහ අසාධාරණකම් පිළිබඳව මැතිවරණ දෙපාර්තමේන්තුවට මෙවර ඡන්ද විමසීම් අවස්ථාවේදී පැමිණිලි ලැබී ඇත.

502. ඡන්ද විමසීම් අවස්ථාවක අප්‍රමාදව මැතිවරණ නීතිය ක්‍රියාත්මක කළ යුතු බලධාරීන් නිසි වේලාවට සහ නිසි ආකාරයට තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් නොවන වාතාවරණයකදී මැතිවරණයකට ඉදිරිපත්වන සෑම පාර්ශ්වයකටම නීතියෙන් ලබා දී ඇති සම හා සාධාරණ අවස්ථාව ලැබේ දැයි සැක සහිතය.

503. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ ව්‍යවස්ථාව අනුව මැතිවරණ කාලය තුළ, සෑම පොලිස් නිලධාරියෙකුට ම පැවරුණු රාජකාරී ඉටු කිරීමේ දී, මැතිවරණ කොමිෂන් සභාවේ වගකීමට ඔවුන් බැඳී සිටින බැවින් හා එහි විධානයන්ට හා පාලනයට යටත් වන බැවින්, මැතිවරණ කොමසාරිස්වරයා මෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ද මැතිවරණ නීති ක්‍රියාත්මක කිරීම සඳහා, විශේෂයෙන් මෙම නීති උල්ලංඝනය වන අවස්ථාවල දී, යම් යම් පියවර ගැනීමට මෙවර ඡන්ද විමසීම් අවස්ථාවේදී පොලිස් නිලධාරීන්ට මෙන්ම, විවිධ මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ට ද උපදෙස් දී ඇත. දේශපාලන පක්ෂවල ලේකම්වරුන් මෙන්ම මැතිවරණ නිරීක්ෂණ ආයතන විසින් ද, සමහර අපේක්ෂකයින් මැතිවරණ නීති උල්ලංඝනය කරමින් කටයුතු කරන ආකාරය පිළිබඳව තේරීම්භාර නිලධාරීන්ට මෙන්ම මැතිවරණ කොමසාරිස්වරයාට ද පැමිණිලි ඉදිරිපත් කර තිබිණි. පොලිස් නිලධාරීන් බොහෝ අවස්ථාවල දී, නීති විරෝධී මැතිවරණ දැන්වීම් ඉවත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා කරන ලද දැනුම් දීම් අනුව, ක්‍රියාකර නොමැති බව, මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මාර්ගයෙන් වාර්තා ලබාගෙන, එම පොලිස් නිලධාරීන්ගේ රාජකාරී පැහැර හැරීම පිළිබඳව කරුණු මැතිවරණ කොමසාරිස්වරයා විසින් සනාථ කරගෙන තිබුණි. මේ අනුව පැහැදිලි වන්නේ, සෘජුවම මැතිවරණ කොමසාරිස්වරයා විසින් සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද සමහර උපදෙස්, ඇතැම් පොලිස් නිලධාරීන් විසින් පිළිගෙන කටයුතු කර නොමැති බවය.

504. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇතුළත් කරන ලද 155 ඊඊ ව්‍යවස්ථාව අනුව, පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් බලකායකට එරෙහිව ලැබෙන පැමිණිලි භාර ගැනීම සහ ඒ පිළිබඳව විමර්ශනය කිරීමට පොලිස් කොමිෂන් සභාවට බලය ලබාදිය යුතු අතර, එසේ පැමිණිලි භාර ගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි වේ. මේ ආකාරයට සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු වේ. ඒ ආකාරයට ක්‍රියා කිරීම මැතිවරණ

කාලය තුළ පොලිස් නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු රාජකාරි නියමාකාරයෙන් ඉටුකරවා ගැනීමට පිටිවහලක් විය හැකිය.

505. මෙම පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවල දී පොලිස්පතිවරයා ඡන්ද විමසීම්වලට අදාළ රාජකාරී ඉටු කිරීම සඳහා උපදෙස් මාලාවක් සෑම පොලිස් ස්ථානාධිපතිවරයෙකු වෙතම නිකුත් කර තිබූ අතර, ඊට අමතරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ද එම නිලධාරීන් සඳහා බෙදා හැරීමට උපදෙස් මාලාවක් පොලිස්පතිවරයා වෙත ලබා දුනි. මෙවැනි තත්ත්වයක් යටතේ මැතිවරණ කටයුතු හා සම්බන්ධව පොලිස් නිලධාරීන්ට පැවරුණු රාජකාරී හා ඔවුන්ගේ වගකීම පිළිබඳව මෙරට මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු අනිකුත් ලේඛනවල පැහැදිලිව සටහන්වී තිබිය දී සහ ඒ පිළිබඳව පොලිස්පතිවරයා මෙන්ම මැතිවරණ කොමසාරිස්වරයා විසින් ද පොලිස් නිලධාරීන් දැනුවත් කර තිබිය දී දිගින් දිගටම මැතිවරණ නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ඔවුන් ක්‍රියා නොකර සිටීම මගින් මෙරට ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයට විශාල පහරක් එල්ල වී ඇත. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු අංශ නිහඬව සිටීම අප රටේ මැතිවරණ ක්‍රියාවලිය දුර්වල කිරීමට ද හේතු වී ඇත. මැතිවරණ රාජකාරි, රජයේ නිලධාරියකුට පැවරෙන විශේෂ රාජකාරියක් වන අතර, ඒවා ඔවුන් විසින් නිසි පරිදි ඉටු කිරීම රටෙහි මැතිවරණයක් නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වීමටත්, ඡන්දදායකයාගේ අයිතිය ආරක්ෂා වීමටත් හේතු වන බැවින් ඔවුන්ගේ වගකීම් නිසි ලෙස ඉටු නොවීම රටෙහි ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව දෙදරා යාමට ද මුල් වනු ඇත. එසේ රාජකාරි පැහැර හැරීම නිසා ජනතාවට ඡන්ද විමසීම් කෙරෙහි ඇති විශ්වාසය ද පළුදු වී යා හැකිය. එබැවින් මැතිවරණ සමයකදී පොලිස් නිලධාරීන් සහ පොලිස් බලකායන්ට පැවරුණු රාජකාරී ඉටු නොවීම සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා, පොලිස් කොමිෂන් සභාවට ඇති බලතල අනුව විශේෂ රීති මාලාවක් අදාළ බලධාරීන් ලවා සකස් කිරීමට පියවර ගැනීම සුදුසු වේ. ඒ සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ අදහස් ද ලබා ගැනීම ද සුදුසුය. එසේම සිය මැතිවරණ රාජකාරි නිසි ලෙස ඉටුනොකරන හා ඡන්ද විමසීම්වලට අදාළ කටයුතු මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් නොතකා දේශපාලන පක්ෂවලට වාසි සහගත වන අයුරින් කටයුතු කරන නිලධාරීන්ට අදාළව රාජ්‍ය නිලධාරීන්ගේ විනය කටයුතු භාර අංශවලට ක්‍රියා කිරීමට ඇති අවකාශය ශක්තිමත් කළ යුතු ය.

විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය භාවිතය

506. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනෙන ලද 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රජයට අයත් මාධ්‍ය ආයතන මගින් මැතිවරණ කාලයක දී යම් පක්ෂයකට හෝ අපේක්ෂකයෙකුට පක්ෂව හෝ අගතියක් ඇතිවන ආකාරයට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හෝ ප්‍රචාරණය කිරීම සිදු කරන්නේ නම්, එවැනි අවස්ථා වැලැක්වීම සඳහා මාධ්‍ය උපමාන පැනවීමටත්, ඒවා කඩවන විට, නිසි බලධරයකු මගින් නීතියේ සඳහන් ක්‍රියාමාර්ග ගැනීමටත් ඉඩ දී තිබුණි. එහෙත් එම බලතල, 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් සීමා කරන ලදී. ඒ අනුව සියලු මාධ්‍ය ආයතන වෙනුවෙන් මැතිවරණ සමයකදී උපමාන නිකුත් කිරීමට පමණක් ඉඩ ලබා දී ඇත. ඒවා පිළිපැදීමේ වගකීම අදාළ මාධ්‍ය ආයතනවලට පවරා ඇත.

507. ඉහත තත්ත්වය යටතේ මාධ්‍ය උපමාන කඩකිරීම සම්බන්ධව දේශපාලන පක්ෂවලින් හෝ වෙනත් අංශයකින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිල්ලක් ලැබුණ හොත්, ඒ පිළිබඳව සැලකිලිමත් වන ලෙස අදාළ ආයතනය වෙත සිහිපත් කිරීම පමණක් දැනට සිදු කෙරේ.

508. වර්තමානයේ ලොව පිළිගත් මාධ්‍ය නිදහසට අදාළ කරුණු ද, පවත්නා විවිධාකාර මාධ්‍ය භාවිතාවන් ද සැලකිමේදී, මැතිවරණ සමයකදී ඊට අදාළව පළ කරණු ලබන ප්‍රවෘත්ති හා වාර්තා වැඩසටහන් ආදිය නිරීක්ෂණය කොට ඒ පිළිබඳව නිගමන ලබාගෙන, මාධ්‍ය ආයතනවලට මග පෙන්වීම පවා බරපතල රාජකාරී කටයුත්තක් වනු ඇත. මෙවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සුදුසු යාන්ත්‍රණයක් මෙන්ම මානව සම්පත් ද මැතිවරණ දෙපාර්තුමේන්තුව සතුව නොමැති තත්ත්වයක් යටතේ, මාධ්‍ය උපමාන උල්ලංඝනය වන අවස්ථා ගැන ලැබෙන පැමිණිලි බලා ඒ පිළිබඳව අදාළ ආයතනවලට දැනුම් දීම පමණක් මැතිවරණ කොමසාරිස්වරයාට සිදු කළ හැකිය. මෙම හේතුව නිසා මාධ්‍ය ආයතනවල කටයුතුවලින් අසීරුතාවය පත්වන දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් වෙනුවෙන්, මැතිවරණ දෙපාර්තමේන්තුවට කළ හැකි මැදිහත් වීම ඉතා අවම මට්ටමක පවතී.

ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වන පිළිගත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල සහභාගීත්වය

509. 1978 වර්ෂයට පෙර මෙරට පැවති මැතිවරණ ක්‍රමය යටතේ, පාර්ලිමේන්තු මැතිවරණය හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ද මඟින්, ඒකල ඡන්ද කොට්ඨාස පදනම් කරගෙන, වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් අපේක්ෂකයා තෝරා ගැනීමේ පදනම් මත නියෝජිතයින් තෝරා ගැනීම සිදු විය. සුළු ජාතීන්ගේ නියෝජනය අපේක්ෂාවෙන් පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස අතර බහුමන්ත්‍රී කොට්ඨාස සුළු සංඛ්‍යාවක්

පැවතිණි. එකල පැවති පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස 160, වර්තමාන කොට්ඨාස සමඟ සසඳා බැලීමේ දී පැරණි කොට්ඨාස ඉතා කුඩා ප්‍රමාණයේ ඒවා විය. එබැවින් ස්වාධීන අපේක්ෂකයින්ට ද සිය මැතිවරණ සංවිධාන කටයුතු පහසුවෙන් සිදු කොට පාර්ලිමේන්තුවට හෝ පළාත් පාලන ආයතනවලට තේරී පත් වීමේ අවස්ථාව හිමි විය. 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දෙන ලද නව මැතිවරණ නීතිය අනුව පිහිටුවන ලද පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස, විශාලත්වයෙන් වැඩි වූ අතර, ඒවා වෙනුවෙන් අපේක්ෂකයින් කණ්ඩායමක් වශයෙන් තරග කළ යුතු ය. ඉන්පසුව පිහිටුවන ලද පළාත් සභාවල, ඡන්ද විමසිම් බලප්‍රදේශය පරිපාලන දිස්ත්‍රික්ක තරමට විශාල වූ අතර, පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී, මුළු පළාත් පාලන බලප්‍රදේශයම එක් ඡන්ද විමසීම් බලප්‍රදේශයක් බවට පත්විය. ඒ හැරුණු කොට තවත් නවාංගද නව මැතිවරණ ක්‍රමයට ඇතුළත් විය. අදාළ අපේක්ෂක කණ්ඩායමට, පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ එසේ නොමැතිව ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින් තරග කිරීමට ඉඩ ලැබුණි. 1987 වර්ෂයේ හඳුන්වාදෙන ලද පළාත් සභා මඟින්, විමධ්‍යගත පාලන අධිකාරියක් වෙනුවෙන් මහජන නියෝජිතයින් තෝරා ගැනීමේ අවස්ථාව ඡන්දදායකයාට උදා වූ අතර, ඒවායේ බලතල බෙදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව සිදු විය.

510. පළාත් සභා, පළාත් මට්ටමේ සෑහෙන දුරට විමධ්‍යගත වූ බලතල හිමි, පළාත් ප්‍රඥප්ති පවා පැනවිය හැකි නව සංකීර්ණ පාලන රටාවකින් යුක්ත වන අතර, ඒවායේ පාලන බලය වෙනුවෙන් ඉදිරිපත් වන පිරිස්, තම දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති හා වැඩසටහන් ඉදිරිපත් කොට ඒ වෙනුවෙන් ඡන්ද විමසීම්වල දී ඡන්දදායකයින්ගෙන් පාලන වරම් ඉල්ලා සිටිති. මෙවැනි නියෝජිත ආයතනයක පාලනය සඳහා ඡන්ද විමසීමක් තරග කිරීමට නාමයෝජනා පත්‍රයක් ඉදිරිපත් කරන ස්වාධීන පුද්ගලයින් කණ්ඩායමකට වගකීම් පැවරීම කොතෙක් දුරට යෝග්‍ය වන්නේ දැයි කල්පනා කිරීම සුදුසු ය. කුඩා ප්‍රමාණයේ මැතිවරණ කොට්ඨාසයක් තරග කරන ලද ස්වාධීන අපේක්ෂකයකුට ජයග්‍රහණයෙන් පසු සිය කොට්ඨාසයේ ඡන්දදායකයින්ට වගකිව යුත්තකු හැටියට පාලන බලය හිමි පක්ෂයට හෝ ප්‍රධාන විරුද්ධ පක්ෂයට සම්බන්ධ වී පාර්ලිමේන්තුවේ කටයුතු කළ හැකි විය. වර්තමාන මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් නියෝජිතයින් පිරිසක් තේරී පත්වන බැවින්, ඔවුන් දේශපාලන පක්ෂයක් නියෝජනය කරන්නන් වුවද, ඡන්ද කොට්ඨාසයේ ඡන්දදායකයින්ට එතරම් බැඳීමක් නැත. මෙය වත්මන් සමානුපාත ක්‍රමයෙහි අඩුපාඩුවක් සේ බෙහෝ දෙනා දකී. මෙවැනි තත්ත්වයක් යටතේ ස්වාධීන කණ්ඩායමක් යටතේ තරග කරන අපේක්ෂකයකු පළාත් සභාවකට තේරී පත් වුවහොත් වත්මන් මැතිවරණ ක්‍රමය යටතේ කොට්ඨාසයේ ඡන්දදායකයින් සමඟ ඇති සබඳතාවය අඩු බැවින් තේරී පත්වන පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් විශේෂ සේවයක් ඔවුන්ගෙන් අපේක්ෂා කළ නොහැකි අතර, බොහෝ විට එවැන්නකු පාලන බලය හිමි වූ පක්ෂය සමඟ එක්ව ක්‍රියා කරනු ඇතැයි විශ්වාස කළ හැකි ය.

511. මෙවර පළාත් සභා ඡන්ද විමසීමේ දී, පළාත් 09 හි පරිපාලන දිස්ත්‍රික්ක 25 යටතේ තරග කළ ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව 214 ක් වූ අතර, ඉන් 55ක් නැගෙනහිර පළාතට අදාළ විය. ඉන් කණ්ඩායම් 21 ක් මඩකලපුව දිස්ත්‍රික්කයට ද, කණ්ඩායම් 18 ක් අම්පාර දිස්ත්‍රික්කයට ද, තවත් කණ්ඩායම් 16 ක් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට ද තරග කරන ලදී. ඊට අමතරව, කෑගල්ල, පුත්තලම හා කොළඹ යන දිස්ත්‍රික්කවලට ස්වාධීන කණ්ඩායම් 10 කට වැඩි සංඛ්‍යාවක් බැගින් තරග කරන ලදී. මෙවර තරග කළ සියලුම ස්වාධීන කණ්ඩායම් (214) ලබා ගත් මුළු ඡන්ද සංඛ්‍යාව 54,062 ක් වූ අතර, එය පළාත් 09 හි වලංගු මුළු ඡන්ද සංඛ්‍යාව වූ 9,158,279 න් සියයට 0.59 ක ප්‍රමාණය කි. කිසිදු කණ්ඩායමකින් එකඳු අපේක්ෂකයකු හෝ තේරී පත් නොවූ බැවින් සියලු කණ්ඩායම්වල ඇප මුදල් රාජසන්තක වී ඇත. සමහර දිස්ත්‍රික්කවල තරග කරන ලද ස්වාධීන කණ්ඩායම්වලට, ඔවුන්ගේ කණ්ඩායම්වල අපේක්ෂක සංඛ්‍යාවට සමාන වන තරමේ ඡන්ද සංඛ්‍යාවක් වත් ලබා ගැනීමට නොහැකි වී ඇත. එම කණ්ඩායම්වලට, මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්වාධීන කණ්ඩායම් 04 ක්ද, අම්පාර දිස්ත්‍රික්කයේ කණ්ඩායම් 08 ක්ද ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කණ්ඩායම් 04 ක්ද, මන්නාරම් දිස්ත්‍රික්කයේ කණ්ඩායම් 06 ක්ද, වවුනියාව දිස්ත්‍රික්කයේ එක් කණ්ඩායමක් ද අයත් වේ.

512. පළාත් සභා 09 හි ඡන්ද විමසීම් පැවැත්වෙන අවස්ථා වන විට පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව 64 ක් වූ අතර, ඉන් 35 ක් ඡන්ද විමසීමට ඉදිරිපත් වී සිටියහ. එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් තරග කළ අඩුම දේශපාලන පක්ෂ සංඛ්‍යාව වූ පක්ෂ 09 ක් බැගින්, අනුරාධපුර, පොළොන්නරුව සහ හම්බන්තොට යන පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් තරග කළ අතර, වැඩිම දේශපාලන පක්ෂ සංඛ්‍යාව වූ පක්ෂ 18 ක් තරග කරන ලද්දේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙනි. අංක 22 දරන සටහනෙහි එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව සහ එම පක්ෂ ලබා ගත් මුළු ඡන්ද සංඛ්‍යාව අනුව, ඡන්ද 500 ක් හෝ ඊට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පක්ෂ සංඛ්‍යාව වර්ග කර දක්වා ඇත. දිස්ත්‍රික්ක 16 ක් යටතේ තරග කරන ලද දේශපාලන පක්ෂ සංඛ්‍යාවෙන් අඩකට වැඩි සංඛ්‍යාවකට 500 ක් ඉක්මවා ඡන්ද සංඛ්‍යාවක්

හෝ ලබා ගත නොහැකිව ඇත. අංක 19 දරන සංඛ්‍යා සටහනෙහි, පළාත් සභා 09 හි මන්ත්‍රීධුර 437 හිමි වී ඇති දේශපාලන පක්ෂ නාමලේඛනය ද, එම පක්ෂ තරග කරන ලද දිස්ත්‍රික්කවල වලංගු ඡන්ද සංඛ්‍යාව හා එම සංඛ්‍යාවෙන් අදාළ පක්ෂ ලබා ගත් ඡන්ද ප්‍රතිශතය ද දක්වා ඇත. තවද, එම පක්ෂ තරග කරන ලද පළාත් සභා සංඛ්‍යාවත්, පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාවත් එම සටහනට ඇතුළත් කර ඇත. එක්සත් ජනතා නිදහස් සන්ධානය, එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ යන දේශපාලන පක්ෂ තුන, සියලුම දිස්ත්‍රික්ක සඳහා තරග කර ආසන සංඛ්‍යාවක් ද ලබා ගත් පක්ෂ විය. එක්සත් ජනතා නිදහස් සන්ධානයට හා එක්සත් ජාතික පක්ෂයට දිවයිනේ පරිපාලන දිස්ත්‍රික්කවල දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන්, 80% කට වැඩි සංඛ්‍යාවක් ලැබී ඇත. සමහර දේශපාලන පක්ෂවල, දිස්ත්‍රික්ක යටතේ තරග කරන ලද තම පක්ෂයේ අපේක්ෂක සඛ්‍යාවට සමාන හෝ ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන නැත. එවැනි දේශපාලන පක්ෂ 03 ක් අම්පාර දිස්ත්‍රික්කයෙන් ද, එකක් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් ද, 05 ක් කිලිනොච්චිය දිස්ත්‍රික්කයෙන් ද, 04 ක් බැගින් මන්නාරම හා වවුනියාව දිස්ත්‍රික්ක වලින් ද, 05 ක් මුලතිව් දිස්ත්‍රික්කයෙන් ද පක්ෂ 02 ක් මොණරාගල දිස්ත්‍රික්කයෙන් ද දැක ගත හැකි විය. මෙවර තරග කරන ලද දේශපාලන පක්ෂ 35 න් පක්ෂ 24 ක්ම ඡන්ද 7000 කට වඩා අඩු සංඛ්‍යාවක් වශයෙන් ලබා ගෙන ඇත.

513. ඉහත සඳහන් ආකාරයට පළාත් සභා වෙනුවෙන් තරග කළ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සියල්ල පළාත් සභා තුළ බලය ලබා ගැනීම සඳහා සත්‍යවාදී ලෙස තරග කරන ලද බව පිළිගත නොහැකි හේතු රාශියක් ඇත. දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්ද විමසීම් ක්‍රියාවලියේ විවිධ අවස්ථාවන් නිරීක්ෂණය කිරීම සඳහා නියෝජිතයින් පත් කිරීමට සම අවස්ථා ලබා දී ඇත. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම, තැපැල් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම, ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද පොළේ දී ඡන්දදායකයින් ඡන්දය පාවිච්චි කිරීම, ඡන්ද හා මනාප ගණන් කිරීම හා ප්‍රතිඵල සකස් කිරීම යන අවස්ථා නියෝජනය කිරීමට පක්ෂවලට හා කණ්ඩායම්වලට නියෝජිතයින් පත් කිරීමට ඉඩ දෙනු ලැබේ. ඡන්ද ගණන් කිරීමේ කාර්යය වෙනුවෙන් පක්ෂයකට හෝ කණ්ඩායමකට නියෝජිතයින් පස් දෙනෙකු බැගින් ද අනෙකුත් ඉහත සඳහන් සෑම අවස්ථාවක දීම නියෝජිතයින් දෙදෙනෙකු බැගින් ද පත් කිරීමට ඉඩ දේ. පිළිගත් දේශපාලන පක්ෂ අදාළ ස්ථානවලට පත්කිරීමට නීතියෙන් ඉඩ ඇති නියෝජිතයින් සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් සහභාගී කරවා ගැනීම සඳහා වෙනත් පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල නියෝජන අවස්ථාවන් ප්‍රයෝජනයට ගන්නා බව පෙනේ. මේ සඳහාම සමහර පිළිගත් දේශපාලන පක්ෂ විසින් වෙනත් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් තරග බිමට කැඳවා ගැනීම සිදු කරන බව පෙනේ. එවැනි පක්ෂ හෝ කණ්ඩායම් ඡන්ද විමසීම් කාලය තුළ ඔවුන්ගේ අදාළ පක්ෂය හෝ කණ්ඩායම ඡන්ද විමසීම ජයග්‍රහණය කරවා ගැනීම සඳහා කිසිදු උනන්දුවකින් කටයුතු නොකරයි.එසේ නාමිකව තරග කරන ලද සමහර පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙනත් පක්ෂයක අපේක්ෂකයිනගේ ජයග්‍රහණය වෙනුවෙන් ඡන්ද ප්‍රචාරණ කාර්යාල පවත්වාගෙන ගිය අවස්ථා පවා හෙළි වී තිබේ. මෙවැනි අනීතික ඡන්ද කාර්යාල පවත්වාගෙන යාම වැළැක්වීම සඳහා මැතිවරණ නිලධාරීන්ට හා පොලිසියට ඉමහත් වෙහෙසක් දැරීමට සිදු වේ.

514. මෙසේ පක්ෂ හා කණ්ඩායම් විශාල සංඛ්‍යාවක් තරග කිරීමේ හේතුවෙන් බෙහෝ දිස්ත්‍රික්කවල ඡන්ද පත්‍රිකාව සංකීර්ණ වීමටත්, ඡන්ද පත්‍රිකා විශාල වීමටත් හේතු වී තිබේ. සමහර ඡන්දදායකයින් ස්වධීන කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා ඡන්ද පත්‍රිකාවේ ඇතුළත් අංක, අපේක්ෂක අංක හැටියට වැරදි වැටහීමකින් ඒවා වෙනුවෙන් මනාප පාවිච්චි කිරීම නිසා ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප වීමද සිදු වන බව පෙනේ. ඡන්ද ගණන් කිරීමේ ශාලාවල, පක්ෂ හා කණ්ඩායම් නියෝජනය කරන විශාල නියෝජිත පිරිසකට ඉඩ කඩ සැපයීමට සිදු වීම නිසා ඡන්ද ගණන් කිරීමේ කටයුතු සංවිධානයේ දී ද ඉමහත් බාධාවන් ඇති වේ. මෙම තත්ත්වය නිසා බෙහෝ ගණන් කිරීමේ ශාලාවල නිලධාරී මණ්ඩලයට වඩා වැඩි සංඛ්‍යාවකින් යුත් නියෝජිතයින් සංඛ්‍යාවක් දක්නට ලැබේ. විශේෂයෙන්ම ඡන්ද ගණන් කිරීමේ කටයුතු වෙනුවෙන් ගණන් කිරීමේ නියෝජිතයින් වැඩි සංඛ්‍යාවක් යෙදවීමෙන් දේශපාලන පක්ෂ අපේක්ෂා කරනුයේ එම කටයුතු වඩාත් හොඳින් නිරීක්ෂණය කිරීම ය. තරග කරනු ලබන පක්ෂයක් නියෝජනය කරනු ලබන අපේක්ෂකයින් එකම පක්ෂයට අයත් වුවද, මනාප ලබා ගැනීම වෙනුවෙන් ඔවුන් අතර දැඩි තරගයක් පවතින බැවින් මන්ත්‍රී ධුර හිමි වූ පක්ෂවල අපේක්ෂකයින් සියලු දෙනාම මනාප ගණන් කිරීමේ අවස්ථාව කෙරෙහි විශාල උනන්දුවක් දක්වයි. මෙය බෙහෝ විට ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයින් වැඩි ප්‍රමාණයක් පත් කිරීමට පිළිගත් දේශපාලන පක්ෂ උනන්දු වීමට හේතු වේ. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ ඡන්ද විමසීම තරග කරන ලද දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් සමඟ පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් මෙම ගැටළුවට විසඳුමක් ලබා දීම සඳහා, මන්ත්‍රී ධුර හිමි වන පක්ෂවලට තම පක්ෂයේ අපේක්ෂකයන්ගේ මනාප ගණන් කරන අවස්ථාවේ ගණන් කිරීමේ ශාලාවලට අපේක්ෂකයින්ට ඇතුළු වීමට විශේෂ අවසරයක් ලබා දී තිබුණි.

515. ප්‍රජාතන්ත්‍රවාදී පාලන පිළිවෙතක් යටතේ ඡන්ද විමසීම තරග කරනු ලබන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව අසාධාරණ ලෙස සීමා කිරීමට නීති පැනවීම අසීරු වුවත්, මෙම ප්‍රශ්නයට පිළියමක් වශයෙන් ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් තැන්පත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණය ඉහළ දැමීමට ද සමහරු යෝජනා කරති. ඒ අනුව අධික ඇප මුදල් ප්‍රමාණයක් තැන්පත් කිරීමට අසීරු ස්වාධීන කණ්ඩායම් තරගයෙන් බැහැර වනු ඇතැයි විශ්වාස කෙරේ. එකම ඡන්ද විමසීමකට ඉදිරිපත්ව ඇති දේශපාලන පක්ෂයක්, එම තරගය අතරතුරදීම ප්‍රසිද්ධියේ වෙනත් පක්ෂයකට හෝ පක්ෂයක අපේක්ෂකයින් සඳහා සහයෝගය දක්වමින් ක්‍රියා කිරීම, ඉහත සඳහන් කරන ලද නාමිකව තරග කරනු ලබන සමහර පක්ෂවල පිළිවෙතක් වී තිබේ. මෙම ක්‍රියා පිළිවෙළ ඡන්ද විමසීම් කාලය තුළ විමර්ශනයකට භාජනය කිරීම හෝ නතර කිරීමට නීතිමය පියවර ගැනීම අසීරු කරුණක් වුවද මෙම තත්ත්වය හේතුවෙන් පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ දී පළාත් සභාවකට හෝ ඡන්දදායකයාට කිසිදු ප්‍රයෝජනයක් නොමැති අනර්ථකාරී මෙම කටයුතු වැළැක්වීම සඳහා ගත හැකි සුදුසු පියවර පිළිබඳව අදාළ පාර්ශව කල්පනාකාරී විය යුතු වැදගත් ය.

මැතිවරණ රාජකාරි, රාජ්‍ය නිලධාරීන් හා නිලධාරීන්ගේ දේශපාලන අයිතිවාසිකම්

516. ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා දින නියම කිරීමත් සමඟ එම ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල නිවේදනය කිරීම දක්වා වූ ක්‍රියාදාමයට අදාළ මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ රාජකාරි වගකීම් ඉටු කිරීම සඳහා සහාය වන්නේ රජයේ නිලධාරීන් ය. ඒ වෙනුවෙන් රාජ්‍ය සේවයේ සුළු සේවකයාගේ සිට අමාත්‍යාංශ ලේකම්වරයා දක්වා සියලුම සේවක පිරිස්වලට විවිධාකාර රාජකාරි පැවරේ. ඡන්ද විමසීම් නීතිය අනුව සියලු රාජකාරි කටයුතු මෙම නිලධාරීන් මඟින් නිම කරවා ගැනීමට, එම රාජකාරි හා ඡන්ද විමසීම් නීතිය පිළිබඳව ද ඔවුන් දැනුවත් කොට, අවශ්‍ය පුහුණුව ද ලබා දී ක්‍රියා කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට හා තේරීම්භාර නිලධාරීන්ට බලය ලැබී ඇත. රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතිමය ප්‍රතිපාදන මඟින් මෙම සියලුම නිලධාරීන්, අපක්ෂපාතී හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව සිය රාජකාරි ඉටු කොට වගකීම් ඉටු කිරීමට බැඳී සිටී.

517. රාජ්‍ය සේවයේ නිලධාරීන්ට යම් සීමාවන් ඇතුළත දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට නීතියෙන් ඉඩ දී ඇත. එහෙත් අධිකරණ නිලධාරීන්ට, සන්නද්ධ සේවාවල නිලධාරීන්ට හා පොලිස් නිලධාරීන්ට ද, සාම නිලධාරීන්ට ද දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම නැත. එබඳු අයට ඡන්ද විමසීම් අවස්ථාවක දී ඡන්දය පාවිච්චි කිරීමට පමණක් හැකියාව ඇත. මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එම දෙපාර්තමේන්තුවේ සේවය කරන තාක්කල් දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට නොහැකි අතර, ඡන්ද විමසීමක දී ඡන්දය පාවිච්චි කිරීමට පමණක් ඔවුන්ට හැකියාව තිබේ. රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියකුට දේශපාලන අයිතිවාසිකම් හිමි වන්නේ ඉහත සඳහන් ආකාරයේ ඡන්ද විමසීමක දී ඡන්දය පාවිච්චි කිරීමට අදාළව පමණි. අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ට හිමිවන දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයෙහි කරුණු දැක්වේ. දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධාරීන් මෙන්ම එම අයිතිවාසිකම් හිමි නොවන නිලධාරීන් ද මැතිවරණ රාජකාරී සඳහා යොදවා ගැනීමට මැතිවරණ දෙපාර්තමේන්තුවට සිදු වී තිබේ. මෙම සියලුම නිලධාරීන් මැතිවරණ නීතිය අනුව අපක්ෂපාතී ලෙස සිය රාජකාරි ඉටු කොට ඡන්ද විමසීම තරග කරනු ලබන පාර්ශ්වයන්ගේ සහ ඡන්දදායකයින්ගේ ද විශ්වාස තහවුරු වන ආකාරයට රාජකාරි වෙනුවෙන් මෙහෙයවීම ඉතා භාරදූර කටයුත්තක් බවට පත්ව ඇත.

518. පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවක දී, පළාත් සභා විසුරුවා හැර තිබුණ ද, රාජ්‍ය බලය හිමි දේශපාලන පක්ෂ විසින් පවත්වාගෙන යනු ලබන පාර්ලිමේන්තුවේ බලය හා වරප්‍රසාද භුක්ති විඳින මහජන නියෝජිතයින්, තම පක්ෂය වෙනුවෙන් පළාත් සභා සඳහා තරග කරනු ලබන අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය තකා කටයුතු කරනු ලැබේ. මේ නිසා මධ්‍යම රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන නොයෙකුත් සංවර්ධන වැඩසටහන්, සමාජ සුභසාධන වැඩසටහන්, ආපදාවන්ට ලක්වූවන්ට සහන සැලසීමේ වැඩසටහන් ආදිය මෙන්ම රාජ්‍ය උත්සව සංවිධානය ද ඡන්ද විමසීම් පැවැත්වෙන දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම් කාලය තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඒවාට රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ලබා ගැනීම සඳහා මධ්‍යම රජයේ අමාත්‍යාංශ විසින් කටයුතු කරනු දැකිය හැකි අතර, එබඳු අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් විවිධාකාර පැමිණිලි දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගෙන් ද, සිවිල් සංවිධාන මඟින් ද මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් වේ. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ දී උඟව පළාත පදනම් කරගෙන අමාත්‍යාංශ දෙකකට අයත් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මැදිහත් වීම සහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වූ දිසාපතිවරුන් ද වෙනත් ප්‍රාදේශීය ලේකම්වරුන් ද සහභාගී කරවාගෙන එම දිස්ත්‍රික්කවල ජනතාව වෙනුවෙන් සහනාධාර

වශයෙන් මුදල් බෙදා දීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව දේශපාලන අයිතිවාසිකම් ඇති එම අමාත්‍යාංශ දෙක යටතේ සිටින ක්ෂේත්‍ර නිලධාරීන් ඔවුන්ගේ වෘත්තීය සමිති මට්ටමින් ඔවුන් කැමති දේශපාලන පක්ෂවලට සහාය දැක්වීමේ ප්‍රචාරණ කටයුතු සඳහා රජයේ කාර්යාල වේලාවෙන් බැහැරව සහ ඔවුන්ගේ නිවාඩු දිනවල යොදවා ගැනීම දක්නට ලැබුණි. රජයේ අදාළ සහන සැලසීම රාජකාරිමය වශයෙන් මෙම ක්ෂේත්‍ර නිලධාරී කණ්ඩායම්වලටම පැවරුණු රාජකාරියක් විය. මේ අනුව මෙම නිලධාරීන්ගේ අදාළ රාජකාරි කටයුත්ත ද සිය වෘත්තිය සමිති හා දේශපාලන අතියිවාසිකම් භුක්ති විඳීම ද උඟව පළාතේ ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත දිනයට දින කිහිපයකට පෙර ඉටු කිරීම බොහෝ පාර්ශ්ව වල මෙන්ම මැතිවරණ කොමසාරිස්වරයාගේ ද විරෝධතාවය මධ්‍යයේ සිදු විය. මේ සම්බන්ධ විරෝධතාව අධිකරණය වෙත පවා ඉදිරිපත් විය. තවද, එම සහනාධාර සැලසීම නියඟයෙන් පීඩා විඳ තිබූ උඟව පළාතේ ජනතාව වෙනුවෙන්, දිසාපතිවරයාගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ ද සහාය ඇතිව ඉටු කිරීමට අධිකරණය මඟින් ද නියෝග ලැබී තිබිණි.

519. මධ්‍යම රජයේ අමාත්‍යාංශ යටතේ අමාත්‍යාංශයක ලේකම්වරයකු මාර්ගයෙන් ක්‍රියාත්මක වන ඉහත ආකාරයේ වැඩපිළිවෙලක් ඡන්ද විමසීම් අවධියක දී ක්‍රියාත්මක වීම නතර කිරීමට හැකියාවක් නොමැති බව ඉහත සඳහන් කරන ලද සිදුවීම් අනුව පෙනී යයි. ඉහත සහනාධාර බෙදීමට මූලික වූ අමාත්‍යාංශයේ ලේකම්වරයා ද ඇතුළු තවත් අමාත්‍යාංශ දෙකක ලේකම්වරුන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අමාත්‍යවරයෙකුගේ ප්‍රධානත්වයෙන්, උඟව පළාත් සභා ඡන්ද විමසීම සම්බන්ධව කොළඹ පිහිටුවා තිබූ මෙහෙයුම් කාර්යාලයේ කටයුතුවල නිරත වූ බව, අදාළ ලේකම්වරුන්ගේ නම් ද සඳහන් කොට 2014.09.28 වන දින "කරලියේ කතා බහ" නමින් ලංකාදීප පුවත්පතේ පළ වූ ලිපියක ප්‍රසිද්ධියට පත් කොට තිබුණි. නීතිමය ප්‍රතිපාදනවල ආරක්ෂාව හා රැකවරණය ඇතිව ඡන්ද විමසීම් බලප්‍රදේශයක ඡන්දදායකයාගේ හැසිරීම කෙරෙහි බලපෑ හැකි වැඩසටහනක් ඡන්ද විමසීම් දින ආසන්නයේ දී ක්‍රියාත්මක කිරීම සදාචාර සම්පන්න නොවන බව පැහැදිලිව සඳහන් කළ හැකි ය. මෙබඳු ක්‍රියාකාරකම්වලට රාජ්‍ය සේවයේ නිලධාරීන් පෙළඹවීමෙන් සිදු විය හැකි ප්‍රධාන අනර්ථය නම්, අපක්ෂපාතී හා සාධාරණ මැතිවරණ පැවැත්වීම සඳහා වගකීම් පැවරෙන රාජ්‍ය සේවයේ නිලධාරීන් මැතිවරණ අවස්ථාවක දී ඉටු කරනු ලබන මැතිවරණ රාජකාරිය කෙරෙහි ඡන්දදායකයාගේ සහ තරග කරන පාර්ශ්වවල විශ්වාසය පළුදු වීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය කෙරෙහි ද කලකිරීමක් ජනතාව තුළ ඇති වීමයි.

520. මෙයට අමතරව කොළඹ දිස්ත්‍රික්කයේ අපේක්ෂකයන් දෙදෙනෙකුගේ ප්‍රචාරක වැඩ පිළිවෙළ ආරම්භ කිරීම හා ඔවුන්ගේ මධ්‍යගත කාර්යාල විවෘත කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයකුගේ මූලිකත්වයෙන් සිදු කර ඇති බවට ජනමාධ්‍ය වාර්තා කළ අතර ඒ සම්බන්ධයෙන් විපක්ෂයේ දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධාන පැමිණිලි ඉදිරිපත් කරන ලදී. මෙහිදී එයට සම්බන්ධ දේශපාලනඥයකු ප්‍රකාශ කර ඇත්තේ අමාත්‍යාංශ ලේකම්වරු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන නිලධාරීන් බැවින් ඔවුන්ට දේශපාලන අයිතිවාසිකම් හිමි බවයි. එයට කිසිසේත් එකඟවිය නොහැකිබව අදාළ දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට ලිඛිතව දන්වන ලද අතර මේ පිළිබඳව ජනාධිපති ලේකම්වරයා හා කාර්ය මණ්ඩල ප්‍රධානී හරහා අතිගරු ජනාධිපතිවරයා ද දැනුම්වත් කිරීමට සිදු විය. අමාත්‍යාංශ ලේකම්වරුන්ද මහජන සේවකයන් වන අතර ඔවුන් ඒ ඒ අමාත්‍යාංශවල ප්‍රධානීන් ලෙස ගණන් දීමේ නිලධරයන් ද වේ. එනම් පාර්ලිමේන්තුව හරහා ක්‍රියාත්මක වන ජනතාව සතු රාජ්‍ය මුදල් පාලනය පිළිබඳ බලය ක්‍රියාත්මක කරන්නේ අමාත්‍යාංශ ලේකම්වරුන්ය. ඔවුන් දේශපාලන ක්‍රියාකාරම්වල නිරතවුවහොත් එය නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ ක්‍රියාදාමයට බරපතල ලෙස බාධා ඇතිවේ. මේ නිසා අමාත්‍යාංශ ලේකම්වරු, දේශපාලන ක්‍රියාකාරම්වලින් වැළැකී සිටීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් වේ.

ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප වීම හා මනාප අවලංගු වීම

521. මෙවර පළාත් සභා ඡන්ද විමසිමේ දී පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීමේ අවස්ථාවේ, දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 492,322 ක් (5.37%) ප්‍රතික්ෂේප වී ඇත. ඒ පිළිබඳ විස්තර අංක 23 සටහනෙහි දක්වා ඇත. මීට අමතරව පක්ෂවල හා කණ්ඩායම්වල අපේක්ෂකයින් වෙනුවෙන් සලකුණු කොට ඇති මනාප ගණන් කිරීමේ අවස්ථාවේදී ද ඡන්ද පත්‍රිකා ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වී ඇත. එම මනාප ගණන් කිරීම සිදු කරන ලද්දේ, මෙම ඡන්ද විමසීමේ දී අදාළ පක්ෂය/ කණ්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාව අනුව මන්ත්‍රීධූර සඳහා හිමිකම් ලැබුවේ නම් පමණි. එම අවස්ථාවේ දී ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව පක්ෂ කිහිපයකට පමණක් අදාළ වන බැවින් ඊට අදාළ විස්තර සටහනක් මෙම වාර්තාවට ඉදිරිපත් කර නොමැත.

522. පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීමේ දී ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප වීම සඳහා හේතු වන කරුණු පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 51 වන වගන්තියේ දක්වා ඇත. ඡන්ද පත්‍රිකා නිල සලකුණෙන් මුද්‍රා නොතැබීම, එක් පක්ෂයකට හෝ කණ්ඩායමකට වැඩි සංඛ්‍යාවක් වෙනුවෙන් ඡන්දය දී තිබීම මෙන්ම පක්ෂ හෝ කණ්ඩායම් සංකලනයකට ඡන්දය සලකුණු කර තිබීම, ඡන්දදායකයා හඳුනා ගැනීමට හැකි වන ආකාරයකට ඡන්දය ප්‍රකාශ කර තිබීම හා ඡන්දය දෙන ලද පක්ෂය හෝ කණ්ඩායම නිශ්චය කර ගත නොහැකි වන විට එවැනි ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කෙරේ. තරග කරන ලද පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ අවස්ථාවේ දී කිලිනොච්චිය (9.43%), නුවරඑළිය (7.80%), මඩකලපුව (7.72%), යාපනය (7.41%), කෑගල්ල (7.32%), මුලතිවු (7.27%) යනාදී වශයෙන් වූ දිස්ත්‍රික්කවල ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප වීම ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබිණි.

523. ඡන්ද විමසීමක දී, ඡන්දදායකයින් විසින් දෙන ලද සියලුම ඡන්ද පත්‍රිකා වලංගු ඒවා හැටියට ගණන් කිරීමට හැකියාවක් ලැබෙන්නේ නම්, එහි ප්‍රතිඵලය ඡන්දදායකයින්ගේ අපේක්ෂාව පිළිබිඹු කිරීම අතින් ප්‍රශස්ථ මට්ටමකට පත්වන බව සාමාන්‍ය පිළිගැනීමකි. අප රටේ ජනගහනයෙන් ඉතා ඉහළ ප්‍රතිශතයක් සාක්ෂරතාවය ඇති පුද්ගලයන් වන බැවින් ඉහත ඡේදයක දක්වා ඇති පරිදි ප්‍රතික්ෂේප වූ ඡන්ද සංඛ්‍යාව, විශාල ප්‍රතිශතයක අගය ගැනීම කෙරෙහි අවධානය යොමු විය යුතු ය. පාර්ලිමේන්තු මැතිවරණයක දී හා පළාත් සභා ඡන්ද විමසීමේ දී ඡන්දදායකයාට පක්ෂයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් ඡන්දයක් ද, අපේක්ෂකයන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් වෙනුවෙන් අවශ්‍ය අපේක්ෂක අංක කතිරවලින් කපා හැර මනාපය පළ කිරීමට ද අවකාශය සැලසී ඇත. පළාත් පාලන ඡන්ද විමසීම්වල දී අපේක්ෂකයින් සඳහා මනාප සලකුණු කිරීමට සිදුවී ඇත්තේ, එක් එක් අපේක්ෂකයාගේ අංකයට ඉදිරියෙන් මනාප තුනක් සලකුණු කිරීමට වෙන් වෙන්ව ඇති හිස් කොටු තුනක් සහිත ඡන්ද පත්‍රිකාවක ය. ජනාධිපතිවරණයේ දී අපේක්ෂකයා වෙනුවෙන් ඡන්දය, 1 ඉලක්කම යෙදීමෙන් ද, අනෙකුත් අපේක්ෂකයින් සඳහා 2, 3 ආදී වශයෙන් ඡන්ද පත්‍රිකාවේ අපේක්ෂක නමට ඉදිරියෙන් ඇති හිස් කොටුවල ඉලක්කම යොදා මනාප සලකුණු කිරීමට ද ඉඩ දී ඇත. මෙවැනි විවිධ ආකාරයේ ඡන්ද පත්‍රිකා ඒ ඒ ඡන්ද විමසීම සඳහා නියමිතව ඇති බැවින්, ඡන්දයට අදාළ ඡන්ද පත්‍රිකාව පිළිබඳවත් එය නිවැරදි ව සලකුණු කිරීම පිළිබඳවත් ඡන්දදායකයින් දැනුවත් කිරීම ඉතා අවශ්‍ය කරුණකි. සමහර ඡන්ද විමසීම් අවස්ථාවල දී අපේක්ෂකයින් විසින් තම පක්ෂය හා තමා වෙනුවෙන් ඡන්දය සලකුණු කර ඇති ආකාරය දැක්වෙන ආදර්ශ ඡන්ද පත්‍රිකා ඡන්දදායකයින් වෙත මුද්‍රණය කොට බෙදා හරින බව මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි ලැබී ඇත. මින් පැහැදිලි වන කරුණක් වන්නේ, අදාළ දැනුවත් කිරීම වෙනුවෙන් දේශපාලන පක්ෂ ද උනන්දුවක් දක්වන බවය.

524. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේ දී බොහෝ කලක් ත්‍රස්තවාදී ක්‍රියා සහ සිවිල් පරිපාලනය කඩා වැටීම නිසා, ඡන්ද විමසීම්වලට සහභාගී වීමේ පළපුරුද්ද හා දැනුම නොමැති උතුරු පළාතේ ඡන්දදායකයින්ට ඡන්දය දෙන ආකාරය පිළිබඳව පැහැදිලි කර දීම සුදුසු බවට දේශපාලන පක්ෂවලින් ද ඉල්ලීම් ඉදිරිපත් වී තිබුණි. ඊට සමගාමීව, මධ්‍යම හා සබරගමුව පළාත්වල වතු කෘෂිකාර්මික ප්‍රදේශවල පදිංචි ජනතාව ද ඒ ආකාරයටම දැනුවත් කිරීම සුදුසු බවට අදහස් පළ විය. මේ නිසා එම පළාත්වල පිහිටි දිස්ත්‍රික්කවල මැතිවරණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ නිලධාරීන් යොදවා මැතිවරණ කොමසාරිස්වරයාගේ මගපෙන්වීම අනුව අදාළ දැනුවත් කිරීම කරන ලදී. මේ සඳහා ගම් ප්‍රදේශවල ජනතාව රැස් කරවා අදාළ දැනුවත් කිරීම් කර ඇත. සාමාන්‍යයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින්, ආදර්ශ ඡන්ද පත්‍රිකාවක් හා ඡන්ද විමසීම් පනතේ ඡන්දය දෙන ආකාරය සම්බන්ධයෙන් දී ඇති උපදෙස්වලට සීමා වී,මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය මාර්ගයෙන් ඡන්දදායකයින් දැනුවත් කිරීමක් කරන අතර, ඊට අමතරව මෙවර ඉහත සඳහන් කළ අයුරින් ඡන්දදායකයින් දැනුවත් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යොදන ලදී. ඡන්ද විමසීමක් පැවැත්වෙන කාලය තුළ කිසිදු ගැටළුවක් ඇති නොවන පරිදි, ඡන්දය දෙන ආකාරය පිළිබඳව ඡන්දදායකයින් දැනුවත් කිරීම මැතිවරණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු විය යුත්තක් බැවින් දිවයින පුරා එක් දිනයක පැවැත්වෙන ඡන්ද විමසීමට අදාළව පෙර සඳහන් කළ ආකාරයට ඡන්දහිමියන් දැනුවත් කිරීම අසීරු විය හැකි ය. නමුත්, මෙවැනි කටයුත්තක ඇති අවශ්‍යතාවය පිළිගෙන ඡන්ද විමසීම් අවස්ථාවක දී ඡන්දය දෙන ආකාරය පිළිබඳව ඡන්දදායකයා පුළුල් ලෙස දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් මඟින්, ප්‍රතික්ෂේප වන ඡන්ද පත්‍රිකා ප්‍රමාණය අඩු කර ගත හැකි යයි විශ්වාස කළ හැකිය.

ඡන්ද විමසීම පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව පරීක්ෂා කිරීම හා ඊට අදාළ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම

525. ඡන්ද විමසීමක් පැවැත්වීමෙන් පසු ඒ පිළිබඳ වාර්තාවක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් සකස් කරනු ලැබූව ද, එවැන්නක් සකස් කිරීම හෝ එවැන්නක්

කවුරුන් වෙත ඉදිරිපත් කළ යුතු දැයි යන්න හෝ ආයතනයක් සම්බන්ධයෙන් හෝ කිසිදු මැතිවරණ නීතියක සඳහනක් නොමැත. දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු වූ සංශෝධනයක් අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (3) ව්‍යවස්ථාව අනුව, මැතිවරණ කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු අතර, එක් එක් ලිත් වර්ෂයේ දී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් ඒ වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වේ. මෙම වාර්තාවට අදාළ වර්ෂය තුළ යම් ඡන්ද විමසීමක් පැවැත්වූයේ නම්, ඒ පිළිබඳව ඉතා සංක්ෂිප්ත වාර්තාවක් ඇතුළත් කිරීම දැනට සිදු වේ.

526. මැතිවරණයක් අවසානයේ දී, මැතිවරණ කොමසාරිස්වරයා විසින් සකස් කරනු ලබන වාර්තාව කිහිප ආකාරයකින්ම වැදගත් වේ. එය මැතිවරණයක් පිළිබඳ නිල වාර්තාවක් වන අතර, ඕනෑම පුද්ගලයකුට හෝ ආයතනයකට මැතිවරණය පිළිබඳ ගවේෂණයන් කළ හැක්කේ ප්‍රධාන වශයෙන් එමඟින් පමණි. ඡන්ද විමසීමක් පැවැත්වීමට පදනම් වූ පසුබිම් විස්තරයකින් ඇරඹෙන එවැනි වාර්තාවකින්, අවසානයේ දී එහි ප්‍රතිඵල ද ඇතුළත් කොට, ඡන්ද විමසීම ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ නිරීක්ෂණයන් ද දක්වා ඡන්ද විමසීම් නීතියේ ඉදිරි සංශෝධන ඇති කිරීමට සුදුසු මඟපෙන්වීම් ද, පෙන්වා දෙනු ලැබේ. ඒ අනුව, මෙවැනි වාර්තාවක් රටෙහි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය අර්ථවත් කිරීමට හා ශක්තිමත් කිරීමට ප්‍රයෝජනයට ගත හැකි, සමාජයට ඵලදායී එකක් වශයෙන් පෙන්වා දිය හැකිය. ඡන්ද විමසීම් තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට ද, රටෙහි සිවිල් සංවිධානවලට හා පුරවැසියන්ට ද ඡන්ද විමසීමේ වෙනත් පාර්ශ්වකරුවන්ට ද විවිධාකාරයෙන් මෙවැනි වාර්තා ප්‍රයෝජනවත් වනු ඇත. ඒ සියල්ලටම වඩා මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා, පවත්නා මැතිවරණ නීතියේ අඩුපාඩු හා එම නීතිය සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය පෙන්නුම් කරනු ලබන එම නිල වාර්තාව කෙරෙහි, විශේෂයෙන් රටෙහි ව්‍යවස්ථාදායකයේ අවධානයට යොමු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. මෙවැනි වාර්තාවක් අඩු තරමින් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂවල අවධානය සඳහා යොමු කිරීමටත්, ඒ පිළිබඳව නීත්‍යානුකූල සාකච්ඡාවක් ව්‍යවස්ථාදායකය තුළ ඇති කිරීමටත් අවකාශයක් සැලසීම සුදුසු ය.

527. වර්තමානයේ මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා මැතිවරණ නීති සංශෝධනය පිළිබඳ තේරීම් කාරක සභා පත්කොට ඊට අදාළ වාර්තා පළ කිරීම සිදු වනුයේ, පාර්ලිමේන්තුවේ පාලක දේශපාලන පක්ෂය හා පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන අනෙකුත් දේශපාලන පක්ෂවල එකඟතාව මතය. ඉහත ඡේදයෙහි දක්වා ඇති ආකාරයට සෑම මැතිවරණයක් අවසානයේ දීම යම් කාලසීමාවක් ඇතුළත මැතිවරණ පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවකාශය සලසා එය මහජන නියෝජිතයින්ගේ සාකච්ඡාවට භාජනය කිරීමට ඉඩ සැලසෙන නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම, මෙරට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය ශක්තිමත් කිරීමට හා ඒ කෙරෙහි දේශපාලන පක්ෂවල හා ඡන්දදායකයාගේ විශ්වාසය තහවුරු කිරීමට ඉවහල් වන බව සඳහන් කළ හැකිය.

XIV වන කොටස

ඇගයීම

528. මෙවර පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා නාමයෝජනා දැන්වීම් පළ කිරීමත් සමඟ ඡන්ද විමසීම් සංවිධානය කිරීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සමඟ තවත් විශාල පිරිසක් කටයුතු කරන ලදී. අමාත්‍යාංශවල ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සිට රාජ්‍ය සේවයේ පහළ මට්ටම දක්වා සමස්ත කාර්ය මණ්ඩලය මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා තේරීම්භාර නිලධාරීන්ගේ දැනුම් දීම් අනුව ඡන්ද විමසීමට අදාළ වගකීම් ඉටු කිරීම සඳහා දක්වන ලද සහයෝගයට ඒ සියලු දෙනාට ස්තුතිය පළ කරනු කැමැත්තෙමි.

529. ඕනෑම ඡන්ද විමසීමක දී දිස්ත්‍රික් මට්ටමේ දී එනම් ප්‍රායෝගික ක්ෂේත්‍රයේ ඡන්ද විමසීම පැවැත්වීමේ කාර්යය භාරයේ වැඩි වගකීමක් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වූ දිසාපතිවරුන්ට/ දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලයට පැවරේ. එම වගකීම් සුපුරුදු පරිදි නිසි ලෙස ඉටු කිරීම සම්බන්ධයෙන් ඔවුනට අතිශයින්ම ස්තුතිවන්ත වෙමි. එමෙන්ම ප්‍රාදේශීය ලේකම්වරුන්ටද ඔවුන්ගේ කාර්ය මණ්ඩලවලට ඡන්ද පොළ රාජකාරි ඉටු කිරීමේ වගකීම නිසි ලෙස ඉටු කරන ලද ග්‍රාමනිලධාරීන්ට ද අපගේ ප්‍රසංශාව හිමිවේ.

530. මැතිවරණ කාලසීමාව තුළ මාස 2 ක පමණ කාලයක් සිය සාමාන්‍ය රාජකාරීවලට අමතරව පොලිස්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් පොලිස් දෙපාර්තමේන්තුව හා පොලිස් විශේෂ කාර්ය බලකාය, ඡන්ද විමසීම සම්බන්ධයෙන් විශේෂ කාර්ය භාරයක් ඉටු කරන ලදී. ඒ සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ හා පරිපාලන) ඇතුළු පොලිස් දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය හා විශේෂ කාර්ය බලකාය නීති විරෝධී ක්‍රියා මැඩලීමටත්, ඡන්ද පොළවල කටයුතු සාමකාමී අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය ආරක්ෂාව ලබා දීමටත් කටයුතු කළ ආකාරය පැසසිය යුතුය. එමෙන්ම ඕනෑම හදිසි හා ආපදා අවස්ථාවල දී මැතිවරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වුවහොත් මැතිවරණ කොමසාරිස්වරයාට හා පොලිස්පතිවරයාට සහාය වීමට යුද, නාවික හා ගුවන් හමුදා සුදානමින් සිටි අතර මේ සම්බන්ධයෙන් මෙම හමුදාපතිවරුන්ට හා එකී ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට/ සමාජිකයින්ට ස්තුතිවන්ත වෙමි. එමෙන්ම අවශ්‍ය සෑමවිටම මැතිවරණ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදුන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු එකී කාර්ය මණ්ඩලයටද කෘතඥ වෙමි.

531. ඡන්ද විමසීමට අදාළ මුද්‍රණ කටයුතු සියල්ලක්ම පාහේ ඉටු කරන ලද්දේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසිනි. රජයේ මුද්‍රණාලයාධිපති ඇතුළු එම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය නාම යෝජනා දැන්වීම් පළ කරනු ලැබීමටත් පෙරාතුව සිටම සිය කාර්ය භාරයෙහි නියැලී සිටියේය. ආරක්ෂා සහිතව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම එම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන විශේෂිත කාර්යය කි. එය ද ඇතුළුව මැතිවරණයට අදාළ සියලු මුද්‍රණ කටයුතු මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ඉටු කිරීම හා මැතිවරණ දෙපාර්තමේන්තුව සමඟ ඉතා සහයෝගයෙන් කටයුතු කිරීමත් සම්බන්ධව රජයේ මුද්‍රණාලයාධිපති ඇතුළු එම දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයට ස්තුති කරමි.

532. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්, මැතිවරණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය ආයතන, වෙනත් ආයතන හා ඡන්දදායකයින් අතර මැතිවරණ කාලය තුළ හුවමාරු වන ඉතා වැදගත් ලියකියවිලි රාශියක් අදාළ අංශය වෙත ආරක්ෂා සහිතව භාර දීම සෑම මැතිවරණ අවස්ථාවක දී ම තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි. මෙම ලිපි ලේඛන අතර, තැපැල් ඡන්දදායකයින්ට අදාළ රක්ෂණ කවර හා ඡන්දදායකයින් වෙත යැවෙන නිල ඡන්ද දැන්වීම්පත් විශේෂ ස්ථානයක් ගනී. මැතිවරණයට අදාළ බොහෝ ලිපි ලේඛන බෙදා හැරීමේ දී ප්‍රමුඛ සේවා පහසුකම් ලබා දී ලිපි ලේඛන බෙදා හැරීමටත් තැපැල් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. තැපැල්පතිවරයා ඇතුළු එම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ඉටු කරන ලද සේවය අගය කරමි.

533. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සහ ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය පසුගිය ඡන්ද විමසීම්වල දී මෙන්ම, මෙම ඡන්ද විමසීමේ දී ද අවශ්‍ය දුරකථන සම්බන්ධතා ලබා දීම, ප්‍රවාහන පහසුකම් ලබා දීම සහ ගණන් කිරීමේ ශාලා වෙනුවෙන් විශේෂ විදුලි සම්බන්ධතා ලබා දීමට ද කටයුතු කරන ලදී. එසේම පෞද්ගලික බස්රථ සමාගම් ද ඡන්දදායකයින් ප්‍රවාහනය කිරීම සඳහා විශේෂ රේට් ගණන් යටතේ බස් රථ සේවාවන් සපයා දෙන ලදී. එම ආයතන ඡන්ද විමසීම් අවස්ථාවල දී මෙම කටයුත්ත ජාතික අවශ්‍යතාවක් සේ සලකා, මැතිවරණ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව අනුව අදාළ සේවාවන් සපයන ලද ආකාරය ප්‍රශංසනීය වේ. එමෙන්ම ජල සම්පත් හා ජල ප්‍රවාහන මණ්ඩලයට ද ශ්‍රී ලංකා දුම්රිය

දෙපාර්තමේන්තුවට ද මැතිවරණ ක්‍රියාවලියට සහාය වූ සියලුම රාජ්‍ය ආයතනවලට ද කෘතඥතාව ප්‍රකාශ කෙරේ.

534. ඡන්දහිමියන් සහ අනෙකුත් පාර්ශ්වයන් දැනුවත් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කරන ලද මාධ්‍ය නිවේදන හා අනිකුත් දැන්වීම් ද, මාධ්‍ය ආයතන සමග මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරන ලද සාකච්ඡා ද පදනම් කොට ගෙන ඡන්ද විමසීම් අවස්ථාවේ ජනතාව දැනුවත් කිරීම සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන ඉටු කරන ලද සේවය ස්තුති පූර්වකව සිහිපත් කරමි. එසේම අවසන් ප්‍රතිඵල මාධ්‍ය ආයතනවලට මුදා හැරීම සඳහා කටයුතු කළ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා ඇතුළු කාර්ය මණ්ඩලය දෙන ලද සහයෝගය වෙනුවෙන් ද ස්තුතිය පළ කරමි.

535. මෙම පළාත් සභා ඡන්ද විමසීම් නියමානුකූලව පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මනාව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුළු කොමසාරිස්වරුන්ද එහි ලේකම්වරයා, නීති ලේකම්වරයා ඇතුළු නිලධාරීන් ද ලබා දුන් අමිල සහාය පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. පොලිසියට, නිලධාරීන්ට, ඡන්ද දායකයන්ට, ජනමාධ්‍යවලට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දෙමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැක්වූ සහාය ඉදිරියේත් නොඅඩුව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

536. මෙම ඡන්ද විමසීම් නිරීක්ෂණය කිරීම සඳහා කටයුතු කළ සියලුම දේශීය නිරීක්ෂණ ආයතනවල ප්‍රධානීන්ට, ඒවායේ කාර්ය මණ්ඩලයට සහ නිරීක්ෂණ කටයුතුවල ක්ෂේත්‍රයේ යෙදුනු සියලුම දෙනාට ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාර ගන්නා අවස්ථාවේ සිට ඡන්ද විමසිම් කටයුතු අවසාන වන තෙක් දක්වන ලද සහයෝගයට ස්තුතිවන්ත වෙමි. විශේෂයෙන් ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වන අවස්ථාවල දී ඒ පිළිබඳව සොයා බලා මැතිවරණ දෙපාර්තමේන්තුවට, තේරීම්භාර නිලධාරීන්ට, පොලිස්පතිවරයාට තොරතුරු ඉදිරිපත් කරමින් සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ අපේක්ෂාවෙන් කටයුතු කළ සියලු ආයතනවලට හා පුද්ගලයින්ට පැසසුම හිමිවිය යුතු ය.

537. උතුරු පළාතේ පළාත් සභා ඡන්ද විමසීම් පැවති අවස්ථාවේ එම ඡන්ද විමසීම් නිරීක්ෂණය කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය නිරීක්ෂණ කණ්ඩායමක් එවීමට කටයුතු කළ පොදු රාජ්‍යමණ්ඩලයේ මහලේකම්තුමාට සහ නිරීක්ෂණ කණ්ඩායමේ ප්‍රධානියාට ද, නිරීක්ෂණ කණ්ඩායමේ සියලුම සාමාජිකයන්ට ද ස්තුතිය පළ කරමි. මැතිවරණ දෙපාර්තමේන්තුවේ ආරාධනය පිළිගෙන දකුණු ආසියාතික මැතිවරණ පරිපාලකයින්ගේ සංසදයේ සභාපතිත්වය දරන වත්මන් ඉන්දියානු මැතිවරණ කොමිෂමේ ප්‍රධාන කොමසාරිස්වරයාට, දකුණු ආසියානු රටවල මැතිවරණ කළමනාකරණ ආයතනය නියෝජනය කරමින් නිරීක්ෂණ කණ්ඩායමක් එවීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ප්‍රශංසා කරමි. එම නිරීක්ෂණ කණ්ඩායමේ සියලුම නිරීක්ෂණ සාමාජිකයින්ටත් විශේෂයෙන් එහි සභාපතීත්වය උසුලන ලද ඉන්දියාවේ හිටපු ප්‍රධාන මැතිවරණ කොමසාරිස්වරයකු වූ එන්. ගෝපාලස්වාමි මහතාට ද මෙම අවස්ථාවේ ප්‍රශංසා කරනු කැමැත්තෙමි.

538. මෙම ඡන්ද විමසීම සාර්ථකව අවසන් කර ගැනීම සඳහා දේශපාලන පක්ෂ නායකයින්, පක්ෂ ලේකම්වරුන්, ස්වාධීන කණ්ඩායම් නායකයින් සහ අපේක්ෂකයන් ද දෙන ලද සහයෝගය මෙන්ම මෙම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය තුළින් සිය මහජන නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට සහභාගීත්වය දැක් වූ සියලුම ඡන්දදායකයින්ට බෙහෙවින් කෘතඥවෙමි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ මහෝත්සවය ලෙස සැලකෙන ඡන්ද විමසීම් ක්‍රියාවලිය නිසි ලෙස ඉටු කර ගැනීමට දේශපාලන පක්ෂ නායකයන්/ පක්ෂ ලේකම්වරුන්/ නිත්‍ය නියෝජිතයන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන්ද සියලුම දේශපාලන ක්‍රියාකාරී කිපදෙනෙක් හා ඒ සියල්ලන්ටමත් වඩා ඡන්ද දායකයන් ඇතුලු සියලුම පුරවැසියන්ද දැක්වූ දායකත්වය අතිශයින්ම අගය කරමි.

539. ඡන්ද විමසීම්වල දී ඡන්ද මධ්‍යස්ථානවල රාජකාරි ඉටුකළ සියලුම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලය කිසිදු බරපතල ගැටලුවකින් තොරව ඡන්ද පොල රාජකාරි ඉටු කිරීම, මෙම ඡන්ද විමසීම නිදහස් හා සාධාරණව පැවැත්වීමේ ප්‍රමුඛ සාධකයක් විය. එමෙන්ම ඡන්ද පත්‍රිකා හා ඡන්ද පෙට්ටි නිකුත් කිරීම්/ භාර ගැනීම් ඉටු කළ නිලධාරීන් ද අතිශයින් වෙහෙස කර කාර්යක් වූ ඡන්ද හා මනාප ගණන් කිරීමේ කාර්යයේ නිරතවූ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ඇතුලු කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කාර්යන් නිසි ලෙස ඉටු නොකලේ නම් ඉතා බරපතල ගැටලුවලට මුහුණ දීමට මැතිවරණ දෙපාර්තමේන්තුවට හා තේරීම්භාර නිලධාරීන්ට සිදු වනු ඇත. ඒ සියලුම දෙනාට මැතිවරණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් බෙහෙවින් කෘතඥ වෙමි.

540. මෙම පළාත් සභා ඡන්ද විමසිම් පැවැත්වීමට අදාළ මූලික සංවිධාන කටයුතුවලදී නීති බලාත්මක කිරීමේ කාර්යයේ දී හා ඡන්ද විමසීම් රාජකාරිවල දී ද ඡන්ද විමසීම් නිරීක්ෂණ කාර්යේදී ද හදිසි අනතුරු නිසා රජයේ නිලධාරීන් දෙදෙනෙකුට හා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරිනියකට දිවි අහිමි වූ අතර

එක් අනියම් සහායකකු ගසකින් වැටී බරපතල ලෙස තුවාල ලැබීය. එසේම මානව හිමිකම් කොමිෂන් සභාවේ තවත් නිලධාරිනියකු බරපතල තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව සිටී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලයට අනුයුක්තව මැතිවරණ මූලික සංවිධාන කටයුතුවල නිරතවී රාත්‍රී ස්වකීය නිවසට යමින් සිටි තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආර්.ජී. ආනන්ද නවරත්න මහතා යතුරුපැදි අනතුරකින් 2012.07.26 දින ජීවිතක්ෂයට පත්වූ අතර වවුනියාව දිස්ත්‍රික්කයේ පුදුකුලම් මහා විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථාන රජකාරි සඳහා ඡන්ද විමසීම් දිනට පෙර දින වන 2013.09.20 ස්වකීය ඡන්ද මධ්‍යස්ථානයට වාර්තා කළ ටී. ක්‍රිස්තුරාජා මහතා ඡන්ද මධ්‍යස්ථානයෙහි දෙබර ප්‍රහාරයකට ලක්වීමෙන් ජීවිතක්ෂයට පත්විය. බදුල්ල දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් කාර්යය නිරීක්ෂණය කර රාජකාරිවල නිතරව සිටි මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරියක් වන එස්. තුසිතා රුවන් කුමාරි සමරසේකර මහත්මිය රිය අනතුරකින් ජීවිතක්ෂයට පත්වූ අතර ඇය සමග ගමන් කල මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරි ඒ.ඒ. අයන්ති ශිරෝමිනි මහත්මියද බරපතල තුවාල ලැබීය. බදුල්ල දිස්ත්‍රික්කයේ උඟව පරණගම ප්‍රදේශයෙහි අනවසර ප්‍රචාරණ ධජ පතාක ඉවත් කරවීම සඳහා අනියම් සහායකයෙකු ලෙස පොලිසිය බඳවා ගෙන සිටි වෘත්තිය ගස් නගින්නකු වූ මොහමඩ් නිසාම් මහතා උස ගසක බැනර් ඉවත් කිරීමේ දී ගසින් වැටී බරපතල ලෙස තුවාල ලබා තිබේ. ඡන්ද විමසිම් පැවැත්වීමේ රාජකාරි ඉටු කිරීමේ දී ස්වකීය ජීවිතය අහිමිවූ එම මහත්ම මහත්මීන්ගේ අකල් මරණ පිළිබඳ බෙහෙවින් කණගාටු වෙමි. ඔවුන්ගේ පවුල්වල සමාජිකයින්ට සාතිශය සංවේගය ප්‍රකාශ කර සිටිමි. එමෙන්ම බරපතල තුවාල ලද නිලධාරීන්ට හා සහායකයන්ට නිරෝගී සුවය පතමි.

541. 2012, 2013, 2014 වර්ෂ තුනෙහි අදියර 4 කින් පැවැත්වූ ඡන්ද විමසීම්වලට අදාළ සියලු කාර්යයන් සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා මෙහෙයවීම සිදු කිරීමේ වගකීම මැතිවරණ කොමසාරිස්වරයාට පැවරී ඇති නමුදු එම කාර්යය සාමූහික ක්‍රියාවලියක් මිස පුද්ගල කාර්යයක් නොවේ. මැතිවරණ දෙපාර්තමේන්තුවේ අනිකුත් පරිපාලන කටයුතුවලට අමතරව වාර්ෂික ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිපූර්ණය කඩිනම් කිරීමේ වැඩ පිළිවෙල ද මැසිවිලි නැගීමෙන් තොරව සතුටින් ඉටුකරමින් එයට සමගාමීව මේ ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කාර්යයන්ට අමතරව නීතිය බලාත්මක කිරීමේ කාර්යන් සම්බන්ධීකරණය කිරීම ද සිදු කරනු ලැබුවේ මැතිවරණ මහලේකම් කාර්යාලයේ අතිරේක මැතිවරණ කොමසාරිස්වරු ප්‍රමුඛ කාර්ය මණ්ඩලය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර /සහකාර කොමසාරිස්වරුන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල සමාජිකයන් විසිනි. සමහර අවස්ථාවල දී දේශපාලනඥයිගේ මැර බලයට ද මුහුණු දෙමින් දිවා රාත්‍රී නොතකා සේවය කරමින් එමෙන්ම ස්වකීය සේවා ස්ථානයෙන් දුර බැහැර දිස්ත්‍රික්කවල සේවය සඳහා කැඳවූ විට නොපැකිළිව ඒ සඳහා ඉදිරිපත් වෙමින් මෙම නිලධාරීන් දැක්වූ අමිල සහාය නොවන්නට මෙම ඡන්ද විමසීම් නිසි ලෙස පැවැත්වීම කළ නොහැකි කාර්යයක් වනු ඇත. එබැවින් මැතිවරණ දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයෝ අපගේ ප්‍රශංසාවට හා කෘතඥතාවට හිමිකම් ලබති. ඒ සැමට අපගේ නොවක් ස්තුතිය පුද කෙරේ.

XV වන කොටස

සමාජතිය

542. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ඡන්ද විමසීම් නීති මගින් මෙරට ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව තුළ පවත්නා මහජන නියෝජිත ආයතනවලට සිය පාලකයින් තෝරා පත්කර ගැනීම හා සම්බන්ධ ක්‍රමවේදය පුරවැසියනට ප්‍රදානය කර ඇත. නීතියෙහි දැක්වෙන ආකාරයට කලින් කල පැවැත්වෙන ඡන්ද විමසීම් හරහා සිය පරමාධිපත්‍ය ක්‍රියාත්මක කරන ඡන්දදායකයා අපේක්ෂා කරන නීත්‍යානුකූල සාමකාමී පරිසරය ඡන්ද විමසීම සඳහා ඇති කරලීම අදාළ සියලුම පාර්ශ්වවල වගකීම වේ.

543. මහජන නියෝජන ආයතනයකට, නීත්‍යානුකූල ඡන්ද විමසීමක් මාර්ගයෙන් තම මහජන නියෝජිතයින් තෝරා පත්කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමක දී මහජනතාව පාලන කටයුතුවලට සහභාගී වේ. ඒ සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන සැලසෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ඡන්ද විමසීමට අදාළ නීති මගිනි.

544. ඡන්දදායකයාට ඡන්ද විමසීමක දී, බලපෑමකින් තොරව රහස්‍ය ලෙස සිය මහජන නියෝජිතයින් තෝරා ගැනීමට ඇති බාධාවන් හැටියට සැලකෙන නීති විරෝධී ක්‍රියා මැතිවරණ වැරදි හා මැතිවරණ දූෂණ ක්‍රියා යනාදිය දඬුවම් ලැබිය හැකි වරදවල් ලෙස මැතිවරණ නීතිවල සඳහන් වේ. එවැනි වැරදිවලින් තොරව ඡන්ද විමසීම්, නිදහස් හා සාධාරණ ලෙස පැවැත්විය යුතුය. ඒ ආකාරයට මැතිවරණ නීති බලාත්මක කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ මැතිවරණ කොමසාරිස්වරයාට, ශ්‍රී ලංකා පොලීසියට සහ රාජ්‍ය නිලධාරීන්ටය.

545. මැතිවරණ නීතිය සෑමට සාධාරණව බලපැවැත්විය යුතුය. ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්වන සියලු දේශපාලන පක්ෂවලට, ස්වාධීන කණ්ඩායම්වලට හා අපේක්ෂකයින්ට අපක්ෂපාතීව හා සාධාරණ ලෙස නීතිය ක්‍රියාත්මක විය යුතුය. එසේ නොමැති වූ විට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය කෙරෙහි ජනතාවගේ විශ්වාසය බිඳී යනු ඇත. මැතිවරණයක් තරග කරනු ලබන දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයින් තම විරුද්ධවාදී පක්ෂවලට, කණ්ඩායම්වලට සහ අපේක්ෂකයින්ට ඡන්ද විමසීමකදී සතුවන නීත්‍යානුකූල අයිතිවාසිකම්වලට හා බලතලවලට ගරු කළ යුතුය. ඡන්දදායකයාට නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් ලබා දීමේ වගකීම දරමින් කටයුතු කරන සෑම පාර්ශ්වයකටම ඒ සඳහා කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය හා පහසුකම් සැලසී තිබීම අත්‍යවශ්‍ය කරුණකි.

546. ඡන්ද විමසීමක් වෙනුවෙන් නාමයෝජනා කැඳවීමේ අවස්ථාවේ සිට සති 06 ක හෝ 08 ක පමණ කාලයක් තුළ එම කටයුතු අවසන් කළ යුතු ය. මැතිවරණ නීති ක්‍රියාත්මක කිරීම එම කාලය තුළ පමා වේ නම් හෝ එම කටයුතු අදාළ අංශ විසින් සිදු නොකරන්නේ නම් එය, මැතිවරණ නීති බිඳදැමීමට දක්වන සහායක් වනු ඇත.

547. මෙම ඡන්ද විමසීමේ දී මැතිවරණ නීති කඩකිරීම පිළිබඳව නීති ක්‍රියාත්මක කරන අංශ ලවා සුදුසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් මැතිවරණ කොමසාරිස්වරයා ද සමග එක්ව ගන්නා ලද උත්සාහයන් සමහර අවස්ථාවල දී අදාළ නිලධාරීන්ගේ සහාය නොලැබීම නිසා සාර්ථක කර ගැනීමට නොහැකි විය. ඒ හේතුවෙන් අදාළ බලධාරීන්, තරගයට එළඹ සිටි දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ දෝෂ දර්ශනයට ද භාජනය විය.

548. ඕනෑම මැතිවරණ රාජකාරියක් පැවරෙන නිලධාරියෙකුට අදාළ රාජකාරී නියම කිරීමේ වගකීම මැතිවරණ කොමසාරිවරයාට හා තේරීම්භාර නිලධාරීන්ට පැවරී ඇත. එසේම අදාළ නියෝගයන් කෙරෙහි බැඳී රාජකාරී කටයුතු කිරීමට එම නියෝග ලබන පිරිස ද නීතියෙන් බැඳී ඇත. මේ නිසා ඡන්ද විමසීම් කාලයක් තුළ දී එම රාජකාරී කටයුතු පැවරෙන නිලධාරීන්, මැතිවරණ බලධාරීන්ගේ නියමයන්ට එකඟව කටයුතු කිරීම නීත්‍යානුකූල වේ. මෙසේ මැතිවරණ රාජකාරී ඉටු කරනු ලබන නිලධාරීන්ට ස්වාධීනව හා නිදහස්ව එම රාජකාරී ඉටු කිරීමට අවකාශය සැලසීම අදාළ සියලු පාර්ශ්වයන්ගේ වගකීම වේ.

පරිශිෂ්ඨ

පරිශිෂ්ඨ - 01

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1764/06 - 2012.06.27

IV (අ) වැනි කොටස - පළාත් සභා
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාවේ 8 වැනි ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නැගෙනහිර පළාත් ආණ්ඩුකාර දොන් සරත් මොහාන් විජේවික්‍රම වන මම, 2012 ජුනි මස 27 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි නැගෙනහිර පළාත් සභාව මෙයින් විසුරුවා හරිමි.

ඩී. එස්. මොහාන් විජේවික්‍රම,
නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර.

2012 ජුනි මස 27 වැනි දින,
නැගෙනහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

පරිශිෂ්ඨ - 02

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1764/07 - 2012.06.27

IV (අ) වැනි කොටස - පළාත් සභා
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාවේ (8) වැනි ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර හේරත් මුදියන්සේලාගේ කරුණාරත්න දිවුල්ගනේ වන මම, 2012 ජුනි මස 27 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි උතුරු මැද පළාත් සභාව මෙයින් විසුරුවා හරිමි.

කරුණාරත්න දිවුල්ගනේ,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර.

2012 ජුනි මස 27 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

පරිශිෂ්ඨ - 03

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1764/08 - 2012.06.27

IV (අ) වැනි කොටස - පළාත් සභා
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාවේ (8) වැනි ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් ආණ්ඩුකාරවර විජේසිංහ ජයවීර මුදියන්සේලාගේ ලොකුබණ්ඩාර වන මම, 2012 ජුනි මස 27 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි සබරගමුව පළාත් සභාව මෙයින් විසුරුවා හරිමි.

වි.ජ.මු. ලොකුබණ්ඩාර,
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2012 ජුනි මස 27 දින,
සබරගමුව පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

පරිශිෂ්ඨ - 04

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1817/38 - 2013.07.05

IV (අ) වැනි කොටස - පළාත් සභා
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ ව්‍යවස්ථාවේ (8) වැනි ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර ටිකිරි බණ්ඩා කොඹබැකඩුව වන මම, වර්ෂ දෙදහස් දහතුනක් වූ ජූලි මස 05 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි මධ්‍යම පළාත් සභාව මෙයින් විසුරුවා හරිමි.

ටිකිරි බණ්ඩා කොඹබැකඩුව,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2013 ජූලි මස 05 වැනි දින,
මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

පරිශිෂ්ඨ - 05

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1817/39 - 2013.07.05

IV (අ) වැනි කොටස - පළාත් සභා
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ ව්‍යවස්ථාවේ (8) වැනි ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාත් ආණ්ඩුකාරවර තිස්ස රෙජිනෝල්ඩ් බළල්ල වන මම, වර්ෂ දෙදහස් දහතුනක් වූ ජූලි මස 05 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි වයඹ පළාත් සභාව මෙයින් විසුරුවා හරිමි.

තිස්ස රෙජිනෝල්ඩ් බළල්ල,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2013 ජූලි මස 05 වැනි දින,
වයඹ පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

පරිශිෂ්ඨ - 06

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1844/75 - 2014.01.12

IV (අ) වැනි කොටස - පළාත් සභා
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ ව්‍යවස්ථාවේ (8) වැනි ඡේදය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර සෙයිද් අහමඩ් සෙයිද් අලවි මව්ලානා වන මම, වර්ෂ දෙදහස් දහහතරක් වූ ජනවාරි මස 12 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි බස්නාහිර පළාතේ පළාත් සභාව මෙයින් විසුරුවා හරිමි.

සෙයිද් අහමඩ් සෙයිද් අලවි මව්ලානා,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර.

2014 ජනවාරි මස 12 වැනි දින,
බස්නාහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

පරිශිෂ්ඨ - 07

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1844/76 - 2014.01.12

IV (අ) වැනි කොටස - පළාත් සභා
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (අ) ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ ව්‍යවස්ථාවේ 8 වැනි ඡේදය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාත් ආණ්ඩුකාර නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය වන මම, 2014 ජනවාරි මස 12 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි දකුණු පළාතේ පළාත් සභාව මෙයින් විසුරුවා හරිමි.

නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2014 ජනවාරි මස 12 වැනි දින,
දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

පරිශිෂ්ඨ - 08

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1870/64 - 2014.07.11

IV (අ) වැනි කොටස - පළාත් සභා
ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (අ) ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ ව්‍යවස්ථාවේ (8) වැනි ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාත් ආණ්ඩුකාරවර කළුවාදේවගේ නන්ද මැතිව් වන මම, වර්ෂ දෙදහස් දහහතරක් වූ ජූලි මස 11 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි ඌව පළාතේ පළාත් සභාව මෙයින් විසුරුවා හරිමි.

කළුවාදේවගේ නන්ද මැතිව්,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2014 ජූලි මස 11 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

පරිශිෂ්ඨ - 09

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1764/15 - 2012.06.28

I වැනි කොටස: **(I)** වැනි ඡෙදය - සාමාන්‍ය
රජයේ නිවේදන

නැගෙනහිර පළාතේ පළාත් සභාව
1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත
10 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

ඉහත සඳහන් පළාත් සභාව සඳහා, එම පළාත තුළ පිහිටි, මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේ දී මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි **II** වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර 2012.07.12 වැනි දිනයෙන් ආරම්භව 2012.07.19 වැනි දින මධ්‍යාහ්න 12.00 ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළ දී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි **III** වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේරීම්භාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරග කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු.2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම් ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුවම වූ දින (එනම් 2012.07.18) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළ දී තේරීම්භාර නිලධරයා වෙත තැන්පත් කළ යුතුය.

05. නියමිත ආකෘතියෙහි වූ නාමයෝජනා පත්‍ර, නාමයෝජනා කාල සීමාව ඉකුත්වීමට පෙර තේරීම්භාර නිලධරයාගෙන් ගාස්තු ගෙවීමක් නොමැතිව ලබාගත හැකිය.

06. පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක 2012.07.19 වැනි දින මධ්‍යාහ්න 12.00 ඉකුත් වූ වහාම තේරීම්භාර නිලධරයන් විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වෙන් කර දෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2012 ජුනි මස 28 වැනි දින,
රාජගිරිය, සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම	II වැනි තීරුව එක් එක් නාමයෝජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව	III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය
මඩකලපුව	14	තේරීම්භාර නිලධාරී. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය) මඩකලපුව

උපලේඛනය (සම්බන්ධිතයි)

I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම	II වැනි තීරුව එක් එක් නාමයෝජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව	III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය
අම්පාර	17	තේරීම්භාර නිලධාරී. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය) අම්පාර
ත්‍රිකුණාමලය	13	තේරීම්භාර නිලධාරී. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය) ත්‍රිකුණාමලය

උතුරු මැද පළාතේ පළාත් සභාව
1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත
10 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

ඉහත සඳහන් පළාත් සභාව සඳහා, එම පළාත තුළ පිහිටි, මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේ දී මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි **II** වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර 2012.07.12 වැනි දිනයෙන් ආරම්භව 2012.07.19 වැනි දින මධ්‍යාහ්න 12.00 ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළ දී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි **III** වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේරීම්භාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරග කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු.2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම් ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුවම වූ දින (එනම් 2012.07.18) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළ දී තේරීම්භාර නිලධරයා වෙත තැන්පත්
කළ යුතුය.

05. නියමිත ආකෘතියෙහි වූ නාමයෝජනා පත්‍ර, නාමයෝජනා කාල සීමාව ඉකුත්වීමට පෙර තේරීම්භාර නිලධරයාගෙන් ගාස්තු ගෙවීමක් නොමැතිව ලබාගත හැකිය.

06. පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක 2012.07.19 වැනි දින මධ්‍යාහ්න 12.00 ඉකුත් වූ වහාම තේරීම්භාර නිලධරයන් විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වෙන් කර දෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2012 ජුනි මස 28 වැනි දින,
රාජගිරිය, සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය (සම්බන්ධිතයි)

I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම	II වැනි තීරුව එක් එක් නාමයෝජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව	III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය
අනුරාධපුර	24	තේරීම්භාර නිලධාරී. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය) අනුරාධපුර
පොළොන්නරුව	13	තේරීම්භාර නිලධාරී. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය) පොළොන්නරුව

සබරගමුව පළාතේ පළාත් සභාව
1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත
10 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

ඉහත සඳහන් පළාත් සභාව සඳහා, එම පළාත තුළ පිහිටි, මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේ දී මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි **II** වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර 2012.07.12 වැනි දිනයෙන් ආරම්භව 2012.07.19 වැනි දින මධ්‍යාහ්න 12.00 ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළ දී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි **III** වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේරීම්භාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරග කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු.2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම් ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුවම වූ දින (එනම් 2012.07.18) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළ දී තේරීම්භාර නිලධරයා වෙත තැන්පත් කළ යුතුය.

05. නියමිත ආකෘතියෙහි වූ නාමයෝජනා පත්‍ර, නාමයෝජනා කාල සීමාව ඉකුත්වීමට පෙර තේරීම්භාර නිලධරයාගෙන් ගාස්තු ගෙවීමක් නොමැතිව ලබාගත හැකිය.

06. පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක 2012.07.19 වැනි දින මධ්‍යාහ්න 12.00 ඉකුත් වූ වහාම තේරීම්භාර නිලධරයන් විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වෙන් කර දෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2012 ජූනි මස 28 වැනි දින,
රාජගිරිය, සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය (සම්බන්ධිතයි)

I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම	II වැනි තීරුව එක් එක් නාමයෝජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව	III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය
රත්නපුර	27	තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය) රත්නපුර
කෑගල්ල	21	තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය) කෑගල්ල

උපලේඛන - 10

අති විශෙෂ ගැසට් පත්‍රය - අංක 1818/21 - 2013.07.11

I වැනි කොටසථ (I) වැනි ඡෙදය - සාමාන්‍ය
රජයේ නිවේදන

මධ්‍යම පළාතේ පළාත් සභාව
1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත
10 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

ඉහත සඳහන් පළාත් සභාව සඳහා, එම පළාත තුළ පිහිටි, මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු ,පනත, යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේ දී මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි **II** වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර, 2013 ජූලි මස 25 වැනි දිනයෙන් ආරම්භව 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළදී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි **III** වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේරීම්භාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරඟ කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම් ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුව ම වූ දින (එනම් 2013 ජූලි මස 31) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළ දී තේරීම්භාර නිලධරයා වෙත තැන්පත් කළ යුතුය.

05. නියමිත ආකෘතියෙහි වූ නාමයෝජනා පත්‍ර, නාමයෝජනා කාල සීමාව ඉකුත්වීමට පෙර තේරීම්භාර නිලධරයාගෙන් ගාස්තු ගෙවීමක් නොමැතිව ලබා ගත හැකිය.

06. පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00 ඉකුත් වූ වහාම තේරීම්භාර නිලධරයන් විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වෙන් කරදෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2013 ජූලි මස 11 වැනි දින,
රාජගිරිය, සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම	II වැනි තීරුව එක් එක් නාමයෝජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව	III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය
මහනුවර	32	තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), මහනුවර

උපලේඛනය (සම්බන්ධිතයි)

I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම	II වැනි තීරුව එක් එක් නාමයෝජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව	III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය
මාතලේ	14	තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), මාතලේ
නුවරඑළිය	19	තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), නුවරඑළිය

උතුරු පළාතේ පළාත් සභාව
1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත
10 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

ඉහත සඳහන් පළාත් සභාව සඳහා, එම පළාත තුළ පිහිටි, මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු ,පනත, යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේ දී මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි **II** වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර, 2013 ජූලි මස 25 වැනි දිනයෙන් ආරම්භව 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළදී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි **III** වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේරීම්භාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරඟ කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම් ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුව ම වූ දින (එනම් 2013 ජූලි මස 31) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළ දී තේරීම්භාර නිලධරයා වෙත තැන්පත් කළ යුතුය.

05. නියමිත ආකෘතියෙහි වූ නාමයෝජනා පත්‍ර, නාමයෝජනා කාල සීමාව ඉකුත්වීමට පෙර තේරීම්භාර නිලධරයාගෙන් ගාස්තු ගෙවීමක් නොමැතිව ලබා ගත හැකිය.

06. පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00 ඉකුත් වූ වහාම තේරීම්භාර නිලධරයන් විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වෙන් කරදෙනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2013 ජූලි මස 11 වැනි දින,
රාජගිරිය, සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය (සම්බන්ධිතයි)

I වැනි තීරුව පරිපාලන දිස්ත්‍රික්කයේ නම	II වැනි තීරුව එක් එක් නාමයෝජනා පත්‍රයෙහි දක්වනු ලැබිය යුතු අපේක්ෂක සංඛ්‍යාව	III වැනි තීරුව නාමයෝජනා භාර ගන්නා නිලධාරියා හා ස්ථානය
යාපනය	19	තේර්මිහාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), යාපනය
කිලිනොච්චිය	07	තේර්මිහාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), කිලිනොච්චිය
මන්නාරම	08	තේර්මිහාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), මන්නාරම
වවුනියාව	09	තේර්මිහාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), වවුනියාව
මුලතිව්	08	තේර්මිහාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, (කච්චේරිය), මුලතිව්

වයඹ පළාතේ පළාත් සභාව
1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත
10 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

ඉහත සඳහන් පළාත් සභාව සඳහා, එම පළාත තුළ පිහිටි, මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක වලින් මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට යන බව (මෙහි මින් මතු ,පනත, යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම ඡන්ද විමසීමේ දී මෙහි උපලේඛනයෙහි **I** වැනි තීරුවෙහි සඳහන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාමයෝජනා කරනු ලැබිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, මෙහි උපලේඛනයෙහි **II** වැනි තීරුව යටතේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති පරිදි විය යුතුය.

03. නාමයෝජනා පත්‍ර, 2013 ජූලි මස 25 වැනි දිනයෙන් ආරම්භව 2013 අගෝස්තු මස 01 වැනි දින මධ්‍යාහ්න 12.00ට අවසන් වන නාමයෝජනා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාව තුළදී ඕනෑම අවස්ථාවක, මෙහි උපලේඛනයෙහි **III** වැනි තීරුවේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානවලදී අදාළ තේර්මිහාර නිලධරයන් විසින් භාර ගනු ලැබේ.

04. ස්වාධීන අපේක්ෂකයින් වශයෙන් තරඟ කිරීමට අදහස් කරන යම් තැනැත්තන්ගෙන් යුතු කණ්ඩායමක් වෙතොත් පනතේ 14 වැනි වගන්තිය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය අනුව, එක් එක් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු.2,000) බැගින් ගණන් බලන ලද මුදලක් මෙම දැන්වීම් ප්‍රසිද්ධ කරන දිනය හා ඉහත සඳහන් නාමයෝජනා කාල සීමාවේ අවසානයට පෙරාතුව ම වූ දින (එනම් 2013 ජූලි මස 31) මධ්‍යාහ්න 12.00 දක්වා අතර කාලය තුළ දී තේර්මිහාර නිලධරයා වෙත තැන්පත් කළ යුතුය.

ශ්‍රී ලංකාවේ මැතිවරණ නීතියට අනුව දේශපාලන පක්ෂ පිළිගැනීමට ප්‍රථම මෙරට ජන සමාජයේ පිළිගත් දේශපාලන පක්ෂ තිබූ අතර, ඒ පිළිබඳ ඉතිහාසය 1931 වර්ෂය දක්වා දිවේ. දේශපාලන පක්ෂ පිළිගැනීම පිළිබඳ නීති 1959 සිට විවිධ අවස්ථාවල සංශෝධනය වී ඇත. වත්මන් සමාජ ප්‍රගමනය වෙනුවෙන් දේශපාලන පක්ෂ විසින් සිදුකරනු ලබන මෙහෙය, වඩාත් අර්ථවත් හා ඵලදායී වීමට නීති රීති මාර්ගයෙන් කළ හැකි දේ අවම බැවින් එහිදී වඩාත් වගකීම පැවරෙන්නේ දේශපාලන පක්ෂ වලටමය.

එම වගකීම ද සැලකිල්ලට ගෙන 2012 වර්ෂයේ පැවැත්වූ පළාත් සභා ඡන්ද විමසීම අරමුණු කරගෙන ප්‍රථම වරට මෙම ආචාර ධර්ම පද්ධතිය මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් සඳහා ප්‍රකාශයට පත්කරන ලදී. ශ්‍රී ලංකාවේ ඡන්ද විමසීම් වෙනුවෙන් දේශපාලන පක්ෂ වලින් බැහැර අපේක්ෂකයින් නියෝජනය වන්නේ ස්වාධීන කණ්ඩායම් වශයෙනි. මෙම ආචාර ධර්ම පද්ධතිය එම ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයින්ට ද අදාළ වේ.

අ. නීතියේ ආධිපත්‍යය.

01. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා අනෙකුත් නීති වලින් සහතික වී ඇති පුරවැසි අයිතිවාසිකම් හා නිදහස ආරක්ෂා කරමින් මැතිවරණ නීති අනුව මහජන නියෝජිතයින් තෝරා ගැනීමට හා ජනමත විචාරණයකට අදාළව පවත්වනු ලබන ඡන්ද විමසීම්වල දී ඡන්ද දායකයාට නිදහසේ සහ කිසිදු බලපෑමකින් තොරව සිය ඡන්දය ප්‍රකාශ කිරීමට අවකාශය සැලසීම හා ඊට අවශ්‍ය ආධාර හා අනුබල ලබාදීම.
02. ඡන්ද විමසීමක් වෙනුවෙන් ඉදිරිපත් වන සියළුම දේශපාලන පක්ෂ වල සහ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන්ට මැතිවරණ ක්‍රියාවලියේ දී හිමි සමතැන සෑම පියවරක දීම ආරක්ෂා කිරීම.
03. සියළුම දේශපාලන පක්ෂ වලට හා අපේක්ෂකයින්ට හිමිවන අයිතිවාසිකම් හා ඡන්ද දායකයින් දැනුවත් කිරීමට ඇති අයිතියට ගරු කරමින් විරුද්ධ මතධාරීන්ගේ ද අයිතීන් ආරක්ෂා කිරීම.
04. ශ්‍රී ලංකාවේ නීතිය යටතේ පිහිටුවා ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික හෝ වෙනත් ආයතනවලට නීතියෙන් අපේක්ෂා කර ඇති ආකාරයට කටයුතු පවත්වාගෙන යාමට කිසිදු ආකාරයකින් බාධා හෝ බලපෑම් නොකිරීම.
05. රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇති ආයතනවලට හා එම කටයුතු පැවරී ඇති අයට අදාළ රාජකාරී ඉටු කිරීමේ දී බාධා හෝ බලපෑම් නොකිරීම.
06. සාමාන්‍ය ජන ජීවිතයට බාධා නොවන අයුරින් සහ පවත්නා නීති රීති උල්ලංඝනය නොවන අයුරින් ඡන්ද විමසීම් ප්‍රචාරක කටයුතු සිදු කිරීම පිළිබඳව සහතික කිරීම.
07. සෑම ඡන්ද විමසීමකටම අදාළ පනත්වල දැක්වෙන නීතිරීති (වගන්ති) ගැන සියලු අපේක්ෂකයින්ට අවබෝධයක් ලබා දීම සහ එම පනත්වල දැක්වෙන වැරදි, දූෂණ ක්‍රියා සහ නීතිවිරෝධී ක්‍රියා වලින් වළකින ලෙස උපදෙස් දීම.

ආ. සාමාන්‍ය හැසිරීම.

01. ශ්‍රී ලාංකිකයින් අදහන ආගම්, භාවිතා කරන භාෂාව, ඔවුන්ගේ වාර්ගිකත්වය, චාරිත්‍ර වාරිත්‍ර හා වෙනත් කුලගෝත්‍ර ආදී වෙනස්කම් පිළිබඳ පුද්ගලයන්ගේ වෛරය හා නොඉවසනසුලු බව හෝ උග්‍රවන ආකාරයට හෝ හැසිරීමෙන් වැළකීම.
02. දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් සිදු කරන විවේචන, ඒ ඒ පක්ෂයේ ප්‍රතිපත්තිවලට, වැඩසටහන්වලට හා අතීත ක්‍රියාකාරකම්වලට සීමා කළ යුතු අතර විරුද්ධවාදී පාක්ෂිකයින්ගේ හෝ අපේක්ෂකයින්ගේ පොදු කටයුතු වලට සම්බන්ධයක් නොමැති ඔවුන්ගේ පෞද්ගලික කටයුතු හා විවේචනය කිරීමෙන් වැළකීම හා සනාථ කර නොගත් චෝදනා හා විකෘති කළ අදහස් මත විවේචන සිදු නොකිරීමට වග බලා ගැනීම.
03. තෝරා පත් කර ගැනීම මඟින් පිහිටුවීමට අපේක්ෂා කරනු ලබන ව්‍යවස්ථාපිත ආයතනයේ අරමුණු ඉටුකරලීම මඟින් ශ්‍රී ලංකා වාසීන්ගේ අනාගත අභිවෘද්ධිය සාක්ෂාත් කරලීමට ඇපකැපවිය හැකි අපේක්ෂකයින් තරඟයට ඉදිරිපත් කොට ඔවුන් විනයක් හා භික්මීමක් ඇතිව තරඟයේ දී මෙහෙයවීම.
04. දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් අපේක්ෂකයින් තරඟය සඳහා තෝරා ගැනීමේ දී ඔවුන්ගේ පූර්ව කල්ක්‍රියා වල යහපත්භාවය, නීතියට ගරු කිරීමෙන් ක්‍රියා කිරීම, නීතිය ඉදිරියේ

දී චෝදනා නොලැබීම, මහජන සේවයට කැපවී සිටීම, ධනබලය හා සමාජයේ බලවත් බව නිසා ජන සමාජය පීඩාවට පත් නොකිරීම යනාදී ගුණාංග කෙරෙහි අවධානය යොමුකර කටයුතු කිරීම.

05. නාමයෝජනා භාරදෙන විට හෝ ඉන්පසු දින 30 ක් ඉකුත් වීමට පෙර සියළුම අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ තේරීම් භාර නිලධාරීට භාරදීම.
06. ඡන්ද පොළ පරිශ්‍රය තුළ හෝ ඡන්ද ගණන් කිරීමේ ශාලා පරිශ්‍රය තුළ දුම්බීම හෝ එම ස්ථානවලට මත්ද්‍රව්‍ය පාවිච්චි කර පැමිණීමෙන් වැළකී සිටිය යුතු බවට අපේක්ෂකයින් / නියෝජිතයින් දැනුවත් කිරීම.
07. නාමයෝජනා භාර ගන්නා ස්ථානයට හෝ ඡන්ද මධ්‍යස්ථානවලට මෙන්ම එහි පරිශ්‍රයට හෝ ඡන්ද ගණන් කරනු ලබන ස්ථානවලට හෝ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ ස්ථානවලට අවසර ඇති පුද්ගලයින් පමණක් ඇතුල්වීම.
08. ඡන්ද විමසීමට අදාළ තහනම් ක්‍රියාවල යෙදීම හෝ තම ආධාරකරුවන් එම ක්‍රියාවන්ට යෙදවීමට සහාය පළකිරීම හෝ ඊට අනුබල දීම යන කටයුතුවල නොයෙදීම.

ඇ. මැතිවරණ ප්‍රචාරණ කටයුතු

01. ඡන්ද විමසීම තරඟ කිරීම සඳහා ඉදිරිපත්ව ඇති දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් ඡන්ද විමසීම් නීතියේ දැක්වෙන ආකාරයට මැතිවරණ ප්‍රචාරණ කටයුතු නීත්‍යානුකූලව ද නීතිය හා සාමය රැකෙන පරිදි ද සිදු කිරීම, විරුද්ධ පාර්ශ්වකරුවන්ගේ නීත්‍යානුකූල මැතිවරණ කටයුතු වලට බාධා නොකිරීම හා නීත්‍යානුකූල අන්දමින් ඡන්ද ප්‍රචාරණ කාර්යාල පවත්වාගෙන යාම.
02. මුද්‍රිත ලේඛන මඟින් ඡන්ද දායකයින් දැනුවත් කිරීම සඳහා වූ ලේඛන මුද්‍රණය කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් මැතිවරණ නීතිය අනුව ක්‍රියා කිරීම.
03. තම පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයන්ගේ හෝ ජයග්‍රහණය පතා හෝ වෙනත් පාර්ශ්වයක පරාජය අපේක්ෂාවෙන් කිසිදු මැතිවරණ ප්‍රචාරණ දැන්වීමක්, ඊට අදාළ ඡායාරූප රාජ්‍ය හෝ පෞද්ගලික අංශයට අයත් ගොඩනැගිල්ලක, භූමියක හෝ මහජනයාට ප්‍රවේශ වීමට අවසර ඇති මාර්ගවල හෝ පොදු ස්ථාන වල ප්‍රදර්ශනය කිරීමෙන් වැළකීම.
04. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතන වලට හෝ අයත් භූමි , ගොඩනැගිලි හෝ දේපළක් හෝ සේවාවක් භාවිතා කිරීමෙන් වැළකී සිටීම.
05. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කිසිදු ආගමික ස්ථානයක් හෝ ආගමික ස්ථානයකට අයත් භූමියක් හෝ දේපළක් භාවිතා කිරීමෙන් වැළකී සිටීම.
06. අපේක්ෂකයා ගමන් කරනු ලබන වාහනයේ පමණක් ඡන්ද විමසීමට අදාළ කොඩි හෝ දැන්වීම් හෝ අපේක්ෂකයාගේ අංකය ප්‍රදර්ශනය කිරීම.
07. මැතිවරණ ප්‍රචාරණය වෙනුවෙන් කරනු ලබන සැරසිලි අවසරලත් මැතිවරණ රැස්වීම් භූමියක රැස්වීම පැවැත්වෙන කාලය තුළ පරිසරයට හානි නොවන පරිදි සිදු කිරීමටත්, එබඳු රැස්වීම් කටයුතු වලින් පසු අප්‍රමාදව එම සැරසිලි ඉවත් කිරීමටත් ක්‍රියා කිරීම.
08. ඡන්ද විමසීම් කාල සීමාව තුළ මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට අදාළව පෙරහැර, මහජන පෙළපාලි හා රථ පෙළපාලි පැවැත්වීම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් බැවින් එවැනි පෙළපාලි, පෙරහැර යනාදී කිසිවක් ඡන්ද විමසීම් කාල සීමාව තුළ නොපැවැත්වීම.
09. රැස්වීම් සඳහා අවසරලත් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම, රැස්වීම් පැවැත්වෙන කාලයට සහ එම භූමියට පමණක් සීමා කිරීම සහ ධාවනයේ යෙදෙන වාහනවල සවිකළ ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ප්‍රචාරක කටයුතු නොකිරීම.
10. මැතිවරණ දින ඡන්ද විමසීම ඇරඹීමට නියමිත වේලාවට පැය 48 කට පෙරාතුව අදාළ ඡන්ද විමසීම් නීතිය අනුව මැතිවරණ ප්‍රචාරණ කටයුතු නතර කිරීමට පියවර ගැනීම සහ දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සංගීත සංදර්ශන වැනි දෑ පැවැත්වීම, මුද්‍රිත/ විද්‍යුත් ජනමාධ්‍ය හරහා දැන්වීම් ප්‍රකාශයට පත්කිරීම යනාදී කාර්යයන් අත්හිටුවීම.
11. කිසිදු පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයකු වශයෙන් තනතුරක් දරමින් සිටින අයකු යම් පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ ඒවායේ අපේක්ෂකයින් ජයග්‍රහණය කරවීමට තමාට නියෝජිතයකු වශයෙන් ලැබී ඇති වරප්‍රසාද, බලතල, වාහන හා වෙනත් රාජ්‍ය දේපළ යොදා නොගැනීම.
12. මහජන නියෝජිතයකුගේ ආරක්ෂාව වෙනුවෙන් නීත්‍යානුකූලව සපයා ඇති ආරක්ෂක අංශ නිලධාරීන් හෝ ඔවුන්ගේ භාවිතාවට දී ඇති ගිනි අවි හා අනෙකුත් ආරක්ෂිත උපකරණ හා මෙවලම් අපේක්ෂිත මහජන නියෝජිතයාගේ ආරක්ෂාව වෙනුවෙන් හැර කිසිදු නීත්‍යානුකූල නොවන අන්දමේ කටයුත්තකට යොදවා ගැනීමෙන් වැළකී සිටීම.
13. යම් මැතිවරණ නීතියක් අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මඟින් ඡන්ද විමසීමට තරඟ කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට මැතිවරණ නීතිය යටතේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ලබාදෙන ගුවන් කාල සීමා, අදාළ සංස්ථා ප්‍රධානීන් හා මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන උපදෙස් හා කොන්දේසි අනුව භාවිතා කිරීම. (පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට අදාළ නොවේ.)

14. යම් මැතිවරණ නිතීයක් අනුව ඡන්ද විමසීමක දී ඡන්ද හිමියන් ලියාපදිංචි සෑම ගෘහයක් වෙතම තරඟ කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට සංදේශයක් යැවීමට ඇති අයිතිය, අදාළ පනතේ ප්‍රතිපාදන හා තැපැල්පතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයට භාවිතා කිරීම. (මෙම අවස්ථාව පළාත් සභා හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට අදාළ නොවේ.)
15. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ විභාග හා 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඇතුළු වෙනත් ප්‍රසිද්ධ විභාග පැවැත්වෙන මෙන්ම එම විභාගවල ඇගයීම් කෙරෙන විදුහල්වලට/ විභාග මධ්‍යස්ථානවලට බාධාවන අයුරින් එම විදුහල්/ මධ්‍යස්ථාන අවට ඡන්ද ප්‍රචාරක කටයුතු කිරීමෙන් වැළකී සිටීම.

ඈ. ඡන්ද විමසීම් දින

01. ඡන්ද විමසීම් දිනයේ ඡන්ද පොළේ සිට මීටර් 500 ක් ඇතුළත , ඡන්දය ආයාචනය කිරීම, ඡන්ද දායකයින් ඡන්දය දීමට හෝ නොදීමට පෙළඹවීම, මැතිවරණ ප්‍රචාරණ අත් පත්‍රිකා ආදී ලේඛන බෙදීම ආදී කිසිඳු මැතිවරණ ප්‍රචාරණ කටයුත්තක් හෝ මැතිවරණ නිතීයේ සඳහන් වෙනත් වරදවල් සිදු නොකිරීම.
02. ඡන්ද විමසීම සඳහා ඡන්ද පොළට පැමිණෙන හා ඡන්ද පොළේ දී ඡන්දය පාවිච්චි කරන ඡන්ද දායකයින්ට කිසිදු බාධාවක් නොකිරීම, ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා බලපෑම් කිරීමෙන් වැළකීම සහ ඡන්ද දායකයාට ස්වාධීනව ඡන්දය නිදහස්ව හා රහසාව පාවිච්චියට ඇති අයිතියට බාධා නොකිරීම.
03. ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද හිමියන්, ඡන්ද පොළ නියෝජිතයින්, ඡන්ද අපේක්ෂකයින්, නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් කිසිදු බිය වැද්දීමකට ලක් කිරීමෙන්, ශාරීරික වද හිංසාවලට ලක් කිරීමෙන් හෝ ඔවුන්ගේ දේපළ වලට හානි කිරීමෙන් වැළකීම සහ ඡන්ද පොළ නියෝජිතයින් ඡන්ද පොළෙන් පලවා හැරීමෙන් වැළකීම.
04. ඡන්ද විමසීම් දින ඡන්ද පොළට ඇතුළු වීම සඳහා අවසරය ඇති අය පමණක් (තරඟ කරනු ලබන දේශපාලන පක්ෂයක ලේකම්, අපේක්ෂකයින් හා ඡන්ද පොළ නියෝජිතයින්) සිය අනන්‍යතාව තහවුරු කර ඇතුළු විය යුතු බැවින් ඒ සම්බන්ධයෙන් සහාය දක්වා ක්‍රියා කිරීම.
05. මැතිවරණ නිතීයේ සඳහන් කිසිදු වරදක් හෝ මැතිවරණ දූෂණ ක්‍රියාවක් කිරීමෙන් හා ඊට අනුබලදීමෙන් වැළකීම. (ඡන්ද පොළේ දී ඡන්ද පෙට්ටි බලෙන් පිරවීම, ඡන්ද පොළට කඩා වැදීම, හොර ඡන්ද දැමීම ආදී වැරදි හා දූෂණ ක්‍රියා)
06. නීත්‍යානුකූල නොවන අන්දමින් ඡන්ද පොළ කරා ඡන්ද දායකයින් ප්‍රවාහනය නොකිරීමට වග බලා ගැනීම.
07. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා එම කටයුතු භාරව ක්‍රියාකරන කාර්ය මණ්ඩලයට අපේක්ෂිත ආකාරයට සහාය වීම හා ඔවුන්ගේ කටයුතු වලට නියෝජිතයින් බාධා නොකරන බවට වග බලා ගැනීම.
08. මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරය මත ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කරන නියෝජිතයින්ට නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්ට බාධා නොකිරීම හා ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට සහාය වීම.

ඉහත සඳහන් කරුණු අදාළ වන විට තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දිනය සඳහා ද වලංගු වන ලෙස සැලකීම යෙහෙකි.

ඉ. ඡන්ද හා මනාප ගණන් කිරීම (තැපැල් ඡන්ද ඇතුළුව) හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.

01. ඡන්ද හා මනාප ගණන් කිරීමේ (තැපැල් ඡන්ද ගණන් කිරීම ද ඇතුළුව) ක්‍රියා පිළිවෙල සම්බන්ධයෙන් ස්වකීය ගණන් කිරීමේ නියෝජිතයන් දැනුවත් කිරීම හා පැමිණිලි ඉදිරිපත් කිරීමේ නිසි ක්‍රමවේදය ගැන ස්වකීය නියෝජිතයන් දැනුවත් කිරීම.
02. තේරීම්භාර නිලධාරී විසින් ගණන් කිරීමේ ශාලා හා ප්‍රතිඵල සකස් කිරීමේ ස්ථානය තුළ එම කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධව පනවා ඇති විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවට ස්වකීය නියෝජිතයන් දැනුවත් කිරීම.
03. ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් ලෙස විධිමත්ව පත්කර නොමැති නම් එනම්, නිසි අවසරයක් නොමැතිව රජයේ හෝ පළාත් සභා ඇමතිවරු, පාර්ලිමේන්තු හා පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන සභිකයන් හෝ වෙනත් දේශපාලන බලධාරීන් ගණන් කිරීමේ පරිශ්‍රයට/ ශාලාවට ඇතුළු නොවීමට වග බලා ගැනීම.

ඊ. වෙනත් විශේෂ කරුණු

01. ඡන්ද විමසීමේ දී තරඟ කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ තමන්ගේ පක්ෂයේ ප්‍රතිපත්ති මාලාව හා යම් කාල සීමාවක් තුළ තම පක්ෂය විසින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වැඩපිළිවෙලක් ඡන්ද දායකයන් වෙත ඉදිරිපත් කිරීම.
02. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් රජයේ දේපළ, නිල වාහන හෝ නිලධාරීන් යොදා නොගැනීම.
03. මහජන නියෝජිතයින් තම නිල රාජකාරී කටයුතු හරහා මැතිවරණ ප්‍රචාරක කටයුතු කිරීමෙන් වැළකීම.
04. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් නොමිලයේ රජයේ ගුවන්යානා හෝ වෙනත් වාහන භාවිතා කිරීමෙන් වැළකීම.

05. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් පොදු ගොඩනැගිලි, ක්‍රීඩාභූමි, රජයේ සංචාරක නිවාස යොදා ගන්නේ නම් නියමිත ගෙවීම් සිදු කොට ඒවා භාවිතා කිරීම හා එවැනි අවස්ථා එම ආකාරයටම සියළුම අවශ්‍ය පාර්ශ්වවලට ලබා ගැනීමට හැකිවන පරිදි ක්‍රියා කිරීම.
06. මැතිවරණ සමයේ දී දේශපාලන පුවත් හා ලිපි හෝ අතිරේක රජයේ හෝ රාජ්‍ය ආයතනවල වියදමින් පළ නොකිරීම.
07. ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද හිමියන් හෝ රජයේ නිලධාරීන් තනිවම හෝ සමූහ වශයෙන් හෝ ස්වකීය පෞද්ගලික හෝ නිල නිවාසවලට කැඳවා සංග්‍රහ කිරීමෙන් වැළකීම.
08. කිසියම් ආකාරයෙන් මූල්‍ය ප්‍රදාන කිරීම හෝ පොරොන්දු දීම්, ව්‍යාපෘති හෝ යෝජනා සඳහා මුල්ගල් තැබීම්, මාර්ග , ජල හා විදුලි ආදිය පහසුකම් සැපයීම සඳහා පොරොන්දු දීම හා තම පක්ෂයට වාසිවන ආකාරයට නම්මවා ගත හැකි ඡන්ද දායකයින් වෙනුවෙන් ක්‍රමානුකූල නොවන ආකාරයට හදිසියේ රාජ්‍ය අංශයේ තනතුරු හා පත්වීම් ප්‍රදානය කිරීමෙන් වැළකීම.
09. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම, මැතිවරණ කටයුතුවලට බාධා කිරීම, මැතිවරණ දූෂණ හා වැරදි සිදුකිරීම සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන අංශ විසින් සිදුකරන පරීක්ෂණවලට බාධා නොකිරීම හා එම අංශ වලට ස්වාධීනව ක්‍රියා කිරීමට අවශ්‍ය පසුබිම සැලසීම.
10. මැතිවරණ සමය තුළ විරුද්ධ පාර්ශ්වවලට හා ඒවායේ ක්‍රියාකාරීන්ට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මඟින් වැරදි චෝදනා ඉදිරිපත් කරමින් හා අදාළ පාර්ශවයන්ට එබඳු අවස්ථාවල දී පිළිතුරු දීමට පවා අවකාශ ලබානොදී ඉදිරිපත් කරන වැඩසටහන් ප්‍රචාරණය කිරීමට මාධ්‍ය යොදා නොගැනීම.
11. දේශපාලන පක්ෂයක් හෝ දේශපාලනඥයන් සම්බන්ධයෙන් කරනු ලබන විවේචන හා චෝදනා වලට ප්‍රතිචාර දැක්වීමට ප්‍රචණ්ඩකාරී නොවන නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයෙන් පමණක් පිළිතුරු සැපයීම.
12. මහජන නියෝජිතයින්ගේ නීත්‍යානුකූල රැකවලුන් වශයෙන් කටයුතු කරනු ලබන පොලිසියේ හා අනෙකුත් ආරක්ෂක අංශවල නිලධාරීන් නිල නොවන ආකාරයට දේශපාලන මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට යොදා ගැනීම හා විරුද්ධ පාක්ෂිකයින්ගේ මැතිවරණ කටයුතු මැඩලීමට යොදවා ගැනීමෙන් වැළකීම.
13. කුමන දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන සංවිධානයක් තම මැතිවරණ කටයුතුවල දී නීත්‍යානුකූල නොවන ආකාරයට අවි ආයුධ සහිත පුද්ගලයින් සම්බන්ධ කරගෙන කටයුතු කරන්නේ නම්, එවැනි ක්‍රියා ප්‍රසිද්ධියේ හෙලා දැකීම හා ඒවා මැඩලීම සඳහා අදාළ අංශ දැනුවත් කිරීම.
14. ඡන්ද විමසීම් පැවැත්වෙන ප්‍රදේශයක රජය විසින් හෝ රජයේ අනුග්‍රහයෙන් සැණකෙළි, සංදර්ශන හෝ ප්‍රදර්ශන ආදිය පැවැත්වෙන්නේ නම් එම අවස්ථා ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත්ව සිටින අපේක්ෂකයින්ගේ හා පක්ෂවල ජයග්‍රහණය පිණිස දේශපාලන ප්‍රචාරණ කටයුතුවලට සම්බන්ධ කරගැනීමට ක්‍රියා නොකිරීම.

ඡන්ද විමසීමට ඉදිරිපත් වන සියළුම දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නායකයින්, තම අපේක්ෂකයින් මේ කරුණු සම්බන්ධව දැනුවත් කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, මෙම ආචාර ධර්ම පද්ධතියේ ඇතුළත් දෑ ඔවුන් අනුගමනය කරනු ලබන බවට පක්ෂ නායකයින් හා ස්වාධීන කණ්ඩායම් සෑහීමට පත්විය හැකි වැඩ පිළිවෙලක් ද යොදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙය 2014 සැප්තැම්බර් මස පැවැත්වෙන පළාත් සභා ඡන්ද විමසීමේ දී තරඟ කරන සියළුම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් මෙන්ම ඡන්ද විමසීමට ඉදිරිපත් නොවූ පිළිගත් දේශපාලන පක්ෂ, මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් සහ ජනමාධ්‍ය ආයතනවලට ද නිකුත් කරනු ලැබේ.

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2014 ජූලි මස 28 වන දින දීය.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

ඇමුණුම 27

උඩ පළාතේ පළාත් සභා ඡන්ද විමසීම - 2014.09.20
ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා අවසරලත් නිරීක්ෂණ ආයතන හා නිරීක්ෂකයින් විසින් පිළිපැදිය යුතු නියාමන

1. මැතිවරණ නිරීක්ෂණ ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ජංගම නිරීක්ෂකයින් සහ ඡන්ද පොළ නිරීක්ෂකයින් වශයෙන් තෝරා ගනු ලබන පුද්ගලයන් පසු ගිය වසර 5 ඇතුළත ක්‍රියාකාරී දේශපාලනයේ නිරත නොවූ, ඡන්ද විමසීම්වල දී අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වී නැති ඡන්ද හිමියන් වශයෙන් සුදුසුකම් ලබා ඇති මධ්‍යස්ථ පුද්ගලයින් විය යුතු ය. සියලුම නිලධාරීන් සහ නිරීක්ෂකයන් දිවුරුම් ප්‍රකාශයක් / ප්‍රතිඥාවක් මගින් ඒ බව තහවුරු කළ යුතු අතර, අවශ්‍ය අවස්ථාවක පරීක්ෂා කිරීමට හැකි වන පරිදි එම දිවුරුම් ප්‍රකාශ / ප්‍රතිඥා නිරීක්ෂණ ආයතනය භාරයේ සුරක්ෂිතව තැබිය යුතුය. (ආදර්ශ දිවුරුමෙහි / ප්‍රතිඥාවෙහි පිටපතක් අමුණා ඇත.)
2. මැතිවරණ නිරීක්ෂණ ආයතනයක කිසියම් නිලධාරියකු හෝ කිසියම් නිරීක්ෂකයකු දේශපාලන සම්බන්ධතා මත රජයෙන් හෝ වෙනත් සංවිධානයක් මගින් ලබා දුන් කිසියම් තනතුරක් දරන්නකු හෝ පසු ගිය වර්ෂ 5 ක් ඇතුළත එවැනි තනතුරු දැරූවකු හෝ නොවිය යුතුය.
3. නිරීක්ෂණ ආයතන විසින් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් සතු ගොඩනැගිලි, වාහන, දුරකථන ආදී පහසුකම් කිසිවක් තම නිරීක්ෂණ ආයතනයේ කටයුතු සඳහා යොදා නොගත යුතුය.
4. මැතිවරණ නිරීක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හෝ නිලධාරි මණ්ඩලයේ සාමාජිකයන් හෝ නිරීක්ෂකයන් කිසිදු දේශපාලන පක්ෂයක හෝ දේශපාලන කණ්ඩායමක අරමුණු ඔස්සේ කටයුතු නොකළ යුතුය.
5. මැතිවරණ නිරීක්ෂණ ආයතන මගින් ඡන්ද විමසීමට අදාළව මාධ්‍ය නිවේදන හා වාර්තා නිකුත් කිරීමේ දී කිසියම් පක්ෂයක් හෝ කණ්ඩායමක් නැතහොත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන හෝ අගතියට පත්වන අන්දමේ ප්‍රකාශ නිකුත් නොකිරීමට සහ සැමවිටම මධ්‍යස්ථව කටයුතු කිරීමට වගබලා ගත යුතුය.
6. මැතිවරණ නිරීක්ෂණ ආයතන විසින් මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්යයන් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා දැනුවත් කිරීමෙන් තොරව මාධ්‍ය නිවේදන හා මාධ්‍ය ප්‍රකාශ නිකුත් නොකළ යුතුය.
7. නිරීක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය, නිලධාරීන් සහ සියලුම නිරීක්ෂකයන් නිරීක්ෂණ කාර්යයේලා ඉටු කරනු ලබන සියලු කටයුතුවලදී දැඩි අපක්ෂපාතීත්වයෙන් යුතුව කටයුතු කිරීම අවශ්‍ය වේ. හැසිරීමෙන් මෙන්ම කතාබහෙන් ද ඒ අපක්ෂපාතීත්වය ප්‍රදර්ශනය විය යුතු අතර, අපක්ෂපාතීව කටයුතු කරන බවට ඒත්තු යා යුතුය.
8. කිසියම් නිරීක්ෂකයකු පක්ෂග්‍රාහීව කටයුතු කරන බවට යම් පැමිණිල්ලක් ලැබුනහොත් වහාම ඔහු හෝ ඇය එම නිරීක්ෂණ කාර්යයෙන් ඉවත් කර කඩිනමින් අදාළ පැමිණිල්ල විභාග කිරීම අවශ්‍ය වේ.
9. ඡන්ද පොළ තුළ රැඳී සිටීමින් නිරීක්ෂණයෙහි යෙදීමට අවසර ඇති නිරීක්ෂකයන් ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ඡන්ද පොළ නියෝජිතයන් හා ඡන්ද හිමියන් සමඟ අනවශ්‍ය කතා බහට නොයා යුතුය. ඡන්ද විමසීමේ සියලු කටයුතු පිළිබඳ රහස්‍යතාව ආරක්ෂා කිරීමත්, ඡන්ද පොළේ දී ඒ පිළිබඳ ප්‍රකාශ පත්‍රයක් අත්සන් කර ජ්‍යෙෂ්ඨ ඡන්දස්ථානාධිපති වෙත භාර දීමත් අවශ්‍ය වේ.
10. ජංගම හා ඡන්ද පොළ තුළ නිරීක්ෂණයෙහි යෙදෙන නිරීක්ෂකයන් පහසුවෙන් හඳුනා ගත හැකි පරිදි නිල ඇඳුමක් හෝ සුදුසු විශේෂිත ඇඳුමකින් සැරසී සිටිය යුතු අතර ඡන්ද විමසීම් දින නිරීක්ෂණයේ නිරත වන කාලය තුළ මත්පැන් පානයෙන් වැළකී සිටීම අත්‍යවශ්‍ය වේ. එසේ ඡන්ද පොළ තුළ දුම් පානය කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතා කර ඡන්ද පොළට පැමිණීම තහනම් වේ.
11. ඡන්ද පොළ තුළ රැඳී සිටීමින් නිරීක්ෂණයෙහි යෙදීමට අවසර ඇති නිරීක්ෂකයන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත ඇති 'බධර්' ආකෘති වාර්තාව ලබාගෙන නියමිත ආකාරයට සම්පූර්ණකොට තම නිරීක්ෂණ ද සඳහන් කර ඡන්ද විමසීම අවසානයේ දී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට භාර දිය යුතුය.
12. නිරීක්ෂණ සංවිධාන විසින් කරනු ලබන පැමිණිලි සියල්ලක්ම සනාථ කළ හැකි සාක්ෂි සහිත කරුණුවලට පමණක් අදාළ විය යුතු ය.

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2014.08.09

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පරිශිෂ්ඨ 28

මෙය අදාළ නැනැත්තන්ගෙන් ලබාගෙන නිරීක්ෂණ සංවිධාන විසින් සුරක්ෂිතව තබා ගත යුතු ප්‍රතිඥාවක ආදර්ශයකි. අවශ්‍යතාවක් ඇතිවුවහොත් මෙවැනි ප්‍රතිඥා පරීක්ෂා කිරීමට මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

පළාත් සභා ඡන්ද විමසීම 2014
මැතිවරණ නිරීක්ෂණ ආයතන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, නිලධාරීන් සහ සියලුම නිරීක්ෂකයින් විසින් ලබා දිය යුතු ප්‍රතිඥාව.

නිරීක්ෂණ ආයතනය : .....

මෙම ඡන්ද විමසීමට අදාළව ඉහත නම් සඳහන් නිරීක්ෂණ ආයතනයේ ..... වශයෙන් තෝරා ගනු ලැබූ ..... ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක .....දරන .....වන මම,

I. ශ්‍රී ලංකාව තුළ ඡන්ද හිමියකු වශයෙන් ලියා පදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්,
II. සස)පසු ගිය වසර පහ තුළ ක්‍රියාකාරී දේශපාලන කටයුතුවල නිරත නොවූ බවත්, රජයෙන් හෝ වෙනත් දේශපාලන සංවිධානයක් මගින් දේශපාලන සම්බන්ධතා මත ලබා දුන් කිසිදු තනතුරක් නොදැරූ බවත්, දැනට එබඳු තනතුරක් නොදරන බවත්,
III. මා ඇතුළු මගේ නිවසේ පදිංචි කිසිවකු ක්‍රියාකාරී දේශපාලනයේ නිරත නොවන බවත්,
IV. පෞද්ගලික මති මතාන්තර වලින් ඈත්ව දැඩි අපක්ෂපාතිත්වයෙන් යුතුව හෘද සාක්ෂියට එකඟව මෙම ඡන්ද විමසීමට අදාළව පැවරී ඇති කටයුතු ඉටු කරන බවත්,
V. ඡන්දපොළක් තුළ ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කිරීමට අවසරය ලදහොත්, එවැනි ඡන්දපොළක ඡන්ද විමසීමට අදාළව සිදුවන අඩුපාඩු සහ කලබලකාරී ක්‍රියාවන් නිරීක්ෂණය වුවහොත් ඊට අදාළ තොරතුරු නිවැරදිව මාගේ නිරීක්ෂණ වාර්තාවට ඇතුළත්කොට ඒ ඡන්ද මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට භාරදෙනු ලබන බවත්,
VI. කිසියම් පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු තෝරා පත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමට හෝ අගතියට පත් කිරීමට වචනයෙන් හෝ ක්‍රියාවෙන් යමක් නොකිරීමට නිරීක්ෂණ ආයතනයක සාමාජිකයකු වශයෙන් මා බැඳී සිටින බව හොඳින් අවබෝධ කර ගෙන ඇති බවත්, ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි.

අත්සන : .....
නම : .....

ඉහත සඳහන් ප්‍රතිඥාව
..... දින ..... දී
මා ඉදිරිපිටදී අත්සන් කරන ලදී.

.....
සාමදාන විනිශ්චයකාරවරයාගේ අත්සන
නිල මුද්‍රාව

පරිශිෂ්ඨ 29

රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම

උඟව පළාතේ පළාත් සභා ඡන්ද විමසීම් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත අතර, ඒ සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම් 2014.07.16 දින ප්‍රසිද්ධ කර ඇත. එදින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් වූ කාල සීමාව "ඡන්ද විමසීමේ කාල සීමාව" ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් වේ. මෙම කාලසීමාව තුළ දී දේශපාලන පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රචාරණය කිරීමට හේතුවන නැතහොත් වෙනත් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයකු අගතියට පත්වන ආකාරයේ කටයුතු සඳහා රාජ්‍ය දේපල භාවිතා කිරීමෙන් වැළකිය යුතු බව හා ඡන්ද විමසීම පැවැත්වෙන දිස්ත්‍රික්කවල රජයේ නිලධරයන්/ සේවකයන් බඳවා ගැනීම් යනාදී කරුණු සීමා කළ යුතු බව රාජ්‍ය දේපල හා වර්තමාන පාලනය භාරව සිටින අමාත්‍යාංශ ලේකම්වරුන් ප්‍රමුඛ සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම් වස් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වන ව්‍යවස්ථා සංශෝධනයේ 104 (ආ) (4) (අ) ව්‍යවස්ථාවන් අනුව "මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපලක්" යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරාපත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට අයත්ය. මැතිවරණ කොමිෂන් සභාව මේ වන තුරු පිහිටුවා නොමැති බැවින් මෙම බලතල වත්මන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කළ හැකිය. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපල භාරව සිටින සියළුම නිලධාරීන් බැඳී සිටී.

03. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජය සතු මෝටර් රථ, ජීප් රථ ආදී සියළුම වාහන සහ හෙලිකොප්ටර් සහ ගුවන් යානා යොදවා ගන්නා බවට පසුගිය මැතිවරණ අවස්ථාවල දී ද මෙම දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබී ඇත. එබැවින් රජයේ වාහන භාරව සිටින සියලු නිලධාරීන් එම වාහන යම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා නොවන ආකාරයට මැතිවරණ කාල සීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු බව අවධාරණය කරමි. නිලධාරීන්ට වෙන් කර ඇති ීසටබැා ඩැයසජකි) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන රාජකාරී කටයුතු සඳහා යොදවන වාහන ද මීට ඇතුළත් වන බව සැලකිය යුතුය. මෙම කාල සීමාව තුළ දී නිලධාරීන්ට වෙන්කර ඇති ීසටබැා ඩැයසජකි) වාහන හැර විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන සහ අනිකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගත යුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කර එම වාහන මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට නොයෙදෙන බවට සැහීමකට පත්විය යුතුය. රාජකාරී කටයුතු සඳහා යෙදවූ බව ව්‍යාජ සටහන් යොදා රජයේ වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් යොදා තිබූ අවස්ථා පසුගිය ඡන්ද විමසීම්වල දී වාර්තා වී ඇති හෙයින් එවැනි ව්‍යාජ කරුණු සඳහා රජයේ වාහන නොයෙදවීමට වගබලා ගත යුතුවේ.

අතිගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂක අංශය සඳහා වෙන් කර ඇති වාහන දෙකකට හැර වෙන කිසිදු වාහනයකට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් වෙන් කරනු ලැබූ අනන්‍ය ලියාපදිංචි අංකය රහිතව ධාවනය කළ නොහැකි බැවින් කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට, ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හෝ වෙනත් කිසිවකුට අදාළ නියමිත ලියාපදිංචි අංකය රහිතව රජයේ හෝ රාජ්‍ය ආයතනවල වාහන භාවිතා කළ නොහැකිය. එබැවින් සියලු දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන සතු වාහන ගරාජ අංකවලින් (ව්‍යාජ අංකවලින්) ධාවනයේ නොයෙදෙන බවට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිසැක විය යුතුය.

04. රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජයේ සම්පත් වේ. එම නිසා එම ගොඩනැගිලි දේශපාලන රැස්වීම්, සාකච්ඡා ආදියට යොදවා ගැනීම ද නොකළ යුතුය. මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින්ට රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් බව ද සැලකිය යුතුය. තවද අදාළ පළාත්වල පිහිටි රජයේ හෝ රාජ්‍ය ආයතන සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන යනාදිය කිසිදු දේශපාලඥයකුට, නිලධරයකුට, වෙනත් පුද්ගලයෙකුට ඡන්ද විමසීම් කාලසීමාව තුළ පූර්ණකාලීනව වෙන් කර දීමෙන් වැළකිය යුතුය. එමෙන්ම එවැනි ස්ථානවල නවාතැන් ගන්නා පුද්ගලයින්ට දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය

කිරීමේ කටයුතුවල නිරත වීමට ඉඩ නොදිය යුතුය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර් කටවුට් ආදිය ප්‍රදර්ශනය සඳහා භාවිතා කිරීමට ද ඉඩ නොදිය යුතුය.

05. (i) ඡන්ද විමසීම් කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ ජංගම සේවා, ප්‍රදර්ශන, විවෘත කිරීම් වැනි උත්සව ආදිය දේශපාලන අංශවලට සම්බන්ධ පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරෙන අතර එම අවස්ථාවල දී ඡන්ද විමසීමට අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වීමට ඉඩ ඇත. එබඳු ප්‍රකාශයක් ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වයට ද අනිසි ලෙස බලපානු ඇත. මෙවැනි උත්සව පැවැත්වීමෙන් යම් පක්ෂයක්/ කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනත් පක්ෂයක්/කණ්ඩායමක් /අපේක්ෂකයකුට අගතියක් වන බවට පැමිණිලි ලැබිය හැකි හෙයින් මෙම ඡන්ද විමසීම් කාලය තුළ එබඳු උත්සව අවස්ථා පැවැත්වීමෙන් වැළකී සිටීම යෝග්‍ය බව පෙන්වා දෙනු කැමැත්තෙමි. මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යාවශ්‍ය ජංගම සේවා මෙම ඡන්ද විමසීම් කාලසීමාව තුළ පැවැත්වීමට ඡන්ද විමසීමට අදාළ නාමයෝජනා කැඳවීමේ දැන්වීම නිකුත් කිරීමට පෙර නියම කරගෙන ඇත්නම් එවැනි අවස්ථා පිළිබඳව වහාම මා වෙත දැන්වීමට ක්‍රියා කළ යුතු වේ. එවිට ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙනු ඇත. එසේ වුවත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් හෝ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජංගම සේවා සඳහා මෙම සීමා කිරීම බලනොපැවැත්වේ. මෙවැනි ජංගම සේවා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පමණක් පැවැත්වීමට වගබලා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ.

(ii) මෙම කාලසීමාව තුළදී අදාළ ඡන්ද විමසීම් ප්‍රදේශ තුළ පදිංචිකරුවන්ට රජයේ ඉඩම් බෙදා දීම්, රජයේ ඉඩම් හිමිකම් ඔප්පු හෝ නිවාස අයිතිය පැවරීමේ ඔප්පු ප්‍රදානය කිරීම්, වැවිලි කර්මාන්ත සඳහා හෝ වගා කටයුතු සඳහා සහනාධාර, පොහොර, කෘෂි උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, ස්වයං රැකියා සඳහා උපකරණ, පාපැදි, සූර්ය බල විදුලි පහන්, නිවාස ඉදිකිරීම් සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය බෙදාහැරීමේ ව්‍යාපෘති හා නිවාස ණය නිකුත් කිරීම්/ වන්දි මුදල් ප්‍රදානය කිරීම් වැනි වැඩසටහන් අත්හිටුවිය යුතුය. එසේ ලබා දෙන බවට රාජ්‍ය නිලධාරීන් විසින් නිවේදන නිකුත් කර ඒ සඳහා ලැයිස්තු සකස් කිරීමද මෙම කාලසීමාව තුළ නොකළ යුතුය. මක්නිසාදයත්, එවැනි කාර්යයන් මගින් ඡන්දදායකයන්ට සංග්‍රහ කිරීමේ වරද සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයින් හා මෙවැනි ව්‍යාපෘති හා වැඩසටහන් මගින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් ප්‍රවර්ධනය සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයිනි. තවද, නිවාස ණය ආධාර ලබා දීම සඳහා ආකෘති බෙදා හැරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දීම සඳහා ආකෘති බෙදා හැරීම වැනි කටයුතු සිදු කිරීමද අත්හිටුවිය යුතුය. එසේ වුවද කල්තැබිය නොහැකි හදිසි ව්‍යාපෘති / වැඩසටහන් සඳහා දැනටමත් දින නියම කර තිබේ නම් හෝ හදිසි විශේෂිත අවශ්‍යතාවක් ඇති වුවහොත් හෝ ඒ සම්බන්ධයෙන් මා වෙත දන්වා එවිය යුතුය. එවිට ඒ පිළිබඳව සුදුසු උපදෙස් නිකුත් කරනු ලැබෙනු ඇත. එවැනි ව්‍යාපෘති / වැඩසටහන් වුවද ක්‍රියාත්මක කළ යුත්තේ කිසිදු දේශපාලන පක්ෂයක/ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට විශේෂ වාසියක් (හෝ අගතියක්) නොවන පරිදි වන බවත්, ඒ සඳහා නිලධාරීන් පමණක් සහභාගී විය යුතු බවත් සැලකිය යුතුය.

06. (i) තවද මෙම ඡන්ද විමසීමට අදාළව රජයේ හෝ රාජ්‍ය සංස්ථා ඇතුළු ආයතනවල නිලධාරීන් කිසිවකුට කාර්යාල වේලාව තුළ හෝ කාර්යාල දිනවල රාජකාරී නිවාඩු ලබාගෙන හෝ කිසියම් පක්ෂයක්/ කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ කිසියම් පක්ෂයකට / කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට එරෙහිව ක්‍රියා කිරීම සඳහා අවකාශ නොදිය යුතු අතර එසේ ක්‍රියා කරන නිලධාරීන් / සේවකයන් පිළිබඳව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුවේ.

(ii) අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ මාණ්ඩලික නිලධාරීන්,සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල මාණ්ඩලික නිලධාරීන්, ග්‍රාමනිලධාරීන් / වන නිලධාරීන් වැනි සාම නිලධාරීන් හා ආරක්ෂක අංශවල සාමාජිකයින් ස්වකීය කාර්යාල වේලාවල තුළ පමණක් නොව කාර්යාල වේලාවෙන් බැහැරව මෙන්ම නිවාඩු දිනවලදී වුවද වක්‍රව හෝ සෘජුව හෝ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන ආකාරයේ නැතහොත් අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමෙන් හෝ ඒවාට අනුබල දීමෙන් හෝ වැළකී සිටිය යුතුය. එනම්, දේශපාලන අයිතිවාසිකම් රහිත සියලුම නිලධාරීන්ට දේශපාලනමය කටයුතුවල යෙදීමට අවසර නොමැති බවට වූ නියමය ඉතා තදින් බලාත්මක කළ යුතුය.

(iii) තවද සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන්ද මෙම ඡන්ද විමසීම් කාල සීමාව තුළදී කිසිදු දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වල යෙදීමෙන් වැළකී සිටිනු ඇතැයි කාරුණිකව අපේක්ෂා කරනු ලැබේ.

07. (i) දහඅටවන ව්‍යවස්ථා සංශෝධනය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන බලතල යටතට ගැනෙන කරුණුවලට දහහත්වන ව්‍යවස්ථා සංශෝධනයේ සීමාකිරීම් බලපානු නොලැබේ. එබැවින් එම කොමිෂන් සභාවල බලතල යටතේ විධිමත් ලෙස කරනු ලබන බඳවාගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් හැර ජන්ද විමසීම් සඳහා නාමයෝජනා කැඳවා ඇති ඉහත සඳහන් පළාත්වල රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා ගැනීම්, පත්වීම් හා උසස්වීම් සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

(ii) ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත පළාත් සභා බල ප්‍රදේශයේ ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් 2014.07.16 වන දින සිට ඡන්ද විමසීම් අවසන් වී සති 02ක් ගතවනතුරු අත්හිටුවිය යුතු අතර, ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවනු නොලබන රජයේ හෝ රාජ්‍ය සංස්ථා නිලධාරීන් හෝ ඡන්ද විමසීම් කාල සීමාව තුළ ස්ථාන මාරු කිරීමේ දී දේශපාලන හේතූන් මත එකී ස්ථාන මාරුවීම් සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීමට සියලුම බලධාරීන් කටයුතු කිරීම යෙහෙකි.

(iii) ඡන්ද විමසීම් කාල සීමාව තුළ ඡන්ද විමසීම් බල ප්‍රදේශය තළ සේවයේ නියුතු නිලධාරීන් අත්‍යාවශ්‍ය හේතූන් මත උදාහරණ වශයෙන් ශිෂ්‍යත්ව, උසස් අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාර, වන්දනා ගමන් යනාදිය සඳහා සිදු කෙරෙන විදේශ ගමන් සීමා කිරීමට අපේක්ෂා නොකෙරේ.එබැවින් එවැනි අවශ්‍යතා සඳහා නිලධාරී විදේශ ගත වීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවක් නැත. එසේ වුවද ඡන්ද විමසීම් දිස්ත්‍රික්කවල නිලධාරීන් සමූහ වශයෙන් මෙම කාලය තුළ විදේශගත වන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. තවද, ඡන්ද විමසීම් නියම කර ඇති දිනට පළාත් සභාවේ ප්‍රතිපාදන වැය කරමින් නිලධාරීන් විදේශගතවීම් සිදු කරන්නේ නම් එකී විදේශගතවීම් ඡන්ද විමසීම් කාල සීමාවෙන් පසු සිදු කිරීමට ක්‍රියා කළ යුතු ය. එසේ වුවද ඉතා හදිසි හා කල් තැබිය නොහැකි හේතු නිසා විදේශගතවීම් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අනුමැතිය දීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි අවස්ථා සම්බන්ධයෙන් වූ ඉල්ලීම් කල්වේලා ඇතිව ඉදිරිපත් කිරීම යෙහෙකි.

(iv) මෙම පළාත් සභාව විසුරුවා හැරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම්/ උසස් කිරීම්වලට අදාළ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් කල්දැමීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතුයයි අමාත්‍යාංශ ලේකම්වරයා අපේක්ෂා කරන විට දී හා සමස්ත දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළ වන විධිමත්ව, දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සිදු කෙරෙන වෙනත් බඳවා ගැනීම්/ උසස් කිරීම් සඳහා මෙම චක්‍රලේඛය අදාළ නොවේ.

(v) තවද රජයේ හා පළාත් සභාවල සාමාන්‍ය පරිපාලන කටයුතුවලට අදාළව සිදු කරනු ලැබ ඇති 2014 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට අදාළ අභියාචනා බලාත්මක කිරීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ විධිවිධාන බල නොපැවැත්වෙන බව ද සැලකිය යුතුය.

(vi) තවද, කිසියම් විශේෂිත අත්‍යවශ්‍ය කරුණක් හේතුවෙන් (එනම් විනය ක්‍රියාමාර්ග, නිලධාරියාගේ ඉල්ලීම මත සානුකම්පිතව ක්‍රියාකිරීමට සිදුවීම, යම්කිසි පාඨශාලාවකට අත්‍යාවශ්‍ය ගුරුවරුන් ලබාදීම වැනි කරුණු හේතුවෙන්) ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත උඟව පළාත් සභා බල ප්‍රදේශයේ නිලධාරීන්/ ගුරුවරුන්/ විදුහල්පතිවරුන් ස්ථාන මැරුකිරීමට සිදුවන විට එම මාරුකිරීම් දේශපාලනමය සිද්ධීන් නිසා කරනු ලබන මාරුවීම් නොවන බවට සනාථ කළ හැකි නම් නැතහොත් ඒ සම්බන්ධයෙන් පැමිණිලි/ චෝදනා නොලැබේ නම් එවැනි මාරුවීම් සම්බන්ධයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලය දැනුවත් කරනු ලැබූ පසු ඒ සඳහා අනුමැතිය ලබාදිය හැකිය.

08. ඡන්ද විමසීම පැවැත්වෙන පළාතේ පමණක් නොව ඡන්ද විමසීම නොපැවැත්වෙන සෙසු පළාත්වලද රාජ්‍ය දේපල විශේෂයෙන්ම රජයේ ආයතන හා නිලධාරීන් ඡන්ද විමසීමට අදාළ පක්ෂ / කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යෙදවීමේ ප්‍රවණතාවක් ඇති බවට පසුගිය ඡන්ද විමසීම්වල දී පැමිණිලි ලද හෙයින් එවැනි අකටයුතු සඳහා කිසිදු අවකාශයක් නොදිය යුතු ය. පසුගිය පළාත් සභා ඡන්ද විමසීම්වල දී ලද පැමිණිලිවලින් වාර්තා වූ පරිදි ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශයන්වල හදිසි රාජකාරී කටයුතු හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම යනාදී කරුණු ඉදිරිපත් කරමින් පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම සඳහා (නැතහොත් අගතියට පත් කිරීම සඳහා) ඡන්ද විමසීම් ප්‍රදේශවලින් බැහැර රජයේ / රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා රජයේ / රාජ්‍ය ආයතන සතු හෝ කුලියට ගත් වාහන ඡන්ද විමසීම් ප්‍රදේශයේ කාර්යාලවලට අනුයුක්ත කිරීම් වැනි අකටයුතු සිදු කිරීමට කිසිදු නිලධරයකුට ඉඩ නොදිය යුතු බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම ඡන්ද විමසීම් කාලය තුළ උඟව පළාත තුළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද කල් තැබිය යුතුවේ.

09. මෙම ඡන්ද විමසීමේ දී පළාත් සභා මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපල භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම තහනම කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළ යුතුය. තවද, ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු,

රාජ්‍ය සංස්ථා හා වෙනත් ආයතනවල ප්‍රධානීන්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට ක්‍රියා කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය.

10. ඡන්ද විමසීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට/ මැතිවරණ කොමසාරිස්වරයාට සහාය දැක්වීම අදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්යය විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවෙහි කර ඇති සඳහන පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය බව කාරුණිකව දන්වා සිටිනු කැමැත්තෙමි.

11. මෙම චක්‍රලේඛ ලිපියේ සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු සහ නියෝජ්‍ය ඇමතිවරුන් සහ අමාත්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරෙන බවද පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් හා සෙසු අමාත්‍යවරුන් දැනුවත් කිරීම, ප්‍රධාන ලේකම්වරයා හා අදාළ පළාත් සභා අමාත්‍ය ලේකම්වරුන්ගේ වගකීම බවත් සලකනු මැනවි.

12. එමෙන්ම අදාළවන විට කොමිෂන් සභාවල ලේකම්වරුන් එකී කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයන් චක්‍රලේඛය පිළිබඳව දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතුවේ.

13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට අමතරව, ඔබේ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නැතහොත් ගණන් දීමේ නිලධාරී වශයෙන් ද රජය සතු දේපල අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම ද අදාළ නිලධාරීන්ගේ වගකීමක් බව මෙහි ලා සඳහන් කරමි.

14. මෙම ලිපියේ සඳහන් කරුණු පිළිබඳව සුපුරුදු පරිදි පිළිගත් දේශපාලන පක්ෂ, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන දැනුවත් කරනු ලබනු ඇති අතර "මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, දේශපාලන පක්ෂ නියෝජිතයින් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්ගෙන් සමන්විත ඡන්ද විමසීම් සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳව ක්‍රියාකිරීමේ මධ්‍යස්ථානය" විසින් මෙහි සඳහන් කරුණුවලට අදාළව ලැබෙන පැමිණිලි ගැන විමර්ශනය කරනු ඇති බවත් ඡන්ද පෙත්සම්වලදී සහ අගතියටපත් පාර්ශ්ව විසින් ගනු ලබන වෙනත් අධිකරණ ක්‍රියාමාර්ගවල දී මෙහි සඳහන් උපදෙස්වලට අනුකූල නොවන ක්‍රියා පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට අවකාශ ඇති බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පරිශිෂ්ඨ 30

පළාත් සභා ඡන්ද විමසීම - 2012/2014
1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 61 අ (2) වගන්තිය යටතේ
තෝරා පත් කර ගන්නා ලද මන්ත්‍රීවරුන්

පළාත් සභාවේ නම	මන්ත්‍රීවරුන් අයත් වන දේශපාලන පක්ෂය	තෝරා පත් කළ මන්ත්‍රීවරුන්ගේ නම්
නැගෙනහිර	එක්සත් ජනතා නිදහස් සන්ධානය	තෙන්නකෝන් මුදියන්සේලාගේ ජයසේන
		තුරෙයියප්පා නවරත්නරාජා
උතුරු මැද	එක්සත් ජනතා නිදහස් සන්ධානය	ගුණරත්න සුසිල්
		ජයන්ත මාරසිංහ
සබරගමුව	එක්සත් ජනතා නිදහස් සන්ධානය	අනුරප්‍රිය නමින්ද එම්.එල්.
		ආනන්ද මිල්ලන්ගොඩ
මධ්‍යම	එක්සත් ජනතා නිදහස් සන්ධානය	තල්ගස්වත්තේ දොන් ජයතිස්ස
		අපනායක නිමල් පියතිස්ස
උතුරු	ඉලංකෙයි තමිල් අරසු කච්චි	අයියූබ් අස්මින්
		මේරිකමලා ගුණසීලන්
වයඹ	එක්සත් ජනතා නිදහස් සන්ධානය	අසුරමාන පේජ්ජලාගේ කීර්තිරත්න
		ඇන්.ටී.ඇම්.ඇම්. තාහිර්
බස්නාහිර	එක්සත් ජනතා නිදහස් සන්ධානය	ෆවිසි මොහමඩ් නව්සර්
		හමුදු ධම්මික ලලන්ත ගුණසේකර
දකුණු	එක්සත් ජනතා නිදහස් සන්ධානය	කාරියවසම් හපුතන්ත්‍රි ගමගේ දුල්ෂාන් පද්මසිරි
		ආනන්ද සෙනරත්විදාන පතිරණගේ
ඌව	එක්සත් ජනතා නිදහස් සන්ධානය	ආරුමුගම් සිවලිංගම්
		දයාරත්න බණ්ඩාර වැදිවල මුදියන්සේලාගේ

පළාත් සභා ඡන්ද විමසීම් 2012-2014
පළාත් සභා ඡන්ද විමසීම් වලට අදාළ අධිකරණ ක්‍රියා මාර්ග

අධිකරණය සහ නඩු අංකය	පළාත් සභාව	අදාළ දිස්ත්‍රික්කය	පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන්	කාරණය	වගඋත්තර කරුවන්	නීන්දුව
ග්‍රේෂ්ඨාධිකරණය SCFR/514/2012	නැගෙනහිර	අම්පාර	එම්.ටී.හසීන් අලි මොවුලාවි එස්.එල්.එම්. හනීෆා ඒ එල්.තවම්	2012 පැවති පළාත් සභා ඡන්ද විමසීමේ දී ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ අපේක්ෂකයන්ට හා ආධාරකරුවන්ට එරෙහිව පැවති ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගොනු කර ඇත.	මැතිවරණ කොමසාරිස් (6වන වගඋත්තරකරු) ඇතුළු තවත් 6 දෙනෙකු	පෙත්සම්කරු ඉදිරිපත් නොවීම නිසා පෙත්සම නිෂ්ප්‍රභා කර ඇත. 2013.03.25
අභියාචනාධිකරණය CA(writ)306/2012	නැගෙනහිර	ත්‍රිකුණාමලය	ජේ.එම්.ලහාර්	මනාප නැවත ගණන් කර ලෙස ඉල්ලීම. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය	මැතිවරණ කොමසාරිස් (1වන වගඋත්තරකරු) තේරීම්භාර නිලධාරී (2 වන වගඋත්තරකරු) සහකාර තේරීම්භාර නිලධාරී (3වන වගඋත්තරකරු) ඇතුළු තවත් 14 දෙනෙකු	මනාප නැවත ගණන් කිරීමට ඇති හේතුවන ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම නිසා නිෂ්ප්‍රභා කර ඇත. 2014.02.20
අභියාචනාධිකරණය CA/178/2012	නැගෙනහිර	මඩකලපුව	ආර්.තුරෙයිරත්නම්	නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීම අත්හිටුවන ලෙස ඉල්ලීම	මැතිවරණ කොමසාරිස් (8වන වගඋත්තරකරු) ඇතුළු තවත් 7දෙනෙකු	නිෂ්ප්‍රභා කර ඇත. 2012.09.14
අභියාචනාධිකරණය CA(writ)/298/2012	නැගෙනහිර	මඩකළපුව	රාජනාදන් ප්‍රභාකරන් බන්නහි ඇතුළු තවත් තිදෙනෙක්	2012 නැගෙනහිර පළාත් සභාවට අදාළව මඩලපුව දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මනාප නැවත ගණන් කිරීම.	මැතිවරණ කොමසාරිස් (1 වන වගඋත්තරකරු) තේරීම්භාර නිලධාරී (2 වන වගඋත්තරකරු) සහකාර මැතිවරණ කොමසාරිස්රී (3වන වගඋත්තරකරු) ඇතුළු තවත් 16 දෙනෙකු	විභාග වෙමින් පවතී

අධිකරණය සහ නඩු අංකය	පළාත් සභාව	අදාළ දිස්ත්‍රික්කය	පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන්	කාරණය	වගඋත්තර කරුවන්	තීන්දුව
ශ්‍රේෂ්ඨාධිකරණය SC/SPL/01/2013	උතුර		බෙන්ගමුවේ නාලක හිමි	උතුරු පළාත් සභා ඡන්ද විමසීම අත්හිටුවන ලෙස ඉල්ලීම	මැතිවරණ කොමසාරිස් (4 වන වගඋත්තරකරු) නීතිපති (5 වන වගඋත්තරකරු) ඇතුළු තවත් 03 දෙනකු	වගඋත්තරකරුවන්ට දැන්වීම් නිකුත් නොකර නිශ්ප්‍රභා කර ඇත
ශ්‍රේෂ්ඨාධිකරණය SC/SPL/02/2013	උතුර		වෛද්‍ය ගුණදාස සූරියආරච්චි අමරසේකර	උතුරු පළාත් සභා ඡන්ද විමසීම අත්හිටුවන ලෙස ඉල්ලීම	මැතිවරණ කොමසාරිස් (4 වන වගඋත්තරකරු) නීතිපති (5 වන වගඋත්තරකරු) ඇතුළු තවත් 03 දෙනකු	වගඋත්තරකරුවන්ට දැන්වීම් නිකුත් නොකර නිශ්ප්‍රභා කර ඇත
ශ්‍රේෂ්ඨාධිකරණය SC/SPL/03/2013	උතුර		ජී.ඩී.පුනාවර්ධන අල්විස්	උතුරු පළාත් සභා ඡන්ද විමසීම අත්හිටුවන ලෙස ඉල්ලීම	මැතිවරණ කොමසාරිස් (4 වන වගඋත්තරකරු) නීතිපති (5 වන වගඋත්තරකරු) ඇතුළු තවත් 03 දෙනකු	වගඋත්තරකරුවන්ට දැන්වීම් නිකුත් නොකර නිශ්ප්‍රභා කර ඇත
ශ්‍රේෂ්ඨාධිකරණය SC/SPL/04/2013	උතුර		යූ.ඒ.අබේකෝන් සතස්චන්ද්‍ර ධර්මසිරි	උතුරු පළාත් සභා ඡන්ද විමසීම අත්හිටුවන ලෙස ඉල්ලීම	මැතිවරණ කොමසාරිස් (4 වන වගඋත්තරකරු) නීතිපති (5 වන වගඋත්තරකරු) ඇතුළු තවත් 03 දෙනකු	වගඋත්තරකරුවන්ට දැන්වීම් නිකුත් නොකර නිශ්ප්‍රභා කර ඇත
ශ්‍රේෂ්ඨාධිකරණය SC/SPL/05/2013	උතුර		ඒ.රවිකුමාර්	උතුරු පළාත් සභා ඡන්ද විමසීම අත්හිටුවන ලෙස ඉල්ලීම	මැතිවරණ කොමසාරිස් (4 වන වගඋත්තරකරු) නීතිපති (5 වන වගඋත්තරකරු) ඇතුළු තවත් 03 දෙනකු	වගඋත්තරකරුවන්ට දැන්වීම් නිකුත් නොකර නිශ්ප්‍රභා කර ඇත
ශ්‍රේෂ්ඨාධිකරණය SC/FR/360/2013	මධ්‍යම	මහනුවර	ඒ.කේ.අල්විස් ගලපිටගේ ඇතුළු තවත් 12 දෙනකු	එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන්ගේ මනාප නැවත ගණන් කිරීම-මධ්‍යම පළාත් සභාව	මහනුවර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී(1 වන වගඋත්තරකරු) නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, මහනුවර(3 වන වගඋත්තරකරු) මැතිවරණ කොමසාරිස්(4 වන වගඋත්තරකරු) නීතිපති(26 වන වගඋත්තරකරු)	නිශ්ප්‍රභා කර ඇත.

අධිකරණය සහ නඩු අංකය	පළාත් සභාව	අදාළ දිස්ත්‍රික්කය	පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන්	කාරණය	වගඋත්තර කරුවන්	තීන්දුව
අභියාචනාධිකරණය CA(Writ)187/2013	උතුර		ජයන්ත ලියනගේ	උතුරු පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීම වැළැක්වීමට තීන්දුවක් ලබා ගැනීම සඳහා	මැතිවරණ කොමසාරිස්(1 වන වගඋත්තරකරු) නීතිපති(2වන වගඋත්තරකරු)	ඉල්ලා අස්කර ගැනීමෙන් අනතුරුව නිශ්ප්‍රභා කර ඇත.
ශ්‍රේෂ්ඨාධිකරණය SC/FR/328/2013	වයඹ	කුරුණෑගල	සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂන සහකාර නිලධාරි සංගමය	මැතිවරණ කොමසාරිස්ගේ අංක ඡකෑ/2013/4ඊ හා 2013.09.12 දිනැති ලිපිය මගින් සමෘද්ධි නිලධාරීන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව	මධ්‍යම හා වයඹ හා උතුරු පළාත්වල සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්(3 සිට 12 දක්වා වගඋත්තරකරුවන්) මැතිවරණ කොමසාරිස් (15 වන වගඋත්තරකරු) නීතිපති(16 වන වගඋත්තරකරු) ඇතුළු තවත් 04 දෙනකු	ඉල්ලා අස්කර ගැනීමෙන් අනතුරුව නිශ්ප්‍රභා කර ඇත.
අභියාචනාධිකරණය CA(Writ)278/2013”	උතුර		ජයන්ත ලියනගේ	උතුරු පළාත් සභා ඡන්ද විමසීම අත්හිටුවන ලෙස ඉල්ලීම	මැතිවරණ කොමසාරිස් (1 වන වගඋත්තරකරු) යාපනය දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී(2 වන වගඋත්තරකරු) කිළිනොච්චි දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී(3 වන වගඋත්තරකරු) මන්නාරම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී(4වන වගඋත්තරකරු) වවුනියා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී(5 වන වගඋත්තරකරු) මුලතිවු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී(6 වන වගඋත්තරකරු) පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්(7 වන වගඋත්තරකරු) නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් (8 වන වගඋත්තරකරු) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් (9 වන වගඋත්තරකරු) නීතීපති(10 වන වගඋත්තරකරු)	වගඋත්තැකරුවන්ට දැන්වීම් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇත.

අධිකරණය සහ නඩු අංකය	පළාත් සභාව	අදාළ දිස්ත්‍රික්කය	පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන්	කාරණය	වගඋත්තර කරුවන්	තීන්දුව
අභියාචනාධිකරණය CA(Writ)296/2013	වයඹ	පුත්තලම	බත්තරමුල්ලේ සීලරතන හිමි	පුත්තලම ශාන්ත ඇන්ඩෘ විද්‍යාලයෙන් ඡන්ද පත්‍රිකා හමුවීම හේතුවෙන් වයඹ පළාත් සභා ඡන්ද විමසීම නැවත පවත්වන ලෙස ඉල්ලීම	මැතිවරණ කොමසාරිස් (1 වන වගඋත්තරකරු) අතිරේක මැතිවරණ කොමසාරිස් (2 වන වගඋත්තරකරු) පුත්තලම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී (3 වන වගඋත්තරකරු) පුත්තලම දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් (4වන වගඋත්තරකරු)	නිශ්ප්‍රභා කර ඇත.
දිසා මහේස්ත්‍රාත් අධිකරණය පුත්තලම බී/ආර්/1221/13/පී	වයඹ	පුත්තලම	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව	පුත්තලම ශාන්ත ඇන්ඩෘ විද්‍යාලයෙන් ඡන්ද පත්‍රිකා හමුවීම		ඡනද් පත්‍රිකා ගණන් කිරීමේ ශාලාවේදී හමුවීමට අදාළ අපරාධයක් හෝ සිතා මතා කරන ලද වරදක් බව අනාවරණය නොවන බැවින් අදාළ ස්ථානයෙන් හමුවූ ඡන්ද පත්‍රිකා නැවත මැතිවරණ කොමසාරිස්වරයා වෙත භාරදීමට තීරණය කර ඇත
අභියාචනාධිකරණය CA(Writ)316/2013	මධ්‍යම	මහනුවර	අළුත් ගෙදර හේරත් බණ්ඩා	මනාප නැවත ගණන් කරන ලෙස ඉල්ලීම		විභාග වෙමින් පවතී
ශ්‍රේෂ්ඨාධිකරණය SC/FR/219/2014	ඌව	බදුල්ල	හරීන් ප්‍රනාන්දු එච්.ඩබ්ලිව්.ටී.මිහිමල් මුණසිංහ	ඌව පළාත් සභා ඡන්ද විමසීමට අදාළව මන්ත්‍රී ආසන සංඛ්‍යාව තීරණය කිරීම	මැතිවරණ කොමසාරිස්	මූලික අයිතිවාසිම් උල්ලංඝනය වීමක් සිදු වී නොමැති බැවින් පෙත්සම නිශ්ප්‍රභා කර ඇත.

පරිශිෂ්ඨ 32

මධ්‍යම, උතුර හා වයඹ පළාත් සභා සඳහා 2013 සැප්තැම්බර් මස පැවැත්වෙන ඡන්ද විමසීම් පිළිබඳව විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන් විසින් පිළිපැදිය යුතු උපමාන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ අටවන සංශෝධනයෙන් සංශෝධනය වූ (දහහත්වන ව්‍යවස්ථා සංශෝධනයේ) 104ආ(5) ව්‍යවස්ථාව සහ මැතිවරණ පැවැත්වීමට අදාළ වෙනත් නීතිරීති යටතේ මැතිවරණ කොමසාරිස්, මහින්ද දේශප්‍රිය වන මට පැවරී ඇති බලතල, වගකීම් සහ කාර්ය භාරය අනුව නිදහස්, ස්වාධීන හා රහස්‍ය ඡන්ද විමසීම් පැවැත්වීම සහතික කිරීම සඳහා සියළුම මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන් විසින් පිළිපැදීමට අවශ්‍ය පහත සඳහන් උපමාන මෙයින් නිකුත් කරමි. මෙම උපමාන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා දැන්වීම නිකුත් කරනු ලැබූ දින සිට ඡන්ද විමසීමේ ප්‍රතිඵල නිකුත් කරන තෙක් වලංගු වේ.

1.1 ප්‍රවෘත්ති පත්‍රවල ඉඩ වෙන්කර දීමේදී හෝ ගුවන් කාලය ලබා දීමේදී කිසිම දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට, අපේක්ෂකයකුට හෝ පක්ෂ නායකයකුට හෝ වෙනස්කම් නොකළ යුතු අතර ඡන්ද විමසීම සම්බන්ධ වාර්තා කිරීමේදී සියළුම මුද්‍රිත, රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය ආයතන සමතුලිතතාවයක් හා අපක්ෂපාතීත්වයක් දැක්විය යුතුය.

1.2 ප්‍රවෘත්ති සහ වත්මන් තතු විකාශය කිරීමේදී සියළුම මාධ්‍ය ආයතන නිවැරදි, සමතුලිත සහ අපක්ෂපාතී විය යුතුය.

1.3 ප්‍රවෘත්ති පත්‍ර වල කර්තෘ මත ව්‍යාකූල මෙන්ම සමබර නොවීමේ විභවතාවක් ඇති විය හැකි නිසා කර්තෘ මත විද්‍යුත් මාධ්‍ය විසින් විකාශය නොකළ යුතුය. එසේ නමුදු කිසියම් හේතුවක් නිසා කර්තෘ අදහස් විකාශය කළහොත් ඊට විරුද්ධ අදහස් දැක්වීමට ඉල්ලා සිටින විටකදී එම අදහස් විකාශය කිරීමට බැඳී සිටිය යුතුය.

1.4 රාජ්‍ය ප්‍රධානියා, අගමැතිවරයා, ඇමතිවරු, බලයේ සිටින පක්ෂයේ සාමාජිකයින් විසින් පවත්වනු ලබන ප්‍රවෘත්ති සාකච්ඡා හා ප්‍රසිද්ධ ප්‍රකාශ මගින් ඇතිවන දේශපාලනමය මතභේද සම්බන්ධව ඊට විරුද්ධ දේශපාලන පක්ෂ වලට ද පිළිතුරු දීමට එක හා සමාන වේලාවක් ලබා දිය යුතුය. මුද්‍රිත මාධ්‍යවලද සමාන ඉඩක් ලබා දිය යුතුය.

1.5 ඡන්ද විමසීමට අදාළ ප්‍රචාරක කාර්යයන් සිදු කරන කාලය තුළදී සමතුලිතබව නොමැති වැඩසටහන් විකාශය නොකිරීමට සියළුම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති අංශය හා වත්මන් තොරතුරු විකාශය භාර අංශ වල වගකීම වේ.

1.6 යම් සිද්ධියක් හෝ සිදුවීමක් පිළිබඳව කරුණු විකාශය කිරීමේදී යම් පක්ෂයක් හෝ අපේක්ෂකයකුගේ අදහස් ඉදිරිපත් කරන විට එම කරුණ ගැන උනන්දුවක් හෝ සැලකිල්ල දක්වන හෝ එම කරුණින් බලපෑමක් ඇති විය හැකි අනෙකුත් පක්ෂ වලට එම ප්‍රවෘත්ති විකාශයේදීම හෝ වැඩසටහනේදී හෝ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දිය යුතුය. එදිනම ඒ අවස්ථාව ලබා දිය නොහැකි නම් එයට පසුදින හෝ ඒ සඳහා අවස්ථාව දිය යුතුය.

1.7 ඕනෑම වාර්තාමය වැඩසටහනක් හෝ විශේෂ වැඩ සටහනක් හෝ ඡන්ද විමසීම් සමයේදී විකාශය කිරීමේදී පිටපත්කරු, නිවේදක හා සංස්කාරකගේ නම සඳහන් කළ යුතුය.

1.8 පෙර අවස්ථා වලදී විකාශය කළ හෝ පළ කළ සාකච්ඡා, වාද විවාද සහ එබඳු වැඩසටහන් ඡන්ද විමසන දිනට පෙර පැය 48 කාලය තුළදී නැවත විකාශය කිරීම හෝ පළ කිරීම සිදු නොකළ යුතුය.

1.9 ඡන්ද විමසීම අවසන් වනතුරු අපේක්ෂකයන්ට හෝ දේශපාලන පක්ෂ වලට හෝ ස්වාධීන කණ්ඩායම් නායකයන්ට හෝ විරුද්ධව ඔප්පු කිරීමට නොහැකි චෝදනා ප්‍රවෘත්ති ප්‍රකාශන වලදී හෝ වැඩ සටහන් වලදී ප්‍රචාරය නොකළ යුතුය.

1.10 රාජකාරීමය උත්සව සහ අපරාධ ආදී ඡන්ද විමසීම මත අදාළ නොමැති ප්‍රවෘත්ති විසුරුවා හැරීමේදී සියළුම ආයතන විසින් පරීක්ෂාකාරීව මෙන්ම අනලස්ව කටයුතු කළ යුතුය.

1.11 ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ රජයේ අමාත්‍යවරු සම්බන්ධ වන දේශපාලන මත/ අදහස් ප්‍රකාශ කිරීමේ රූපවාහිනී/ ගුවන්විදුලි වැඩසටහන් වල ඔහු/ ඇය අයත් වන දේශපාලන පක්ෂයේ වැඩ සටහනක් ලෙස සැලකිය යුතු අතර එම නිසා එයට විරුද්ධ අදහස් දරන දේශපාලන පක්ෂ වල නායකයන්ට ද ඒ හා සමාන වැඩ සටහන් ලබා දිය යුතුය. මුද්‍රිත මාධ්‍යද ඒ අයුරින් දේශපාලන පක්ෂ/ කණ්ඩායම් වලට විශේෂ සාකච්ඡා ලබාදීමේදී/ ප්‍රචාරක පක්ෂ රැස්වීම් වාර්තා පළකිරීමේදී සමාන ඉඩක් හා ප්‍රමුඛතාව ලබා දිය යුතුය. තරඟ කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විශාල සංඛ්‍යාවක් ඇති බව ඒ සියලුම පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් සඳහා එක හා සමාන ගුවන් කාලයක් හෝ ප්‍රවෘත්ති පත්‍රවල ඉඩ කඩ ලබා දීම කළ නොහැකි නමුත් යම් කිසි පක්ෂයකට කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට විශේෂ සැලකිල්ලක් දක්වා ප්‍රවර්ධනය වන අයුරින් හෝ වෙනත් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් හට අගතියක් වන අයුරින් හෝ ගුවන් කාලය නැතහොත් ප්‍රවෘත්ති පත්‍ර වෙන් කිරීම නොකළ යුතුය.

1.12 කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගීවන්නන් තෝරා ගැනීමේ දී සියළුම විද්‍යුත් මාධ්‍ය ආයතන සාධාරණ ලෙස කටයුතු කළ යුතු අතර සාකච්ඡාවේ අඩංගු දෑ සමතුලිත විය යුතුය.

1.13 දුරකථන මාර්ග මගින් පවත්වනු ලබන වැඩ සටහන් වලදී, සියළුම අමතන්නන්ට ඔවුන්ගේ ප්‍රශ්නවල හෝ යෝජනා වල අඩංගු කරුණු කුමක් වුවද එක හා සමාන අවස්ථාවන් දිය යුතුය. දුරකථන මාර්ග මගින් පවත්වන වැඩසටහන් වලදී කාර්මික කටයුතු මෙහෙයවන නිලධාරීන් එම වැඩසටහන් වල සමබරතාවය ගැන වගකිව යුතුය.

1.14 කිසියම් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සභාපතිවරයකු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හෝ සේවකයෙකු දේශපාලන කටයුතු වල ක්‍රියාකාරීව නිරතව සිටී නම් එවැනි නිරතවීම් සමබර විකාශනයකට බාධා වන ගැටුම් වලට හේතුවේ. එබැවින් පහත සඳහන් කරුණු කළමනාකාරීත්වයේ දැන ගැනීම සඳහා දැනුම් දිය යුතුය.

ඇ. එවැනි පුද්ගලයන්ගේ මැදිහත්වීමේ මට්ටම

ඈ. එවැනි පුද්ගලයන්ගේ රැකියාවේ ස්වභාවය හා මට්ටම

ඇ. වැඩ සටහන්සැකසීමේ දී එවැනි පුද්ගලයන්ගේ මැදිහත් වීමේ ප්‍රමාණය

1.15 කිසියම් පුද්ගලයකු (කිසියම් ගුවන් විදුලි හෝ රූපවාහිනී හෝ මුද්‍රිත ආයතනයක සේවකයකු හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු) දේශපාලන පක්ෂයක කිසියම් නිලයක් දරන්නකු බවට ප්‍රසිද්ධියක් දරන්නේ නම් එම පුද්ගලයා ඡන්ද විමසීම නිමා වන තෙක් එවැනි තැනැත්තකු මාධ්‍යවේදියකු ලෙස ඉටු කරන කටයුතු වලින් ඉවත් විය යුතු අතර කිසිදු ගුවන් විදුලි හෝ රූපවාහිනී ආයතනයක මාධ්‍යවේදියකු ලෙස විශේෂයෙන්ම වැඩසටහන් මෙහෙයවන්නකු ලෙස ක්‍රියා කිරීමට අවසර නොදිය යුතුය. වැඩ සටහන් ඉදිරිපත් කිරීමේදී එවැනි පුද්ගලයන්ගේ දායකත්වය මහජනයාගේ දැන ගැනීම හෝ දැන ගැනීමට ලැබීම නිසා ඇති වන ඵල විපාකයන් කළමනාකාරීත්වය විසින් සලකා බැලිය යුතුය.

1.16 කිසියම් මාධ්‍ය ආයතනයක් විසින් ඉදිරිපත් කරන සාකච්ඡාවකට හෝ සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වීම කිසියම් පුද්ගලයකු විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක සහ එසේ ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු ඉදිරිපත් නොකෙරෙන අවස්ථාවක මාධ්‍ය ආයතනය විසින් එවැනි තත්ත්වයන්ට ගරු කළ යුතුය. එවැනි අවස්ථා වලදී හිස් පුටුවක් දර්ශනය කිරීම වැනි නාට්‍ය ස්වරූප උපායක් වෙනුවට සෘජු සහ සරල නිවේදනයක් මගින් එවැන්නක් ප්‍රකාශ කිරීමට පොළඹවනු ලැබේ.

1.17 මත විමසුමක ප්‍රතිඵල ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් විකාශය කිරීමේදී හෝ මුද්‍රිත මාධ්‍යයෙන් පළ කිරීමේදී එම මත විමසුම පවත්වන ලද සංවිධානය හඳුන්වා දීම එම කාර්යය පවරන ලද හා ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දුන් ආයතනය හෝ තැනැත්තා භාවිතා කළ ක්‍රමය, නියැදියේ ප්‍රමාණය, දෝෂ සීමාව සහ ක්ෂේත්‍රයේ කටයුතු කළ දින වකවානු සඳහන් කළ යුතුය. මත විමසුම පවත්වන ලද අවස්ථාවේ පැවැති මහජන මතය පමණක් මින් පිළිබිඹු වන බව විකාශක හෝ ප්‍රකාශක විසින් සඳහන් කළ යුතුය.

1.18 තරඟයට එළඹ සිටින අපේක්ෂකයකු හෝ පක්ෂයක්/ කණ්ඩායමක් විසින් වෙනත් අපේක්ෂකයකු ගේ ජයග්‍රහණය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන් විකාශය නොකළ යුතුය. ප්‍රසිද්ධ නොකළ යුතුය.

1.19 පක්ෂයක හෝ කණ්ඩායමක ඡන්ද විමසීම් වලට අදාළ ප්‍රචාරක කටයුතු වලදී දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්ති සහ පොරොන්දු පිළිබඳව ඡන්දදායකයාට මධ්‍යස්ථව සලකා බැලීමට හැකිවන පරිදි නිහඬ වාතාවරණයක් ඡන්ද විමසන දිනට පෙර ඇති කිරීම වැදගත් වන බැවින් ඡන්ද විමසන දිනට පෙර පැය 48 ක් කාලය තුළදී, මැතිවරණයට අදාළ සාකච්ඡා, වාද විවාද, වෙළෙඳ දැන්වීම් ආදිය ප්‍රචාරය කිරීමෙන් වැළකී සිටිය යුතුය. මුද්‍රිත මාධ්‍යයටද මෙය අදාළ වේ.

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2013.07.31

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

සංඛ්‍යා සටහන්

සංඛ්‍යා සටහන 1

පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014

පළාත් සභා විසුරුවන ලද දින, ඡන්ද විමසීම් සඳහා නාමයෝජනා කැඳවන ලද දින හා ඡන්ද විමසීම් පැවති දින

පළාත් සභාව (1)	විසුරුවන ලද දිනය (2)	විසුරුවන ලද ගැසට් නිවේදන දිනය/ අංකය (3)	නාමයෝජනා දැන්වීමේ දිනය (4)	නාමයෝජනා දැන්වීමේ ගැසට් නිවේදන දිනය/ අංකය (5)	නාමයෝජනා කාලය සිට දක්වා (6)	ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම් දිනය (7)	ඡන්ද විමසීම් දැන්වීමේ ගැසට් නිවේදනය දිනය/ අංකය (8)	ඡන්ද විමසීම් දිනය (9)
නැගෙනහිර	2012.06.27	2012.06.27 1764/06	2012.06.28	2012.06.28 1764/15	2012.07.12 2012.07.19	2012.07.25	2012.07.25 1768/21	2012.09.08
උතුරු මැද	2012.06.27	2012.06.27 1764/07	2012.06.28	2012.06.28 1764/15	2012.07.12 2012.07.19	2012.07.25	2012.07.25 1768/21	2012.09.08
සබරගමුව	2012.06.27	2012.06.27 1764/08	2012.06.28	2012.06.28 1764/15	2012.07.12 2012.07.19	2012.07.25	2012.07.25 1768/21	2012.09.08
මධ්‍යම	2013.07.05	2013.07.05 1817/38	2013.07.11	2013.07.11 1818/21	2013.07.25 2013.08.01	2013.08.06	2013.08.06 1822/5	2013.09.21
උතුරු	2013.07.05*	-	2013.07.11	2013.07.11 1818/21	2013.07.25 2013.08.01	2013.08.06	2013.08.06 1822/5	2013.09.21
වයඹ	2013.07.05	2013.07.09 1817/39	2013.07.11	2013.07.11 1818/21	2013.07.25 2013.08.01	2013.08.06	2013.08.06 1822/5	2013.09.21
බස්නාහිර	2014.01.12	2014.01.12 1844/75	2014.01.16	2014.01.16 1845/18	2014.01.30 2014.02.06	2014.02.10	2014.02.10 1849/1	2014.03.29
දකුණ	2014.01.12	2014.01.12 1844/76	2014.01.16	2014.01.16 1845/18	2014.01.30 2014.02.06	2014.02.10	2014.02.10 1849/1	2014.03.29
ඌව	2014.07.11	2014.07.11 1870/64	2014.07.16	2014.07.16 1871/32	2014.07.30 2014.08.06	2014.08.13	2014.08.13 1875/23	2014.09.20

*ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි උතුරු පළාත වෙනුවෙන් ඡන්ද විමසීමක් පවත්වන ලෙසට නියෝග නිකුත් කළ දිනය

සංඛ්‍යා සටහන 2

පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014
එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරාගැනීමට නියමිත වූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව

පළාත් සභාව (1)	ඡන්ද විමසීම් පැවැති දිනය(2)	පරිපාලන දිස්ත්‍රික්කය(3)	තෝරා පත් කර ගැනීමට නියමිත වූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව (4)
නැගෙනහිර	2012.09.08	මඩකලපුව	11
		අම්පාර	14
		ත්‍රිකුණාමලය	10
උතුරු මැද	2012.09.08	අනුරාධපුර	21
		පොළොන්නරුව	10
සබරගමුව	2012.09.08	රත්නපුර	24
		කෑගල්ල	18
මධ්‍යම	2013.09.21	මහනුවර	29
		මාතලේ	11
		නුවරඑළිය	16
උතුරු	2013.09.21	යාපනය	16
		කිලිනොච්චිය	04
		මන්නාරම	05
		වවුනියාව	06
		මුලතිව්	05
වයඹ	2013.09.21	කුරුණෑගල	34
		පුත්තලම	16
බස්නාහිර	2014.03.29	කොළඹ	40
		ගම්පහ	40
		කළුතර	22
දකුණ	2014.03.29	ගාල්ල	22
		මාතර	17
		හම්බන්තොට	14
ඌව	2014.09.20	බදුල්ල	18
		මොණරාගල	14
		එකතුව	**437**

සංඛ්‍යා සටහන 3

පළාත් සභා ඡන්ද විමසීම් - 2012/2014
පරිපාලන දිස්ත්‍රික්ක යටතේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව,
ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව හා ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව

පළාත් සභාව (1)	පරිපාලන දිස්ත්‍රික්කය (2)	ඡන්ද විමසීම් පැවති දිනය (3)	නාවික ඵ ඡන්ද විමසීම් නාමලේඛනයේ වර්ෂය (4)	ඡන්ද හිමියන් සංඛ්‍යාව (5)	ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව (6)	ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව (7)
නැගෙනහිර	මඩකලපුව	2012.09.08	2011	347,099	414	466
	අම්පාර			441,287	464	464
	ත්‍රිකුණාමලය			245,363	285	285
උතුරු මැද	අනුරාධපුර	2012.09.08	2011	606,508	608	608
	පොළොන්නරුව			294,365	287	288
සබරගමුව	රත්නපුර	2012.09.08	2011	769,813	623	623
	කෑගල්ල			631,981	566	567
මධ්‍යම	මහනුවර	2013.09.21	2012	1,015,315	825	825
	මාතලේ			366,594	322	323
	නුවරඑළිය			507,693	423	423
උතුරු	යාපනය	2013.09.21	2012	426,813	526	526
	කිලිනොච්චිය			68,600	95	95
	මන්නාරම			75,737	70	70
	වවුනියාව			94,644	89	89
	මුලතිව්			53,683	50	52
වයඹ	කුරුණෑගල	2013.09.21	2012	1,227,810	920	920
	පුත්තලම			526,408	387	389
බස්නාහිර	කොළඹ	2014.03.29	2013	1,552,734	1,049	1,062
